ජන දිවියට
නව මඟක්



ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ



මෙම වාර්තාව ඉංග්‍රීසි භාෂාවෙන් මාර්ගගත පරිශීලනයට:

ඔබගේ ස්මාර්ට් දුරකථනය හරහා QR කේතය පරිලෝකනය කරන්න හෝ පහත වෙබ් අඩවියට යොමු වන්න.

https://www.boc.lk/



ජන දිවියට
නව මඟක්

ලංකා බැංකුව වන අප මුළු දිවයින පුරා සිටින මිනිසුන්ගේ ජීවන ගමන් මඟ සෑම දවසක් පසාම නව මඟකට යොමු කරමින් සිටිමු.
අපගේ පාර්ශ්වකරුවන් අප කෙරෙහි තබා ඇති විශ්වාසය සහ වටිනාකම පිළිබඳ නොනැසෙන සහතිකයක් වන අපගේ උරුමය
සංකේතවත් කරනු ලබන ස්ථායීතාවය, විශේෂඥතාවය සහ නොසැලෙන ශක්තිය සමඟ වසර 82 ක් පුරාවට
ශ්‍රී ලාංකීය ජනතාවට අප සේවය කර ඇත්තෙමු.

අපගේ සාර්ථකත්වය හුදෙක්ම ඉලක්කම් වලින් මැනිය නොහැකි අතර, ඔවුන්ගේ ජීවිත වලට වෙනසක් ළඟාකිරීම සඳහා වූ
හැකියාව පිළිබඳ අප කෙරෙහි විශ්වාසය තැබූ මිනිසුන්ගේ සාර්ථකත්වය මත අපගේ සාර්ථකත්වය මැනිය හැකිය.
ජනතාවට සහ ප්‍රජාවන්ට වඩාත් වැදගත් වන්නා වූ සේවා සැපයීමෙන්, අපගේ පද්ධති ඩිජිටල්කරණය කිරීමෙන් සහ
ඔවුනගේ සාර්ථකත්වයේ දැක්ම වඩාත් යහපත් හෙටක් කරා ගෙන යාමට ව්‍යාපාරයන්ට සහ පුද්ගලයින්ට
හැකි සෑම අයුරකින්ම අවශ්‍ය සහයෝගය ලබා දීමෙන් මෙම දිවයින පුරා සෑම අස්සක් මුල්ලක් නෑරම
අපව අත්‍යවශ්‍ය අංගයක් වී ඇත.

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ

"ජාතියේ මහා පහන් ටැඹ"

දැක්ම

ගෝලීය බැංකුකරණයේ ශ්‍රී ලාංකික සලකුණ බවට පත්වෙමින් ගනුදෙනුකාර කේන්ද්‍රීය නව්‍ය මූල්‍ය පහසුකම් පිරිනමන ජාතියේ බැංකුකරුවා වීම.

මෙහෙවර

ගෝලීය බැංකුකරණයේ නැවුම් අත්දැකීම් අප ගනුදෙනුකාර ප්‍රජාව වෙත ළඟා කරලමින් සේවක පරිපූර්ණත්වය මත ගොඩ නැංවූ වඩාත් කාර්යක්ෂමවූත්, නවීන තාක්ෂණවේදයන් මුසුවූත් මූල්‍ය සේවාවන් හරහා සියළු පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් උත්පාදනය කරලීම.

ආයතනික වටිනාකම් ප්‍රකාශය

ගෝලීය බැංකුකරණයේ ශ්‍රී ලාංකීය සලකුණ බවට පත්වීමේ අපගේ දැක්ම කරා යන ගමනේදී පහත දැක්වෙන පංචවිධ වූ මූලික හරයන් මත බැංකුව ක්‍රියාත්මක වෙයි.

- ගනුදෙනුකාර කේන්ද්‍රීය වීම
- අප ආයතනය හා බැඳුනු විවිධ ජන කණ්ඩායම්හි විවිධත්වයට ගරු කිරීම
- ඉතා උසස් තත්ත්වයේ ආචාරධර්ම පිළිපැදීම සහ වෘත්තීමය පරිසරයක ස්ථාපනය සඳහා කැපවීම
- නම්‍යශීලි සහ නවෝත්පාදන පරිසරයක් ප්‍රවර්ධනය කිරීම
- අපගේ සෑම ක්‍රියාකාරකමක් සඳහාම වගවීම

පටුන

දළ විශ්ලේෂණය

මෙම වාර්තාව පිළිබඳව 2
සමෝධානික චින්තනය සඳහා අපගේ ප්‍රවේශය 4
බැංකුව පිළිබඳව කෙටියෙන් 5
මූල්‍ය කාර්යසාධන විශේෂාංග 7
මූල්‍ය නොවන කාර්යසාධන විශේෂාංග 8

නායකත්ව දර්ශනය

සභාපතිතුමාගේ පණිවිඩය 10
මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය 14
අධ්‍යක්ෂ මණ්ඩලය 18
ආයතනික කළමනාකාරිත්වය 22
විධායක කළමනාකාරිත්වය 28

අපේ බැංකුව

අගය නිර්මාණය කිරීමේ ආකෘතිය 32
චිකතු කළ අගය මත වාර්තාව 34
අපගේ ආර්ථික බලපෑම 35
මෙහෙයුම් සන්දර්භය 36
PESTEL විශ්ලේෂණය 37
ප්‍රමාණාත්මකව වැදගත් කරුණු 39

අපගේ උපායමාර්ග

පරිවර්තනීය උපායමාර්ගය 42
සම්පත් වෙන්කිරීම සහ උපායමාර්ගික ප්‍රවේශයන්හි ප්‍රගතිය 44
තිරසාර බවට අනුගතව 47

අපගේ කාර්යසාධනය

ප්‍රධාන මූල්‍ය නිලධාරිතුමාගේ සමාලෝචනය 52

ව්‍යාපාරික අංශ සමාලෝචනය

ශාඛා බැංකුකරණය 56
ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය 58
ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම් 60

පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ

ගනුදෙනුකරුවන් 62
අපගේ සේවකයින් 68
කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන් 73
රට සහ ප්‍රජාව 74
ව්‍යාපාරික හවුල්කරුවන් 78
නියාමකයින් 79
සම්මාන 81

වගවීම

ආයතනික යහපාලනය 82

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වාර්තා

විගණන කමිටු වාර්තාව 93
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව 94
මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව 96
නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටු වාර්තාව 97
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු වාර්තාව 98
අවදානම් කළමනාකරණය 99

මූල්‍ය වාර්තා

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව 115
ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම 120
මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 122
ස්වාධීන සහතිකවීමේ වාර්තාව 124
මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම 125
විගණකාධිපතිතුමාගේ වාර්තාව 126
ලාභ හෝ අලාභ ප්‍රකාශනය 130
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 131
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 132
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය 134
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 138
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 140

අනුකූලතා ඇමුණුම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2017 සංග්‍රහයට අනුකූලතා 317
2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා 322
කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා 339
ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා 341
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය 345

අතිරේක තොරතුරු

GRI දර්ශකය 358
ස්වාධීන සහතිකවීමේ වාර්තාව - තිරසාරකත්වය 361
ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ඇ.ඩො.) 363
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (ඇ.ඩො.) 364
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ඇ.ඩො.) 365
කාර්තුමය විශ්ලේෂණය 366
කොටස් හා ණයකර තොරතුරු 369
දස වර්ෂ සංඛ්‍යාන සාරාංශය - බැංකුව 370
පරිපාලිතයන් හා ආශ්‍රිතයන් 372
විදේශ රටවල නියෝජිත බැංකු - රටවල් පදනම මත 374
විනිමය හුවමාරු සමාගම් - රටවල් පදනම මත 380
මූල්‍ය සහ බැංකුකරණ පාරිභාෂික ශබ්ද සංග්‍රහය 381
ආයතනික සහ විදේශීය කාර්යාල 385
සංස්ථාපිත තොරතුරු 387

මෙම වාර්තාව පිළිබඳව



ලංකා බැංකුවේ නවවන ඒකාබද්ධ වාර්ෂික වාර්තාවට සාදරයෙන් පිළිගනිමු

අපගේ මෙම 2021 වාර්ෂික වාර්තාව 2021 ජනවාරි මස 01 වන දින සිට 2021 දෙසැම්බර් මස 31 වන දින දක්වා කාලය තුළ අපගේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය පිළිබඳ වාර්තා කරයි. බැංකුවේ සියලු පාර්ශ්වකරුවන් සහ සමස්තයක් වශයෙන් ආර්ථිකය සඳහා බැංකුව අගය නිර්මාණය කළ ආකාරය අවධාරණය කරමින්, 'ජන දිවියට නව මඟක්' තේමා කරගත් වාර්තාව ආයතනික, සමාජීය සහ පාරිසරික යන ත්‍රිත්ව අංශයන් මගින් අප ලබා ඇති ප්‍රගතිය පිළිබඳ දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කරයි. ලංකා බැංකුව විසින් වාර්ෂික වාර්තාකරණ පිළිවෙතක් අනුගමනය කරන අතර, මෙම වාර්තාව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා වූ පෙර වාර්ෂික වාර්තාව මත ගොඩනඟා ඇත.

වාර්තාකරණයේ සීමා

මෙම වාර්තාව ලංකා බැංකුවේ ("BoC" හෝ "බැංකුව") සහ එහි පරිපාලිත සමාගම් වල ("සමූහය") දේශීය සහ විදේශීය මෙහෙයුම් ආවරණය කරයි. මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය තොරතුරු ඒකාබද්ධ තොරතුරු වන අතර මූල්‍ය නොවන තොරතුරු සමූහය තුළ ඇති ප්‍රමුඛතාවය අනුව මව් ආයතනයට පමණක් සීමා වේ. පරිපාලිත සමාගමක් වන කොළඳෙණිය හයිඩ්‍රෝපවර් (පුද්ගලික) සමාගම විකිණීම, මර්චන්ට් බැංකුවේ හිමිකම් කොටස් නිකුතුවේ ආයෝජනය මත එම සමාගමේ අයිතිය 84.56% දක්වා වැඩි කිරීම සහ සීමාසහිත සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගමෙහි BOC මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම සතු කොටස් අයිතිය BOC ප්‍රොපට් ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගමට පැවරීම හැර සමූහයේ ප්‍රමාණය, ව්‍යුහය හෝ සැපයුම් දාමයේ සැලකිය යුතු වෙනසක් නොමැතිව වාර්තාකරණ මායිම පෙර වසරට සාපේක්ෂව නොවෙනස්ව පවතී.

තොරතුරු වල අබණ්ඩතාව

අපගේ බාහිර වාර්තාකරණයේ විශ්වසනීයත්වය සහ අබණ්ඩතාව සහතික කිරීම සඳහා අපි ඒකාබද්ධ සහතික කිරීමේ ආකෘතියක් යොදාගන්නෙමු. විගණන කමිටුව සහ අභ්‍යන්තර විගණන කාර්යයන් සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලීන් සහ අදාළ අභ්‍යන්තර පාලනයන්හි සඵලතාවය සහතික කිරීම සඳහා වගකිව යුතු අතර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බාහිර සහතිකය ජාතික විගණන කාර්යාලය විසින් ලබා දී ඇත. වාර්ෂික වාර්තාවේ ප්‍රකාශයට පත් කර ඇති තිරසාර තොරතුරු KPMG (වරලත් ගණකාධිකාරිවරුන්) ආයතනය විසින් බාහිරව සහතික කර ඇත. පසුගිය වසරේ ප්‍රකාශයට පත් කරන ලද කිසිදු ප්‍රධාන මූල්‍ය නොවන තොරතුරුවල නැවත ප්‍රකාශයන් නොමැත.

ලංකා බැංකුවෙහි ආයතනික කළමනාකරණ කණ්ඩායම මෙම ඒකාබද්ධ වාර්තාව සකස් කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයට වගකිව යුතුය. වාර්තාව සකස් කර ඇත්තේ නායකත්ව කණ්ඩායමේ යෙදවුම්, විවිධ අංශවල ක්‍රියාකාරී අභ්‍යන්තර තොරතුරු සහ වෙනත් අදාළ බාහිර තොරතුරු භාවිතා කරමිනි.

පූර්ව ආරක්ෂණ මූලධර්මය

විධිමත් ලෙස අනුගත නොවුනද, ලංකා බැංකුව එහි ආයෝජන සහ මෙහෙයුම් කිසිදු ආකාරයක පාරිසරික හානියක් ඇති නොකරන බවට පූර්වාරක්ෂාකාරී ප්‍රවේශයක් අනුගමනය කරයි.



"අපගේ බාහිර වාර්තාකරණයේ විශ්වසනීයත්වය සහ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා අපි ඒකාබද්ධ සහතික කිරීමේ ආකෘතියක් යොදාගන්නෙමු. විගණන කමිටුව සහ අභ්‍යන්තර විගණන කාර්යයන් සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලීන් සහ අදාළ අභ්‍යන්තර පාලනයන්හි සඵලතාවය සහතික කිරීම සඳහා වගකිව යුතු අතර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බාහිර සහතිකය ජාතික විගණන කාර්යාලය විසින් ලබා දී ඇත."

වාර්තාකරණ රාමු

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (CA Sri Lanka)
- <IR> ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලයේ රාමුව
- ගෝලීය වාර්තාකරණ ප්‍රමිති වල මූලික නිර්නායක වලට අනුකූල වීම්
- තිරසාර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද වාණිජ බැංකු සඳහා වන ප්‍රමිති මණ්ඩලය (SASB)
- කොළඹ කොටස් වෙළඳපළ පාරිසරික, සමාජීය සහ ආයතනික යහපාලනය පිළිබඳ වාර්තාකරණ රාමුව
- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය මූලික කොටගත් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ වාර්තාකරණ රාමුව
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිචය සඳහා වූ ආචාරධර්ම සංග්‍රහය (2017)
- කොළඹ කොටස් වෙළඳපළ ලැයිස්තුගත කිරීමේ රීතීන්
- 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥාපනත සහ එහි සංශෝධන
- 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධන
- ශ්‍රී ලංකා මහ බැංකුව සහ කොළඹ කොටස් වෙළඳපළ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතා අනුව බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් අනාවරණ ප්‍රකාශයට පත් කිරීමේ මඟ පෙන්වීම

වාර්තාකරණයේ වැඩිදියුණු කිරීම්

- පාර්ශ්වකරුවන්ගේ අගය හා වසර තුළදී උපායමාර්ග සහ අගය නිර්මාණය කිරීම සඳහා බැංකුවේ සමස්ත ප්‍රවේශය පිළිබිඹු කරන බලපෑම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.
- තිරසාර ගිණුම්කරණ සම්මත මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද වාණිජ බැංකු සඳහා අදාළ ප්‍රමිති වලට අනුගත වීම. (SASB)
- සංඥා සහ පරිශීලන සලකුණු භාවිතය මගින් ඒකාබද්ධ වාර්තාකරණ රාමුව හරහා ඉදිරිපත් කර ඇති ප්‍රාග්ධන වල සබඳතාවය වැඩිදියුණු කිරීම.

ප්‍රතිචාර

කරුණාකර මෙම වාර්තාව පිළිබඳ යෝජනා සහ අදහස් dgmfp@boc.lk වෙත යොමු කරන්න.

ඔබගේ ස්මාර්ට් උපාංගය සමඟ QR කේතය පරිලෝකනය කිරීම හෝ https://www.boc.lk/ වෙත පිවිසෙන්න.



පරිශීලන සලකුණු

පාර්ශ්වකරුවන්

- ගනුදෙනුකරුවන්
- සේවකයින්
- කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්
- රට සහ ප්‍රජාව
- ව්‍යාපාරික හවුල්කරුවන්
- නියාමකයින්

ප්‍රාග්ධනය

- මූල්‍ය ප්‍රාග්ධනය
- නිෂ්පාදිත ප්‍රාග්ධනය
- මානව ප්‍රාග්ධනය
- සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය
- බුද්ධිමය ප්‍රාග්ධනය
- ස්වාභාවික ප්‍රාග්ධනය

උපායමාර්ගික ප්‍රමුඛතා

- ගනුදෙනුකාර කේන්ද්‍රීය බව
- ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය
- ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය
- කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩ නැඟීම
- ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය

සමෝධානික චින්තනය සඳහා අපගේ ප්‍රවේශය

ලංකා බැංකුවෙහි සමෝධානික ප්‍රවේශය අභ්‍යන්තර හා බාහිර මෙහෙයුම් පරිසරය විසින් පැන නඟින ලද නැගී එන අභියෝගවලට පූර්වගාමීව ප්‍රතිචාර දැක්වීමට උපායමාර්ග සැකසීම සඳහා හැකියාව ලබා දී ඇත.

ප්‍රමාණාත්මක ගැටළු තීරණය කිරීම

අපගේ අගය නිර්මාණය කිරීමේ හැකියාව, මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සමාජ පරිසරය සහ පාර්ශ්වකරුවන්ගේ සබඳතා කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි ගැටළු.

අපගේ මෙහෙයුම් සන්දර්භය
කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පැන නැඟුණු පෙර නොවූ විරූ අභියෝග ඇතුළුව මෙහෙයුම් පරිසරය විසින් ඉදිරිපත් කරන ලද අවදානම් සහ අවස්ථා.
(පිටු අංක 38)

පාර්ශ්වකරුවන්ගේ සලකා බැලීම්
අපගේ විවිධ අවශ්‍යතා සපුරාලීමේ ක්‍රමවේද හරහා හඳුනාගෙන ඇති පාර්ශ්වකරුවන් උනන්දුවක් දක්වන කරුණු.
(පිටු අංක 39)

අභ්‍යන්තර ශක්තීන්/දුර්වලතා
උපායමාර්ග මෙහෙයවීම සඳහා සෘජුවම බලපාන ශක්‍යතාවයන්ට වැදගත් වන බැංකුවටම ආවේණික වූ ශක්තීන් සහ දුර්වලතා.
(පිටු අංක 42)

උපායමාර්ග සැකසීම

අපගේ උපායමාර්ගයේ අරමුණ වන්නේ වෙළඳපළ නායකත්වය පවත්වා ගනිමින් සමාජ ආර්ථික වටිනාකම් නිර්මාණය කිරීම සඳහා අනාගතයට ගැළපෙන, කාර්යක්ෂම සහ තිරසාර බැංකුවක් බවට ලංකා බැංකුව පරිවර්තනය කිරීමයි.

අප ළඟා විය යුතු ස්ථානය
- ගනුදෙනුකාර සේවයේ විශිෂ්ටත්වය
- ඩිජිටල් අනුගතවීම සඳහා නායකත්වය ගැනීම
- වෙළඳපළ නායකත්වය රඳවා තබා ගැනීම
- හොඳම තිරසාර බැංකුකරණය

උපායමාර්ග සක්‍රීයක
- ගනුදෙනුකාර කේන්ද්‍රීය බව
- ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය
- ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය
- කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩ නැඟීම
- ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය

සම්පත් වෙන් කිරීම

විධිමත් තීරණ ගැනීමේ රාමුවක් හරහා උපායමාර්ග මෙහෙයවීම සඳහා සම්පත් සහ සබඳතා යෙදවීම (පිටු අංක 44)

මූල්‍ය ප්‍රාග්ධනය | නිෂ්පාදිත ප්‍රාග්ධනය | මානව ප්‍රාග්ධනය | සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය | බුද්ධිමය ප්‍රාග්ධනය | ස්වභාවික ප්‍රාග්ධනය

අපගේ ව්‍යාපාරික අංශ හරහා උපායමාර්ග ක්‍රියාත්මක කිරීම

ශාඛා බැංකුකරණය
(පිටු අංක 56)

ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය
(පිටු අංක 58)

ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම්
(පිටු අංක 60)

අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය සඳහා ක්‍රමානුකූල සහ ක්‍රියාශීලී ප්‍රවේශයක් හරහා අපගේ මූල්‍ය කාර්යසාධනය සහ ස්ථාවරත්වය ආරක්ෂා කර ගනිමින් පාර්ශ්වකරුවන් වෙත අගය නිර්මාණය කිරීම අඛණ්ඩව මෙහෙයවීමට බැංකුවට හැකියාව ලැබේ. (පිටු අංක 99)

පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ

ගනුදෙනුකරුවන්
පහසු, නවෝත්පාදන, වගකිවයුතු බැංකුකරණ හරහා පූර්ණ විසඳුම් සහ නවීන සේවා විශිෂ්ටත්වය
(පිටු අංක 62)

සේවකයින්
කුසලතා සහ වෘත්තීය සංවර්ධනය සඳහා අඛණ්ඩ අවස්ථා සපයන ගතික සහ පූර්ණ සේවා ස්ථානයක්
(පිටු අංක 68)

කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්
ගන්නා ලද අවදානමට සරිලන ලෙස තිරසාර ප්‍රතිලාභ ජනනය කිරීම
(පිටු අංක 73)

රට සහ ප්‍රජාව
රටේ ජාතික සංවර්ධන න්‍යාය පත්‍රයට දායක වීම
(පිටු අංක 74)
ධනාත්මක සහ අර්ථවත් සමාජ-ආර්ථික වෙනසක් ඇති කිරීම
(පිටු අංක 75)

ව්‍යාපාරික හවුල්කරුවන්
අන්‍යෝන්‍ය වර්ධනය සඳහා අවස්ථා නිර්මාණය කිරීම
(පිටු අංක 78)

නියාමකයින්
අදාළ නියාමන සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතා වලට පූර්ණ අනුකූලතාවය සහතික කිරීම
(පිටු අංක 79)

බැංකුව පිළිබඳව කෙටියෙන්

ජාතියේ මහා පහන් ටැඹ

ලංකා බැංකුව, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බලපත්‍රලාභී වාණිජ බැංකුව වන අතර, 2021 දී ක්ෂේත්‍රයේ ණය සහ අත්තිකාරම් වලින් 25% ක් සහ තැන්පතු වලින් 23% ක හිමිකාරිත්වයක් දරයි. පූර්ණ රාජ්‍ය හිමිකාරිත්වයක් ඇති, දේශීය පද්ධතිමය වශයෙන් වැදගත් බැංකුවක් ලෙස, ලංකා බැංකුව ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථිකයට බද්ධ වී ඇති අතර දශක අටකට අධික කාලයක් රටේ මූල්‍ය සවිබල ගැන්වීම සහ ආර්ථික වර්ධනය සඳහා උත්ප්‍රේරකයක් විය.

ශ්‍රී ලංකාව පුරා සිය පුළුල් ප්‍රවේශයට අමතරව, ලංකා බැංකුව විසින් ඉන්දියාව, මාලදිවයින සහ සීෂෙල්ස් යන රටවල ශාඛා තුනක් ද, හුල්හුමාලේ හි සීමිත සේවා ශාඛාවක් ද, එක්සත් රාජධානියේ ලන්ඩන් හි පූර්ණ හිමිකාරිත්වය දරණ පරිපාලිත සමාගමක් ක්‍රියාත්මක කරයි.

ව්‍යාපාර අංශ



ශාඛා බැංකුකරණය

ඒක පුද්ගල ව්‍යාපාර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ සහ ක්ෂුද්‍ර ව්‍යවසායකයන්ගේ ආයෝජන, ණය දීම් සහ ගනුදෙනු අවශ්‍යතා සපුරාලීම.





ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම්

අරමුදල් කළමනාකරණය, මූල්‍ය ආයෝජන, විදේශ මුදල් සම්බන්ධ ගනුදෙනු, නියෝජිත බැංකුකරණය සහ විදේශීය මෙහෙයුම්.



ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය

ආයෝජන, ණය දීම් සහ විදිහෙදා බැංකුකරණ සේවා ලබා දීම් හරහා ආයතන, රජය සහ රජය සතු ව්‍යවසායන් සඳහා සේවා සැපයීම්.

රු. ට්‍රිලියන 3.8
මුළු වත්කම්

රු. ට්‍රිලියන 2.9
මුළු තැන්පතු

රු. ට්‍රිලියන 2.6
මුළු අත්තිකාරම්

රු. බිලියන 43.2
වර්ෂය සඳහා බදු පෙර ලාභය

17.8%
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය

රු. බිලියන 200.8
ස්කන්ධය

8,337
සේවක සංඛ්‍යාව

මිලියන 14.4
ගනුදෙනුකරුවන්

801
විදේශීය නියෝජිත බැංකු සමඟ සම්බන්ධතා

2,071
ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන

අපගේ වෙළඳපළ තත්ත්වය

22%
බැංකු ක්ෂේත්‍රයේ වත්කම් කොටස

25%
ක්ෂේත්‍රයේ ණය සහ අත්තිකාරම් කොටස

23%
ක්ෂේත්‍රයේ තැන්පතු කොටස

65%
ඉලක්ක වෙළඳපළ ප්‍රතිශතය

41%
ආමුඛ ප්‍රේෂණවල කොටස

ලංකා බැංකුවෙහි තරඟකාරී වාසිය

වත්කම්, තැන්පතු, ණය සහ අත්තිකාරම් වල වෙළඳපළ ප්‍රමුඛයා

සම්පූර්ණයෙන්ම රජය සතු බැංකුවක් වීම තුළින් ගොඩ නැගුණු විශ්වාසය

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මූල්‍ය සේවා සන්නාමය

65% ට වැඩි අසමසම ඉලක්ක වෙළඳපළ ආවරණය

දිවයින පුරා ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන 2,000 කට අධික ප්‍රමාණයක් හරහා අසමසම භූගෝලීය ප්‍රවේශය

සමාජීය සහ පාරිසරික තිරසාරකත්වය සඳහා කැපවීම

ශක්තිමත් ආයතනික පාලන විධි සහ භාවිතයන්

බැංකුව පිළිබඳව කෙටියෙන්

අපගේ සේවා ජාලය

වත්කම්, තැන්පතු සහ ණය හා අත්තිකාරම් වල ප්‍රමාණය මත නිර්ණය වන ශ්‍රී ලංකාවේ විශාලතම බැංකුව ලෙස ලංකා බැංකුව අඛණ්ඩව එහි තත්ත්වය පවත්වා ගෙන යනු ලබයි. සියලුම පළාත් පුරා පැතිරී ඇති අංගසම්පූර්ණ, සීමිත සේවා සහ ජංගම ශාඛා, සුළු හා මධ්‍ය පරිමාණ ණය ලබා දීමේ මධ්‍යස්ථාන, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, මුදල් තැන්පත් යන්ත්‍ර සහ මුදල් චක්‍රීකරණ යන්ත්‍ර ඇතුළු සෘජු සම්බන්ධතා මධ්‍යස්ථාන 2,000 කට අධික ජාලයක් හරහා අපගේ ඉලක්ක වෙළඳපළට සහාය වේ. ශ්‍රී ලංකාවට අමතරව මාලදිවයින, සීෂෙල්ස් සහ ඉන්දියාව යන රටවලද අප ශාඛා ක්‍රියාත්මක කරනු ලබයි.

පළාත	ශාඛා	සීමිත සේවා ශාඛා	ජංගම ශාඛා	ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර/මුදල් චක්‍රීකරණ යන්ත්‍ර/ මුදල් තැන්පතු යන්ත්‍ර	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සේවා මධ්‍යස්ථාන
මධ්‍යම පළාත	65	7	1	148	2
නැගෙනහිර පළාත	55	3	1	93	1
උතුරු මැද පළාත	50	3	1	117	1
උතුරු පළාත	63	6	1	103	1
වයඹ පළාත	57	4	1	138	2
සබරගමුව පළාත	49	2	1	123	2
දකුණු පළාත	65	3	1	167	3
ඌව පළාත	42	3	1	98	2
බස්නාහිර පළාත	132	33	2	407	1
විදේශීය මෙහෙයුම්	3	1	-	6	-
එකතුව	**581**	**65**	**10**	**1,400**	**15**

සමූහයේ ව්‍යුහය



මූල්‍ය කාර්යසාධන විශ්ලේෂාංග

	බැංකුව			සමූහය		
	2021	2020	වෙනස %	2021	2020	වෙනස %
මෙහෙයුම් ප්‍රතිඵල (රු. මිලියන)						
මුළු ආදායම	290,362	247,164	17.5	297,621	252,756	17.8
ශුද්ධ පොළී ආදායම	111,252	74,776	48.8	114,990	77,203	48.9
මූල්‍ය සේවා සඳහා බදු ගෙවීමට පෙර ලාභය	52,217	29,010	80.0	53,843	27,627	94.9
බදු පෙර ලාභය	43,190	23,552	83.4	44,637	22,246	100.7
බදු පසු ලාභය	37,590	17,765	111.6	38,683	16,307	137.2
රජයට දායකත්වය	20,710	15,556	33.1	21,433	15,709	36.4
මූල්‍ය තත්ත්වය (රු. මිලියන)						
මුළු වත්කම්	3,803,284	2,982,981	27.5	3,847,950	3,024,774	27.2
දළ ණය සහ අත්තිකාරම්	2,576,668	2,115,205	21.8	2,612,567	2,148,747	21.6
මුළු ආයෝජනය	1,116,744	779,225	43.3	1,123,677	786,099.1	42.9
ගනුදෙනුකරුවන්ගේ තැන්පතු	2,866,894	2,474,775	15.8	2,886,237	2,493,110	15.8
මුළු වගකීම්	3,602,524	2,826,322	27.5	3,632,553	2,855,817	27.2
මුළු ස්කන්ධය	200,760	156,659	28.2	215,397	168,957	27.5
කොටස් පිළිබඳ දත්තයන් (රු.)						
කොටසක ඉපැයුම	1,504	711	111.6	1,540	674	128.5
කොටසක ශුද්ධ වත්කම්	8,030	6,266	28.2	8,552	6,708	27.5
කාර්යසාධන අනුපාත (%)						
වත්කම්හි සාමාන්‍ය මත ප්‍රතිලාභය	1.3	0.9	0.4	1.3	0.8	0.5
ස්කන්ධයෙහි සාමාන්‍ය මත ප්‍රතිලාභය	21.0	11.9	9.1	20.1	10.1	10.0
පොළී ආන්තිකය	3.3	2.8	0.5	3.4	2.8	0.6
ආදායමට පිරිවැය	32.0	37.0	(5.0)	33.2	39.4	(6.2)
තැන්පතු වලට ණය අනුපාතය	89.9	85.5	4.4	90.5	86.2	4.3
ස්කන්ධය මත ණය	51.0	35.4	15.6	-	-	-
හානිකරණ ප්‍රතිපාදන, දළ ණය සහ අත්තිකාරම් වල ප්‍රතිශතයක් ලෙස	6.3	6.0	0.3	6.4	6.1	0.3
හානිකරණ ණය (අදියර 3)	5.1	5.0	0.1	-	-	-
හානිකරණ ණය (අදියර 3) සඳහා ණය හානිකර ප්‍රතිපාදන වෙන් කිරීම්	49.1	50.1	(1.0)	-	-	-
ව්‍යවස්ථාපිත අනුපාත (%)						
ද්‍රවශීලතා වත්කම් අනුපාතය (දේශීය) (අවම අවශ්‍යතාව 20%)	25.0	26.6	(1.6)	-	-	-
ද්‍රවශීලතා ආවරණ අනුපාතය (රු.) (අවම අවශ්‍යතාව 2021 - 100%, 2020 - 90%)	169.3	190.0	(20.7)	-	-	-
ද්‍රවශීලතා ආවරණ අනුපාතය (සියලු මුදල්) (අවම අවශ්‍යතාව 2021 - 100%, 2020 - 90%)	111.5	137.0	(25.5)	-	-	-
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත (%)						
පොදු ස්කන්ධය ස්ථර 1 ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාව - 2021 - 8.50%, 2020 - 7.50%)	12.9	10.1	2.8	12.8	10.2	2.6
ස්ථර 1 ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාව - 2021 - 10.00%, 2020 - 9.00%)	14.3	11.2	3.1	14.1	11.3	2.8
මුළු ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාව - 2021 - 14%, 2020 - 13%)	17.8	14.9	2.9	17.6	14.9	2.7

මූල්‍ය නොවන කාර්යසාධන විශ්ලේෂාංග

සමාජ කාර්යසාධනය

සේවක වටිනාකම්

8,337 ↓

සේවකයන්

99.5% ↓

සේවකයන් සේවාවේ රැඳී සිටීමේ අනුපාතය

රු. බිලියන 25.0 ↑

සේවකයින් සඳහා ආයෝජනය

729 ↑

උසස්වීම්

176,418 මිනිස් පැය ↓

මුළු පුහුණු පැය ගණන

රු. මිලියන 64.1 ↑

පුහුණුව සඳහා ආයෝජනය



ගනුදෙනුකාර වටිනාකම්



671

භෞතික
සම්බන්ධතා
මධ්‍යස්ථාන



1,400 ↑

ඩිජිටල්
සම්බන්ධතා
මධ්‍යස්ථාන

1:2 භෞතික හා ඩිජිටල් සම්බන්ධතා මධ්‍යස්ථාන අතර අනුපාතය

මිලියන 195.1 ↑

ඩිජිටල් ගනුදෙනු (සංඛ්‍යාව)

43% ↑

ඩිජිටල් ගනුදෙනු වල වැඩි වීම





ආර්ථික කාර්යසාධනය

රු. බිලියන 130.5 ↑

සුළු හා මධ්‍ය පරිමාණ
ව්‍යවසායකයින්ට ලබා දී ඇති ණය

16

නැවත පුනර්ජීවනය
කරන ලද ව්‍යාපාර
ගණන



ලබා දී ඇති ණය

රු. බිලියන 461.5 ↓

ශුද්ධ ණය ලබා දීම්



ආර්ථික වටිනාකම්

රු. බිලියන 20.7 ↑

රජයට දායකත්වය

විදේශ විනිමය ගලා ඒම

ඇ.ඩො. බිලියන 3.6 ↑

අභ්‍යන්තර ප්‍රේෂණ

ඇ.ඩො. මිලියන 237.3 ↑

විදේශ මුදලින් උපයන පොළී ආදායම

මූල්‍ය ඇතුළත් කිරීම්

රු. බිලියන 16.0 ↑

ක්ෂුද්‍ර මූල්‍ය ණය කළඹ

1,486

බස්නාහිර පළාතෙන් පිටත සම්බන්ධතා මධ්‍යස්ථාන



පාරිසරික කාර්යසාධනය

පාරිසරික වටිනාකම්

832 ↑

සමාජ සහ පාරිසරික භාවිතයන් සඳහා අනුකූලතාවය ඇගයීමට ලක් කරණ ලද ණය සංඛ්‍යාව

12

හරිත ගොඩනැගිලි ප්‍රමිතීන්ට අනුව ඉදිකරන ලද ශාඛා

3,631.3 $tCo_2eqv.$ ↑	13,478.5 $tCo_2eqv.$ ↑	7,900.6 $tCo_2eqv.$ ↑
කාණ්ඩ 1 හරිතාගාර වායු විමෝචනය	කාණ්ඩ 2 හරිතාගාර වායු විමෝචනය	කාණ්ඩ 3 හරිතාගාර වායු විමෝචනය

51

සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ශාඛා බවට පරිවර්තනය වූ ශාඛා



රු. මිලියන 971.3 ↑

වසර තුළ හරිත ණය දීම්

මෙගා වොට් පැය
1,757.5 ↓

වර්ෂය තුළ නිපදවන ලද සූර්ය බලශක්තිය



↓↑ වාර්ෂික වෙනස

සභාපතිතුමාගේ පණිවිඩය



කාංචන රත්වත්තේ
සභාපති

පසුගිය 2021 වසර තුළදී පැවති ඉතාමත් අසීරු කාලපරිච්ඡේදයන් අභිමුඛව උවද සියලු පාර්ශ්වකරුවන් සඳහා අගය නිර්මාණය කරමින් ලංකා බැංකුව රටේ ආර්ථික සහ සමාජීය සුභසිද්ධිය උදෙසා දක්වන ලද දායකත්වය මා සිහිපත් කරන්නේ මහත් වූ අභිමානයකිනි.

මම ඔබ වෙත මෙම පණිවිඩය ගෙන එන්නේ ලොව පුරාම සිටින ජනතාව, ව්‍යාපාර ආයතන සහ සියළුම පාහේ රාජ්‍යයන් එකසේ අභියෝගාත්මකව ගෙවා නිමකළ වසරක් අවසන් කර නවමු මුහුණුවරකින් අනාගතය දෙස යොමුව සිටින අවධියකය. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මූල්‍ය අතරමැදියා වශයෙන් ලංකා බැංකුව තමන් සතු භාරදූර කාර්යභාරය වගකීම් සහගතව නොපිරි හෙලා ඉටු කරන්නේ රටේ ආර්ථිකය, සමස්ත රටවැසියන්ගේ සුභසිද්ධිය සහ බැංකුව අතර ඇති අන්‍යෝන්‍ය බැඳීයාව පිළිබඳ ඉතා පැහැදිලි දර්ශනයකින් යුක්තවය. පසුගිය 2021 වසර තුළදී පැවති ඉතාමත් අසීරු කාලපරිච්ඡේදයන් අභිමුඛව උවද සියලු පාර්ශ්වකරුවන් සඳහා අගය නිර්මාණය කරමින් ලංකා බැංකුව රටේ ආර්ථික සහ සමාජීය සුභසිද්ධිය උදෙසා දක්වන ලද දායකත්වය මා සිහිපත් කරන්නේ මහත් වූ අභිමානයකිනි. එසේම 2021 වසර සඳහා වන ලංකා බැංකුවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ සහ වාර්ෂික වාර්තාව ඔබ වෙත මම ඉතාමත් ගෞරවාන්විත ආඩම්බරයකින් ඉදිරිපත් කරමි.

මෙහෙයුම් පරිසරය

සිය අතීත අත්දැකීම් තුළ කවරදාකවත් නොලද අන්දමේ අත්දැකීම් සමුදායකට මුහුණ දෙමින් 2020 වසර තුළ ලැබූ පන්නරය මත බොහෝ ව්‍යාපාර ආයතන මෙන්ම මහජනතාවද 2021 වසර තුළ උද්ගත වූ දෙවන සහ තෙවන කොවිඩ් රැල්ල වෙත අනුගත වුයේ සංචරණ සීමාකරණයන්ට සාර්ථකව මුහුණ දෙමින්ය. මෙම තත්ත්වය තවදුරටත් කළමනාකරණය කිරීම සඳහා රජය විසින් බලපෑමට ලක්වූ ව්‍යාපාර අංශයන් වෙත ණය ගෙවීමේ සහන කාල දිගුවක් ලබා දුන් අතර සහනදායී මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. කොවිඩ්-19 වසංගත තත්ත්වය මත ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට විශ්වූ දැඩි අහිතකර බලපෑම සහ විදේශ ප්‍රේෂණ රට තුළට ගලාඒමේ දී වූ මන්දගාමීත්වය නිසා, රටේ විදේශ විනිමය මත නොවැලැක්විය හැකි සෘණාත්මක බලපෑමක් ජනිත වූ අතර, මෙම ගැටළුව නිරාකරණය කර ගැනීමට කාලෝචිත උපායමාර්ගික විසඳුම් ක්‍රියාවට නැංවීම රජයට මහත් අභියෝගයක් විය.

2021 වසරේ දෙවන අර්ධය වන විට සාර්ව ආර්ථික ස්ථායීතාවය පවත්වාගෙන යාම අරමුණු කරගනිමින් ශ්‍රී ලංකා මහා බැංකුව දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට පෙලඹුන අතර, ඒ අනුව ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය, ස්ථාවර තැන්පතු පහසුකම් අනුපාතය සහ ස්ථාවර ණය පහසුකම් අනුපාතය 2021 තුන්වන කාර්තුව තුළ දී ඉහළ නංවන ලදී.

උපායමාර්ගික ප්‍රවේශය

බැංකුවේ 2021 වර්ෂය සඳහා වන උපායමාර්ගික මූලිකාංගයන් සහ එහි ප්‍රවේශයන් විවිධ වූ සම්බන්ධිත පාර්ශ්වකරුවන්ගේ අභිලාශයන් මුදුන්පත් කරන අතරම රටේ සමාජීය සහ ආර්ථික සංවර්ධනය ස්ථායීකරණය සහ ව්‍යාපාර අංශයන් පුනර්ජීවනය කිරීම යන අංශ කෙරෙහි සමබරතාවයක් පවත්වා ගැනීම කේන්ද්‍රකර ගනිමින් ක්‍රියාවට නැංවින. විටින් විට පැනවුණ සංචරණ සීමා මධ්‍යයේ උවද අප සතු දීප ව්‍යාප්ත සේවා සැපයුම් මධ්‍යස්ථාන ඔස්සේ දිවයින පුරා විසිරී සිටින අප ගනුදෙනුකාර භවතුන් වෙත අබාධිත බැංකු සේවාවන් සපයන ලදී. එසේම, අපගේ සේවක මණ්ඩලයේ සෞඛ්‍යාරක්ෂාව සහ පහසුව පිළිබඳව නිරන්තර අවධානය යොමු කරමින් කාර්ය මණ්ඩලය අතර වෛසරය ව්‍යාප්තවීම මැඩ පැවැත්වීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී. පෙර වසරේ මෙන්ම අබාධිත සේවක මණ්ඩලය සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම, කොවිඩ්-19 රෝගී තත්ත්වය වෙනුවෙන් දරණ ලද වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය, නිරෝධායන සහ වෛද්‍ය සේවා මධ්‍යස්ථාන පහසුකම් සැපයීම, නිරෝධායන නිවාඩු පහසුකම් අනුමත කිරීම ආදී පිළිවෙත් තුළින් මෙම

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයේ මෙන්ම පුනර්ජීවනයේ මූලකේෂයන් ලෙස අප විශ්වාස කරනුයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ජාලයයි. මෙය හේතු කොට ගෙන වසර තුළදී අපගේ උපායමාර්ගික දර්ශනය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය වෙත දිශාගත කළේ හුදෙක් මූල්‍ය සහය පමණක් සම්පාදනය කිරීමට වඩා පුළුල් වූ සාර්ව වටිනාකම්න් යුත් සේවා කළඹක් පිරිනැමීම මගින්ය. මේ අනුව මෙම ව්‍යාපාර අංශය මූලික කොට ගනිමින් බැංකුව විසින් බහුවිධ උපදේශන සේවාවන් සපයන ලද්දේ මානව සම්පත් සංවර්ධනය, වෙළඳපළ ප්‍රවිෂ්ටය, ව්‍යාපාර සංයෝජනය සහ ජාලගතකරණය ආදී අවස්ථා හඳුනාගැනීම වැනි සුවිශේෂී සහ වැදගත් අංගයන් ආවරණය වන පරිදිය.

අසීරු කාලපරිච්ඡේදය තුළ අප කාර්යමණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුභසිද්ධිය තහවුරු කිරීමට කටයුතු කළෙමු.

කොවිඩ්-19 වසංගත තත්ත්වය නිසා බලපෑමට ලක් වී අඩපණ තත්ත්වයට පත් වූ ව්‍යාපාර යළි ප්‍රාණවත් කරමින් ආර්ථිකයට එම ව්‍යාපාර වල දායකත්වය ලබා දීම උදෙසා අවශ්‍ය උපායමාර්ගික ක්‍රියාමාර්ග මත බැංකුව ක්‍රියා කළ අතර ව්‍යාපාර පුනර්ජීවන වැඩ පිළිවෙළ මේ අතර මූලික වේ. ව්‍යාපාර වෙත අවශ්‍ය සහය මෙන්ම උපදේශන සේවාවන් ද සපයමින් අක්‍රීයත්වයට සහ අර්බුදකාරී තත්ත්වයට ලක්වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මෙන්ම මහා පරිමාණ ව්‍යාපාරද ප්‍රතිස්ථාපනය උදෙසාම විශේෂයෙන්ම කැපවූ 'ව්‍යාපාර ප්‍රත්‍යානයන සහ පුනරුත්ථාපන' ඒකකයක් ස්ථාපනය කිරීම ප්‍රමුඛත්වය යොමුවූ කරුණකි. වර්තමානය වන විට මෙම ඒකකය ව්‍යාපාර 16 ක් පමණ යළි ප්‍රතිස්ථාපනයට සේවාවන් සපයා ඇත්තේ 4,900 ක් පමණ වන එම ආයතන තුළ සේවයේ නියුතු සේවක ප්‍රජාවගේ රැකියා සුරක්ෂිත කරමින්ය. ලංකා බැංකුව තනිපුද්ගල මෙන්ම ව්‍යාපාර ආයතන වෙතද ණය ගෙවීම් සඳහා වන සහන කාලයන් තවදුරටත් ලබාදෙමින් මෙම අභියෝගාත්මක අවධිය ජයග්‍රහණය කිරීමට අවැසි ශක්තිය සපයා දෙනු ලැබූ අතර 2021 වසරේ දෙසැම්බර් මාසය අවසානය වන විට ණය පහසුකම් 97,000 ක් පමණ ප්‍රමාණයක් මත රු. බිලියන 380.6 ක ණය වටිනාකම් සඳහා ආපසු ගෙවීමේ සහන කාලයන් ප්‍රදානය කර ඇත .

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයේ මෙන්ම පුනර්ජීවනයේ මූලකේෂයන් ලෙස අප විශ්වාස කරනුයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ජාලයයි. මෙය හේතු කොට ගෙන වසර තුළ දී අපගේ උපායමාර්ගික දර්ශනය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය වෙත දිශාගත කළේ හුදෙක් මූල්‍ය සහය පමණක් සම්පාදනය කිරීමට වඩා පුළුල් වූ සාර්ව වටිනාකම්න් යුත් සේවා කළඹක් පිරිනැමීම මගින්ය. මේ අනුව මෙම ව්‍යාපාර අංශය මූලික කොට ගනිමින් බැංකුව විසින් බහුවිධ උපදේශන සේවාවන් සපයන ලද්දේ මානව සම්පත් සංවර්ධනය, වෙළඳපළ ප්‍රවිෂ්ටය, ව්‍යාපාර සංයෝජනය සහ ජාලගතකරණය ආදී අවස්ථා හඳුනාගැනීම වැනි සුවිශේෂී සහ වැදගත් අංගයන් ආවරණය වන පරිදිය. මේ අතර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත දිරි දීම අරමුණු කර ගනිමින්ම ස්ථාපිත ණය යෝජනා ක්‍රමයක් වන 'දිවි උදාන' ණයයෝජනා ක්‍රමය යටතේ රු. බිලියන 17.8 කට වඩා වැඩි ණය මුදල් ප්‍රමාණයක් පිරිනමා ඇත. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ආයතනික කළමනාකාරිත්වයේ ඍජු දායකත්වය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධනය උදෙසා බැංකුව දියත් කළ වැඩසටහන් වෙත නොඅඩුව ලැබුණ අතර එමගින් රටපුරා විසිරී සිටින බැංකුවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ප්‍රජාව සමඟ සමීපව කටයුතු කිරීමටත් ඔවුන්ගේ ගැටළු සහ අරමුණු නිසියාකාරව හඳුනාගෙන ප්‍රායෝගික විසඳුම් ලබාදීමටත් අපහට හැකියාව ලැබිණ.

වසර තුළදී ලංකා බැංකුව විසින් ඉටු කරන ලද සමාජ ආර්ථිකමය මෙහෙවර තවදුරටත් තීව්‍ර වූයේ අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීමේ දී බැංකුව විසින් ඉටුකරන ලද භූමිකාව මගින්ය. විදේශ විනිමය අවශ්‍යතා සපුරා ගැනීම අභියෝගයකට ලක්වූ අවධියක උවද රටේ ආර්ථික ක්‍රියාදාමයන් අබාධිතව පවත්වාගෙන යාමට ධෛර්ය ලබා දෙමින් ඉන්ධන, ඖෂධ වර්ග සහ ගෑස් වැනි අත්‍යවශ්‍ය ආනයන භාණ්ඩ මෙරටට ගෙන්වා ගැනීම උදෙසා අවශ්‍ය මූල්‍ය ශක්තිය ලංකා බැංකුව විසින් සපයනු ලැබීය. වසර තුළදී අවශ්‍ය ඉන්ධන ආනයනය සඳහා ඇ. ඩොලර් මිලියන 1,460.0 ක මූල්‍ය පහසුකම් බැංකුව සපයා දී ඇත. කොවිඩ්-19 වසංගත තත්ත්වය රටින් තුරන් කරලීමට ලංකා බැංකුව විසින් සිදුකළ මෙහෙය පිළිබඳ මා තුළ නිහතමානී ආඩම්බරයක් ජනිත

සභාපතිතුමාගේ පණිවිඩය

කෙටි කාලීන වශයෙන් අභියෝගාත්මක කාලපරිච්ඡේදයක් අභිමුවේ පැවතියද, ශ්‍රී ලාංකික ජනතාවගේ නොසැලෙන ධෛර්යවන්තභාවය සහ අභියෝග වලට මුහුණ දීමේ හැකියාව පිළිබඳව අපි විශ්වාස කරන්නෙමු. මධ්‍ය සහ දිගු කාලීන වශයෙන් උපරිම ශක්‍යතාවයන් මත සාර්ථකත්වය ළඟා කර ගැනීමට හැකි වන පරිදි අවශ්‍ය පියවරයන් ගනිමින් ආර්ථික පුනර්ජීවනය උදෙසා රජය කටයුතු කරන ආකාරය පිළිබඳව අප සුභවාදී අදහස් ඇතිව සහයෝගය ලබා දෙනු ඇත.

රු. බිලියන 17.8

2021 වසර තුළදී 'දිවි උදාන' ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කළ ණය ප්‍රමාණය

වන්නේ අවශ්‍ය වන්නත් ප්‍රමාණය ආනයනය උදෙසා ඇ. ඩොලර් මිලියන 138.0 ක මූල්‍ය පහසුකම් බැංකුව විසින් සපයා ඇති බැවින්ය.

මෙමගින් රටේ වන්නත්කරණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය උදෙසා වක්‍ර දායකත්වය සැපයීමට අපට හැකියාව ලැබිණි. රටේ වඩාත්ම වැදගත් විදේශ විනිමය මුදල් ප්‍රවාහයක් වන විදේශ ප්‍රේෂණ වෙළඳපල තුළ වෙළඳපල නායකත්වය අප සතුවීමේ ශක්තිය මත ලංකා බැංකුවට මෙම අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයන කිරීමේ දී ප්‍රධාන භූමිකාවක් නිරූපණය කිරීමට ඉඩ ප්‍රස්ථාව සැලසී ඇත. සමස්තයක් වශයෙන් රටේ විදේශ ප්‍රේෂණ ප්‍රමාණයේ මන්දගාමීත්වයක් වසර තුළ දී පෙන්නුම් කළද ලංකා බැංකුව සිය විදේශ ප්‍රේෂණ 29% කින් වසර තුළදී වර්ධනය කර ගත්තේ අප සතු විදේශ නියෝජිත සම්බන්ධතා ජාලය මත ළඟා කරගත් උපායමාර්ගික වාසිදායකත්වය පදනම් කර ගනිමින්ය.

ශ්‍රී ලංකාවේ විදේශීය ගෙවුම් අගයන් හි පවතින දුර්වලතා නිසි පරිදි සැලකිල්ලට ගනිමින් එම ගැටළු නිසි ලෙස විසඳීම උදෙසා දීඝකාලීන වූත් තිරසාර වූත් පියවර ගැනීමේ දැඩි අවශ්‍යතාවය පිළිබඳව අප තුළ මනා අවබෝධයක් පවතී. මෙම කාලීන අවශ්‍යතාවයට පිටිවහලක් වෙමින් ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ අපනයන ව්‍යවසායකයින් වෙත දිරියක් වීමේ අරමුණින් යුතුව 'BOC අපනයන කවය' නමින් නවතම වූත් අනන්‍ය වූත් සංකල්පයක් හඳුන්වා දෙන ලදී. අපනයනකරුවන් වෙත සපයන මූල්‍ය සහයට එහා ගිය අත්වැලක් සපයමින් ඔවුනොවුන් අතර සම්බන්ධතාවය සහ සහයෝගය ගොඩනඟා ගනිමින් අවශ්‍ය ශක්‍යතාවයන් වර්ධනය කර ගැනීමටත් ව්‍යාපාර කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමටත්

රු. බිලියන 380.6

ණය ගෙවීමේ සහන කාලයන් ලබා දී ඇති ණය ප්‍රමාණය

අවශ්‍ය පසුබිම සකස් කර දීම BOC අපනයන කවය මඟින් සිදු කෙරේ. 2021 වර්ෂය තුළදී නව සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් 80 ක් වෙත මෙම නව සංකල්පය තුළින් පහසුකම් සපයා දුන් අතර අපනයනකරුවන් 351 ක් උදෙසා දැනුවත් කිරීමේ දීපව්‍යාප්ත වැඩමුළු පවත්වන ලදී.

කොවිඩ්-19 වසංගත තත්ත්වයට විරෙහිව දියත් කෙරුණු ජාතික ක්‍රියාදාමයේ සක්‍රීය දායකයෙකු වශයෙන් ලංකා බැංකුව තම දායකත්වය ලබා දුන් අතර සෞඛ්‍ය අමාත්‍යාංශය මූලිකත්වය ගෙන ක්‍රියාවට නැංවුන කොවිඩ්-19 රෝගීන් සඳහා නිවාස මූලික ප්‍රතිකාර ක්‍රමයට අවශ්‍ය ඇමතුම් මධ්‍යස්ථානය ස්ථාපනය සහ පවත්වාගෙන යාම උදෙසා අවශ්‍ය මූල්‍ය දායකත්වය ලබා දෙන ලදී. මෙම පහසුකම යටතේ නිවෙස්වල සිට ප්‍රතිකාර වලට යොමුවන කොවිඩ්-19 රෝගීන් උදෙසා තම රෝගී තත්ත්වයන් වාර්තා කිරීමට සහ අවශ්‍ය ප්‍රතිකාර සහ උපදෙස් ලබා ගැනීමට භාෂා ත්‍රිත්වයෙන්ම සමන්විත ගාස්තු අය කිරීමකින් තොර වූ දුරකථන ඇමතුම් පහසුව මෙන්ම ඒකාබද්ධ ඩිජිටල් තාක්ෂණික පහසුකම් ද සපයන ලදී. මෙමගින් අසාධ්‍ය තත්ත්වයට පත් නොවූ රෝගීන් දුරස්ථව නිරීක්ෂණයට ලක් කරමින් අවශ්‍ය ප්‍රතිකාර ලබාදීම තුළින් රෝහල් අංශයට සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට දැරීමට සිදුවූ වගකීම් සහ කාර්යභාරය තරමක් දුරට හෝ පහසු කරන ලදී.

කාර්යසාධනය සහ ස්ථාවරත්වය

වර්ෂය තුළදී කිනම් ආකාරයේ අභියෝග වලට මුහුණ දීමට සිදු වුවද, ලංකා බැංකුව සිය වගකීම් සහ යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. වර්ෂය තුළ වාර්තාගත ලෙස රු. බිලියන 43.2 ක ලාභයක් වාර්තා කරමින් බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය ශක්තිමත් කර ගත්තේ ලාභය රඳවා ගනිමින්ය. අස්ථාවර සහ අභියෝගාත්මක කාලපරිච්ඡේදයකදී මූල්‍ය තත්ත්වයේ ස්ථාවරත්වය පවත්වාගෙන යාමේ ඇති වැදගත්කම පිළිබඳව අප තුළ ඇති මනා අවබෝධය නිසාම අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂ අවධානය ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය ශක්තිමත් කිරීම තුළින් අපේ වර්ධනයට අවශ්‍ය පසුබිම සැකසීම සහ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවයන් සැපිරීම වෙත දිශාගත විය. ඒ අනුව වර්ෂය තුළදී බැංකුව ස්ථර 1 ප්‍රාග්ධනය රු. බිලියන 3.4 ක් ද ස්ථර 2 ප්‍රාග්ධනය රු. බිලියන 5.2 ක් ද රැස්කර ගත්තේ අනුමත ණයකර සහ ස්ථර 1 බැඳුම්කර හරහාය. ඒ අනුව ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය 14.3% සහ මුළු ප්‍රාග්ධන අනුපාතය 17.8% ක් ලෙස වාර්තා විය. මෙම අනුපාතයන් නියාමන අවශ්‍යතාවයන්ට වඩා ඉහළ අගයක පවත්වා ගැනීම තුළින් 2022 වර්ෂය තුළ උද්ගත විය හැකි අනපේක්ෂිත ආතතියන්ට සාර්ථකව මුහුණ දීමට හැකියාව ජනිත වනු ඇත. මූලික වශයෙන් කොවිඩ්-19 වසංගත තත්ත්වය නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර යළි නඟාසිටුවීම ඉලක්ක කරගත් ණය සැපයුම් ක්‍රියාවලියක් යටතේ ආසියානු කලාපයේ යටිතල ක්ෂේත්‍රයේ ආයෝජන බැංකුව (AIIB) මඟින් ඇ. ඩොලර් මිලියන 90 ක ණය පහසුකම් ලබා ගන්නා ලදී.

යහපාලනය සහ නායකත්වය

ලංකා බැංකුවේ සාර්ථකත්වයට සහ තිරසාරකත්වය රඳා පවතින්නේ එහි උපායමාර්ගික දර්ශනය මත පදනම්ව ගොඩ නැඟුණු ප්‍රතිපත්ති රාමුව සහ ක්‍රියාවලි පට්පාටිය මතයි. මෙම ප්‍රතිපත්ති සහ ක්‍රියාවලියනට අනුගතව මෙහෙයුම් කටයුතු දියත් කිරීමේදී කාර්යක්ෂම සහ දූරදර්ශී නායකත්වය ප්‍රධානතම සාධකයක් වේ. 2021 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනස් වීමක් සිදු නොවූ අතර, එබැවින් බැංකුවේ දැක්ම, උපායමාර්ගික දර්ශනය සහ ඒකමතික තීරණයන් යන ඉතා වැදගත් අංශයන් අඛණ්ඩව ඉදිරියට ගෙනයාමට රුකුලක් විය. වර්ෂය තුළ දී අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂ අවධානය යොමු වූ කරුණු අතර, නව පාරිසරික සමාජීය කළමනාකරණ පද්ධතිය සම්බන්ධ ප්‍රතිපත්තියක් (ESMS) අනුමත කිරීම මඟින් තිරසාර ණය ප්‍රතිපාදන සැපයීමේ මූලධර්මයන් අනුගමනයට මූලාරම්භය ලබා දීම, ණය අවදානම් කළමනාකරණ රාමුව බල ගැන්වීම සහ මෙහෙයුම් පරිසරය තුළ සිදුවන නව ප්‍රවණතාවයන් සහ වර්ධනයන් සක්‍රීයව නිරීක්ෂණය කරමින් අනුගතවීම ප්‍රධාන වේ.

ඉදිරි දැක්ම

කෙටි කාලීන වශයෙන් අභියෝගාත්මක කාලපරිච්ඡේදයක් අභිමුවේ පැවතියද, ශ්‍රී ලාංකික ජනතාවගේ නොසැලෙන ධෛර්යවන්තභාවය සහ අභියෝග වලට මුහුණ දීමේ හැකියාව පිළිබඳව අපි විශ්වාස කරන්නෙමු. මධ්‍ය සහ දිගු කාලීන වශයෙන් උපරිම ශක්‍යතාවයන් මත සාර්ථකත්වය ළඟා කර ගැනීමට හැකි වන පරිදි අවශ්‍ය පියවරයන් ගනිමින් ආර්ථික පුනර්ජීවනය උදෙසා රජය කටයුතු කරන ආකාරය පිළිබඳව අප සුභවාදී අදහස් ඇතිව සහයෝගය ලබා දෙනු ඇත. ජාතියේ මහා පහන් ටැඹ වශයෙන් ලංකා බැංකුව රජයේ සංවර්ධන න්‍යාය පත්‍රය ක්‍රියාවට නැංවීම උදෙසා උපරිම දායකත්වය ලබා දීමට කටයුතු කරන අතර, ඒ අනුව යමින් රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ අපනයන අංශ බලගැන්වීම, දේශීය නිෂ්පාදකයින් විදේශීය වෙළඳපළ කරා යොමු කිරීමට අවශ්‍ය සහය ලබා දීම ආදිය ක්‍රියාවට නංවනු ලැබේ. සමාජීය සහ පාරිසරික දැක්ම අපගේ උපායමාර්ගික දැක්ම සමඟ අනුගත කරමින් අපගේ මෙහෙයුම් කටයුතු සිදු කිරීම සහ තීරණ ගැනීම මඟින් 2022 වර්ෂය සඳහා වගකීම් සහිත ආයතනික පුරවැසියෙකු ලෙස අප කටයුතු කරනු ඇත.

ස්තූතිය

මම මෙම අවස්ථාවේ මගේ කෘතඥතාවය අතිගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා, මුදල් අමාත්‍යතුමා වෙත පිරිනමන අතර මා වෙත තැබූ විශ්වාසය සහ මඟ පෙන්වීම පිළිබඳව ස්තූතිවන්ත වෙමි. ශ්‍රී ලංකා මහා බැංකුවේ අධිපතිතුමා ඇතුළු නිලධාරී මණ්ඩලයටත්, ජනාධිපති ලේකම්තුමා සහ භාණ්ඩාගාර ලේකම්තුමා විසින් අප වෙත ලබා දුන් මාර්ගෝපදේශයන් හා උපදෙස් සඳහා හදපිරි ස්තූතිය මම පිරිනමනු කැමැත්තෙමි. වර්ෂය පුරාවට දක්වන ලද වටිනා දායකත්වය සහ සහයෝගය උදෙසා මගේ සහෝදර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වෙත මම ගෞරවපූර්ව ස්තූතිය පිරිනමන අතර 2022 පෙබරවාරි 01 වන දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉවත් වූ ජයම්පති මොල්ලිගොඩ මහතා වෙත මගේ සුභාශිංසනය පිරිනැමේ. වසර 40 ක වටිනා සේවා කාලයක් සපුරමින් බැංකු දිවියෙන් විශ්‍රාම ගිය හිටපු මහා කළමනාකාරතුමන් වන ඩී පී කේ ගුණසේකර මහතා වෙතද සුභාශිංසන පිරිනමන අතරම නව මහා කළමනාකාරතුමන් ලෙස පත් වූ කේ ඊ ඩී සුමනසිරි මහතාව උණුසුම්ව පිළිගන්නේ එතුමා සමඟ ඉදිරි කටයුතු සාර්ථකව මෙහෙයවීමේ අරමුණින්ය. අනේකවිධ වූ බාහිර අභියෝගයන් අභිමුඛව උවද තම සේවය නොපිරිහෙලා ඉටු කරමින් ලංකා බැංකුව සාර්ථකත්වය කරා මෙහෙය වූ බැංකුවේ නායකත්ව කණ්ඩායම සහ සේවක පිරිස වෙත මා තුළ ඇත්තේ මහත්වූ අභිමානයකි. අවසාන වශයෙන් අපගේ වටිනා ගනුදෙනුකාර භවතුන් වෙතත්, ව්‍යාපාර සහායකයන් වෙතත්, අනෙකුත් සියලුම පාර්ශ්වකරුවන් වෙතත් මගේ කෘතඥතාවය පිරිනමන්නේ ඔවුන් විසින් අප කෙරේ තැබූ විශ්වාසය, පක්ෂපාතිත්වය සහ අමිල සහයෝගය ගෞරවයෙන් සිහිපත් කරමින්ය.



කාංචන රත්වත්තේ
සභාපති

2022 පෙබරවාරි 24
කොළඹ දී ය.

මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය



කේ ඊ ඩී සුමනසිරි
මහා කළමනාකරු

"අනාගතය උදෙසා අපගේ ගනුදෙනුකාර භාවිතය හුදෙක්ම ඩිජිටල් මාධ්‍ය හරහා ගොඩනැගෙනු ඇති අතර ඒ සඳහා අවශ්‍ය පරිවර්තනීය උපායමාර්ගික දර්ශනය සහ ක්‍රියාපිළිවෙත් නිසිලෙස අඛණ්ඩව ක්‍රියාවට නංවමින් පවතී."

මේ වන විට අපගේ මෙහෙයුම් පරිසරයේ කොටසක් බවට වසර දෙකක් පමණ පුරාවට පැවති කොවිඩ්-19 වසංගත තත්ත්වය පත්ව ඇත්තේ ශ්‍රී ලංකාව තුළ පමණක් නොව ලොව පුරා පවතින රටවල් වලටද පොදු අභියෝගයන් රැසක් ජනිත කරමින්ය. මෙවන් පසුබිමක, ලංකා බැංකුවට ඉතා අත්‍යවශ්‍ය කාර්යභාරයන් රාශියක වගකීම පැවරුනේ සියලු අනපෙක්ෂිත අභියෝගයන් දරා ගනිමින් සමාජ ආර්ථිකමය වශයෙන් ඉතාම වැදගත් ක්ෂේත්‍ර, එනම් ව්‍යාපාර, කුටුම්භ සහ රජය වෙත අවශ්‍ය මූල්‍ය සහයෝගය දක්වමින් රට මුහුණදී තිබූ අසීරු තත්ත්වය සමනය කිරීම සිදුවීමත් සමඟින්ය. අතිශයින්ම අභියෝගාත්මක පසුබිමක අප විසින් ඉතාම දැඩි තීන්දු තීරණ ගනිමින් අඛණ්ඩව මෙහෙයුම් ක්‍රියාදාමයන් පවත්වාගෙන යනු ලැබුවේ අපගේ ව්‍යාපාර කටයුතුවල තිරසාරකත්වය සහ සියලු පාර්ශ්වකරුවන් උදෙසා අගය නිර්මාණය තුළින් රටේ මූලික සාර්ව ආර්ථික කරුණු ස්ථායිකරණය පෙරදැරි කරගෙනය. කෙතරම් අභියෝගාත්මක අවධියකදී උවද වාර්තාගත වර්ෂයක් අවසන් කරමින් ලාභදායිත්වය සහ වර්ධනය යන දෙඅංශයම මත මූල්‍ය තත්ත්වය සහ ප්‍රාග්ධන තත්ත්වය වර්ධනය කර ගනිමින් බැංකුව සිය මූල්‍ය වෙළඳපළ නායකත්වය තව දුරටත් තහවුරු කර ගත් අතර 2021 වසරේ ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම බැංකුව බවට චික්සත් රාජධානියේ සුප්‍රසිද්ධ 'ද බැන්කර්' සඟරාව මඟින් ලංකා බැංකුව ගෞරව සම්මානයට පත්විය.

ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වා ගෙනයාම සහතික කරනු පිණිස ප්‍රමුඛතාවය දෙමින් අප කටයුතු සිදු කරන විට ලංකා බැංකුවේ සේවක මණ්ඩලය ඒ සඳහා සාර්ථකව නව මානයන් ඔස්සේ දායක වෙමින් රටක් වශයෙන් සියලු දෙනා මුහුණ දුන් අභියෝග ජය ගැනීමට දක්වන ලද නොමඳ සහයෝගය මම ඉමහත් ගෞරවයෙන් යුතුව සිහිපත් කර සිටිමි. රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් දිරිගන්වමින් නඟා සිටුවීම මුඛ්‍ය අවශ්‍යතාවක් වූ අතර බැංකුව සිය දායකත්වය අඛණ්ඩව සපයමින් ප්‍රමුඛ අංශ ගොඩනැගීම සඳහා රු. බිලියන 1.6 ක ණය පහසුකම් සපයනු ලැබිය. මූල්‍ය පහසුකම් සැපයීම ප්‍රධාන කොටගත් විවිධ වූ සේවාවන් සහ උපදේශන වැඩමුළු ඔස්සේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය වෙත බැංකුව විසින් සපයන ලද දිරි ගැන්වීම් මත එම ව්‍යාපාරවල මූල්‍ය පැවැත්ම ස්ථාවර වූවා මෙන්ම එම ව්‍යාපාර සහ සම්බන්ධිත සේවක ප්‍රජාව සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ ජීවන තත්ත්වයද සුරක්ෂිත කිරීමට වක්‍රව දායක වන ලදී. විවිධ අස්ථිරතාවයන්ට සහ පසුබෑමට ලක්වූ ව්‍යාපාර ඒකකයන් මෙන්ම ගනුදෙනුකාර හවතුන් සමඟ ද අත්වැල් බැඳගනිමින් මෙම අනපේක්ෂිත දුෂ්කරතාවයන් හමුවේ යලි නැඟී සිටීමටත් දිගුකාලීන වශයෙන් ස්ථාවර අඩිතාලමක් යටතේ මෙහෙයුම් කටයුතු සිදු කරගෙන යාමටත් අවශ්‍ය ධෛර්ය ශක්තිය ලංකා බැංකුව විසින් සපයනු ලැබිය. එපමණක් නොව රටට වුවමනා අත්‍යවශ්‍ය භාණ්ඩ වන ඉන්ධන, ගෑස්, ඖෂධ, එන්නත් ආනයන කටයුතු සම්පාදනයෙහිලා අප බැංකුව අඛණ්ඩ සේවාවක් සපයන ලදී. රටේ අපනයන ක්ෂේත්‍රය පුනර්ජීවනය කිරීමෙහි ලා රජයේ වැඩපිළිවෙළ වෙත අනුගත වෙමින් ප්‍රධාන රාජ්‍ය බැංකුවක් ලෙස ලංකා බැංකුව අපනයන අංශය ඉලක්ක කර ගත් නැඟී එන ව්‍යාපාරිකයන්ට විවිධාංගිකෘත වූ අගනා සේවාවන් රාශියක් සපයමින් 'BOC අපනයන කවය' යන නැවුම් වූ සංකල්පය දියත් කළේය. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ වාණිජ බැංකුවක් වශයෙන් රටේ ආර්ථික සංවර්ධනය උදෙසා අප හට සිදු කළ හැකි සේවාව සහ භූමිකාව පිළිබඳව අප මනාසේ අවබෝධ කරගෙන ඇති අතර විවිධ වූ පාර්ශ්වකරුවන්ගේ විවිධ වූ අපේක්ෂා තුලනය කරමින් පරිපූර්ණත්වයට පත් කිරීම පිළිබඳව ද අප වගකීම දරණු ඇත.

උපායමාර්ගික ප්‍රවේශයේ කාර්යසාධනය

අප සතු ආවේණික ශක්‍යතාවයන් සහ ශක්තිමත් වෙළඳපල නායකත්වය මත ගොඩනැඟුන නව්‍යමය වූත් විශාල පරිවර්තනයක් ළඟා කර දෙන්නාවූත් උපායමාර්ගික සැලැස්මක් 2018 වසරේ සිට බැංකුව ක්‍රියාවට නංවන අතර එමඟින් වර්තමානයේදී ශීඝ්‍රයෙන් දියුණුවෙමින් සහ විපර්යාසයන්ට භාජනය වෙමින් පවතින සමාජ, ආර්ථික සහ මෙහෙයුම් පරිසරය වෙත නිවැරදිව අනුගත වෙමින් අනාගත බැංකුකරණ ක්ෂේත්‍රය තුළ නොසැලී සාර්ථකත්වය කරා ළඟා වීමට අපේක්ෂා කෙරේ. මේ මත ක්‍රියාවට නංවන ලද විවිධ වූ කාර්යයන් රාශියක් මත අප බැංකුව විසින් ළඟා කරගත් නව ක්‍රියාවලි සහ කාර්යක්ෂමතාවයන් වර්තමානයේ උද්ගත වූ අනේකවිධ ගැටළු සහ අනපේක්ෂිත අභියෝගයන්ට

රු. බිලියන 111.3

ශුද්ධ පොළී ආදායම

සාර්ථකව මුහුණදීමට අවශ්‍ය ශක්තිය සහ පසුබිම සකස් කර දුන්නේය.

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය

අනාගතය උදෙසා අපගේ ගනුදෙනුකාර භාවිතය හුදෙක්ම ඩිජිටල් මාධ්‍ය හරහා ගොඩනැගෙනු ඇති අතර ඒ සඳහා අවශ්‍ය පරිවර්තනීය උපායමාර්ගික දර්ශනය සහ ක්‍රියාපිළිවෙත් නිසිලෙස අඛණ්ඩව ක්‍රියාවට නංවමින් පවතී. කොවිඩ්-19 වසංගත තත්ත්වය සමඟ ක්ෂණිකව ඩිජිටල් ගනුදෙනු මාධ්‍යයන් වෙත ඇතිවූ නැඹුරුව සාර්ථකව ග්‍රහණය කරගැනීමට අපහට හැකියාව ලැබුනේ අප විසින් පෙර සිටම ඩිජිටල් භාවිතාවන් සඳහා ආයෝජනය කර උපායමාර්ගික සැලසුම් දියත්කර තිබූ නිසාවෙන්ය. එලෙසම ලංකා බැංකුව සතු පුළුල් සේවා ජාලය හරහා දීප ව්‍යාප්ත බැංකු සේවාවන් අඛණ්ඩව ඩිජිටල් මාධ්‍ය ඔස්සේ ලබාදීමට හැකියාව ලැබෙනුයේ ගනුදෙනුකරුවන්ගේ ඩිජිටල් බැංකු ශක්‍යතාවය ඉහළ නංවමින්ය. වසර තුළ දී දියත් කරන ලද ඩිජිටල් නව්‍යකරණ සේවාවන් අතර ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන ජනතාවගේ පහසුව සඳහා හඳුන්වාදුන් 'BOC CONNECT' සේවාව 'BOC ස්මාර්ට්-පේ' ගෙවුම් යෙදවුමෙහි උපාංග යාවත්කාලීන කිරීම, ප්‍රේෂණ මෙහෙයුම් පද්ධති යාවත්කාලීනකරණය, ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය කිරීමේ නවතම තාක්ෂණක්‍රමවේද හරහා වැඩ ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය ආදිය ප්‍රධාන වේ. මෙම සියලු පියවරයන්හි ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවේ ඩිජිටල් ගනුදෙනු ප්‍රතිශතය 43% කින් ඉහළ නැංවුණු අතර ඩිජිටල්තලයේ සක්‍රීය ගනුදෙනුකරුවන් ප්‍රමාණය 13% කින් වර්ධනය විය.

ගනුදෙනුකාර කේන්ද්‍රීය බව

අපගේ මිලියන 14.4 ක් පමණ වන ගනුදෙනුකරුවන් සමඟ සහ සම්බන්ධතාවයන් පවත්වාගෙන යාම මූලික වශයෙන් කේන්ද්‍රගත වන්නේ මෙම දුෂ්කර අවධියේ ගනුදෙනුකරුවන්ගේ දීර්ඝකාලීන තිරසාරකත්වය අරමුණු කරගත් සුවිශේෂී වූ සේවාවන් ඔස්සේ ඔවුන් වෙත සහයෝගය දැක්වීම මතය. ගනුදෙනුකරුවන් සමඟ වඩාත් ඵලදායී වූත්, අඛණ්ඩ වූත් සම්බන්ධතාවයන් අප පවත්වාගත් එක් මාධ්‍යයක් ලෙස දැනුවත් කිරීමේ වැඩසටහන් සැලකිය හැකි අතර එම වැඩසටහන් අතරින් සමහරක් බැංකුවේ ජ්‍යේෂ්ඨ නායකත්ව කණ්ඩායමේ සහභාගීත්වය ඇතිව පවත්වන ලදී. ගනුදෙනුකරුවන්ගේ පහසුව පිළිබඳව ද අපගේ ප්‍රමුඛ අවධානය යොමුවන අතර අප විසින් සපයනු ලබන සේවාවන් හි කාර්යක්ෂමතාව සහ පහසුව වැඩි දියුණු කිරීමේ අරමුණින් නවමුකරණය සහ නව ඩිජිටල්කරණ පහසුකම් හඳුන්වාදීම මත ගනුදෙනුකරුවන්ගේ පහසුව තවදුරටත් වර්ධනය කරන ලදී. අප සපයනු ලබන සේවාවන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ ගනුදෙනුකාර

රු. බිලියන 52.2

බදු පෙර මෙහෙයුම් ලාභය

තෘප්තිමත්භාවය උපරිම තලයක රඳවා ගැනීම පෙරදැරි කරගනිමින් සේවක මණ්ඩලය වෙත විශේෂ පුහුණු සැසි සහ වැඩසටහන් පැවැත්වීම උදෙසා අවශ්‍ය සම්පත් ආයෝජනය කරන ලදී.

කාර්යක්ෂම සේවක මණ්ඩලය

ශීඝ්‍රයෙන් පැතිරී යන කොවිඩ්-19 වෛරස ප්‍රභේදයන්හි ව්‍යාප්තිය සමඟම අප කාර්ය මණ්ඩලයේ සෞඛ්‍යාරක්ෂාව සහ සනීපාරක්ෂාව පිළිබඳව අවධානය තවදුරටත් දැඩි කළ අතර ඒ සඳහා අවශ්‍ය සියලු පියවරයන් නොපමාව ක්‍රියාත්මක කරන ලදී. සේවක ආරක්ෂාව සහ සෞඛ්‍යාරක්ෂිත වැඩ පරිසරයක් සපයමින් ගනුදෙනුකාර සේවාවන් අකර්මණ්‍ය නොවී අඛණ්ඩව සැපයීමට සහය වීම උදෙසා අප සේවක මණ්ඩලය වෙත අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම, ගුණාත්මක බවින් යුත් පෞද්ගලික ආරක්ෂණ උපකරණ (PPE) සැපයීම, ආසාදිත සේවක මහත්ම මහත්මීන් උදෙසා අවශ්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන පහසුකම් පිළියෙළ කරදීම සහ එන්නත්කරණ ක්‍රියාවලිය උදෙසා ඔවුන්ට පහසුවෙන් යොමුවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය ආදිය බැංකුව විසින් ගනු ලැබූ විවිධ ආරක්ෂණ පියවරයන් අතරින් කිහිපයකි. බැංකුව මෑතකදී ඩිජිටල්කරණ ක්‍රියාවලි උදෙසා වැඩි අවධානයක් යොමුකර තිබූ බැවින් පහසුවෙන්ම සේවක මණ්ඩලයේ ආරක්ෂාව තවදුරටත් තහවුරු කරමින් නිවසේ සිට වැඩකිරීමේ ක්‍රියා පිළිවෙත ක්‍රියාත්මක කිරීමට අපට හැකිවිණි. මෙමඟින් අඛණ්ඩව බැංකු සේවා පවත්වා ගෙනයාමට රුකුලක් සපයන ලදී. බැංකුව වෘත්තීය සමිති සමඟ ඉතා සාර්ථක සාකච්ඡා වට කිහිපයක් නිම කරමින් 2021-2023 වසර සඳහා වන සාමුහික ගිවිසුම අත්සන් කරන ලදී. සේවක ප්‍රජාව වෙත අඛණ්ඩව ප්‍රතිලාභ ජනනය කරමින් පැවති අභියෝග හමුවේ උවද සාර්ථක ප්‍රතිඵල අත්කර ගැනීම මත විශේෂ දිරි දීමනාවන් ප්‍රදානය කරනු ලැබීය. වසර තුළදී 1,355 ක් වූ පුහුණු මාණ්ඩලික නිලධාරීන් ස්ථිර සේවා කාලයෙහි පිහිටවනු ලැබිය. සේවක මණ්ඩලයේ වෘත්තිය දියුණුව සහ අභිප්‍රේරණය අඛණ්ඩව ඉදිරියට පවත්වාගැනීමේ අරමුණින් මෙම දුෂ්කර කාලය තුළදී උවද අප ඔවුන් වෙත සපයන පුහුණු වැඩසටහන් සහ වෘත්තිය සංවර්ධන වැඩපිළිවෙත් අමතක නොකළ අතර බාධා ජය ගනිමින් ඩිජිටල් මාධ්‍ය හරහා පුහුණු සැසි පවත්වන ලදී.

තිරසාරකත්වයට අනුගතව

පසුගිය වසර දෙක තුළ පැවති වාතාවරණයන් ව්‍යාපාර, ප්‍රජාව සහ පාරිසරික පද්ධති අතර අන්තර් සම්බන්ධතාවය නිවැරදිව ග්‍රහණය කර ගැනීමේ වැදගත්කම පිළිබඳව දැඩිව අවධාරණය කළේය. ලාභ අරමුණින් ඔබ්බට ගිය දර්ශනයකින් හෙබි ව්‍යාපාර ආයතනයක් වශයෙන් ලංකා බැංකුව සිය සියලු කාර්යයන් වලදී පාරිසරික සහ සමාජීය වගකීම්

මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය

2021 වසර තුළදී අගය නිර්මාණය



ගනුදෙනුකරුවන්

- යලි නඟාසිටුවීම සහ පුනර්ජීවනය සඳහා දිරිදීම
- විවිධවූත්, පුළුල් වූත් සේවා සැපයුම් ජාලය හරහා ගනුදෙනුකාර කේන්ද්‍රීය සේවා සැපයීම
- ගනුදෙනුකාර සේවාවන්හි ප්‍රමිතිය තහවුරු කිරීම



සේවකයින්

- දුරස්ථ වැඩ පහසුම් සැපයීම
- සෞඛ්‍යාරක්ෂාව සහ සුභසාධනය තහවුරු කිරීම
- පාරිතෝෂිත සහ ප්‍රතිලාභ දීමනා ක්‍රමවේදයන් ශක්තිමත් කිරීම
- ඩිජිටල් මාධ්‍ය ඔස්සේ පුහුණු වැඩසටහන් සහ සම්බන්ධතාවයන් පවත්වා ගැනීම



කොටස් හිමියා සහ අරමුදල් සම්පාදකයන්

- වාර්තාගත ලාභයක්
- ප්‍රාග්ධන පදනම ශක්තිමත් කිරීම
- අවදානම් කළමනාකරණය රාමුව ශක්තිමත් කිරීම මඟින් ව්‍යාපාරික ශක්‍යතාවය නැංවීම



රට සහ ප්‍රජාව

- ව්‍යාපාර පුනර්ජීවනය සඳහා සහය වීම
- ප්‍රධාන ආර්ථික ක්ෂේත්‍ර වෙත අවශ්‍ය අරමුදල් සම්පාදනය
- අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම
- සාර්ව ආර්ථික මූලධර්මයන් ස්ථාවර කිරීමට දායකත්වය සැපයීම
- ජාතික යහපැවැත්ම සහ සුභසාධනය උදෙසා ආයෝජනය



ව්‍යාපාරික හවුල්කරුවන්

- අනෝන්‍ය සහ සංවර්ධන සහ අගය ජනනය කිරීම් උදෙසා අවස්ථාවන් සැපයීම
- විනිවිද භාවයෙන් යුතු ප්‍රසම්පාදන ක්‍රමවේදයන්



නියාමකයින්

- අදාල නියාමන වෙත පූර්ණ අනුගතවීම
- ජාතික කේත (QR) වැඩපිළිලෙළ උදෙසා සහය දැක්වීම
- තිරසාර මූල්‍ය මාර්ගෝපදේශය සඳහා දායකත්වය

පිළිබඳව මනා අවබෝධයකින් යුතුව කටයුතු සිදු කරයි. ලංකා බැංකුවේ තිරසාර දැක්ම කේන්ද්‍ර ගත වන්නේ ආර්ථික, පාරිසරික සහ සමාජීය වශකීම් යන ප්‍රධාන ත්‍රිත්ව පැතිකඩ ඔස්සේය. තිරසාරකත්වය ගොඩනැංවීම සඳහා වන අපගේ උපායමාර්ගික පිළිවෙත් චක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක මත ගොඩනැංවී ඇති අතර හරිතවත් වූ පෘථිවි තලයක් නිර්මාණය කිරීම ප්‍රමුඛ කරගත් ක්‍රියාපිළිවෙත් විදිනෙදා ව්‍යාපාරික කටයුතු වලට හැකිතාක් අනුගත කිරීමට අප නොමඳ උත්සාහයක යෙදෙන්නෙමු. පරිසර හිතකාමී ව්‍යාපාර කටයුතු සහ ආයෝජනයන් වෙත අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම සහ දිරිදීම තුළින් පාරිසරික සහ දේශගුණික තිරසාරකත්වය සඳහා මූල්‍ය ආයතනයක් වශයෙන් අපට ඉටු කළ හැකි කාර්යභාරය සහ බලපෑම පිළිබඳව අප මනාව දැනුම්වත්ය.

පැවති අභියෝගාත්මක කාලපරිච්ඡේදය හමුවේ උවද, බැංකුව සිය ශාඛාවන් සූර්යබල ශක්තිය භාවිතය වෙත යොමු කිරීමේ වටිනා වැඩපිළිලෙළ ක්‍රියාත්මක කළ අතර 2021 දෙසැම්බර් 31 අවසන විට ශාඛා 51 ක් සූර්ය බලයෙන් ක්‍රියාකරන ශාඛාවන් බවට පරිවර්තනය කර ඇත. මේ අතරම, "හරිත අරණ" වැඩ සටහන යටතේ හබරණ ප්‍රදේශයේ අක්කර 100 ක පමණ භූමි ප්‍රමාණයක යළි වන වගාව ආරම්භ කර ඇත්තේ ශ්‍රී ලංකාවේ වන වැස්ම ඉහළ නැංවීමේ රජයේ ජාතික ප්‍රතිපත්තිය යටතේය.

කාර්යසාධනය

අප විසින් ක්‍රියාත්මක කරන ලද උපායමාර්ගික වැඩපිළිවෙත් වල අදාළත්වය සහ කාලෝචිත බවත්, මෙම උපායමාර්ගයන් ක්‍රියාවට නැංවීමෙහිලා ලංකා බැංකු සේවක කණ්ඩායම විසින් දක්වන ලද අනභිබවනීය කැපවීමත් මත සමාලෝචනයට ලක්කරන වසර තුළ දී වාර්තා සහගත කාර්යසාධනයක් ළඟා කරගැනීමට හැකිවිය. ආර්ථික කටයුතු සහ වර්ධනය මන්දගාමී තත්ත්වයක පැවතියේ උවද ව්‍යාපාර ගොඩනැංවීම, පුනර්ජීවනය සහ බලපෑමට ලක්වූ ව්‍යාපාර වෙත අඛණ්ඩව අවශ්‍ය සහාය සැපයීම මත 22% ක ණය සහ අත්තිකාරම් වල වර්ධනයක් සටහන් කිරීමට ලංකා බැංකුවට හැකිවිය. තවද වත්කම් සහ වගකීම් කල්පිරීම් නිසිලෙස කළමනාකරණය කිරීම තුළින් පොළී වියදම 2% කින් අඩුකර ගැනීමට හැකිවූ අතර, ඒ මත ශුද්ධ පොළී ආදායමේ 49% ක් තරම් වූ වර්ධනයක් ලඟාකර ගැනීමට හැකිවිය. ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායමද 19% කින් වර්ධනය විය.

බැංකුව විසින් ණය හානිකරණ ප්‍රතිපාදන වෙන් කිරීමේදී දූරදර්ශී සහ විවේකශීලී පිළිවෙතක් අනුගමනය කරන ලද අතර අපේක්ෂිත ණය හානිකරණ වෙනුවෙන් වෙන්කරන ලද වෙන්කිරීම් 40% කින් මෙම වසරේ දී ඉහළ ගියේය. මෙම වසරේ පැවති ව්‍යාපාරික පරිසරය මත බැංකුව විසින් දැඩි අයකර ගැනීමේ ක්‍රියාපටිපාටීන් අනුගමනය නොකළ අතර ණය ගුණාත්මකභාවයේ හීනවීම අභිමුඛව උවද ව්‍යාපාර පුනර්ජීවනය උදෙසා අවශ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීම් ආදියට අවධානය යොමු කරන ලදී. බැංකුවේ දළ ඍණ ණය අනුපාතය පසුගිය වසරේ පැවති අගයේම පවත්වා ගැනීමට හැකියාව ලැබුණ අතර එය බැංකු ක්ෂේත්‍රයේ අනුපාතය සමඟ ද ඉහළ අගයක් නොපෙන්වීය. සේවක මණ්ඩල වියදම් වල වැඩිවීම මූලික කොටගෙන බැංකුවේ මෙහෙයුම් වියදම 26% කින් ඉහළ ගියේය. කෙසේ වෙතත් ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය, සහ ඩිජිටල්කරණයේ අබණ්ඩත්වය මත බැංකුවේ ආදායම මත වූ වියදම් අනුපාතය 32% දක්වා වසර තුළදී අඩු කර ගැනීමට හැකියාව ලැබුණි. සමස්තයක් වශයෙන් බැංකුවේ මූල්‍ය සේවා මතවූ බදු වලට පෙර මෙහෙයුම් ආදායම රු. බිලියන 52.2 ක් දක්වා දෙගුණයකින් පමණ වර්ධනය විය. මේ අතර බදු

"රට පුරා ආර්ථික කටයුතු වල වේගය වැඩි දියුණු කිරීම අරභයා තරුණ සහ නැඟී එන ව්‍යවසායකත්වය උදෙසා අවශ්‍ය මූල්‍ය සහාය ලබාදීමට අවශ්‍ය පසුබිම සකසමින් ඔවුන් දිරිමත් කිරීමටද අප බලාපොරොත්තු වේ."

පෙර ලාභය සහ බදු පසු ලාභය 83% කින් සහ 112% කින් වර්ධනය විය.

ප්‍රධාන වශයෙන් ණය කළඹේ සිදුවූ වර්ධනය හේතු කොටගෙන වසර තුළ දී බැංකුවේ සමස්ත වත්කම් ප්‍රමාණය රු. ට්‍රිලියන 3.8 ක් දක්වා 28% කින් වර්ධනය විය. අපගේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවයේ ශක්තිමත්භාවය පවත්වා ගෙනයාම සඳහා ද වසර තුළදී වැඩි අවධානයක් යොමු කරන ලදී. රජය සතු ආයතනයක් ලෙස ප්‍රාග්ධන වෙළඳපල හරහා ප්‍රාග්ධනය රැස්කර ගැනීමට බැංකුවට අවස්ථාවක් නොමැති බැවින් ලාභාංශ ගෙවීම සීමා කිරීම ආදී ක්‍රමවේද ඔස්සේ අභ්‍යන්තර වශයෙන් උද්පාදිත ප්‍රාග්ධනය උපරිම තලයක රඳවා ගැනීමට බැංකුව කටයුතු කරනු ලැබීය. මෑත කාලයේ දී ලාභාංශ ගෙවීම් රු. මිලියන 1,846.4 ක ප්‍රමාණයක පවත්වා ගනිමින් ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය 14.3% ක් සහ මුළු ප්‍රාග්ධන අනුපාතය 17.8% ක තත්ත්වයක පවත්වා ගැනීමට බැංකුවට හැකිවිය. තවද බාසල් III ප්‍රාග්ධන රෙගුලාසි සමඟ අනුකූලවන ණයකර සහ අමතර ස්ථර 1 ට අදාළ වන ණය උපකරණ නිකුතු මඟින් ද ප්‍රාග්ධන ස්ථාවරත්වය රඳවා ගැනීමට රුකුලක් ලැබුණි. බැංකුව සතු තැන්පතු ප්‍රමාණය 16% කින් වර්ධනය වූයේ බැංකුවේ සමස්ත අරමුදල් ප්‍රමාණයෙන් 77% ක ප්‍රමාණයකට දායකත්වය සපයමිනි. මෙමඟින් බැංකුව කෙරේ මහජනයා විසින් තබා ඇති විශ්වාසනීයභාවය පිළිබිඹු වේ.

වටිනාකම් සුරැකීම

දැනුම්වත් වූ තීරණ ගැනීම සඳහා යථාවත් වූ යහපාලන රාමුවක් සහ කාර්යක්ෂම අවදානම් කළමනාකරණ ක්‍රියාපිළිවෙතක් අත්‍යවශ්‍ය බව අපගේ ස්ථිර විශ්වාසයයි. වසර තුළ දී පැවති සංකීර්ණ තත්ත්වයන් මත බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී. වසර තුළ දී, අප සවිස්තරාත්මක පසුවිපරම් සිදුකර අවදානම් කළමනාකරණය ආශ්‍රිත සියළු ප්‍රතිපත්තීන් සමාලෝචනය කර යාවත්කාලීන කළ අතර, ප්‍රමාණාත්මක ණය ලබාදීම් සම්බන්ධව පසු විශ්ලේෂණයන් සිදු කිරීම ශක්තිමත් කිරීම, මෙහෙයුම් අවදානම් කළමනාකරණය පළාත් වශයෙන් ක්‍රියාවට නැංවීම ශක්තිමත් කිරීම, නව අවදානම් ආතති පරීක්ෂණයන් හඳුන්වා දීම මඟින් අවදානම් අවස්ථාවන්ට මුහුණදීමේ ශක්‍යතාවය හඳුනාගැනීම ආදිය ද ක්‍රියාවට නංවන ලදී. බැංකුවේ ආයතනික අවදානම් කළමනාකරණය සමඟ පාර්සරික සහ සමාජීය අවදානම් කළමනාකරණ සමායෝජනය කරමින් ඒ සඳහාම වෙන්වූ "පාර්සරික, සමාජීය කළමනාකරණ පද්ධති අංශයක්" ස්ථාපිත කළ අතර ඒ මඟින් අපගේ ව්‍යාපාර කටයුතු මත පාර්සරික සහ සමාජීය අවදානම් අවස්ථාවන් වෙත නිරාවරණයවීම් සහ ඒ හා සබැඳි අවදානම් උපරිම ලෙස කළමනාකරණය කර ගැනීම අපේක්ෂා කෙරේ. ත්‍රිත්ව ආරක්ෂණ ආකෘතියක් මත පදනම් වූ බැංකුවේ දැඩි අවදානම් කළමනාකරණ රාමුව, බහුවිධ තලයන්හි ක්‍රියාත්මක අවදානම් කළමනාකරණ කමිටු, සියලු මෙහෙයුම් ස්ථරයන් හරහා ක්‍රියාත්මක අවදානම් කළමනාකරණ කමිටු, සියළු මෙහෙයුම් ස්ථරයන් හරහා ක්‍රියාත්මක ප්‍රශස්ත තීරණ ගැනීමේ ක්‍රියාපිලිවෙත්, සියලු ප්‍රධාන අවදානම් දර්ශක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත සීමාවන් තුළ පවත්වාගෙන යනු ලබන බවට තහවුරු කරයි. දැනට පවතින තත්ත්වයන් මත 2022 වසර තුළදී ද අපගේ මෙහෙයුම් කටයුතු මත යම් අවදානම් සහගත තත්ත්වයන් උද්ගතවිය හැකි බවට අනුමාන කළ හැකි උවද අප විසින් දැනට දියත් කර ඇති අවදානම් කළමනාකරණ ක්‍රියාදාමයන් මත එම අභියෝග සඳහා සාර්ථකව මුහුණ දිය හැකි බවට සනාථ කර ගත හැකිය.

ඉදිරි දැක්ම

සාර්ථකව ක්‍රියාවට නංවන ලද විනිනත්කරණ වැඩපිළිවෙළ මත ආර්ථික කටයුතු යළිත් යථා තත්ත්වයෙන් පවත්වාගෙන යාමට අවශ්‍යය පරිසරය සැකසෙමින් පවතින අතර ඒ මත පාරිභෝගික සහ ආයෝජක අංශයන්හි සක්‍රීය දායකත්වය මත ආර්ථික කටයුතු යළි පණගැන්වෙනු ඇතැයි අපේක්ෂා කළ හැකිය. සංචාරකයන්ගේ පැමිණීමද යළිත් අපේක්ෂා කළ හැකි අතර, කෙසේ වෙතත් කෙටිකාලීන වශයෙන් හෝ පැනනැඟිය හැකි විදේශ විනිමය ගැටළු පිළිබඳවද අපගේ අවධානය යොමුව ඇත. යහපත් බලාපොරොත්තු ඇති කරමින් වසර තුළ දී රටේ අපනයන අංශය 23% ක වර්ධනයක් සටහන් කර ඇත. මේ සමඟම ක්‍රියාත්මක දේශීය නිෂ්පාදන දිරිගන්වන ප්‍රතිපත්ති, ආනයන ආදේශක, සහ වෙනත් ක්‍රියාමාර්ග මඟින් රටේ "බාහිර ශේෂය" ශක්තිමත් වනු ඇත. දීර්ඝකාලීන වශයෙන් රටේ අපනයන ක්ෂේත්‍රය දිරිගැන්වීම මඟින් විදේශ විනිමය අර්බුදයට ස්ථිරසාර පිළියමක් යෙදීමේ රජයේ ප්‍රතිපත්තියට, රාජ්‍ය බැංකුවක් වශයෙන් අපගේ නොමඳ සහයෝගය පිරිනැමේ. මෙම වසරේ ස්ථාපිත "BOC අපනයන කවය" 2022 වසර තුළ දී තවදුරටත් ශක්තිමත්ව ස්ථාපනය කරමින් රටේ සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍ර වෙත අවශ්‍ය මූල්‍ය සහාය මෙන්ම අනෙකුත් ව්‍යාපාරික සේවා සහ දැනුම ද ලබා දෙනු ඇත. ඩිජිටල්කරණ සේවා සැපයුම තුළ අදාළත්වය සහ පැවැත්ම අඛණ්ඩව පවත්වා ගනිමින් නිරතුරුව තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දීම උදෙසා නව්‍ය වූ ඩිජිටල් සේවා ඉදිරියටත් හඳුන්වාදීමට අපි කටයුතු කරන්නෙමු. රට පුරා ආර්ථික කටයුතු වල වේගය වැඩි දියුණු කිරීම අරභයා තරුණ සහ නැඟී එන ව්‍යවසායකත්වය උදෙසා අවශ්‍ය මූල්‍ය සහාය ලබාදීමට අවශ්‍ය පසුබිම සකසමින් ඔවුන් දිරිමත් කිරීමට ද අප බලාපොරොත්තු වේ. අපගේ තිරසාර ගමන් මඟේ ඉදිරියටම ගමන් කරමින් පාරිසරික සමාජීය යහපාලන අංගයන් මෙහෙයුම් කටයුතු සමඟ අනුගත කරලීම සඳහා අවශ්‍ය සියලු පියවරයන් ක්‍රියාත්මක කරනු ඇති අතර එමඟින් සියලු ව්‍යාපාර අංශ සහ ප්‍රධාන ක්‍රියාවලි තිරසාර සංවර්ධන ක්‍රියාවලියට සක්‍රීයව අනුගත කෙරෙනු ඇත.

ස්තූතිය

මම මේ අවස්ථාවේ දී සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මා කෙරේ තබන ලද විශ්වාසයත් සපයනු ලබන මඟ පෙන්වීමත් උදෙසා මගේ කෘතඥතාවය පිරිනමන අතර 2022 වසර සඳහා අපේක්ෂා සහගත ලෙස යොමුවීමට කැමැත්තෙමි. මම තවද වසර 40 ක් පුරා ලංකා බැංකුව වෙත සපයන ලද වටිනා සේවාව වෙනුවෙන් විශ්‍රාම දිවියට එලඹී මහා කළමනාකාර ඩී පී කේ ගුණසේකර මහතාට මගේ හද පිරි ප්‍රණාමය පුදු කරමි. මෙම වාර්තාව මඟින් ඔබ ඉදිරියේ පිරිනැමෙන ප්‍රතිඵලයන් සියල්ල ලංකා බැංකුවේ ආයතනික කළමනාකාරිත්වය, විධායක කළමනාකාරිත්වය ඇතුළු සේවක මණ්ඩලයේත්, වෘත්තීය සමිති සාමාජිකයින්ගේත් අප්‍රතිහත කැපවීමේ සහ උත්සාහයේ ප්‍රතිඵලයන් වන අතර එම සියලු දෙනාට මගේ හද පිරි ස්තූතිය පළකර සිටින්නෙමි. තවද, මුදල් අමාත්‍යතුමා ඇතුළු මුදල් අමාත්‍යංශයේ නිලධාරි මණ්ඩලයටත්, ශ්‍රී ලංකා මහ බැංකු අධිපති ඇතුළු නිලධාරි මණ්ඩලයටත්, ඔවුන් විසින් අඛණ්ඩව සපයන ලද මඟපෙන්වීම උදෙසා මම කෘතඥ වෙමි. මෙම වාර්තාව නියමිත කාල වකවානු තුළ ඉදිරිපත් කිරීමට අවශ්‍ය සහාය සපයමින් මූල්‍ය වාර්තා විගණන කටයුතු නියමිත පරිදි ඉටුකර දීම වෙනුවෙන් විගණකාධිපතිතුමා ඇතුලු ඔහුගේ කාර්ය මණ්ඩලයට මගේ ස්තූතිය පිරිනැමේ. අවසන් වශයෙන් අප වෙත තබන ලද නොමඳ විශ්වාසය වෙනුවෙන් අපගේ වටිනා ගනුදෙනුකාරභවතුන්ටත් අනෙකුත් සියළු පාර්ශ්වකරුවන්ටත් මගේ ප්‍රණාමය පුදු කරන අතර සියළු දෙනා සමඟ ඉදිරි කටයුතු සාර්ථකව පවත්වා ගෙනයාමට මා අපේක්ෂා කරමි.



කේ ඊ ඩී සුමනසිරි
මහා කළමනාකරු

2022 පෙබරවාරි 24
කොළඹ දී ය.

අධ්‍යක්ෂ මණ්ඩලය



අසුන්ගෙන

කාංචන රත්වත්තේ මහතා
සභාපති, ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

වමේ සිට දකුණට සිටගෙන

1. **ජානකී සේනානායක සිරිවර්ධන මිය**
   ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
2. **ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා**
   නිල බලයෙන් පත්වූ, විධායක නොවන අධ්‍යක්ෂ
3. **වී සී මහිල්ක ප්‍රනාන්දු මහතා**
   ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
4. **ජී හර්ෂ විජේවර්ධන මහතා**
   ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
5. **ජයම්පති මොල්ලිගොඩ මහතා**
   ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
6. **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි**
   ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

කාංචන රත්වත්තේ මහතා

සභාපති

ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම් ලද දිනය

2020 ජනවාරි 02

නිපුණතා හා පළපුරුද්ද

- කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධිය හිමිකරගත් නීතිඥවරයෙකි.
- රාජ්‍ය අංශයේ පිළිවෙත් හා රෙගුලාසි පිළිබඳව රාජ්‍ය ආයතනයන්හි නායකත්ව තනතුරු ඔස්සේ ලබාගත් විස්තීර්ණ පළපුරුද්ද සහිතය.
- තොරතුරු තාක්ෂණය, සුරක්ෂිත දත්ත මුද්‍රණය, මෘදුකාංග සංවර්ධනය, ව්‍යාපාර සඳහා බාහිරින් සේවා සපයන ආයතන, රක්ෂණ තැරැව්කාර කටයුතු හා සුරැකුම් යන ක්ෂේත්‍රයන්හි පුද්ගලික අංශයේ පරිපාලන හා නායකත්ව හැකියාව.

සෙසු නිල තල

- සභාපති තනතුරු:
  - ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී
  - මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී
  - සීමාසහිත හොටෙල්ස් කලම්බු (1963) සමාගම
  - බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම
  - ලංකා බැංකුව (යූ.කේ.) සමාගම
- පෞද්ගලික අංශයේ කොටස් තැරැව්කාර සමාගමක සහ රක්ෂණ තැරැව්කාර සමාගමක අධ්‍යක්ෂ ධූරයන් දරයි.

කලින් දැරූ තනතුරු

- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරය
- ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශයේ හා ලංකා නැව් සංස්ථාවේ සභාපති ධූරයන්
- ලංකා කෝල් කෝ (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ
- EW ඉන්ෆෝමේෂන් සිස්ටම්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ
- ටොපෑන් ෆෝම්ස් (කලම්බු) ලිමිටඩ් හි අධ්‍යක්ෂ

ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා

නිල බලයෙන් පත්වූ, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම් ලද දිනය

2020 අප්‍රේල් 28

නිපුණතා හා පළපුරුද්ද

- වසර 25 කට වඩා පළපුරුද්ද සහිත ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකි.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් හා නෝර්වේහි කෘෂිකාර්මික විශ්වවිද්‍යාලයෙන් කෘෂිකර්මය පිළිබඳ විද්‍යාපති උපාධියක් හිමිකර ගෙන ඇත.
- බහු පාර්ශ්වික සංවර්ධන බැංකුකරණය තුළ විස්තීර්ණ අත්දැකීම් සහිතය.
- ද්වි පාර්ශ්වික සාකච්ඡා, සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙන ආයතන සමඟ සම්බන්ධීකරණය ඇතුළුව සංවර්ධන ව්‍යාපෘති සඳහා විදේශීය අරමුදල් ඒකරාශී කිරීමෙහි ලා සහභාගිත්වය සපයා ඇත.

සෙසු නිල තල

- මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්
- ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සාමාජික
- කලම්බු ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි (පෞද්ගලික) සමාගම

කලින් දැරූ තනතුරු

- ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සභාපති
- ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සාමාජික
- චීන මහජන සමූහාණ්ඩුවේ බීජිං හි ආසියානු අපර ව්‍යුහ ආයෝජන බැංකුවේ විකල්ප විධායක අධ්‍යක්ෂ
- මහජන බැංකුවේ අධ්‍යක්ෂ
- ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ
- සී/ස මූල්‍ය අධ්‍යයන ඇකඩමියේ (ගැරන්ටි) අධ්‍යක්ෂ
- වෘත්තීය පුහුණු විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ සාමාජික
- ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ
- ශ්‍රී ලංකා ජාතික ජලජීවී සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති පිළිබඳ ශ්‍රී ලංකා කවුන්සිලයේ සාමාජික
- ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ (SPC) අධ්‍යක්ෂ
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ
- ජාතික විද්‍යා පදනමේ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශයේ උපදේශක මණ්ඩලයේ සාමාජික
- ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ සාමාජික.
- ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සාමාජික

පී හර්ෂ විජේවර්ධන මහතා

ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම් ලද දිනය

2020 ජනවාරි 14

නිපුණතා හා පළපුරුද්ද

- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වසර විස්සකට වැඩි පුළුල් පළපුරුද්ද සහිත තොරතුරු තාක්ෂණ වෘත්තිකයෙකි.
- රාජ්‍ය අංශයේ පරිගණක ජාලයන් ඇතුළුව, රජයේ තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති සඳහා දායකත්වය දක්වා ඇත.
- කොළඹ විශ්වවිද්‍යාලයේ මෘදුකාංග සංවර්ධන අංශය ස්ථාපිත කළේය.
- ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ ස්වයංකෘත ඇඟිලි සළකුණු හඳුනා ගැනීමේ පද්ධතිය බදු ජාතික මට්ටමේ ප්‍රධානතම මෘදුකාංග ව්‍යාපෘතීන්හි මූලිකත්වය දරා ඇති අතර, දැනට මුදල් අමාත්‍යාංශය සමඟ රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය නිර්මාණය කිරීමේ නියුක්තව සිටී.
- ජෙව රසායනය හා රසායන විද්‍යාව ප්‍රධාන විෂය ලෙස ද ගණිතය අනුවිෂය වන ලෙස ද ඇතුළත් වන පරිදි ඇමෙරිකා එක්සත් ජනපදයේ මියාමි විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී උපාධියක් ලබා ඇත.
- බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ වරලත් සාමාජිකයෙකි.

අධ්‍යක්ෂ මණ්ඩලය

- විද්‍යාත්මක පත්‍රිකා හා පොත් කිහිපයක් පළකොට ඇති අතර ICTA, LK Domain Registry සහ Sri Lanka Chapter මඟින් ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ පුරෝගාමියෙකු ලෙස ගෞරවයට පාත්‍ර විය.

සෙසු නිල තල

- තීක්ෂණ හි (කොළඹ විශ්වවිද්‍යාලයෙහි පරිගණක විද්‍යා පාසලට අනුබද්ධ සමාගමකි) ප්‍රධාන මෙහෙයුම් නිලධාරි හා ප්‍රධාන තාක්ෂණ නිලධාරි
- ලංකා ඩොමේන් රෙජිස්ට්ර් ආයතනයේ මුල්ම අධ්‍යක්ෂ
- සිංහල ශබ්දකෝෂ සම්පාදන ආයතනයේ උපදේශක කමිටු සාමාජික
- ICTA යටතේ ඇළුතින් එකතු කරන ලද දේශීය භාෂා ක්‍රියාකාරී කණ්ඩායමේ සභාපති

කලින් දැරූ තනතුරු

- ලංකා රාජ්‍ය තොරතුරු යටිතළ පහසුකම් හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ උපදේශකයකු ලෙස කටයුතු කර ඇත
- කොඹළ විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යා පාසලේ මෘදුකාංග අංශයෙහි ප්‍රධානියා/උපදේශකයෙකු ලෙස සේවය කර ඇත
- ජනාධිපති ලේකම් කාර්යාලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපදේශකයෙකු ලෙස සේවය කර ඇත

ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා

ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම් ලද දිනය

2020 අප්‍රේල් 21

නිපුණතා හා පළපුරුද්ද

- ශ්‍රී ලංකාවේ හා එතෙර ආයතනයන්හි, බැංකුකරණ, උපායමාර්ග සැලසුම්, ගණකාධිකරණ හා මූල්‍ය වෘත්තිකයකු ලෙස වසර 40 කට වැඩි පළපුරුද්ද.
- වාණිජ බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන ඇතුළු ආයතන පරාසයක උපායමාර්ගික සැලසුම් සම්පාදනය, ප්‍රතිව්‍යුහගත කිරීම් හා ආයතන සංවර්ධන ව්‍යාපෘති සඳහා උපදේශන/මඟ පෙන්වීම් සේවා සපයා ඇත.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජික.
- හාර්වඩ් විශ්වවිද්‍යාලයේ හා INSEAD හි විශේෂිත පුහුණුව නිමකර ඇත.
- ඇමෙරිකා එක්සත් ජනපදයේ ජෝර්ජියා විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය හිමිකරගෙන ඇත.

සෙසු නිල තල

- සොෆ්ට්ලොජික් ෆිනැන්ස් පී එල් සී හි විධායක නොවන අධ්‍යක්ෂ

කලින් දැරූ තනතුරු

- එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායිහි මෂ්රික් බැංකුව, සිටි බැංකුව, එන් ඩී බී බැංකුව හා සවුදි අරාබියේ රියාද්හි අල් රාජි බැංකුව යන මූල්‍ය සේවා ආයතන වල ජ්‍යෙෂ්ඨ කළමනාකාර තනතුරු දරා ඇත.
- පෞද්ගලික අංශයේ තවත් සමාගම් කිහිපයක අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කර ඇත.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය ඇතුළු ආයතනයන් හි බාහිර කථිකාචාර්යවරයකු ලෙස කටයුතු කර ඇත.

මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි

ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම් ලද දිනය

2021 ජනවාරි 08

නිපුණතා හා පළපුරුද්ද

- රාජ්‍ය අංශයේ නායකත්ව තනතුරු දරා ලද රාජ්‍ය සේවා පිළිවෙත් හා රෙගුලාසි පිළිබඳ පළපුරුද්ද.
- ඉන්දියාවේ ජාතික ආරක්ෂක විද්‍යාලයේ හා බංගලාදේශයේ ආරක්ෂක සේවා අණ දීමි හා නිලධාරී විද්‍යාලයේ උපාධිධාරියෙකි.
- රණ වික්‍රම පදක්කම, විශිෂ්ට සේවා විභූෂණ, උත්තම සේවා පදක්කම ඇතුළු විශේෂිත ඇගැයීම් දිනාගෙන ඇත.

සෙසු නිල තල

- ශ්‍රී ලංකා ගුවන් තොටුපොල හා ගුවන් සේවා (පුද්ගලික) සමාගමේ සභාපති.

කලින් දැරූ තනතුරු

- ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පහත දැක්වෙන ප්‍රධාන අණදීම් හා මාණ්ඩලික තනතුරු රැසක් සමඟින් වසර 35 ක කීර්තිමත් හමුදා පළපුරුද්ද.
  - ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී තනතුර (යුධ හමුදාවේ 2 වැනි අණදෙන නිලධාරී)
  - ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මේජර් ජෙනරාල් තනතුර
  - වී්කාබද්ධ මෙහෙයුම් ආඥා මූලස්ථානයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා විශේෂ බලකායේ රෙජිමේන්තු අණ දෙන නිලධාරී
  - යාපනය ආරක්ෂක සේවා මූලස්ථානයේ අණදෙන නිලධාරී
  - අතිගරු ජනාධිපතිතුමාගේ හමුදා ආරක්ෂක සම්බන්ධීකාරක
  - යුද්ධයට පසු උතුරු පළාතේ අභ්‍යන්තරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම සඳහා නිසි බලධාරී
- උතුරු පළාතේ ආණ්ඩුකාර ධූරය

ජයම්පති මොල්ලිගොඩ මහතා

ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම් ලද දිනය

2021 පෙබරවාරි 18

නිපුණතා හා පළපුරුද්ද

- මූල්‍ය කළමනාකරණය, උපායමාර්ගික ක්‍රමසම්පාදනය, මානව සම්පත් සංවර්ධනය, වැවිලි කළමනාකරණය හා ජාත්‍යන්තර තේ අපනයනය පිළිබඳ වසර 40 කට වැඩි විධායක මට්ටමේ පළපුරුද්ද.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධිසාමාජික.

- කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය.
- ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න්හි වික්ටෝරියා විශ්වවිද්‍යාලයේ විධායක උපායමාර්ග පාඨමාලාව සාර්ථකව නිම කොට ඇත.
- 2014 ජූනි මස පැවැත් වූ ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ජාතික සම්මේලනයෙහි දී 2014 වෘත්තීය විශිෂ්ටත්ව සම්මානය හිමිකර ගත්තේය.

සෙසු නිල තල

- සභාපති, ශ්‍රී ලංකා තේ මණ්ඩලය.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ කවුන්සිල් සාමාජික.
- මෙට්‍රොපොලිටන් රිසෝස් හෝල්ඩිංස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ

කලින් දැරූ තනතුරු

- විධායක උප සභාපති/ ප්‍රධාන විධායක, බොගවන්තලාව තේ වතුයාය/ටී එස්ටේට් පී එල් සී
- කොළඹ ඉන්ලේ තේ සමාගමේ ස්වාධීන විගණන කමිටුවේ සභාපති
- ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන ගණකාධිකාරී
- සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ ජ්‍යෙෂ්ඨ මූල්‍ය කළමනාකරු
- මහජන බැංකුවේ අධ්‍යක්ෂධූරය
- උඩපුස්සැල්ලාව ප්ලාන්ටේෂන් පී එල් සී හි අධ්‍යක්ෂධූරය
- හපුගස්තැන්න ප්ලාන්ටේෂන් පී එල් සී හි අධ්‍යක්ෂධූරය
- සිලෝන් ප්ලයිවුඩ්ස් කෝපරේෂන් හි ගණකාධිකාරී

ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය
ලේකම්, ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

විස්තර, පිටු අංක 24 හි දැක්වේ.

ආයතනික කළමනාකාරීත්වය



අසුන්ගෙන වමේ සිට දකුණට
ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය, ඩබ්ලිව් පී රසල් ෆොන්සේකා මහතා

සිටගෙන වමේ සිට දකුණට
ජී වී ජයශාන්ත මහතා, ඒම් ආර් එන් රෝහණ කුමාර මහතා, වයි වී ජයතිලක මහතා, කේ වී ඩී විජයවර්ධන මහතා, ආර් එම් එන් ජීවන්ත මහතා, එම් පී රුවන් කුමාර මහතා, නිලන්ත මෙනේරිපිටියගේ මහතා, එස් සිවන්ජන් මහතා



අසුන්ගෙන වමේ සිට දකුණට
කේ ඊ ඩී සුමනසිරි මහතා, ඩබ්ලිව් බී පී රත්නායක මහත්මිය

සිටගෙන වමේ සිට දකුණට
පී වීම් ලියනගේ මහතා, ඩී එස් මුතුකුඩාරච්චි මහතා, එච් ප්‍රියාල් සිල්වා මහතා, බී කේ ගුරුසිංහ මහතා, කේ ඒ ඒ කරුණාරත්න මහතා, ඒ ආර් එෆ් ජොන් පුල්ලේ මහතා, සමීර ඩී ලියනගේ මහතා

ආයතනික කළමනාකාරීත්වය

කේ ඊ ඩී සුමනසිරි මහතා

මහා කළමනාකරු
(2021 අගෝස්තු මාසයේ දී මහා කළමනාකරු ලෙස පත් කරන ලදී)

නිපුණතා සහ පළපුරුද්ද

- ණය සහ පුද්ගල කළමනාකරණය පිළිබඳ විශේෂඥතාව සමඟ බැංකුව තුළ වසර 31 කට වැඩි විවිධ ක්ෂේත්‍රයන්හි අත්දැකීම් සමූහයක් සහිත වේ. ඔහුගේ බැංකු වෘත්තීය ජීවිතය තුළ ඔහු ශාඛා බැංකුකරණය, ක්ෂුද්‍ර මූල්‍ය, ආයතනික මූල්‍ය, අයකර ගැනීම්, ඉගෙනුම් සහ සංවර්ධන සහ මානව සම්පත් කළමනාකරණය යන ක්ෂේත්‍රවල සේවය කර ඇත.

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ අධ්‍යයන ආයතනය විසින් පවත්වන ව්‍යාපාර නායකයන් සඳහා වූ උසස් කළමනාකරණ සහ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ විශේෂ කළමනාකරණ පාඨමාලාව ද, ඉහළ කළමනාකාරීත්වය සඳහා වන කළමනාකරණ සංවර්ධන පාඨමාලාව ද, ඇමෙරිකා එක්සත් ජනපදයේ හාවඩ් ව්‍යාපාරික පාසල විසින් පවත්වන ලද නායකත්ව පාඨමාලාව ද සම්පූර්ණ කර ඇති අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි ආශ්‍රිත සාමාජිකත්වය සහ ශ්‍රී ලංකා වරලත් පිරිස් කළමනාකරණ ආයතනයෙහි ආශ්‍රිත සාමාජිකත්වය ද උසුලයි.

ඩබ්ලිව් පී රසල් ෆොන්සේකා මහතා

අතිරේක මහා කළමනාකරු/ප්‍රධාන මූල්‍ය නිලධාරී
(2012 මාර්තු මාසයේ දී ආයතනික කළමනාකාරීත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

- මූල්‍ය කළමනාකරණය, අයවැය සහ උපායමාර්ගික සැලසුම්කරණය පිළිබඳ වෘත්තීය අත්දැකීම් සහිතව බැංකුවේ දේශීය හා විදේශීය මෙහෙයුම් කටයුතු සම්බන්ධව වසර 31 කට අධික සේවා කාලයක් සහිත වේ.

- ශාඛා බැංකුකරණය, ජාත්‍යන්තර මෙහෙයුම්, භාණ්ඩාගාර සහ ආයෝජන සහ ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය වැනි ක්ෂේත්‍රයන්හි අත්දැකීම් ඇතුළත් වේ.

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ද, ඕස්ට්‍රේලියාවේ දකුණු ක්වීන්ස්ලන්ත විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය ද, ඇමෙරිකා එක්සත් ජනපදයේ හාවඩ් ව්‍යාපාරික පාසලේ උසස් කළමනාකරණ වැඩසටහන ද නිමකොට ඇති අතර ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය මෙන්ම ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි ජ්‍යෙෂ්ඨ අධි සාමාජිකත්වය ද ලබා ඇත.

ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය

ලේකම්, ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්
(2010 ඔක්තෝබර් මාසයේදී ආයතනික කළමනාකාරීත්වයට පත් කරන ලදී)

නිපුණතා සහ පළපුරුද්ද

- නීතිවේදී උපාධියක් සහිත වෘත්තියෙන් නීතිඥවරියකි

- සමාගම් ලේකම් සහ ආයතනික පාලනය පිළිබඳ බැංකුවේ වසර 25 කට වැඩි පළපුරුද්ද

- කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය විශිෂ්ට සාමාර්ථයක් සහිතව හිමිකරගෙන ඇත.

ඩී එස් මුතුකුඩාරච්චි මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(අයකර ගැනීම් ආයතනික)
(2020 පෙබරවාරි මාසයේදී ආයතනික කළමනාකාරීත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

- බැංකු මෙහෙයුම් හා සබැඳි විවිධ වූ අංශ පිළිබඳ වසර 31 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.

- ණය කළමනාකරණය, ණය අවදානම් සහ විදේශීය ශාඛා මෙහෙයුම් පිළිබඳ විශේෂිතව, ශාඛා සහ ආයතනික බැංකුකරණය පිළිබඳ පුළුල් අත්දැකීම් සහිත වේ.

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් දේපළ කළමනාකරණය සහ තක්සේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා ගෙන ඇත.

වයි ඒ ජයතිලක මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(ශාඛා ණය මෙහෙයුම් - කලාප II)
(2020 පෙබරවාරි මාසයේ දී ආයතනික කළමනාකාරීත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

- ශාඛා බැංකුකරණය, භාණ්ඩාගාර සහ විදේශීය මෙහෙයුම්, ව්‍යාපෘති කළමනාකරණය, නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය, ණය සහ අයකරගැනීම් ආදී විවිධ වූ භූමිකාවන්හි වසර 24 කට වැඩි පළපුරුද්දක් ඇත.

- ලංකා බැංකුව (යූ.කේ) සමාගමේ මූලික බැංකු පද්ධතිය සහ වෙළඳ මූල්‍ය පද්ධති වැනි බැංකුවේ ප්‍රධාන තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, මූලික බැංකුකරණ සහ ටෙලර් පද්ධතිය වැඩිදියුණු කිරීම, ලේඛන කළමනාකරණ පද්ධතිය, කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණ පද්ධතිය සහ ගනුදෙනුකරුවන් වෙත පිරිනැමෙන ඩිජිටල් සේවාවන් කිහිපයක් ද බැංකුවේ ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ වී ඇත.

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිධාරියකු වන අතර කැළණිය විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර මූල්‍යනය පිළිබඳ පශ්චාත් උපාධියද, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය සහ බැංකු සහ මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමාව ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ උපායමාර්ගික කළමනාකරණය පිළිබඳ උසස් පාඨමාලාව ද ලබාගෙන ඇත.

එච් ප්‍රියාල් සිල්වා මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය)
(2020 පෙබරවාරි මාසයේ දී ආයතනික කළමනාකාරීත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

- ආයතනික, ශාඛා හා සංවර්ධන බැංකුකරණය, ජාත්‍යන්තර සහ භාණ්ඩාගාර මෙහෙයුම් සහ විකුණුම් සහ අලෙවිකරණය ඇතුළු ශාඛා මෙහෙයුම් පිළිබඳ විශේෂිත වූ බැංකුකරණයේ විවිධ අංශවල වසර 24 කට වැඩි පළපුරුද්දක් ඇත.

- රුහුණු විශ්වවිද්‍යාලයේ අළෙවිකරණය පිළිබඳව විශේෂිත ව්‍යාපාර පරිපාලනය පිළිබඳ දෙවන පන්තියේ (ඉහළ අංශය) උපාධියද කැළණිය විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධියද ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ චික්සත් රාජධානියේ වරලත් අළෙවිකරණ ආයතනයේ වෘත්තීය අළෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද සහිතව ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද උසුලයි.

පී ඒ ජයශාන්ත මහතා
ප්‍රධාන අවදානම් නිලධාරී
(2020 සැප්තැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද
- බැංකුවේ වසර 24 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.
- ශාඛා ණය, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත, භාණ්ඩාගාර මෙහෙයුම්, වත්කම් සහ වගකීම් කළමනාකරණය, අවදානම් කළමනාකරණය සහ ආයතනික ණය හා අක්වෙරළ මෙහෙයුම් වැනි විවිධ අංශ වල විශේෂිත අත්දැකීම් ලබා ඇත.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිධාරියෙකු වන අතර කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද, ශ්‍රී ලංකා බැංකකුරුවන්ගේ ආයතනයේ ණය කළමනාකරණය සම්බන්ධව ඩිප්ලෝමාවක් ද, ලබා ගෙන ඇති අතර එහි ආශ්‍රිත සාමාජිකයෙකු ද වේ.

ඩබ්ලිව් බී පී රත්නායක මහත්මිය
නියෝජ්‍ය මහා කළමනාකාරිණී
(අනුකූලතා)
(2020 සැප්තැම්බර් මාසයේදී ආයතනික කළමනාකාරිත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද
- සිය වෘත්තිය කාල පරාසය තුළ දේශීය හා විදේශීය වාණිජ බැංකුකරණයේ සියලු අංශවල වසර 24 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.
- ආයතනික හා ශාඛා ණය පිළිබඳ පළපුරුද්ද මෙන්ම අවදානම් කළමනාකරණය, අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ බැංකුව සඳහා අවදානම් කළමනාකරණ ක්‍රමවේද සංවර්ධනය කිරීමේහි ලා ප්‍රවීණයෙකු වේ.
- රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිධාරියකද, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධාරියක ද වන අතර ශ්‍රී ලංකා බැංකකුරුවන්ගේ ආයතනයේ බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියක මෙන්ම එහි ආශ්‍රිත සාමාජිකාවක් ද වේ.

ආර් එම් එන් ජීවන්ත මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(ජාත්‍යන්තර, භාණ්ඩාගාර හා ආයෝජන)
(2020 සැප්තැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද
- භාණ්ඩාගාර කළමනාකරණ, ආයෝජන බැංකුකරණය මූල්‍ය කළමනාකරණය, ණය කළමනාකරණය සහ ශාඛා බැංකුකරණය වැනි ක්ෂේත්‍රවල වසර 19 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ද, පශ්චාත් උපාධි කළමනාකරණ අධ්‍යයන ආයතනයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධියද ලබා ඇති අතර ශ්‍රී ලංකාවේ සහතිකලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ සාමාජිකත්වය සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද හොබවයි.

එම් පී රුවන් කුමාර මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(මූල්‍ය හා සැලසුම්)
(2020 සැප්තැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද
- මූල්‍ය කළමනාකරණය, උපායමාර්ගික සැලසුම්කරණය, ආයෝජන බැංකුකරණය, වාණිජ බැංකුකරණය සහ විදේශීය බැංකු කටයුතු පිළිබඳ වසර 19 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ද, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පොදුරාජ්‍ය මණ්ඩලීය විධායක ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය ද හිමි ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය දරණ අතර ශ්‍රී ලංකාවේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සාමාජිකයෙකු ද වේ. තවද ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය සහ ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ සාමාජිකත්වය ද උසුලයි.

එස් සිවන්ජන් මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(ශාඛා ණය මෙහෙයුම් කලාප I)
(2020 සැප්තැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද
- ශාඛා බැංකු මෙහෙයුම්, ණය අයකර ගැනීම්, සංවර්ධන බැංකු කටයුතු, ක්ෂුද්‍ර මූල්‍ය හා විදේශීය මෙහෙයුම් සම්බන්ධව වසර 19 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.
- යාපනය විශ්වවිද්‍යාලයේ පළමු පන්තියේ (ගෞරව) විද්‍යාවේදී උපාධියක් හිමි වන අතර කොළඹ විශ්වවිද්‍යාලයේ අළෙවිකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධියක් ද හිමිය.

බී කේ ගුරුසිංහ මහතා
ප්‍රධාන නීති නිලධාරී
(2020 සැප්තැම්බර් මාසයේදී ආයතනික කළමනාකාරිත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද
- ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීතීඥයෙකි.
- බැංකු වෘත්තිකයෙකු ලෙස ආයතනික බැංකු කටයුතු, ශාඛා බැංකු කටයුතු සහ ආයතනික පරිවර්තනමය ව්‍යාපෘති පිළිබඳ වසර 24 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ද, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පොදුරාජ්‍ය මණ්ඩලීය විධායක ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය ද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය හා ශ්‍රී ලංකා නීතිඥවරුන්ගේ සංගමය වැනි සංවිධාන කිහිපයක සාමාජිකත්වය දරනු ලබයි.

ආයතනික කළමනාකාරීත්වය

එම් ආර් එන් රෝහණ කුමාර මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(අයකර ගැනීම් පළාත්, ව්‍යාපාර ප්‍රත්‍යානයන සහ පුනරුත්ථාපනය)
(2021 ජනවාරි මාසයේ දී ආයතනික කළමනාකාරීත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

- අයකර ගැනීම්, ශාඛා ණය සහ ව්‍යාපෘති මූල්‍යකරණය සම්බන්ධයෙන් විධායක නායකත්ව භූමිකාවන් ඇතුළුව බැංකුවේ වසර 19 කට වැඩි පළපුරුද්දක් ඇත.
- බැංකුවේ මධ්‍යම පුහුණු කිරීමේ ආයතනයේ සම්පත් දායකයකු ලෙස ඔහුගේ භූමිකාව තුළින් සේවක මණ්ඩලයේ ණය කුසලතා වැඩි දියුණු කිරීමට දායක විය.
- කැලණිය විශ්වවිද්‍යාලයෙන් ගණිතය පිළිබඳ විද්‍යාවේදී පළමු පන්තියේ උපාධිය, ඇමරිකා එක්සත් ජනපදයේ උතුරු ඉලිනොයිස් විශ්වවිද්‍යාලයේ නායකත්වය පිළිබඳ ඩිප්ලෝමාව සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වයද දරයි.

ඒ ආර් එෆ් ජෝන් පුල්ලේ මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(උපකාරක සේවා)
(2021 ජූලි මාසයේදී ආයතනික කළමනාකාරීත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

- භාණ්ඩාගාර කළමනාකරණය, ශාඛා බැංකුකරණය, අවදානම් කළමනාකරණය සහ විදේශීය බැංකු මෙහෙයුම් පිළිබඳ විශේෂඥතාව ඇති වාණිජ බැංකුකරණයේ සෑම අංශයකම වසර 30 කට වැඩි පළපුරුද්දක් ඇත. චෙන්නායි හි ලංකා බැංකුවේ භාණ්ඩාගාර අංශයේ ප්‍රධානියා ලෙස ද ලන්ඩනයේ ලංකා බැංකුව (යූ.කේ) සමාගමේ හි ප්‍රධාන විධායක නිලධාරිවරයා ලෙස ද සේවය කර ඇත.
- ඉතාලියේ “Universita’ Pontificia Salesiana” වෙතින් දර්ශනවේදය පිළිබඳ දර්ශනවේදී පළමු පන්තියේ උපාධිය සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය උසුලනු ලැබේ.

නිලන්ත මෙනේරිපිටියගේ මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(ශාඛා මෙහෙයුම් සහ සංවර්ධන බැංකුකරණය)
(2021 ජූලි මාසයේ දී ආයතනික කළමනාකාරීත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

- ආයතනික බැංකුකරණය, ශාඛා බැංකුකරණය, අවදානම් කළමනාකරණය, ණය කාඩ්පත් මෙහෙයුම්, භාණ්ඩාගාර මෙහෙයුම් සහ තොරතුරු තාක්ෂණය වැනි ක්ෂේත්‍රවල දේශීය සහ විදේශීය මෙහෙයුම් පිළිබඳ වසර 29 කට වැඩි පළපුරුද්දක් ඇති වෘත්තීය බැංකුකරුවෙකු වේ.
- ලංකා බැංකුව (යූ.කේ) සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි/ විධායක අධ්‍යක්ෂ සහ සහකාර මහා කළමනාකරු (අවදානම් කළමණාකරණ) ආදී තනතුරු ඔහු හොබවා ඇත. මහා පරිමාණ ව්‍යාපාර සහ රාජ්‍ය අංශයේ යටිතල පහසුකම් ව්‍යාපෘති හැසිරවීම ඔහුගේ අත්දැකීම් වලට ඇතුළත් වේ.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී (කළමනාකරණ) ගෞරව (විශේෂ) උපාධිය සහ කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ බැංකු හා මූල්‍ය ඩිප්ලෝමාවක්ද හිමි ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකුද වේ.
- මොරටුව විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන අංශයට, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයට, අපනයන සංවර්ධන මණ්ඩලයට සහ ලංකා බැංකුවේ මධ්‍යම පුහුණු කිරීමේ ආයතනයට අනුබද්ධ බාහිර කථිකාචාර්යවරයකු ලෙස සේවය කර ඇත.

කේ ඒ ඩී විජයවර්ධන මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(මානව සම්පත්)
(2021 ඔක්තෝබර් මාසයේ දී ආයතනික කළමනාකාරීත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

- ශාඛා බැංකුකරණය හා මානව සම්පත් මෙහෙයුම් යන අංශවල විධායක නායකත්ව තනතුරුද ඇතුළුව ණය සහ ශාඛා බැංකුකරණය ආදී ක්ෂේත්‍ර වල බැංකුවේ වසර 19 කට වඩා වැඩි පළපුරුද්දක් ඇත.
- කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී (සාමාන්‍ය) දෙවන පන්තිය (ඉහළ අංශය) ගෞරව උපාධිය ද, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් බැංකුකරණය හා මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබා ගෙන ඇති අතර ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකයෙකු ද වේ.

පී එම් ලියනගේ මහතා

ප්‍රධාන අභ්‍යන්තර විගණක
(2014 දෙසැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරීත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

- මූල්‍ය වෘත්තිකයෙකු ලෙස බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 22 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ගණකාධිකරණය හා මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා ඇති ඒ මහතා ශ්‍රී ලංකා චරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය සහ ඇමරිකා එක්සත් ජනපදයේ ISACA හි සහතිකලත් තොරතුරු පද්ධති විගණකවරුන්ගේ සංගමයේ (CISA) සාමාජිකත්වය ද දරනු ලැබේ.

සමීර ඩී ලියනගේ මහතා

ප්‍රධාන අළෙවිකරණ නිලධාරී
(2020 අගෝස්තු මාසයේදී ආයතනික කළමනාකාරීත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

- බැංකුකරණය සහ අළෙවිකරණය පිළිබඳ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල වසර 23 ට වඩා වැඩි වෘත්තීය විශේෂඥතාවයකින් යුක්තය.
- 2015 වර්ෂයේ දී චික්සත් රාජධානියේ වරලත් අළෙවිකරණ ආයතනය විසින් ප්‍රදානය කරනු ලබන වරලත් අළෙවිකරු සම්මානයෙන් පිදුම් ලැබීය.
- චික්සත් රාජධානියේ වරලත් අළෙවිකරණ ආයතනයෙන් පශ්චාත් උපාධි අළෙවිකරණ ඩිප්ලෝමාව ලද ඔහු චික්සත් රාජධානියේ අළෙවිකරණ ආයතනයේ, ශ්‍රී ලංකා අළෙවිකරණ ආයතනයේ සහ වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමය යන ආයතන වල සාමාජිකත්වය දරනු ලබයි.

කේ ඒ අජිත් කරුණාරත්න මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(නම් කරන ලද)
(2021 අගෝස්තු මාසයේ දී ආයතනික කළමනාකාරීත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

- ශාඛා බැංකුකරණය, වෙළඳ මූල්‍ය, ආයතනික සහ ප්‍රිමියර් බැංකු මෙහෙයුම් යන ක්ෂේත්‍රවලට විශේෂිතව බැංකුවේ වසර 19 කට වැඩි පළපුරුද්දක් සහිත වේ.
- ශාඛා බැංකුකරණයේ විවිධ වූ පැතිකඩයන්හි අත්දැකීම් සහ ව්‍යාපාර ප්‍රවර්ධනය, පරිපාලනය සහ මානව සම්පත් සඳහා වගකීම් සහිතව පළාත් කිහිපයක විධායක නායකයෙකු ලෙස අත්දැකීම් ලබා ඇත.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ද, වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ සංගමයේ සාමාජිකත්වය සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද ලබා ඇත.

විධායක කළමනාකාරීත්වය



එම් ඩී ඒ කරුණාරත්න මහතා
සහකාර මහා කළමනාකරු
- තොරතුරු තාක්ෂණ (යෙදවුම් පද්ධති)



පී පී එම් විජේසේකර මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- ණය විගණනය



ඒ එම් ආර් ඩී සුබසිංහ මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- ආපසු අයකරගැනීම් - පළාත්



ටී පෙරේරා මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- පුහුණු හා සංවර්ධන



කේ පී සී දිපාල් මහතා
සහකාර මහා කළමනාකරු
- තොරතුරු පද්ධති විගණනය



ජේ ඥානසම්බන්ධන් මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- භාණ්ඩාගාර පසුපෙළ කාර්යාලය



ආර් එම් එම් විරසේකර මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- ශාඛා ණය - කලාප I



එම් එම් ආර් පී ප්‍රනාන්දු මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- වෙළඳ සේවා



කේ පී මල්ලිකා මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- ඩිජිටල් බැංකු සේවා ප්‍රවර්ධන



අයි එස් එන් පෙරේරා මහතා
සහකාර මහා කළමනාකරු
- ගිණුම්කරණ හා බදු



එස් පී සී කේ ප්‍රනාන්දු මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- ආයතනික ණය



සීනා රුවයිස් මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- අයවැය, ක්‍රමෝපායික සැලසුම් හා කළමනාකරණ තොරතුරු පද්ධති



ජී කේ පී මහින්ද බණ්ඩාර මහතා
සහකාර මහා කළමනාකරු
- උතුරු මැද පළාත



ඩී ආර් සී එස් උදයකුමාරි මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- ශාඛා මෙහෙයුම්



ඩබ්ලිව් එම් ඒ වනිගසේකර මහතා
සහකාර මහා කළමනාකරු
- නැගෙනහිර පළාත



පී එම් විතාන ආරච්චි මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- උපකාරක සේවා



ඩී ඒ එස් එස් විමලසිරි මහතා
සහකාර මහා කළමනාකරු
- පාරිභෝගික හා සංවර්ධන බැංකුකරණ



කේ කේ අයි සී කේ කන්නංගර මෙනෙවිය
සහකාර මහා කළමනාකාරිණී
- ආපසු අයකර ගැනීම් - ආයතනික



කේ ජේ යෝගරත්නම් මහත්මිය
නේවාසික කළමනාකාරිණී
- චෙන්නායි ශාඛාව



එච් එම් එම් ඩී හේරත් මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- විදේශීය ශාඛා



එස් අරුණ කුමාර මහතා
ප්‍රධාන විධායක නිලධාරී
- ලංකා බැංකුව (යූ කේ) සමාගම



එස් එච් එම් එම් පී හේරත් මෙනෙවිය
සහකාර මහා කළමනාකාරිණී
- අක්වෙරළ බැංකුකරණය



එම් ටී එස් ඒ පෙරේරා මහතා
සහකාර මහා කළමනාකරු
- නිමැවුම් සංවර්ධන කටයුතු හා ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණ



එස් පිරපාහරන් මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- ආයෝජන බැංකුකරණය



එස් කේ වික්‍රමසිංහ මහතා
සහකාර මහා කළමනාකරු
පිටකොටුව ශාඛාව



සී පී සී අබේරත්න මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- තොරතුරු තාක්ෂණ (මෙහෙයුම්/ තාක්ෂණික සහය)



එන් ඩබ්ලිව් ජේ එස් පී නානායක්කාර මහත්මිය
නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරිනී
- ආපසු අයකර ගැනීම්



ජේ එම් පී ඩබ්ලිව් තිලකරත්න මහත්මිය
නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරිනී
- ජාත්‍යන්තර කටයුතු, මානව සම්පත් සහ මෙහෙයුම්



එන් එන් නිශානදි මහත්මිය
නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරිනී
- ණය



ඒ ආර් මල්ලිකාරච්චි මහතා
සහකාර මහා කළමනාකරු
- පරිපාලන සේවා



එස් බී ඒ එම් ජී එස් අරම්පත් මහතා
නේවාසික කළමනාකරු
- මාලේ ශාඛාව



එස් පී කේ ලියනගේ මහතා
සහකාර මහා කළමනාකරු
- බස්නාහිර පළාත උතුර

විධායක කළමනාකාරීත්වය



එස් ඩබ්ලිව් එම් එස් වීජේසිංහ මහතා
සහකාර මහා කළමනාකරු
- මධ්‍යම පළාත



ජේ කේ ඩී ධර්මපාල මහතා
සහකාර මහා කළමනාකරු
- මෙට්‍රොපොලිටන් ශාඛාව



ඩබ්ලිව් කේ එල් බී එන් සමන්තී මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- බස්නාහිර පළාත දකුණ



ආර් එම් සමරක්කොඩි මහතා
සහකාර මහා කළමනාකරු
- විමර්ශන



ඩබ්ලිව් එම් එන් ඩී දයාවංස මහතා
සහකාර මහා කළමනාකරු
- සබරගමුව පළාත



වී සිවානන්දන් මහතා
සහකාර මහා කළමනාකරු
- උතුරු පළාත



එම් එම් ඊ අයි බණ්ඩාර මහතා
සහකාර මහා කළමනාකරු
- විද්‍යුත් බැංකුකරණ මධ්‍යස්ථානය



කේ දීපා කුමාරි මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- අවදානම් කළමනාකරණය



ඒ ඩබ්ලිව් ආර් තුෂාන්ත මහතා
සහකාර මහා කළමනාකරු
- භාණ්ඩාගාර



ඩී එම් ඒ මාධව මහතා
සහකාර මහා කළමනාකරු
- ආයතනික සබඳතා



ඒ ටී හෙට්ටිආරච්චි මහතා
සහකාර මහා කළමනාකරු
- අළෙවිකරණ



එස් එස් ටී කුළසේකර මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- ව්‍යාපෘති මූල්‍යන



ඩබ්ලිව් ඒ ජී එල් විරක්කොඩි මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- ශාඛා ණය - කලාප II



එච් කේ රාජපක්ෂ මහතා
සහකාර මහා කළමනාකරු
- තොරතුරු තාක්ෂණ (සැපයුම් හැසිරවීම්)



පී චන්ද්‍රදේව මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- තොරතුරු තාක්ෂණ (ආරක්ෂණ සහ අනුකූලතා)



එම් ඒ ඩී පී ඩයස් මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- මානව සම්පත් මෙහෙයුම්



අයි කේ නවරත්න මහතා
සහකාර මහා කළමනාකරු
- ඌව පළාත



එන් ආර් ඩී එන් පෙරේරා මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- වයඹ පළාත



එන් ක්‍රිෂ්ණකුමාර් මහතා
සහකාර මහා කළමනාකරු
- ව්‍යාපාර ප්‍රත්‍යානයන සහ පුනරුත්ථාපන



ආර් පී ඩී ආර් ආර් රුවන්පතිරණ මහතා
සහකාර මහා කළමනාකරු
- ජාත්‍යන්තර



ටී එස් සේනානායක මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
- පළාත් සහ ශාඛා විගණන



අයි යූ කේ ඩී විජේගුණවර්ධන මහතා
නේවාසික කළමනාකරු
- සීෂේල්ස් ශාඛාව

අගය නිර්මාණය කිරීමේ ආකෘතිය

ප්‍රාග්ධන යෙදවුම්

මූල්‍ය ප්‍රාග්ධනය

රු. බිලියන 200.8
කොටස් හිමියාගේ අරමුදල්

රු. බිලියන 2,866.9
තැන්පතු

රු. බිලියන 688.6
ණය ගැනීම්

නිෂ්පාදිත ප්‍රාග්ධනය

2,071
ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන

10
ජංගම සේවා ශාඛා

මානව ප්‍රාග්ධනය

8,337
සේවකයින්

රු. මිලියන 64.1
පුහුණුව සහ සංවර්ධනය සඳහා ආයෝජනය

සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය

මිලියන 14.4
ගනුදෙනුකරුවන්

484
ලියාපදිංචි සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන්

801
විදේශ රටවල නියෝජිත බැංකු

බුද්ධිමය ප්‍රාග්ධනය

ශ්‍රී ලංකාවේ ශක්තිමත්ම මූල්‍ය සේවා සන්නාමය

පුළුල් පරාසයක විහිදි සේවාවක්

රු. මිලියන 884.0
ඩිජිටල් යටිතල පහසුකම් සඳහා ආයෝජනය

රු. බිලියන 53.9
සන්නාමයේ වටිනාකම

ස්වාභාවික ප්‍රාග්ධනය

ටෙට්රා ජූල් 193.1
බලශක්ති පරිභෝජනය

ඝන මීටර 696,304.3
ජල පරිභෝජනය

වර්ග අඩි 951,864
බැංකුව විසින් භාවිතා කරන ලද භූමි ප්‍රමාණය

වටිනාකම් පරිවර්තනය

ප්‍රධාන ව්‍යාපාරික කටයුතු

- කේවල, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, සංස්ථා සහ රජයට ණය පහසුකම්
- ගනුදෙනුකරුවන්ගෙන් සහ අරමුදල් සපයන්නන්ගෙන් අරමුදල් සපයා ගැනීම
- අරමුදල් සහ විදේශ විනිමය කළමනාකරණය
- ගනුදෙනුකාර බැංකු සේවා සහ වෙළඳ සේවා
- විවිධාංගීකෘත ආයෝජන කළඹවල ආයෝජනය කිරීම
- උපදේශන සේවා
- භාරකාර පාලන සේවා

සේවා සපයන ප්‍රධාන ව්‍යාපාර අංශ

ශාඛා බැංකුකරණය
(පිටුව 56)

ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය
(පිටුව 58)

ජාත්‍යන්තර භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම්
(පිටුව 60)

සැකසුම්

- පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය (පිටු 62-80)
- සම්පත් විභාජනය (පිටුව 44)
- ආයතනික යහපාලනය (පිටුව 82)
- අවදානම් කළමනාකරණය (පිටුව 99)

උපායමාර්ගික ප්‍රවේශයන්



ප්‍රතිඵල

රු. බිලියන 260.5 (+15%)
පොළී ආදායම

රු. බිලියන 14.2 (+19%)
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම

රු. බිලියන 25.0 (+37%)
සේවකයින් සඳහා ආයෝජනය

රු. බිලියන 43.7 (+40%)
හානිකරණය

රු. බිලියන 43.2 (+83%)
බදු පෙර ලාභය (PBT)

රු. බිලියන 2,576.7 (+22%)
ණය කළඹ

රු. බිලියන 2,866.9 (+16%)
තැන්පතු පදනම

මිලියන 513.9 (+4%)
සිදුකරන ලද ගනුදෙනු ප්‍රමාණය

රු. මිලියන 79.5 (+6%)
ප්‍රජාවන් සඳහා ආයෝජනය

25,010.5 tCO_2 eqv. (+42%)
කාබන් විමෝචනය

ප්‍රතිලාභ

මූල්‍ය ප්‍රාග්ධනය
- මුළු ආදායම් වර්ධනය 18%
- වසර සඳහා ලාභය වැඩි වීම 83%
- වසර සඳහා ලාභාංශ වැඩි වීම 16%

නිෂ්පාදිත ප්‍රාග්ධනය
- ද්‍රේපළ, පිරියත හා උපකරණ වැඩි වීම 2%
- ඩිජිටල් ගනුදෙනු වැඩි වීම 43%
- ඩිජිටල් ලෙස ක්‍රියාකාරී ගනුදෙනුකරුවන්ගේ වැඩි වීම 13%

මානව ප්‍රාග්ධනය
- සේවකයින් වෙත නිර්මාණය කරන ලද අගය 37%
- සේවය හැර නොයාමේ ප්‍රතිශතය 0.1% කින් 99.5% දක්වා අඩු වීම
- මිනිස් පුහුණු පැය 176,418
- සේවක උසස්වීම් 729

සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය
- ප්‍රධාන නිෂ්පාදන/ සේවා කාණ්ඩවල වෙළඳපළ නායකත්වය පවත්වාගෙන යාම
- ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි
- දිගුකාලීන ආයතනික සමාජ මූලපිරීම් හරහා ප්‍රජා වටිනාකම් නිර්මාණය කිරීම

බුද්ධිමය ප්‍රාග්ධනය
- සන්නාමයේ වටිනාකම වැඩි වීම 12.5%
- ප්‍රධාන නිෂ්පාදන/ සේවා කාණ්ඩවල වෙළඳපළ නායකත්වය පවත්වාගෙන යාම

ස්වාභාවික ප්‍රාග්ධනය
- ණය ප්‍රදානයේදී පරිසරය, සමාජය සහ යහපාලනය පිළිබඳ තක්සේරුව
- අපගේ මෙහෙයුම්වල කාබන් පියසටහන වැඩි වීම 42%
- ණය තක්සේරුවේ දී හරිත ණය දීම සහ පාරිසරික සමාජ සහ කළමනාකරණ පද්ධති ඒකාබද්ධ කිරීම පිළිබඳ සලකා බැලීම්

ලංකා බැංකුවෙහි වටිනාකම් පරිවර්තන ක්‍රියාවලිය

සම්පත් යෙදවුම්

මූල්‍ය අතරමැදියෙකු ලෙස, ආයෝජන සඳහා අතිරික්ත අරමුදල් ඇති තැන්පත්කරුවන්/ අරමුදල් සපයන්නන් සමඟ එක්ව පුද්ගලයන්ගේ සහ ව්‍යාපාරවල අරමුදල් අවශ්‍යතා සපුරාලීම ලංකා බැංකුවෙහි මූලික අරමුණ වේ. රාජ්‍ය බැංකුවක් ලෙස, ජාතික මෙහෙවරට සහය දීමේදී මහජන උපයෝගිතා, අත්‍යවශ්‍ය ආනයන සැපයීම සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රාජ්‍ය අංශයට අරමුදල් සැපයීම, සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ මූල්‍ය නිදහස සහ මූල්‍ය ඇතුළත් කිරීම් සඳහා පහසුකම් සැලසීම තුළින් ආර්ථික සංවර්ධනය සඳහා ලංකා බැංකුව වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම බැංකුව සිය ගනුදෙනුකරුවන් සහ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ පෝෂණය කර ඇති සබඳතා මත රඳා පවතී. ණය ගැනුම්කරුවන්ට අරමුදල් ලබා දීමේ දී ප්‍රාග්ධනය, ණය ගැනීම් සහ ගනුදෙනුකාර තැන්පතු වැනි මූල්‍ය සම්පත් උපයෝගි කර ගනී. මෙම ක්‍රියාවලිය බල ගැන්වෙන්නේ ලංකා බැංකුවේ කාර්ය මණ්ඩලය මගිනි. බැංකුවේ ශාඛා ජාලය මෙන්ම ඩිජිටල් සහ අතථ්‍ය බෙදාහැරීමේ නාලිකා තුළින් මෙය පහසු කෙරේ.

අගය නිර්මාණය කිරීම

ණය දීම, තැන්පතු ආයෝජනය දිරි ගැන්වීම, ගනුදෙනුකාර බැංකු සේවා සහ වෙනත් සේවාවන් යන බැංකුවේ ව්‍යාපාරික ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ව්‍යාපාර අංශ තුනක් හරහා ලබා දෙනු ලැබේ (ශාඛා බැංකුකරණය, ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය සහ ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම්). බැංකුවේ ප්‍රධාන මෙහෙයුම් කටයුතු මෙහෙයවනු ලබන්නේ ගනුදෙනුකාර කේන්ද්‍රීය බව, ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය, ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය, කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩ නැඟීම, ස්ථාවරත්වය, යහපාලනය හා තිරසාර වර්ධනය යන උපායමාර්ගික ප්‍රවේශයන් පහ මත කේන්ද්‍රගත වන උපායමාර්ගික සැලැස්ම මඟිනි. මෙම පරිවර්තන ක්‍රියාවලියට ප්‍රශස්ත සම්පත්, ශක්තිමත් පාලන පිළිවෙත් සහ ක්‍රියාකාරී අවදානම් කළමනාකරණය අවශ්‍ය වේ.

ප්‍රතිඵල සහ ප්‍රතිලාභ

ව්‍යාපාර ක්‍රියාකාරකම් ඒකාබද්ධ වී පොළී ආදායම, ගාස්තු සහ කොමිස් ආදායම සහ වෙනත් ආදායම් ආකාරයෙන් ප්‍රධාන ප්‍රතිඵල කිහිපයක් ජනනය කරයි. දිගුකාලීනව, නිමැවුම් සහ ව්‍යාපාරික ක්‍රියාකාරකම් වලින් පැන නඟින ප්‍රතිවිපාක අපගේ විවිධ පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිඵල ජනනය කරයි.

එකතු කළ අගය මත වාර්තාව

බැංකුවේ අගය එක් කිරීම සහ ප්‍රධාන පාර්ශ්වකරුවන් සඳහා එම අගය විසර්ජනය වන ආකාරය පිළිබඳ විශ්ලේෂණයක් පහත දැක්වේ

	2021 රු. මිලියන	2020 රු. මිලියන	වෙනස %
එකතු කළ අගය			
බැංකු සේවා කටයුතු සැපයීමෙන් ලද ආදායම	284,832	243,619	17
සේවා සැපයීමේ පිරිවැය	(140,946)	(148,412)	(5)
බැංකු සේවා තුළින් එකතු කළ අගය	143,886	95,207	51
බැංකු සේවා නොවන ආදායම	5,531	3,545	56
ණය හා අනෙකුත් අලාභ සඳහා හානිකරණ වෙන් කිරීම්	(43,734)	(31,232)	40
අගය එකතු කිරීම	105,683	67,520	51
අගය විසර්ජනය			
සේවකයන්ට			
වැටුප්, වේතන හා අනෙකුත් ප්‍රතිලාභ	24,982	18,190	37
රජයට			
ශ්‍රී ලංකා රජයට ගෙවූ ලාභාංශ	1,846	1,596	16
ආදායම් බදු	9,836	8,502	16
මූල්‍ය සේවා සඳහා බදු	9,027	5,458	65
	20,710	15,557	33
ප්‍රජාව වෙත			
සමාජ වගකීම් ව්‍යාපෘති	80	75	5
බාහිර අරමුදල් සපයන්නන්ට			
සෙසු ණය ගැනීම් උදෙසා පොළිය	16,944	9,554	77
නිකුත් කළ ණයකර සඳහා පොළිය	7,314	6,436	14
	24,258	15,990	52
ව්‍යාප්තිය හා වර්ධනය උදෙසා			
රඳවා ගත් ලාභය	35,744	16,169	121
ක්ෂය කිරීම් හා ක්‍රමක්ෂය	4,146	4,255	(3)
විලම්බිත බදු	(4,237)	(2,714)	56
	35,653	17,709	101
	105,683	67,520	57

එකතු කළ ආර්ථික අගය (EVA) මඟින් ආයතනයක සත්‍ය ආර්ථික ලාභය පෙන්නුම් කරයි. සංසන්දනාත්මක අවදානමේදී කොටස්හිමියාගේ අවම ප්‍රතිලාභය ඉක්ම වූ හෝ අඩු වූ ඉපැයුම් අගය සඳහා ඇස්තමේන්තුවක් මෙමඟින් ලබා දේ.

	2021 රු. මිලියන	2020 රු. මිලියන
ආයෝජිත ප්‍රාග්ධනය		
කොටස්හිමියන්ගේ අරමුදලේ සාමාන්‍ය	177,090	149,471
එකතු කළා: ණය අලාභයන් සහ හානිකරණයන් සඳහා ප්‍රතිපාදනයන්හි එකතුව	162,906	126,796
	339,996	276,267
ආයෝජිත ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ		
බදු පසු ලාභය	37,590	17,765
එකතු කළා: ණය අලාභයන් සඳහා ප්‍රතිපාදන සහ අනෙකුත් අලාභයන්	43,734	31,232
අඩු කළා: ණය කපාහැරීම්	(77)	(1)
ආයෝජිත ප්‍රාග්ධනය මත මුළු ප්‍රතිලාභය	81,247	48,996
ආයෝජිත ප්‍රාග්ධනයෙහි ආවස්ථික පිරිවැය*	(19,210)	(17,405)
එකතු කළ ආර්ථික අගය	62,037	31,592
	5.65%	6.30%

* බර තැබූ සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් (මාස 12) අනුපාතය මත පදනම්ව ගණනය කරයි 2021 - 5.65% (2020 - 6.30%)

අපගේ ආර්ථික බලපෑම

වසර තුළ ශ්‍රී ලංකා ආර්ථිකය නොයෙකුත් සංකීර්ණතා සහ ප්‍රබල ආර්ථික අභියෝග සමඟ ගැටී ඇති හෙයින්, බාධාවකින් තොරව බැංකු සේවාව ලබාදීම හරහා රටට අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා අබණ්ඩව පවත්වාගෙන යාම සහ සාර්ව ආර්ථික ස්ථාවරත්වය පවත්වාගෙන යෑම ලංකා බැංකුව මගින් අපේක්ෂා කරන ලදී. ඒ අනුව දිවයින පුරා ආර්ථික ක්‍රියාකාරකම් සහ මූල්‍ය ගනුදෙනු මෙහෙයවීමේදී බහුවිධ කර්යභාරයක් ඉටු කළ නිසා බැංකුව මඟින් ඉටුකරන ලද ආර්ථික දායකත්වය වසර පුරාම වර්ධනය වනු දැකගත හැකි විය.



මෙහෙයුම් සන්දර්භය

ආර්ථික පරිසරය

ගෝලීය ආර්ථිකය

සම්ප්‍රේෂණ හැකියාව ඉහළ නව කොවිඩ්-19 ප්‍රභේද මතුවීම ගෝලීය ආර්ථිකය ප්‍රකෘතිමත් වීමේ වේගය දුර්වල කර ඇත. කොවිඩ්-19 එන්නත් සඳහා ප්‍රවේශය සමඟ ප්‍රතිපත්ති මඟින් ලබා දෙන සහයෝගය කලාප සහ ජාතීන් අතර ආර්ථික වර්ධනයේ ප්‍රධාන නිර්ණායකය වී ඇත. නැගී එන වෙළඳපළවල උග්‍ර වසංගත ගතිකතාවයන් සහ දියුණු ආර්ථිකයන්හි සැපයුම් බාධා හේතුකොට ගෙන 2022 දී 4.9% දක්වා මධ්‍යස්ථ වීමට පෙර 2021 දී ගෝලීය ආර්ථිකය 5.9% කින් වර්ධනය වනු ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) පුරෝකථනය කරයි.

ශ්‍රී ලංකා ආර්ථිකය

පෙර නොවූ විරූ ප්‍රතිපත්ති උත්තේජක, වර්ධනය වී පැවති ඉල්ලුම මුදා හැරීම සහ පශ්චාත් වසංගත යථාර්ථයන් වෙත ව්‍යාපාර අනුවර්තනය පිළිබිඹු කරමින් 2021 මුල් භාගයේ ශක්තිමත් ප්‍රකෘතිමත් වීමක් දේශීය ආර්ථිකය වාර්තා කර ඇත. කෙසේ වෙතත්, ආසාදන නැවත ඇතිවීම හා සමගාමීව දෙවන භාගයේ සීමාවන්, වසර, 2021 තුන්වන කාර්තුවේදී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය 1.5% කින් හැකිලීම් සඳහා හේතු විය. සමස්තයක් වශයෙන්, 2021 වසර තුළ රටේ දළ දේශීය නිෂ්පාදිතය 3.7% ක වර්ධනයක් වාර්තා කර ඇත.

මුදල් ප්‍රතිපත්තිය

ඉහළ යන උද්ධමන පීඩනය හමුවේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 තුන්වන කාර්තුව සිට මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමට උත්සහ කල අතර නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය, නිත්‍ය ණය පහසුකම් අනුපාතය, බැංකු අනුපාතය සහ රුපියල් වගකීම් මත ව්‍යාවස්ථාපිත සංචිත අනුපාතය වැඩි කර ඇත. මෑත වසරවල චේතිහාසික වශයෙන් අඩු පොළී අනුපාත අනුගමනය කිරීමට එරෙහිව 2021 අවසන් මාස කිහිපය තුළ වෙළඳපළ පොළී අනුපාත ඉහළ යාමක් වාර්තා කළේය. මේ අතර, සැපයුම් අංශයේ බාධා ගෝලීය භාණ්ඩ මිල ඉහළ යාම සහ ඇතැම් මිල පාලනයන් ඉවත් කිරීම හේතුවෙන් වසර තුළ උද්ධමන මට්ටම ඉහළ ගියේය. ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) වසරින් වසර (YoY) 14% කින් ඉහළ ගිය අතර වාර්ෂික සාමාන්‍යය වසරින් වසර (YoY) 7% ක වැඩි වීමක් වාර්තා කළේය.

බාහිර අංශය

ප්‍රධාන මූලාශ්‍ර වෙළඳපළවල් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමෙන් පසුව, වසර තුළ ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයනය 24% කින් වැඩි විය. අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම් තිබියදීත්, රටේ ආනයන ද 29% කින් වැඩි වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳ හිඟය 35% කින් පුළුල් විය. සේවක ප්‍රේෂණවල වසරින් වසර (YoY) 38% ක පහත වැටීමක් හා සංචාරක ඉපැයීම්වල තියුණු පහත වැටීමත් සමඟ එහි ප්‍රතිඵලයක් ලෙස එම කාල සීමාව තුළ සමස්ත ගෙවුම් ශේෂ හිඟය 57% කින් ඉහළ ගියේය. සෘජු ප්‍රේෂණ විධිමත් මාර්ග හරහා ගලා ඒම සඳහා රජයේ උත්සාහයන් සහ සංක්‍රමණික මූලාශ්‍ර වෙලඳපලවල් ක්‍රමානුකූලව විවෘත කිරීම හරහා කෙටි කාලීන සිට මධ්‍ය කාලීන ප්‍රේෂණ නැවත ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

මේ අතර, අපනයනකරුවන්ගේ සීමිත පරිවර්තන, සමපේක්ෂන වෙළඳාම සහ විදේශ විනිමය ඉපැයීම්වල තියුණු පහත වැටීම පිළිබිඹු කරමින් වසර තුළ ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු අස්ථාවරත්වයක් වාර්තා කළේය. ඒ අනුව, 2021 දෙසැම්බර් වන විට රුපියල ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව 8% කින් අවප්‍රමාණය විය.

රාජ්‍ය මූල්‍ය තත්ත්වය

කොවිඩ්-19 හේතුවෙන් රාජ්‍ය ආදායමට අහිතකර ලෙස බලපාන බාධා කිරීම් හා පොළී ගෙවීම් සහ වැටුප් හා වේතන ප්‍රසාරණය වීම හේතුවෙන් වියදම් ඉහළ යාම සමඟ වසර තුළදී රටේ මූල්‍ය තත්ත්වය පිරහුණි. ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආයතන (මූඩීස්, එස් ඇන්ඩ් පී, ෆිච් රේටින්ග්ස් සහ ෆිච් රේටින්ග්ස්) විසින් වසර තුළදී රටේ ස්වෛරී ශ්‍රේණිගත කිරීම පහත හෙලනු ලැබුවේ, රටේ දුර්වල වන බාහිර තත්ත්වය සහ ණය බර පිළිබඳ උත්සුකයන් උපුටා දක්වමිනි. කෙසේ වෙතත්, රජය මේ දක්වා තිබෙන කාලානුරූපී ණය ගෙවීම් පිළිබඳ වාර්තාව පවත්වා ගනිමින් එහි සියලුම ණය සේවා වගකීම් මේ දක්වාම පොරොන්දු වූ පරිදි ඉටුකර ඇත.

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය



පොළී අනුපාත



විදේශ වෙළඳාම



PESTEL විශ්ලේෂණය

මෙම විශ්ලේෂණය මගින් වටිනාකම් උත්පාදනය සඳහා බැංකුවේ ශක්‍යතාවයට කෙටිකාලීන, මධ්‍ය කාලීන සහ දිගුකාලීන වශයෙන් බලපෑමක් ඇති කළ හැකි ප්‍රමාණාත්මක අවදානම් සහ අවස්ථා හඳුනාගැනීමට ඉඩ සැලසෙයි. වසර තුළ බැංකුවේ උපායමාර්ග සහ කාර්යසාධනය කෙරෙහි බලපෑ ප්‍රධාන සාධක පහත සාරාංශගත කර ඇත.

දේශපාලන

- ප්‍රධාන සමුද්‍ර මාර්ගයන්ට ආසන්නව ශ්‍රී ලංකාවේ උපායමාර්ගික ස්ථානගත වීම මත පදනම් වූ භූ දේශපාලනික වැදගත්කම.
- ආසියාවේ ප්‍රබල රටවල්, චීනය සහ යුරෝපීය හා බටහිර ජාතීන්ගේ හවුල්කාරිත්වය සමඟ රටේ සමීප සබඳතා, වෙළඳාම සඳහා සැලකිය යුතු අවස්ථා ලබා දී ඇත.
- දේශීය නිෂ්පාදන ශක්තිමත් කිරීම සහ අපනයන ඉහළ නැංවීම කේන්ද්‍ර කර ගනිමින් තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක කිරීම සහ දේශපාලන ස්ථාවරත්වය.
- ශ්‍රී ලංකා මහ බැංකුව වසංගතයෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර සඳහා ලබා දී ඇති ණය සහන කාල සීමාවන් සහ ගෙවීම් ප්‍රමාද කිරීමේ සහන කාලයන් දීර්ඝ කිරීම මගින් අඛණ්ඩව සහාය ලබාදීම.

ආර්ථික

- 2021 වසරේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට වසංගතය මුල් කරගත් බාධා කිරීම් සහ බාහිර අංශයේ ආතතිය.
- මූල්‍ය ප්‍රතිපත්තිය දැඩි කිරීමට ගත් උත්සාහයත් සමඟ පොළී අනුපාත ක්‍රමයෙන් ඉහළ යාම.
- සැපයුම් දාමයේ බාධා වීම්, ගෝලීය භාණ්ඩ මිල වැඩිවීම සහ ශ්‍රී ලංකා රුපියල ක්ෂය වීම සමඟ උද්ධමන මට්ටම ඉහළ යාම.
- අඩුවෙමින් පවතින විදේශ මුදල් සංචිත සහ ජාත්‍යන්තර ණය ගෙවීමේ බැඳීම් හේතුවෙන් බාහිර ගෙවුම් ශේෂය මත ආතතිය.

සමාජීය

පාරිභෝගික මනාපය

- බැංකු ගනුදෙනුකරුවන් වැඩි වැඩියෙන් බාධාවකින් තොරව, පහසු සහ පුද්ගලාරෝපිත විසඳුම් ඉල්ලා සිටී. මෙය ගනුදෙනුකරුවන් බැංකු සමඟ අන්තර් ක්‍රියා කරන ආකාරය සම්පූර්ණයෙන්ම පරිවර්තනය කර ඇති අතර තරුණ ජන විකාශනය විනිවිද යාමේ තීරණාත්මක සාධකයකි.
- ආකල්ප සහ ජීවන රටා වෙනස්වීම් ද ගෘහස්ථ පරිභෝජන රටාවේ සැලකිය යුතු වෙනස්කම් ඇති කරන අතර, එමගින් විශේෂිත නිෂ්පාදන සහ සේවා කාණ්ඩවල වර්ධනය සඳහා අවස්ථා සපයයි.

කුසලතා ආකර්ෂණය සහ රඳවා තබා ගැනීම

- අනාගත යෝග්‍යතාවය පවත්වා ගැනීම සඳහා බැංකු පරිවර්තනය විය යුතු බැවින්, ඩිජිටල් සහ විශ්ලේෂණ කුසලතා කෙරෙහි අවධානය යොමු කරමින් සේවකයින්ගේ අවශ්‍ය කුසලතා සංයුතිය ද වෙනස් වී ඇත.

තාක්ෂණය

- කොවිඩ් -19 වසංගතය පැතිර යාමෙන් සහ පෙර නොවූ විරූ ලෙස ඩිජිටල් වේදිකා වෙතට ගනුදෙනුකරුවන් හුරුවීමෙන් පසුව, බැංකු සඳහා ප්‍රධාන උපාංගයක් ලෙස ඩිජිටල් සේවා මතු වී තිබේ.
- රොබෝ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය (RP) සහ කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය වැනි තාක්ෂණයන් යෙදවීම හරහා කාර්යක්ෂම මෙහෙයුම් ආකෘති ගොඩනැගීමට බැංකු වැඩි වැඩියෙන් උත්සහ කර ඇත.
- Blockchain, කෘතිම බුද්ධිය සහ ක්ලවුඩ් පරිඝණක තාක්ෂණය වැනි නැඟී එන තාක්ෂණයන් බැංකුකරණයේ බොහෝ අංශ පරිවර්තනය කරයි, මෙහෙයුම් කාර්යක්ෂමතාව සඳහා අවස්ථා සපයයි, පිරිවැය අඩු කරයි, ගනුදෙනුකරුවන් සමඟ අන්තර් ක්‍රියා කිරීම සහ සම්පත් ප්‍රශස්ත කරයි.

නීතිය

- බැංකු පද්ධතියෙන් විදේශ මුදල් ගලා යාම සීමා කිරීම සඳහා රෙගුලාසි කිහිපයක් හඳුන්වා දෙන ලදී.
- පවතින නිරෝධාන ඇඳිරි නීති කාලසීමාව තුළ බැංකු සේවා සැපයීම
- බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ උපදෙස්
- ශ්‍රී ලංකාවේ විදේශ විනිමය තත්ත්වය ආරක්ෂා කිරීම අරමුණු කර ගත් විදේශ විනිමය රෙගුලාසි
- කොවිඩ්-19 මගින් බලපෑමට ලක් වූ ව්‍යාපාර සඳහා ණය සහන සහ ණය ගෙවීමේ සහන පමා කාල දීර්ඝ කිරීම
- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට සහ කෘෂිකාර්මික අංශයට ප්‍රමුඛ අංශයේ ණය දීමේ ඉලක්ක
- තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා නියාමන රාමුව
- ණය ගැතියන්ට එරෙහිව අයකර ගැනීමේ ක්‍රියාමාර්ග කල් දැමීම

පාරිසරික

- අද වන විට සංවිධාන සහ ප්‍රජාවන් මුහුණ දෙන බරපතලම අවදානම් අතර පාරිසරික අවදානම ඇතුළත් වේ. 2021 සඳහා වන ලෝක ආර්ථික සංසදයේ ගෝලීය අවදානම් වාර්තාවට අනුව බලපෑම් සහ සම්භාවිතාව යන දෙඅංශයෙන්ම ඉහළම අවදානම් ලෙස ප්‍රමුඛත්වය දී ඇත්තේ ආන්තික කාලගුණික සහ දේශගුණික ක්‍රියාකාරකම් හි අහිතකර තත්ත්වයන් මතය.
- සමාජීය සහ පාරිසරික නිර්ණායක ඇතුළත් වගකීම් සහිත ණය අනුමත කිරීමේ තීරණ හරහා ප්‍රායෝගික සහ දිගුකාලීන විසඳුම් සැපයීමේ දී අප වැනි බැංකු ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- වගකිවයුතු ණය දීමේ පිළිවෙත් සහ ප්‍රතිපත්ති අනුගමනය කිරීම හරහා වඩාත් පරිසර හිතකාමී විසඳුම් සඳහා ගනුදෙනුකරුවන්ට බලපෑම් කිරීමේ හැකියාව බැංකුව සතු වේ.

PESTEL විශ්ලේෂණය

බැංකුවෙහි උපායමාර්ග සහ කාර්යසාධනය කෙරෙහි බලපෑම

ඉහත විස්තර කර ඇති පරිදි මෙහෙයුම් පරිසරයේ ප්‍රවණතා බැංකුවේ උපායමාර්ග සහ කාර්යසාධනය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරන අතරම එහි වටිනාකම් නිර්මාණය සඳහා අවස්ථා සහ අවදානම් යන දෙකම ඉදිරිපත් කරයි. මෙම බලපෑම් පහත සාරාංශගත කර ඇත:

විභව බලපෑම්

- විදේශ මුදල් හිඟය ආනයන පරිමාව, ආනයන ආශ්‍රිත ගාස්තු සහ කොමිස් ආදායම කෙරෙහි නොවැළැක්විය හැකි බලපෑම් සහ විදේශීය ගනුදෙනු සඳහා අරමුදල් සැපයීමේ අභියෝගවලට හේතු විය.
- ආර්ථික කටයුතුවල සිදුවූ බලපෑම මත ණය ආපසු ගෙවීමේ හැකියාව මත පීඩනයක් ඇති විය හැකි අතර, ණය කළඹේ ගුණාත්මක භාවයට අහිතකර ලෙස බලපායි.
- පොළී අනුපාතිකය ඉහළ යාම පොළී ආන්තිකය මත පීඩනයක් ඇති කිරීමට ඉඩ ඇත
- තාක්ෂණික සහ ඩිජිටල් සේවාවල වර්ධනය බාධාවකින් තොරව සේවා ලබා දීම හරහා ගනුදෙනුකරුවන්ගේ අගය නිර්මාණයට රුකුලක් ලබාදේ.
- ඩිජිටල් සේවා සැපයීම හරහා උද්ගත වන අවදානම් හමුවේ තරඟකාරී තත්ත්වය පවත්වා ගැනීමට අවශ්‍ය වන වේගවත් බව සහ අනුවර්තනය වීම
- තිරසාර භාවිතයන් අනුගමනය කිරීම තුළින් බැංකුවට හරිත ණය දීම ඉලක්ක කරගත් අරමුදල් මාර්ග වෙත ප්‍රවේශය වැඩි කළ හැක



අවස්ථාවන්

- කොවිඩ්-19 මගින් බලපෑමට ලක් වූ ව්‍යාපාර පුනර්ජීවනය කිරීමට සහ පාරිභෝගික සබඳතා ශක්තිමත් කිරීමට ණය සහන හරහා සහය වීම
- ජාතික න්‍යාය පත්‍රයට සමගාමීව, අපනයන අංශයේ වර්ධන අවස්ථා
- අසමසම ගනුදෙනුකාර පදනම හරහා ඩිජිටල් සාක්ෂරතාවය මෙහෙයවීම
- සුදුසු පුහුණු මැදිහත්වීම් හරහා ක්‍රියාශීලී සහ ගතික ශ්‍රම බලකායක් ගොඩනැගීම
- ක්‍රියාවලි කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා තාක්ෂණය පදනම් වූ අවස්ථා සහ පිරිවැය තාර්කිකකරණය
- ගනුදෙනුකාර අත්දැකීම් පරිවර්තනය කිරීම තුළින් තරඟකාරිත්වය තියුණු කිරීම
- ආයතනික උපායමාර්ග සඳහා තිරසාර උපායමාර්ග ඒකාබද්ධ කිරීමේ අවස්ථාව
- ජන ජීවන රටාව වෙනස් වීම නිසා ඇති වන අවස්ථා



අවදානම්

- විනිමය අනුපාතිකයේ අස්ථාවරත්වය සහ විදේශ මුදල් හිඟය නිසා ඇතිවන අවදානම්
- රටේ ස්වෛර් ශ්‍රේණිගත කිරීම පහත හෙළීම හේතුවෙන් විදේශ අරමුදල් ආකර්ෂණය කර ගැනීමේ අභියෝග
- ශුද්ධ පොළී ආන්තිකය (NIM) මත පීඩනය සහ ලාභදායීත්වයට බලපෑම
- තාක්ෂණයේ වෙනස් වීමේ ශීඝ්‍රතාව මත තාක්ෂණික යල්පැන යාම
- ඉහළ සේවය හැරයාමේ ප්‍රතිශතය විශේෂයෙන් තරුණ ප්‍රජාව අතර
- කෘෂිකාර්මික සැපයුම් දාම සහ නිමැවුම් මත දේශගුණික විපර්යාසවල ඇඟවුම් උත්සන්න වීමෙන් පැන නඟින අවදානම්
- ඩිජිටල්කරණයේ සැලකිය යුතු වර්ධනයක් හේතුවෙන් පැන නැගෙන සයිබර් ආරක්ෂණ තර්ජන

ප්‍රමාණාත්මකව වැදගත් කරුණු

ප්‍රමාණාත්මකව වැදගත් කරුණු මඟින් බැංකුවට වටිනාකම් නිර්මාණය කිරීමේ හැකියාව කෙරෙහි සැලකිය යුතු ලෙස බලපෑ හැකි අභ්‍යන්තර සහ බාහිර ගැටළු නියෝජනය කරයි. මෙම කරුණු කළමනාකරණය කිරීම අපගේ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම් සඳහා ඉතා වැදගත් වන අතර එබැවින් අපගේ උපායමාර්ග සහ මෙහෙයුම් සඳහා ඉතා වැදගත් වේ. ප්‍රමාණාත්මක මාතෘකා තීරණය කිරීම සඳහා බැංකුවේ ක්‍රියාවලිය පහත දැක්වේ.



2021 සඳහා ප්‍රමාණාත්මක තක්සේරුව 2020 දී හඳුනාගත් ප්‍රමාණාත්මක මාතෘකා මත විකාශනය වේ. අපගේ ප්‍රමාණාත්මක මාතෘකා වල සීමාවන් සහ අපගේ මෙහෙයුම් වල වෙනස්කම් වලට අනුකූලව අපි විෂය පථය ද සමාලෝචනය කළෙමු. අපගේ වාර්තාකරණ සීමාවන්ට සැලකිය යුතු වෙනස්කම් නොමැති බව තීරණය කරන ලදී.

අපගේ විශ්ලේෂණයේ දී මෙහෙයුම් කොන්දේසි බැංකුව සඳහා ඒවායේ අදාළත්වය තහවුරු කිරීම සඳහා අපගේ 2020 ප්‍රමාණාත්මක මාතෘකා නැවත බැලීමක් සිදු විය. පසුගිය වසරේ එකතු කරන ලද නව මාතෘකා දෙකෙන් එකක් වන ගනුදෙනුකාර සහය සහ ව්‍යාපාර පුනර්ජීවනය, දිගුකාලීන ඇඟවුම් අනුව, ප්‍රමාණාත්මක වැදගත් ලෙස දිගටම පවතී. කොවිඩ්-19 හි, නව ප්‍රභේද මතුවීමත් සමඟ සේවක සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ වැදගත්කම වැඩි වී ඇත. මේ අතර, රටේ පවතින ආර්ථික සංකීර්ණතා සහ අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගනිමින්, විශේෂයෙන්ම විදේශ විනිමය සම්බන්ධයෙන් ගත් කළ, ප්‍රමාණාත්මක වශයෙන් තවදුරටත් ඉහළ නංවා ඇති සාර්ව-ආර්ථික වර්ධනයන් සහ ප්‍රතිපත්ති වෙනස්කම් 2021 වසරේ වඩාත්ම ප්‍රමාණාත්මක කාරණා අතර ශ්‍රේණිගත කර ඇත. 2021 සඳහා බැංකුවේ ප්‍රමාණාත්මක ආකෘතිය මේ සමඟ ඉදිරිපත් කෙරේ.



ප්‍රමාණාත්මකව වැදගත් මාතෘකාව	මෙම මාතෘකාව ප්‍රමාණාත්මකව වැදගත් වන්නේ ඇයි	ප්‍රමාණාත්මක බව වෙනස් වීම	අනුරූප වාර්තාකරණ ප්‍රමිතීන් (GRI, CSE-ESG මාර්ගෝපදේශය, වාණිජ බැංකු සඳහා SASB ප්‍රමිතීන්)
1. **ගනුදෙනුකාර සහය සහ ව්‍යාපාර පුනර්ජීවනය**	පහසුකම් ප්‍රතිනිර්මාණය කිරීම/ ප්‍රතිව්‍යුහගත කිරීම, මුදල් ප්‍රවාහය අධීක්ෂණය සහ මූල්‍ය ප්‍රවේශය හරහා ව්‍යාපාරික පුනර්ජීවනයට සහය වෙමින් අපි රටේ ආර්ථිකය ප්‍රකෘතිමත් භාවයක් පත්කිරීමට අඛණ්ඩව නායකත්වය ලබා දී ඇත.	-	SASB FN-CB-240a.2: මූල්‍ය ඇතුළත් කිරීම් සහ හැකියාවන් ගොඩනැඟීම
2. **සේවකයින්ගේ සෞඛ්‍යය හා ආරක්ෂාව**	ආසාදන තත්ත්වය වරින් වර ඉහළ යාම හේතුවෙන්, සේවක සෞඛ්‍යය සහ ආරක්ෂාව සහතික කිරීම 2021 දී තීරණාත්මක ප්‍රමුඛතාවයක් ලෙස පවතී.	▲	GRI 403: වැඩ පරිසරය තුළ සෞඛ්‍යය සහ ආරක්ෂාව
3. **සාර්ව ආර්ථික හා ප්‍රතිපත්තිමය ප්‍රවණතා**	ශ්‍රී ලංකාවේ ආර්ථිකයට බලපාන බහුවිධ අභියෝග සහ ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති වර්ධනයන් මූල්‍ය අංශයේ මෙහෙයුම්, කාර්යසාධනය සහ තිරසාරත්වය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරයි.		
4. **කුසලතා කළමනාකරණය සහ කම්කරු සබඳතා**	අපගේ උපායමාර්ගය මෙහෙයවීම සඳහා අපගේ වටිනාම වත්කම් වලින් එකක් වන සේවකයින් අත්‍යවශ්‍ය වන අතර සේවක සම්බන්ධ ගැටළු ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ වැදගත්කම අවධාරණය කෙරේ.	-	GRI 401: සේවා නියුක්තිය GRI 402: කම්කරු/ කළමනාකරණය සබඳතා GRI 404: පුහුණුව සහ අධ්‍යාපනය GRI 407: ඇසුරු කිරීමේ නිදහස සහ සාමූහික කේවල් කිරීම
5. **විවිධත්වය හා සමාන අවස්ථා**	සේවකයින්ට අභිවෘධිය සහතික කරන විවිධ වූ ශක්‍යතා වලින් හෙබි ශ්‍රම බළකායක් නිර්මාණය කිරීමට අපි කැපවී සිටිමු	-	GRI 405: විවිධත්වය හා සමාන අවස්ථා

ප්‍රමාණාත්මක වැදගත් කරුණු

ප්‍රමාණාත්මකව වැදගත් මාතෘකාව	මෙම මාතෘකාව ප්‍රමාණාත්මකව වැදගත් වන්නේ ඇයි	ප්‍රමාණාත්මක බව වෙනස් වීම	අනුරූප වාර්තාකරණ ප්‍රමිතීන් (GRI, CSE-ESG මාර්ගෝපදේශය, වාණිජ බැංකු සඳහා SASB ප්‍රමිතීන්)
6. **ගනුදෙනුකාර අත්දැකීම්**	ගනුදෙනුකාර සේවය ශ්‍රී ලංකාවේ ඉතා තරඟකාරී වන බැංකු ක්ෂේත්‍රයේ ප්‍රධාන නිර්ණායකය ලෙස මතු වී ඇත	-	
7. **ගනුදෙනුකාර රහස්‍යතාවය සහ දත්ත සුරක්ෂිතභාවය**	ඩිජිටල්කරණය කෙරෙහි ඇති දැඩි නැඹුරුව ගනුදෙනුකරුවන්ගේ පෞද්ගලිකත්වය සහ ආරක්ෂක ගැටළු වලට ඇති අවදානම ඉහළ නංවා ඇති අතර එමනිසා තොරතුරු තාක්ෂණ ආරක්ෂණ රාමු ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.	-	GRI 418: ගනුදෙනුකාර රහස්‍යතාවය SASB FN-CB-230a.2: දත්ත සුරක්ෂිතභාවය
8. **වගකිවයුතු බැංකුකරණය**	වගකීම් සහගත ණය දීමේ පිළිවෙත් සමාජ-ආර්ථික වෙනසක් ඇති කිරීමේ බැංකුවේ හැකියාව තහවුරු කරයි	-	GRI 417: අලෙවිකරණය සහ ලේබල් කිරීම
9. **මූල්‍ය කාර්යසාධනය**	අපගේ වාණිජ තිරසාරභාවය, පාර්ශ්වකරුවන්ට අඛණ්ඩ වටිනාකම් උත්පාදනය සහතික කිරීමේ දී තීරණාත්මක වේ	-	
10. **සමාජ ආර්ථික දායකත්වය සහ මූල්‍ය ඇතුළත් කිරීම**	රජය සතු බැංකුවක් ලෙස, දිවයින පුරා මූල්‍ය ඇතුළත් කිරීම් සහ සමාජ-ආර්ථික සවිබල ගැන්වීම සඳහා ලංකා බැංකුවෙහි කාර්යභාරය සම්ප්‍රදායික බැංකුකරණයෙන් ඔබ්බට විහිදේ.	-	GRI 201: ආර්ථික කාර්යසාධනය GRI 202: වෙළඳපළ පැවැත්ම GRI 413: දේශීය ප්‍රජාවන් GRI 203: වක්‍ර ආර්ථික බලපෑම් SASB N-CB-240a.3: මූල්‍ය ඇතුළත් කිරීම් සහ ධාරිතාව ගොඩනැගීම SASB FN-CB-240a.4: මූල්‍ය ඇතුළත් කිරීම් සහ ධාරිතාව ගොඩනැගීම
11. **නියාමන පරිසරය, පාලනය සහ අනුකූලතාවය**	ශක්තිමත් අනුකූලතා සංස්කෘතියක් සහ ශක්තිමත් ආයතනික පාලන භාවිතයන් අපගේ වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියට දායක වේ.	-	GRI 207: බදු GRI 419: සමාජ ආර්ථික අනුකූලතාව GRI 307: පාරිසරික අනුකූලතාවය
12. **වගකිවයුතු ප්‍රසම්පාදනය**	අපි, සැපයුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සමඟ සම්බන්ධ වන අතර තිරසාර භාවිතයන් ප්‍රචාරණය කිරීම හරහා ප්‍රසම්පාදනයේදී වගකීම් සහගත පරිචයන් සහතික කරමු.	-	GRI 204: ප්‍රසම්පාදන පිළිවෙත්
13. **අල්ලස් හා දූෂණ විරෝධී**	රජය සතු ආයතනයක් ලෙස, හවුල් වටිනාකම් වගකීමෙන් නිර්මාණය කිරීමේදී අල්ලස හා දූෂණ විරෝධී සංස්කෘතියක් පෝෂණය කිරීම ඉතා වැදගත් වේ.	-	GRI 205: දූෂණ විරෝධී GRI 406: වෙනස්කම් නොකිරීම SASB FN-CB-510a.2: ව්‍යාපාරික ආචාරධර්ම
14. **කම්කරු අයිතිවාසිකම් (බාහිරින් ලබාගත්/ කොන්ත්‍රාත්තු)**	ශ්‍රමයේ ගෞරවය ආරක්ෂා කිරීමට සහ අප ආයතනයේ සේවයේ නියැලී සිටින සියලුම බාහිරින් ලබා ගත් සහ කොන්ත්‍රාත් සේවකයින් සඳහා හිතකර සේවා පරිසරයක් සැපයීමට බැංකුව කැපවී සිටී.	-	GRI 408: ළමා ශ්‍රමය GRI 409: බලහත්කාරයෙන් හෝ අනිවාර්ය ශ්‍රමය
15. **ඩිජිටල්කරණය සහ තාක්ෂණය**	ඩිජිටල් විශිෂ්ටත්වය ළඟාකර ගැනීම බැංකුවේ ප්‍රධාන උපායමාර්ගික අපේක්ෂාවකි	-	
16. **දේශගුණික විපර්යාස සහ පාරිසරික පියසටහන්**	තිරසාර භාවිතයන් ප්‍රචාරණය කිරීමේදී හරිත ණය දීම හරහා අපගේ මෙහෙයුම්වල පාරිසරික බලපෑම අඩු කිරීමට අපි කැපවී සිටිමු	-	GRI 302: බලශක්තිය GRI 305: විමෝචනය SASB FN-CB-410a.2: ණය විශ්ලේෂණය සඳහා පාරිසරික සමාජ සහ යහපාලන සාධක ඇතුළත් කිරීම
17. **වෙළඳ නාමයේ කීර්තිය**	ශ්‍රී ලංකාවේ අංක 1 බැංකු සන්නාමය ලෙස අඛණ්ඩව ශ්‍රේණිගත කර ඇති බැංකු සන්නාමය අපගේ ශක්තිමත් වෙළඳපළ තත්ත්වය යටතේ පවතින තරඟකාරීත්වයේ ප්‍රධාන මූලාශ්‍රයකි.	-	



ලංකා බැංකුව විසින් නැගී එන සහ දැනට ව්‍යාපාර ක්ෂේත්‍රයේ කටයුතු කරන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා දිරි දෙමින් මෙම අභියෝගාත්මක ආර්ථික සහ ව්‍යාපාර පරිසරය තුළ නොසැලී ඉදිරියට යාමට අවශ්‍ය මූල්‍ය ශක්තිය සහ උපදෙස් සපයනු ලැබීය.

පරිවර්තනීය උපායමාර්ගය

තුන් අවුරුදු ආයතනික සැලැස්මක් සැකසීමෙන් අපේක්ෂිත අරමුණ කරා ළඟා වන ආයතනික උපායමාර්ග නිර්ණය කිරීමේදී බැංකුව පරිපූර්ණ ක්‍රියාවලියක් අනුගමනය කරයි. මෙහෙයුම් පරිසරයේ ගතිකත්වය වෙනස් වීමත් ඒ හා සැබැඳි අදාළත්වය සහතික කිරීම සඳහාත් මෙම සැලැස්ම වාර්ෂිකව සමාලෝචනය කර සංශෝධනය කරනු ලැබේ.

ලංකා බැංකුවේ උපායමාර්ගයෙහි අරමුණ වන්නේ මෙහෙයුම් පරිසරයේ ශීඝ්‍ර වෙනස්වීම් වලට අනුවර්තනය වීමට හැකියාව ඇති අනාගතයට ගැළපෙන තරඟකාරී ආයතනයක් බවට බැංකුව පරිවර්තනය කිරීම සඳහා ශක්තිමත් වෙළඳපළ තත්ත්වය වැනි විහි ආවේනික ශක්තීන් උපයෝගී කර ගැනීමයි. මෙම පරිවර්තනීය උපායමාර්ගය 2018 දී දියත් කරන ලද අතර බැංකුවේ උපායමාර්ගික සැලසුමේ කොටසක් ලෙස එය වාර්ෂිකව සමාලෝචනය කර සංශෝධනය කරනු ලැබේ.

අපගේ වර්තමාන තත්ත්වය

ශක්තීන්

- වත්කම්, තැන්පතු, ණය, අභ්‍යන්තර ප්‍රේෂණ සහ ගනුදෙනුකරුවන් ප්‍රමාණය මත වෙළඳපළ ප්‍රමුඛයා
- අසමසම ශාඛා ජාලය
- රටේ ප්‍රමුඛතම බැංකු සන්නාමය
- රාජ්‍ය හිමිකාරිත්වය හා සම්බන්ධ විශ්වසනීයත්වය
- ජාත්‍යන්තර ව්‍යාප්තිය
- පුළුල් පාර්ශ්වකරුවන්ගේ හවුල්කාරිත්වය

දුර්වලතා

- සහශ්‍ර ගනුදෙනුකරුවන් සහ තරුණ ප්‍රජාව සමඟ සම්බන්ධතාවය අවම වීම
- මෙහෙයුම්වල විශාලත්වය හේතුවෙන් තාක්ෂණය සහ නවෝත්පාදන ශාඛා ජාලය පුරා ව්‍යාප්ත කිරීමේ අභියෝගය
- දීර්ඝ කාලීනව ස්ථාපිත පද්ධති ඒකාබද්ධ කිරීමේ අභියෝග
- ජාලයේ පුළුල් බව හේතුවෙන් සියලුම සම්බන්ධතා ස්ථාන හරහා සේවා ගුණාත්මකභාවය සහ ගනුදෙනුකාර අත්දැකීම්වල අනුකූලතාව පවත්වා ගැනීමේ අභියෝගය

අවස්ථා

- ගනුදෙනුකරුවන්ගේ ඩිජිටල් භාවිතාවන් වර්ධනය වීම
- අපනයන සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍ර කෙරෙහි රජයේ අවධානය
- අභියෝගාත්මක ආර්ථික කාලයේ දී ගුණාත්මකභාවය පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම
- රට තුළ ඩිජිටල් සාක්ෂරතාව ඉහළ නැංවීම
- හරිත මූල්‍යකරණය හඹා යාමේ අවස්ථා
- අඩු පොළී අනුපාත මත ණය සඳහා ඇති ඉල්ලුම වැඩි වීම
- නව සාමාන්‍ය තත්ත්වයත් සමඟ මිනිසුන්ගේ ජීවන රටාව වෙනස් වීම

තර්ජන

- දුර්වල වූ සාර්ව ආර්ථික වාතාවරණය සහ බාහිර අංශයේ ආතතිය
- කොවිඩ්-19 වසංගතයේ නව ප්‍රභේද මතුවීම
- ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීම පහත වැටීම
- නව සහ වඩා ක්‍රියාශීලි බැංකු මඟින් ඇතිවන තරඟය වැඩි වීම
- ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම්වල සංකීර්ණත්වය ඉහළ යෑම
- දේශගුණික විපර්යාසවල බලපෑම් තීව්‍ර වීම
- සයිබර් ආරක්ෂණ අවදානම

අප ළඟා විය යුතු ස්ථානය

ගනුදෙනුකාර සේවාවේ විශිෂ්ටත්වය

අපගේ සියලු භෞතික යටිතල පහසුකම් සහ අථත්‍ය වේදිකා හරහා ස්ථාවර හා උසස් ගනුදෙනුකාර සේවාවක් සහතික කිරීම

ඩිජිටල් අනුගත වීම සඳහා නායකත්වය ගැනීම

අති නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් අභ්‍යන්තර හා බාහිර ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම් නව මානයකට පරිවර්තනය කිරීම

වෙළඳපළ නායකත්වය රඳවා ගැනීම

බැංකුවේ සන්නාම ශක්තිය සහ ඉලක්ක වෙළඳපළ ප්‍රතිශතය මත අදාළ බැංකු සේවා සහ විශිෂ්ට ගනුදෙනුකාර සේවාව උපයෝගී කර ගනිමින් ඒ තුළින් වෙළඳපළ නායකත්ව තත්ත්වය පවත්වා ගැනීම

හොඳම තිරසාර බැංකුකරණය

ක්‍රියාකාරී, අර්ථවත් විසඳුම් හරහා ආර්ථික, සමාජීය හා පාරිසරික ක්ෂේත්‍රයේ පවතින අභියෝගයන්ට ඵලදායී ලෙස ආමන්ත්‍රණය



අප ඒ සඳහා ළඟා වීමට සැලසුම් කරන ආකාරය	සාර්ථකත්වය මනින ආකාරය
ගනුදෙනුකාර කේන්ද්‍රීය බව	▶ ශුද්ධ ප්‍රවර්ධක ලකුණු ▶ ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය මනින ලකුණු ▶ අලුතෙන් එකතු වූ ගනුදෙනුකරුවන් ගණන ▶ ඉලක්ක වෙළඳපළ අනුපාතය ▶ ගනුදෙනුකාර සේවා මධ්‍යස්ථාන ගණන ▶ වෙළඳ සන්නාමයේ ශක්තිය
ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය	▶ ඩිජිටල් ගනුදෙනුවල වර්ධනය ▶ ගනුදෙනුකරුවන් අතථ්‍ය වේදිකාවලට යොමු වීම ▶ ඩිජිටල් සේවාවන් සඳහා සක්‍රීය ලෙස ලියාපදිංචි වී ඇති ගනුදෙනුකරුවන් ▶ අතථ්‍ය සේවාවන් සඳහා සක්‍රීය ලෙස ලියාපදිංචි වී ඇති ගනුදෙනුකරුවන්
ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය	▶ ණය කළඹේ වර්ධනය ▶ දළ අක්‍රීය ණය අනුපාතය ▶ ගෙවීමේ කාලය නැවත ගිවිසුම් ගත කර ඇති/ ප්‍රතිව්‍යුහගත කර ඇති ණය ▶ ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්
කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩ නැඟීම	▶ රඳවා ගැනීමේ අනුපාතය ▶ සේවකයෙකු සඳහා පුහුණු කාලය ▶ සේවකයෙකු සඳහා ශුද්ධ ලාභය ▶ සේවකයෙකු සඳහා එකතු කළ අගය ▶ කාන්තා නියෝජනය
ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය	▶ ජනනය කළ ආර්ථික විටිනාකම ▶ ප්‍රජා ආයෝජන ▶ කාබන් පියසටහන් ▶ පුනර්ජනනීය බලශක්ති උත්පාදනය



සම්පත් වෙන්කිරීම සහ උපායමාර්ගික ප්‍රවේශයන්හි ප්‍රගතිය

ගනුදෙනුකාර කේන්ද්‍රීය බව

2021 විශේෂ අවස්ථා

- ගෙයින් ගෙට ගොස් බැංකුකරණ සේවා සැපයීම සඳහා නියෝජිත බැංකුකරණය දියත් කිරීම
- 'BoC CONNECT', 'BOC අපනයන කවය', 'ස්මාර්ට් සැලරි සේවර්' සහ 'Smart BOC රන් කැකුළු ගිණුම' දියත් කිරීම
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, අපනයන සහ කෘෂිකර්මාන්තය ඇතුළු තෝරාගත් අංශ ඉලක්ක කර ගනිමින් ගනුදෙනුකරුවන්ට අවශ්‍ය තොරතුරු ලබා දීමේ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් රාශියක්
- ශාඛා සහ ස්මාර්ට් කලාප වැඩිදියුණු කිරීම සහ නැවත ස්ථානගත කිරීම සඳහා ආයෝජනය කිරීම
- ගනුදෙනුකරුවන්ගේ සේවා සම්බන්ධ ගැටළු කිහිපයක් පිළිබඳව අවධානය යොමු කිරීම
- තැන්පතු ගනුදෙනුකරුවන් ඩිජිටල් මාධ්‍ය ඔස්සේ ලියාපදිංචි කිරීම
- POS යන්ත්‍ර භාවිතයෙන් ග්‍රාමීය ප්‍රදේශවලදී මුදල් සැපයීම

2021 දී සම්පත් වෙන් කිරීම

මූල්‍ය ප්‍රාග්ධනය
භෞතික හා ඩිජිටල් යටිතල පහසුකම් සඳහා රු. බිලියන 2.2 ක ආයෝජනයක්

පුහුණුව හා සංවර්ධනය සඳහා රු. මිලියන 64.1 ක ආයෝජනයක්

නිෂ්පාදන ප්‍රාග්ධනය
ශාඛා 13 ක් නැවත ස්ථානගත කිරීම

මානව ප්‍රාග්ධනය
සේවකයින් සඳහා ගනුදෙනුකාර සේවාව පිළිබඳ වැඩසටහන් 39 ක්

සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය
ගනුදෙනුකරුවන් සඳහා වැඩමුළු 58 ක්

ප්‍රාග්ධන අතර අන්තර් සම්තුලිතයන්

ණය ගෙවීමේ සහන කාල පමා සහ අනෙකුත් සහන හරහා ගනුදෙනුකරුවන් පුනර්ජීවනය කිරීමේ අබණ්ඩ උත්සහයන් කාර්යසාධනය හරහා බැංකුවේ මූල්‍ය ප්‍රාග්ධනය කෙරෙහි බලපා ඇත. කෙසේ වෙතත්, මෙම ප්‍රවේශය ගනුදෙනුකරුවන්ගේ පක්ෂපාතිත්වය සහ තෘප්තිමත්භාවය ඉහළ නැංවීම තුළින් අපගේ සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය ශක්තිමත් කර ඇත.

ප්‍රධාන කාර්යසාධන දර්ශක සහ ප්‍රතිඵල

- ශුද්ධ ප්‍රවර්ධක ලකුණු: 40
- ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය මනින ලකුණු 79%
- අත්පත් කරගත් නව ගනුදෙනුකරුවන්: 220,406
- ඉලක්ක වෙළඳපළ ප්‍රතිශතය: 65% (2020: 64%)
- සම්බන්ධතා මධ්‍යස්ථාන: 2,071
- සන්නාම ශක්තිය: රු. බිලියන 53.9 (+13%)

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය

2021 විශේෂ අවස්ථා

- මුදල් හුවමාරු කිරීම, ඊ.පී.ෆ්/ ඊ.ටී.ෆ් පියවීම් සහ බිල්පත් ගෙවීම් වැනි විශේෂාංග එකතු කිරීම හරහා ආයතනික ගනුදෙනුකරුවන් සඳහා ලංකා බැංකුවේ මාර්ගගත බැංකු යෙදවුම මගින් ලබා දෙන ඩිජිටල් සේවාවන් තවදුරටත් වර්ධනය කිරීම.
- ස්මාර්ට් ඔන්ලයින් බැංකු යෙදවුමේ ආයතනික මොඩියුලය සඳහා නව විශේෂාංග හඳුන්වා දීම
- ස්මාර්ට් පේ යෙදවුම හා මාර්ගගත ගෙවීම් ද්වාරය යන දෙකෙහිම නියෝජිත ජාලය පුළුල් කිරීම
- හර කාඩ් අක්‍රිය කිරීම සඳහා රොබෝ තාක්ෂණය, වෙබ් අඩවි විමසුම් සහ ණය අනුමත කිරීම් සඳහා කාර්ය ප්‍රවාහ පද්ධති ඇතුළු ක්‍රියාවලි ස්වයංක්‍රියකරණය
- තථ්‍ය කාලීන ප්‍රේෂණ සක්‍රීය කිරීම සඳහා ස්මාර්ට් රෙමිට් පද්ධතිය යාවත්කාලීන කිරීම
- දත්ත මධ්‍යස්ථානය නවීකරණය කිරීම

2021 වර්ෂයේ සම්පත් වෙන් කිරීම

මූල්‍ය ප්‍රාග්ධනය
ඩිජිටල් යටිතල පහසුකම් සඳහා රු. මිලියන 884.0 ක ආයෝජනයක්

නිෂ්පාදන ප්‍රාග්ධනය
නව මුදල් චක්‍රීකරණ යන්ත්‍ර 104 එකතු කිරීම

මානව ප්‍රාග්ධනය
ඩිජිටල් පරිවර්තනය මෙහෙයවීම උදෙසා කැපවූ 39 දෙනෙකුගෙන් යුත් ශක්තිමත් කණ්ඩායමක්

සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය
POS යන්ත්‍ර 7,700
අන්තර්ජාල ගෙවීම් ද්වාර නියෝජිතයන් 88 ක්

ප්‍රාග්ධන අතර අන්තර් සම්තුලිතයන්

සේවකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා කෙරෙන ආයෝජන කෙටි කාලීනව මූල්‍ය ප්‍රාග්ධනයට අහිතකර බලපෑමක් ඇති කර ඇතත්, මෙමඟින් ගොඩනැඟෙන ඉහළ පක්ෂපාතිත්වය සහ තෘප්තිමත්භාවය තුළින් මානව ප්‍රාග්ධනය ශක්තිමත් කර ඇත. අබණ්ඩ පුහුණුව සහ සංවර්ධනය අපගේ මානව සහ බුද්ධිමය ප්‍රාග්ධනයේ ගුණාත්මකභාවය ශක්තිමත් කර ඇත.

ප්‍රධාන කාර්යසාධන දර්ශක සහ ප්‍රතිඵල

- ඩිජිටල් ගනුදෙනුවල වර්ධනය: 43% (2020: 8%)
- අතථ්‍ය නාලිකා වෙත ඇතුළත් කර ඇති ගනුදෙනුකරුවන් සංඛ්‍යාව: 610,083 (2020: 567,540)
- සක්‍රීය ඩිජිටල් ගනුදෙනුකරුවන් සංඛ්‍යාව: 31% (2020: 28%)
- අතථ්‍ය ලෙස සක්‍රීය ගනුදෙනුකරුවන් සංඛ්‍යාව: 11% (2020: 7%)

ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය

2021 විශේෂ අවස්ථා

- නම්‍යශීලී ගෙවීම් සහ ප්‍රතිව්‍යුහගත කිරීම් තුළින් ගනුදෙනුකරුවන් පුනර්ජීවනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම
- ව්‍යාපාර ප්‍රත්‍යානයන සහ පුනරුත්ථාපන ඒකකය හරහා ගනුදෙනුකරුවන් සමඟ සමීප සම්බන්ධතා පැවැත්වීම
- ණය තක්සේරු කිරීම සහ ඇගැයීම් පිළිබඳ කාර්ය මණ්ඩලය සඳහා අඛණ්ඩ පුහුණුව සහ කුසලතා ගොඩනැගීම
- නැවත අයකරගැනීම් ශක්තිමත් කිරීම සඳහා පළාත් සඳහා ලබාදී ඇති සම්පත් වැඩි දියුණු කිරීම
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිවේදනය කර ඇති තාවකාලික සහන දීර්ඝ කිරීම

2021 දී සම්පත් වෙන් කිරීම

මූල්‍ය ප්‍රාග්ධනය

රු. බිලියන 380.6 ක් වටිනා ණය පහසුකම් සඳහා ණය ගෙවීමේ සහන කාල ලබා දී ඇත

මානව ප්‍රාග්ධනය

ව්‍යාපාර ප්‍රත්‍යානයන සහ පුනරුත්ථාපන ඒකකය තුළ ව්‍යාපාර පුනර්ජීවනය සඳහා කැපවූ සේවකයන් 11 දෙනෙක්

සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

ණය පහසුකම් 4,209 ක් ප්‍රතිව්‍යුහගත කර ඇත

ප්‍රාග්ධන අන්තර් සම්බන්ධතා

ණය ගෙවීම සඳහා ලබා දී ඇති සහන කාල සහ අනිකුත් පහසුකම් මූල්‍ය ප්‍රාග්ධනයට කෙටි කාලීන බලපෑමක් ඇති කිරීමට ඉඩ ඇත. ණය කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ආයෝජනය කිරීම, ණය පිළිබඳ සංස්කෘතිය පෝෂණය කිරීම තුළින් බැංකුවේ බුද්ධිමය ප්‍රාග්ධනය ශක්තිමත් වනු ඇත. දිගුකාලීනව මෙය ණය කළඹේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම තුළින් බැංකුවේ මූල්‍ය කාර්යසාධනයට සහය වනු ඇත.

ප්‍රධාන කාර්යසාධන දර්ශක සහ ප්‍රතිඵල

- ණය කළඹේ වර්ධනය 22% (2020: 28%)
- දළ අක්‍රීය වත්කම් අනුපාතය: 4.5% (2020: 4.8%)
- ව්‍යාපාර ප්‍රත්‍යානයන සහ පුනරුත්ථාපන ඒකකය විසින් ක්‍රියාකාරී තත්ත්වයට උසස් කරන ලද ණය පහසුකම් ප්‍රමාණය රු. බිලියන 35.0 කි.
- ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන: 58

කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩ නැඟීම

2021 විශේෂ අවස්ථා

- සේවකයින්ට නිවසේ සිට වැඩ කිරීම සඳහා අවශ්‍ය නම්‍යශීලී බව ඇති කිරීම
- චින්නත් ලබාදීමට පහසුකම් සැලසීම, අතුරු ප්‍රතිකාර මධ්‍යස්ථාන සහ රෝහල්ගත කිරීමේ පහසුකම් ලබා දීම, දැනුවත් කිරීමේ වැඩසටහන්, සියලුම පුද්ගලික ආරක්ෂක උපකරණ ලබාදීම, සේවකයන්ගේ ප්‍රවාහන පහසුකම් සහ ප්‍රතිපාදන ඇතුළුව සවිස්තරාත්මක සෞඛ්‍ය ආරක්ෂක පියවරයන්
- TVBOC සහ අනෙකුත් ඩිජිටල් වේදිකා හරහා ක්‍රියාශීලීව සේවකයන් සමඟ සම්බන්ධ වීම
- ණය කළමනාකරණය, ඩිජිටල් සේවා සඳහා යොමුවීම සහ ගනුදෙනුකාර සේවා කුසලතා කෙරෙහි පුහුණු සැසිවල අවධානය යොමු කරන ලදී
- 2021-2023 වසර සඳහා අවසන් කර අත්සන් කරන ලද සාමූහික ගිවිසුම යටතේ සියලුම කාර්ය මණ්ඩලයට වැටුප් සහ වේතන වර්ධක
- කාර්ය මණ්ඩලය සඳහා වෙන් කර ඇති සුභසාධන නිවාඩු නිකේතනවල සිදු කරන ලද වැඩිදියුණු කිරීම්/ නවීකරණයන් (කතරගම නිවාඩු නිකේතනය-නව ගොඩනැගිල්ල, අනුරාධපුර නිවාඩු නිකේතනය - ප්‍රතිසංස්කරණය කරන ලදී)

2021 දී සම්පත් වෙන් කිරීම

මූල්‍ය ප්‍රාග්ධනය

සේවකයින් සඳහා රු. බිලියන 25.0 ක ආයෝජනයක්

කොවිඩ්-19 ආශ්‍රිත වියදම් ඇතුළුව සෞඛ්‍ය සහ ආරක්ෂාව සඳහා රු. මිලියන 286.9 ක ආයෝජනය

ප්‍රාග්ධන අතර අන්තර් සම්බන්ධතා

සේවකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා කෙරෙන ආයෝජන කෙටි කාලීනව මූල්‍ය ප්‍රාග්ධනයට අහිතකර බලපෑමක් ඇති කර ඇතත්, මෙමඟින් ඉහළ පක්ෂපාතිත්වයක් සහ තෘප්තිමත්භාවයක් ගොඩනැගීම තුළින් මානව ප්‍රාග්ධනය ශක්තිමත් කර ඇත. අඛණ්ඩ පුහුණුව සහ සංවර්ධනය අපගේ මානව සහ බුද්ධිමය ප්‍රාග්ධනයේ ගුණාත්මක භාවය ශක්තිමත් කර ඇත.

ප්‍රධාන කාර්යසාධන දර්ශක සහ ප්‍රතිඵල

- රැඳවා ගැනීමේ අනුපාතය: 99.5% (2020: 99.6%)
- සේවකයෙකු සඳහා පුහුණු මිනිස් පැය 21.2 (2020: මිනිස් පැය 58.3)
- සේවකයෙකු සඳහා ශුද්ධ ලාභය: රු. මිලියන 4.5 (+115%)
- සේවකයෙකු සඳහා චිකතු කළ අගය: රු. මිලියන 3.0 (+40%)
- කාන්තා නියෝජනය: 60% (2020: 60%)

සම්පත් වෙන්කිරීම සහ උපායමාර්ගික ප්‍රවේශයන්හි ප්‍රගතිය



ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය

2021 විශේෂ අවස්ථා

- වත්කම් කළඹේ රු. ට්‍රිලියන 3.0 ඉක්මවමින් ශේෂ පත්‍රයේ සවිමත්භාවයේ සන්ධිස්ථානයක් අත්පත් කර ගැනීම.
- පාරිසරික සහ සමාජ කළමනාකරණ පද්ධති ප්‍රතිපත්තියේ විස්තීර්ණ සමාලෝචනය
- සෞඛ්‍ය අමාත්‍යාංශයේ 1390 කොවිඩ්-19 නිවාස පාදක රෝගී කළමනාකරණ සත්කාර මධ්‍යස්ථානය ස්ථාපනය සඳහා අරමුදල් සැපයීම
- ශාඛා සූර්ය බලශක්ති උත්පාදනය කරන මධ්‍යස්ථාන බවට පත්කිරීම සඳහා ආයෝජනය කිරීම සහ පුනර්ජනනීය බලශක්තියට ණය දීම හරහා දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා දායක විය
- නැවත වන වගාව සහ ගස් සිටුවීම හරහා දේශගුණයට අනුවර්තනය වීමට සහය වීම
- තොරතුරු තාක්ෂණ සහ සයිබර් ආරක්ෂණ අවදානම් රාමු ශක්තිමත් කිරීම
- කොවිඩ්-19 හා සබැඳිව රට සංචරණ සීමා පැනවූ කාලවකවානුව පුරා අඛණ්ඩ සේවාවක් සහතික කරන ලදී

2021 දී සම්පත් වෙන් කිරීම

මූල්‍ය ප්‍රාග්ධනය

ප්‍රජා සහභාගීත්වය සඳහා රු. මිලියන 79.5 ක ආයෝජනයක්

නිෂ්පාදන ප්‍රාග්ධනය

ශාඛා 51 ක් සූර්ය ශක්තිය භාවිතා කරන ශාඛා බවට පරිවර්තනය කරන ලදී

මානව ප්‍රාග්ධනය

තිරසාරකත්ව ඒකකයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු 'තිරසර කළමනාකරුවන්' ලෙස සහතික ලත් පාඨමාලා අවසන් කර ඇත.

සුදුසුකම් ලත් නිලධාරියෙකු පාරිසරික හා සමාජ කළමනාකරණ පද්ධති නිලධාරියෙකු ලෙස අනුයුක්ත කරන ලදී

ප්‍රාග්ධන අතර අන්තර් සම්බන්ධතා

ප්‍රජාවන් සහ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ අර්ථවත් සබඳතා තුළින් සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම පිළිබඳ දිගුකාලීන දැක්මක් ඇතිව මෙහෙයුම් සහ තීරණ සඳහා තිරසාරභාවය ඇතුළත් කිරීමට දරණ උත්සහයන් වැඩි කිරීම. සූර්ය බලශක්තිය සඳහා වන ආයෝජන හරහා බැංකුව පොසිල ඉන්ධන මත යැපීම අවම කිරීමට දරණ අඛණ්ඩ උත්සහයන් දිගුකාලීනව ස්වාභාවික ප්‍රාග්ධනය සංරක්ෂණයට සහය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ප්‍රධාන කාර්යසාධන දර්ශක සහ ප්‍රතිඵල

- නිර්මාණය කරන ලද ආර්ථික වටිනාකම: රු. බිලියන 62.0 (+96%)
- ප්‍රජා ආයෝජන: රු. බිලියන 79.5 (+6%)
- කාබන් පියසටහන: 25,010.5 tCO2 eqv' (+42%)
- හරිතාගාර වායු විමෝචන තීව්‍රතාවය 3.0 tCO2 eqv. (+43)
- ජනනය කළ පුනර්ජනනීය බලශක්තිය: මෙගා වොට් පැය 1,757.5 (-17%)

තිරසාර බවට අනුගතව

ශ්‍රී ලංකාවේ විශාලතම බැංකුව ලෙස, අපගේ පාර්ශ්වකරුවන් හරහා යහපත් සමාජ සහ පාරිසරික භාවිතයන් ප්‍රවලිත කිරීමේ දී අපට ඉටු කළ හැකි තීරණාත්මක කාර්යභාරය පිළිබඳව අපි හොඳින් දනිමු.

ආර්ථික, පාරිසරික සහ සමාජීය වගකීම යන ප්‍රධාන මානයන් තුන කේන්ද්‍ර කර ගනිමින් බැංකුවේ මෙහෙයුම් සහ එහි ආයතනික සමාජ වගකීම් සඳහා මූලපිරීම් යන දෙඅංශයෙන්ම ලබා දෙන විස්තීරණ තිරසාර ප්‍රතිපත්තියක් තුළ තිරසාර සංවර්ධනයක් සඳහා බැංකුවේ අභිලාෂයන් පැහැදිලිව ප්‍රකාශ කර ඇත. අපගේ තිරසාර න්‍යාය පත්‍රය ද එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක මඟින් දක්වා ඇති අභිලාෂයන් සමඟ පෙළගැසී ඇති අතර පහත සාරාංශගත කර මෙම වාර්තාවේ ඊළඟ කොටස්වල තවදුරටත් විස්තරාත්මකව සාකච්ඡා කෙරේ.

තිරසාරත්වය සඳහා අපගේ ප්‍රවේශය

ආර්ථික

මූල්‍ය ඇතුළත් කිරීම

රටේ වඩාත්ම අඩු පහසුකම් සහිත ප්‍රජාවන් සඳහා මූල්‍ය ප්‍රවේශය ලබා දීම සහ ඉතුරුම් සංස්කෘතියක් පෝෂණය කිරීම

ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා සංවර්ධන ණය ලබා දීම

සමාජීය

ආයතනික සමාජ ආයෝජන

අර්ථවත් සහ දිගු කාලීන ප්‍රතිඵල සහිත උපායමාර්ගික ආයතනික සමාජ වගකීම් සඳහා මූලපිරීම්

ශක්තිමත් මානව සම්පත් පරිචයන්

සමාන අවස්ථා සේවා යෝජකයෙකු වීම, ඉහළ මට්ටමේ ස්ත්‍රී පුරුෂ සහභාගිත්වයක් සහිතව විවිධත්වය පෝෂණය කරන සංස්කෘතිය

පාරිසරික

මෙහෙයුම්

හරිතාගාර වායු විමෝචනය තක්සේරු කිරීම, සූර්ය බලශක්ති පරිවර්තන ව්‍යාපෘතිය සහ හරිත ගොඩනැගිලි සංකල්ප හරහා අපගේ මෙහෙයුම්වල පාරිසරික බලපෑම් අවම කිරීමට අඛණ්ඩ කැපවීම

මූලික ව්‍යාපාර සඳහා පරිසරය සහ සමාජ යහපාලන අංගයන්

ණය ඇගයීමේදී පාරිසරික නිර්ණායක ඇතුළත් කිරීම සහ විශේෂිත වූ හරිත මූල්‍ය ණය කළඹ හඳුන්වා දීම.

තිරසාර පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තිරසාරකත්වය සම්බන්ධ සියලු කරුණු පිළිබඳ අධීක්ෂණය සපයන අතර, බැංකුවේ තිරසාර න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමේ වගකීම මහා කළමනාකරු සභාපතිත්වය දරණ තිරසාර කමිටුව වෙත පැවරේ. කමිටුව සියලුම ප්‍රධාන ව්‍යාපාර අංශ සහ ආධාරක කාර්යන්හි නියෝජ්‍ය මහා කළමනාකරුවන්ගෙන් සමන්විත වන අතර එමඟින් තිරසාරත්වය යනු ආයතනයේ සියලු අංශ හරහා විහිදී ඇති ක්‍රියාකාරී සහ සංවිධානාත්මක පුළුල් විෂයක් බව සහතික කරයි. අදාළ සියලු පාරිසරික සහ සමාජ ආර්ථික රෙගුලාසිවලට සම්පූර්ණයෙන්ම අනුකූල වන බව බැංකුව සහතික කරන අතර සමාලෝචිත වර්ෂය තුළදී, අනුකූල නොවන අවස්ථා වාර්තා වී නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලය

- පාරිසරික සහ සමාජ පාලනය ක්‍රියාත්මක වන බවට සහතික වීම
- පාරිසරික, සමාජ සහ යහපාලන කරුණු සම්බන්ධ අධීක්ෂණය සැපයීම.

තිරසාර කමිටුව

- තිරසාර ප්‍රතිපත්ති සංවර්ධනය සහ කාලීන සංශෝධන
- තිරසර ප්‍රතිපත්තියට අනුකූලව තිරසාර මූලාරම්භයන් ඇගැයීම, ප්‍රවර්ධනය කිරීම සහ අනුමත කිරීම
- මූලපිරීම් වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම
- බැංකුවේ සමස්ත උපායමාර්ග සහ දෛනික මෙහෙයුම් සඳහා තිරසාරභාවය පිළිබඳ සලකා බැලීම් හා ඒකාබද්ධ කිරීම

තිරසාර ඒකකය

- බැංකුවේ සියලුම තිරසාර මූලපිරීම් ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා වගකීම දරයි
- තිරසාරකත්ව වාර්තා කිරීම්
- තිරසාර න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමේදී අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන් සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ වීම

තිරසාර බවට අනුගතව

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සඳහා අපගේ දායකත්වය

1 දරිද්‍රතාවයෙන් මොර වීම

දරිද්‍රතාවයෙන් මොර වීම

ලංකා බැංකුව විහි ක්ෂුද්‍ර මූල්‍යකරණ වැඩසටහන වන ''BOC මිතුරු'' හරහා අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් අතර මූල්‍ය ඇතුළත් කිරීම් සිදු කරන අතරම සහභාගිත්ව මූල්‍ය ආයතනයක් ලෙස යෝජනා ක්‍රම යටතේ විවිධ වූ ණය වර්ග ලබා දීම මගින් මෙම ප්‍රජාව දිළිඳුකමින් මුදවාගැනීමට උපකාර කරනු ලැබේ.

ඉලක්කය 1.1

2030 වන විට, සෑම තැනකම සිටින සියලුම මිනිසුන් සඳහා අන්ත දරිද්‍රතාවය තුරන් කිරීම, දැනට දිනකට ඇ. ඩොලර් 1.25 ට අඩු ආදායමක් ලබන පුද්ගලයින් මෙලෙස වර්ගීකරණය කරනු ලැබේ.

ක්ෂුද්‍ර මූල්‍ය කණ්ඩායම් 2,243 ක් සඳහා සහයෝගය දක්වයි

ඉලක්කය 1.4

2030 වන විට, සියලුම පිරිමින්ට සහ කාන්තාවන්ට, විශේෂයෙන් දුප්පතුන්ට සහ අවදානමට ලක්විය හැකි අයට, ආර්ථික සම්පත් සඳහා සමාන අයිතිවාසිකම් මෙන්ම මූලික සේවාවන් සඳහා ප්‍රවේශය, ඉඩම් සහ වෙනත් ආකාරයේ දේපළ, උරුමය, ස්වාභාවික සම්පත් පිළිබඳ අයිතිය සහ පාලනය සහ ක්ෂුද්‍ර මූල්‍ය ඇතුළු නව තාක්ෂණය සහ මූල්‍ය සේවා සඳහා සමාන අයිතිවාසිකම් ඇති බවට සහතික වීම.

වසර තුළ දී රු. බිලියන 84.5 ක් සංවර්ධන ණය ලබා දී ඇත

2 කුසගින්න තුරන් කිරීම

කුසගින්න තුරන් කිරීම

ප්‍රධාන උප අංශ ඉලක්ක කර ගනිමින් ණය යෝජනා ක්‍රම හරහා රටේ කෘෂිකාර්මික අංශයේ දියුණුවට අපි දිගටම සහය සලසන්නෙමු

ඉලක්කය 2.3

2030 වන විට සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ කෘෂිකාර්මික ඵලදායිතාවය සහ ආදායම් දෙගුණ කිරීම විශේෂයෙන්ම කාන්තාවන්, ආදිවාසීන්, ගොවි පවුල්, එඬේරුන් සහ ධීවරයින් සඳහා ඉඩම්, අනෙකුත් නිෂ්පාදන සම්පත් සහ යෙදවුම්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපළ සඳහා සුරක්ෂිත හා සමාන ප්‍රවේශයක් හරහා අගය එකතු කිරීම සහ ගොවි නොවන රැකියා සඳහා අවස්ථා

පහසුකම් 1,623 ක් හරහා 2021 වසරේ කෘෂිකර්ම, කිරි සහ මාංශ නිෂ්පාදන අංශය සඳහා රු. බිලියන 35.7 ක සංවර්ධන ණය ලබා දී ඇත.





3 නීරෝගී බව සහ යහපැවැත්ම

නිරෝගී බව සහ යහපැවැත්ම

වසර තුළ, කොවිඩ්-19 වසංගත සහ ඒ ආශ්‍රිත වෛද්‍ය උපකරණ සහ අනෙකුත් අත්‍යවශ්‍ය වෛද්‍ය සහ ඖෂධ සැපයුම් මෙරටට ආනයනය කිරීමට පහසුකම් සැලසීමට ලංකා බැංකුව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය.

ඉලක්කය 3.බී

සංවර්ධනය වෙමින් පවතින රටවලට මූලික වශයෙන් බලපාන බෝවන සහ බෝ නොවන රෝග සඳහා වසංගත සහ ඖෂධ පර්යේෂණ සහ සංවර්ධනය සඳහා සහය වීම, දැරිය හැකි මිලකට අත්‍යවශ්‍ය ඖෂධ සහ වසංගත සඳහා ප්‍රවේශය ලබා දීම.

ඇ. ඩොලර් මිලියන 138.0 ක මූල්‍යකරණය හරහා කොවිඩ්-19 වසංගත ආනයනය කිරීමට පහසුකම් සලසා ඇත.

5 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය

බැංකුව තුළ සහ බැංකුවෙන් පිටත කාන්තාවන් සඳහා අවස්ථා නිර්මාණය කිරීමට අපි කැප වී සිටිමු

ඉලක්කය 5.5

දේශපාලන, ආර්ථික සහ පොදු ජීවිතයේ තීරණ ගැනීමේ සෑම තරාතිරමකම නායකත්වය සඳහා කාන්තාවන්ගේ පූර්ණ සහ ඵලදායී සහභාගීත්වය සහ සමාන අවස්ථා සහතික කිරීම

කළමනාකරණ මට්ටමින් 42% ඇතුළුව 60% ක සමස්ත කාන්තා නියෝජනය

ඉලක්කය 5.ඒ

ආර්ථික සම්පත් සඳහා කාන්තාවන්ට සමාන අයිතිවාසිකම් ලබා දීම සඳහා ප්‍රතිසංස්කරණ සිදු කිරීම

වසර තුළ කාන්තාවන්ට රු. බිලියන 86.7 ක් ණය ලබා දීම



4 ගුණාත්මක අධ්‍යාපනය

ගුණාත්මක අධ්‍යාපනය

අධ්‍යාපනය බැංකුවේ තිරසාර න්‍යාය පත්‍රයේ ප්‍රධාන අංගයක් වන අතර පාසල් සිසුන්ගේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයට සහය වීම සඳහා අපි ක්‍රමෝපායික අඛණ්ඩ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කර ඇත.

ඉලක්කය 4.1

2030 වන විට, සියලුම ගැහැණු ළමයින් සහ පිරිමි ළමයින් අදාළ සහ ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල කරා ගෙන යන, නිදහස්, සාධාරණ සහ ගුණාත්මක ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපන පහසුකම් සම්පූර්ණ කරන බවට සහතික වීම.

සිසුන් 2,087 ක් සහ තරුණයින් 252 ක් සඳහා ශිෂ්‍යත්ව සහ අධ්‍යාපනික ආධාර

ඉලක්කය 4.4

2030 වන විට, පිළිගත් රැකියා සහ ව්‍යවසායකත්වය සඳහා තාක්ෂණික සහ වෘත්තීය කුසලතා ඇතුළු අදාළ කුසලතා ඇති තරුණ හා වැඩිහිටි සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩි කිරීම.

සේවකයින් සඳහා සම්පූර්ණ පුහුණු පැය 176,418 ක්

පුහුණු සීමාවාසික වැඩසටහන සම්පූර්ණ කළ පාසල් හැර ගිය සිසුන් සහ විශ්වවිද්‍යාල සිසුන් 2,253 ක් සඳහා අදාළ සහතිකපත් නිකුත් කරන ලදී.

6 පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව

පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව

රට පුරා ජාතික ජල සම්පාදන, ජලප්‍රවාහන සහ වාරිමාර්ග පහසුකම් වැඩිදියුණු කරන ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීමට බැංකුව කැප වී සිටී.

ඉලක්කය 6.1

2030 වන විට සැමට සුරක්ෂිත සහ දැරිය හැකි මිලට පානීය ජලය සඳහා විශ්වීය සහ සාධාරණ ප්‍රවේශයක් ලබා ගැනීම

ජල සම්පාදන හා ඒ ආශ්‍රිත සේවාවන් සඳහා රු. බිලියන 43.7 ක මුළු ණය ලබා දීම



තිරසාර බවට අනුගතව

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සඳහා අපගේ දායකත්වය

දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය

බැංකුව සිය ශාඛා සූර්ය බලශක්තිය භාවිතා කරන ශාඛා බවට පරිවර්තනය කිරීමේ පූර්ණකාලීන වැඩසටහනක් දියත් කළේය.

ඉලක්කය 7.2

2030 වන විට ගෝලීය බලශක්ති මිශ්‍රණයේ පුනර්ජනනීය බලශක්තියේ කොටස සැලකිය යුතු ලෙස වැඩි කිරීම

පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා රු. මිලියන 675.5 ක ණය දීම
බැංකුවේ විදුලි පරිභෝජනයෙන් 7% ක් සූර්ය බලයෙන් ජනනය වේ.

කර්මාන්ත නවෝත්පාදන සහ යටිතල පහසුකම්

රජයේ සංවර්ධන න්‍යාය පත්‍රයට සහ පිඩාවට පත්ව ඇති ක්ෂේත්‍ර වලට සමගාමීව බැංකුව රජයේ සහ පෞද්ගලික අංශයේ විශාල යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අරමුදල් යොමු කරයි.

ඉලක්කය 9.1

සැමට දැරිය හැකි සහ සාධාරණ ප්‍රවේශයක් කෙරෙහි අවධානය යොමු කරමින් ආර්ථික සංවර්ධනයට සහ මානව යහපැවැත්මට සහය වීම සඳහා කලාපීය සහ දේශසීමා යටිතල පහසුකම් ඇතුළුව ගුණාත්මක, විශ්වාසදායක, තිරසාර සහ ප්‍රසාවට දැරිය හැකි මට්ටමේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු. බිලියන 445.1 ක ණය

තිරසාර නගර සහ ප්‍රජාවන්

නිවාස ණය යනු බැංකුවේ ණය කළඹෙහි වැදගත් අංගයක් වන අතර සහනදායී පොළී අනුපාත යටතේ අපි මේ සඳහා ණය යෝජනා ක්‍රම කිහිපයක් පිරිනමන්නෙමු.

ඉලක්කය 11.1

2030 වන විට, සැමට ප්‍රමාණවත්, ආරක්ෂිත සහ දැරිය හැකි නිවාස සහ මූලික සේවාවන් සඳහා ප්‍රවේශය සහතික කිරීම සහ මුඩුක්කු නිවාස, ප්‍රමාණවත් පහසුකම් සහිත නිවාස ලෙස වැඩි දියුණු කිරීම

රු. බිලියන 77.6 ක නිවාස ණය කළඹ.

සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය

8,337 ක කාර්ය මණ්ඩල සංඛ්‍යාවක් සමඟ ලංකා බැංකුව එහි සියලුම සේවකයින්ට පූර්ණ සහ සාධාරණ වැටුප් ව්‍යුහයක් සහිතව ක්ෂේත්‍රයේ කීර්තිමත් සේවා යෝජකයෙකු ලෙස පිළිගැනීම සහතික කරයි.

ඉලක්කය 8.5

2030 වන විට, තරුණයින් සහ විවිධ ආබාධ සහිත පුද්ගලයින් ඇතුළුව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියාවක් සහ සමාන වටිනාකමක් ඇති වැඩ සඳහා සමාන වැටුප් ලබා දීම.

සේවකයින් 8,337 කට ශක්තිමත් සේවා යෝජකයෙකු වීම

ඉලක්කය 8.2

ඉහළ අගයක් එකතු කළ සහ ශ්‍රම තීව්‍ර අංශය කෙරෙහි අවධානය යොමු කිරීම ඇතුළුව විවිධාංගීකරණය, තාක්ෂණික වැඩිදියුණු කිරීම් සහ නවෝත්පාදන තුළින් ඉහළ ආර්ථික ඵලදායිතාවක් ළඟා කර ගැනීම

එක් සේවකයෙකු සඳහා වසර තුළ 21% ව්‍යාපාර වර්ධනයක්

අව අසමානතා

සිය අසමසම ගනුදෙනුකාර සම්බන්ධතා ජාලය සහ ගනුදෙනුකරුවන් සමීපයටම ගොස් බැංකු සේවා සැපයීමේ සේවාව හරහා, ලංකා බැංකුව රටේ බිම් මට්ටමේ ප්‍රජාවන් වෙත ළඟා වී, මූල්‍ය සේවා සහ මූල්‍ය සාක්ෂරතාව සඳහා ප්‍රවේශය ලබා දෙයි.

ඉලක්කය 10.2

2030 වන විට, වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ආබාධිතභාවය, ජාතිය, ජනවාර්ගිකත්වය, සම්භවය, ආගම, ආර්ථික හෝ වෙනත් තරාතිරම නොබලා සියලු දෙනාගේ සමාජ, ආර්ථික සහ දේශපාලන ඇතුළත් කිරීම් බල ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම

ආර්ථික වශයෙන් පසුගාමී ප්‍රදේශවල ශාඛා 55 ක් සහ ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන 90 ක්



12 වගකීමෙන් යුතු පරිභෝජනය සහ නිෂ්පාදනය

වගකීමෙන් යුතු පරිභෝජනය සහ නිෂ්පාදනය

බැංකුවේ ඩිජිටල්කරන ක්‍රියාවලිය සහ ක්‍රියාවලි ස්වයංක්‍රියකරණය කෙරෙහි බැංකුවේ මෑතකාලීන උද්යෝගි බව හේතුවෙන් කඩදාසි පරිභෝජනය සහ අපද්‍රව්‍ය තිරසාර ලෙස පහත වැටීමට හේතු වී ඇති අතර බැංකුවේ තිරසාර ප්‍රතිපත්තිය හරහා වගකීම් සහගත පරිභෝජනය සහ නිෂ්පාදන භාවිතයන් ප්‍රචාරණය කෙරේ.

ඉලක්කය 12.2

2030 වන විට ස්වාභාවික සම්පත් තිරසාර කළමනාකරණය සහ කාර්යක්ෂම භාවිතය සාක්ෂාත් කර ගැනීම

ස්වයංක්‍රියකරණය හරහා කඩදාසි මෙට්‍රික් ටොන් 14.5 ක් ඉතිරි කර ඇත

ඉලක්කය 12.5

2030 වන විට, වැළැක්වීම්, භාවිතාව අඩු කිරීම, ප්‍රතිචක්‍රීයකරණය සහ නැවත භාවිතය තුළින් අපද්‍රව්‍ය නිෂ්පාදනය සැලකිය යුතු ලෙස අඩු කිරීම.

කඩදාසි මෙට්‍රික් ටොන් 14.0 ප්‍රතිචක්‍රීයකරණය කිරීම.

13 දේශගුණික ක්‍රියාකාරකම්

දේශගුණික ක්‍රියාකාරකම්

බැංකුව සිය කාබන් පියසටහන් පිළිබඳ විස්තීරණ තක්සේරුවක් සිදු කරන අතර ඒ සඳහා සාමූහික උත්සහයන් මෙහෙයවයි.

ඉලක්කය 13.2

දේශගුණික විපර්යාස සඳහා වන ක්‍රියාකාරකම් ජාතික ප්‍රතිපත්ති, උපායමාර්ග සහ සැලසුම් වලට ඒකාබද්ධ කිරීම.

දේශගුණික විපර්යාස සහ පාරිසරික පියසටහන් උපායමාර්ග සැකසීමේ දී වැදගත් මානෘකාවක් ලෙස හඳුනා ගැනීම.

15 ගොඩබිම මත ජීවය

ගොඩබිම මත ජීවය

බැංකුවේ "හරිත අරණ" ව්‍යාපෘතිය රජයේ "වන රෝපා" වැඩසටහනට අනුකූලව රටේ වන ආවරණය ඉහළ නැංවීමට දායක වීම අරමුණු කරයි.

ඉලක්කය 15.2

2020 වන විට, සියලු වර්ගවල වනාන්තරවල තිරසාර කළමනාකරණය ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීම, වන විනාශය නැවැත්වීම, විනාශ වූ වනාන්තර ප්‍රතිසංස්කරණය කිරීම සහ ගෝලීය වශයෙන් වන වගාව සහ නැවත වන වගාව සැලකිය යුතු ලෙස වැඩි කිරීම

ලංකා බැංකුව විසින් හබරණ ප්‍රදේශයේ බාදනය වූ වනාන්තර පෙදෙසක හෙක්ටයාර් 100 ක වගා කළ ගස් 80,000 කට වැඩි ප්‍රමාණයක් පෝෂණය කිරීම සඳහා වසර තුළ දී රු. මිලියන 11.0 ක් ආයෝජනය කර එහි පුනර්ජීවනයට දායක විය.



16 සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන

සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන

ශක්තිමත් ප්‍රතිපත්ති හරහා බැංකුව සිය සියලුම ගනුදෙනු වලදී ඉහළම මට්ටමේ විනිවිදභාවය සහ අඛණ්ඩතාව ප්‍රවර්ධනය කරයි

ඉලක්කය 16.5

දූෂණය සහ අල්ලස් සෑම ආකාරයකින්ම සැලකිය යුතු ලෙස අඩු කිරීම.

දූෂණ විරෝධී සහ අල්ලස් විරෝධී ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වීම

ඉලක්කය 16.10

ජාතික නීති සහ ජාත්‍යන්තර ගිවිසුම්වලට අනුකූලව තොරතුරු සඳහා මහජන ප්‍රවේශය සහතික කිරීම සහ මූලික නිදහස ආරක්ෂා කිරීම.

තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත පිළිපැදීම

17 තිරසාර සංවර්ධනය සඳහා පාර්ශ්වකරණයන්

තිරසාර සංවර්ධනය සඳහා පාර්ශ්වකරණයන්

අනෙක්‍යන්‍ය හවුල්කාරිත්වයන් හරහා හවුල් වටිනාකම් නිර්මාණය කිරීමට බැංකුව සිය ව්‍යාපාර මෙහෙයුම් පද්ධතිය හරහා හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කරයි

ඉලක්කය 17.17

ඵලදායී රාජ්‍ය, රාජ්‍ය පෞද්ගලික සහ සිවිල් සමාජ හවුල්කාරිත්වයන් දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම, හවුල්කාරිත්වයන්හි අත්දැකීම්, සම්පත් සහ උපායමාර්ග ගොඩ නැගීම.

ශ්‍රී ලංකා බැංකු සංගමයේ තිරසාර බැංකුකරණ මුලපිරීම තුළ ක්ෂේත්‍රයේ අනකුත් බැංකු සමඟ සම්පව කටයුතු කිරීම, කොවිඩ්-19 මගින් බලපෑමට ලක් වූ ව්‍යාපාර සඳහා කැපවූ අරමුදල් මාර්ගයක් හරහා උපකාර කිරීම සඳහා බැංකුව, ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව සමඟ වසර තුළ හවුල් විය.



ප්‍රධාන මූල්‍ය නිලධාරීතුමාගේ සමාලෝචනය



මූල්‍ය ප්‍රාග්ධනය කළමනාකරණයේදී බැංකුවේ ප්‍රමුඛතාවය, ස්කන්ධය මත ප්‍රතිලාභ උපරිම කිරීම, ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම සහ ද්‍රවශීලතාවය පවත්වා ගෙනයාම යන ත්‍රිත්ව පැතිකඩයන් ඔස්සේ ඉලක්ක ගත විය. මෙය ප්‍රධාන වශයෙන් බැංකුවේ ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර සංවර්ධනය යන උපායමාර්ගික ප්‍රවේශය මත අඛණ්ඩව ක්‍රියාවට නංවන ලදී.

වර්ෂය තුළ දී ස්කන්ධය මත ප්‍රතිලාභය දෙගුණයක අගයකට ආසන්න වෙමින් ද, ශක්තිමත් ණය වර්ධනයක් මෙන්ම ප්‍රාග්ධන අනුපාතයක් ද පවත්වා ගනිමින් සහ දේශීය හා විදේශීය මුදල් ද්‍රවශීලතා මට්ටම ආරක්ෂාකර ගනිමින් බැංකුව විසින් තම ඉලක්ක ඉටුකර ගැනීමේ දී සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත.

මුළු ආදායම

වසංගතයෙන් පීඩාවට පත් වූ ව්‍යාපාරවලට සහය වීම සහ ආර්ථිකය පුනර්ජීවනය කිරීම කේන්ද්‍ර කරගත් උපායමාර්ගයන් පෙරදැරිව බාහිර අභියෝගවලින් පිරුණු වසරක් තුළ බැංකුව තම පැවැත්ම තවත් තහවුරු කර ගන්නා ලදී. බැංකුව සිය අරමුදල්, මත පදනම් වූ ආදායම්, ගාස්තු මත පදනම් වූ ආදායම සහ අනෙකුත් ආදායම්වල පදනම පුළුල් වීම ආදියේ සහය ඇතිව මුළු ආදායමේ 18% ක වර්ධනයක් වාර්තා කළේය.

ආදායමේ උපනතීන්



ශුද්ධ පොළී ආදායමේ සහ අනෙකුත් ආදායම්වල ශක්තිමත් වර්ධනයක්

ක්‍රියාශීලී ප්‍රතිමිලකරණ තීරණ සහ ශක්තිමත් අරමුදල් පැතිකඩකින් සහය දක්වන ශුද්ධ පොළී ආන්තිකයේ පුළුල් වීම

* සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගය



අරමුදල් පදනම් කරගත් ආදායම: අඩු පොළී අනුපාත පරිසරයක් තිබියදීත්, වසර තුළ දී ණය සහ අත්තිකාරම් හි 22% ක ප්‍රසාරණය හේතු කොට ගෙන ලංකා බැංකුවෙහි අරමුදල් පදනම් කරගත් ආදායම 15% කින් රු. බිලියන 260.5 දක්වා ඉහළ ගොස් ඇත. ණය වර්ධනයට මූලික වශයෙන් අයිරා, කාලීන ණය සහ පුද්ගලික ණය හි වැඩි වීම හේතු විය. ණය සහ අත්තිකාරම් මත පොළී ආදායම මුළු පොළී ආදායමට 74% ක දායකත්වයක් ලබා දුන් අතර වසර තුළ දී 12% කින් වර්ධනය විය. මේ අතරතුර, අතිරික්ත ද්‍රවශීලතාවය ආයෝජන උපකරණ වෙත යොමු වීම නිසා බැංකුවේ ආයෝජන කළඹෙන් උපයා ගත් පොළී ආදායම ද 21% කින් රු. බිලියන 67.1 දක්වා වැඩි විය. මේ අතර බැංකුවේ පොළී වියදම් රු. බිලියන 149.3 දක්වා 2% කින් අඩු වූ අතර, එය කාලෝචිත ප්‍රතිමිලකරණ තීරණ සහ බැංකුවේ ජංගම සහ ඉතුරුම් ගිණුම් අනුපාතයේ වැඩි දියුණුවක් පිළිබිඹු කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, බැංකුවේ ශුද්ධ පොළී ආදායම වසර තුළදී රු. බිලියන 111.3 දක්වා 49% කින් ඉහළ ගොස් ඇති අතර එය මෙහෙයුම් ආදායමෙන් 81% ක් විය.

අරමුදල් පදනම් කරගත් ආදායම



ගාස්තු සහ කොමිස් ආදායම: බැංකුවේ ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම රු. බිලියන 14.2 දක්වා 19% කින් ඉහළ ගොස් ඇති අතර, එය ඩිජිටල් අනුගතවීම ඉහළ නැංවීම සඳහා වූ උපායමාර්ග කෙරෙහි අවධානය යොමු කිරීම නිසා ණය සහ හර කාඩ්පත් ආශ්‍රිත සේවාවන්ගෙන් ලැබෙන ආදායම 42% කින් වැඩි වීමට හේතු විය. නව සාමාන්‍යකරණය යටතේ රට ක්‍රියාත්මක වීමට පටන් ගැනීමත් සමඟ ඇතිවූ ආනයන අපනයන ක්‍රියාකාරකම්වල වර්ධනයත් සමඟ වෙළඳ කටයුතු වලින් ලැබෙන ආදායම දෙගුණයකින් ඉහළ යාමද ගාස්තු හා කොමිස් ආදායමේ වර්ධනයට ඉවහල් විය. 'BOC අපනයන කවය' හරහා අපනයන ආදායම ශක්තිමත් කිරීම සඳහා බැංකුවේ උපායමාර්ගික අභිලාශයද මෙමගින් පිළිබිඹු කරයි.

ගාස්තු සහ කොමිස් ආදායම



- **වෙනත් ආදායම්:** වෙනත් ආදායම් සමන්විත වන්නේ බැංකුවේ ආයෝජන කළඹ මත වෙළඳාම සහ සාධාරණ අගය මත ලාභ/ අලාභ මෙන්ම විදේශ විනිමය ආදායමයි. වසර තුළ දී, පහත සඳහන් දෑ හේතු කොට ගෙන වෙනත් ආදායම් රු. බිලියන 12.2 දක්වා දෙගුණයක ආසන්න අගයකින් වර්ධනය විය.
  - ඇ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන් වෙළඳ කටයුතු වලින් ලැබෙන විදේශ විනිමය ආදායම 85% කින් ඉහළ යෑම.
  - 2021 පළමු මාස නවය තුළ කොටස් වෙළඳපළ දර්ශකවල ඉහළ යාම හේතුවෙන් මූල්‍ය උපකරණවලින් ලැබූ ලාභවල 45% ක වර්ධනයක්.
  - ඇ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් විදේශ විනිමය ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිලාභ තුන් ගුණයකට වඩා වර්ධනය වීම.

හානිකරණ ප්‍රතිපාදන

සාර්ව-ආර්ථික පීඩනය සහ වසංගතයෙන් සිදුවූ බලපෑම හේතු කොට ගෙන ණය කළඹේ ගුණාත්මක භාවය කෙරෙහි නොවැළැක්විය හැකි බලපෑමක් ඇති විය. ලංකා බැංකුවෙහි උපායමාර්ග කේන්ද්‍රගත වූයේ මෙම අභියෝගාත්මක කාලවලදී තම ගනුදෙනුකරුවන් ක්ෂණිකව ප්‍රකෘති තත්ත්වයට පත්කිරීම වෙනුවට ඔවුන්ගේ දිගුකාලීන තිරසාරත්වය සඳහා දායක වීමයි. ගනුදෙනුකරුවන්ගේ පුනර්ජීවනය සඳහා වූ මෙම සවිඥානික ප්‍රවේශය මෙන්ම විදේශ මුදල් වලින් නම් කරන ලද ස්වෛරීත්ව බැඳුම්කර වෙනුවෙන් තැබූ හානිකරණ ප්‍රතිපාදන හේතුවෙන් වසර තුළ දී බැංකුවේ හානිකරණ ප්‍රතිපාදන රු. බිලියන 43.7 දක්වා 40% කින් ඉහළ ගියේය.

හානිකරණය සඳහා වන ප්‍රතිපාදන



හානිකරණ ප්‍රතිපාදන ඉහළ ගියද, බැංකුවේ ණය කළඹේ ගුණාත්මකභාවය මනිනු ලබන දළ අක්‍රීය ණය අනුපාතය පෙර වසරේ තිබූ අගය වන 4.8% සිට 4.5% දක්වා වර්ධනයක් වාර්තා කරන ලදී. අඛණ්ඩ දැඩි හා විචක්ෂණශීලී ප්‍රතිපාදන ප්‍රතිපත්ති බැංකුව අනුගමනය කර ඇති අතර වසර තුළ පැවති ඉහළ අවිනිශ්චිතභාවය සැලකිල්ලට ගෙන, අවදානම් සහිත කර්මාන්ත සඳහා අතිරේක අපේක්ෂිත ණය හානිකරණ සඳහා ප්‍රතිපාදන ක්‍රමවේදය යටතේ ආර්ථික සාධක ගැලපුම (EFA) සිදු කරන ලද අතර හානිදායී කාණ්ඩයට වැඩි බර තැබීමක් සිදු කරන ලදී. 3 වන අදියරේ හානිකරණ සංචිතය 19% කින් වැඩි වූ අතර 2 වන අදියරේ හානිකරණ සංචිතය ද වසර තුළ 32% ක වර්ධනයක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, බැංකුවේ ණය හානිකරණ ප්‍රතිපාදන සංචිත අනුපාතය 6% ක් ලෙස සටහන් වූ අතර, 3 වන අදියරේ ණය සහ අත්තිකාරම් අනුපාතයට සාපේක්ෂව 3 වන අදියරේ හානිකරණ ප්‍රතිපාදන 49% ක් ලෙස වාර්තා විය. බලපෑමට ලක් වූ පහසුකම් සඳහා ක්‍රියාකාරීව අධීක්ෂණය කිරීමට සහ විසඳුම් ලබා දීමට වසර තුළ දී, ව්‍යාපාර ප්‍රත්‍යානයන සහ පුනරුත්ථාපන ඒකකයක් ද පිහිටුවන ලදී.

වියදම් කළමනාකරණය

පිරිවැය කළමනාකරණය



මෙහෙයුම් වියදම් වලින් විශාලතම කොටස වන මානව සම්පත් වියදම් 37% කින් වැඩි වීම හේතුවෙන්, මෙහෙයුම් වියදම් 26% කින් වර්ෂය තුළ දී ඉහළ ගියේය. දක්ෂතා හඳුනා ගැනීම සහ ඇගැයීම් පිරිනැමීම කෙරෙහි බැංකුව උපායමාර්ගිකව අවධානය යොමු කිරීම හේතුවෙන් ද සාමූහික ගිවිසුමට අනුව වැටුප් පරිමාණයන් ඉහළ අගයකින් සංශෝධනය වීමද කාර්ය මණ්ඩල පිරිවැය ඉහළ යාමට හේතු විය. බැංකුව විසින් අභ්‍යාසලාභී මාණ්ඩලික සහකාරවරුන් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කර ගැනීම කාර්ය මණ්ඩල පිරිවැය ඉහළ යෑමට තවත් එක් හේතු සාධකයක් විය. මේ අතර, තැන්පතු හිතකර වර්ධනයට සමගාමීව තැන්පතු රක්ෂණ වාරිකයේ ඉහළ යාම සහ සියලුම මෙහෙයුම් ස්ථානවල දැඩි සෞඛ්‍යාරක්ෂිත පියවරයන් සඳහා දරණ ලද පිරිවැය වැඩිවීම හේතුවෙන් අනෙකුත් වියදම් 18% කින් ඉහළ ගියේය. මෙම වැඩිවීම නොතකා, ස්වයංක්‍රීයකරණය සහ ඩිජිටල්කරණ ක්‍රියාවලීන් තුළින් ඵලදායිතාව ඉහළ නැංවීම සහ සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සඳහා දරණ ලද අඛණ්ඩ උත්සහයන් පිළිබිඹු කරමින්, බැංකුවේ පිරිවැයට ආදායම 32% ක් ලෙස සටහන් විය.

පිරිවැයට ආදායම



බදුකරණය

වසර තුළ බදු ආකාරයෙන් රජයට වටිනාකම් නිර්මාණය කිරීම රු. බිලියන 18.9 දක්වා 35% කින් වැඩි විය. මෙහෙයුම් ලාභයේ ශක්තිමත් වර්ධනයට සමගාමීව මූල්‍ය සේවා මත වැට් බද්ද 65% කින් රු. බිලියන 9.0 දක්වා ඉහළ ගියේය. 2021 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 51(4) වගන්තියට අනුව, ආයතනික ආදායම් බදු අනුපාතය 2020 සිට ක්‍රියාත්මක වන පරිදි 28% සිට 24% දක්වා සංශෝධනය කරන ලද අතර ඒ අනුව, බැංකුවේ 2021 වර්ෂය සඳහා ආදායම් බදු වගකීම රු. මිලියන 724.9 කින් අඩු විය. කෙසේ වෙතත්, 2020 වසර සඳහා ආදායම් බදු වියදම 28% ක බදු අනුපාතයට අනාවරණය කර ඇති අතර 28% සිට 24% දක්වා බදු අනුපාත අතර වෙනස පෙර වර්ෂවලට අදාළ ගැළපීම්වලට ඇතුළත් කර ඇත. වර්ෂය සඳහා ආදායම් බදු වියදම් රු. බිලියන 5.6 ක් වූ අතර, එය ප්‍රධාන වශයෙන් බදු අනුපාතිකය අඩුවීම හේතුවෙන් පෙර වසරට සාපේක්ෂව සුළු පහත වැටීමක් පෙන්නුම් කරයි.

මෙම පෙර වසර සහ විලම්බිත බදු ගැළපීම් ඉවත් කළ විට බැංකුවේ ආදායම් බදු වියදම වසර සඳහා රු. බිලියන 10.3 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

** සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගය*

ප්‍රධාන මූල්‍ය නිලධාරීතුමාගේ සමාලෝචනය

ලාභදායීත්වය



ණය කළඹේ වර්ධනය, පොළී ආන්තිකයන්හි, ඵලදායී කළමනාකරණය ණය කළඹේ ගුණාත්මකභාවය සහ වියදම් හි ඵලදායී කළමනාකරණයේ ප්‍රතිඵලයක් ලෙස වසර තුළ දී 83% වර්ධනයක් සහිතව බදු පෙර ලාභය රු. බිලියන 43.2 දක්වා ඉහළ නැංවීමට බැංකුවට හැකි වූ අතර, එය පැවති දැඩි වෙළඳපළ අභියෝග වලින් සමන්විත වර්ෂයක් තුළ දී ලැබූ ප්‍රශංසනීය ජයග්‍රහණයකි. මේ අතර පෙර වසරට සාපේක්ෂව වර්ෂය සඳහා බදු පසු ලාභය රු. බිලියන 37.6 ක් ලෙස වාර්තාගත ලෙස දෙගුණයකටත් වඩා වැඩි ඉහළ අගයක් පෙන්නුම් කල අතර, එය විවිධ පාර්ශ්වකරුවන්ගේ තරඟකාරී අවශ්‍යතා සමතුලිත කිරීම තුළින් විවිධ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා මුදුන්පත් කිරීමට බැංකුවට ඇති හැකියාව පෙන්නුම් කරයි. ස්කන්ධයෙහි සාමාන්‍යය මත ප්‍රතිලාභ අනුපාතය (ROAE) පෙර වසරේ පැවති 11.9% සිට 21.0% දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය. ලාභ වර්ධනයට අනුකූලව වසර තුළ දී වත්කම්හි සාමාන්‍ය මත ප්‍රතිලාභ අනුපාතය (ROAA) 1.3% දක්වා වැඩි දියුණු විය.

අනෙකුත් විස්තීරණ ආදායම (OCI)

පසුගිය වර්ෂයේ වාර්තා වූ රු. බිලියන 1.8 ක අලාභය හා සසඳන විට බැංකුවේ අනෙකුත් විස්තීරණ ආදායම වර්ෂය සඳහා රු. බිලියන 8.4 ක් විය. මෙම වැඩි වීම පොළී අනුපාත චලනයන්ට අනුකූලව විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්වල ශුද්ධ ආයුගණන ගැළපුම් මත ලාභයත් පිළිබිඹු කරන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස බැංකුවේ වර්ෂය සඳහා සමස්ත විස්තීරණ ආදායම රු. බිලියන 45.9 ක් විය.

ණය කළඹේ වර්ධනය, පොළී ආන්තිකයන්හි, ඵලදායී කළමනාකරණය, ණය කළඹේ ගුණාත්මකභාවය සහ වියදම්හි ඵලදායී කළමනාකරණයේ ප්‍රතිඵලයක් ලෙස වසර තුළදී 83% වර්ධනයක් සහිතව බදු පෙර ලාභය රු. බිලියන 43.2 දක්වා ඉහළ නැංවීමට බැංකුවට හැකි වූ අතර, එය පැවති දැඩි වෙළඳපළ අභියෝග වලින් සමන්විත වර්ෂයක් තුළදී ලැබූ ප්‍රශංසනීය ජයග්‍රහණයකි.

වත්කම්



වර්ෂය තුළ දී 28% ක ශක්තිමත් වත්කම් ප්‍රසාරණයක් පෙන්නුම් කරමින්, බැංකුවේ ශේෂ පත්‍රය 2021 දෙසැම්බර් අවසානය වන විට රු. ට්‍රිලියන 3.8 දක්වා ළඟා වූයේ බැංකුවේ වෙළඳපළ නායකත්වය තව තවත් තහවුරු කරමිනි. වත්කම් හි 22% ක වර්ධනය මූලික වශයෙන් ණය සහ අත්තිකාරම් මඟින් මෙහෙයවනු ලැබූ අතර, වසංගතයෙන් බලපෑමට ලක් වූ කර්මාන්ත සහ ව්‍යාපාර යළි නඟා සිටුවීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී. මුළු වත්කම් වලින් 63% ක් ණය වත්කම් වලින් සමන්විත වූ අතර, වර්ෂය තුළ දී වත්කම් සංයුතිය සාපේක්ෂව නොවෙනස්ව පැවතුනි.

ණය සහ අත්තිකාරම්: කර්මාන්ත සහ නිෂ්පාදන අංශ පදනමේ පුළුල් වර්ධනයේ සහය ඇතිව බැංකුවේ ණය සහ අත්තිකාරම් වර්ෂය තුළ රු. ට්‍රිලියන 2.0 සීමාව ඉක්මවා ගියේය. අයිරා පහසුකම්, පුද්ගලික ණය සහ කාලීන ණය ප්‍රසාරණය වීම නිසා පුද්ගලික අංශයට ණය ලබාදීම 9% කින් වැඩි විය.

අඩු පොළී අනුපාත තත්ත්වයක් වර්ෂය පුරාවටම පැවති අතර නව සාමාන්‍යකරණය යටතේ ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම සඳහා ණය ඉල්ලුම් කිරීම වැඩිවීමට මෙය හේතු විය. පුද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශයේම කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම අයිරා පහසුකම් 73% කින් සහ කාලීන ණය 12% කින් වැඩි වීම තුළින් පිළිබිඹු වන අතර සංචරණ සීමා ලිහිල් කිරීම සහ චීන්නත් කිරීමේ වැඩසටහන සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම නිසා ජීවන රටාව නව ආකාරයකින් සාමාන්‍ය තත්ත්වයට ගෙන ඒම තුළින් පුද්ගලික ණය පහසුකම් වර්ෂය තුළ 19% කින් වර්ධනය විය.

රාජ්‍ය බැංකුවක් ලෙස, රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය නංවාලීමේ අරමුණ පෙරදැරිව, වර්ෂය අවසානය වන විට බැංකුව විසින් 'දිවි උදාන' ණය යෝජනා ක්‍රම යටතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයට රු. බිලියන 130.5 කට වැඩි ණය ප්‍රමාණයක් ලබා දී ඇත.

අපගේ ණය කළඹේ ගුණාත්මකභාවය සෑම විටම පූර්ණ අධීක්ෂණය යටතේ පවතින අතර අපේක්ෂිත පාඩු ග්‍රහණය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන මට්ටම් පවත්වා ගැනීමට අවශ්‍ය විචක්ෂණ ප්‍රවේශයන් සැමවිටම ක්‍රියාත්මක කරනු ලබයි. ණය සහ අත්තිකාරම් මත කොවිඩ්-19 බලපෑම පිළිබිඹු වන පරිදි හානිකරණ ප්‍රතිපාදන සැකසීමේ දී කළමනාකරණ තක්සේරු මත අවධානම් ගැළපීම් සිදු කරන ලද අතර රටේ ශ්‍රේණිගත කිරීම පහත හෙළීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමනයන් සහ ශ්‍රී. ලං. මූ. වා. ප්‍ර. 09 ට අනුකූලව අවශ්‍ය ගැලපීම් කරන ලදී.

- **ද්‍රවශීලතාවය සහ ආයෝජන:** පෙර නොවූ විරූ වෙළඳපළ අස්ථාවරත්වයක් තිබියදීත්, බැංකුවේ දේශීය හා විදේශීය මුදල් ද්‍රවශීලතා තත්ත්වය වසර තුළ යහපත් මට්ටමක පැවතුනි. බැංකුව සිය වෙළඳපළ නායකත්වය සහ පුළුල් පරාසයක විභිදි ප්‍රවේශය මත විදේශ මුදල් ප්‍රේෂණ ගලා ඒමේ ඉහළ යාමක් ළඟා කරගත් අතර එය විදේශ මුදල් ද්‍රවශීලතාවය කළමනාකරණයට රුකුලක් විය. වර්ෂය තුළ දී රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජන රු. බිලියන 1,082.2 දක්වා ඉහළ ගිය අතර සියලු ද්‍රවශීලතා ආවරණ අනුපාත නියාමන අවම මට්ටම්වලට වඩා ඉහළ අගයක පැවතුණි.

** සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගය*

වගකීම් සහ ප්‍රාග්ධනය

තැන්පතුවල 16% ක වර්ධනයක් සහ අනෙකුත් ණය ගැනීම් දෙගුණයකින් වැඩි වීමෙන් මුළු වගකීම් රු. ට්‍රිලියන 3.6 දක්වා 28% කින් වැඩි විය. රු. ට්‍රිලියන 2.9 ක තැන්පතු පදනමක් සමඟින්, ලංකා බැංකුව තැන්පතු සම්බන්ධයෙන් එහි ඈඳාගත් හැකියාව ඉහළ මට්ටමක පවත්වා ගෙන යනු ඇත. මුළු තැන්පතු වලින් 21% ක් විදේශ මුදල් තැන්පතු වලින් සමන්විත වන අතර එය වසර තුළ 10% කින් රු. බිලියන 613.2 දක්වා වැඩි විය. 2021 දී බැංකුවේ ජංගම හා ඉතුරුම් ගිණුම් අනුපාතය 36% (පෙර වර්ෂයේ 35%) දක්වා වැඩි වූ අතර ශුද්ධ පොළී ආන්තිකය පුළුල් වීමට මෙය ප්‍රධාන සාධකයක් විය.

සාර්ව-ආර්ථික අවිනිශ්චිතතාවය සහ වේගවත් ණය වර්ධනය හේතුවෙන්, ලංකා බැංකුව වර්ෂය තුළ සිය ප්‍රාග්ධනය ශක්තිමත් කිරීමට උත්සහ කරන ලදී. රජය සතු ආයතනයක් ලෙස, ලංකා බැංකුව හට එහි ප්‍රාග්ධන පදනම වැඩි දියුණු කිරීමට ඇති මාර්ග සීමිත බැවින් අභ්‍යන්තරව ජනනය කරන අරමුදල් මත විශ්වාසය තැබීමට සිදුවේ. වර්ෂය තුළ දී, අභ්‍යන්තර ප්‍රාග්ධන උත්පාදනය හරහා ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය ශක්තිමත් කිරීමට ප්‍රමුඛත්වය දුන් ලාභාංශ ප්‍රතිපත්තියක් මගින් ප්‍රාග්ධන පදනම ශක්තිමත් කරන ලදී. ඒ අනුව, ලාභ රඳවා තබා ගැනීම මත වසර තුළ දී බැංකුවේ රඳවාගත් ඉපැයීම් 41% කින් රු. බිලියන 136.7 දක්වා ඉහළ ගිය අතර, එහි ප්‍රතිඵලයක් ලෙස කොටස් හිමියන්ගේ අරමුදල් රු. බිලියන 200.7 දක්වා 28% කින් වැඩි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, බැංකුවේ පොදු ස්කන්ධ ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය 12.9% දක්වා වැඩි වූ අතර, 2021 දෙසැම්බර් අවසන් වන විට මුළු ප්‍රාග්ධන අනුපාතය 17.8% ක් ලෙස සටහන් විය. රු. බිලියන 3.4 ක ලැයිස්තුගත නොවන, සුරැකුම් රහිත, යටත්, නිත්‍ය, අතිරේක ස්ථර 1 ප්‍රාග්ධන බැඳුම්කර නිකුතුවකින් ස්ථර 1 ප්‍රාග්ධනය ශක්තිමත් වූ අතර 2021 නොවැම්බරයේදී රු. බිලියන 5.2 ක සුරැකුම් රහිත, යටත්, නිදහස් කළ හැකි ණයකර නිකුත් කිරීම මගින් ස්ථර 2 ප්‍රාග්ධනය ද ශක්තිමත් විය.

සමූහයේ කාර්යසාධනය

ඒකාබද්ධ මට්ටමින්, සමූහයේ සමාගම්වල දායකත්වය 200% කට වඩා වැඩි වීමත් සමඟ, වර්ෂයේ සමූහයේ බදු පෙර ලාභය දෙගුණ වූ අතර එය රු. බිලියන 44.6 ක් විය. 2021 අවසන් වන විට බැංකුවට පරිපාලිත සමාගම් නවයක් සහ ආශ්‍රිත සමාගම් හතරක් තිබූ අතර ඒවා මූල්‍ය සේවා, දේපළ කළමනාකරණ සේවා සහ හෝටල් කළමනාකරණය වැනි විවිධ මෙහෙයුම්වලට සම්බන්ධ වේ. බැංකුව සතු විදේශ අනුබද්ධිත ආයතනයක් වන ලංකා බැංකුව (යූ කේ) සමාගම යුරෝපයේ වෙළඳපළ ප්‍රවේශයට පහසුකම් සලසා ඇති අතර කාර්ය මණ්ඩලය සඳහා විදේශ මෙහෙයුම් අත්දැකීම් ලබා ගැනීමට ඵලදායී වේදිකාවක් සපයයි. සමස්ත වත්කම් වලින් 99% ක හිමිකාරිත්වය දරන ලංකා බැංකුව සමූහය තුළ ප්‍රමුඛතම ආයතනය වේ.

වර්ෂය තුළ සමූහ ක්‍රියාකාරකම්වල විශේෂ අවස්ථා සඳහා පහත සඳහන් දෑ ඇතුළත් විය.

- ලංකා බැංකුව විසින් 2021 සැප්තැම්බර් මාසයේදී එහි පරිපාලිත සමාගමක් වන මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ආයතනය වර්ෂය තුළ ලාභදායී ආයතනයක් බවට පත් කිරීම උදෙසා රු. බිලියන 1.7 ක ප්‍රාග්ධන දායකත්වයක් ලබා දුනි. බලපත්‍රලාභී කල්බදු සහ මූල්‍ය ආයතනයක් ලෙස, බැංකුවේ අවදානම් අභිරුචියට යටත් නොවන වෙළඳපළ කොටසකට පහසුකම් සැලසීමට මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ආයතනය සමත් වේ.
- බැංකුවේ වක්‍ර පරිපාලිත ආයතනයක් වූ කොළඳෙණිය හයිඩ්‍රෝපවර් (පෞද්ගලික) සමාගම බාහිර පාර්ශ්වයකට විකිණීම.
- සී/ස සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගමෙහි සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම සතු කොටස් අයිතිය සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම වෙත පැවරීම.
- 2022 දී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී සමාගම කොළඹ කොටස් වෙළඳපළ ලැස්තුගත ලේඛණයෙන් ඉවත් කිරීමට බැංකුව සැලසුම් කර ඇත.

වාර්ෂික විස්තීරණ පරිපාලිත කාර්යසාධන සමාලෝචනයකට එහා ගිය පරිපාලිත සමාගම් ප්‍රඥප්තියක් යටතේ පරිපාලිත සමාගම් කළමනාකරණය කෙරේ. සමූහයේ සමස්ත අවදානම් අභිරුචියට අනුකූලව අවදානම් පිළිගත හැකි මට්ටම් තුළ කළමනාකරණය කර ඇති බව සහතික කිරීම සඳහා පරිපාලිත සමාගම්වල මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරිත්වය බැංකුව විසින් නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලබන අතර අවදානම් තොරතුරු බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරිතුමා වෙත වාර්තා කෙරේ. මේ අතර, බැංකුවේ අපේක්ෂාවන්ට අනුකූලව පරිපාලිත සහ ආශ්‍රිත සමාගම් වල මෙහෙයුම් සිදු කිරීම සහතික කිරීම සඳහා බැංකුවේ නියෝජිතයෙකු සාමාන්‍යයෙන් එම සමාගම් වල අධ්‍යක්ෂ මණ්ඩල තනතුරක් දරයි.

ඉදිරි දැක්ම

කෙටි කාලීනව ශ්‍රී ලංකාව නොවැළැක්විය හැකි සාර්ව ආර්ථික පීඩනයකට මුහුණ දෙන බැවින්, අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීමට සහ ඔවුන්ගේ දිගුකාලීන තිරසාරභාවය සහතික කිරීම සඳහා ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධ වීමට බැංකුව කැපවී සිටී. මෙම අභිලාෂයන්ට අනුකූලව, ලංකා බැංකුව විසින් එහි වර්ධන සැලසුම් මෙහෙයවීම සඳහා අභ්‍යන්තර ලාභ උත්පාදනය සහ ණයකර නිකුතු හරහා එහි ප්‍රාග්ධන තත්ත්වය ඉහළ නැංවීම කෙරෙහි ද අවධානය යොමු කරනු ඇත. සුදුසු ගනුදෙනුකාර කාණ්ඩ සමඟ සම්බන්ධවෙමින් අඩු වියදම් තැන්පතු පදනම තවදුරටත් පුළුල් කරන අතරම ජාත්‍යන්තර සංවර්ධන මූල්‍ය නියෝජිතායතන වෙතින් සෘජු ජාත්‍යන්තර අරමුදල් ලබා ගැනීමට ද අපි බලාපොරොත්තු වෙමු. ක්‍රියාවලි ඩිජිටල්කරණය වැඩි කිරීම සහ නැගී එන ජාත්‍යන්තර හොඳම භාවිතයන් වෙත අනුගත වීම තුළින් අපගේ මූල්‍ය වාර්තාකරණය ශක්තිමත් කිරීම කෙරෙහි ද උපායමාර්ගික අවධානය යොමු කෙරේ.



ඩබ්ලිව් පී රසල් ෆොන්සේකා
ප්‍රධාන මූල්‍ය නිලධාරී

2022 පෙබරවාරි 24
කොළඹ දී

ව්‍යාපාරික අංශ සමාලෝචනය



ශාඛා බැංකුකරණය

ලංකා බැංකුවේ ශාඛා බැංකුකරණ අංශය මගින් පුද්ගලයන්ට, ව්‍යවසායකයින්ට සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්ට දිවයින පුරා විසිරී තිබෙන 2,016 කට අධික ගනුදෙනුකාර සේවා මධ්‍යස්ථාන හරහා ණය දීම, ආයෝජන සහ ගනුදෙනුකාර බැංකු සේවා රැසක් පිරිනැමීම සිදු කරයි. කොවිඩ්-19 හි විනාශකාරී ආර්ථික බලපෑමෙන් මිදීම සඳහා ක්‍රියාකාරිව සහය වන අතරම, බැංකු සේවා සඳහා ගනුදෙනුකරුවන්ට බාධාවකින් තොරව ප්‍රවේශ වීමට ඇති හැකියාව සහතික කිරීම කෙරෙහි වර්ෂය තුළ දී මෙම අංශයේ ප්‍රමුඛ අවධානය යොමුවිය.

කාර්යසාධන විශේෂ අවස්ථා 2021

ශාඛා බැංකුකරණ අංශය 10% ක වත්කම් වර්ධනයක් සහ දෙගුණයකට වඩා වැඩි මෙහෙයුම් ලාභ වර්ධනයක් වාර්තා කරමින් වර්ෂය තුළ සාර්ථකව ක්‍රියාත්මක විය.

ශාඛා බැංකුකරණ අංශයේ කාර්යසාධනය



මෙහෙයුම් පරිසරයේ බලපෑම්

- ➕ ශ්‍රී ලංකා මහා බැංකුවේ ණය සහන යෝජනා ක්‍රම දීර්ඝ කිරීම
- ➕ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ හඳුනාගත් ප්‍රමුඛතා අංශ සඳහා ශක්තිමත් ප්‍රතිපත්තිමය සහාය
- ➖ නැවත නැවතත් උත්සන්න වූ වසංගතයෙන් පැමිණි බාධා
- ➖ වර්ෂයේ දෙවන භාගයේදී පොළී අනුපාත ඉහළ යාමේ ප්‍රවණතාවය

රු. බිලියන 53.1

ශුද්ධ පොළී ආදායම

රු. බිලියන 21.4

මෙහෙයුම් ලාභය

රු. බිලියන 995.6

වත්කම්

රු. බිලියන 943.1

වගකීම්

තැන්පතු

වර්ෂයේ වැඩි කාලයක් තුළ පැවති අඩු පොළී අනුපාත පරිසරය සැලකිල්ලට ගත් විට තැන්පතු 16% කින් ඉහළයාම ආකර්ෂණීය වර්ධනයකි. මේ අතර, රට පුරා තැන්පතු ඒකරාශි කර ගැනීමේ කේන්ද්‍රීය උත්සහයේ ප්‍රතිඵලයක් ලෙස සහ බැංකුවේ අසමසම තැන්පතු සහ සන්නාම ශක්තිය සහතික කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ජංගම සහ ඉතුරුම් අනුපාතය 45% ක් ලෙස පවත්වා ගැනීමට හැකි විය.

ණය සහ අත්තිකාරම්

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ පුනර්ජීවනයට සහය දැක්වීමේ අරමුණින් 'දිවි උදාන' ණය යෝජනා ක්‍රමය හරහා ලබාදුන් ණය හේතුවෙන් ණය සහ අත්තිකාරම් 7% කින් වර්ධනය විය. වසංගතයෙන් සැලකිය යුතු ලෙස බලපෑමකට ලක් වූ සංචාරක, ඩීවර, කෘෂිකර්මික සහ සත්ත්ව පාලනය වැනි අංශවල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ණය ලබා දීම හේතුවෙන් 2021 වර්ෂය අවසන් වන විට මෙම අංශයේ යෝජනා ක්‍රම යටතේ වන ණය කළඹ රු. බිලියන 90.0 ඉක්මවා ඇත. වසර තුළ අපි කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ණය යෝජනා ක්‍රමයක් දියත් කළ අතර මගී ප්‍රවාහන අංශයේ සහ කෘෂිකාර්මික අංශයේ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති සඳහා ද අබණ්ඩව ණය ලබා දුනි. තවද රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා 'සොඳුරු කැදැල්ල' නමින් නව නිවාස ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දුන් අතර විවිධ වෘත්තිකයන් රැසක් සඳහා පුද්ගලික ණය යෝජනා ක්‍රම ද ලබා දුනි.

ගනුදෙනුකාර බැංකු සේවා

පෙර නොවූ විරූ ඩිජිටල් භාවිතය සහ ශාඛා රහිත බැංකුකරණයේ වර්ධනය මධ්‍යයේ හර කාඩ් සහ ණය කාඩ්පත් ගනුදෙනු වල වටිනාකම 33% කින් වැඩි වූ අතර ගනුදෙනු පරිමාව 30% කින් වැඩි විය. මෙමඟින් බැංකුවේ ගනුදෙනුකරුවන් ඩිජිටල් ලෙස සක්‍රීය කිරීම සඳහා ඇති බැංකුව විසින් අනුගමනය කරන උපායමාර්ගික ප්‍රවේශයේ සාර්ථකත්වය විදහා දක්වයි.

ණය ගෙවීම් කාල පමා සහන

2021 දෙසැම්බර් අවසානය වන විට, ශාඛා බැංකුකරණ අංශයේ ණය කළඹෙන් 5% ක් ණය ගෙවීම් සහන යටතේ වූ අතර එය 2020 දෙසැම්බර් 35% අගයක පැවතුණි. 2021 දෙසැම්බර් මාසය අවසන් වන විට බොහෝ ණය ගෙවීම්වල කාලපමා සහන කාල අවසන් වූ අතර, සංචාරක අංශයේ ණය ගෙවීම්වල කාල පමා සහන 2022 ජුනි දක්වා තවදුරටත් දීර්ඝ කරන ලදී.

ණය කළඹේ ගුණාත්මකභාවය

වසංගතයේ පවතින ආර්ථික බලපෑම ණය කළඹේ ගුණාත්මක භාවයට බලපෑ අතරම, වර්ෂය තුළ 4.9% ක දළ අක්‍රීය ණය අනුපාතයක් පවත්වා ගෙන යාමට බැංකුව සමත් විය. ප්‍රතිසාධන ක්‍රියාමාර්ගවලට වඩා ව්‍යාපාර පුනර්ජීවනය සහ ගනුදෙනුකරුවන්ගේ දිගුකාලීන තිරසාරභාවය කෙරෙහි වසර තුළ දී බැංකුවේ අවධානය යොමු විය.



උපායමාර්ගයන්ට එරෙහිව කාර්යසාධනය

ගනුදෙනුකාර කේන්ද්‍රීය බව

- කොවිඩ්-19 තුන්වන රැල්ල තුළ දී සංචරණ සීමා පනවා තිබියදීත් සියලුම ශාඛා සීමිත බැංකු වේලාවන් සඳහා විවෘතව පැවතුණි
- ශ්‍රී ලංකා මහා බැංකුව විසින් ලබා දුන් ණය ගෙවීමේ කාල පමා සහන දීර්ඝ කිරීම හරහා වසංගතයෙන් පීඩාවට පත් ගනුදෙනුකරුවන් සඳහා අඛණ්ඩ සහය
- කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් වූවන් සඳහා කාරක ප්‍රාග්ධන ණය
- පශ්චාත් වසංගත සමය තුළ ව්‍යාපාර පුනර්ජීවනයට සහය වීම සඳහා කැපවූ ඒකකය
- වසංගත කාල සීමාව තුළ බැංකු සේවා ගනුදෙනුකරුවන් වෙත ගෙනයාමට සියලුම 'ජංගම බැංකු ඒකක' යෙදවීම
- ගොවීන්/ ධීවරයින් සඳහා විශේෂ ඉතුරුම් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම
- BOC SMART 'රන් කැකුළු' ඉතුරුම් ගිණුම දියත් කිරීම

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය

- "SME Online" අන්තර්ජාලයෙන් ණය අයදුම් කිරීමේ පහසුකම දියත් කිරීම
- ණය පහසුකම් ඉල්ලුම් කිරීම සහ ආපසු ගෙවීම් ඩිජිටල්කරණය
- ඩිජිටල් නාලිකා හරහා ගනුදෙනු කිරීමට ගනුදෙනුකරුවන් වැඩි ලෙස යොමු කිරීම
- පුද්ගලික ණය පහසුකම් සහ ලීසිං පහසුකම් අන්තර්ජාලය හරහා අනුමත කිරීම
- ග්‍රාමීය සහ බැංකු පහසුකම් අඩු අංශයට බැංකුකරණ පහසුකම් සැපයීම සඳහා නව සේවා නාලිකාවක් වන 'BOC CONNECT' දියත් කරන ලදී.

ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය

- BOC 'සශ්‍රීක' සහ 'සොඳුරු කැදැල්ල' නමින් නව ණය යෝජනා ක්‍රමයන් හඳුන්වා දීම
- අක්‍රීය ණය බවට පත්වීමේ සම්භාවිතාවක් පවතින ණය කෙරෙහි පෙර විමසුම් අධීක්ෂණය
- ප්‍රාදේශීය ණය මධ්‍යස්ථාන 14 හරහා ණය සැපයුම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ ගුණාත්මකභාවය පවත්වාගෙන යාම.
- බැංකුවේ ක්ෂුද්‍ර මූල්‍යකරණ වැඩසටහන වන 'BOC මිතුරු' හරහා බැංකුව රටේ වඩාත්ම අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට මූල්‍ය පහසුකම් ලබා දීම හරහා මූල්‍ය ඇතුළත් කිරීම් සිදු කරයි. 2021 දී මෙම අංශය සඳහා රු. බිලියන 16.0 ක ණය ලබා දී ඇත.

කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩ නැඟීම

- කාර්ය මණ්ඩලයට සේවයට වාර්තා කිරීම සඳහා විශේෂ ප්‍රවාහන පහසුකම් සලසා තිබුණි
- කාර්ය මණ්ඩලය සඳහා පුද්ගලික ආරක්ෂක උපකරණ ලබා දෙන ලදී
- ඒකරාශීවීම සීමා කිරීම සඳහා පුහුණු කිරීම් සහ රැස්වීම් බොහෝ දුරට මාර්ගගතව පවත්වන ලදී
- කාර්ය මණ්ඩල ගම්‍යතාවය සහ අන්තර් සම්බන්ධතාවය සහතික කිරීම සඳහා 'BOC Spirit' සම්මානය TVBOC හරහා පවත්වන ලදී

ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය

- වර්ෂය අවසාන වන විට ශාඛා 51 ක් සූර්ය බලශක්ති උත්පාදනය කරන ශාඛා බවට පරිවර්තනය විය.
- හරිත ගොඩනැගිලි ප්‍රමිතීන්ට අනුව ශාඛා 12 ක් ඉදිකර ඇත.

ඉදිරි දැක්ම

අපි බිම් මට්ටමේ සිට වර්ධනයක් ඇති කිරීමට කැපවී සිටින අතර, කොවිඩ්-19 අර්බුදයෙන් පසු නැගී සිටීමට වෙර දරණ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ක්ෂුද්‍ර ව්‍යවසායකයින්ට අරමුදල් සහ පුද්ගලාරෝපිත මූල්‍ය විසඳුම් සඳහා ප්‍රවේශය අඛණ්ඩව ලබා දෙන්නෙමු. විශාල මූල්‍ය ඇතුළත් කිරීම් සහ ප්‍රවේශයක් සඳහා අප උත්සහ කරන බැවින් මූල්‍ය සේවා ඩිජිටල්කරණය ප්‍රමුඛතාවයක් ලෙස පවතිනු ඇත. මේ අතර, අඛණ්ඩ පුහුණු අවස්ථා තුළින් අපගේ ශාඛා ජාලය පුරා සිටින ණය නිලධාරීන්ගේ කුසලතා ඉහළ නැංවීම කෙරෙහි අපි තවදුරටත් අවධානය යොමු කරන්නෙමු.

අවස්ථාවන්

- සුළු හා මධ්‍ය පරිමාණ සහ ක්ෂුද්‍ර අංශවල සැලකිය යුතු වර්ධන අපේක්ෂාවන්
- ගනුදෙනුකරුවන්ගේ ඩිජිටල් අනුගත වීම ඉහළ යාම

අවදානම්

- ආර්ථිකය ප්‍රකෘති තත්ත්වයට පත්වීමේ දී සිදුවන ප්‍රමාදයන් ණය කළඹේ ගුණාත්මකභාවයට අහිතකර ලෙස බලපෑ හැකිය
- අඛණ්ඩ ආනයන සහ විදේශ විනිමය සීමා කිරීම්

ව්‍යාපාරික අංශ සමාලෝචනය



ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය

ආයතනික සහ අක්වෙරළ බැංකුකරණ අංශය පුද්ගලික අංශයේ ආයතන, රජයට සහ රජය සතු ව්‍යවසායන්ට ව්‍යපෘති ණය දීම, වෙළඳ මූල්‍යකරණය සහ අක්වෙරළ බැංකු පහසුකම් ඇතුළු මූල්‍ය සේවා රාශියක් පිරිනමයි. 2021 වර්ෂය අවසාන වන විට රු. බිලියන 1,430.3 ක වත්කම් පදනමක් ඇති විශාලතම ණය දෙන්නා ලෙස මෙම අංශය රටේ ආර්ථික වර්ධනය උදෙසා සුවිශාල මෙහෙයක් ඉටුකරයි.

කාර්යසාධනයේ විශේෂ අවස්ථා 2021

ආයතනික සහ අක්වෙරළ බැංකුකරණ අංශය 2021 දී සුවිශේෂී කාර්යසාධනයක් පෙන්නුම් කළ අතර, ඒ සඳහා 33% කට වැඩි ණය කළඹේ වර්ධනයක් සහ 58% ක ශුද්ධ පොළී ආදායමේ ප්‍රසාරණය දායක විය.

ආයතනික සහ අක්වෙරළ බැංකු අංශයේ කාර්යසාධනය



මෙහෙයුම් පරිසරයේ බලපෑම්

- ➕ වත්කම්වල ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා ණය සහන සහ අනෙකුත් සහන දීර්ඝ කිරීම්
- ➕ ජාතික අවශ්‍යතාවක් ලෙස අපනයන අංශයට ණය ලබා දීම වැඩි කිරීම
- ➖ ආනයන සීමා කිරීම් හේතුවෙන් විදේශීය ගනුදෙනු වල අඩුවීම
- ➖ ආනයන සීමා කිරීම් නිසා ඒ ආශ්‍රිත සේවා සැපයුම් මත සෘණාත්මක ලෙස බලපෑම

රු. බිලියන 34.6

ශුද්ධ පොළී ආදායම

රු. බිලියන 1,430.3

වත්කම්

පුද්ගලික අංශයට ණය දීම

ක්ෂේත්‍රයේ වර්ධනය වේගවත් කිරීම අරමුණු කරගත් සහනදායී අරමුදල් මාර්ග කිහිපයක් සමඟින් අපි පුද්ගලික අංශයට සහය ලබා දීම නිසා අංශයේ සමස්ත ණය කළඹෙන් 25% ක් වන පුද්ගලික අංශයට ණය දීම් 33% කින් වර්ධනය විය. මේ අතර, මෙම අංශයේ ණය කළඹෙන් දළ වශයෙන් 3% ක් පමණ වන ආයතනික පහසුකම් 3,300 කට අධික සංඛ්‍යාවකට ණය ගෙවීමේ සහන කාලයන් ලබා දෙන ලදී.

ව්‍යාපෘති සඳහා ණය දීම

රජයට ප්‍රධාන ණය දෙන්නෙකු ලෙස, මහාමාර්ග ඉදිකිරීම් සහ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වැනි රටේ ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අරමුදල් සපයමින් ජාතික ආර්ථිකය පුනර්ජීවනය කිරීමේ රජයේ ප්‍රයත්නයන්ට බැංකුව අඛණ්ඩව සහයෝගය ලබා දුන්නේය.

වෙළඳ මූල්‍යනය

අපනයනකරුවන්ට මූල්‍ය සම්පාදනය කිරීමේ බැංකුවේ අඛණ්ඩ උත්සහය සහ අත්‍යවශ්‍ය ආනයන සඳහා පහසුකම් සැලසීමේ ප්‍රමුඛත්වය නිසා අපගේ සේවාදායක පදනමට නව ගනුදෙනුකරුවන් එක්වීම සිදුවිය. එය අංශයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස කෙටි කාලීන වෙළඳ මූල්‍ය ණය වසර තුළ දී රු. බිලියන 57.5 දක්වා 8% කින් ඉහළ ගියේය. නව සාමාන්‍යකරණය යටතේ වෙළඳ මූල්‍ය ව්‍යාපාර මෙහෙයුම්වල වාර්තා වූ දියුණුව හේතුවෙන් ගාස්තු සහ කොමිස් ආදායම ද වැඩි විය. කොවිඩ්-19

රු. බිලියන 13.9

මෙහෙයුම් ලාභය

රු. බිලියන 1,354.8

වගකීම්

වැළැක්වීමේ චන්නත් ඇතුළු ඖෂධ, බනිජ තෙල්, ගෑස් සහ රටේ ජනතාවගේ දෛනික ජීවිතය පවත්වාගෙන යාමට අවශ්‍ය අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇතුළු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය රැසක් මෙරටට ආනයනය කිරීමට ලංකා බැංකුව පෙරමුණ ගෙන ඇත.

අක්වෙරළ බැංකුකරණය

ආනයන සීමා කිරීම් මඟින් විදේශ රටවල් හරහා සිදුවන ගනුදෙනු සීමා කරන ලද අතර, එය වර්ෂය තුළ දී මෙම අංශයේ ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපෑවේය. 2021 අවසන් වන විට බැංකුවේ අක්වෙරළ බැංකු ණය කළඹ රු. බිලියන 356.4 ක් විය.

වර්ෂය තුළ දී අක්වෙරළ බැංකු අංශය ශ්‍රී ලංකා අන්තර් බැංකු ඇ. ඩොලර් නිෂ්කාශන ක්‍රමයේ පියවීම් බැංකුව බවට පත් වූ අතර දැන් රටේ සමස්ත බැංකු ක්ෂේත්‍රය සඳහාම අන්තර් බැංකු ඇ. ඩොලර් නිෂ්කාශනය ලබා දෙන බව සඳහන් කළ යුතුවේ.

ණය කළඹේ ගුණාත්මකභාවය

ගනුදෙනුකරුවන් සමඟ නොකඩවා සම්බන්ධ වීම සහ පෙර විමසුම් අධීක්ෂණය සහ පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම මඟින් අභියෝගාත්මක තත්ත්වයන් යටතේ අක්‍රීය ණය අනුපාතය අපේක්ෂිත පරාසය තුළ කළමනාකරණය කිරීමට අංශයට හැකි විය. ඒ අනුව, 2021 දෙසැම්බර් 31 වන විට අංශයේ පුද්ගලික ණයවල දළ අක්‍රීය ණය අනුපාතය 7.3% ක් විය. ආර්ථික ක්‍රියාකාරකම්වල ක්‍රමානුකූල පිබිදීම සහ ව්‍යාපාර පුනර්ජීවනයට අනුකූලව 2022 වර්ෂයේදී දළ අක්‍රීය ණය අඩු වනු ඇතැයි අපි අපේක්ෂා කරමු.



උපායමාර්ගයන්ට එරෙහිව කාර්යසාධනය

ගනුදෙනුකාර කේන්ද්‍රීය බව

- ව්‍යාපාර පුනර්ජීවන ව්කකය හරහා ගනුදෙනුකරුවන් සමඟ අබණ්ඩව සම්බන්ධ වීම තුළින් මුදල් ප්‍රවාහ සීමා ලිහිල් කිරීමට සහ ව්‍යාපාර පුනර්ජීවනයට සහාය වීමට පුද්ගලාරෝපිත විසඳුම් ඉදිරිපත් කිරීම
- පුහුණු වැඩසටහන් හරහා කාර්ය මණ්ඩලය වෙත ගනුදෙනුකාර සේවය අවධාරණය කිරීම
- කොවිඩ්-19 ආශ්‍රිත සමාජ දුරස්ථභාවය සම්බන්ධ ක්‍රියාමාර්ග ගෙන තිබියදීද ආයතනික සේවාදායකයින්ට දින 360 පුරාම සේවාව ලබාදීම

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය

- මාර්ගගත ගිණුම් විවෘත කිරීම, මාර්ගගත RTGS ගෙවීම් සඳහා RTGS-B-SWIFT පද්ධතිය, EPF/ETF සෘජු හර පහසුකම් සහ අපනයන ආදායම රුපියල් වෙත පරිවර්තනය කිරීම සඳහා හඳුන්වා දුන් 20 explore system ඇතුළු විශේෂාංග රැසක් සමඟ අපගේ ඩිජිටල්කරණ යොමුකිරීම් ආයතනික ගනුදෙනුකරුවන් වෙත පුළුල් කර ඇත.
- ස්මාර්ට් ඔන්ලයින් බැංකු සේවාවේ ආයතනික මොඩියුලය හරහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ගෙවීම් සඳහා පහසුකම් සැලසීම.

ණය සංස්කෘතිය හා ගුණාත්මකභාව

- අපනයන ඉලක්ක කරගත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා මූල්‍ය සහ මූල්‍ය නොවන සහය ලබා ගැනීම සඳහා 'BOC අපනයන කවය' ස්ථාපිත කරන ලදී.
- ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB) අරමුදල් හරහා කොවිඩ්-19 මඟින් බලපෑමට ලක් වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ණය පහසුකම් 117 කට වැඩි ප්‍රමාණයක් ලබා දී ඇත.

කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩ නැඟීම

- ආයතනික අංශයේ තෝරාගත් සේවකයින් සඳහා දුරස්ථ වැඩ ප්‍රවේශය ලබා දීම
- සංචරණ සීමා පනවා තිබූ කාලය තුළ දී සේවකයින්ට සේවයට වාර්තා කිරීම සඳහා විශේෂ ප්‍රවාහන විධිවිධාන සලසා දීම
- අතථ්‍ය පුහුණුව සහ රැස්වීම්

ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය

- ආයතනික අංශයේ ව්‍යාපෘති මූල්‍ය කණ්ඩායම් සඳහා දැනට පවතින පාරිසරික, සමාජීය සහ සහ යහපාලනය සම්බන්ධ පද්ධති කළමනාකරය (ESG) පිළිබඳ පුහුණුව

ඉදිරි දැක්ම

කාරක ප්‍රාග්ධනය සහ අත්‍යවශ්‍ය ආනයන මූල්‍යකරණය සහ අපනයන සහ ආනයන ආදේශක නිෂ්පාදන පදනම් වූ මූල්‍යකරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම තුළින් පශ්චාත් කොවිඩ්-19 ආර්ථිකය පුනර්ජීවනය කිරීමට රජය දරන ප්‍රයත්නයන් සඳහා අපි දිගටම සහය දෙන්නෙමු. පුද්ගලික අංශයේ ණය වර්ධනය මූල්‍ය හා මූල්‍ය ප්‍රතිපත්ති උත්තේජක මඟින් සහය දක්වන ඉහළ සීමාවක ගමන් කරනු ඇති බවට අපි සුබවාදීව කටයුතු කරන අතර, පවතින සහ නව මහා පරිමාණ ව්‍යාපෘති සහ ළඟා නොවූ භූගෝලීය ප්‍රදේශවලට ළඟා වීමට ඇති අවස්ථාවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් නිෂ්පාදන නව්‍යකරණය, ඩිජිටල්කරණය සහ උසස් ගනුදෙනුකාර සේවා සැපයීම සම්බන්ධයෙන් අපගේ අවධානය යොමුවන අතර එම අංශ තවදුරටත් වැඩිදියුණු කරනු ඇත.

අවස්ථාවන්

- නව මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වලින් පැන නඟින අරමුදල් සැපයීමේ අවස්ථා
- අපනයන ක්ෂේත්‍රයේ අපේක්ෂිත වර්ධනය සහ ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් වෙළඳ මූල්‍යන අවස්ථා වැඩි වීම

අවදානම්

- දිගුකාලීන ආනයන සීමා කිරීම්
- විසංගතයේ දිගින් දිගටම ඇතිවූ බාධා සහ සමාජ-ආර්ථික තත්ත්වයන් කෙරෙහි ඇතිවන බලපෑම්, ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීම ප්‍රමාද කිරීමට සහ ණය කළඹේ ගුණාත්මක භාවයට බලපානු ඇත.

ව්‍යාපාරික අංශ සමාලෝචනය

ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම්

බැංකුවේ විදේශ මුදල් සම්බන්ධ ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමේ වගකීම දරණ ජාත්‍යන්තර අංශය, ද්‍රවශීලතා සහ අරමුදල් කළමනාකරණ මෙහෙයුම් කටයුතු සිදු කරන භාණ්ඩාගාර අංශය, විදේශීය ශාඛා කළමනාකරණය සිදු කරන විදේශීය ශාඛා මෙහෙයුම් අංශය සහ ආයෝජන කටයුතු මෙහෙයවන ආයෝජන අංශය යන ඒකක වලින් මෙම අංශය සමන්විත වේ.

කාර්යසාධනයේ විශේෂ අවස්ථා 2021

ජාත්‍යන්තර සහ භාණ්ඩාගාර මෙහෙයුම් අංශවල ප්‍රබල කාර්යසාධනය හේතුවෙන් මෙම අංශයේ මෙහෙයුම් ලාභය 69% කින් වැඩි විය.

ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම් අංශයේ කාර්යසාධනය



මෙහෙයුම් පරිසරයේ බලපෑම්

- විදේශ විනිමය තත්ත්වයේ පවතින ආතති තත්ත්වයන් ඇතුළු සාර්ව ආර්ථික අභියෝග
- 2021 වසරේ අග භාගයේදී ප්‍රතිපත්ති පොළී අනුපාතික ඉහළ දිශානතියට සංශෝධනය කිරීමෙන් පසු පොළී අනුපාත ක්‍රමයෙන් වැඩි වීම
- විදේශීය වෙළඳපළ ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීම
- ශ්‍රී ලංකාවේ ස්වෛරී ශ්‍රේණිගත කිරීම පහත හෙළීම

රු. බිලියන 24.8

ශුද්ධ පොළී ආදායම

රු. බිලියන 18.6

මෙහෙයුම් ලාභය

රු. බිලියන 1,213.7

වත්කම්

රු. බිලියන 1,149.7

වගකීම්

භාණ්ඩාගාර අංශය

අස්ථාවර වෙළඳපළ තත්ත්වයන් සැලකිල්ලට ගෙන බැංකුවේ විදේශ මුදල් ද්‍රවශීලතා තත්ත්වය කළමනාකරණය කිරීම සඳහා මෙම ඒකකය උපායමාර්ගික අවධානය යොමු කළ අතර, 2021 අග භාගය දක්වා වෙළඳපළ පොළී අනුපාත ක්‍රමයෙන් ඉහළ යාම, වත්කම් සහ වගකීම් ප්‍රතිමිලකරණය ක්‍රියාශීලීව අධීක්ෂණය කිරීම කෙරෙහි ද අවධානය යොමු විය. අරමුදල් පිරිවැය මත පීඩනය තිබියදීත්, ලංකා බැංකුව වර්ෂය තුළ සිය ශුද්ධ පොළී ආන්තිකය සාර්ථකව පවත්වා ගෙන ගියේය; බැංකුව ප්‍රමාණවත් ද්‍රවශීලතා ආවරණයක් පවත්වාගෙන යාම, රජයේ සුරැකුම්පත් වෙත ආයෝජන යොමු කිරීම සහ විදේශ ණය හිමියන් සමඟ දිගු කාලීන මූල්‍ය පහසුකම් පිළිබඳ සාකච්ඡා කිරීම ද සිදු කළේය. රජයේ සුරැකුම්පත් කල්පිරෙන දිනට බැහැර කිරීම නිසා ආයෝජන කළඹේ පාඩුවලට නිරාවරණය වීම අවම කර ගැනීමට බැංකුවට හැකි විය.

ජාත්‍යන්තර අංශය

වර්ෂය තුළ දී විදේශ ප්‍රේෂණවල වෙළඳපළ නායකත්ව කොටස 40% සිට 41% දක්වා ශක්තිමත් කර ගැනීමට ලංකා බැංකුව සමත් විය. බැංකුව සිය විදේශ ප්‍රේෂණ ගලා ඒම 29% කින් වැඩි කළ අතර එමඟින් රටට තීරණාත්මක විදේශ විනිමය ගලා ඒම සඳහා පහසුකම් සැලසීය. විදේශ විනිමය මත පවතින ආතතිය නොතකා බනිජ තෙල්, ගෑස්, කොවිඩ්-19 සඳහා වන්නත් සහ ආහාර ද්‍රව්‍ය ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ අඛණ්ඩව ආනයනය කිරීමට සහය දැක්වීමට ලංකා බැංකුව හට මෙමඟින් හැකි විය. මෙම අංශය නව නියෝජිත බැංකු සබඳතා 18 ක් ගොඩනඟා ගත් අතර, එමඟින් ඇමරිකානු කලාපය තුළ සිය ස්ථාවරය ශක්තිමත් කරන ලද අතර, විදේශ විනිමය හුවමාරු ආයතන 92 ක් සහ නියෝජිත බැංකු සබඳතා 801 ක් සමඟ සිය සබඳතා දිගටම පවත්වා ගෙන යයි. නව සහ පවතින වෙළඳපළ තුළ තවදුරටත් පුළුල් වෙමින් සිදු කරන මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ සේවා විශිෂ්ටත්වය පිළිබඳව ද අංශය අවධානය යොමු කළේය.

විදේශීය මෙහෙයුම් අංශය

අපගේ විදේශීය වෙළඳපළවල මෙන්ම විශේෂයෙන් මාලදිවයිනේ ක්‍රමික වර්ධනය හේතු කොට ගෙන විදේශ මෙහෙයුම් අංශය කාර්යසාධනය සාපේක්ෂව යහපත් මට්ටමක පැවතුණි. චෙන්නායි සහ සීෂෙල්ස් හි ප්‍රකෘතිමත් වීම මන්දගාමී වූ අතර, එම ශාඛා වල ක්‍රියාකාරිත්වය අපේක්ෂා සහගත වේ. ණය ගෙවීමේ කාලපරිමා සහන අවසන් වුවද, ක්‍රියාකාරී අධීක්ෂණය සහ ගනුදෙනුකාර සහභාගීත්වය මඟින් ණය කළඹේ ගුණාත්මකභාවය පවත්වා ගෙන යාමට හැකි විය. වර්ෂය තුළ, ඩිජිටල් භාවිතාවන් ශක්තිමත් කිරීම තුළින් අභ්‍යන්තර කාර්යක්ෂමතාව සහ ගනුදෙනුකාර අත්දැකීම් වැඩිදියුණු කිරීම කෙරෙහි උපායමාර්ගික අවධානය යොමු කරන ලදී.

ආයෝජන බැංකුකරණය

මෙම අංශය කොටස් වෙළඳපළේ ගනුදෙනු මඟින් මෙම වසරේදී ලාභ උපයා ගන්නා ලදී. රු. බිලියන 3.4 ක බාසල් III අනුකූල, යටත් නිත්‍ය, ස්ථර I ප්‍රාග්ධන බැඳුම්කර සහ රු. බිලියන 5.2 ක බාසල් III අනුකූල, යටත් ස්ථර II ණයකර නිකුත් කිරීම හරහා බැංකුවේ ප්‍රාග්ධනය ඉහළ නැංවීම සඳහා ද අංශය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය.



උපායමාර්ගයන්ට එරෙහිව කාර්යසාධනය

ගනුදෙනුකාර කේන්ද්‍රීය බව

- 2,100 ක දෙකනුගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ හවුල් වී අනාගත සහ වත්මන් විගමණික ශ්‍රමිකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 42 ක් ක්‍රියාත්මක කිරීම
- වසංගතය හේතුවෙන් බාධා ඇති වුවද බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල කවුන්ටරයේ මෙහෙයුම් අඛණ්ඩව සිදු කිරීම
- ජාත්‍යන්තර අංශය යටතේ සමාජ මාධ්‍ය හරහා ජාත්‍යන්තර ගනුදෙනුකාර සහාය ඒකකය පිහිටුවීම
- ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින් සිටින ප්‍රදේශ සහ රටවල් ආවරණය වන පරිදි වැඩි නියෝජිතයින් පිරිසක් ස්ථානගත කිරීම
- විදේශ විනිමය හුවමාරු ආයතන සහ නියෝජිත ආයතනවලට නව සේවකයින් යොදවා නියෝජිත බැංකු සබඳතා ජාලය ශක්තිමත් කිරීම

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය

- ජාත්‍යන්තර අංශය සිය SMART Remit පද්ධතිය වැඩිදියුණු කර ඇති අතර එමඟින් ප්‍රේෂණ ලබන්නාගේ හිණුමට ක්ෂණිකව බැර කිරීමට හැකි විය.
- විදේශ ශාඛාවල පසුපෙළ මෙහෙයුම් කාර්යාල ඩිජිටල්කරණය
- මාලදිවයින් ශාඛාව සඳහා නව අන්තර්ජාල සහ ජංගම බැංකු පහසුකම් දියත් කිරීම

ණය සංස්කෘතිය හා ගුණාත්මකභාව

- සංක්‍රමණික සේවකයින් සඳහා වඩාත් ආකර්ශනීය සහ අපහසුතාවකින් තොරව පෙර පිටත්වීමේ ණය යෝජනා ක්‍රම සහ ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම
- විදේශීය ශාඛා වල අක්‍රීය ණය කළමනාකරණය

කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩ නැඟීම

- විදේශගත කාර්ය මණ්ඩලයේ කොවිඩ්-19 ආශ්‍රිත වෛද්‍ය සහ නිරෝධායන අවශ්‍යතා සඳහා පහසුකම්වලට අදළ පිරිවැය බැංකුව විසින් සැලසීම
- විදේශීය ශාඛා කාර්ය මණ්ඩලය සඳහා අඛණ්ඩ පුහුණුව

ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය

- රට තුළ පවතින විදේශ විනිමය සීමාවන් සැලකිල්ලට ගනිමින් බැංකුවේ විදේශ විනිමය ද්‍රවශීලතා තත්ත්වය කල්තියා කළමනාකරණය කිරීම අවධාරණය කිරීම
- බැංකුවේ ශුද්ධ පොළී ආන්තිකය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා කාලෝචිත ප්‍රතිමිල තීරණ

ඉදිරි දැක්ම

අපගේ ජාත්‍යන්තර හවුල්කාරිත්වය උත්තේජනය කිරීම හරහා ණය නොවන විදේශ විනිමය ගලා ඒම වැඩි කිරීමට සැලසුම් කරමින් පවතී. ආන්තික වෙළඳාම සහ අනෙකුත් ව්‍යුත්පන්න වෙළඳ විකල්පයන් දියත් කිරීමත් සමඟ විශේෂයෙන් ආයෝජන බැංකුකරණය සහ භාණ්ඩාගාර අංශය තුළ අපගේ නිෂ්පාදන කළඹ පුළුල් කිරීමට ද අපි උත්සහ කරමු. අපගේ විදේශීය ශාඛාවල ඩිජිටල් ප්‍රස්තුතය ශක්තිමත් කිරීමට අප උත්සහ කරන බැවින් ඩිජිටල්කරණය කෙටි කාලීන සිට මධ්‍ය කාලීන ප්‍රමුඛතාවයක් ලෙස පවතී.

අවස්ථාවන්

- නව වෙළඳපළවල් වලට ඇතුල් වීම හරහා අපගේ චිතෙර පැවැත්ම පුළුල් කිරීම
- කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ ගනුදෙනුකාර අත්දැකීම් පරිවර්තනය කිරීම සඳහා මෙහෙයුම් කටයුතු ඩිජිටල්කරණය කිරීම
- කොටස් වෙළඳපළ ආයෝජන සඳහා නිරාවරණය වැඩි කිරීම

අවදානම්

- විදේශ මුදල්වල උග්‍ර හිඟය සහ මූල්‍ය බාධා ඇතුළු සාර්ව ආර්ථික අභියෝග
- කොටස් වෙළඳපළ අස්ථාවරත්වය
- කොවිඩ්-19 හි නව ප්‍රභේද මතුවීමත් සමඟ ආසාදන නැවත ඇති වීම

පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ



ගනුදෙනුකරුවන්

65% ඉක්ම වූ අසමසම ඉලක්ක වෙළඳපළ ප්‍රතිශතයක් සහිතව ලංකා බැංකුව දිවයින පුරා විහිදී ඇති මිලියන 14.4 ක් ඉක්ම වූ පුද්ගලික ගනුදෙනුකරුවන්, ක්ෂුද්‍ර ව්‍යාපාර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, මහා පරිමාණ ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යවසාය සඳහා සේවාවන් සපයනු ලබයි.

ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සඳහා අවධානය යොමු කිරීම

සම්බන්ධ වීමේ වේදිකා

- තෘප්තිමත්භාවය පිළිබඳ කාලානුරූප සමීක්ෂණ
- ශාඛා සහ ඩිජිටල් නාලිකා හරහා සෘජුව සම්බන්ධ වීම (අඛණ්ඩව)
- වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය වේදිකා (අඛණ්ඩව)
- පාරිභෝගික ක්ෂණික ඇමතුම් අංකය (අඛණ්ඩව)
- මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් (අඛණ්ඩව)
- අළෙවිකරණය, ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය (අඛණ්ඩව)

අවශ්‍යතා

- කඩිනම් සහ පහසු සේවාවක්
- පහසු, විශ්වසනීය සහ ආරක්ෂිත සේවා ක්‍රම
- ණය සහන
- විනිවිද පෙනෙන මිලකරණය
- මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය

ප්‍රතිචාර දක්වන ආකාරය

- ගනුදෙනුකාර කේන්ද්‍රීය විසඳුම්
- ගනුදෙනුකාර අත්දැකීම් කෙරෙහි අවධානය යොමු කිරීම
- ඩිජිටල් සේවාවන් වැඩිදියුණු කිරීම
- ස්වයංක්‍රීයකරණය හරහා ගනුදෙනු පිරිවැටුම් කාලය අඩු කිරීම

ලංකා බැංකුවේ උපායමාර්ගික සැලැස්මේ අඩංගු ප්‍රධාන උපායමාර්ගික ප්‍රමුඛතාවක් වන ගනුදෙනුකාර කේන්ද්‍රීය බව ක්‍රියාත්මක කිරීමේදී, ප්‍රධාන ව්‍යාපාරික අංශ තුන නිෂ්පාදන සහ බැංකු සංවර්ධන, තොරතුරු තාක්ෂණය, විකුණුම් සහ නාලිකා කළමනාකරණය සහ සංවර්ධන බැංකු අංශය, ශාඛා ණය මෙහෙයුම් සහ අළෙවි දෙපාර්තමේන්තු යන සහයක දෙපාර්තමේන්තු සතු මධ්‍යගත හැකියාවන් සමඟ සමීපව ක්‍රියා කරයි. මෙම සම්බන්ධීකරණ ප්‍රවේශය බැංකුවට අදාළ, ඒකාබද්ධ විසඳුම් ලබා දීමට හැකියාව ලබා දී ඇති අතර, එය උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම වේගවත් කරයි.

ගනුදෙනුකරුවන් නැවත නඟා සිටුවීම සහ ඒ සඳහා සහය වීම

කොවිඩ්-19 හේතුවෙන් ඇති වූ බාධාවන් හේතු කොට ගෙන ආපසු ගෙවීමේ හැකියාව මත පීඩනයක් ඇතිවීම අඛණ්ඩව සිදු වූ හෙයින්, බැංකුවේ උපායමාර්ගික සැලැස්මේ ප්‍රධාන උපායමාර්ගික ප්‍රවේශයක් වන ණය සංස්කෘතිය සහ ගුණාත්මකභාවය ක්‍රියාවට නැංවීම සඳහා බැංකුවට අතිරේක උත්සාහයක් දැරීමට සිදු විය. ඒ අනුව, බලපෑමට ලක්වූ ගනුදෙනුකරුවන් සඳහා ලබා දී ඇති ණය ගෙවීම් සහන කාල දීර්ඝ කිරීම, මූල්‍ය සහන සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ පහසුකම් හරහා වැඩි සහයෝගයක් ලබා දෙන ලදී. බලපෑමට ලක් වූ ව්‍යාපාර සඳහා නව මූල්‍ය පහසුකම් ද ප්‍රදානය කරන ලද අතර එමඟින් ඔවුන්ගේ පැවැත්ම සහ වාණිජ තිරසාරභාවය සහතික විය. නව පහසුකම් හරහා සහ එම ව්‍යාපාරික ආයතනවල අභ්‍යන්තර හැකියාවන් ශක්තිමත් කිරීම තුළින් ඌන ක්‍රියාකාරී සහ ක්‍රියාකාරී නොවන ආයතනික ගනුදෙනුකරුවන් පුනර්ජීවනය කිරීමේ අරමුණින් කැපවූ ව්‍යාපාර ප්‍රත්‍යානයන සහ පුනරුත්ථාපන ඒකකයක් ස්ථාපිත කරන ලදී. අද වන විට, මෙම ඒකකය මඟින් ආයතනික ගනුදෙනුකරුවන් 16 දෙනෙකුට වැඩි පිරිසක් නැවත යථා තත්ත්වයට පත්කර ඇති අතර, එම ආයතනවල සේවයේ නියුතු පුද්ගලයින් 5,000 කගේ පමණ ජීවනෝපාය සුරක්ෂිත කර ඇත.

ගෙවීම් කාල පමා සහන ලබා දී ඇති ණය **රු. බිලියන 380.6**	ප්‍රතිව්‍යුහගත කරන ලද ණය **රු. බිලියන 23.3**
ගෙවීම් සහන කාල පමා ලබා දී ඇති ගනුදෙනුකරුවන් සංඛ්‍යාව **97,906**	නැවත නඟා සිටුවන ලද ගනුදෙනුකරුවන් සංඛ්‍යාව **16**

ගනුදෙනුකාර කේන්ද්‍රීය විසඳුම්

බැංකුව සිය විවිධත්වයකින් යුක්ත වූ ගනුදෙනුකාර පදනමට ගැළපෙන ණය, ගනුදෙනුකාර සේවා සහ ආයෝජන බැංකුකරණ විසඳුම් රාශියක් හඳුන්වා දී ඇත. නිෂ්පාදන සංකල්පීයකරණය සහ සංවර්ධනය වෙළඳපළ ගතිකත්වය, තරඟකාරීත්වය සහ ගනුදෙනුකාර අවශ්‍යතා පිළිබඳ අඛණ්ඩ තක්සේරුවකින් පසුව සිදු වේ. වසර තුළ දී, බැංකුව දැනට පවතින නිෂ්පාදනවලට අගය එකතු කිරීම සහ නව නිෂ්පාදන සහ නාලිකා හඳුන්වාදීම තුළින් තෝරාගත් වෙළඳපළ කොටස් තුළ සිය බැංකු සේවාවන් තවදුරටත් ව්‍යාප්ත කිරීමට උත්සහ කළේය. මේ සඳහා පහත සඳහන් දෑ ඇතුළත් විය.

- ග්‍රාමීය ජනතාවට සේවා සැපයීම සඳහා 'BOC CONNECT' නියෝජිත බැංකු සේවාව හඳුන්වා දීම
- BOC ඉන්ධන කාඩ්පත හඳුන්වා දීම
- ශේෂ විමසීම් සහ ගනුදෙනු යාවත්කාලීන කිරීම් සඳහා ස්මාර්ට් කාඩ්පත වැනි ඩිජිටල් විශේෂාංග සහිතව 'ස්මාර්ට් රන් කැකුළු' ඉතුරුම් ගිණුම හඳුන්වා දීම.
- නව ව්‍යවසාය සහ ව්‍යාපාර සඳහා අරමුදල් සැපයීමේ පහසුකම් සමඟ 'අභිමාන ජ්‍යේෂ්ඨ පුරවැසි ගිණුමට' නව අගයක් එකතු කිරීම
- ආයෝජන, මුදල් කළමනාකරණය සහ වැටුප් අත්තිකාරම් ඇතුළු ආකර්ෂණීය විශේෂාංග සහිතව "Smart Salary Saver" ගිණුම හඳුන්වා දීම.
- වාහන රැසක් සහිත සංස්ථාපිත ආයතන සඳහා ඉන්ධන කාඩ්පතක් හඳුන්වා දීම.
- විවිධ ණය යෝජනා ක්‍රම කිහිපයක් එක් කිරීමෙන් 'දිවි උදාන' ණය යෝජනා ක්‍රමය හඳුන්වා දීම.

අපනයන කවය සහ ඒ හා සබැඳි වටිනාකම්



- **අපනයන කවය** - වසර තුළ පිහිටුවන ලද අපනයන කවය, අපනයන ප්‍රමුඛ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ප්‍රමුඛත්වය දෙමින් අපනයනකරුවන් සඳහා මූල්‍ය ආධාරවලට අමතරව ඵලදායී ජාලකරණ අවස්ථා සහ ඔවුන්ගේ හැකියාවන් ගොඩනැගීම සඳහා වේදිකාවක් සැපයීය. මෙම වැඩසටහන හරහා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) සහ SEDA වැනි ආයතනවලින් වෙළෙඳපළ වෙත ප්‍රවේශය, රක්ෂණ සහ බැංකු කටයුතු සඳහා අපනයනකරුවන්ට සහය ලබා ගැනීමට අවස්ථා සලසා දී ඇත.



80

සහය දැක්වූ අපනයන ඉලක්ක කරගත් නව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මට්ටමේ අපනයනකරුවන් සංඛ්‍යාව

351

අපනයනය ඉලක්ක කරගත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන්වල ප්‍රතිලාභීන්

පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ

ගනුදෙනුකරුවන්

බහු-නාලිකා උපායමාර්ගය

අපි අපගේ භෞතික සහ ඩිජිටල් යටිතල පහසුකම් දෙකෙහිම අඛණ්ඩව ආයෝජනය කරමින් ගනුදෙනුකරුවන්ට ප්‍රවේශ්‍යතාව වැඩි කිරීමටත්, එමඟින් ඔවුන්ගේ අවශ්‍යතා විශ්වාසදායක ලෙසත් පහසු ලෙසත් ඉටු කිරීමටත් කටයුතු කරන්නෙමු. මෑත වසරවලදී, ලංකා බැංකුව සිය අසමසම භූගෝලීය ප්‍රවේශය පුළුල් වන ඩිජිටල් ප්‍රවේශයක් සමඟින් සම්පූර්ණ කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති අතර එමඟින් දිවයිනේ සියලුම ප්‍රදේශ හරහා මූල්‍ය ඇතුළත් කිරීම් මෙන්ම ඩිජිටල් සාක්ෂරතාවය ද ප්‍රචලිත කරයි.

ගනුදෙනුකාර සේවා සැපයුම් මධ්‍යස්ථාන

ශාඛා **581** | සීමිත සේවා ශාඛා **61** | ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර **739** | මුදල් තැන්පතු යන්ත්‍ර **164** | මුදල් චක්‍රීකරණ යන්ත්‍ර **497**



BoC DIGI ශාඛා **04** | බිල්පත් ගෙවීම් යන්ත්‍ර **67** | පාසල් 'සංසද' **1,489** | ජංගම පාසල් ඉතුරුම් ඒකක **991** | ශාඛා වලින් පිටත ස්මාර්ට් කලාප **205**

ගනුදෙනුකාර සේවා ඩිජිටල්කරණය කිරීම

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය බැංකුවේ මධ්‍ය කාලීන උපායමාර්ගයේ ප්‍රධාන උපායමාර්ගික ප්‍රවේශයක් වන අතර බාධාවකින් තොරව නව්‍ය විසඳුම් හරහා ගනුදෙනුකාර අත්දැකීම පරිවර්තනීය වෙනසකට ලක් කිරීමේ දී එය වඩාත් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇත. පසුගිය වසර තුන තුළ රු. බිලියන 4.5 ක් ඉක්ම වූ ආයෝජන සමඟින්, ලංකා බැංකුව දැන් අපගේ ගනුදෙනුකරුවන්ගේ විවිධ අවශ්‍යතා සපුරාලන පුළුල් ඩිජිටල් විසඳුම් මාලාවක් ඉදිරිපත් කර ඇත.

මෙම මුල පිරීම්වල ප්‍රතිඵලයක් වශයෙන්, බැංකුවේ ඩිජිටල් ගනුදෙනු පරිමාව සහ වටිනාකම වසර තුළ පිළිවෙළින් 43% සහ 58% කින් වැඩි විය. 2021 අවසන් වන විට, ඩිජිටල් ගනුදෙනු බැංකුවේ මුළු ගනුදෙනුවලින් 38% ක් වූ අතර එය පෙර වසරේ වාර්තා වූ 23% ට වඩා ඉහළ අගයකි. 2021 වසරේ ප්‍රධාන වර්ධනයන් පහත පරිදි වේ;

- ආයෝජන නිෂ්පාදන සඳහා ලියාපදිංචි වීම ඩිජිටල් නාලිකා ඔස්සේ සිදුකිරීම සඳහා අවකාශ ගනුදෙනුකරුවන්ට ලබා දීම
- බිල්පත් ගෙවීම් ආදී වැඩිදියුණු කළ විශේෂාංග හඳුන්වාදීම සහ වෙළඳපළ නියෝජිත ජාලය පුළුල් කිරීම සමඟ 'ස්මාට් පේ' යෙදුම වැඩිදියුණු කිරීම
- සීෂෙල්ස් ශාඛාව වෙත 'ස්මාට් පාස්බුක්' යෙදුම හඳුන්වා දීම සහ මාලේ ශාඛාව වෙත ජංගම සහ අන්තර්ජාල බැංකුකරණ පහසුකම් හඳුන්වා දීම ඇතුළු විදේශීය ශාඛාවල ඩිජිටල් යෙදවුම් ශක්තිමත් කිරීම
- සාමාන්‍ය දෛනික ගනුදෙනු 53,596 ක් සහිත අන්තර්ජාල ගෙවීම් ද්වාරයෙහි (IPG) ඒකාබද්ධ වෙළඳපළ නායකත්වය, වසර තුළ දී බැංකුව නව වෙළඳ නියෝජිතයින් 34 දෙනෙකු අන්තර්ජාල ගෙවීම් ද්වාරය (IPG) සමඟ ඒකාබද්ධ කර ගත් අතර, මුළු IPG වෙළඳ නියෝජිතයන් 88 දෙනෙකු දක්වා ඉහළ ගියේය. මුදල් රහිත ගනුදෙනු කරා යන ගමන වේගවත් කිරීම සඳහා රාජ්‍ය ආයතන සමඟ හවුල්කාරිත්වයන්ටද එළඹුණි.
- 'ස්මාට් රෙමිට්' මුදල් ප්‍රේෂණ ක්‍රමය වැඩිදියුණු කිරීම මඟින් තත්‍ය කාලීන අරමුදල් හුවමාරු කිරීමට හැකියාව ලබා ගැනීම

34 BOC Smart CONNECT නියෝජිතයන්

ස්මාර්ට් ඔන්ලයින් බැංකු ද්වාරය

B App බී ඇප් ජංගම යෙදවුම

BOC Smart Pay යෙදවුම



ශාඛා වල ස්ථාපිත ස්මාර්ට් කලාප **556**

ජංගම සේවා ශාඛා **10**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සේවා මධ්‍යස්ථාන **15**

ඩිජිටල් සේවා භාවිතය වසර 2021

ණය කාඩ්පත් ගනුදෙනු
ගනුදෙනු වටිනාකම
රු. බිලියන 12.4 (+32%)

ගනුදෙනු පරිමාව
මිලියන 2.3 (+20%)

ස්මාර්ට් පේ යෙදවුම
ගනුදෙනු වටිනාකම
රු. බිලියන 1.7 (+1,751%)

ගනුදෙනු පරිමාව
මිලියන 4.6 (+2,262%)

ලියාපදිංචි ගනුදෙනුකරුවන් සංඛ්‍යාව
501,582 (+116%)

ස්මාර්ට් පාස්බුක් යෙදවුම
ලියාපදිංචි සංඛ්‍යාව
1,512,064 (+42%)

ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර/ මුදල් තැන්පතු යන්ත්‍ර/ මුදල් චක්‍රීකරණ යන්ත්‍ර
ගනුදෙනු වටිනාකම
රු. බිලියන 2,257.1 (+41%)

ගනුදෙනු පරිමාව
මිලියන 128.1 (+24%)

ස්මාර්ට් ඔන්ලයින් බැංකු ද්වාරය සහ බී ඇප් යෙදුම
ගනුදෙනු වටිනාකම
රු. බිලියන 642.3 (+250%)

ගනුදෙනු පරිමාව
මිලියන 27.2 (+114%)

මුළු ඩිජිටල් ගනුදෙනු සංඛ්‍යාව
ගනුදෙනු වටිනාකම
රු. ට්‍රිලියන 3.0 (+58%)

ගනුදෙනු පරිමාව
මිලියන 195.1 (+43%)

2021 වසර තුළ සේවා නාලිකා වල ප්‍රගමනය

BOC CONNECT - නියෝජිත බැංකු සේවාව දියත් කිරීම

මුදල් ගැනීම, තැන්පත් කිරීම සහ බිල්පත් ගෙවීම ඇතුළු ගනුදෙනු රාශියක් සිදු කිරීමේ පහසුකම් ඇතුළත් POS යන්ත්‍ර සහිතව දිවයින පුරා නියෝජිතයන් 34 ක් ලියාපදිංචි කිරීම.

සාමාන්‍ය බැංකුකරණය යටතේ බැංකු කටයුතු සලසා දීම අපහසු දුෂ්කර ප්‍රදේශ වල ජනතාව සඳහා නව්‍ය බැංකු ක්‍රම ඔස්සේ අබණ්ඩ බැංකු සේවාවක් ලබා දීම.

ශාඛා ජාලය

නව සීමිත සේවා ශාඛාවක් ශාඛා ජාලයට එක් විය

වැඩිදියුණු කරන ලද ඩිජිටල් පහසුකම් සහිතව ශාඛා 13 ප්‍රතිස්ථානගත කිරීම

පළාත් සහ ජාතික තලයේ සියලු බැංකු ශාඛාවල සහභාගීත්වයෙන් එස් 5 (5 S) සංකල්පය දියත් කිරීම මූලික කොට ගෙන තරග පැවැත්වීම.

ශාඛාවන්හි සේවා ලබා ගැනීමට ඇති හැකියාව සහ සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීම

ස්මාර්ට් කලාප

ශාඛා වල ස්වරූපය සහ පරිසරය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජනය කිරීම

ඩිජිටල් සේවාවන් සඳහා ප්‍රවිශ්ටය ඉහළ නැංවීම තුළින් ගනුදෙනුකරුවන්ගේ බැංකු කටයුතු පහසු කිරීම

ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර/ මුදල් තැන්පතු යන්ත්‍ර/ මුදල් චක්‍රීකරණ යන්ත්‍ර ජාලය

ආර්ථික වශයෙන් පසුගාමී ප්‍රදේශ 11 ක්ද ආවරණය වන පරිදි නව මුදල් තැන්පතු යන්ත්‍ර 104 ක් ස්ථාපිත කිරීම

ඩිජිටල් සේවාවන් සඳහා ප්‍රවිශ්ටය ඉහළ නැංවීම තුළින් ගනුදෙනුකරුවන්ගේ බැංකු කටයුතු පහසු කිරීම

නාලිකා

වසර 2021 තුළ නාලිකා වල ප්‍රගමනය

ගනුදෙනුකරුවන්ට අගය නිර්මාණය කිරීම

පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ

ගනුදෙනුකරුවන්

ගනුදෙනුකාර අත්දැකීම

තීව්‍ර තරඟකාරීත්වයක් සහිත වර්තමාන බැංකු ක්ෂේත්‍රයේ සුවිශේෂීම සේවා ගුණාංගය ලෙස බැංකුවේ ගනුදෙනුකාර සේවය සහ අත්දැකීම් හඳුනාගෙන ඇත. ශාඛාවන්හි නිරීක්ෂණ චාරිකා වලින් පසුව කළමනාකරණ කණ්ඩායම සහ පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය පිළිබඳව සමීක්ෂණ මඟින් බැංකුව තවදුරටත් වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන සේවා සම්බන්ධ ගැටළු විසඳීම සඳහා කැපවූ කණ්ඩායමක් පත් කරන ලදී. ශාඛා සේවකයින් සඳහා වන පුහුණුව ද මූලික වශයෙන් සේවා ආශ්‍රිත නිපුණතා සංවර්ධනය කෙරෙහි යොමු කළ අතර ප්‍රධාන කාර්යාලය ශාඛා සමඟ සතිපතා සම්බන්ධ වීම ද මෙම කටයුතු වල ප්‍රගමනය සඳහා තවදුරටත් ඉවහල් විය. සේවා-නැඹුරු සංස්කෘතියක් පෝෂණය කිරීමේ දී, බැංකුව ඉදිරි පෙළ කාර්ය මණ්ඩලයට ගනුදෙනුකාර සේවා සම්බන්ධ පුහුණුව අඛණ්ඩව ලබා දෙයි.

ශුද්ධ ප්‍රවර්ධක අගය
40

ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය පිළිබඳ අනුපාතය
79%

65 පිටුවේ ලැයිස්තුගත කර ඇති නව ඩිජිටල් සේවා වලට අමතරව, අභ්‍යන්තර ඩිජිටල් සේවාවන්හි පහත සඳහන් වැඩිදියුණු කිරීම්ද වැඩි පහසුව සහ විශ්වසනීයත්වය ඉහළ නැංවීම තුළින් ගනුදෙනුකරුවන් සඳහා වටිනාකම් නිර්මාණය කර ඇත:

- බැංකුවේ වෙබ් අඩවිය හරහා ස්ථාවර නියෝග, ක්ෂණික ණය සහ තාවකාලික අයිරා පහසුකම් සඳහා අයදුම්පත් යොමු කිරීමේ පහසුකම, සහ එමඟින් ගනුදෙනුකරුට තම ඉල්ලීම අන්තර්ජාලය හරහා ඉදිරිපත් කිරීමට සහ බාධාවකින් තොරව අනුමැතිය ලබා ගැනීමට ඉඩ සැලසීම.
- රොබෝ තාක්ෂණය මඟින් ක්‍රියාවලි ස්වයංක්‍රියකරණය (RPA) හරහා හර කාඩ්පත් අක්‍රිය කිරීම ස්වයංක්‍රියකරණය - මෙමඟින් ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ අක්‍රිය කිරීමේ ඉල්ලීම කෙටි පණිවුඩයක් හරහා ඉදිරිපත් කළ හැකි අතර කාඩ්පත තත්පර 18 කින් පමණ ස්වයංක්‍රියව අක්‍රිය වේ.

මෑත වසරවල ක්‍රියාවලි ස්වයංක්‍රියකරණය සඳහා බැංකුවේ ආයෝජනයන් ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම් සහ අභ්‍යන්තර කාර්යක්ෂමතාව යන දෙකම වැඩිදියුණු කරමින් සේවා පිරිවැටුම් කාලයක් සැලකිය යුතු දියුණුවක් ඇති කර තිබේ.

ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි
2,159 ක

බැංකුවේ ඩිජිටල් යටිතල පහසුකම් සඳහා යොමු කරන ලද ආයෝජනවල ඉහළ යාමට සමගාමීව, ප්‍රතිපත්ති සංශෝධන, නිරන්තර අවදානම් පරීක්ෂාව සහ ප්‍රමුඛ පෙළේ තොරතුරු තාක්ෂණ/ සයිබර් ආරක්ෂණ ප්‍රමිතීන් සහ රාමුවලට අනුගතවීම තුළින් තොරතුරු තාක්ෂණ ආරක්ෂණ රාමුව ශක්තිමත් කිරීමට ද පියවර ගෙන ඇත.

කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණයේ ප්‍රතිඵලයක් ලෙස කාලය ඉතිරි කිරීම

	ඒකකය	කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරනයට පසු	කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරනයට පෙර
පුද්ගලික ණය	පැය	3.0	24.0
නිවාස ණය	දින	18	21.0
හර කාඩ්පත් නිකුත් කිරීම	මිනිත්තු	5.0	10.0
ස්ථාවර තැන්පතු විවෘත කිරීම	මිනිත්තු	4.5	8.0

ගනුදෙනුකරුවන් දැනුවත් කිරීම

බැංකුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, ක්ෂුද්‍ර හා කාන්තා ව්‍යවසායකයින්, විදේශ රැකියා ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්, විශ්වවිද්‍යාල සිසුන් සහ රාජ්‍ය සේවකයින් ඉලක්ක කර ගනිමින් අඛණ්ඩව ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වයි. වසර තුළ දී, මූලික වශයෙන් අපනයනය කෙරෙහි අවධානය යොමු කරන ලද අතර රටේ ආර්ථික පුනර්ජීවනය සඳහා ඔවුන්ගේ ජාතික වැදගත්කම අනුව වැඩි අවධානයක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ගනුදෙනුකරුවන් වෙත යොමු විය. වර්ෂය තුළ පවත්වන ලද වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

වැඩසටහන් විස්තර	ඉලක්කගත ගනුදෙනුකරුවන්	සහභාගිවූ ගණන
BoC 'දිවි උදාන' ණය යෝජනා ක්‍රමය යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන	ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින්	823
සුළු හා මධ්‍ය පරිමාණ මට්ටමේ ගනුදෙනුකරුවන් සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයේ සේවා	අපනයන ක්ෂේත්‍රයේ සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්	171
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධනය සහ අපනයන මාර්ගෝපදේශය	අපනයන ක්ෂේත්‍රයේ සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්	180
ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ අංශය මුහුණ දෙන අභියෝග සහ ඔවුන් එම අභියෝග ජය ගත යුතු ආකාරය	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්	708
කාර්මික තාක්ෂණ ආයතනය විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා පිරිනමන සේවාවන්	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්	201
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා CMA වැඩමුළුව, ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සම්මන්ත්‍රණය	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්	163
ගතික ව්‍යවසායකයින් ගොඩනැගීම	ව්‍යවසායකයින්	485
BOC 'සශ්‍රීක' ණය යෝජනා ක්‍රමය	ව්‍යවසායකයින්	257
BOC 'මිතුරු' ව්‍යවසායක වෙළඳ ප්‍රදර්ශනය සහ ලීසිං පොළ	ක්ෂුද්‍ර මූල්‍ය ගනුදෙනුකරුවන්	500
විශ්වවිද්‍යාල ශිෂ්‍ය පරිගණක ණය	විශ්වවිද්‍යාල සිසුන්	300
විදේශ රැකියා ශ්‍රමිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන්	විදේශ රැකියා ශ්‍රමිකයින්	2,100

වගකිවයුතු බැංකුකරණ පිළිවෙත්

අපගේ බැංකුකරණ භාවිතයන් සහ ගනුදෙනුකරුවන් හා සහ සම්බන්ධවීම් ශ්‍රී ලංකා මහා බැංකුවේ ගනුදෙනුකාර ප්‍රඥප්තිය සමඟ පෙළගැසී ඇති අතර එමඟින් ගනුදෙනුකරුවන්ගේ වගකීම් සහ ප්‍රමිතීන් පැහැදිලිව නිර්වචනය කරයි. පොළී අනුපාත, කල්පිරීමේ කාලසීමාවන් සහ අනෙකුත් නියමයන් සහ කොන්දේසි වැනි අදාළ තොරතුරු ගනුදෙනුකරුවන්ට ඔවුන් කැමති භාෂාවකින් පැහැදිලිව සන්නිවේදනය කෙරේ. වසර තුළ නිෂ්පාදන සහ සේවා

තොරතුරු සහ ලේබල් කිරීම සහ අළෙවිකරණ සන්නිවේදනයන්ට අදාළ රෙගුලාසි/ ස්වේච්ඡා අනුගතවීම් වලට අනුකූල නොවීම පිළිබඳ සිදුවීම් වාර්තා වී නොමැත.

දත්ත රහස්‍යතාව සහ තොරතුරු තාක්ෂණ ආරක්ෂාව

බැංකුවේ ඩිජිටල් යටිතල පහසුකම් සඳහා තීව්‍ර කරන ලද ආයෝජනවලට සමගාමීව, ප්‍රතිපත්ති සංශෝධන, නිත්‍ය අවදානම් පරීක්ෂාව සහ ප්‍රමුඛ පෙළේ තොරතුරු තාක්ෂණ/ සයිබර් ආරක්ෂණ ප්‍රමිති සහ ක්‍රියාපටිපාටි තුළින් තොරතුරු තාක්ෂණ ආරක්ෂණ රාමුව ශක්තිමත් කිරීමට ද පියවර ගෙන ඇත. මෑතක දී සම්පූර්ණ කරන ලද අවදානම් පරීක්ෂණයේ නිර්දේශ මත ලංකා බැංකුව විශේෂිත ජාල මෙහෙයුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම ඇතුළු හඳුනාගත් දුර්වලතා නිවැරදි කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. වසර තුළ අනෙකුත් වර්ධනයන් ලෙස පහත සඳහන් දෑ ඇතුළත්ය,

- බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවට ISO 27001 ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම
- පුහුණුවීම් සහ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් හරහා කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම වැඩි දියුණු කිරීම
- සියලුම විදේශීය ස්ථානවල තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ඇතුළු තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති සංශෝධනය කිරීම, සියලුම විදේශීය ශාඛාවල සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති සහ බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම
- COBIT තොරතුරු තාක්ෂණ පාලන රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශකයෙකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.

බැංකුවේ මෙහෙයුම්, තාක්ෂණය මත රඳා පවතින බැවින් අන්තර්ජාල සහ ජංගම බැංකුකරණ වේදිකා සහ ක්ලවුඩ් තාක්ෂණය වෙත බැංකුවේ නැඹුරුව ඉහළ යෑමත් සමගම සයිබර් ආරක්ෂණ තර්ජනවලට ලංකා බැංකුවේ නිරාවරණය ඉහළ යන බව අපි හොඳින් දනිමු. මෙම පසුබිමට විරෙහිව, ශක්තිමත් තොරතුරු තාක්ෂණ ආරක්ෂණ ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ විමසුම් සහගත ආයතනික සංස්කෘතියක් හරහා අපගේ ගනුදෙනුකරුවන්ගේ රහස්‍ය සහ පුද්ගලික මූල්‍ය තොරතුරුවල පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව උදෙසා වගකීමට අපි කැපවී සිටිමු.

2021 වසර තුළ වාර්තා වූ මුළු දත්ත ආරක්ෂණ කඩ කිරීම් සිදුවීම් ගණන	කිසිවක් නැත
පුද්ගලිකව හඳුනාගත හැකි තොරතුරු විවෘත අවකාශයට මුදාහැරීමේ සිද්ධි ගණන 2021 වසර තුළ වාර්තා වූ මුළු දත්ත ආරක්ෂණ කඩ කිරීම් සිදුවීම් ගණනේ % ක් ලෙස	කිසිවක් නැත
දත්ත කඩකිරීම් වලින් පීඩාවට පත් වූ මුළු ගිණුම් හිමියන් සංඛ්‍යාව	කිසිවක් නැත

අපගේ වෙළඳ සන්නාමයේ ශක්තිය

ලංකා බැංකුව ශ්‍රී ලංකාවේ අංක 1 බැංකු සන්නාමය ලෙස අඛණ්ඩව 13 වැනි වසරටත් එහි අසමසම තත්ත්වය පවත්වා ගෙන ගියේ එහි පාර්ශ්වකරුවන් විසින් බැංකුව කෙරෙහි තබා ඇති විශ්වාසය තහවුරු කරමිනි. මෑත වසරවලදී, ලංකා බැංකුව මෙම සුවිශේෂී ශක්තීන් ප්‍රයෝජනයට ගැනීමට උත්සාහ කර ඇති අතර, බැංකුවේ අනාගත තිරසරභාවය සහතික කිරීමට සහ නව පරපුරේ ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීමට හැකි වන ලෙස බැංකුව තම සන්නාමය නව්‍යකරණයකට ලක් කර ඇත.

2021 දී සන්නම් උපායමාර්ගය

ක්‍රියාකාරී මාධ්‍ය අවකාශයන් මිලදී ගැනීමේ උපායමාර්ගය

වර්ෂය තුළ දී, බැංකුව මාධ්‍ය තුළ පවත්වාගත් තම සන්නාමයේ හඬ කොටස 2021 වසරේ වියදම් කොටස ඉක්මවන අතර එමගින් උපායමාර්ගයේ සඵලතාවය සනාථ කරයි.

ඩිජිටල් නාලිකා වල ප්‍රචලිතභාවය ඉහළ නංවා ගැනීම

තම ෆෙස්බුක් සහ ඉන්ස්ටග්‍රැම් ගිණුම් නැවත යාවත්කාලීන කිරීම

නව සන්නම් මාර්ගෝපදේශ

සියලුම වේදිකා හරහා අළෙවිකරණ සන්නිවේදනයේ සමානාත්මතාවය සහතික කිරීම

ආයතනික සමාජ වගකීම් හි අඛණ්ඩ ආයෝජන

අධ්‍යාපනය සහ තරුණ සවිබල ගැන්වීම, ප්‍රජා සෞඛ්‍යය සහ යහපැවැත්ම සහ පරිසරය පිළිබඳ උපායමාර්ගික ප්‍රජා සම්බන්ධීකරණ මූලපිරීම් (පිටුව 75)

ඉදිරි වසර සඳහා සැලසුම්

දැඩි සාර්ව-ආර්ථික අභියෝග සහ නව ප්‍රභේද මතුවීමේ හැකියාව සමඟ කොවිඩ් ආසාදනය නැවත මතුවීමට ඇති හැකියාව හමුවේ 2022 අභියෝගාත්මක වසරක් වනු ඇතැයි අපි අපේක්ෂා කරමු. බොහෝ ණය සහන කාලයන් 2021 දෙසැම්බරයේදී අවසන් වීමත් සමඟ බලපෑමට ලක් වූ ව්‍යාපාර වල ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පීඩාකාරී තත්ත්වයන් ඇති විය හැකි අතර, මෙම ව්‍යවසායකයන්ගේ පැවැත්ම සහ තිරසාර බව සහතික කිරීම සඳහා බැංකුව මූල්‍ය සහ මූල්‍ය නොවන සහය අඛණ්ඩව ලබා දෙනු ඇත. ගනුදෙනුකරු අපගේ ප්‍රධාන පාර්ශ්වකරු වන අතර, ගනුදෙනුකාර කේන්ද්‍රීය බව, ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය සහ ඩිජිටල්කරණයේ විශිෂ්ටතාව යන අපගේ උපායමාර්ගික ප්‍රවේශයන් හා අදාළ කරුණු ළඟා කරදීම සඳහා අපි කැපවී සිටින්නෙමු. කෙටි කාලීනව අපි නව සාමාන්‍යකරණය යටතේ ක්‍රියා කිරීම සහ නැගී එන ගනුදෙනුකාර අවශ්‍යතා සපුරාලීම කෙරෙහි අවධානය යොමු කරන අතර මධ්‍ය කාලීනව සහ දිගු කාලීනව අපගේ ප්‍රමුඛතාවය වනුයේ ගනුදෙනුකරුවන් රඳවා තබා ගැනීම සහ ඔවුන්ගේ තෘප්තිමත්භාවය ඉහළ නැංවීම සහ අපගේ සේවාවන් ලබා දීමෙන් සහ ඕනෑම වේලාවක ඕනෑම තැනකට ප්‍රවේශ විය හැකි පහසු සහ බාධාවකින් තොර බැංකු විසඳුම් හරහා අපගේ පදනම වර්ධනය කර ගැනීමයි.

ලොව ඉහළම බැංකු 1000 අතරට
ද බෑන්කර් සඟරාව වික්සත් රාජධානිය

2021 වසරේ විශිෂ්ටතම බැංකුව - ශ්‍රී ලංකාව
ද බෑන්කර් සඟරාව වික්සත් රාජධානිය

2021 වසරේ දී රටේ වටිනාම බැංකු සන්නාමය
බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් - ඉහළම සන්නාම 1000
සන්නාම වටිනාකම රු. බිලියන 53.9 ක් දක්වා 12% කින් වැඩි වීම

2021 වසරේ මහජනයාගේ බැංකු සේවා සපයන්නා
ස්ට්‍රිම් හීල්සන්ස් ජනතා සම්මාන 2021

පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ

අපගේ සේවකයින්

බැංකු ක්ෂේත්‍රයේ විශාලතම සේවා යෝජකයා ලෙස, ලාංකීය බැංකු ක්ෂේත්‍රය අනාගත ලොවට ගැළපෙන ලෙස මෙහෙයවීම සඳහා කැපවුණු සහ වී සඳහා බලගැන්වූ සේවක ප්‍රජාවක් ඇතුළත් වූ වැඩ පරිසරයක් අප විසින් ප්‍රචලිත කරන්නෙමු.

සේවකයින්ගේ අවශ්‍යතා සඳහා සවන් දීම

සම්බන්ධවීමේ වේදිකා

- බහු මට්ටම් කාර්ය මණ්ඩල රැස්වීම් (අඛණ්ඩව)
- විවෘත දොර සංස්කෘතිය (අඛණ්ඩව)
- දුක්ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණය (අඛණ්ඩව)
- TVBOC හරහා අතථ්‍ය සබැඳියාව (අඛණ්ඩව)
- කාර්යසාධන ඇගැයීම් (වාර්ෂික)
- වෘත්තීය සමිති හරහා සම්බන්ධ වීම (අඛණ්ඩව)
- වාර්ෂික ක්‍රියාකාරකම් දින දර්ශනය (අඛණ්ඩව)

අවශ්‍යතා

- තරඟකාරී වැටුප් යෝජනා
- ආරක්ෂිත සේවා ස්ථාන
- වෘත්තීය දියුණුව
- කුසලතා වර්ධනය සඳහා අවස්ථා
- සමාන අවස්ථාවන්
- රැකියා සුරක්ෂිතභාවය

ප්‍රතිචාර දක්වන ආකාරය

- භෞතික සහ මානසික සුවය සහතික කිරීම සඳහා පියවර
- පුහුණුව සහ කුසලතා සංවර්ධනය සඳහා අඛණ්ඩ අවස්ථා
- ආකර්ෂනීය වැටුප් සහ වැටුප් නොවන දීමනා

8,337

සේවකයින්

අපගේ කණ්ඩායම

බැංකුවට ලංකාවේ පළාත් නවය පුරාම මෙන්ම මාලදිවයින, සීෂෙල්ස් සහ ඉන්දියාවේ ශාඛාවල සහ බැංකුවට අනුබද්ධ ආයතනයක් ලෙස මෙහෙයුම් සිදු කරන චික්සත් රාජධානියේ පිහිටි පරිපාලිත සමාගමට අනුයුක්තව සේවයේ යොදවා ඇති සේවකයින් 8,337 කින් සමන්විත ශක්තිමත් කණ්ඩායමක් ඇත. ඔවුන් බහු ආගම්, වාර්ගික සහ සමාජ-ආර්ථික පසුබිම් නියෝජනය කරමින් අප කණ්ඩායමට සංස්කෘතියට විවිධත්වයක් එක් කර ඇත. ක්ෂේත්‍රයේ වඩාත්ම පිළිගැනීමක් සහිත සේවා යෝජකයෙකු ලෙස, බැංකුවේ බොහෝ ජයග්‍රහණ පිටුපස සිටින ගාමක බලවේගය වන රටේ ඉහළම දක්ෂතා සහිත සේවක ප්‍රජාවක් ආකර්ෂණය කර ගැනීමට ලංකා බැංකුවට හැකි වී තිබේ.

සේවා පදනම සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවක ව්‍යාප්තිය



ශ්‍රේණිය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවක ව්‍යාප්තිය



	ස්ථිර	බාහිර ආයතන වලින් බඳවා ගත්	කොන්ත්‍රාත්
බස්නාහිර පළාත	3,620	351	13
මධ්‍යම පළාත	723	160	1
නැගෙනහිර පළාත	469	131	-
උතුරු පළාත	521	120	1
උතුරු මැද පළාත	580	127	4
වයඹ පළාත	676	131	5
සබරගමු පළාත	552	121	1
දකුණු පළාත	740	153	-
ඌව පළාත	456	118	-
එකතුව	8,337	1,412	25

විවිධත්වයෙන් යුත් කණ්ඩායමක්

ලංකා බැංකු කණ්ඩායමේ විවිධත්වය එම විවිධාංගිකෘත වූ සේවක මණ්ඩලයේ විවිධ වූ අවශ්‍යතා සපුරාලීම සඳහා බැංකුවේ කැපවීම පිළිබිඹු කරයි. 60% වූ ක්ෂේත්‍රයේ ඉහළම කාන්තා නියෝජනයක් මගින් ස්ත්‍රී පුරුෂ විවිධත්වය නියෝජනය කරනු ලැබේ. කාන්තාවන් සහ පිරිමින් අතර මූලික වැටුප් අනුපාතය 1:1 ලෙස දිගටම පැවතුනි. බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්තිය සැමට සමාන අවස්ථා සහ ලිංගික හිංසන විරෝධී පරිසරයක් සහතික කරයි. සේවක දුක්ගැනවිලි සම්බන්ධයෙන් බැංකුවට වෙනම ප්‍රතිපත්තියක් ද ඇත. 42% ක කළමනාකරණ ශ්‍රේණියේ කාන්තා නියෝජනය සහ මාතෘ නිවාඩු වලින් පසුව නැවත සේවයට වාර්තා කිරීමේ ඉහළ ප්‍රතිශතය විසින් පෙන්නුම් කරන පරිදි, කාන්තාවන්ට ප්‍රතිලාභ ගෙන දෙන හිතකර පරිසරයක් මෙම ප්‍රතිපත්ති මගින් සහතික කරයි.

පාලන යාන්ත්‍රණයෙහි ස්ත්‍රී පුරුෂ නියෝජනය



වයස අනුව සේවකයින්



සේවා කාලය අනුව සේවකයින්



දේශීය ප්‍රජාව අතරින් බඳවා ගත් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සාමාජික ප්‍රතිශතය

100%

ස්ත්‍රී පුරුෂ නියෝජනය

	පිරිමි	ගැහැණු
උසස්වීම්	303	426
ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම		
තොරතුරු තාක්ෂණ අංශය	71	37
ව්කාබද්ධ අවදානම් කළමනාකරණ අංශය	10	17
මූල්‍ය අංශය	65	66
ආයතනික සහ අක්වෙරළ බැංකු අංශය	161	279
ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම් අංශය	141	80

බැංකුව විසින් දරුවෙකු බිහි කරන සියලුම කාන්තාවන් සඳහා මාතෘ නිවාඩු (මාපිය නිවාඩු) ලෙස වැඩ කරන දින 81 ක් නිවාඩු ලබා දෙයි.

මාතෘ නිවාඩු

	පිරිමි	ගැහැණු
සේවකයින්		**ගණන**
මාපිය නිවාඩු සඳහා හිමිකම් සහිත සේවිකාවන් ගණන	0	4,970
මාපිය නිවාඩු ලබා ගත් සේවිකාවන් ගණන	අදාළ නැත	505
නිවාඩුවෙන් පසු නැවත සේවයට පැමිණි සේවිකාවන් ගණන	අදාළ නැත	427
මාස 12 කට පසුවත් සේවයේ නියුතු සේවිකාවන් ගණන	අදාළ නැත	505
මාතෘ නිවාඩු ලබා ගන්නා සේවිකාවන්ගෙන් නැවත සේවයට වාර්තා කිරීමේ අනුපාතය	අදාළ නැත	100%
මාතෘ නිවාඩු ලබා ගන්නා සේවිකාවන් සේවයේ රැඳී සිටීමේ අනුපාතය	අදාළ නැත	100%

අපගේ කණ්ඩායම වයස් නියෝජනයෙන් ද විවිධ වේ, සේවකයින්ගෙන් 56% ක් වයස අවුරුදු 35 ට වඩා අඩු වයස් කාණ්ඩ නියෝජනය කරන අතර ආබාධ සහිත සේවකයින් සඳහා 1% ක උපරිමයක් දක්වා කෝටාවක් ද අපගේ බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය මගින් වෙන් කර දී ඇත.

සේවකයින් සඳහා නිර්මිත වටිනාකම්

සාධාරණ වැඩ පිළිවෙත්

ශක්තිමත් සහ සාධාරණ ප්‍රතිපත්ති රාමුව

60% ක් වූ කාන්තා නියෝජන අනුපාතය

කුසලතා මත පදනම් වූ උසස්වීම් 729 ක්

ආරක්ෂිත වැඩ පරිසරය

සේවක සෞඛ්‍ය හා ආරක්ෂක පියවර ක්‍රියාත්මක කිරීම සඳහා ආයෝජනය

රු. මිලියන 286.9 කි

පුහුණුව සහ සංවර්ධනය සඳහා අවස්ථාවන්

පුහුණුව සඳහා ආයෝජනය
රු. මිලියන 64.1 කි

පුහුණු පැය 176,418 කි

ගෙවීම් සහ ප්‍රතිලාභ

සේවකයින් සඳහා ආයෝජනය
රු. බිලියන 25.0 කි

ඉහළ මට්ටමේ සේවක සම්බන්ධ වීම්

සේවක පිරිවැටුම් අනුපාතය 0.5% තරම් අඩු අගයක් වාර්තා කිරීම



පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ

අපගේ සේවකයින්

සාධාරණ වැඩ පිළිවෙත්

සියලුම දේශීය කම්කරු නීතිවලට අනුගත වන ලෙස මෙන්ම ජාත්‍යන්තරයේ ඉහළම භාවිතයන් මගින් මඟ පෙන්වනු ලබන ආකාරයට සකස් කර ඇති පරිපූර්ණ මානව සම්පත් උපායමාර්ගයක් සහ ශක්තිමත් පදනමක් තුළ සකස් කර ඇති මානව සම්පත් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සාධාරණ, ප්‍රගතිශීලී වැඩ පිළිවෙත් සහතික කරනු ලැබේ. මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව විසින් මෙහෙයවනු ලබන, මහා කළමනාකාරතුමා විසින් සභාපතිත්වය දරණ මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුව සමස්ත මානව සම්පත් උපායමාර්ග සහ මානව සම්පත් ප්‍රතිපත්ති අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමත වීම ප්‍රතිපත්ති ඉන් පසුව මානව සම්පත් දෙපාර්තුමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

දැඩි ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ මාර්ගෝපදේශ වෙනස් කොට සැලකීමක් නොවන බව සහතික කරන අතර විවිධත්වය දිරිමත් කරන පරිසරයක් සහ සැමට සම මට්ටමේ අවස්ථා සහතික කරයි. වර්ෂය තුළ වෙනස්කම් සිදුවීම පිළිබඳ සිදුවීම් කිසිවක් වාර්තා වී නැත.

වැටුප් සහ වැටුප් නොවන දීමනා

මූල්‍ය සහ මූල්‍ය නොවන පහසුකම් ලබා දෙමින් අභියෝගාත්මක කාල පරාසය පුරාම වසංගත තත්ත්වය තුළ දී අපගේ සේවකයින්ට සහය වීමට කැපවී සිටින සේවා යෝජකයෙකු ලෙස අපි රැඳී සිටියෙමු. වර්ෂය තුළ වැටුප් හෝ වෙනත් ප්‍රතිලාභ වල කිසිදු අඩු කිරීමක් හෝ සංශෝධනයන් නොමැතිව අපගේ සියලුම සේවකයින් එලෙසම සේවයේ රඳවා ගත් බව අපි සාධම්බරව ප්‍රකාශ කරමු.

මූලික වැටුපට අමතරව වෙනත් ප්‍රතිලාභ මාලාවක් ලබා දීම මගින් අපගේ සේවකයින්ගේ මූල්‍ය ආරක්ෂණය අපි නිරතුරුව සහතික කරනු ලැබේ. 2021 සිට 2023 දක්වා නව සාමූහික ගිවිසුම ද වැඩි දියුණු කළ වැටුප් පැකේජයක් සමඟ වසර තුළ අත්සන් කරන ලදී. නිවාඩු සහ වෛද්‍ය ප්‍රතිපූර්ණ කිරීම් වලට අමතරව සියලුම ස්ථිර සේවකයන්ට අභිමත ප්‍රසාද දීමනා සහ දිරි දීමනා ගෙවීම ද සිදු කරනු ලැබේ. වර්ෂය තුළ අපි හදිසි අනතුරු ප්‍රතිලාභ ප්‍රතිපත්තිය ද සමාලෝචනය කර ජීවිත හානියකදී සිදුකරන හිමිකම් ගෙවීම ද ඉහළ නංවන ලදී.

පූර්ණ කාලීන සේවකයින් වෙත ලබා දී ඇති ප්‍රතිලාභ

- ප්‍රසාද දීමනා සහ දිරි දීමනා
- සහන පොළී ණය පහසුකම්
- වෛද්‍ය ආධාර යෝජනා ක්‍රම
- පශ්චාත් විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ වැන්දඹු, වැන්දඹු සහ අනත් දරු යෝජනා ක්‍රම
- සේවායෝජකයා මඟින් EPF සහ ETF අරමුදල් සඳහා සිදුකරන දායකත්වය
- අධ්‍යාපන ආධාර සහ වෘත්තීය දායකත්වය ප්‍රතිපූරණය

සාධාරණ බඳවා ගැනීම්

අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරන ලද වාර්ෂික මිනිස් බල සැලැස්ම පරිදි බඳවා ගැනීම් සිදු කෙරේ. බැංකුවේ වෙබ් අඩවිය සහ පුවත්පත්වල භාෂා තුන යටතේම පුරප්පාඩු ප්‍රචාරය කෙරේ. සේවකයින් තෝරා ගැනීම ලිඛිත කාර්යසාධනය මනින විභාගයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මත පදනම් වේ.

ව්‍යුහගත කාර්යසාධනය ඇගැයීම

අර්ධ වාර්ෂිකව සියලුම සේවකයින් සඳහා කාර්යසාධනය ඇගැයීම සිදු කරනු ලැබේ. කලින් තීරණය කරන ලද සහ වසර ආරම්භයේ සේවකයින් සමඟ සන්නිවේදනය කර එකඟ වන කාර්යසාධන මිනුම් දර්ශක මත මෙම ඇගැයීම් පදනම් වේ.

වෙනස්කම් නොකිරීමේ පිළිවෙත්

සමාන අවස්ථා ලබා දෙන සේවා යෝජකයෙකු ලෙස සියලුම සේවකයින් සඳහා සමාන අවස්ථා සහතික කිරීම සඳහා බැංකුවට මාර්ගෝපදේශ ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි ඇත.

දක්ෂතා මත පදනම් වූ කාර්යසාධනය

උසස්වීම් සහ වෘත්තීය දියුණුව පිළිබඳ වන ප්‍රතිපත්තිය මගින් උසස්වීම් හිමිවීම සඳහා සම්පූර්ණ කළ යුතු නිර්ණායක පැහැදිලිව ප්‍රකාශ කරයි. වත්මන් ශ්‍රේණියේ අවම සේවා කාලය සපුරා සිටිය යුතු වීම සහ ලිඛිත විභාගයක් සමත් වීම එම නිර්ණායක වලට ඇතුළත්ය. උසස්වීම් සිදු කරනු ලබන්නේ පූර්ව සම්මුඛ පරීක්ෂණ සහ සම්මුඛ පරීක්ෂණ ලකුණු මත පදනම්වය. කාර්යසාධන කළමනාකරණ පද්ධතියේ ලකුණු පූර්ව සම්මුඛ පරීක්ෂණයේ සැලකිය යුතු ලකුණු කොටසකට හිමිකම් කියනු ලැබේ.

බඳවා ගැනීම

වර්ෂය තුළ පැවති සාධක සැලකිල්ලට ගනිමින් නියමිත බඳවා ගැනීම් කල් දැමීමට බැංකුවට සිදු විය. වසර තුළ මුළු බඳවා ගැනීම් ගණන පහකි.

වර්ෂය තුළ අපගේ බඳවා ගැනීම් පිළිබඳ පැතිකඩ පහත දැක්වේ:

ස්ත්‍රී පුරුෂ භාවය අනුව

පිරිමි: 03 (60%)
කාන්තා: 02 (40%)

වයස අනුව

30 අඩු: 02 (40%)
අවුරුදු 30-50: 03 (60%)

ආරක්ෂිත වැඩ පරිසරය

වෛද්‍ය ප්‍රතිලාභ, සේවා ස්ථානයේ ආරක්ෂාව සහ සෞඛ්‍ය සහ සුවතාවය වැනි ප්‍රධාන ක්ෂේත්‍ර ආවරණය වන සවිස්තරාත්මක සේවක සෞඛ්‍ය සහ ආරක්ෂණ මාර්ගෝපදේශ බැංකුව සතුව ඇත. වෛද්‍ය ආධාර යෝජනා ක්‍රමය යටතේ සේවක හිමිකම් වැනි වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් සේවක සහභාගිත්වය සහ උපදේශන සහතික කිරීම සඳහා වෛද්‍යාධාර යෝජනා ක්‍රම වැනි සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධ මාතෘකා සාමූහික ගිවිසුම් මගින් ආවරණය කර ඇත. ප්‍රධාන කාර්යාලයේ අභ්‍යන්තර වෛද්‍යවරයකු සහ ඔසුසලක් පැවතීමට අමතරව, සියලුම ස්ථිර සේවකයන්ට වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය මෙන්ම පී.සී.ආර්. සහ රැපිඩ් පරීක්ෂණ ඇතුළුව අනෙකුත් කොවිඩ්-19 ප්‍රතිකාරද ඇතුළත් පුළුල් වෛද්‍ය ආධාර යෝජනා ක්‍රමයක් බැංකුව තුළ ස්ථාපිතය.

කොවිඩ්-19 වසංගතය ව්‍යාප්තවීම ආරම්භ වීමත් සමගම ඉහළ යන සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ගැටළු මධ්‍යයේ අවදානම තක්සේරු කිරීමට සහ සියලුම සේවකයින්ගේ ආරක්ෂාව සහතික කිරීමට බැංකුව ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වයෙන් සමන්විත විශේෂ ආරක්ෂක කාර්යසාධක බළකායක් පිහිටුවීය. ආරක්ෂිත වැඩ පරිසරයක් සහතික කිරීම සඳහා වසර තුළ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන මුලපිරීම් පහතින් නිරූපණය කෙරේ.

කොවිඩ්-19 සම්බන්ධීකරණ මැදිහත්වීම්

- වසංගත රෝග විද්‍යා ඒකකය සහ ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සමඟ එක්ව ලංකා බැංකු සේවකයින් එන්නත් කිරීමේ ව්‍යාපාරය.
- ප්‍රවාහන සේවා පහසුකම්/ ප්‍රවාහන වියදම් ප්‍රතිපූරණය.
- අතථ්‍ය නාලිකා සහ TVBOC හරහා කොවිඩ්-19 පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන්.



- වැඩ මුර පදනම් කරගත් වැඩ විධිවිධාන, දුරස්ථ වැඩ විධිවිධාන සහ පුද්ගලික ආරක්ෂක උපකරණ සැපයීම ඇතුළුව ආරක්ෂිත වැඩ පිළිවෙත්.
- බැංකුවේ වෛද්‍ය ආධාර යෝජනා ක්‍රමය හරහා කාර්ය මණ්ඩලයේ සහ ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයන්ගේ කොවිඩ්-19 ආශ්‍රිත වියදම් ප්‍රතිපූරණය කිරීම.
- අතුරු ප්‍රතිකාර මධ්‍යස්ථාන සහ ආසාදිත කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ ඔවුන්ගේ පවුලේ අය සඳහා රෝහල්ගත වීමේදී අවශ්‍ය පහසුකම් සහ විධිවිධාන.

පරිපූර්ණ පුහුණු අවස්ථා

පුහුණුව අපගේ සේවක වටිනාකම් ගොනුවේ මූලික අංගයක් ලෙස අඛණ්ඩව පවතින අතර අපි මේ සඳහා සැලකිය යුතු සම්පත් ප්‍රමාණයක් කැප කර ඇත්තෙමු. වසර තුළ පුහුණු ක්‍රියාකාරකම් සඳහා රු. මිලියන 64.1 ක් වෙන් කරන ලද අතර එය වැඩසටහන් 3,015 ක් හරහා ලබා දුන් මුළු මිනිස් පැය 176,418 ක පුහුණුවක් බවට පරිවර්තනය විය. අතථ්‍ය වේදිකා වෙත මාරු වීමෙන් සහ MSTeams, Zoom සහ TVBOC නාලිකාව වැනි මෙවලම් මගින් අභ්‍යන්තර සන්නිවේදනයන් ප්‍රචලිත කිරීමෙන් වසංගතය නිසා ඇති වූ බාධා නොතකා අපි අපගේ පුහුණු ක්‍රියාකාරකම් දිගටම කරගෙන ගියෙමු.

සියලුම ආරක්ෂිත මාර්ගෝපදේශ වලට අනුගතව මහරගම අපගේ පුහුණු මධ්‍යස්ථානයේ කටයුතු ක්‍රමානුකූලව නැවත ආරම්භ කරන ලදී.

වසර තුළ සිදුකළ පුහුණු වැඩසටහන් වලදී ණය කළමනාකරණය, තාක්ෂණික සහ ගනුදෙනුකාර සේවා කුසලතා යන මූලික ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරන ලදී. වර්ෂය තුළ ප්‍රධාන පුහුණු වැඩසටහන්වලට පහත සඳහන් දෑ ඇතුළත් විය.

- ව්‍යාපෘති මූල්‍යනය පිළිබඳ සහතිකය
- මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදය සඳහා මූල්‍යකරණයට එරෙහිව සටන් කිරීම
- මූල්‍ය ආයතන සඳහා ණය පහසුකම් ලබා දීම සහ ප්‍රතිසාධනය පිළිබඳ මාර්ගගත වැඩසටහන
- මූල්‍ය ආයතන සඳහා විදේශ විනිමය රෙගුලාසි
- බැංකු ගනුදෙනුකරුවන් සඳහා හොඳම භාවිතයන්
- මූල්‍ය ආයතන සඳහා අභ්‍යන්තර පාලනය සහ විගණනය පිළිබඳ මාර්ගගත වැඩසටහන
- මුදල් ප්‍රතිපත්තිය සහ මුදල් මෙහෙයුම්
- බැංකු සේවා සඳහා කෘතිම බුද්ධිය

ආවරණය කළ පුහුණු ක්ෂේත්‍ර



පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ

අපගේ සේවකයින්

ශ්‍රේණිය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සාමාන්‍ය පුහුණු පැය



අතථ්‍ය පුහුණුව

වැඩසටහන්
617

මිනිස් පැය
69,935

සේවක සේවය සම්බන්ධතා පවත්වා ගැනීම

අපගේ සේවකයින් සමඟ ඉහළ මට්ටමේ සේවක සේවය සම්බන්ධතාවක් පවත්වා ගනිමින් ද දුරස්ථ වැඩ විධිවිධාන සහ ශාරීරික දුරස්ථභාවය මධ්‍යයේ කාර්ය මණ්ඩලයේ අභිප්‍රේරණ මට්ටම් සැලකිය යුතු මට්ටමක පවත්වා ගනිමින් ද සේවකයින් සමඟ අඛණ්ඩ සංවාදයක් පවත්වා ගැනීමට අපට හැකි වී තිබේ. එසේම, TVBOC, අපගේ අභ්‍යන්තර රූපවාහිනී නාලිකාව සේවකයින්ට තොරතුරු විකාශනය කිරීම සඳහා පුළුල් ලෙස භාවිතා කරන අතර, ලංකා බැංකුවේ දුරස්ථ ඉගෙනුම් නාලිකාව, MSTeams සමාජ මාධ්‍ය සහ විද්‍යුත් තැපෑල වැනි ඩිජිටල් මාධ්‍ය ද සන්නිවේදන ක්‍රියාවලියට සක්‍රීයව තබා ගැනීමට භාවිතා කරන ලදී. සැලකිය යුතු උනන්දුවක් සේවක ප්‍රජාව අතර ඇති කරන ලද හොඳම ශාඛා ඇගැයීමේ තරඟයද අප විසින් පවත්වන ලදී. අපි වෘත්තීය සමිති නියෝජිතයන් සමඟ අඛණ්ඩ සංවාදයක් පවත්වා ගෙන ගිය අතර වසර පුරා සුමට සබඳතාවක් ඔවුන් සමඟ පවත්වාගෙන ගියෙමු, අපගේ සේවකයින්ගෙන් 99% ක් වෘත්තීය සමිති හයෙන් එකකට අයත් වන අතර සාමූහික ගිවිසුම මගින් ලංකා බැංකුවේ හි සියලුම ස්ථිර සේවකයින් ආවරණය කරයි.

වෘත්තීය සමිති සමඟ සාකච්ඡා පවත්වනු ලබන්නේ තේරී පත් වූ වෘත්තීය සමිති නියෝජිතයන් හරහා ය. දැනුම්දීමේ කාලසීමාව සහ විධිවිධාන හෝ උපදේශන සහ සාකච්ඡා සාමූහික ගිවිසුම්වල නිශ්චිතව දක්වා ඇති අතර සැලකිය යුතු මෙහෙයුම් වෙනස්කම් ක්‍රියාත්මක කිරීමට පෙර සේවකයින්ට මාස හයක දැනුම් දීමේ කාලයක් ලබා දේ. වසර තුළ අපි 2021-2023 කාලසීමාව සඳහා වැටුප් සහ වැටුප් නොවන ප්‍රතිලාභ සඳහා සාමූහික ගිවිසුම සාර්ථකව අවසන් කළෙමු.

ඉවත්ව යන සේවකයින් පිළිබඳ විශ්ලේෂණය

ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවය හැර යාම



පළාත් අනුව සේවය හැර යාම



වයස අනුව සේවය හැර යාම



ඉදිරි වසර සඳහා සැලසුම්

ලෝකය ක්‍රමක්‍රමයෙන් පශ්චාත් කොවිඩ්-19 නව සාමාන්‍ය තත්ත්වයට පත් වන විට, වඩ වඩාත් සංකීර්ණ ව්‍යාපාරික පරිසරයක් තුළ සාර්ථක වීමට බැංකුවට හැකියාව ලබා දෙන ඩිජිටල් දැනුමක් ඇති කාර්යසාධනය මත පදනම් වූ කණ්ඩායමක් ගොඩනැගීම කෙරෙහි අපි දිගටම අවධානය යොමු කරන්නෙමු. සෞඛ්‍ය සම්පන්න වැඩ-ජීවිත සමතුලිතතාවයක් ලබා දෙන අතරම අපගේ සේවකයින්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සහතික කරන දෙමුහුන් වැඩ ආකෘති වල යෝග්‍යතාව අපි දිගටම ගවේෂණය කරන්නෙමු.

අපගේ සේවකයන්ගෙන් 20% කට බැංකුවේ වසර 15 කට වැඩි පළපුරුද්දක් ඇති අතර සේවකයන් ගෙන් 56% ක් වයස අවුරුදු 35 ට අඩු අය වෙති. එමනිසා, නිවැරදි හා කාලෝචිත දැනුමක් හරහා මෙම සේවකයින් බැංකුවේ අනාගත නායකත්වය උදෙසා මනාව සකස් කර පුහුණු කිරීම අතිශය වැදගත්ය. නව තාක්ෂණයන් පිළිබඳ නිපුණතා සමඟ අපගේ සේවක මණ්ඩලයේ කුසලතා යාවත්කාලීන කිරීම අපගේ පුහුණු යෝජනාවලියේ වැදගත් අංගයකි.



කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්

බැංකුව සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා රජය සතු වේ. අනෙකුත් අරමුදල් සපයන්නන් අතරට බැංකුවේ ණය සුරැකුම්පත්වල ආයෝජනය කරන පුද්ගලයන් සහ සංවිධාන, ණය සැපයුම්කරුවන් මෙන්ම තෝරාගත් කර්මාන්ත/ගනුදෙනුකාර කණ්ඩායම් වෙත සෘජුවම අරමුදල් සපයන ජාත්‍යන්තර අරමුදල් ආයතන ද ඇතුළත් වේ.

අපගේ කොටස් හිමියාගේ සහ අරමුදල් සපයන්නන්ගේ අවශ්‍යතා සඳහා සවන් දීම

සම්බන්ධ වීමේ වේදිකා

- වාර්ෂික වාර්තාව සහ අනෙකුත් ප්‍රකාශන (අබණ්ඩව)
- වරින් වර රැස්වීම් (අබණ්ඩව)
- විශාල ආයෝජකයින් සමඟ පුද්ගලික රැස්වීම් (කාලීන)
- ආයෝජක ඉදිරිපත් කිරීම් සහ මාර්ග දර්ශන (කාලීන)
- වෙළඳපළ අතරමැදියන් හරහා සම්බන්ධ වීම (කාලීන)

අවශ්‍යතා

- අවදානමට සරිලන පරිදි ප්‍රමාණවත් ප්‍රතිලාභයක්
- විනිවිදභාවය හා කාලෝචිත වාර්තාකරණය
- ශක්තිමත් ආයතනික පාලනය සහ අවදානම් කළමනාකරණ භාවිතයන්
- කීර්තිය
- වගකීම් සහගත ව්‍යාපාරික පිළිවෙත්

ප්‍රතිචාර දක්වන ආකාරය

- ප්‍රමාණවත් ප්‍රතිලාභ ජනනය වන බවට සහතික වීම
- ණය කළඹේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම
- ඵලදායී ආන්තික කළමනාකරණය
- කාලෝචිත ලෙස ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම සහ ශක්තිමත් කිරීම
- කාලීන වෙළඳපළ වර්තා කිරීම්

මෙහෙයුම් පරිසරය තුළ පැවති අභියෝග රාශියක් මධ්‍යයේ වුවද බැංකුව සිය කොටස් හිමියාගේ අවශ්‍යතා සඳහා කැපවීම අඛණ්ඩව ඉටු කළේය. ලංකා බැංකුව එහි ප්‍රාග්ධන මට්ටම් පවත්වා ගනිමින් සහ එහි අවදානම් පරාමිතීන් අර්ථ දක්වා ඇති අවදානම් අභිරුචි මට්ටම් තුළ කළමනාකරණය කරමින් වාර්තාගත ලාභයක් ජනනය කළේය.

බැංකුවේ කාර්යසාධනය සහ ස්ථාවරත්වය පිළිබඳ ඉහළ මට්ටමේ දළ විශ්ලේෂණයක් පහත දැක්වේ. බැංකුවේ කාර්යසාධනය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සඳහා කරුණාකර ප්‍රධාන මූල්‍ය නිලධාරිතුමාගේ සමාලෝචනය (පිටුව 52) සහ ව්‍යාපාරික අංශ සමාලෝචනය (පිටුව 56) වෙත යොමු වන්න.



මුළු ආදායම

මුළු ආදායමේ 18% ක වර්ධනය සඳහා

- 22% ක ණය වර්ධනයක් මඟින් මෙහෙයවන ලද අරමුදල්-පාදක ආදායමේ 15% ක වැඩිවීම
- ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායමේ 19% ක වර්ධනය
- විදේශ විනිමය ආදායම සහ විදේශ විනිමය ප්‍රත්‍යාගණනය මඟින් ලැබූ අදායම් ඇතුළුව අනෙකුත් ආදායම් දෙගුණ වීම



ලාභය

වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ලාභය රු. බිලියන 37.6 දක්වා දෙගුණයකටත් වඩා වැඩි විය. ලාභදායීත්වය හැඩගස්වන සාධක පහත දක්වා ඇත.

- ආන්තික ඵලදායී කළමනාකරණය
- පිරිවැයට ආදායම් අනුපාතය 32% ක් වීම සහ ඵලදායී පිරිවැය කළමනාකරණය
- ණය හානිකරන වියදම 40% කින් වැඩි වීම



වත්කම් වර්ධනය

වත්කම් 28% ක වර්ධනය පෙන්වමින් රු. ට්‍රිලියන 3.8 දක්වා වර්ධනය වීම සඳහා

- අයිරා, පුද්ගලික ණය සහ කාලීන ණය මඟින් ණය සහ අත්තිකාරම්වල ණය කලඹේ සිදුවූ 22% ක වර්ධනය සඳහා සහාය විය.



වගකීම්

මුළු වගකීම්වල 28% වර්ධනයක් පිළිබිඹු කරමින්,

- 16% ක තැන්පතු වැඩිවීමක් සමඟ ජංගම සහ ඉතුරුම් තැන්පතු අනුපාතය 36% දක්වා වැඩිදියුණු වීම
- අනෙකුත් ණය ගැනීම් දෙගුණ වීම



කොටස් හිමියා සඳහා ප්‍රතිලාභ

- ස්කන්ධය මත ප්‍රතිලාභය 2020 වර්ෂයේ වාර්තා වූ 11.9% සිට 21.0% දක්වා වැඩි විය
- කොටසක ඉපැයීම් රු. 1,503.60 දක්වා දෙගුණ වීම
- කොටසක ලාභාංශය රු. 73.86 දක්වා 16% කින් වැඩි වීම



ප්‍රාග්ධනීකරණය

පහත හේතු පදනම් කරගනිමින් ශක්තිමත් ප්‍රාග්ධනීකරණය මට්ටමක් රදවා ගැනීම,

- රඳවාගත් ඉපැයීම්වල 41% වැඩිවීම
- ලාභාංශ ප්‍රතිපත්තිය අභ්‍යන්තර ප්‍රාග්ධන උත්පාදනය සඳහා උත්පාදනය කරන ලාභය සුරැකීම කෙරෙහි අවධානය යොමු කරයි.
- බැංකුවේ පොදු කොටස් මට්ටම් 1 ප්‍රාග්ධන අනුපාතය 12.9% දක්වා වැඩි විය.
- මුළු ප්‍රාග්ධන අනුපාතය 17.8% දක්වා වැඩි විය

පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ

රට සහ ප්‍රජාව

ශ්‍රී ලංකාවේ විශාලතම බැංකුව සහ රජය සතු ආයතනයක් ලෙස, ලංකා බැංකුව වසර ගණනාවක් පුරා රටේ ජාතික ආර්ථික න්‍යාය පත්‍රය මෙහෙයවීමට සහ සාර්ව ආර්ථික ස්ථාවරත්වය සඳහා දායක වෙමින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර ඇත.

රට සහ ප්‍රජාව සමඟ සම්බන්ධවීම

සම්බන්ධවීමේ වේදිකා

- වාර්ෂික වාර්තාව සහ අනෙකුත් ප්‍රකාශන (අබණ්ඩව)
- කර්මාන්ත සංසද සහ රැස්වීම් (අබණ්ඩව)
- ශාඛා හරහා සම්බන්ධ වීම (අබණ්ඩව)
- ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම් සහ අනුග්‍රහය (අබණ්ඩව)
- මාධ්‍ය නිවේදන සහ මාධ්‍ය ප්‍රචාරණ (අබණ්ඩව)

අවශ්‍යතා

- ව්‍යාපාරවලට සහය වීම සහ ආර්ථිකයේ පුනර්ජීවනය ඇති කිරීම
- මූල්‍ය අංශය තුළ විශ්වාසය පවත්වා ගැනීම
- ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය බැංකුවේ උපායමාර්ගයට පෙළගැස්වීම
- මූල්‍ය ඇතුළත් කිරීම් සඳහා පහසුකම් සැලසීම
- ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සඳහා දායකත්වය
- වගකීම් සහගත ව්‍යාපාරික පිළිවෙත්
- මූල්‍ය ඇතුළත් කිරීම් සහ සවිබල ගැන්වීම

අපි ප්‍රතිචාර දැක්වූ ආකාරය

- ශක්තිමත් පාලනය සහ අවදානම් කළමනාකරණ භාවිතයන්
- රැකියා උත්පාදනය
- රට පුරා මූල්‍ය ඇතුළත් කිරීම් සඳහා පහසුකම් සැලසීම
- ආයතනික සමාජ වගකීම් සහිත ව්‍යාපෘති සඳහා අබණ්ඩව දිගුකාලීන ආයෝජනය
- රජයට වටිනාකම් නිර්මාණය කිරීම
- රටේ ආර්ථික පුනර්ජීවනයට සහය වීම

ආර්ථිකයට දායක වීම

කොවිඩ්-19 වසංගතයෙන් පැන නඟින සැලකිය යුතු ආර්ථික පීඩනය පුද්ගලයන්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, ආයතනික සහ රජය සතු සංවිධාන කෙරෙහි පුළුල් ලෙස බලපෑම් ඇති කරන ලද අතර එය සැලකිල්ලට ගනිමින් මෙම භූමිකාවේ වැදගත්කම මෑත කාලයේ දී විස්තාරණය වී ඇත. රජය වෙත බැංකුව වටිනාකම් නිර්මාණය කිරීම බහුකාර්ය වූ අතර එය පහත සාරාංශගත කර ඇත.

සංචරණ සීමා ප්‍රකාශ කර තිබූ කාල වකවානු තුළ බැංකු සේවා අබණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම

සෞඛ්‍ය ගැටළු හේතුවෙන් වසා දැමීමට අවශ්‍ය නම් මිස, 2021 තුළ කොවිඩ්-19 හේතු කොටගෙන පැන වූ සංචරණ සීමා සහ මෙහෙයුම් සීමා කිරීම් නොතකා සියලුම ලංකා බැංකු ශාඛා විවෘතව තිබූ අතර සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක විය. බැංකුවේ පුළුල් ශාඛා ජාලය හේතුවෙන් දිවයින පුරා බැංකු සේවා අබණ්ඩව පවත්වාගෙන යාමට හැකි විය. ජංගම බැංකු ඒකක 10 ක් යෙදවීම සහ බැංකුවේ නියෝජිත බැංකුකරණ විසඳුම - BOC CONNECT දියත් කිරීම මඟින් මෙම ක්‍රියාදාමය තවදුරටත් ශක්තිමත් විය. ගනුදෙනුකාර ඩිජිටල් අනුගතවීම ඉහළ නැංවීම සඳහා ලංකා බැංකුවෙහි උපායමාර්ගික පෙළඹවීම ඩිජිටල් වේදිකා හරහා අත්‍යවශ්‍ය බැංකු කටයුතු අබණ්ඩව පවත්වාගෙන යාමට තවදුරටත් සහය වී ඇත.

සාර්ව ආර්ථික ස්ථායීතාවයට සහාය වීම

රටේ ඉලක්ක කරගත් ආර්ථික වාතාවරණය ශක්තිමත් කිරීම සඳහා රජයේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සහය වීමේදී ලංකා බැංකුව වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ප්‍රේෂණ වෙළඳපළ ප්‍රමුඛයා ලෙස, බැංකුව වර්ෂය තුළ රටට තීරණාත්මක විදේශ මුදල් ගලා ඒම සඳහා පහසුකම් සලසා ඇත. බදු සහ ලාභාංශ මඟින් ද රජයේ සුරැකුම්පත් වෙළඳපළේ ආයෝජන හරහා ද බැංකුව රජයේ ආදායමට දායක වේ.

අත්‍යවශ්‍ය ආනයන සහ රජයේ ක්‍රියාකාරකම් අබණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම

රට තුළ විදේශ මුදල් සංචිත සඳහා දැඩි පීඩනයක් තිබියදීත්, බනිජ තෙල්, ගෑස්, කොවිඩ්-19 සඳහා වන්නත් සහ අනෙකුත් ඖෂධ සහ වෛද්‍ය නිෂ්පාදන වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීමට ලංකා බැංකුව පහසුකම් සලසා ඇත. 2021 වර්ෂයේ දී බැංකුව විසින් වර්ෂය තුළ බනිජ තෙල් ආනයනය සඳහා ඇ. ඩොලර් මිලියන 1,460.0 ක් ලබා දී ඇත. තවද, ශ්‍රී ලංකාවට මිලදී ගන්නා ලද කොවිඩ්-19 ට එරෙහි වන්නත් ආනයනය කිරීම සඳහා ලංකා බැංකුව විසින් ඇ. ඩොලර් මිලියන 138.0 ක් මූල්‍යනය කර ඇත. ප්‍රශස්ත මට්ටමින් විදේශ මුදල් කළමනාකරණය කිරීමේ සිය හැකියාවන් ප්‍රදර්ශනය කරමින් ලංකා බැංකුව විදේශයන්හි අධ්‍යාපනය ලබන ශ්‍රී ලාංකික සිසුන්ගේ විදේශ විනිමය අවශ්‍යතා සඳහා ද අබණ්ඩව පහසුකම් සපයයි.

මීට අමතරව වැටුප්, විශ්‍රාම වැටුප් සහ සමෘද්ධි ගෙවීම් සඳහා පහසුකම් සපයන අතරම රජය සතු ප්‍රධාන ආයතනවල ද්‍රවශීලතා ගැටළු මඟහරවා ගැනීම හරහා අත්‍යවශ්‍ය රාජ්‍ය සේවාවන්හි මෙහෙයුම් සඳහා ද බැංකුව අබණ්ඩව සහයෝගය ලබා දුන්නේය.

ආර්ථික පුනර්ජීවනයට සහය වීම

35 සහ 62 පිටුවල විස්තර කර ඇති පරිදි, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්, අපනයනකරුවන් සහ කෘෂිකාර්මික අංශය ඇතුළු වැදගත් අංශ පුනර්ජීවනය කිරීම සඳහා පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම සහ ණය ගෙවීමේ කොන්දේසි නැවත සංශෝධනය කිරීම, ණය ගෙවීමේ සහන කාල හඳුන්වා දීම ආදී විවිධ ණය කොන්දේසි මත ලබා දුන් සහන හරහා රටේ ආර්ථික පුනර්ජීවනය ඇති කිරීමට ලංකා බැංකුව ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. බැංකුවේ කළමනාකාරිත්ව කණ්ඩායම විසින් රට පුරා සිටින ගනුදෙනුකරුවන් සමඟ විශේෂ සාකච්ඡා පැවැත්වීම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ නව ව්‍යවසායකයින් සඳහා 'සශ්‍රීක' නව ණය යෝජනා ක්‍රමය දියත් කිරීම ආදිය ද, විශේෂ උත්සව අත්තිකාරම් කාර්යක්ෂමව බෙදා හැරීම සහ චිමඟින් උත්සව සමයේ මුදල් සංසරණය ඉහළ නැංවීම ද මේ සඳහා දායක විය.

යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා මූල්‍යකරණය

රජයට ප්‍රධාන ණය දෙන්නෙකු ලෙස, ලංකා බැංකුව රජය විසින් මෙන්ම පෞද්ගලික අංශය විසින් සිදු කරන ලද අත්‍යවශ්‍ය යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අඛණ්ඩව අරමුදල් සපයන ලදී. ආර්ථික ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සපයන වාරිමාර්ග ව්‍යාපෘති, විදුලි උත්පාදනය, ජලය සහ ප්‍රවාහන යටිතල පහසුකම් සහ දිගුකාලීන ජීවන තත්ත්වය ඉහළ නැංවීමට දායක වන ව්‍යාපෘති මේ සඳහා ඇතුළත් වේ. 2021 දෙසැම්බර් 31 වන විට යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ලබා දී ඇති ණය මුදල් ප්‍රමාණය රු. බිලියන 445.1 කි.

ඉදිරි වසර සඳහා සැලසුම්

ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික වර්ධනය මන්දගාමී කරන කෙටි කාලීන හා මධ්‍ය කාලීන අභියෝග කිහිපයක් සමඟින්, ව්‍යාපාර පුනර්ජීවනයට සහය වීම, රටේ අපනයන සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශ ශක්තිමත් කිරීම සහ ණය දීම තුළින් ආර්ථික ක්‍රියාකාරකම් මෙහෙයවීම හරහා ලංකා බැංකුව ජාතික ආර්ථික න්‍යාය පත්‍රයට අඛණ්ඩව සහය වනු ඇත. සුහුරු අධ්‍යාපනය, ප්‍රවාහනය සහ සන්නිවේදන විසඳුම් ඇතුළත් රටේ ජාතික ඩිජිටල් ක්‍රියා පිළිවෙත මෙහෙයවීම සඳහා රාජ්‍ය ආයතන සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ හවුල් වීමේ ක්‍රම ද බැංකුව ගවේෂණය කරයි.

ප්‍රජා සහභාගීත්වය

බැංකුව තම දිගුකාලීන තිරසාර න්‍යාය පත්‍රය, මෙහෙවර සහ ආයතනික වටිනාකම්වලට ව්‍යාපෘති පෙළ ගැසී ඇති බව සහතික කරමින් ආයතනික සමාජ ආයෝජන සඳහා උපායමාර්ගික ප්‍රවේශයක් අනුගමනය කරයි. තිරසාර සංවර්ධන ඉලක්ක වලට අනුකූල වන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සපයන ඇගැයීම් ආකෘතියක් හරහා ව්‍යාපෘති අනුමත කරනු ලබන අතර එමඟින් අර්ථවත් හා දිගුකාලීන වෙනසක් ඇති කිරීම අරමුණු කරයි. සම්පත් ඵලදායී ලෙස යෙදවීම සහ ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම සහතික කිරීම සඳහා අඛණ්ඩ පදනමක් මත ව්‍යාපෘති බැංකුවේ තිරසාරත්ව ඒකකය මඟින් අධීක්ෂණය කරනු ලැබේ.

වර්ෂය තුළ බැංකුවේ ප්‍රජා සහභාගීත්ව ව්‍යාපෘතිවල ප්‍රගතිය පහත සාරාංශගත කර ඇත.

4 ගුණාත්මක අධ්‍යාපනය

ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයට සහය වීම

බැංකුවේ ආයතනික සමාජ වගකීම් න්‍යාය පත්‍රයේ ප්‍රධාන අංශයක් ලෙස, ලංකා බැංකුවේ අඛණ්ඩ ශිෂ්‍යත්ව වැඩසටහන් සහ අධ්‍යාපන වැඩසටහන් හරහා දරුවන්ගේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයට සහය දක්වයි. වර්ෂය තුළ සිසුන් 2,339 කට වැඩි සිසුන් පිරිසක් අපගේ ශිෂ්‍යත්ව වැඩසටහන් වලින් ප්‍රතිලාභ ලබා ඇත. මේ අතර උසස් අධ්‍යාපනය සඳහා අපගේ පොළී රහිත අධ්‍යාපන ණය යෝජනා ක්‍රමය මඟින් වර්ෂය තුළ රු. මිලියන 812.5 ක් ලබා දී ඇත. වසංගත කාලය තුළ දරුවන්ට ඔවුන්ගේ අධ්‍යාපනය දිගටම කරගෙන යාමට සහය වීම සඳහා රූපවාහිනිය සහ බැංකුවේ යූ ටියුබ් නාලිකාව ඔස්සේ අධ්‍යාපන සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා ප්‍රමුඛ පෙළේ උපදේශකවරුන් සමඟ ද බැංකුව හවුල් විය.

'නැණපය' ශිෂ්‍යත්ව උසස් පෙළ ඉහළ දස්කම් දක්වන සිසුන් උදෙසා ඔවුන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් අරමුදල් සැපයීම සඳහා මාසික දීමනා	ශිෂ්‍යත්ව 252 ක් රු. මිලියන 9.9 කි
'නැණපය' සහ ගුරුතලාව උසස් පෙළ අධ්‍යාපනික සම්මන්ත්‍රණ මාලාව උසස් පෙළ සම්මන්ත්‍රණ සිංහල සහ දෙමළ භාෂාවෙන් යූ ටියුබ් සහ රූපවාහිනිය ඔස්සේ	සම්මන්ත්‍රණ 95
'හපනා' රන් කැකුළු ගිණුම් හිමියන් සඳහා 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව	ශිෂ්‍යත්ව 2,087 ක් රු. මිලියන 31.3 ක්
ලංකා බැංකුව සහ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව එක්ව සංවිධානය කළ 'රන් කැකුළු ස්මාර්ට් විදුනැණ' සම්මන්ත්‍රණ මාලාව සහ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය පෙනී සිටින සිසුන්ට උපකාර කිරීම සඳහා ජන මාධ්‍ය ඔස්සේ සිදු කළ අනෙකුත් පස්වන ශ්‍රේණියේ සම්මන්ත්‍රණ වැඩසටහන්	සම්මන්ත්‍රණ 211
'රන් කැකුළු ස්මාර්ට් හපනා' අධ්‍යාපනික සම්මන්ත්‍රණ මාලාව සිංහල සහ දෙමළ භාෂා වලින් යූ ටියුබ් හි අධ්‍යාපන වැඩසටහන්	සම්මන්ත්‍රණ 4
සීමාවාසික පුහුණු වැඩසටහන අවසන් කළ විශ්වවිද්‍යාල සිසුන් සහ පාසල් අධ්‍යාපනය නිම කළ සිසුන් සඳහා වසර තුළ නිකුත් කරන ලද සහතික පත්	ප්‍රතිලාභීන් 2,253 ක්

3 නීරෝගී බව සහ යහපැවැත්ම

කොවිඩ්-19 ට එරෙහිව සටන් කිරීම

රජයේ චින්නත් කිරීමේ ව්‍යාපාරයට මූල්‍ය සම්පාදනය කිරීමේ දී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරමින් වසංගතය මැඩපැවැත්වීමේ ප්‍රයත්නයන්හි දී බැංකුව රජයට අඛණ්ඩව සහයෝගය ලබා දුන්නේය. මේ අතර, අපගේ ආයතනික සමාජ වගකීම මුලපිරීම්වල කොටසක් ලෙස, අපි සෞඛ්‍ය අමාත්‍යාංශය, ඩයලොග් ආයතනය සහ වේව්නෙට් ඉන්ටර්නැෂනල් පුද්ගලික ආයතනය සමඟ හවුල් වී කොවිඩ් රෝගීන් ලෙස හඳුනාගත් එහෙත් රෝග ලක්ෂණ නොමැති හෝ මද රෝග ලක්ෂණ ඇති නිවාසගත රෝගීන් උදෙසා සත්කාර කළමනාකරණය කිරීම සඳහා ඩිජිටල් මූලපිරීම් සහිත ඒකාබද්ධ සෞඛ්‍ය උපදේශන සේවය වනම් ජාතික 1390 කොවිඩ් 19 නිවාස මූලික ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පිහිටුවීමට කටයුතු කළෙමු.

5 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය

කාන්තා සවිබල ගැන්වීම

ප්‍රගතිශීලී ප්‍රතිපත්ති සහ භාවිතයන් හරහා අපගේම සේවා ස්ථානයේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීමට අමතරව (වැඩිදුර තොරතුරු සඳහා 70 පිටුව බලන්න), අපි කාන්තාවන්ට ඔවුන්ගේ පුද්ගලික සහ ව්‍යාපාර ආශ්‍රිත මූල්‍ය අවශ්‍යතා සපුරාලන පරිදි සකස් කරන ලද මූල්‍ය සේවාවන් පිරිනැමීමෙන් අඛණ්ඩව ඔවුන්ව සවිබල ගන්වන්නෙමු.

වර්ෂය තුළ ලංකා බැංකුව 'කාන්තා රන් ගිණුම්' 161,031 ක් විවෘත කර ඇත.

2021 වර්ෂය තුළදී කාන්තාවන් සඳහා රු. බිලියන 86.7 ක ණය ප්‍රදානය කොට ඇත.

පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ

රට සහ ප්‍රජාව

පරිසරය සුරැකීම සඳහා කැපවීම

පුළුල් භූගෝලීය ව්‍යාප්තියක් සහ අසමසම ගනුදෙනුකාර ප්‍රවේශයක් ඇති බැංකුවක් ලෙස, අපගේ මෙහෙයුම් සඳහා පරිසර හිතකාමී භාවිතයන් ඇතුළත් කිරීම පමණක් නොව, සමාජය පුරා තිරසාර භාවිතයන් ප්‍රවර්ධනය කිරීම මගින්, ජාතික කාබන් පියසටහන අඩු කිරීමට දායක වීමට අපට කළ හැකි කාර්යභාරය පිළිබඳව අපි දැනුවත්ය.

අපගේ මෙහෙයුම් මත වන පාරිසරික බලපෑම් අවම කිරීම



සූර්ය බලශක්තිය භාවිතා වන ශාඛා

පුද්ගලයන් සහ ව්‍යාපාර සමඟ අපගේ ක්‍රියාත්මකවීම් හරහා අපගේ මෙහෙයුම්වල පාරිසරික බලපෑම් අවම කිරීම, ෆොසිල ඉන්ධන මත යැපීම අඩුකරමින් සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ශාඛා සහ අපගේ මෙහෙයුම් ස්ථාන හරහා වඩාත් බලශක්ති කාර්යක්ෂම ක්‍රියාවලීන් අනුගමනය කරමින් බැංකුව තුළ වැඩි බලශක්ති කාර්යක්ෂමතාවයක් ඇති කිරීම කරා අපි දිගටම කටයුතු කරමු. ශාඛා සූර්ය ශක්තිය මත ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2021 වසර අවසන් වන විට ශාඛා 51 ක් සූර්යබල ශාඛා බවට පත් කර ඇත. තවද ISO 14064-1 ප්‍රමිතිය මත පදනම්ව අපි අපගේ හරිතාගාර වායු වීමෝචනය ගණනය කිරීම සඳහා දිගටම කැපවන්නෙමු.

සූර්යබල ශාඛා

51

නිෂ්පාදනය කරන ලද පුනර්ජනනීය බලශක්තිය

මෙගා වොට් පැය 1,757.5

බලශක්ති පරිභෝජනය	2021	2020	% වෙනස් වීම
විදුලිය (මෙගා වොට් පැය)	24,861.4	18,514	34
ඉන්ධන (ලීටර්)	808,735.2	420,337	92
සූර්ය බලශක්තිය (මෙගා වොට් පැය)	1,758	2,122	(17)

12

හරිත ගොඩනැගිලි සහතිකය ලබා ඇති ශාඛා සංඛ්‍යාව

7%

පුනර්ජනනීය බලශක්තිය මගින් සපුරාලන බලශක්ති අවශ්‍යතාව

හරිතාගාර වායු විමෝචන



*බැංකුව 2020 සිට කාණ්ඩ 3 හරිතාගාර වායු විමෝචන තක්සේරුව ආරම්භ කළේය



කඩදාසි පරිභෝජනය අඩු කිරීම

ලේඛන කළමනාකරණ පද්ධතිය සහ කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය වැනි ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය සහ ගනුදෙනුකරුවන් ඩිජිටල් නාලිකා වෙත හුරු කිරීම, මාර්ගගත පහසුකම් මඟින් ඉල්ලුම්පත් යොමු කිරීමේ පහසුකම් ආදියත් සහ ප්‍රතිචක්‍රීකරණ ප්‍රයත්නයන් කෙරෙහි අපගේ තිරසාර අවධානයක් යොමු කිරීම වැනි ක්‍රියාවලි හරහා කඩදාසි පරිභෝජනය අඩු කිරීමට අපගේ නිරන්තර උත්සාහයන් අප විසින් පෙන්නුම් කරයි.

ෆොසිල ඉන්ධන මත අපගේ යැපීම අඩුකරමින් සහ අපගේ මෙහෙයුම් මධ්‍යස්ථාන හරහා වඩාත් බලශක්ති කාර්යක්ෂම ක්‍රියාවලීන් අනුගමනය කිරීමෙන් බැංකුව තුළ වැඩි බලශක්ති කාර්යක්ෂමතාවයක් කරා අපි දිගටම ගමන් කරමු.

වගකීම් සහගත අපද්‍රව්‍ය කළමනාකරණය

පාවිච්චි කරන ලද කඩදාසි සහ විද්‍යුත් අපද්‍රව්‍ය බැංකුවේ මෙහෙයුම් මඟින් ජනනය වන ප්‍රධාන අපද්‍රව්‍ය වර්ග වේ. නාස්තිය අවම කිරීම සහ අපද්‍රව්‍ය වගකීමෙන් බැහැර කිරීම පිළිබඳව අපි දැනුවත් කිරීම් දිගටම සිදුකරන්නෙමු. එමෙන්ම අප විසින් භාවිතා කරන ලද කඩදාසි සහ විද්‍යුත් අපද්‍රව්‍ය ලියාපදිංචි ප්‍රතිචක්‍රීකරණ ආයතන හරහා ප්‍රතිචක්‍රීකරණය කෙරේ.

වගකීම් සහගත ණය දීම්

අපගේ ණය දීමේ තීරණවලට පාරිසරික සලකා බැලීම් ඇතුළත් කර ඇති බව අපි සහතික කරන අතර හරිත මූල්‍ය ණය මාර්ග ගණනාවක් හරහා පරිසර හිතකාමී ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම දිගටම කරගෙන යන්නෙමු. දැනට තෝරාගත් ණය කාණ්ඩවලට අදාළ වන විස්තීරණ පාරිසරික සහ සමාජ කළමනාකරණ පද්ධති ප්‍රතිපත්තියකට අනුව අරමුදල් සපයන ආයතන සහ ආයතනවල පාරිසරික සහ සමාජ බලපෑම් කළමනාකරණ අවශ්‍යතා දැඩි ලෙස පිළිපැද ඇත. අනෙකුත් ණය සඳහා ද මෙම තක්සේරුව ව්‍යාප්ත කිරීම සඳහා වර්ෂය තුළ කැපවූ වැඩකයක් පිහිටුවීම බැංකුව මේ සම්බන්ධයෙන් ලැබූ තව ජයග්‍රාහී පියවරකි. සියලුම වාණිජ ණය සඳහා පාරිසරික හා සමාජ කළමනාකරණ පද්ධතිය පදනම් කරගත් ඇගැයීම ව්‍යාප්ත කිරීමේ නියමු ව්‍යාපෘතියක් ද අපි ආරම්භ කළෙමු. වර්ෂය තුළ පාරිසරික හා සමාජීය නිර්ණායක සඳහා ණය පහසුකම් 832 ක් පරීක්ෂා කරන ලදී.

7 දැරිය හැකි පිවිතුරු බලශක්තිය

හරිත ණය දීම

බැංකුව පුනර්ජනනීය බලශක්ති අංශයට අඛණ්ඩව ණය ලබා දෙන අතර ගෘහස්ථ සහ වාණිජ පරිශීලකයින් අතර පුනර්ජනනීය බලශක්ති භාවිතය දිරිමත් කිරීම සඳහා සහනදායී ණය අරමුදල් ව්‍යාපෘති කිහිපයක් සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතනයක් ලෙසද කටයුතු කරයි. වර්ෂය තුළ මෙම ව්‍යාපෘති හරහා ලබා දුන් මුළු ණය ප්‍රමාණය රු. මිලියන 675.5 කි. මේ අතර, 2021 දෙසැම්බර් 31 අවසන් වන විට, පුනර්ජනනීය බලශක්ති අංශය සඳහා බැංකුවේ මුළු ණය ප්‍රමාණය රු. බිලියන 1.2 ඉක්මවයි.

'හරිත අරණ' වැඩසටහන

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා එක්ව ක්‍රියාත්මක 'හරිත අරණ' වැඩසටහන මඟින් හබරණ හුරුළු සංරක්ෂණ වනාන්තරයේ ගස් 80,000 ක් සිටුවා විනාශ වූ වනාන්තර අක්කර 100 ක් ජීවනය කිරීම මෙම වැඩසටහනේ අරමුණයි. වර්ෂය තුළ දැනටමත් රෝපණය කර ඇති ගස් පෝෂණය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 11.0 ක් ආයෝජනය කරන ලදී. ජාතික වන ආවරණයට හෙක්ටයාර 2,889 ක් එක් කිරීමට ඉලක්ක කර ඇති රජයේ 'වන රෝපා' වැඩසටහනට මෙම වැඩසටහන ද රුකුලක් වේ.

ඉදිරි වසර සඳහා සැලසුම්

සමාජයේ සියලුම කොටස් සඳහා තිරසාර සමාජ-ආර්ථික සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් වටිනාකම් නිර්මාණය කිරීම පිළිබඳ දිගුකාලීන දැක්මක් අපි සතු වන්නෙමු. මේ සඳහා අපි අපගේ බැංකුව තුළ සහ පුළුල් ප්‍රජාවන් තුළ පාරිසරික තිරසාරභාවය ප්‍රවාරණය කරන අතරම රජයේ සංවර්ධන ප්‍රයත්නයන් සඳහා අඛණ්ඩව සහය දෙන්නෙමු. ප්‍රධාන සමාජ ගැටලු විසඳීමට සහ අපගේ ප්‍රජාවන් තුළ අර්ථවත් වෙනසක් ඇති කිරීමට අපි ආයතනික සමාජ වගකීම් සඳහා උපායමාර්ගික ආයෝජනයන් දිගටම කරගෙන යන්නෙමු.

පරිසර කැපවීම

අපගේ මෙහෙයුම්

- හරිත ශාඛා සහ සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ශාඛා
- ISO 14064-1 ප්‍රමිතියට අනුව හරිතාගාර වායු තක්සේරුව
- ස්වයංක්‍රීයකරණය හරහා කඩදාසි පරිභෝජනය අඩු කිරීම

වගකීම් සහගත ණය දීම්

- ණය අනුමත කිරීමේ තීරණවලදී පාරිසරික නිර්ණායක තක්සේරු කිරීම මඟින් ණය කළඹ හරිතකරණය
- හරිත ව්‍යාපාර සඳහා අරමුදල් සැපයීම

පාරිසරික ආයතනික සමාජ වගකීම්

- BoC 'හරිත අරණ'

ඉවතලන කඩදාසි



මෙ. ටොන් 14.0

ප්‍රතිචක්‍රීකරණය කරන ලද කඩදාසි



පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ

ව්‍යාපාරික හවුල්කරුවන්

ලංකා බැංකුවෙහි සැපයුම් දාමය දේශීය හා ජාත්‍යන්තර සැපයුම්කරුවන්ගෙන් සමන්විත වන අතර ඔවුන් තොරතුරු තාක්ෂණ උපකරණ, ලිපි ද්‍රව්‍ය සහ අනෙකුත් ද්‍රව්‍ය මෙන්ම මෙහෙයුම්වල අඛණ්ඩ පැවැත්ම සඳහා අවශ්‍ය විවිධ සේවාවන් සපයන සේවා සපයන්නන්ගෙන් ද සමන්විත වේ.

ව්‍යාපාරික හවුල්කරුවන්ගේ අවශ්‍යතා සඳහා සවන් දීම

සම්බන්ධ වීමේ වේදිකා

- අඛණ්ඩ ලිඛිත සන්නිවේදනය
- නිතිපතා රැස්වීම්
- ලංසු තැබීමේ ක්‍රියාවලි
- කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික වාර්තා

අවශ්‍යතා

- විනිවිදභාවයෙන් යුත් ප්‍රසම්පාදන ක්‍රියාවලි සහ තරඟකාරී මිලකරණය
- ගනුදෙනු කිරීමේ පහසුව
- වේකඟ වූ කාල අනුව ගෙවීම්
- ස්ථිර සහ පුරෝකථනය කළ හැකි ඉල්ලුම

ප්‍රතිචාර දක්වන ආකාරය

- සැපයුම්කරුවන් 484 ක් (දේශීය සැපයුම්කරුවන් 454 ක් සහ ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි සමාගම් 30 ක්)
- සැපයුම්කරුවන්ට රු. බිලියන 12.2 ක ගෙවීම්
- විනිවිදභාවයෙන් යුත් තෝරා ගැනීමේ සහ තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය
- ගෙවීම් පැහැර හැරීම් නොමැත
- ප්‍රසම්පාදන ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය

රජයේ ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය මත පදනම්ව සකස් කර ඇති බැංකුවේ විස්තීරණ ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය මඟින් ප්‍රසම්පාදන ආශ්‍රිත කාර්යයන් මෙහෙයවනු ලබන අතර, එය දේපළ හා ප්‍රසම්පාදන අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ.

වර්ෂය තුළ බැංකුව සැපයුම්කරුවන් හට වටිනාකම් නිර්මාණය කිරීමේ ප්‍රධාන අංග පහත දැක්වේ.

සැපයුම්කරුවන් විගණනය

මූලික පාරිසරික සහ සමාජීය ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා බැංකුව සැපයුම්කරුවන්ගේ ස්ථානීය විගණන සිදු කරයි; 2021 දී එවැනි එක් විගණනයක් පවත්වන ලදී. නිශ්චිත ISO ප්‍රමිතීන්, සාධාරණ ශ්‍රම පරිචයන්, බලශක්ති සුරැකීමේ ක්‍රම භාවිතයන් සහ ප්‍රතිචක්‍රීකරණ භාවිතයන් සමඟ අනුකූල වීම පිළිබඳ නිර්ණායක මෙයට ඇතුළත් වේ.

2021 දී ළමා/ බලහත්කාර ශ්‍රමය සම්බන්ධ සිදුවීම් හෝ සාමූහික කේවල් කිරීම සහ නිදහස සඳහා වූ අයිතිවාසිකම් අහිමි වීමේ සිද්ධීන් කිසිවක් වාර්තා වී නැත.

සැපයුම්කරුවන්ට ගෙවීම්



අනෙකුත් ව්‍යාපාරික හවුල්කරුවන්

විදේශීය නියෝජිත සම්බන්ධතා සහ විදේශ මුදල් හුවමාරු මධ්‍යස්ථාන	බැංකුවේ ප්‍රේෂණ මෙහෙයුම් සඳහා සහය දක්වමින් විදේශ ස්ථානවල වෙළඳපළ සම්බන්ධතාව සඳහා පහසුකම් සපයයි
මාර්ගගත ගෙවීම් ද්වාරය සහ POS යන්ත්‍ර සඳහා වන නියෝජිත ජාලය	පුළුල් වූ වෙළඳ ප්‍රජාවන් සඳහා ප්‍රවේශය ලබා දෙමින් ගනුදෙනුකරුවන් හට අඟය නිර්මාණය
BOC CONNECT නියෝජිත ජාලය	ගනුදෙනුකරුවන්ට ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කිරීම හරහා අපගේ සේවාවේ ප්‍රවේශය පුළුල් කරයි
ගෙවීම් කාඩ්පත් හවුල්කරුවන්	ලොව පුරා වෙළඳපළ ගනුදෙනු පියවීම් සඳහා වන පුළුල් වෙළඳ නියෝජිත ජාල හරහා මුදල් ආපසු ගැනීම් සහ ගෙවීම් සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම හරහා ගනුදෙනුකරුවන්ට අපගේ සේවාවන් පුළුල් කිරීම

ක්ෂේත්‍රය තුළ හවුල්කාරිත්වය

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බැංකුව ලෙස, ලංකා බැංකුව ක්ෂේත්‍රය නියෝජනය කරන සංගම්වල ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරමින් වඩා සුවිසල් සහ හිතකර මූල්‍ය පද්ධතියක් ගොඩනැගීම පිළිබඳ සංවාදයට පහසුකම් සපයයි. බැංකුව පහත සංගම්වල සාමාජිකත්වය දරයි.

- ආසියානු පැසිෆික් ග්‍රාමීය හා කෘෂිකාර්මික ණය සංගමය
- ශ්‍රී ලංකා බැංකු අනුකූලතා නිලධාරීන්ගේ සංගමය
- ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ අවදානම් වෘත්තිකයන්ගේ සංගමය
- ශ්‍රී ලංකා නීතිඥ සංගමය
- බයෝ ඩයිවර්සිටි ආයතනය - ශ්‍රී ලංකාව
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
- ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය - ශ්‍රී ලංකාව
- සීමාසහිත ශ්‍රී ලංකා බැංකු සංගමය
- ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය
- ලංකා වාණිජ මණ්ඩලය
- ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් (සීමාසහිත) සමාගම



නියාමකයින්

බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව ඇතුළු එහි ප්‍රධාන නියාමකයින් සමඟ සහයෝගී සබඳතාවයක් පවත්වාගෙන යනු ලබයි.

නියාමකයින්ගේ අවශ්‍යතා සඳහා සවන්දීම

සම්බන්ධවීමේ වේදිකා

- නියාමන වාර්තාකරණය (අඛණ්ඩව)
- පුද්ගලික රැස්වීම් (අඛණ්ඩව)
- කර්මාන්ත සංසද හරහා සාකච්ඡා (අඛණ්ඩව)
- වාර්ෂික වාර්තාව සහ අනෙකුත් ප්‍රකාශන (අඛණ්ඩව)

අවශ්‍යතා

- ව්‍යාපාර සහ ආර්ථික පුනර්ජීවනයට සහය වීම
- මූල්‍ය ක්ෂේත්‍රය කෙරෙහි විශ්වාසය තබා ගැනීම
- ශක්තිමත් පාලනය සහ අවදානම් කළමනාකරණ භාවිතයන්
- මූල්‍ය ඇතුළත් කිරීම සඳහා පහසුකම් සැලසීම

ප්‍රතිචාර දක්වන ආකාරය

- කාලෝචිත වාර්තාකරණය සහ ප්‍රමාණවත් හෙළිදරව් කිරීම්
- සියලුම රෙගුලාසි/ මාර්ගෝපදේශ සමඟ පූර්ණ අනුකූල වීම
- අවධානයට ලක්විය හැකි කොටස් සඳහා අනිවාර්ය ණය දීමේ අවශ්‍යතා පිළිපැදීම
- දැඩි බලපෑමට ලක් වූ අංශ සඳහා අඛණ්ඩ සහය
- අඛණ්ඩතාව සහ ක්ෂේත්‍රයේ සහයෝගිතාවය පවත්වා ගැනීම

අපි විසින් නියාමකයින් සමඟ ක්‍රියාශීලී සහ විනිවිද භාවයෙන් යුතුව කටයුතු කිරීමට අදාළ රෙගුලාසි සහ මාර්ගෝපදේශවලට පූර්ණ අනුකූලතාව සහතික කිරීම, බැංකුවේ අවදානම් පැතිකඩ ඵලදායී ලෙස කළමනාකරණය සහ ශ්‍රී ලංකාව තුළ හිතකර සහ තිරසාර බැංකු කර්මාන්තයක් නිර්මාණය කිරීමේ සාමූහික ප්‍රයත්නයන් සඳහා සහය වී ඇත.

සමාලෝචනයට ලක්වන වර්ෂය තුළ බැංකුව නියාමකයින් සමඟ ඇති සබඳතාවයේ ප්‍රධාන අංග පහත සාරාංශගත කර ඇත:

2021 වර්ෂයේදී නිකුත් කරන ලද නව නියෝග, රෙගුලාසි සහ මාර්ගෝපදේශවලට අනුකූල වීම. ප්‍රධාන කරුණු පහත වේ.

- පවතින නිරෝධායන ඇඳිරි නීතිය අතරතුර බැංකු සේවා සැපයීම සඳහා අවශ්‍ය විධිවිධාන
- බාසල් III රෙගුලාසි යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ උපදෙස්
- ශ්‍රී ලංකාවේ විදේශ විනිමය තත්ත්වය රැක ගැනීම අරමුණු කරගත් විදේශ විනිමය රෙගුලාසි
- ණය සහන කාලය දීර්ඝ කිරීම සහ කොවිඩ්-19 බලපෑමට ලක් වූ ව්‍යාපාර සඳහා සහන
- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට සහ කෘෂිකාර්මික අංශයට ප්‍රමුඛ අංශ යටතේ ණය දීමේ ඉලක්ක
- තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා නියාමන රාමුව
- ණය ගැතියන්ට විරෙහිව අයකර ගැනීමේ ක්‍රියාමාර්ග කල් දැමීම

මුදල් නෝට්ටු අවම සමාජයක් වෙත සංක්‍රමණය වීමේ ශ්‍රී ලංකා මහ බැංකුවෙ හි අපේක්ෂාව සඳහා ක්‍රියාකාරී දායකත්වය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකා ක්ලියර් පුද්ගලික ආයතනය සහ බලපත්‍රලාභී මූල්‍ය ආයතන සමඟ සහයෝගිතාවයෙන් මුදල් නෝට්ටු අවම සමාජයක් වෙත සංක්‍රමණය වීම තුළින් රට තුළ මූල්‍ය ඇතුළත් කිරීම් ඉහළ නැංවීමේ අරමුණින් ජාතික වැඩසටහනක් වන 'රට පුරාම ලංකා QR' දියත් කරන ලදී. ලංකා QR සහතික ලත් මූල්‍ය ආයතනවල ගෙවීම් යෙදුම් භාවිතයෙන් ගනුදෙනුකරුවන්ට නොමිලේ ගෙවීම් කිරීමට මෙම වේදිකාව මඟින් හැකියාව ලැබේ. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බැංකුව ලෙස, විශාලතම ගනුදෙනුකාර පදනමකට සේවා සපයන ලංකා බැංකුව මිලියන 14 කට අධික ගනුදෙනුකාර පදනමක් සහිතව මෙම අභිලාෂය සඳහා අත්‍යවශ්‍ය දායකත්වයක් සපයයි.

තිරසාර මූල්‍යනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ග සිතියමට අනුව පෙළගැසීම

ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍යනය සඳහා වූ මාර්ග සිතියම 2019 දී දියත් කරන ලද්දේ හරිත, දේශගුණික හිතකාමී සහ සමාජීය වශයෙන් වැදගත් වන ව්‍යාපාරවලට සහය වන අතරම, නැගී එන පාරිසරික හා සමාජ පාලන අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා මූල්‍ය ආයතනවලට සහය වීමේ අරමුණ ඇතිවය. දිගුකාලීනව මෙය තිරසාර ආකාරයකින් වර්ධන අපේක්ෂාවන් කරා ගමන් කරන අතරම මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ. ලංකා බැංකුවෙ හි තිරසාර උපායමාර්ගය තිරසාර මූල්‍යනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ග සිතියමට අනුකූලව සකස් කර ඇති අතර මාර්ග සිතියමේ සෑම අංශයකම අත්කර ගත් ප්‍රගතිය පහත සාරාංශගත කර ඇත.

පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ

නියාමකයින්

තිරසාර ණය දීම

- සහයෝගිතා මූල්‍ය ආයතනයක් ලෙස අරමුදල් මාර්ග හරහා සහ බැංකුවේම අරමුදල් තුළින් ලබා දෙන ණය සහන හරහා පියස් මත සූර්ය පැනල සවිකිරීම ඇතුළු පුනර්ජනනීය බලශක්ති භාවිතය බැංකුව ප්‍රවර්ධනය කරයි.
- 'BOC මිතුරු' ක්ෂුද්‍ර මූල්‍යකරණ මුලපිරීම හරහා ලංකා බැංකුව අඩු වරප්‍රසාද ලත් ප්‍රජාවන්හි ව්‍යවසායක ව්‍යාපාර සඳහා ණය දෙයි.
- බැංකුව කාන්තා ව්‍යවසායකයින් ඉලක්ක කරගනිමින් කැපවූ ණය සහ ආයෝජන නිෂ්පාදන කිහිපයක් ක්‍රියාත්මක කරයි.
- හරිත ව්‍යාපාර භාවිතයන් සහ හරිත ප්‍රවාහනය ප්‍රවර්ධනය කිරීම සඳහා බැංකුව විසින් ණය යෝජනා ක්‍රම කිහිපයක් ද පිරිනමයි උදා: දැනට ක්‍රියාත්මක වන කාබනික පොහොර නිෂ්පාදනය සඳහා 'BOC සශ්‍රීක' ණය යෝජනා ක්‍රමය.

පාරිසරික සමාජීය සහ පාලනවිධි ඒකාබද්ධකරණය

- ගෝලීය වාර්තාකරණ මුලපිරීම් අනුගමනය කිරීම හරහා ඉහළ වැදගත්කමක් සහිත පාරිසරික සහ සමාජීය පාලන මාතෘකා හෙළිදරව් කිරීම සඳහා තිරසාර වාර්තාකරණය සඳහා වන ප්‍රමිති සහ ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලයේ ඒකාබද්ධ වාර්තාකරණ (IR) රාමුව භාවිතා කිරීම.
- බැංකුවේ ණය දීමේ කළඹ හා සම්බන්ධ පාරිසරික හා සමාජීය අවදානම් කල්තියා හඳුනාගෙන කළමනාකරණය කිරීම සඳහා ණය තක්සේරුව සඳහා වූ විස්තීර්ණ පරිසර සහ සමාජ කළමනාකරණ පද්ධති ප්‍රතිපත්තිය.
- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය යටතේ පිහිටුවා ඇති පාරිසරික සහ සමාජීය අවදානම් කළමනාකරණ ඒකකය.

මූල්‍ය ඇතුළත් කිරීම

- රට පුරා ගනුදෙනුකාර සම්බන්ධතා ස්ථාන 2,061 ක අසමසම ප්‍රවේශයක් හරහා ප්‍රවේශ වීමේ හැකියාව.
- ග්‍රාමීය අංශය ඉලක්ක කර ගනිමින් BOC CONNECT නව සේවා නාලිකාව දියත් කිරීම.
- විශේෂ ණය පහසුකම් හරහා අඩු පහසුකම් සහිත ප්‍රජාවන් වෙත අරමුදල් යොමු කිරීම.
  - ක්ෂුද්‍ර මූල්‍ය අංශය සඳහා ණය ප්‍රධානයන් 39,451 ක් හරහා රු. බිලියන 16.0 ක්.

හැකියාවන් ගොඩනැගීම

- බැංකුවේ තිරසාර ප්‍රතිපත්තිය එළිදැක්වීමෙන් පසුව, ණය නිලධාරීන් ඇතුළු තෝරාගත් සේවකයින් සඳහා පාරිසරික සහ සමාජීය පාලන සම්බන්ධ පුහුණුව බැංකුව අඛණ්ඩව ලබා දෙයි.
- තිරසාරත්ව ඒකකයේ සේවකයින් දෙදෙනෙකු ISO/IEC 17024:2012: තිරසාර කළමනාකරුගේ විෂය පථය සඳහා පුද්ගලයින් සහතික කිරීම යටතේ 'සහතික කළ තිරසාර කළමනාකරු' තත්ත්ව සහතිකය ලබා ගෙන ඇත.
- බැංකුවේ කැපවූ තිරසාර ඒකකය සමාජ හා පාරිසරික දැනුවත්භාවය පිළිබඳ සංස්කෘතියක් ප්‍රචාරණය කිරීමේදී සියලු මට්ටම් වල ක්‍රියාකාරී කණ්ඩායම් සමඟ අඛණ්ඩව කටයුතු කරයි.

සම්මාන

සමස්ත කාර්යසාධන තුළ විශිෂ්ටත්වය

වසරේ බැංකුව - ශ්‍රී ලංකාව
- "ද බැන්කර්"

2021 වසරේ ප්‍රමුඛම බැංකු දහස අතර
ශ්‍රී ලංකාවේ අංක 01 බැංකුව
- "ද බැන්කර්"

වාර්තාකරණයේ විශිෂ්ටත්වය

ස්වර්ණ සම්මානය - රාජ්‍ය බැංකු අංශයේ හොඳම වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ 57 වැනි වාර්ෂික වාර්තා සම්මාන 2021

වටිනාකම් නිර්මාණය පිළිබඳ හොඳම හෙළිදරව් කිරීම
– "CMA විශිෂ්ටතා සමෝධානික වාර්තාකරණ සම්මාන 2021"

හොඳම සමෝධානික වාර්තාව (රාජ්‍ය අංශයේ ව්‍යාපාර)
– "CMA විශිෂ්ටතා සමෝධානික වාර්තාකරණ සම්මාන 2021"

හොඳම සමෝධානික වාර්තා දහය අතර
– "CMA විශිෂ්ටතා සමෝධානික වාර්තාකරණ සම්මාන 2021"

සන්නාම කාර්යසාධන තුළ විශිෂ්ටත්වය

වඩාත් වටිනාම බැංකු සන්නාමය අඛණ්ඩව 13 වන වරටත්
- "බ්‍රෑන්ඩ් ෆිනෑන්ස්"

වසරේ, ජනතාවගේ බැංකු සේවා සැපයුම්කරු -
ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය
- නීල්සන් පීපල්ස් සම්මාන 2021

කළමනාකරණයේ විශිෂ්ටත්වය

හොඳම ජයග්‍රාහකයින් දසදෙනා - හොඳම කළමනාකරණ පරිචයන් සඳහා වන සම්මාන - "නව සාමාන්‍යකරණය යටතේ නැවත ව්‍යාපාරයන්ට යොමුවීම" - ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනය

මානව සම්පත් කළමනාකරණයේ විශිෂ්ටත්වය

මානව සම්පත් හි හොඳම සේවා සපයන්නා -
ආසියානු මානව සම්පත් නායකත්ව සම්මාන

සේවය කිරීමට හොඳම මානව සම්පත් සංවිධානය
- 2022 වසරේ ගෝලීය මානව සම්පත් විශිෂ්ටතා සම්මාන

ආයතනික යහපාලනය



ආයතනික යහපාලනය පිළිබඳ සභාපතිතුමාගේ පණිවිඩය

2021 වර්ෂය තුළ කොවිඩ්-19 ගෝලීය වසංගතය විසින් නිර්මිත නිරන්තර අභියෝග විශේෂයෙන් රටේ ආර්ථික පුනර්ජීවය කෙරෙහි ලංකා බැංකුවේ උපකාරක භූමිකාව තුළ අනුවර්තනය හා සුවලාභීතාවයේ වැදගත්කම ශක්තිමත් කළේය. මේ පසුබිමේ, අධ්‍යක්ෂ මණ්ඩලය මූලික වශයෙන් සිය අවධානය යොමු කරන ලද්දේ රටේ ආර්ථික පුනර්ජීවනය කෙරෙහි දිරිය සපයමින් මූල්‍ය කාර්යඵලය හා බැංකුවේ ස්ථාවරත්වය රඳවා ගන්නා අතරවාරයේ අපගේ කාර්ය මණ්ඩලය, ගනුදෙනුකරුවන් හා සෙසු පාර්ශ්වකරුවන්ගේ යහපැවැත්ම සුරැකීම සඳහාය.

වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය නොවෙනස්ව පැවතුන අතර එමඟින් මෙකී අර්බුදකාරී කාලසීමාව තුළ උපායමාර්ගික සංගතිය හා ස්ථාවරත්වය ඇතිකරන ලදී. අපි 2021 වර්ෂය තුළ පවත්වන ලද ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 26 ක් සමඟින් අපේ කටයුතු තුළ ගැඹුරින් නිමග්න වූයෙමු. (සම්බන්ධවීමේ වපසරිය ශක්තිමත් කළෙමු) මේ ඔස්සේ මෙහෙයුම් පරිසරය තුළ වෙනස්වීම් සේම බැංකුවේ අඟය නිර්මාණයෙහි ලා විභවාත්මක සහසම්බන්ධතා හා යාවත්කාලීන වන්නට ද අධ්‍යක්ෂ මණ්ඩලය බලාත්මක කෙරුණේය. අධ්‍යක්ෂ මණ්ඩලය, වර්ෂය තුළ නව පාරිසරික හා සමාජීය කළමනාකරණ පද්ධතියක් ඇඟයීමට ලක් කොට ක්‍රියාත්මක කළ අතර, එමඟින් ණය ඇඟයුම් ක්‍රියාදාමය තුළට සමාජීය හා පාරිසරික නිර්නායක කාවැද්දීම සඳහා අවශ්‍ය මෙවලම් හා මඟ පෙන්වීම් පැහැදිලිව විදහා දක්වනු ලැබිණ. ඩිජිටල්කරණය ලංකා බැංකුවේ ප්‍රධාන උපායමාර්ගික අංශයක් ලෙස තවදුරටත් පවතින අතර, අපි ගත වූ වර්ෂය තුළ නව ඩිජිටල් පිරිනැමුම් හා සේවා කිහිපයක්ම ඇඟැයුම් කොට අනුමත කළෙමු. මතුවෙමින් පවත්නා වර්ධනයන් හා සමඟ උපායමාර්ගික පෙළගැස්වීම් තහවුරු කරනු සඳහා මෙන්ම ණය, මෙහෙයුම් හා සයිබර් ආරක්ෂාව හා බැඳි අවදානම් කෙරේ විශේෂිත අවධානය දක්වමින් බැංකුවේ අවදානම් පැතිකඩ මත විභව්‍ය බලපෑම් සමාලෝචනය කෙරෙහි ද ප්‍රමුඛතාවය යොමු කරනු ලැබීය.

අනුකූලතාවය

මෙම වාර්තාව, යහපාලනය මත පරිචය වල්ලේ අපගේ ප්‍රවේශය, අධ්‍යක්ෂ මණ්ඩලය 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ ආකාරය හා වර්ෂය තුළ සිය කර්තව්‍යයන් ඉෂ්ට කළ අන්දම විදහා පෙන්වයි. එය බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වන 2007 අංක 11 දරණ බැංකු පනතේ නියෝග යටතේ, ආයතනික යහපාලන රෙගුලාසි හා අනුකූලත්වයේ තත්ත්වයද ප්‍රදර්ශනය කරයි. බැංකුව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් 2017 දෙසැම්බර් මස නිකුත් කළ ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ සංග්‍රහයට අදාළ සංශෝධනයන්ද ස්වේච්ඡාවෙන් පිළිපැද තිබේ.

ඉදිරි ගමන්මඟ

ශ්‍රී ලංකාව, 2022 වර්ෂයේ දී කොතෙකුත් අභියෝගයනට මුහුණ දෙන අතරවාරයේ, ලංකා බැංකුව රටේ ව්‍යවසායකයන් සඳහා උපකාරක සේවා සැපයීමට මෙන්ම එහි ආර්ථික පුනරුදය ගාමනය කිරීම සඳහාද කැපවී සිටී. එය අපගේ වෙළඳපළ ස්ථාපනය හා ශ්‍රී ලංකාව තුළ සමාජ - ආර්ථික බලගැන්වීම ධාවනය කරනු සඳහා ඇති අසමසම විහිදුම තෝලනය කරනු වස් මං පෙත් සොයන්නට දිගින් දිගටම නිරතවන අතරේ රටේ ප්‍රමුඛතම බැංකුව වශයෙන් අප සාඩම්බරව, වගකීම් සහගතව වැළඳගන්නා භූමිකාවක් වේ.



කාංචන රත්වත්තේ
සභාපති
2022 පෙබරවාරි 24
කොළඹ දීය.

යහපාලන දර්ශනය හා රාමුව

ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ හා අප මෙහෙයුම් කටයුතු සිදු කරන සමාජ වපසරිය තුළ මූලිකයකු වශයෙන්, අපගේ විවිධාකාර පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා තුලනය කරන අතරේ රටේ බැංකු ක්‍රමයේ සුමට පැවැත්ම තහවුරු කෙරෙන අයුරින් කටයුතු කිරීම අපගේ කාර්යභාරය වන බව හඳුනාගෙන ඇත්තෙමු. ඩිජිටල් විසඳුම් තුළින් බලගැන්වූ අනාගතයට සරිලන ආයතනයක් ලෙස පරිවර්තනය වීමේ බැංකුවේ අපේක්ෂාවන්, අපගේ යහපාලන චින්තනය, අපගේ උපායමාර්ග හා බැඳුණු අවදානම් වටහා ගැනීම කෙරේ වන සහයෝගය, සම්පත් බෙදාහැරීම් කළමනාකරණය හා තිරසර අගය නිර්මාණය යන කරුණු විසින් තහවුරු කෙරේ.

නියාමන අවශ්‍යතා සහ ප්‍රශස්ත ජාත්‍යන්තර පරිචයන් හා අනුගත වන අතරේ අපගේ යහපාලන ප්‍රතිපත්ති රාමුව බැංකුවේ පාර්ශ්වකරුවන්ගේ විවිධාකාර අවශ්‍යතා සපුරාලන්නට උත්සුක වන්නා සේම විශේෂයෙන් රජය සතු, පද්ධතිමය වශයෙන් සැලකිය යුතු බැංකුවක් ලෙස අපගේ පිළිගැනීම මත, කෙටි හා දිගු කාලීන ප්‍රතිඵල අතර සමතුලිතයක් ඇති කරන්නට ද කටයුතු කරන්නෙමු.

නායකත්වයේ මූලික වගකීම්

- උපායමාර්ගික දිශානතිය සකස්කොට, එහි ප්‍රගතිය පිළිබඳ සුපරීක්ෂණය සැපයීම
- ශක්තිමත් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති රාමු ස්ථාපිත කිරීම.
- බැංකුවේ කීර්තිනාමය ආරක්ෂා කිරීම
- රෙගුලාසි, ප්‍රතිපත්ති, ප්‍රමිති හා පිළිවෙත් වල්ලේ අනුකූලතාවය සහතික කිරීම.

යහපාලන ප්‍රතිපත්ති රාමුවේ මූලිකාංග

- ප්‍රජාව
- අභිමතාර්ථ
- ක්‍රියාවලි
- කාර්යසාධනය

තහවුරු කරනු ලබන්නේ

නියාමන රාමුව

- 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත (ආඥා පනත සේ හඳුන්වනු ලබන) හා ඊට අදාළ සංශෝධන
- 1988 අංක 30 දරණ බැංකු පනත හා පසුකාලීන සංශෝධන
- බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ආයතනික යහපාලනය පිළිබඳ 2007 අංක 11 දරණ බැංකු පනත් නියෝගය
- කොළඹ කොටස් හුවමාරුවේ අඛණ්ඩ ලැයිස්තුගත කිරීම් අවශ්‍යතා
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් 2017 දෙසැම්බර් මස නිකුත් කළ ආයතනික යහපාලනය පිළිබඳ හොඳම පරිචයන්,
- 2021 අංක 19 දරණ සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත.

අභ්‍යන්තර මඟ පෙන්වීම්

- අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය
- උපකමිටු ප්‍රඥප්ති
- අධ්‍යක්ෂවරුන් සඳහා ව්‍යාපාර චර්යාව හා ආචාරධර්ම සංග්‍රහය
- සර්වග්‍රාහී පිළිවෙත් හා ප්‍රතිපත්ති
- පරිපාලිත සමාගම් කළමනාකරණ ප්‍රඥප්තිය
- ගනුදෙනුකාර ප්‍රඥප්තිය
- මානව සම්පත් හා මානව සැලසුම්
- ක්‍රමෝපායික සහ ආයතනික සැලසුම්
- අවදානම් කළමනාකරණය
- තොරතුරු තාක්ෂණය සහ සයිබර් ආරක්ෂා පාලනය
- කාර්ය මණ්ඩල ආචාරධර්ම සංග්‍රහය

ආයතනික වටිනාකම්

- ගනුදෙනුකාර කේන්ද්‍රීය බව
- අප ආයතනය හා බැඳුනු විවිධ ජන කණ්ඩායම්හි විවිධත්වයට ගරු කිරීම.
- ඉතා උසස් තත්ත්වයේ ආචාරධර්ම පිළිපැදීම සහ වෘත්තීය පරිසරයක් ස්ථාපනය සඳහා කැපවීම.
- නම්‍යශීලී සහ නවෝත්පාදන පරිසරයක් ප්‍රවර්ධනය කිරීම.
- අපගේ සෑම ක්‍රියාකාරකමක් සඳහාම වගවීම.

පාර්ශ්වකාර ක්‍රියාකාරකම්

- ගනුදෙනුකරුවන්
- අපගේ සේවකයින්
- කොටස් හිමියා හා අරමුදල් සපයන්නන්
- රට හා ප්‍රජාව
- නියාමකයින්
- ව්‍යාපාරික හවුල්කරුවන්

ආයතනික යහපාලනය

යහපාලන ප්‍රතිඵල හා 2021 වර්ෂයේ කැපී පෙනෙන සිදුවීම්

2021 වර්ෂය තුළ දී බැංකුවට පෙර නොවූ විරූ අභියෝගයන්ට මුහුණ දීමට සිදුවූයේ කොවිඩ්-19 සහ ගනුදෙනුකරුවන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව මෙන්ම රාජ්‍ය මූල්‍ය හා සාර්ව ආර්ථික පරිසරය කෙරේ එමගින් වූ බලපෑම් හේතුකොට ගෙනය. සිය ගනුදෙනුකරුවන් හා සෙසු පාර්ශ්වකරුවන් වෙත විසඳුම් ඉදිරිපත් කරලීමෙහි ලා ඉක්මනින් හා තීක්ෂණ ලෙසින් කටයුතු කිරීම ලංකා බැංකුව වෙතින් අපේක්ෂා කරන ලද්දෙන් අපේ යහපාලන ක්‍රියාවලීන්හි ශක්තිමත් බව හා දැඩි විනිශ්චය, අවසන් පරීක්ෂණයට බඳුන් කරනු ලැබීය. අධ්‍යක්ෂ මණ්ඩලය එහි සුපරීක්ෂක වගකීම් ඉටු කළේ, අධ්‍යක්ෂකවරුන්ගේ කාර්යාවලියේ ගැඹුර වර්ධනය කරමින්, අවදානම් කළමනාකරණ පරිචයන් ශක්තිමත් කරමින් හා මෙහෙයුම් පරිසරය පූර්ව ක්‍රියාකාරී ලෙසින් නිරීක්ෂණය කරමිනි.

කොවිඩ්-19 කෙරේ ප්‍රතිචාරයන්

අධ්‍යක්ෂ මණ්ඩලය සිය කටයුතු අතථ්‍ය ලෙස ක්‍රියාත්මක කිරීම කරා සාර්ථක ලෙස සංක්‍රමණය විය. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල හා උපකමිටු රැස්වීම් ඩිජිටල් මාධ්‍යයෙන් සිදු කෙරුණි. ගෝලීය වසංගතය, පාර්ශ්වකරුවන්, කාර්යසාධනය හා මෙහෙයුම් මත කළ බලපෑම කෙරේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු කොට බැංකුවේ ප්‍රතිචාරය මත උචිත සුපරීක්ෂණය සහතික කළේය.

උපායමාර්ගික සුපරීක්ෂණය

වාර්ෂික උපායමාර්ගික වැඩමුළුව වර්ෂය තුළ අතථ්‍ය ලෙසින් පවත්වන ලද අතර කෙටි හා මධ්‍ය කාලීන ඉලක්ක හා ක්‍රියාකාරී සැලසුම් වෙළඳපල පරිසරය අනුව යමින් සංශෝධනය කෙරුණේය. අධ්‍යක්ෂ මණ්ඩලය, කාර්යඵලය, ආයතනික සැලසුම් විල්ලේ සමාලෝචනය කළේය.

පාරිසරික හා සමාජීය තිරසරභාවය

බැංකුව සිය පාරිසරික හා සමාජීය කළමනාකරණ පද්ධතිය වර්ෂය තුළ දී සමාලෝචනය කළ අතර බැංකුවේ පාරිසරික හා සමාජ පරීක්ෂණ පරිචයන් තවදුරටත් ශක්තිමත් කෙරුණේ, 2022 වන විට සියළුම ව්‍යාපෘති මූල්‍යකරණ පහසුකම් මේ ඔස්සේ පරීක්ෂා කිරීමට ඇතුළත් වන සේ ආවරණය පුළුල් කිරීම සඳහා වන සැලසුම් සමගිනි.

අවදානම් කළමනාකරණය

ඉහළ අවදානම් මට්ටමක් සහිත කර්මාන්ත හඳුනා ගැනීම හා විචක්ෂණශීලී ප්‍රතිපාදන ඇතුළුව අදාළ ප්‍රතිපත්ති සමාලෝචනය හා සංශෝධනය ඔස්සේ ණය අවදානම් කළමනාකරණය ශක්තිමත් කරනු ලැබීය. එතෙර ශාඛා වලට අදාළ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සමාලෝචනය කොට යළි සකසනු ලැබීය.

යහපාලන ව්‍යුහය

අධ්‍යක්ෂ මණ්ඩලය, තමන් වෙත විමධ්‍යගත කර ඇති සෙසු කරුණු අතර විගණනය, නාමයෝජනා, පාරිශ්‍රමික, අවදානම් කළමනාකරණය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඇතුළත් කරුණු අරභයා සුපරීක්ෂණ වගකීම සහිත උපකමිටු මගින් සහය ලබයි. මේ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයට උපායමාර්ගික න්‍යාය පත්‍ර කරුණු කෙරේ සිය කාලය මිඩංගු කරන්නට හැකි වේ. ඒ ඒ කමිටු සභාපතිවරයා විසින් තමන්ට අදාළ කමිටු වල කටයුතු හා නිර්දේශ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී වාර්තා කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය එය අනුමත කරයි. බැංකුවේ එදිනෙදා කළමනාකරණය, මහා කළමනාකරු විසින් නායකත්වය සපයන කළමනාකරණ කණ්ඩායම වෙත පවරා ඇත. විශේෂිත වගකීම් හා පැහැදිලිව නිර්වචනය කළ බලපැවරුම් සහිත (අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු හා විධායක කමිටු පිළිබඳ වැඩිදුර විස්තර සඳහා පිටු අංක 88 වෙත යොමු වන්න) විධායක තලයේ කමිටු කිහිපයක්ම ස්ථාපිත කර ඇත. යහපාලන ව්‍යුහය පහත දැක්වෙන සටහනෙහි දැක්වේ.



යහපාලන ප්‍රවේශය

වර්ෂය තුළ යහපාලන පරිචයන් හා ප්‍රතිඵල විස්තර කරලීම සඳහා බැංකුවේ යහපාලන ප්‍රතිපත්ති රාමුවේ පහත දැක්වෙන ප්‍රධාන සාධකයන් හතර උපයෝගී කරගෙන ඇත.



ප්‍රජාව

අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය නිපුණතා, පළපුරුද්ද හා ජනවිකාශ පැතිකඩ අනුව විවිධාකාර මිශ්‍රයක් මෙන්ම තුලනයක්ද වන අධ්‍යක්ෂවරුන් හය දෙනෙකුගෙන් සමන්විත වේ. සියළුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන තලයක කටයුතු කරන අතර හයදෙනා අතරින් පස් දෙනෙක් ස්වාධීන අධ්‍යක්ෂවරු වෙති. අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය, බැංකු ආඥා පනතේ සඳහන් කර ඇති අතර, අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ රාජ්‍ය බැංකු කටයුතු පැවරෙන අදාළ ඇමතිවරයා විසිනි. මුදල් කටයුතු භාරවන අමාත්‍යාංශයේ නියෝජිතයෙක් අධ්‍යක්ෂ මණ්ඩලය තුළ නිල බලයෙන් පත් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය වර්ෂය මුළුල්ලේම නොවෙනස්ව පැවතුනේ ඒ මඟින් අභියෝගාත්මක වසරක ඉදිරි දැක්ම, සාමූහික චින්තනය හා ප්‍රවේශය තුළ අඛණ්ඩතාවය සහතික කරලීමිනි.

භූමිකා හා වගකීම් විභේදනය

භූමිකා තුළ පැහැදිලි බව හා ඵලදායී වගකීම් විභේදනය අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය ඔස්සේ සහතික කෙරේ. එය අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව හා වගකීම් මැනවින් විදහා දක්වයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිගේ භූමිකාව, විධායක කළමනාකාරිත්වයට නායකත්වය සපයන මහා කළමනාකරුගේ භූමිකාව හා සමඟ පැහැදිලිව වෙන් කර ඇත. සභාපති, විධායක නොවන අධ්‍යක්ෂවරයකු වන අතර අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයයි. ඒ අතර, මහා කළමනාකරු විධායක නායකත්වය දරන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තනතුරක් නොදරමිණි. කිසිදු තනි අධ්‍යක්ෂවරයෙකුට තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ නිර්බාධික බලයක් හිමි නොවේ.

සභාපතිගේ භූමිකාව

- අධ්‍යක්ෂ මණ්ඩලයේ නායකත්වය දැරීම හා එහි ඵලදායිතාවය සහතික කිරීම.
- සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ ඵලදායී සහභාගීත්වය සඳහා පහසුකම් සැලසීම.
- කොටස්හිමියා වන ශ්‍රී ලංකා රජය සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගෙන යාම.
- සියළුම අධ්‍යක්ෂවරුන් වෙත ප්‍රමාණවත් තොරතුරු සැපයෙන බවට වග බලා ගැනීම.
- ඉහළම තලයේ ආචාරධර්ම සංස්කෘතියක් ඉහළම පාලන තන්ත්‍රයේ සිට ස්ථාපිත කිරීම.

මහා කළමනාකරුගේ භූමිකාව

- බැංකුවේ ආයතනික සැලැස්ම තුළ විළි දක්වා ඇති උපායමාර්ගික න්‍යාය පත්‍රය, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවන ලද මූල්‍ය හා මූල්‍ය නොවන ඉලක්ක හා අනුගත වෙමින් ක්‍රියාවට නැංවීම.
- බැංකුවේ කාර්යසාධනය පසු විපරම් කොට අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.
- බැංකුව අනුමත අවදානම් අභිරුචිය තුළ මෙහෙයුම් කටයුතු කරන බවට සහතික වීම.

අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රමිතිය

6 විධායක නොවන අධ්‍යක්ෂකවරු

5 ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු

නිපුණතා පැතිකඩ

මූල්‍ය හා ගණකාධිකරණ	බැංකුකරණය	රාජ්‍ය සේවය
අධ්‍යක්ෂ මණ්ඩලයේ 50%	අධ්‍යක්ෂ මණ්ඩලයේ 33%	අධ්‍යක්ෂ මණ්ඩලයේ 83%

තොරතුරු තාක්ෂණය හා විදුලි සංදේශ සේවා	නීතිය
අධ්‍යක්ෂ මණ්ඩලයේ 33%	අධ්‍යක්ෂ මණ්ඩලයේ 17%

වයස් පරාසය



අවුරුදු 45- 55 | අවුරුදු 56- 65 | අවුරුදු 66 ට වැඩි

ආයතනික යහපාලනය

ස්වාධීනත්ව තක්සේරුව

අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය තක්සේරු කරනුයේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන නියෝග මත පදනම් වෙමිනි. මේ සඳහා අවශ්‍ය කෙරෙන ප්‍රකාශන ලබා ගනු ලැබේ. 2021 වර්ෂය අවසානය වන විට, කාංචන රත්වත්තේ, ජී හර්ෂ විජයවර්ධන, ඒ සී මහිල්ක ප්‍රනාන්දු, විශ්‍රාමික මේජර් ජෙනරාල් ජී ඒ චන්ද්‍රසිරි හා ජයම්පති මොල්ලිගොඩ යන මහත්වරු ස්වාධීන බැව් නිගමනය කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම හා මූලික දැනුවත් කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම් කරනුයේ රාජ්‍ය බැංකු සඳහා වගකීම් දරණ අමාත්‍යවරයා විසිනි. අපේක්ෂිත යෝග්‍යතාව හා උචිත බව පිළිබඳ නිර්ණායක කරා ඵලඹ ඇත්නම්, ශ්‍රී ලංකා මහ බැංකුව, එසේ සිදු කරන ලද පත් කිරීම් අනුමත කරයි. 2021 අංක 19 දරණ, නව සුරැකුම්පත් හා විනිමය කොමිසම් පනත හා සමඟ, අධ්‍යක්ෂ මණ්ඩලයට කරන පත්කිරීම් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම විසින් ද තවදුරටත් අනුමත කළ යුතුය. අධ්‍යක්ෂවරුන්ගේ ඉල්ලා අස්වීම් හා ඉවත් කිරීම් ද පෙර කී අමාත්‍යවරයා වෙතටම යොමු කරනු ලබන අතර, එබඳු අධ්‍යක්ෂ මණ්ඩල වෙනස්වීම් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවට හා ශ්‍රී ලංකා සුරැකුම් පත් හා විනිමය කොමිසම වෙත ද විධිමත්ව දන්වනු ලැබේ.

අධ්‍යක්ෂ පුහුණු කිරීම්

සිය වගකීම් ඵලදායී ලෙසින් මුදා හැරීම උදෙසා අවශ්‍ය දැනුම අත්පත් කර ගැනීම වෙනුවෙන් පුහුණු පාඨමාලාවන්ට සහභාගි වන්නට අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව සලසා ඇත. සැබෑ ලෙසම, එය තුළ අදාළ නීති හා රෙගුලාසි මත දැනුම, ප්‍රමිති හා ප්‍රඥප්ති මත වෙනස්වීම් හා මෙහෙයුම් වපසරිය තුළ මතුවෙමින් පවත්නා උපනතීන් විල්ලේ නැවුම්කරණ වැඩ සටහන් ඇතුළත් වෙයි. වර්ෂය තුළ පැවති තත්ත්වය මත අධ්‍යක්ෂවරුන් සහභාගි වූයේ එකම එක බාහිර පුහුණුවීම් වැඩ සටහනකට පමණි. එසේ වුවද, පහත දැක්වෙන යාන්ත්‍රණ අධ්‍යක්ෂ මණ්ඩලය අදාළ වර්ධනයන් පිළිබඳව යාවත්කාලීන කෙරෙන බව සහතික කළේය.

- අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ආරාධනයෙන් සහභාගිවන කළමනාකරණ කාණ්ඩායම් සමඟ සක්‍රීය සහභාගිත්වය.
- අධ්‍යක්ෂ මණ්ඩල සංදේශ සහ අනෙකුත් අදාළ තොරතුරු ඉලෙක්ට්‍රොනික් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා පද්ධතියක් ඔස්සේ සංසරණය.

ස්වාධීන වෘත්තීය උපදෙස් සඳහා අධ්‍යක්ෂවරුන්ට ප්‍රවේශය සැලසීමේ ප්‍රතිපත්තිය, බැංකුවේ පිරිවැය තුළින් බාහිර විශේෂඥ යෙදවුම් ලබා ගැනීමට අවස්ථාවක් බිහි කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා හඳුන්වාදීමේ වැඩසටහන්

සියළුම නව අධ්‍යක්ෂවරුන්ට බැංකුවේ යහපාලන ප්‍රතිපත්ති රාමුව, සංස්කෘතිය හා වටිනාකම්, ව්‍යූහය, මෙහෙයුම් හා උපායමාර්ග පිළිබඳව යොමු කෙරෙන මැනවින් සැකසූ හඳුන්වාදීමක් ලැබේ.

හඳුන්වාදීමේ සමස්ත වැඩ පිළිවෙළ තුළ බැංකුව පිළිබඳ දළ විශ්ලේෂණය, යහපාලන ප්‍රතිපත්ති රාමුව පිළිබඳ විස්තරාත්මක තොරතුරු (ව්‍යූහයන්, ප්‍රතිපත්ති වැනි දෑ) නියාමන රෙගුලාසි, ප්‍රතිපත්ති රාමු හා ආයතනික කළමනාකාරිත්ව කණ්ඩායම පිළිබඳ විස්තරාත්මක තොරතුරු මෙන්ම සෙසු දෑ අතර අධ්‍යක්ෂ මණ්ඩල උපකාරක ප්‍රතිපත්ති රාමුව යන අංග ඇතුලත් වේ.

බැංකුවේ ඉතිහාසය, ව්‍යාපාර ආකෘතිය, ආයතනික ව්‍යුහය, ව්‍යාපාරික අංශ වෙළඳපළ හා උපකාරක කාර්යයන් විත්‍රහ කෙරෙන මහා කළමනාකරුගේ ඉදිරිපත් කිරීම.

අවශ්‍යතාව/ ඉල්ලීම මත සැලැසුම් කෙරෙන සම්මුඛ සාකච්ඡා හා එක් එක් අංශ නිරීක්ෂණය

ක්‍රියාවලි

ඵලදායී නායකත්වය හා පාලනය සහතික කරමින් ඒ අතරේ, වගකීම්, විනිවිදභාවය හා අවංකභාවය ප්‍රවලිත කරවන අධ්‍යක්ෂ මණ්ඩල පිළිවෙත් හි විස්තරාත්මක තොරතුරු පහත විදහා දක්වනු ලැබේ.

ප්‍රතිපත්ති රාමුව

සර්වග්‍රාහී ප්‍රතිපත්ති රාමුවක්, උපායමාර්ගික හා මෙහෙයුම් අංශ විල්ලේ සංගත පිළියම් සහතික කරන අතර, එය වාරානුකූලව සමාලෝචනය කොට සංශෝධනය කරනුයේ වෙනස්වන අභ්‍යන්තර හා බාහිර ගතිකයන් කෙරේ අදාළ වන බව තහවුරු කරමිනි. මෙම ප්‍රතිපත්ති රාමුව තුළ සෙසු දෑ සමඟ මානව සම්පත් හා බැඳුණු අංශ, අවදානම් කළමනාකරණය, යහපාලනය හා අධ්‍යක්ෂ මණ්ඩල පිළිවෙත් හා ඩිජිටල් ආයෝජන අන්තර්ගත වේ. අධ්‍යක්ෂ මණ්ඩලය 2021 වර්ෂයේ දී සංශෝධිත පාරිසරික හා සමාජ තිරසර පැවැත්ම කළමනාකරණ පද්ධතිය අනුමත කළේය. මෙයට අමතරව, බැංකුව පහත දැක්වෙන ප්‍රධාන පෙළේ ප්‍රතිපත්ති කිහිපයක්ම සංශෝධනය කළේය.

හඳුන්වා දුන්/සංශෝධනය කළ ප්‍රධාන පෙළේ ප්‍රතිපත්ති

අවදානම් කළමනාකරණය
- ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- රට සඳහා වන අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- ආතති පිරික්සුම් ප්‍රතිපත්තිය
- අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණාත්මකතා ඇගැයීම් පිළිවෙත හෙවත් ICAAP ප්‍රතිපත්තිය
- මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- වංචා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

මානව කළමනාකරණය
- පුහුණු කිරීම් හා සංවර්ධන ප්‍රතිපත්තිය
- බඳවා ගැනීම් ක්‍රියාවලිය
- මානව සම්පත් ප්‍රතිපත්තිය

තොරතුරු තාක්ෂණය
- ඊ-අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය
- තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය

තිරසර පැවැත්ම
- පාරිසරික හා සමාජීය කළමනාකරණ ප්‍රතිපත්තිය
- යහපාලන ප්‍රතිපත්තිය
- ගනුදෙනුකාර පැමිණිලි පිළිබඳව කටයුතු කිරීමේ ප්‍රතිපත්තිය හා පිළිවෙත්

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු කෙරෙහි බැඳුණු වගකීම් හා පිළිවෙත් උපකමිටු යොමු කිරීමේ අනුදේශ තුළ විදහා දැක්වෙන අතර පහතින් සාරාංශගත කොට ඇත. උපකමිටු සභාපතිවරු ඒවායේ ඵලදායී ක්‍රියාත්මකවීම පිළිබඳව වග වන අතර කමිටුව විසින් ඉටුකරන ලද කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරති. ගත වූ වසර තුළ සියළුම උපකමිටුවල විෂයපථය සමාලෝචනය/ සංශෝධනය කරන ලදී.

විගණන කමිටුව

බල පැවරුම

අභ්‍යන්තර පාලනය, බාහිර හා අභ්‍යන්තර විගණනය ඇතුළුව, බැංකුවේ මූල්‍ය වාර්තාකරණය සමාලෝචනය කරයි. (කමිටු වාර්තාව සඳහා 93 පිටුව බලන්න)

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව

බල පැවරුම

තොරතුරු තාක්ෂණ නිමැවුම්, සේවා, ප්‍රතිපත්ති, පරිචයන් හා තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන යටිතල පහසුකම් මත සුපරීක්ෂණ වගකීම. (කමිටු වාර්තාව සඳහා 98 පිටුව බලන්න)

නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව

බල පැවරුම

ජ්‍යේෂ්ඨ කලමනාකාරිත්ව තනතුරු සඳහා තෝරාගැනීම/ පත්කිරීම උදෙසා පිළිවෙත් ක්‍රියාත්මක කිරීම, ආචාරධර්ම චර්යා පද්ධතිය හා ආයතනික යහපාලන පරිචයන් සඳහා වගකීම.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

බල පැවරුම

ණය, වෙළඳපළ, මෙහෙයුම්, ද්‍රවශීලතා, සයිබර්/ තොරතුරු තාක්ෂණය, උපායමාර්ගික, පාරිසරික හා සමාජීය යහපාලනය ඇතුළුව අවදානම් කළමනාකරණ වගකීම, අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති රාමුව හා අනුගතවීම තහවුරු කිරීම, නීති හා රෙගුලාසි ව්‍යුත්පන්න අනුකූලතාවය සහතික කිරීම (කමිටු වාර්තාව සඳහා පිටු අංක 94 බලන්න)

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

බල පැවරුම

පාරිශ්‍රමික ප්‍රතිපත්තිය, අරමුණු ස්ථාපිත කිරීම හා ප්‍රධාන කළමනාකරණ පිරිසගේ කාර්යඵල ඇගැයුම් සහ බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්තිය නිශ්චය කිරීම. (කමිටු වාර්තාව සඳහා 96 පිටුව බලන්න)

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවලට අමතරව, තීරණාත්මක ඉසව් තුළ දෛනික කළමනාකරණ කටයුතු සඳහා විධායක මට්ටමේ කමිටු කිහිපයක්ම ස්ථාපිත කර ඇත.

විධායක කමිටු

වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව (ALCO)	ශාඛා අංශයේ ණය කමිටුව	ව්‍යාපාරික අඛණ්ඩතා සම්බන්ධීකරණ කමිටුව	ව්‍යාපාරික අඛණ්ඩතා ක්‍රියාත්මක කිරීමේ කමිටුව	ව්‍යාපාරික අඛණ්ඩතා කළමනාකරණ විකල්ප කමිටුව (BCMAC)
මෙහෙයුම් අලාභ පිළිබඳව කමිටුව	ආයතනික තොරතුරු ආරක්ෂණ කමිටුව	ආයතනික කළමනාකරණ කමිටුව	ආයතනික උපායමාර්ග සමාලෝචන කමිටුව	ණය කමිටුව
හානි තක්සේරු කරන හා ප්‍රතිෂ්ඨාපන කමිටුව (DARC)	මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුව	නිෂ්ක්‍රීය වත්කම් කමිටුව	අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලි මෙහෙයුම් කමිටුව	ආයෝජන කමිටුව
රාජ්‍ය සුරැකුම්පත් හි ආයෝජන පිළිබඳ කමිටුව	තොරතුරු තාක්ෂණ මෙහෙයවීම් කමිටුව	අළෙවිකරණ කමිටුව	අක්‍රීය වත්කම් සමාලෝචන කමිටුව (NPAC)	මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව
ප්‍රතිලාභ සහ ඇගැයීම් ප්‍රතිපත්ති කමිටුව (HRPC)	ශිෂ්‍යත්ව වැඩසටහන් තේරීමේ කමිටුව (සමාලෝචන කමිටුව)	ශිෂ්‍යත්ව කමිටුව	තිරසාර කමිටුව	TVBOC මෙහෙයුම් කමිටුව
තාක්ෂණ හා මෙහෙයුම් කමිටුව	TVBOC හි ක්‍රියාකාරී කමිටුව			

අවදානම් සුපරීක්ෂණය

බැංකුවේ අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති රාමු මත අධ්‍යක්ෂ මණ්ඩලය සුපරීක්ෂණය සපයන අතර ප්‍රතිපත්ති රාමු සඳහා ස්ථිරසාර පදනමක් සැකසීමෙහි ලා වගකීම දරයි. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) හා විගණන කමිටුව, ඒහි අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණ වගකීම් ඉටු කිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ. වසර තුළ පැවති වාතාවරණය හමුවේ, අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ ණය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය වෙත ඉහළින්ම අවධානය යොමු කරන ලදී. වර්ෂය තුළ අවදානම් කළමනාකරණය හා බැඳුණු සෙසු ක්‍රියාවලින් මේ සමඟ දක්වා ඇත.

අවදානම් හා බැඳුණු ක්‍රියාවලින්

1. බැංකුවේ අවදානම් අභිරුචිය අනුමත කිරීම.
2. බැංකුව අභිමුඛ ඇති ප්‍රධානතම අවදානම්, නිරන්තරව ඇගැයීම.
3. IRMC රැස්වීම් තුළ දී අවදානම් අභිරුචි හා කාර්යසාධනය, නිශ්චය කළ පරාමිතීන් විල්ලේ සමාලෝචනය.
4. මෙකී අවදානම් කෙරේ ඵලදායී ලෙසින් මුහුණදෙනු උදෙසා අවශ්‍ය සැලසුම් සන්තකයේ ඇති බව තහවුරු කිරීම.

ආයතනික යහපාලනය

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

2021 වර්ෂය තුළ පැවති වාතාවරණය හමුවේ වුවද අධ්‍යක්ෂ මණ්ඩලය වාරානුකූලව හමුවන ලදී. බහුතරයක් අධ්‍යක්ෂ මණ්ඩල හා උපකමිටු රැස්වීම් අතථ්‍ය පදනමින් සිදු කෙරුණේ නිරන්තරව රට අගුළු දැමීම් හමුවේ ක්‍රියාකාරිත්වයේ අඛණ්ඩතාවය සහතික කරලමිනි. ලංකා බැංකුවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් රැස්වීම් න්‍යාය පත්‍රය සැකසීම, තොරතුරු සංසරණය, රැස්වීම් පැවැත්වීම හා රැස්වීම් වාර්තා පවත්වාගෙන යාම තුළ සියලු පිළිවෙත් නියමාකාරයෙන් ඉටු කරලන බවට සහතික වේ. න්‍යාය පත්‍ර සැකසීමෙහිදී අධ්‍යක්ෂ මණ්ඩලය, උපායමාර්ගික සැලසුම්, අවදානම් කළමනාකරණය, අනුකූලතාවය හා යහපාලන සංසිද්ධීන් බඳු තීරණාත්මක කරුණු කෙරෙහි ප්‍රමාණවත් කාලයක් වෙන් කරන බවට වග බලා ගැනීම තහවුරු කරනු ලැබේ. වර්ෂය තුළ දී, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 26 ක් හා උපකමිටු රැස්වීම් 36 ක් පවත්වනු ලැබීය.

වර්ෂය ආරම්භය	න්‍යාය පත්‍රය	අධ්‍යක්ෂ මණ්ඩල සංදේශ සැකසීම හා සංසරණය	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	පශ්චාත් රැස්වීම් ක්‍රියාමාර්ග
අධ්‍යක්ෂ මණ්ඩල හා උපකමිටු රැස්වීම් උදෙසා කාල සටහන සකසා වාර්ෂික දින දර්ශකයක් මඟින් අධ්‍යක්ෂවරුන් වෙත දන්වනු ලැබේ.	ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් න්‍යාය පත්‍රය සකසා සභාපතිතුමාගේ අනුමැතිය ලබා ගනී. අධ්‍යක්ෂවරුන්ට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් තුළ න්‍යාය පත්‍රයට යෝජනා ඉදිරිපත් කිරීමට නිදහස් අභිමතය ඇති අතර අභ්‍යන්තර/ බාහිර වර්ධනයන් මඟින් ඉස්මතුවන කරුණු න්‍යාය පත්‍රයට ඇතුළත් කළ හැකිය.	අධ්‍යක්ෂ මණ්ඩල සංදේශ සකස් කොට සුරක්ෂිත ද්වාරයක් ඔස්සේ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් අධ්‍යක්ෂවරුන් වෙත සංසරණය කෙරෙනුයේ සාකච්ඡාවට බඳුන් කෙරෙන කරුණු සමාලෝචනය කරන්නට හා අවශ්‍ය නම් අතිරේක කරුණු පැහැදිලි කිරීම් ලබාගන්නට ප්‍රමාණවත් කාලයක් සහතික කරමිනි.	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් තුළ, කාර්යඵල යාවත්කාලීන කිරීම්, සහ පාලන කටයුතු හා අවදානම් වාර්තා ඇතුළුව උපකමිටුවල නිර්දේශ බඳු කිසියම්, සම්මත අයිතම අඩංගු වේ. අතිරේක පැහැදිලි කිරීම් අවශ්‍ය වේ නම්, කළමනාකාරිත්ව කණ්ඩායම් සාමාජිකයන් ආරාධනය කොට කැඳවනු ලැබේ.	ලංකා බැංකුවේ/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් රැස්වීම් වාර්තා සකස් කොට, රැස්වීම පවත්වා දින 10 ක් ඇතුළත එය සුරක්ෂිත ඩිජිටල් විසඳුමක් ඔස්සේ අධ්‍යක්ෂවරුන් අතර සංසරණය කරලයි. කෙටුම්පත් වාර්තා, ඊළඟ රැස්වීමට පෙර දින ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය අතර බෙදාහරිනු ලැබෙයි. වාර්තා, ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සම්මත කරනු ලැබේ. තවමත් අවධානය යොමු කර නැති කරුණු සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාමාර්ග ගැනේ.

අධ්‍යක්ෂ මණ්ඩල/ උපකමිටු රැස්වීම්වල සහභාගීත්වය පහත සටහනින් පෙන්නුම් කෙරේ

	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	විගණන කමිටු රැස්වීම්	මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු රැස්වීම්	නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටු රැස්වීම්	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම්	තොරතුරු තාක්ෂණ කමිටු රැස්වීම්	මානව සම්පත් කමිටුව, හා පාරිශ්‍රමික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවේ ඒකාබද්ධ රැස්වීම්
	26	6	5	8	8	9	1
කාංචන රත්වත්තේ මහතා සභාපති, ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	26/26	-	-	-	-	-	-
ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ	26/26	6/6	5/5	8/8	8/8	-	1/1
ජී හර්ෂ විජයවර්ධන මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	26/26	6/6	-	8/8	8/8	9/9	1/1
ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	26/26	6/6	5/5	7/8	-	9/9	1/1
විශ්‍රාමික මේජර් ජෙනරාල් ජී ඒ චන්ද්‍රසිරි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	22/25	5/6	4/5	-	1/2	-	1/1
ජයම්පති මොල්ලිගොඩ මහතාෆ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	21/23	-	-	7/7	6/6	8/8	1/1

* 2021 පෙබරවාරි 18 දින අධ්‍යක්ෂ මණ්ඩලයට එක් විය.

සමාගම් ලේකම්

බැංකුවේ යහපාලන ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීමෙහිලා ලංකා බැංකුවේ/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරිය ප්‍රධාන භූමිකාවක් ඉටු කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩල පිළිවෙත්, අදාළ නීති, රීති හා රෙගුලාසි හා අනුගත වන බවට සහතික වෙයි. ලේකම්වරිය, බැංකුවේ යහපාලන ප්‍රතිපත්ති රාමුව නිරන්තරයෙන් සමාලෝචනය කරන්නේ මතුවෙමින් පවතින ප්‍රශස්ත පරිචයන්, නියාමන වෙනස්කම් හා පාර්ශ්වකරුවන්ගේ බැඳියාවන් සැලකිල්ලට ගනිමිනි. ලේකම්වරියගේ උපදෙස් හා සේවා සඳහා සියළුම අධ්‍යක්ෂවරුන්ට ප්‍රවේශය ඇත. ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස කටයුතු කරන අතර, ඇය පත් කොට ඇත්තේ බැංකු ආඥා පනත හා අදාළ සංශෝධන මඟින් පනවා ඇති අවශ්‍යතා හා අනුගතවය.

අභිමතාර්ථ

අධ්‍යක්ෂවරුන් හා කළමනාකාරීත්වයේ ක්‍රියාකාරීත්වය, ලංකා බැංකුවේ දිගු කාලීන අභිමතාර්ථ, ආයතනික වටිනාකම් හා ආචාරධර්ම පද්ධතිය හා අනුගත වන බවට සහතික වීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වෙයි. සිය වගකීම් ඉටු කරලීමේහිදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අවංක භාවයෙන්, විනිවිද බවින් හා වගවීමෙන් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරනුයේ එමගින් බැංකුවේ ඉහළම පාලන තලයේ සිටම ආචාරධර්ම සඳහා වගකීම සහතික කරමිනි.

අප කටයුතු කරන විලාසය

අපේ ඉදිරි දැක්ම

ගෝලීය බැංකුකරණයේ ශ්‍රී ලාංකික සලකුණ බවට පත්වෙමින් ගනුදෙනුකාර කේන්ද්‍රීය නව්‍ය මූල්‍ය පහසුකම් පිරිනමන ජාතියේ බැංකුකරුවා වීම.

මෙහෙවර

ගෝලීය බැංකුකරණයේ නැවුම් අත්දැකීම් අප ගනුදෙනුකාර ප්‍රජාව වෙත ළඟා කරලමින් සේවක පරිපූර්ණාත්වය මත ගොඩ නැංවූ වඩාත් කාර්යක්ෂමවූත්, නවීන තාක්ෂණවේදයන් මුසුවූත් මූල්‍ය සේවාවන් හරහා සියළු පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් උත්පාදනය කරලීම.

වටිනාකම්

ගනුදෙනුකාර කේන්ද්‍රීය වීම. → අප ආයතනය හා බැඳුණු විවිධ ජන කණ්ඩායම් හි විවිධත්වයට ගරු කිරීම. → ඉතා උසස් තත්ත්වයේ ආචාරධර්ම පිළිපැදීම් සහ වෘත්තීමය පරිසරයක ස්ථාපනය සඳහා කැපවීම. → නම්‍යශීලි සහ නවෝත්පාදන පරිසරයක් ප්‍රවර්ධනය කිරීම. → අපගේ සෑම ක්‍රියාකාරකමක් සඳහා ම වගවීම.

2021 වර්ෂයට අදාළතාවය

2020 වර්ෂය මුල් භාගයේදී, ගෝලීය වසංගතය ආරම්භ වීමත් සමඟම, බැංකුව රටේ ආර්ථිකය පණගැන්වීම සඳහා කේන්ද්‍රීය භූමිකාවක් නිරූපණය කළේ ව්‍යවසායකයන් හා රාජ්‍ය ව්‍යවසායකයන් වෙත සහය දෙමින්, මුදල් සංසරණය අඛණ්ඩව සිදු කෙරෙන බවට වගබලා ගනිමින්, හා දිවයින හාත්පස අත්‍යවශ්‍ය බැංකු සේවා සඳහා පහසුකම් සලසමිනි. සමාලෝචනයට බඳුන් වන වර්ෂය බැංකුව හුදෙක් ලාභ හඹා නොයමින් උපායමාර්ග ගනුදෙනුකරුවන් නැවත නඟා සිටුවීම හා ශක්තිමත් කරලීම කෙරෙහි වඩ වඩා කේන්ද්‍රණය කරන ලද වසරක් විය. මේ වර්ෂයේ අපේ කේන්ද්‍රීය වටිනාකමක් වන 'නම්‍යශීලි සහ නවෝත්පාදන පරිසරයක් ප්‍රවර්ධනය කිරීම' සැබැවින්ම ක්‍රියාවට නැංවිය හැකි අපගේ හැකියාවෙන්ම නිර්වචනය වූවක්ම විය.

2021 වර්ෂය තුළ ක්‍රියාකාරකම්

- පාර්ශ්වකාර බැඳියාවන් තුලනය කරමින් බහුවිධ පාර්ශ්වකරුවන් සඳහා අගය නිර්මාණය කිරීම.
- සහන කාලසීමා හා ණය සහන ඔස්සේ බලපෑමට ලක් වූ ව්‍යාපාර යළි නඟා සිටුවීම.
- නිරවද්‍යතාව හා විනිවිද බව ඇතුළත් සංස්කෘතියක් ආයතනයේ ඉහළම තලයේ සිට ප්‍රවර්ධනය කිරීම.
- ණය අවදානම් කළමනාකරණ පරිචයන් ශක්තිමත් කරලීම.
- යහපාලන ප්‍රතිපත්තියක් හඳුන්වා දෙමින් යහපාලන ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීම.
- බැංකුව තුළ කොවිඩ්-19 කාර්යසාධක බළකායක් ස්ථාපිත කිරීම.
- 2022-2024 ආයතනික සැලැස්ම හා 2022 ආයතනික අයවැය අනුමත කිරීම.
- රට තුළ කොවිඩ්-19 හා සටන් වැදීම අරමුණු කර ගනිමින් ආයතනික සමාජ සත්කාර දියත් කිරීම.
- බැංකුවේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සමාලෝචනය.

ආයතනික යහපාලනය

වටිනාකම් මත පදනම් සංස්කෘතිය

අධ්‍යක්ෂ මණ්ඩලය ඉහළම තලයේ සිට ආචාරධාර්ම වලට අනුගත වීම ස්ථාපිත කරන අතර, වටිනාකම් මත පදනම් සාරධර්ම හා අවංකභාවය ප්‍රවර්ධනය කරන සංස්කෘතියක් පෝෂණය කරන්නට දරණ කළමනාකාරිත්වයේ ආයාසයන් මත සුපරීක්ෂණය පවත්වාගෙන යයි. මෙම ප්‍රවේශය තවදුරටත් මධ්‍යගත වන්නේ ගනුදෙනුකරුවන්ට වගකීම් සහගත හා සාධාරණ ලෙසින් සැලකීමේ සංස්කෘතියක් නිර්මාණය කරමින් සහ ආචාරධර්ම පෙරදැරි කරගත් ව්‍යාපාර මෙහෙයවීමක් ඔස්සේය. පහත දැක්වෙන ප්‍රතිපත්ති රාමු, මෙබඳු සංස්කෘතියක් ප්‍රචලිත කිරීමට පහසුකම් සපයන්නේ කාර්ය මණ්ඩලයෙන් අපේක්ෂා කරනු ලබන වගකීම් සහගත, ආචාරධාර්මික හැසිරීමකට අනාගත සැලසුමක් මෙනි.

චර්යා හා ආචාරධර්ම සංග්‍රහය

අධ්‍යක්ෂවරුන්ගේ ආචාරධර්ම සංග්‍රහය

අධ්‍යක්ෂ මණ්ඩලය ව්‍යාපාරික චර්යා හා ආචාරධර්ම සංග්‍රහය සඳහා බැඳෙන අතර, ඔවුන් තමන් එම සංග්‍රහයේ විධිවිධාන හා සමඟ අනුගත වන බවට වාර්ෂික තහවුරුවක් ඉදිරිපත් කළ යුතු වෙයි. ආචාරධර්ම සංග්‍රහය අවංකභාවය, විනිවිදභාවය හා දූෂණ විරෝධී ශක්තිමත් සංස්කෘතියක් පෝෂණය කරන්නට අරමුණු කරන අතර බැංකුවේ උපරිම අභිවෘද්ධිය උදෙසා කටයුතු කිරීමට අධ්‍යක්ෂවරුන් දිරි ගන්වයි.

සේවක ප්‍රජාවගේ ආචාරධර්ම සංග්‍රහය

සමස්ත සේවක ප්‍රජාවට අදාළ වන මෙමඟින් බාහිර හා අභ්‍යන්තර පාර්ශ්වකරුවන් හා කටයුතු කිරීමේ, චර්යාවන් හා අල්ලස් හා දූෂණ පිළිබඳ කටයුතු කිරීම හා සබැඳි බැංකුවේ අපේක්ෂාවන් මැනවින් පිළිබිඹු කරයි.

'විසිල් බ්ලෝවර්' ප්‍රතිපත්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත 'විසිල් බ්ලෝවර්' ප්‍රතිපත්තිය අනුව සොරකම්/ වංචා, දූෂණ, බැංකුවේ වත්කම් අවභාවිතය හෝ ආචාරධර්ම විරෝධී හෝ අනීතික යැයි සැලකෙන වෙනත් ඕනෑම කටයුත්තක් ගැන පැමිණිලි ඉදිරිපත් කරන්නට, කාර්ය මණ්ඩල සාමාජිකයන් සේම, කාර්ය මණ්ඩල සාමාජිකයන් නොවන්නන් ද දිරිමත් කෙරේ. පැමිණිලි ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත ඉදිරිපත් කොට ඔහු විසින් සුපරීක්ෂණය කරනු ලබන අතර නියෝජ්‍ය මහා කළමනාකරු හා ඉන් ඉහළ ශ්‍රේණිවලට අයත් කාර්ය මණ්ඩලයට එරෙහි පැමිණිලි විගණන කමිටුවේ සභාපති වෙත යොමු කෙරේ.

දූෂණ විරෝධී කටයුතු

බැංකුව, අල්ලස් හා දූෂණ පිළිබඳව ශූන්‍ය දරාගැනීමේ ප්‍රවේශයක් අනුගමනය කරන අතර එහිදී සියළුම ව්‍යාපාරික ගනුදෙනු හා සබඳතා තුළ වෘත්තික වශයෙන් සාධාරණව හා අවංකභාවයෙන් යුතුව කටයුතු කිරීමට බැඳී සිටී. බැංකුව මෙහෙයුම් කටයුතු කරන සෑම ඉසව්වකම අල්ලස් පිටු දැකීම සඳහා ඵලදායී පද්ධති ක්‍රියාත්මක කොට බලගන්වනු ලබයි. බැංකුවේ අල්ලස් හා දූෂණ විරෝධී ප්‍රතිපත්තිය පිළිබඳව මූලික පත්වීමෙන් පසු පවත්වන පුහුණු වැඩසටහන් වලදී සියළුම සේවකයන් වෙත පැහැදිලිව දන්වනු ලබන අතර, එම කරුණ නිතිපතා පැවැත්වෙන පුහුණු පාඨමාලා හා දැනුවත් කිරීමේ වැඩසටහන් තුළ දී යළි යළිත් අවධාරණය කරනු ලැබේ.

සමාලෝචනයට බඳුන් වූ වසර තුළ, වංචා, අභ්‍යන්තර රහසිගත තොරතුරු නිරාවරණය වීම තුළින් වෙළඳපළ ගනුදෙනු මෙහෙයවීම, විශ්වාසය පළුදු වූ, තරඟකාරී චර්යා විරෝධී වෙළඳපළ සංවලනය, අවිපරිචය හෝ අදාළ වෙනත් මූල්‍ය වෙළඳපළ නීති හා රෙගුලාසි හා බැදුණු නීති කෘත්‍ය තුළින් ලද මූල්‍යමය අලාභ කිසිවක් වාර්තා නොවීය.

වගකීම් සහිත ආයතනික පුරවැසිභාවය

අධ්‍යක්ෂ මණ්ඩලය, ලංකා බැංකුවේ ක්‍රියාකාරකම් වගකීම් සහිත ආයතනික පුරවැසියකු ලෙස එහි තත්ත්වය කෙරෙහි කෙසේ බලපාන්නේ ද යන්න පසු විපරම් කරයි. එය අනිත් අතට බැංකුවේ නිත්‍යනුකූලභාවය හා මෙහෙයුම් කටයුතු කරන්නට ඇති සමාජීය බලපැවරුම කෙරේද බලපෑම් විල්ල කළ හැකිය. තිරසර පැවැත්ම පිළිබඳ බැංකුවේ ප්‍රවේශය, 'තිරසර පැවැත්ම ජීවන ශෛලියකි' යන කියමන මත කේන්ද්‍රගත වන අතර ආර්ථික, පාරිසරික හා සමාජීය යන මූලික මානයන් ත්‍රිත්වය ඔස්සේ ඉලක්ක ගත කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලය සමස්ත තිරසර පැවැත්ම හා බැඳුණු කරුණු මත සුපරීක්ෂණය සපයන අතර, ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම මහා කළමනාකරු විසින් සභාපතිත්වය දරණ තිරසර කමිටුව වෙත පැවරී ඇත.

වර්ෂය තුළ දී සංශෝධනය කෙරුණු බැංකුවේ පාරිසරික හා සමාජයීය කළමනාකරණ ප්‍රතිපත්තියෙහි කැපීපෙනෙන සිදුවීම්/ කරුණු පහත දක්වා ඇත.

පාරිසරික හා සමාජීය කළමනාකරණ ක්‍රියාවලිය

(1) සමාජීය හා පාරිසරික නිර්ණායකයන් විල්ලේ මූලික පරීක්ෂාව.

(2) අවම, මධ්‍යම හා ඉහළ මට්ටමේ යනුවෙන් අවදානම් වර්ගීකරණය

(3) පාරිසරික හා සමාජයීය අවදානම් කත්සේරු කරනු වස් නිසි පෙර සුපරීක්ෂණ මෙහෙයවීම. යන කරුණු මත මඟ පෙන්වීම් ලබා දෙයි.



ආයතනික වාර්තාකරණය

ප්‍රකාශයට පත් කරන්නට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන සියළුම බාහිර වාර්තාවන්හි නිරවද්‍යතාවය හා අවංකභාවය සහතික කිරීමෙහිලා ප්‍රධානතම වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය දරයි. මේවා පහත සඳහන් දෑ වලින් අන්තර්ගත වේ.

- **වාර්ෂික ඒකාබද්ධ වාර්තාව** මෙය කොටස්හිමියා සඳහා ඉදිරිපත් කෙරෙන මූලික වාර්තාව වන අතර බැංකුව එහි පාර්ශ්වකරුවන් වෙත අගය නිර්මාණය කරන අන්දම පිළිබඳ සාකල්‍යතා හා තුළනාත්මක පිරිදසුනක් සම්පාදනය කරයි.
- **සමූහයේ විගණනය කරන ලද සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ හා සටහන්** අන්තර්ගත වන වාර්ෂික මූල්‍ය ප්‍රකාශ.

පාර්ශ්වකාර සම්බන්ධතා

බැංකුවේ සන්නිවේදන ප්‍රතිපත්තිය, අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන් සමඟ ඵලදායී හා අදාළ සන්නිවේදනය පවත්වා ගෙන යාම හා විවෘත මෙන්ම තිරසර සම්බන්ධතා පවත්වා ගැනීම පිළිබඳව මඟ පෙන්වීම් සපයයි. මෙකී ප්‍රතිපත්තිය, නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව විසින් සමාලෝචනය කෙරේ. එක් එක් ප්‍රධාන පාර්ශ්වකාර කණ්ඩායම වෙත පිරිනැමෙන අගය පිළිබඳ විස්තර මේ සමඟ විදහා දැක්වෙන අතර බැංකුව තම පාර්ශ්වකාර කණ්ඩායම් සමඟ සන්නිවේදනය පවත්වාගෙන යන වේදිකා මෙම වාර්තාවේ පිටු අංක 68 - 81 දක්වා සඳහන් කෙරේ.

ගනුදෙනුකරුවන්

අදාළ නිමැවුම්, විශ්වාසනීයත්වය හා ස්ථාවරත්වය තුළින් තහවුරු කරන ලදුව, පහසු නාලිකා හරහා බෙදාහරිනු ලැබේ.

අපගේ සේවකයින්

ඵලදායී හා උපකාරක කාර්ය පරිසරයක, වෘත්තීය හා නිපුණතා සංවර්ධනය උදෙසා අවස්ථාවන්

කොටස් හිමියා හා අරමුදල් සපයන්නන්

දරා සිටින අවදානමට සරිලන තිරසාර ප්‍රතිලාභ ජනනය

රට හා ප්‍රජාව

ජාතික සමාජ ආර්ථික සංවර්ධනය හා මූල්‍ය ඇතුළත්කරණය වෙත දායකත්වය.

ව්‍යාපාරික හවුල්කරුවන්

අන්‍යෝන්‍ය වර්ධනය සඳහා අවස්ථාවන් නිර්මාණය

නියාමකයින්

අදාළ නියාමන හා ව්‍යවස්ථාපිත අවශ්‍යතා ඒල්ලේ පූර්ණ අනුකූලතාවය සහතික කිරීම.



කාර්යසාධනය

අගය නිර්මාණය කිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලයේ දායකත්වය

අධ්‍යක්ෂ මණ්ඩලය ගෝලීය වසංගතයේ දැනට පවත්නා බලපෑම් පිළිබඳව අබණ්ඩව අවධාරණය කළ අතර, ඔවුන් විසින් මඟපෙන්වීම් කළ ප්‍රධාන තීරණ කිහිපයක් පහතින් ඉස්මතු කෙරේ.

කොවිඩ්-19 එල්ලේ ප්‍රතිචාරය

සේවකයින්ට

- අපගේ කණ්ඩායමේ යහපැවැත්ම සහතික කරනු වස් ආයතනය පුරා සර්වග්‍රාහී ආරක්ෂණ විධිවිධාන.
- නිවසේ සිට වැඩ කිරීමේ පහසුකම් හා ලිහිල් සේවා සම්මතයන්.
- අතථ්‍ය නාලිකා ඔස්සේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය

(වැඩිදුර විස්තර සඳහා පිටු අංක 68 වෙත යොමුවන්න)

ගනුදෙනුකරුවන්ට

- ණය ගෙවීමේ කාල පමා සහන, ණය සහන හා ප්‍රතිලේඛනගත/ ප්‍රතිව්‍යුහගත පහසුකම් හරහා ව්‍යාපාර යළි පණගැන්වීම උදෙසා සහය සැපයීම.
- ගනුදෙනුකාර සේවය ඉහළ නැංවීම සඳහා සියලු අංශ එක්ව දරණ ආයාසයන්.
- වර්ධනය වූ ඩිජිටල් වේදිකා සඳහා යොමුවීම ගාමනය

(වැඩිදුර විස්තර සඳහා පිටු අංක 62 වෙත යොමුවන්න)

අවදානම් කළමනාකරණය

- ණය කළඹ පසු විපරම් කිරීම ශක්තිමත් කොට, අබණ්ඩ පුහුණු කිරීම් ඔස්සේ ණය කළමනාකරණ නිපුණතා වර්ධනය.
- පළාත් මට්ටමින් මෙහෙයුම් අවදානම් කළමනාකරණය ඉහළ නැංවීම.
- කාලීන හා පූර්ව ක්‍රියාකාරී අරමුදල් සැපයුම් උපායමාර්ග හරහා ද්‍රවශීලතා ස්වාරක්ෂකය ඉහළ දැමීම.

(වැඩිදුර විස්තර සඳහා පිටු අංක 100 වෙත යොමුවන්න)

කොටස්හිමියාට

ඉපැයුම්, ව්‍යාපෘති, අක්‍රීය ණය අනුපාත, ප්‍රාග්ධනය හා ද්‍රවශීලතාවය ඇතුළුව, බැංකුවේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ අබණ්ඩ විමර්ශනය

(වැඩිදුර විස්තර සඳහා පිටු අංක 73 වෙත යොමුවන්න)

රට හා ප්‍රජාවට

පහත සඳහන් අංශ වෙත අරමුදල් සපයමින් ජාතික ආර්ථිකයට සවියක් වීම.

1 - සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය
2 - අත්‍යවශ්‍ය සේවා
3 - වෛද්‍ය උපකරණ හා වන්නත්
4 - රජය සතු ආයතන

(වැඩිදුර විස්තර සඳහා පිටු අංක 74 වෙත යොමු වන්න)

ආයතනික යහපාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂය තුළ සලකා බැලූ අනෙකුත් කරුණු සහ බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා කෙරෙහි ඒවායේ සබැඳිය පහත දක්වා ඇත.

අවධානය යොමු කළ මාතෘකා	ගත් තීරණ	උපායමාර්ගය වෙත සබැඳිය
උපායමාර්ගික සුපරීක්ෂණය	▶ මතුවෙමින් පවත්නා වෙළඳපළ තුළ උපායමාර්ගයේ අදාළත්වය පිළිබඳ සුපරීක්ෂණය ▶ 2021-2023 ආයතනික සැලැස්මේ අර්ධ වාර්ෂික සමාලෝචනය	ආයතනික සැලැස්ම හරහා උපායමාර්ග ක්‍රියාත්මක කිරීම.
අධීක්ෂණ කාර්යසාධනය	▶ මාසික මූල්‍ය ප්‍රකාශන, කාර්යසාධනය හා ස්ථාවරත්වය පිළිබඳ වාර්තා, උපායමාර්ගික අරමුණු වල්ලේ කාර්යසාධනය, පූර්ව ක්‍රියාකාරී ලෙසින් අධීක්ෂණය ▶ උපකමිටු රැස්වීම් තුළ නිර්දේශ හා කැපී පෙනෙන සාධක ▶ පරිපාලිත සමාගම් අවදානම් දසුන් පුවරු වාරානුකූලව සමාලෝචනය කරමින් නවතම අවදානම් පැතිකඩ නිශ්චය කළ පරාමිතීන් තුළ පවත්වා ගත යුතු බවට තහවුරු කරමින් කටයුතු කිරීම පැවරෙන බැංකුවේ පරිපාලිත සමාගම් කාර්යසාධනය, පරිපාලිත සමාගමේ කළමනාකරණ ප්‍රඥප්තියට අනුරූපව සිදු කෙරෙන බවට සුපරීක්ෂණය ▶ ව්‍යාපාර අඛණ්ඩතා හා සැලසුම් අභ්‍යාසය අධීක්ෂණය ▶ චිතෝර ශාඛා කාර්යසාධනය අධීක්ෂණය ▶ දේශීය හා විදේශීය මුදල් ද්‍රවශීලතා තත්ත්වය පිළිබඳ නිරන්තර ඇගයීම.	ස්ථාවරත්වය, යහපාලනය හා තිරසර වර්ධනය
පිරිස් කළමනාකරණය	▶ නව මහා කළමනාකරු තෝරා ගැනීම හා පදවියට පත් කිරීම. ▶ ප්‍රධාන කළමනාකරණ කණ්ඩායමේ (KMP) අනුප්‍රාප්තික සැලසුම යාවත්කාලීන කිරීම. ▶ ජනවාරි 2021 - දෙසැම්බර් 2023 තෙක් වැටුප් හා වැටුප් නොවන දීමනා පිළිබඳ සාමූහික ගිවිසුම අත්සන් කරන ලදී. ▶ වඩා කේන්ද්‍රීය තොරතුරු ලබා ගැනීම පිණිස, රැකියාවෙන් ඉවත් වීමේ සම්මුඛ පරීක්ෂණ ප්‍රශ්නාවලිය සංශෝධනය කිරීම.	ඉහළ කාර්යසාධනයක් සහිත කණ්ඩායමක් නිර්මාණය
ඩිජිටල්කරණය	▶ නියෝජිත බැංකුකරණය හඳුන්වා දීම මඟින් පුළුල් සහ ඉලක්කගත ප්‍රජාවකට සේවා සැලසීමේ වෙළඳපළ සංකල්පය ඉහළ නැංවීම. ▶ ගනුදෙනුකරුවන්ට ඩිජිටල් සේවා සම්පාදනය ▶ සැලකියයුතු ආයෝජනයක් සහිත ඩිජිටල් ආයෝජනවල ශක්‍යතාවය පිරික්සීම. ▶ ස්වයංක්‍රියකරණය හා ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය. ▶ ඩිජිටල් අත්සන් හඳුන්වා දීම.	ඩිජිටල් විශිෂ්ටත්වය ගනුදෙනුකාර කේන්ද්‍රීය බව

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය

ස්වයං ඇගැයීම් යාන්ත්‍රණයක් හරහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායිතාවය තක්සේරු කිරීමේ ව්‍යුහගත ක්‍රියාවලියක්, බැංකුව සතුව ඇත. එක් එක් අධ්‍යක්ෂවරයා කාර්යසාධන ඇගැයීම් ආකෘතියක් සම්පූර්ණ කිරීම අවශ්‍යය. ඉන් පසුව ප්‍රතිචාර එකට එක්කොට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ. උපකමිටු මේ හා සමාන ඇගයීමක් සිදු කරති.

පාරිශ්‍රමික සමාලෝචනය

පාරිශ්‍රමික සඳහා ප්‍රවේශය

අපගේ උපායමාර්ගික අපේක්ෂාවන් බලගැන්වීමට අවශ්‍ය සම්පත් කණ්ඩායම සතුව ඇති බව තහවුරු කිරීම හා එහි අඟය නිර්මාණය කිරීම උදෙසා දරණ දායකත්වය නිසි සේ ඇගැයීමට පත්කර පාරිශ්‍රමික පිරිනැමීම, බැංකුවේ පාරිශ්‍රමික කමිටුව ඉලක්ක ගත කරයි. ඒ හේතුවෙන් මෙම ප්‍රතිපත්තිය, තරඟකාරී මෙන්ම සාධාරණ පාරිශ්‍රමික ගොනුවක් පිරිනැමීමෙහි බැංකුවේ කැපවීම පිළිබිඹු කරයි. ඒ අනුසාරයෙන් දිගුකාලීන පදනමකින් පරිසර කාර්යසාධනයක් ප්‍රවර්ධනය කරයි.

පාරිශ්‍රමික මූලධර්ම

- තරඟකාරීත්වය
- සාධාරණත්වය
- විනිවිදභාවය
- සියළු පාර්ශ්ව අන්තර්ගත කර ගැනීම

පාරිශ්‍රමික ව්‍යුහයන්

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික තීරණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ හා ලිපිලේඛන මෙන්ම බැංකු ආඥා පනත හා එහි සංශෝධන ද පිළිබිඹු වන අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය මඟිනි. කිසිදු අධ්‍යක්ෂවරයෙක් ඔහුගේ හෝ ඇයගේ පාරිශ්‍රමික නිගමනය කිරීමට සහභාගි නොවෙයි.

මහා කළමනාකරු හා ප්‍රධාන කළමනාකරණ කණ්ඩායමේ (KMP) පාරිශ්‍රමික, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ ප්‍රධාන කළමනාකරණ කණ්ඩායමේ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය මත පදනම් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව හරහා මහා කළමනාකරු හා ප්‍රධාන කළමනාකරණ කණ්ඩායමේ පාරිශ්‍රමික පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය ඒ මත පදනම් වෙමින් එය අනුමත කොට අදාළ අමාත්‍යවරයා වෙත තම නිර්දේශ යොමු කරනු ලැබේ. බැංකු ආඥා පනත හා එහි සංශෝධන අනුව යමින් අවසන් අනුමැතිය ලබා දෙන්නේ අමාත්‍යවරයා විසිනි. මහා කළමනාකරු හා ප්‍රධාන කළමනාකරණ කණ්ඩායමේ පාරිශ්‍රමික සෑම තෙවසරකට වරක් සංශෝධනය කෙරේ.

බැංකුවේ පාරිශ්‍රමික සැකසුමෙහි ප්‍රධාන අංගෝපාංග පහත සඳහන් කර ඇත.

ස්ථිර පාරිශ්‍රමික

- භූමිකාව හා සේවක ශ්‍රේණිය අනුව නිගමනය කළ පදනම් වැටුප හා අනෙකුත් ස්ථාවර සංරචක.

විචල්‍ය පාරිශ්‍රමික

- දිරිගැන්වීමේ පාරිතෝෂික

අනෙකුත් මූල්‍ය නොවන ප්‍රතිලාභ

- සේවා කාලයෙන් අනතුරුව පිරිනැමෙන ප්‍රතිලාභ
- විශේෂ යෝජනා ක්‍රම මත ණය පහසුකම්
- ණය කාඩ්පත්

අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික පිළිබඳ විස්තර සඳහා පිටු අංක 165 ත්, ප්‍රධාන කළමනාකාර කණ්ඩායමේ පාරිශ්‍රමික පිළිබඳ විස්තර සඳහා පිටු අංක 337 සඳහාත්, මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව සඳහා පිටු අංක 96 ත් වෙත යොමු වන්න.

මහා කළමනාකරු හා ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම ඇගැයීම.

අධ්‍යක්ෂ මණ්ඩලය, ආයතනික සැලසුමෙහි දැක්වෙන මූල්‍ය හා මූල්‍ය නොවන ඉලක්ක මත පදනම් වෙමින් මහා කළමනාකරු හා ප්‍රධාන කළමනාකරණ කණ්ඩායමේ කාර්යසාධනය වාර්ෂිකව ඇගැයීමට ලක් කරයි. මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව මෙම ආයාසයෙහිදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහය දක්වයි. වර්ෂය ආරම්භයේදී මෙකී නිර්ණායක පිළිබඳව මහා කළමනාකරු හා ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම එකඟතාවයකට එළඹෙන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අපේක්ෂාවන් පිළිබඳ පැහැදිලි බව තහවුරු කරමිනි. ඇගැයීම් ක්‍රියාවලිය මෙහෙයුම් වපසරියේ පවතින ගතිකයන් සේම ඇගැයීමට ලක්වන්නාගේ අදහස් ද සැලකිල්ලට ගනී.

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වාර්තා

විගණන කමිටු වාර්තාව

2021 වසර තුළ කමිටුවේ සංයුතිය

පහත දැක්වෙන අධ්‍යක්ෂවරුන් 2021 වර්ෂයේ විගණන කමිටුවේ සමාජිකයින් ලෙස කටයුතු කරන ලදී.

(1) ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා
සභාපති/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

(2) ජී හර්ෂ විජයවර්ධන මහතා
සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

(3) ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා
සාමාජික/ නිල බලයෙන් පත් වූ විධායක නොවන අධ්‍යක්ෂ

(4) මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි
සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

කමිටුවේ ලේකම්

නීතිඥවරියක මෙන්ම නියෝජ්‍ය මහා කළමනාකාරිණී තනතුරද දරණ ලේකම්, ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, කමිටුවේ ලේකම් ලෙස ද ක්‍රියා කරයි.

අබණ්ඩව සහභාගිවන්නන්

- ප්‍රධාන අභ්‍යන්තර විගණක
- ප්‍රධාන අවදානම් නිලධාරී
- නියෝජ්‍ය මහා කළමනාකරු (අනුකූලතා)
- සහකාර මහා කළමනාකරු (පළාත්/ ශාඛා සහ ණය විගණන)
- සහකාර මහා කළමනාකරු (විමර්ශන)
- සහකාර මහා කළමනාකරු (තොරතුරු පද්ධති විගණන)
- සහකාර මහා කළමනාකරු (අවදානම් කළමනාකරණය)
- අභ්‍යන්තර විගණක
- විගණකාධිපතිගේ නියෝජිතයන් (බැංකුවේ බාහිර විගණක)

ආරාධනයෙන් පමණක් සහභාගී වන්නන්

- මහා කළමනාකරු
- අතිරේක මහා කළමනාකරු/ ප්‍රධාන මූල්‍ය නිලධාරී
- නියෝජ්‍ය මහා කළමනාකරු (මූල්‍ය හා සැලසුම්)
- ආයතනික හෝ විධායක කළමනාකාරීත්වයේ ඕනෑම සාමාජිකයෙකු හෝ සේවක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයකු

2021 වසරේ දී පැවැත්වූ රැස්වීම් වාර ගණන: හයයි.
(සාමාජික සහභාගිත්වය මෙම වාර්තාවේ පිටු අංක 88 හි දක්වා ඇත.)

ගණපූර්ණය: සාමාජිකයන් දෙදෙනකු හෝ සාමාජිකයන්ගෙන් බහුතරය යන දෙකෙන් වැඩි අගය

කමිටුවේ කාර්යභාරය

විගණන කමිටු ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අනුගමනය කරනු ලබන විගණන කමිටු ප්‍රඥප්තියේ සඳහන් කරුණු මත විගණන කමිටුවේ විෂය පථය සකස් කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වූ 2007 අංක 11 දරණ බැංකු පනතේ නියෝග වල අවශ්‍යතා සහ ඊට අයත් ක්‍රියාමාර්ග වල විෂය පථය ආවරණය සම්බන්ධයෙන් ද කමිටුව සහතික කරයි.

ප්‍රධානතම අවධානය

මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පිළිබඳ ස්වාධීන හා විෂයානුබද්ධ සමාලෝචනයක් ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට සිය කාර්යයන් ඉටු කරලීම සඳහා සහය දැක්වීම කෙරෙහි විගණන කමිටුව මූලිකව සිය අවධානය යොමු කර ඇත.

වාර්තාකරණ ක්‍රියාමාර්ග

විගණන කමිටු රැස්වීම් වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කෙරේ. එහිදී සියලු ප්‍රධාන කරුණු, ගන්නා ලද ක්‍රියාමාර්ග, අත්පත් කර ගත් හෝ අත්පත් කරගැනීමට ඇති ප්‍රතිඵල සහ පසුවිපරම් ක්‍රියාමාර්ග පැහැදිලි කර ගැනීම සඳහා සාකච්ඡා කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සිදු කෙරේ.

2021 වසර තුළ අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම් මූල්‍ය වාර්තාකරණය

- බැංකුවේ මාසික, කාර්තුමය, හා වාර්ෂිකව විගණනය නොකළ/ කළ මූල්‍ය ප්‍රකාශන සුපරීක්ෂණ හා නියාමන බලධාරීන් විසින් පනවන ලද අවශ්‍යතා හා අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා අනුරූප වන පරිදි පිළියෙල කොට හා ප්‍රසිද්ධ කොට තිබෙන බව තහවුරු කරනු පිණිස මෙම ප්‍රකාශන සමාලෝචනය කරන ලදී.

නියාමන අනුකූලතාවය

- අනිවාර්ය බැංකු කටයුතු හා අනෙකුත් ව්‍යවස්ථාපිත අවශ්‍යතා සමඟ වූ අනුකූලතාවය සමාලෝචනය කරන ලදී.
- නියාමකයින් විසින් පවත්වන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණයන්ගෙන් හඳුනාගන්නා ලද කරුණු සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග වල ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.

අභ්‍යන්තර පාලනය

- 2021 වසර සඳහා යාවත්කාලීන කරන ලද අභ්‍යන්තර පාලන අනුකෘතිය මඟින් 2007 අංක 11 දරණ බැංකු පනතේ නියෝග වල 3 (8)(ii) (ආ) කොටසට අනුකූලව බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණාත්මකතාවය සහ සඵලත්වය සමාලෝචනය කරන ලදී.
- නිරන්තරව සහ අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය හේතු විශ්ලේෂණ මත පද්ධති, පටිපාටි සහ අභ්‍යන්තර පාලන විධිවිධාන වල ශක්තිමත්භාවය ඉහළ නැංවීම උදෙසා අවශ්‍ය සංශෝධන සිදු කරන ලදී.

අභ්‍යන්තර විගණන

- අභ්‍යන්තර විගණන ක්‍රියාමාර්ග වල ස්වාධීනත්වය, වාස්තවිකත්වය සහ කාර්යසාධනය සේම එම අංශයේ සම්පත් ප්‍රමාණවත් ද යන කරුණ පිළිබඳව ද විශේෂිත අවධානය යොමු කොට සමාලෝචනය කරන ලදී.
- අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කරමින් සැලසුම ක්‍රියාත්මක කිරීමේ සාර්ථකත්වය වසර පුරාම සමාලෝචනය කරන ලදී.
- අභ්‍යන්තර පාලනයේ අධීක්ෂණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබූ මුල්පිරීම්හි ප්‍රගතිය අධීක්ෂණය කරන ලදී.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබූ ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වූ 2007 අංක 11 දරණ බැංකු පනතේ නියෝගවලට අනුව අභ්‍යන්තර විගණන ප්‍රඥප්තියේ සහ විගණන කමිටු ප්‍රඥප්තියේ අනුකූලතාවය අධීක්ෂණය කරන ලදී.
- වසංගත කාලපරිච්ඡේදය තුළ විකල්ප විගණන ක්‍රියාපටිපාටි පිළිබඳ ගවේෂණය කරන ලදී.

බාහිර විගණනය

- රටේ ව්‍යවස්ථාව අනුව බාහිර විගණනය කරනු ලබන්නේ විගණකාධිපතිවරයා විසිනි. ඵලදායී ලෙස හා ස්වාධීනව බාහිර විගණන කටයුතු කරගෙන යන බවටත් විගණන ප්‍රවේශය හා ක්‍රියා පිළිවෙත අනුව විගණකාධිපතිගේ නියෝජිතයන් සමඟ අබණ්ඩව සම්බන්ධතාවක් පවත්වා ගෙන යන බවටත් කමිටුව සහතික වේ.
- විගණකාධිපතිවරයාගේ නියෝජිතයින් සමඟ "සංවෘත සාකච්ඡා" පැවැත්වීම සඳහා පහසුකම් සැලසුණි.

ඉදිරි දැක්ම

වසර 2022 හා ඉන් ඔබ්බට අභ්‍යන්තර විගණන ප්‍රඥප්තියේ දක්වා ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීමට ධනාත්මක සහ ඵලදායී අභ්‍යන්තර පාලන පරිසරයක් ඇති කිරීමට විගණන කමිටුව කැප වේ.

විගණන කමිටුව වෙනුවෙන්,



ඒ සී මනිල්ක ප්‍රනාන්දු
සභාපති
විගණන කමිටුව
2022 පෙබරවාරි 24

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වාර්තා

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

2021 වසර තුළ කමිටුවේ සංයුතිය

2021 වසර තුළ කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

(1) ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා
සභාපති/ නිල බලයෙන් පත් වූ විධායක නොවන අධ්‍යක්ෂ

(2) ජී හර්ෂ විජයවර්ධන මහතා
සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

(3) මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි
සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ - 2021 ජනවාරි 21 සිට 2021 මාර්තු 03 දක්වා

(4) ජයම්පති මොල්ලිගොඩ මහතා
සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ - 2021 මාර්තු 04 සිට 2022 ජනවාරි 31 දක්වා

කමිටුවේ ලේකම්

නීතිඥවරියක මෙන්ම නියෝජ්‍ය මහා කළමනාකාරිණී තනතුරද දරණ ලේකම්, ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, කමිටුවේ ලේකම් ලෙස ද ක්‍රියා කරයි.

අඛණ්ඩව සහභාගිවන්නන්

- මහා කළමනාකරු
- ප්‍රධාන අවදානම් නිලධාරි
- නියෝජ්‍ය මහා කළමනාකරු (අනුකූලතා)

ආරාධනයෙන් පමණක් සහභාගී වන්නන්

අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හෝ ආයතනික කළමනාකාරිත්වයේ ඕනෑම සාමාජිකයෙකු හෝ සේවක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකු.

2021 වසරේ දී පැවැත්වූ රැස්වීම් වාර ගණන:
අටකි
(සාමාජික සහභාගිත්වය මෙම වාර්තාවේ පිටු අංක 88 හි දක්වා ඇත.)

ගණපූර්ණය: සාමාජිකයන් දෙදෙනෙකු

කමිටුවේ කාර්යභාරය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමතකර අනුගමනය කරනු ලබන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තියේ සඳහන් කරුණු මත ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ විෂය පථය සකස් කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වූ 2007 අංක 11 දරණ බැංකු පනත හා එහි සංශෝධන වලට අදාළ නියෝගවල අවශ්‍යතා කමිටුවේ විෂය පථය මඟින් ආවරණය වන බවට කමිටුව සහතික වේ.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තිය මඟින් හඳුනාගෙන ඇති පහත සඳහන් අංග සමාලෝචනය සහ/ හෝ නිර්දේශ පිළිබඳ වගකීම ද කමිටුව දරයි.

- අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවය හා බැඳුණු ප්‍රතිපත්ති, වැඩසටහන් සහ කළමනාකරණ ප්‍රඥප්ති.
- ප්‍රධාන අවදානම් නිලධාරි විසින් නිර්දේශ කරන පරිදි ණය වෙළඳපළ, ද්‍රවශීලතා මෙහෙයුම් හෝ වෙනත් අවදානම් සඳහා අවදානම් අභිරුචීන් හා ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම.
- කමිටුව විසින් දක්වා ඇති ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමා ඇතුළත අවදානම් කළමනාකරණය උදෙසා කළමනාකරණ කමිටු වලට විශේෂිත අවදානම් පිළිබඳ අවධානය යොමු කරනන්ට ඇති ප්‍රමාණාත්මකතාවය හා සාඵල්‍යතාව.
- බැංකුවේ අවදානම් පැතිකඩ මෙන්ම වෙළඳපළ හා නියාමන අවදානම් හා එබඳු අවදානම් හඳුනා ගැනීම/ මිණුම්කරණය/ අධීක්ෂණය හා පාලනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ අවදානම් කළමනාකරණ වාර්තා.
- බැංකුවේ ප්‍රතිපත්ති හා නියාමන/ සුපරීක්ෂණ අවශ්‍යතා පදනම මත කමිටුව විසින් තීරණය කළ විවක්ෂණශීලී මට්ටම්වලට ඉහළින් වන විශේෂිත අවදානමක් වේ නම් එහි අහිසි ප්‍රතිඵල අවම කිරීමට පිළියම් යෙදීම.
- ණය වෙළඳපළ, ද්‍රවශීලතා මෙහෙයුම් හා අනුකූලතා අවදානම් හඳුනාගැනීම, මිනුම්කරණය, අධීක්ෂණ ක්‍රියාවලිය තුළ ප්‍රමාණාත්මකතාවය හා සඵලතාවය.

ප්‍රධානතම අවධානය

අධ්‍යක්ෂ මණ්ඩලයට අවදානම් කළමනාකරණයේ සියලුම අංශයන් සඳහා සිය සුපරීක්ෂක වගකීම් ඉටු කරන්නට සහය වීමට කමිටුව ප්‍රධාන ලෙසම වග බලා ගනී. මේ පිළිබඳව කටයුතු කරද්දී කමිටුව ණය වෙළඳපළ, ද්‍රවශීලතා මෙහෙයුම් හා උපායමාර්ගික අවදානම් කෙරෙහි අවධානය යොමු කරමින් සමාලෝචනය කරන්නේ උචිත අවදානම් දර්ශක හා කළමනාකරණ තොරතුරු අනුසාරයෙනි.

වාර්තාකරණ ක්‍රියාමාර්ග

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කෙරෙන අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සිදු කෙරේ.

2021 වර්ෂය තුළ අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම්

- බැංකුවේ අවදානම් පැතිකඩ තක්සේරුව සඳහා පාදක වන පහත දැක්වෙන ප්‍රතිපත්ති/ අත්පොත් සමාලෝචනය සහ/ හෝ නව නිර්දේශ ඉදිරිපත් කිරීම.
  - ණය සමාලෝචන යාන්ත්‍රණ ප්‍රතිපත්තිය (LRM)
  - අවදානම් සහගත අංශ කළමනාකරණ ප්‍රතිපත්තිය
  - ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ ප්‍රතිපත්තිය සහ බැංකුවේ ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම
  - ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
  - ණය අවදානම් ඇගැයීමේ ප්‍රතිපත්තිය
  - ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
  - වෙළඳපළ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
  - විදේශ විනිමය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
  - ණය කළඹේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
  - ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
  - ප්‍රත්‍යාබල පරීක්ෂණ ප්‍රතිපත්තිය
  - ICAAP ප්‍රතිපත්තිය
  - මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
  - තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
  - ඒකාබද්ධ පාරිසරික හා සමාජීය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

- තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය
- මාලදිවයින සහ වෙන්නායි සඳහා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය
- අනුකූලතා ප්‍රතිපත්තිය
- මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි ප්‍රතිපත්තිය
- වාර්ෂික අනුකූලතා සැලැස්ම

- පහත දැක්වෙන කමිටු ප්‍රඥප්ති සහ විෂය පථයන් සමාලෝචනය කරන ලදී.
  - ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තිය.
  - අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණාත්මකතා තක්සේරු පිළිබඳ (ICAAP) හා ප්‍රාග්ධනය යළි ගොඩනැඟීමේ (RCP) මෙහෙයුම් කමිටුව.
  - මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව.
  - ආයතනික තොරතුරු ආරක්ෂණ කමිටුව
  - අවදානම් කළමනාකරණ රාමුව හා එහි යහපාලන ව්‍යුහය සම්මත කිරීම.
- බැංකුවේ ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විසින් බැංකුවේ අවදානම මාසිකව තක්සේරු කරන අතර එහි සංක්ෂිප්ත වාර්තාවක් කමිටුවට ඉදිරිපත් කරයි. කමිටුව එය සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලයට සිය නිර්දේශ කමිටු වාර්තා හරහා කඩිනමින් දන්වයි.
- සීමා ඉක්මවා පැතිරගිය මැනිය හැකි හා නොහැකි අවදානම් අධීක්ෂණය කොට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.
- පරිපාලිතයන්ට අවදානම් ක්‍රියා ඵලදායී ලෙස කළමනාකරණය කර ගැනීමට සහය දක්වමින් පරිපාලිත අවදානම් කළමනාකරණ දර්ශක පුවරුව වැඩිදියුණු කිරීම.
- පරිපාලිත අවදානම් කළමනාකරණ දර්ශක පුවරුව තක්සේරු කර සහ අධීක්ෂණය කර පරිපාලිත සමාගම් මුහුණ දෙන විවිධ අවදානම් කළමනාකරණය කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ශාඛා පද්ධතිය, තීරණාත්මක ව්‍යාපාරික අංශ හා උපකාරක සේවා අංශ තුළ ප්‍රධාන අවදානම් දර්ශක අධීක්ෂණය කිරීම.
- කාර්තුමය පදනම මත බැංකුවේ අවදානම් විශ්ලේෂණ වාර්තාව සමාලෝචනය කිරීම.
- 2021 වසර සඳහා අවදානම් අභිරුචිය සහ සීමා පැනවීම ස්ථාපිත කිරීම.
- 2021 වසර සඳහා අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණාත්මකතා තක්සේරු පිළිවෙත් සම්මත කිරීම හා නිර්දේශ කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකු විධාන යටතේ අය කර ගැනීම් සැලසුම් සකස් කරනු වස් මූලික අත්‍යාවශ්‍ය පියවර ගනු ලැබීය.
- කාර්තුමය පදනමකින් ප්‍රත්‍යාබල පරීක්ෂණ ප්‍රතිඵල සමාලෝචනය කිරීම.
- 2021 වසර සඳහා සීමා කළමනාකරණ රාමුව සමාලෝචනය කොට නිර්දේශ කරන ලදී
- බැංකුවේ විදේශ විනිමය හා රුපියල් ද්‍රවශීලතා තත්ත්වය පිළිබඳ නිත්‍ය පදනමකින් තක්සේරුව කරගෙන යන ලදී.
- ප්‍රධාන අවදානම් නිලධාරීගේ සහ අනුකූලතා නිලධාරීගේ කාර්යසාධන ඇගැයීම් සිදු කිරීම.
- බැංකුව, ප්‍රධාන අවදානම් නිලධාරීගේ මඟ පෙන්වීම යටතේ පාරිසරික හා සමාජයීය කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා මූල පුරන බව සහතික කරන ලද අතර පාරිසරික හා සමාජයීය කළමනාකරණ පද්ධතිය සකස් කොට අවසන් කරන ලදී.
- ISO 27001 තත්ත්ව සහතික ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙහි ලා පුරෝගාමීත්වය දරන ලදී.
- 2021 වසර සඳහා අවදානම් තක්සේරුව හා ප්‍රත්‍යාබල පරීක්ෂණ සම්පූර්ණ කොට නිවැරදි කිරීමේ වැඩසටහන් නිත්‍ය පදනමකින් සමාලෝචනය කරන ලදී.
- බැංකුව තුළ තොරතුරු හා සම්බන්ධිත තාක්ෂණය සඳහා පාලන අරමුණු (COBIT) පරිපාලන රාමුව සම්මත කිරීම ආරම්භ කරන ලදී.
- අනුකූලතා නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ අනුකූලතා වාර්තා සමාලෝචනය කරන ලදී.
- වංචනික ලෙස වෙනස් කළ චෙක්පත් හා වංචා පිළිබඳ කටයුතු කරන කමිටුවේ තීරණ කාර්තුමය පදනමකින් සමාලෝචනය කරන ලදී.
- මෙහෙයුම් අලාභ පිළිබඳව කටයුතු කරන කමිටුවේ තීරණ කාර්තුමය පදනමකින් සමාලෝචනය කරන ලදී.
- බැහැර සිට අවදානම් තක්සේරුකරණය සඳහා පහසුකම් සලසමින් අනුකූලතා අවදානම් තක්සේරුකරණ ආකෘතිය සමාලෝචනය කරන ලදී.

කමිටුව, සැලකිල්ලට බඳුන් වන වසර තුළ කමිටු සාමාජිකයකුව සිටි, මේ වන විට ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්ව ඇති ජයම්පති මොල්ලිගොඩ මහතාට, ඔහු විසින් මේ කමිටුව වෙත පිරි නැමූ වටිනා දායකත්වය පිළිබඳව ඇගැයීම වාර්තා කරනු කැමැත්තේය.

සමාප්තිය

වසර තුළ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් සාමූහිකව එහි ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාවයෙහි කාර්යසාධනය ඇගයීමට ලක් කොට ඇත.

තාක්ෂණ අභිවර්ධනයන් ගොඩනැඟීම, සාර්ව ආර්ථික කම්පන මෙන්ම නිතර වෙනස් වන තත්ත්වයන් නිසා ද වංචා හා සයිබර් අපරාධ බැංකු ක්ෂේත්‍රය පුරාම විශාල තර්ජනයක් වීමට පටන් ගැනීම හේතුවෙන් විමසිලිමත් වීමටත් යෝග්‍ය ආකාරයෙන් ක්‍රියා කිරීමටත් අවශ්‍ය බව කමිටුවේ අවබෝධය වේ.

කාර්ය මණ්ඩලය අතර අවදානම් කළමනාකරණය, අනුකූලතාවය සහතික කිරීම පිළිබඳව දැනුවත්භාවය සහ සේවක මණ්ඩල පුහුණුව මෙම ප්‍රවේශයේ වැදගත් අංගයන් වේ. බැංකුව සිය පාර්ශ්වකරුවන්ගේ අභිලාශයන් මුදුන් පමුණුවා ගැනීමට අවදානම් කළමනාකරණ අභියෝගයන්ට සහ අනුකූලතාවයන්ට අනුව නිවැරදි මාවතක ගමන් කරන බව කමිටුවේ දැක්ම වේ.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙනුවෙන්,



ආර් එම් ප්‍රියන්ත රත්නායක
සභාපති
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

2022 පෙබරවාරි 24

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වාර්තා

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව

2021 වසර තුළ කමිටුවේ සංයුතිය

පහත දැක්වෙන අධ්‍යක්ෂවරු 2021 වසර තුළ කමිටුවේ සාමාජිකත්වය දැරූහ.

(1) ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා
සභාපති/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

(2) ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා
සාමාජික/ නිල බලයෙන් පත් වූ විධායක නොවන අධ්‍යක්ෂ

(3) මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි
සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

කමිටුවේ ලේකම්

නීතිඥවරියක මෙන්ම නියෝජ්‍ය මහා කළමනාකාරිණී තනතුර ද දරණ ලේකම්, ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, කමිටුවේ ලේකම් ලෙසද ක්‍රියා කරයි.

ආරාධනයෙන් පමණක් සහභාගී වන්නන්

- මහා කළමනාකරු
- නියෝජ්‍ය මහා කළමනාකරු (මානව සම්පත්)
- ආයතනික හෝ විධායක කළමනාකාරිත්වයේ ඕනෑම සාමාජිකයෙකු

2021 වසරේදී පැවැත්වූ රැස්වීම් වාර ගණන: පහයි
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව හා සබැඳි රැස්වීම් වාර ගණන: එකයි
(සාමාජික සහභාගීත්වය මෙම වාර්තාවේ පිටු අංක 88හි දක්වා ඇත.)
ගණපූරණය: සාමාජිකයන් දෙදෙනෙකු

කමිටුවේ කාර්යභාරය

කමිටුවේ විෂය පථය හා ප්‍රධාන වගකීම්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ ශ්‍රී ලංකාව තුළ ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ ආයතනික යහපාලනය පිළිබඳ බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ නියාමනයන් මත මූලික වශයෙන් පදනම් වී ඇත.

- බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පිරිස් සම්බන්ධයෙන් වූ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා සහ අනෙකුත් මූල්‍ය ගෙවීම්) නිගමනය කිරීම.
- මහා කළමනාකරු හා ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අරමුණු හා ඉලක්ක නියම කිරීම.
- මහා කළමනාකරු හා ප්‍රධාන කළමනාකරණ පිරිස් වෙත ලබාදුන් අරමුණු හා ඉලක්ක වල කාර්යසාධනය කාල පදනමක් මත ඇගයීම හා කාර්යසාධනය මත පදනම් වූ දිරිදීමනා තුළ පාරිශ්‍රමික, ප්‍රතිලාභ හා අනිකුත් ගෙවීම් සංශෝධනය කිරීමේ පදනම නිශ්චය කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවට යොමු කළ කාර්ය මණ්ඩලයට අදාළ කරුණු සමාලෝචනය.
- බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්තිය හා සංවිධාන ව්‍යුහය නිශ්චය කිරීම.

ඉහත සඳහන් 2007 අංක 11 දරණ බැංකු ආඥා පනතේ නියෝග අනුව, සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය මෙම කමිටුව විසින් නිශ්චය කළ යුතුය. කෙසේ වුවත් ලංකා බැංකුව සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික තීරණය කෙරෙනු ලබන්නේ, එහි එකම කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන චක්‍රලේඛ හා උපදෙස් අනුව යමිනි. මෙහිදී 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා ඊට කළ සංශෝධනයන් ද සැළකිල්ලට ගනු ලැබේ. ඉහත දැක්වෙන පදනමින් පිළියෙළ කළ, රජය විසින් නව රෙගුලාසි නිකුත් කරන විට අවශ්‍ය වන පරිදි සංශෝධනය කරනු ලබන පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් බැංකුව සතුව ඇත. අධ්‍යක්ෂවරුන් වෙත ගෙවනු ලබන පාරිශ්‍රමික පිළිබඳ විස්තර, වාර්ෂික වාර්තාව තුළින්, වාර්ෂික පදනමකින් අනාවරණය කෙරේ.

ප්‍රධානතම අවධානය

- මූලිකව ප්‍රධාන කළමනාකරණ පිරිස් ඇගැයීම පිළිබඳව මානව සම්පත් සම්බන්ධ ගැටළු විසඳීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට උපකාරී වීම පිළිබඳව මෙම කමිටුව අවධානය යොමු කරයි.

වාර්තාකරණ ක්‍රියාමාර්ග

- කමිටු රැස්වීම් වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කෙරෙන අතර කමිටුවේ නිර්දේශයන්ට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සිදු කෙරේ.

2021 වර්ෂය තුළ අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම්

- 2020 න් අවසන් වූ වර්ෂය සඳහා ප්‍රධාන කළමනාකරණ පිරිසේ කාර්යසාධන වාර්තා (අදාළ උපකමිටු වලට ඉදිරිපත් කරන ලද නියෝජ්‍ය මහා කළමනාකරු (අනුකූලතා), ප්‍රධාන අවදානම් නිලධාරී සහ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්යසාධන වාර්තා හැර) ආයතනික සැලැස්මට අනුකූලව වර්ෂය ආරම්භයේ නියමකර ඇති ඉලක්ක මත පදනම්ව කමිටුව විසින් ඇගැයීමට ලක් කරන ලදී.
- කමිටුව 2021 වසර සඳහා ආයතනික කළමනාකාරිත්වය හා මහා කළමනාකරුගේ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) සමාලෝචනය කොට නිර්දේශ කළේය.
- සේවක මණ්ඩලය තුළ අවශ්‍ය නිපුනතා, දැනුම හා ආකල්ප සංවර්ධනය කිරීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම මත පසු විපරම් කටයුතු කළේය.
- බැංකුවේ ආයතනික ව්‍යුහය සමාලෝචනය කොට එය අනාගතයට සුදානම් වන සේ සකස් කරනු වස් කමිටුවක් පත්කරනු ලැබීය.
- පහත දැක්වෙන ප්‍රතිපත්ති/ ප්‍රඥප්ති භාවිතයට ගැනීම නිර්දේශ කළේය.
  - සමාලෝචනය කළ මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ ප්‍රඥප්තිය.
  - සංශෝධන කළ බැංකුවේ විනය නීති සංග්‍රහය.
  - සංශෝධන කළ බැංකුවේ ආචාරධර්ම සංග්‍රහය.
  - සහකාර මහා කළමනාකරු හා නියෝජ්‍ය මහා කළමනාකාර ශ්‍රේණි සඳහා උසස්වීම් වලදී විශේෂ ප්‍රශංසා සඳහා ලකුණු ලබා දීම හා අසතුටුදායක නිර්ක්ෂණ/ දඬුවම් සඳහා ලකුණු කපා හැරීමේ පිළිවෙත සංශෝධනය කරනු ලැබිය.
  - අභ්‍යාසලාභී/ පරිවාස සේවකයන් විසින් පරිවාස/ අභ්‍යාසලාභී කාලසීමාව තුළ ලබාගත් ප්‍රසූත නිවාඩු පිළිබඳ ප්‍රතිපත්තිය ප්‍රතිශෝධනය කරනු ලැබීය.
  - සේවක මණ්ඩලයේ පාරිශ්‍රමික, ලංකා බැංකුවේ කටයුතු විෂය පථය යටතට ගැනෙන අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව වසර තුනකට වරක් ප්‍රතිශෝධනය කරනු ලැබිය.

ඒ අනුව, සහකාර මහා කළමනාකරුවන්ගේ සහ ආයතනික කළමනාකාරිත්ව සාමාජිකයන්ගේ (නියෝජ්‍ය මහා කළමනාකරණ ශ්‍රේණියට සමාන්තර, බඳවා ගන්නා අවස්ථාවේ ස්ථිර දීමනා සහිත කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගත් අයවළුන් හැර) වැටුප් හා විශේෂ දීමනා 01.01.2021 සිට 31.12.2023 දක්වා කාලය සඳහා ප්‍රතිශෝධනය කරන ලෙස කමිටුව නිර්දේශ කළේය.

ඉදිරි දැක්ම

කමිටුව බැංකුව තුළ ප්‍රශස්ත මානව සම්පත් පරිචයන් භාවිතය දිරිගැන්වීම උදෙසා තවදුරටත් කටයුතු කරනු ඇත.

සමාප්තිය

කමිටු සාමාජිකයෝ, කමිටුවේ කාර්යසාධනය සාමූහිකව ඇගැයීමට ලක් කළහ.

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව වෙනුවෙන්



ඒ සී මනිල්ක ප්‍රනාන්දු
සභාපති,
මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

2022 පෙබරවාරි 24

නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටු වාර්තාව

2021 වසර තුළ කමිටුවේ සංයුතිය

පහත දැක්වෙන අධ්‍යක්ෂවරු 2021 වසර තුළ කමිටු සාමාජිකයන් වූහ.

2021 මාර්තු 03 දින දක්වා

(1) ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා
සභාපති/ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

(2) ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා
සාමාජික/ විධායක නොවන, නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

(3) ජී හර්ෂ විජයවර්ධන මහතා
සාමාජික/ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

2021 මාර්තු 04 දින පටන්

(1) ජයම්පති මොල්ලිගොඩ මහතා
සභාපති/ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
(2022 පෙබරවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි ඉල්ලා අස්වීම බාරදෙන ලදී)

(2) ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා
සාමාජික/ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

(3) ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා
සාමාජික/ විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

(4) ජී හර්ෂ විජයවර්ධන මහතා
සාමාජික/ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

කමිටුවේ ලේකම්

නීතිඥවරියක මෙන්ම නියෝජ්‍ය මහා කළමනාකාරිණී තනතුර ද දරණ ලේකම්, ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, කමිටුවේ ලේකම් ලෙස ද ක්‍රියා කරයි.

ආරාධනයෙන් පමණක් සහභාගී වන්නන්

- මහා කළමනාකරු
- කමිටුවේ අභිමතය පරිදි කළමනාකාරිත්වයේ ඕනෑම සාමාජිකයෙකු

2021 වසරේ දී පැවැත්වූ රැස්වීම් වාර ගණන: අටයි

(සාමාජික සහභාගීත්වය මෙම වාර්තාවේ පිටු අංක 88 හි දක්වා ඇත.)

ගණපූර්ණය: සාමාජිකයන් දෙදෙනෙකු

කමිටුවේ කාර්යභාරය

නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටුවේ ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අනුගමනය කරනු ලබන නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටු ප්‍රඥප්තියේ සඳහන් කරුණු මත නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටුවේ විෂය පථය සකස් කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වූ 2007 අංක 11 දරණ බැංකු පනත හා සංශෝධන වලට අදාළ නියෝග වල අවශ්‍යතාවය හා ඊට අයත් ක්‍රියාමාර්ග වල විෂය පථය ආවරණය වීම සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ හොඳම පරිචය පිළිබඳ සංග්‍රහය සම්බන්ධයෙන් ද කමිටුව සහතික කරයි.

ප්‍රධානතම අවධානය

නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටුව නීතියෙන් නියමකර ඇති ආයතනික යහපාලන මූලධර්මයන්ට අනුකූල බවට සහතික කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වන අතරම මහා කළමනාකරු/ ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන ආයතනික කළමනාකාරිත්වයේ පිරිස් පත් කිරීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ.

වාර්තාකරණ ක්‍රියාමාර්ග

නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටු රැස්වීම් වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කෙරෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සිදු කෙරේ.

2021 වර්ෂය තුළ අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම්

- ලංකා බැංකුව සම්බන්ධයෙන් ගත් කළ එහි පූර්ණ හිමිකාරිත්වය ශ්‍රී ලංකා රජය සතු වන බැවින් අධ්‍යක්ෂවරුන් පත් කිරීම රාජ්‍ය බැංකු අධීක්ෂණය භාර අමාත්‍යවරයා විසින් 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතේ සහ එහි සංශෝධන වල විධිවිධාන වලට අනුව සිදු කරනු ලබයි. එම නිසා අධ්‍යක්ෂවරුන් පත් කිරීමට නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව සම්බන්ධ නොවේ. කෙසේ වෙතත් ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ දී ඉහළ මට්ටමේ නිපුණතා ඇති, වගකීම් හෙබවිය හැකි අධ්‍යක්ෂවරු පත් කිරීමට සැලකිලිමත් වනු ලබන අභ්‍යන්තර ප්‍රතිපත්තියක් අනුමත කර ඇත.
- ලංකා බැංකුවේ පරිපාලිත සමාගම් සඳහා අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ ප්‍රතිපත්ති නිර්දේශ කිරීම මෙම කමිටුවේ නිර්දේශ හරහා සිදු වේ.
- පහත සඳහන් ප්‍රතිපත්ති සංශෝධනය කර අළුතින් හඳුන්වා දෙන ලද ආයතනික යහපාලන ප්‍රතිපත්තිය හා අන්තර්ගත කරන ලදී.
  - බැංකුවේ සන්නිවේදන ප්‍රතිපත්තිය.
  - අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීන වෘත්තීය උපදෙස් සඳහා ප්‍රවේශය පිළිබඳ ප්‍රතිපත්තිය.
  - නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටුවේ ප්‍රඥප්තිය
- නිලධාරීන් ප්‍රධාන කළමනාකාරිත්ව කණ්ඩායමට පත් කළ හෝ උසස් කළ විට ඔවුන් එම තනතුරු දැරීමට නිසි හා යෝග්‍ය පුද්ගලයින් බවට සහතික කිරීම.
- ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයන්ගේ ශ්‍රේණියට පහළ අනුප්‍රාප්තික සැළසුම් පිළිවෙත් සකස් කිරීමේහිදී කෘතිම බුද්ධි මෙවලම් භාවිතා කරමින් පසු විපරම් කෙරුණි.
- ආයතනික කළමනාකාරිත්ව පිරිස් සහ විධායක කළමනාකාරිත්ව පිරිස් සඳහා අනුප්‍රාප්තික සැලැස්ම සමාලෝචනය කළේය.
- ප්‍රධාන කළමනාකාරිත්ව කණ්ඩායමට නායකත්ව සංවර්ධනය සඳහා පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීම.
- කළමනාකාරිත්වය විසින් නිර්දේශ කරන ලද පරිදි, ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින්ගේ නව තනතුරු නාම හඳුන්වාදීම හා ස්ථාන මාරු සමාලෝචනය කොට නිර්දේශ කෙරුණි.
- අදාළ ආයතනික යහපාලන රෙගුලාසි හා අනුකූලතාවය සහතික කෙරුණි.
- 2021 වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඇගයීම් වාර්තාව නිර්දේශ කරන ලදී.

ඉදිරි දැක්ම

නියාමකයින් විසින් නිකුත් කරනු ලබන උපදෙස් ක්‍රියාත්මක කිරීම කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරමින්, කමිටුව ලංකා බැංකුව තුළ ප්‍රශස්ත යහපාලන පරිචයන් පවත්වා ගෙන යාමට උපරිමයෙන් කටයුතු කරනු ඇත.

සමාප්තිය

සාමූහිකව සිදු කරන ලද වාර්ෂික ඇගැයීම් තුළින් කමිටුව සිය කාර්යයේ කාර්යක්ෂමතාව සමාලෝචනය කළේය. මෙම කමිටුවේ කාර්යයන් තුළින් කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් වලට තවදුරටත් වටිනාකමක් එක්කරනු ඇත.

නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව වෙනුවෙන්



ජයම්පති මොල්ලිගොඩ
සභාපති
නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව

2022 ජනවාරි 31

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වාර්තා

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු වාර්තාව

2021 වසර තුළ කමිටුවේ සංයුතිය

පහත සඳහන් අධ්‍යක්ෂවරු 2021 වසර තුළ කමිටුවේ සාමාජිකයන්ව සිටියහ.

(1) ජී හර්ෂ විජයවර්ධන මහතා
සභාපති/ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

(2) ඒ සී මහිල්ක ප්‍රනාන්දු මහතා
සාමාජික/ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

(3) ජයම්පති මොල්ලිගොඩ මහතා[1]
සාමාජික/ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

කමිටුවේ ලේකම්

නීතිඥවරියක මෙන්ම නියෝජ්‍ය මහා කළමනාකාරිණී තනතුර ද දරණ ලේකම්, ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, කමිටුවේ ලේකම් ලෙසද ක්‍රියා කරයි.

අබණ්ඩව සහභාගිවන්නන්

- මහා කළමනාකරු
- ප්‍රධාන තොරතුරු නිලධාරි/ තොරතුරු තාක්ෂණ ප්‍රධානී
- නියෝජ්‍ය මහා කළමනාකරු (නිමැවුම් හා බැංකුකරණ සංවර්ධන)
- ප්‍රධාන අවදානම් නිලධාරි

ආරාධනයෙන් පමණක් සහභාගී වන්නන්

- තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවට සම්බන්ධ සහකාර මහා කළමනාකරුවන්
- සහකාර මහා කළමනාකරු (නිමැවුම් සංවර්ධන කටයුතු සහ ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණ)
- කමිටුවේ අභිමතය පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ, ආයතනික කළමනාකාරිත්වයේ හෝ කාර්ය මණ්ඩලයේ වෙනත් ඕනෑම සාමාජිකයෙකු

නිරීක්ෂකයකු ලෙස සහභාගි වන්නන්

- ප්‍රධාන අභ්‍යන්තර විගණක

2021 වසරේදී පැවැත් වූ රැස්වීම් වාර ගණන: නවයයි
(සාමාජික සහභාගීත්වය මෙම වාර්තාවේ පිටු අංක 88 හි දක්වා ඇත.)

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව හා සබැඳි වාර ගණන: එකයි

ගණපූර්ණය: සාමාජිකයන් දෙදෙනෙකු

කමිටුවේ කාර්යභාරය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවේ ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අනුගමනය කරනු ලබන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු ප්‍රඥප්තියේ සඳහන් කරුණු මත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවේ විෂය පථය සකස් කර ඇත.

ප්‍රධානතම අවධානය

කමිටුවේ මූලික අරමුණ වනුයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණ වගකීම ඉටු කිරීම සඳහා බැංකුවේ තොරතුරු තාක්ෂණ නිෂ්පාදන හා සේවා, ප්‍රතිපත්තීන් සහ භාවිතයන් සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සඳහා තොරතුරු තාක්ෂණ නිෂ්පාදන සහ ප්‍රධාන තාක්ෂණික ආයෝජනයන්හි ක්‍රියාකාරිත්වය ඵලදායීව පවත්වා ගැනීමට සහය වීමයි. එමඟින් බැංකුවේ යටිතල පසුකම් සහ හැකියාවන් ශක්තිමත් ලෙස සෑම විටම ස්ථානගත කොට ඇති බවටත් නව තාක්ෂණික ප්‍රවණතා විශ්ලේෂණය කොට බැංකුවේ ආයතනික සැලැස්මට අනුගත වෙමින් හා ඉහළම ක්‍රියාපිළිවෙත් ඔස්සේ පවත්වා ගෙන යන බවටත් සහතික කරයි.

වාර්තාකරණ ක්‍රියාමාර්ග

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු රැස්වීම් වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කෙරෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සිදු කෙරේ.

2021 වසර තුළ අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම්

- කමිටු ප්‍රඥප්තිය සංශෝධනය කෙරුණි.
- බැංකුවේ ක්‍රියාත්මක තොරතුරු තාක්ෂණ වර්ධනයන්/ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ව්‍යාපෘති පසු විපරම් කොට යෝජිත වර්ධනයන්/ ඉහළ නැංවීම මත මඟ පෙන්වීම.
- බැංකුවේ පවත්නා තීරණාත්මක භාවිතයන්ගේ මෙහෙයුම් විපරම්කොට, පවත්නා ගැටළු නිරාකරණය/ සමථය කිරීම පිළිබඳ අත්‍යවශ්‍ය මඟපෙන්වීම සම්පාදනය.
- බැංකුවේ යෝජිත ඩිජිටල් බැංකුකරණ විසදුම (අන්තර්ජාල හා ජංගම බැංකුකරණ පද්ධතිය, බී ඇප්) හි ප්‍රගතිය සමාලෝචනය කරනු ලැබීය.
- බැංකුවේ ආයතනික වෙබ් අඩවියේ නව්‍යකරණය විවරණය කරන ලදී.
- 2022 තොරතුරු තාක්ෂණ ප්‍රසම්පාදන සැලැස්ම විවරණය කරන ලදී.
- ආයතනික සැලැස්ම තුළ ග්‍රහණය කරන ලද බැංකුවේ ඩිජිටල් ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡා කරන ලදී.
- බැංකුව සඳහා අන්තර්ජාල මත පදනම්ව ඊ - ගෙවීම් විසඳුම ක්‍රියාත්මක කිරීම පිළිබඳව සාකච්ඡා කරන ලදී.
- ඩිජිටල් අළෙවිකරණ වේදිකාවට මුල පුරන ලදී.
- බැංකුවේ ඩිජිටල් අත්සන් අනුමත කිරීමේ ව්‍යාපෘතියක් සඳහා මුල පුරන ලදී.
- යෝජිත ජීව දත්ත පදනම් කරගත් හඳුනාගැනීමේ විසදුම් විවරණය කරන ලදී.
- තොරතුරු තාක්ෂණ අංශය සඳහා අවශ්‍ය මානව සම්පත් සැපයුමට සහය වන ලදී.
- ප්‍රධාන තොරතුරු නිලධාරිගේ ගිවිසුම කල් ඉකුත් වීම සමඟ නව ප්‍රධාන තොරතුරු නිලධාරිවරයෙකු බඳවා ගැනීම සඳහා ක්‍රමවේදය ආරම්භ කරන ලදී.
- පහත දැක්වෙන නිර්දේශ කරනු ලැබීය.
  - ගනුදෙනුකරුවන්ගේ සබැඳියාව කළමනාකරණය උදෙසා ක්‍රියා පිළිවෙත් පද්ධතියක්
  - ඊ- අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය.
  - එළඹෙන වසර තුනේ සිට පහ දක්වා තොරතුරු තාක්ෂණ මාර්ග සිතියම පිළියෙළ කිරීම හා බැංකුවේ තොරතුරු තාක්ෂණ අපර ව්‍යුහය සංවිධිත කිරීම සඳහා කාර්මික විශේෂඥයන්ගෙන් සමන්විත කමිටු පහක් ස්ථාපිත කිරීම.
  - ණය තක්සේරුව සඳහා කෘත්‍රිම බුද්ධි මෘදුකාංග මෙවලමක් සංවර්ධනය කිරීම.
  - සයිබර් ආරක්ෂාව සහතික කරලීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග.
  - තොරතුරු තාක්ෂණ අංශය සඳහා ප්‍රභව කේත කළමනාකරණ පද්ධතියක්.

2021 වසර තුළ කමිටු සාමාජිකයෙකුව සිටිමින් මේ වන විට අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉවත් වී ඇති ජයම්පති මොල්ලිගොඩ මහතා විසින් මෙම කමිටුව කෙරෙහි දැක්වූ අගනා දායකත්වය පිළිබඳව ඒ මහතා වෙනුවෙන් ඇගයීම වාර්තා කරන්නට කමිටුව අදහස් කරයි.

ඉදිරි දැක්ම

මෙම අභියෝගාත්මක කාලසීමාවේ මෙන්ම නව සාමාන්‍ය පරිසරය තුළද බැංකුව ප්‍රති-හැඩතල ගත කිරීමෙහි ලා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අපර ව්‍යුහය ප්‍රත්‍යස්ථික වන බව තහවුරු කරලීම කෙරෙහි කමිටුව විහි උපරිම සහය ලබා දෙනු ඇත.

සමාප්තිය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවේ සාමාජිකයින් 2021 වර්ෂය තුළ කමිටුවේ කාර්යසාධනය, ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාව ඇගැයීමට ලක් කර ඇත.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව වෙනුවෙන්



ජී හර්ෂ විජයවර්ධන
සභාපති
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව

2022 පෙබරවාරි 24

1 ජයම්පති මොල්ලිගොඩ මහතා 2021 මාර්තු 04 දින සිට බලපැවැත්වෙන පරිදි කමිටුවට පත් වූ අතර 2022 ජනවාරි 31 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්විය.

අවදානම් කළමනාකරණය

2021 වර්ෂය තුළ අවදානම් සන්දර්භය

කොවිඩ්-19 වසංගතයේ පුළුල් සමාජ-ආර්ථික බලපෑම් 2021 වර්ෂය තුළ ද අවධානය ග්‍රහණය කර ගත්තේ බැංකුවල අවදානම් සන්දර්භය තුළ විශාල බලපෑමක් නිරූපණය කරමිනි. ව්‍යාපාරික අවිච්ඡින්නතාවට, සැපයුම් දාමයන්ට හා මූල්‍ය වෙළඳපළවලට බලපෑම් විල්ලු කළ වසංගත-පාදක බිඳවැටීම් හමුවේ ලොව පුරා බැංකු අක්‍රීය ණයවල නියත ඉහළ යාමකට හා ශේෂපත්‍ර කම්පනයන් සඳහා සූදානම් වූහ. ශ්‍රී ලංකාවේ බැංකු සඳහා මෙම අභියෝගයන් සාර්ව ආර්ථික අවදානම් පාත්‍රතා මඟින් තවත් සංකීර්ණ කරන ලද අතර, ඒ සඳහා අවදානම් කළමනාකරණ ක්‍රියාවලි ශක්තිමත් කිරීම, විශේෂයෙන්ම ණය අවදානම හා ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීම අවශ්‍ය විය.



ආර්ථික තත්ත්වය

වර්ෂයේ 2 වන හා 3 වන කාර්තු තුළ වසංගතය විසින් මෙහෙයවන ලද බිඳවැටීම් මඟින් ආර්ථික වර්ධනය වැළැක්විය නොහැකි ලෙස බලපෑමට ලක් වූ අතරම, 4 වන කාර්තුව තුළ යථා තත්ත්වයට පත් වීමෙහි ජවය වර්ධනය විය. ආර්ථිකය පහළ යාමෙහි මුඛ්‍ය අවදානම්වලට ඇතුළත් වන්නේ:-

- රුපියල මත පීඩනය හා විදේශ මුදල් ද්‍රවශීලතාව
- ඉහළ නඟින උද්ධමනය
- අවදානම ඉහළ ගිය කර්මාන්ත
- සැපයුම් බිඳවැටීම්
- ආනයන සීමා



භූ-දේශපාලනික තත්ත්වය

කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් මතු වූ භූ-දේශපාලනික අවිනිශ්චිතතාවන් 2021 වර්ෂයේ 4 වන කාර්තුව වන විට ක්‍රමයෙන් පහව යෑම ඇරඹූ නමුදු, ගෝලීය ආරක්ෂාව හා දේශපාලන සබඳතා සමඟ බද්ධ වූ ජගත් ක්ෂේත්‍රයෙහි මෑතකාලීන අර්බුදය බලශක්ති හා වෙනත් භාණ්ඩවල මිල ගණන් පෙර නොවූ විරූ මට්ටම්වලට ඉහළ නැංවීමට දායක වී තිබේ.



නියාමන ප්‍රවණතා

මුදල් ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීමට යොදනු ලැබූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට අතිරේකව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රටින් පිටවන මුදල් ප්‍රවාහය අවම කිරීම හරහා විදේශ මුදල් සුරැකීමට (විශේෂයෙන්ම බැංකු ක්ෂේත්‍රය තුළ) ක්‍රියාමාර්ග රාශියක් ක්‍රියාත්මක කරන ලදී.



තාක්ෂණවේද හා සයිබර් අවදානම

පෙර නොවූ විරූ ලෙස ඩිජිටල් වේදිකා සඳහා යොමුවීම ස්ථිර ලෙසම පැවතිය හැකි අතර එමඟින් සයිබර් තාක්ෂණ ආරක්ෂණය, මූල්‍ය අපරාධ හා තොරතුරු තාක්ෂණ ව්‍යූහය ආශ්‍රිත අවදානම ඉහළ යනු ඇත.



දේශගුණ විපර්යාසය

විපරීත කාලගුණික රටා හා ස්වාභාවික විපත් ඇතුළු දේශගුණ විපර්යාස කෙරෙන් මතු වන අවදානම් අද ලෝකය මුහුණ දෙන වඩාත් ප්‍රමුඛ අවදානම් අතර වේ. ලංකා බැංකුව සම්බන්ධයෙන් ගත් කළ, දේශගුණික අවදානම් කෘෂිකාර්මික ණය කළඹට බලපෑම් විල්ලු කරන අතර, ඉන් (මෙහෙයුම් අඛණ්ඩතාවට බලපෑම් විල්ලු කරන) භෞතික අවදානම් හා අඩු කාබන් ආර්ථිකයකට යොමු වීමෙන් ඇතිවන සංක්‍රාන්ති අවදානම ආදිය මඟින්ද යම් අනිටු ඵල ඇති විය හැකිය.



තරඟකාරීත්වය

අභිනවයෙන් ක්ෂේත්‍රයට පිවිසෙන්නන්ගේ විශේෂයෙන්ම ඩිජිටල් බැංකු, ජංගම සේවා සම්පාදකයින් හා මූල්‍ය සම්පාදක තාක්ෂණයන් මඟින් ඇතිවන තරඟකාරී තර්ජනය ඉහළ ගොස් ඇති අතර, ඒවා සාම්ප්‍රදායික බැංකුවල හා ඒවායේ මිල නියම කිරීමේ ආකෘතිවල තරඟකාරී තත්ත්වයන් මත පීඩනයක් විල්ලු කර ඇත.

අවදානම් කළමනාකරණය

කාර්යසාධන විශ්ලේෂාංග

ශුද්ධ පොළී ආන්තිකය



ද්‍රවශීල වත්කම් අනුපාතය



ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය



අවදානම් කළමනාකරණය කරා වූ අපගේ ප්‍රවේශය

ලංකා බැංකුවේ අවදානම් කළමනාකරණය බැංකුව සිසාරා ඇති අවදානම් කළමනාකරණ රාමුව මගින් ශක්තිමත් කෙරෙන අතර එමගින් බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛත්වයන්, සංවිධානමය සංස්කෘතිය හා සංස්ථායික පිළිවෙත් කෙරෙහි අනුගත වීකීය රාමුවක් ඇතුළත සියලුම අවදානම් කළමනාකරණය කෙරෙන බවට වගබලා ගැනේ. නිරවුල්ව නිර්වචනය කෙරුණු ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි හරහා මෙම රාමුව කර්තව්‍යයන්, මෙහෙයුම් හා ක්‍රියාවලින් සිසාරා ඇති අවදානම් හඳුනා ගැනීම හා කළමනාකරණය කිරීම සඳහා උපකාරී වේ.

ආයතනික අවදානම් කළමනාකරණ රාමුව



අවදානම් පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලයට මනා අවදානම් කළමනාකරණය හා අනුකූලතාව සඳහා ඉහළම වගකීම ඇති අතර එහි අවදානම් ආශ්‍රිත රාජකාරිවලදී ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC), විගණන කමිටුව හා තොරතුරු සන්නිවේදන තාක්ෂණවේද කමිටුව එයට සහය වේ. එයට අමතරව, විධායක මට්ටමේ කමිටු කීපයක් ද බැංකුවේ අවදානම් සැකැස්ම එහි අවදානම් අභිරුචි සීමාවන් ඇතුළත කළමනාකරණය කෙරෙන බවට සහතික වීමේ වගකීම දරති. මෙම වර්ෂය තුළ බැංකුව සිය ණය කළඹ තුළ වන පාරිසරික හා සමාජීය අවදානම් හඳුනා ගැනීම හා කළමනාකරණය කිරීම පිණිසම කැප වූ පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධති (ESMS) ඒකකයක් පිහිටුවීය. අවදානම් තන්ත්‍රණ ව්‍යූහය පහත පරිදි වේ:





ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සංයුතිය

ස්වාධීන අධ්‍යක්ෂවරුන් දෙදෙනකුගෙන් හා විධායක නොවන අධ්‍යක්ෂවරුන් තුන් දෙනකුගෙන් සමන්විතය.

කාර්ය පටිපාටි රාමුව

- අවදානම් ආශ්‍රිත ප්‍රතිපත්ති රාමු, කාර්යපටිපාටි හා කමිටු ප්‍රඥප්ති කාලීනව සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම
- සෑම මුඛ්‍ය අංග සඳහාම දර්ශක හා නිරාවරණ මට්ටම් ද ඇතුළත් බැංකුවෙහි අවදානම් අභිරුචිය අනුමත කිරීම
- අවදානම්-ආශ්‍රිත කළමනාකරණ කමිටුවල සඵලදායී ක්‍රියාකාරිත්වය සහතික වීම
- අවදානම් හඳුනා ගැනීම, මැනීම, නිරීක්ෂණය හා හානි අවම කිරීම සඳහා ස්ථානගතව ඇති අදාළ මෙවලම්වල හා කාර්යපටිපාටිවල සප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම
- බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය (ICAAP) ඔස්සේ එහි ප්‍රාග්ධන තත්ත්වය හා අනාගත අවශ්‍යතාවන් සමාලෝචනය කිරීම
- විභව්‍ය අවදානම් අවස්ථා හඳුනා ගනු පිණිස නියමිත කාලයකට වරක් ප්‍රත්‍යාබල පරීක්ෂා ප්‍රතිඵල ඇගැයීම සහ අවදානම් හානි අවකාරකයන් යෝජනා කිරීම
- බැංකුවේ ව්‍යාපාරික අවිච්ඡින්නතා සැලැස්ම සමාලෝචනය කිරීම

ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශයේ සංයුතිය

ප්‍රධාන අවදානම් නිලධාරී විසින් ප්‍රධානත්වය දරනු ලබන අතර ස්වාධීනව ක්‍රියා කරයි.

කාර්ය පටිපාටි රාමුව

- අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා විශේෂිත මුඛ්‍ය අවදානම් දර්ශක, පරාසය හා සීමා නිර්ණය කිරීම ඇතුළුව අවදානම් අභිරුචිය නිර්ණය කිරීම.
- කාර්යසාධනය හා ප්‍රාග්ධනය මත ඇති බලපෑම තක්සේරු කරනු පිණිස, ඇති විය හැකි පීඩාකාරී අවස්ථා පිළිබඳ සිද්ධි-නිරූපන පරාසයක් වෙතින් පැන නගින අවදානම් තක්සේරු කිරීම සඳහා නිතිපතා ප්‍රත්‍යාබල පරීක්ෂාව සිදු කිරීම.
- ව්‍යාපාරික ඒකක (පළමු ආරක්ෂක වළල්ල) වෙත අවදානම් හඳුනා ගැනීමෙහි, නිරීක්ෂණය කිරීමෙහි හා වාර්තා කිරීමෙහි ලා උපකාර කිරීම.
- සඵලදායී ලෙස අවදානම් හානි අවමකිරීම සඳහා ක්‍රියාමාර්ග හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම සිදුකිරීම.
- ව්‍යාපාරික අවිච්ඡින්නතා සැලැස්ම සඵලදායී ලෙස ක්‍රියාත්මක කෙරෙන බවට වගබලා ගැනීම.
- නව නිෂ්පාදන හා ක්‍රියාවලීන් දියත් කිරීමෙන් පැන නැගිය හැකි විභව්‍ය අවදානම් තක්සේරු කිරීම.
- අවදානම් සවිඥානික සංස්කෘතියක් සංවර්ධනය කර ගැනීමෙහි ලා සේවකයින්ට අඛණ්ඩ සේවාස්ථ පුහුණුව හා සන්නිවේදන සැපයීම.
- බැංකුවෙහි විස්තීර්ණ අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය (ICAAP) සහ ප්‍රකෘතිකරණ සැලැස්ම පිළියෙළ කිරීම

අවදානම් කළමනාකරණය

ප්‍රතිපත්ති රාමුව

මෙම බැංකුවෙහි අවදානම් ආශ්‍රිත ප්‍රතිපත්ති 101 පිටුවෙහි ආයතනික අවදානම් කළමනාකරණ රාමුව යටතේ දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මෙම ප්‍රතිපත්ති හා රාමු මඟින් සංවිධානය සිසාරා අවදානම් හඳුනා ගැනීම, මැනීම හා කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් සංස්ථායී බව සහතික කරයි. ප්‍රතිපත්ති නිතිපතා සමාලෝචනය කිරීම යටතේ, ශ්‍රී ලංකා මහ බැංකු මාර්ගෝපදේශවලට, ක්ෂේත්‍රයේ විශිෂ්ටතම පිළිවෙත්වලට හා වත්මන් වෙළඳපළට ගැළපෙන ජවසම්පන්න ව්‍යාපාරික අවශ්‍යතාවන්ට අනුකූල වන බවට සහතික වනු පිණිස, පූර්ණ ප්‍රතිපත්ති මාලාවක් යාවත්කාලීන කරන ලදී. අදාළ ප්‍රතිපත්තිවලට ඇතුළත් කරන ලද සමාජීය හා තන්ත්‍රණ අවදානම ද සමගින් තෝරා ගනු ලැබූ ප්‍රතිපත්තිවල විෂය පථයද පුළුල් කරන ලදී. සමාලෝචිත වර්ෂය තුළ, අප බැංකුව බැංකු ක්ෂේත්‍රයෙහි මෙම අවදානම් ඉහළ යාම සැලකිල්ලට ගෙන ඒකාබද්ධ පාරිසරික හා සමාජීය කළමනාකරණ පද්ධති (ESMS) ප්‍රතිපත්තියක් හඳුන්වා දුනි. (සවිස්තරාත්මක සටහන් සඳහා 81 පිටුව බලන්න.)

ESMS ප්‍රතිපත්ති රාමුව

පරිසර හා සමාජීය අවදානම ඇගැයීම

ගනුදෙනු පරීක්ෂා කිරීම

↓

අවදානම් වර්ගීකරණය

↓

පාරිසරික හා සමාජීය කරුණු පිළිබඳ නිසි සැලකිලිමත් බව

↓

මූල්‍ය පහසුකම් සඳහා කොන්දේසි

පාරිසරික හා සමාජීය අවදානම නිරීක්ෂණය

සේවාලාභීන්ගේ/ආයෝජිතයන්ගේ පාරිසරික හා සමාජීය කාර්යසාධන ඇගයීම්

↓

අනුකූල නොවීම් කළමනාකරණය කිරීම

අවදානම් සංස්කෘතිය

මෙම බැංකුව මතුව එන අවදානම් හඳුනා ගැනීමට, සාකච්ඡාවට භාජනය කිරීමට, ඉහළ අවධානයට ගෙන ඒමට හා අවකරණය කිරීමට හැකියාව ඇති පරිණාමනය වන හා ආයතනය සිසාරා ඇති අවදානම් සංස්කෘතියක් පෝෂණය කරයි. බැංකුවෙහි ත්‍රිත්ව ආරක්ෂක මාර්ග ආකෘතිය සමඟ දිශාගතව ඇති සංවිධානමය හා වෙළඳපළ හැසිරීම පිළිබඳ දැනුම, අභ්‍යන්තර පාලනවිධි, චර්යාධර්ම සංග්‍රහය හා ප්‍රතිපත්ති පිළිබඳව වූ ශක්තිමත් අවධාරණය අඛණ්ඩව ලාභය හා පාරිසරික හා සමාජීය කාර්යසාධනයන්හි තිරසර මට්ටමක් ළඟාකර ගැනීමෙහි ලා දායක වෙමින් ඇත්තේ අවදානම්-ප්‍රතිලාභ ගතිකයන්ද සැලකිල්ලට ලක් කරමිනි.

අවදානම් අභිරුචිය

බැංකුවේ අවදානම් අභිරුචිය නිර්වචනය කර ඇත්තේ එහි උපායමාර්ගික හා මූල්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීම ඇතුළත ගැනීමට සූදානම් අවදානමේ මට්ටම ලෙස ය. එය අවදානම් විධිවිධාන වශයෙන් ප්‍රමාණාත්මකවද, ප්‍රතිපත්ති හා පාලනවිධි ලෙස ගුණාත්මකවද ප්‍රකාශනය කෙරේ. අවදානම් නිරාවරණයන් පිළිබඳ නිර්දේශිත සීමාවන්ට අමතරව, අවදානම් අභිරුචි ප්‍රකාශයෙහි අවදානම් අභිරුචි මට්ටම් පසුකරන අවස්ථා ඇතුළත් වන අතර, එම සීමා ඉක්මවන/පසුකරන අවස්ථාවන්හිදී ගත යුතු විශේෂිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගද නිර්වචනය කරයි. බැංකුවෙහි උපායමාර්ගික අභිප්‍රායන් සහ වෙළඳපළ ඉඩප්‍රස්ථාවන් ද, අවදානම්-ප්‍රතිලාභ ගතිකයන් අතර ප්‍රශස්තතම සමබරතාවද සැලකිල්ලට ගෙන එය වාර්ෂිකව සමාලෝචනය කෙරේ.

අවදානම් අභිරුචි ප්‍රකාශය හා සංවර්ධනයන් - 2021

අවදානම් ප්‍රමිතික	දර්ශකය/ ක්‍රමවේදය	කාර්ය සැලැස්ම
ණය අවදානම		නිතිපතා නිරීක්ෂණය කිරීම හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හරහා ව්‍යතිරේකයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම
සංකේන්ද්‍රණ අවදානම	නිෂ්පාදන අනුව HHI ක්ෂේත්‍ර අනුව HHI භූගෝලීය කලාප අනුව HHI (Herfindahl-Hirschman index)	
පැහැරහැරීමේ අවදානම	ඇස්තමේන්තු ගත අක්‍රීය වත්කම් අනුපාතය % ශ්‍රේණි අනුව වූ සීමා අංකනය කිරීම	
වෙළඳපළ අවදානම		
විනිමය අනුපාතික අවදානම	අවදානමේ දී විදේශ විනිමය වටිනාකම (Exvar)	
ස්කන්ධ අවදානම	අවදානමේ දී ස්කන්ධ වටිනාකම (Equity var)	
පොළී අනුපාතික අවදානම	පාදක ඒකකය සඳහා මිල වටිනාකම් (PVBP)	
ද්‍රවශීලතා අවදානම		
ද්‍රවශීලතාව	ද්‍රවශීලතා අනුපාත විතැන්වීම් විශ්ලේෂණය	
මෙහෙයුම් අවදානම		
මෙහෙයුම් අලාභය	ක්ෂේත්‍ර අනුව මෙහෙයුම් අලාභ සීමා	

මෙහෙයුම් අලාභය

බැංකුව සිය අවදානම් අභිරුචියට සාපේක්ෂව වත්මන් හා විභව්‍ය අවදානම් පැතිකඩෙහි සංවේදිතාව තක්සේරු කිරීමට නිතිපතා ප්‍රත්‍යාබල පරීක්ෂාව භාවිත කරයි. ප්‍රත්‍යාබල පරීක්ෂා රාමුව සඳහා සාර්ව-ආර්ථික හා ව්‍යාපාරික ආකෘති ප්‍රත්‍යාබල පරීක්ෂාව ඇතුළු ශිල්පක්‍රම සංකලනයක් භාවිත කරයි.

ප්‍රත්‍යාබල පරීක්ෂාව පූර්ව-ක්‍රියාකාරී කළමනාකරණය හරහා බැංකුව මුළුල්ලේ අවදානම් දැනුවත්භාවය වැඩි කිරීමට හා ව්‍යාපාරික අවිච්ඡින්නතාව සුරක්ෂිත කිරීමට ඉලක්ක කරයි. එය අවදානම් හඳුනා ගැනීමට හා පාලනය කිරීමට, වෙනත් අවදානම් කළමනාකරණ මෙවලම්වල අනුපූරක සැපයීම, ප්‍රාග්ධන හා ද්‍රවශීලතා සැලසුම්කරණය සහ ව්‍යාපාරික තීරණ ගැනීම පහසු කිරීම යන අංශවලින් බැංකුවට සහය වෙයි.

අවදානම	ප්‍රත්‍යාබල සිද්ධි-නිරූපනය	බලපෑම්
අක්‍රීය වත්කම්වල අහිතකර විචලනය	දළ අක්‍රීය වත්කම් අනුපාතයේ වැඩිවීම	▶ ප්‍රාග්ධන තත්ත්වය හා උපායමාර්ගික ව්‍යාපාරික සැලසුම්කරණය පිළිබඳව අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය සමඟ අනුකූල තීරණ
	ප්‍රාග්ධන තත්ත්වය හා උපායමාර්ගික ව්‍යාපාරික සැලසුම්කරණය පිළිබඳව අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය සමඟ අනුකූල තීරණ	
රජයේ නිරාවරණය අහිමි වීම	රජයේ නිරාවරණය අඩු වීම	
ඇපකර වල ගුණාත්මකභාව	ඇපකර හීන වීම	▶ ප්‍රාග්ධන හා ද්‍රවශීලතා ස්වාරක්ෂක පිළිබඳ තීරණ
තැන්පතු නැවත ලබාගැනීම සඳහා අසාමාන්‍ය ඉල්ලුම්	තැන්පතු පහළ වැටීම	
විදේශ විනිමය උච්ඡාවචනය	අහිතකර විදේශ විනිමය සංචලනය	▶ අවදානම් අභිරුචි ඉලක්ක හා ක්‍රියාමාර්ග පිළිබඳ තීරණ
පරිපාලිත ආයතනයන්ගෙන් බලපෑම්	පරිපාලිත තුළ ආයෝජන හානිකරණය වීම	
සංකේන්ද්‍රණ අවදානම	අනෙකවූ සංකේන්ද්‍රණය ඉහළ ණය ගැනුම්කරුවෝ ඉහළ තැන්පත්කරුවෝ ක්ෂේත්‍රමය සංකේන්ද්‍රණය	▶ සම්භව්‍යතා සැලසුම්කරණය

අවදානම් වාර්තාකරණය

සියලුම අවදානම් නිරාවරණයන් අදාළ අවදානම් කමිටු හරහා නිතිපතා පදනමකින් අධ්‍යක්ෂ මණ්ඩලය හා ආයතනික කළමනාකාරිත්වය වෙත වාර්තා කෙරේ. අවදානම් අභිරුචි දර්ශකවලට සාපේක්ෂව අවදානම් දර්ශක පුවරු හා කාර්යසාධනයෙන් සමන්විත විස්තීර්ණ අවදානම් වාර්තාවක් මාසිකව හෝ අවශ්‍ය පරිදි හා අවශ්‍ය අවස්ථාවේදී ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) වෙත ලබා දෙනු ලැබේ. වර්ෂය තුළ පැවති තත්ත්වයන් හමුවේ කෝවිඩ්-19 වසංගතයේ බලපෑම්වලට ඔරොත්තු දෙනු පිණිස යොදා ගනු ලැබූ අවදානම් හානි අවකාරකයන් මත විශේෂ අවධානය ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවදානම් වාර්තාකරණය ශක්තිමත් කරනු ලැබීය.

අවදානම් වපසරිය

බැංකුවෙහි අවදානම් වපසරිය අභ්‍යන්තර අවදානම්වලින් මෙන්ම බාහිර පරිසරයෙන් මතුවන අවදානම්වලින් සමන්විත ය. මෙහෙයුම් පරිසරය තුළ වර්ධනය වන සංකීර්ණතා ද සමග, බැංකුව පාරිසරික හා සමාජීය අවදානම් මත සිය අවධානය වැඩි කරනු පිණිස, නිරීක්ෂණය කරනු ලබන අවදානම්වල විෂය පථය පුළුල් කර ඇත. අභ්‍යන්තර අවදානම් ක්‍රමානුකූල ලෙස පූර්ව-ක්‍රියාකාරී පදනමකින් කළමනාකරණය කරනු ලබන අතර, අපගේ මෙහෙයුම් මත විභව්‍ය කම්පනයන් තක්සේරු කරනු පිණිස බැංකුව විසින් බාහිර අවදානම් අඛණ්ඩ පදනමින් නිරීක්ෂණය කරනු ලැබේ.

පාරිසරික අවදානම
(පිටුව 112)

නෛතික අවදානම
(පිටුව 112)

තාක්ෂණික අවදානම

තොරතුරු හා සයිබර් ආරක්ෂක අවදානම
(පිටුව 111)

නියාමනීය හා අනුකූලතා අවදානම
(පිටුව 112)

කීර්තිනාම අවදානම
(පිටුව 112)



ණය අවදානම
(පිටුව 103-106)

වෙළඳපළ අවදානම
(පිටුව 107-108)

අරමුදල් සම්පාදන හා ද්‍රවශීලතා අවදානම
(පිටුව 109)

මෙහෙයුම් අවදානම
(පිටුව 110-111)

උපායමාර්ගික අවදානම
(පිටුව 112)

2021 වර්ෂය තුළ අවදානම් කාර්යසාධනය

ණය අවදානම

එකඟව සිටින නියමයන් අනුව වූ වගකීම්භාරයන් ඉෂ්ට කිරීමට ණය ගනුදෙනුවක ප්‍රතිපාර්ශ්වයක් අපොහොසත් වීම නිසා පැන නගින විභව්‍ය අලාභයන් මෙයට ඇතුළත්ය. ණය අවදානම බොහෝ විට පැහැර හැරීම් අවදානම හෝ ප්‍රතිපාර්ශ්ව, භූගෝලීය කලාප හෝ කර්මාන්ත අංශ සංකේන්ද්‍රණය යන ස්වරූප ගත හැකිය.

ණය අවදානම් කළමනාකරණය

මූලික වශයෙන් ගනුදෙනුකරු-අභිමුඛ ප්‍රාථමික ව්‍යාපාරික අංශ වෙතින් එන ණය සහිත ලංකා බැංකුවේ ණය අවදානම් කළමනාකරණ රාමුව ත්‍රිත්ව ආරක්ෂක මාර්ග ආකෘතිය ඔස්සේ තන්ත්‍රණය කෙරේ. ශක්තිමත් රාමුවක් මඟින් බැංකුව සිසාරා ඒකාකාර ලෙස සහ බැංකුවේ අවදානම් අභිරුචියට අදාළව ණය අවදානම් හඳුනා ගැනීමට හැකියාව ලබා දෙයි. ණය අවදානම් කළමනාකරණ න්‍යායපත්‍රය ඉදිරියට ගෙන යාමෙහි ලා භාවිතා කෙරෙන තන්ත්‍රණ ව්‍යුහයන්, ප්‍රතිපත්ති රාමු හා ක්‍රමවේද පිළිබඳ දළසටහනක් පහත දැක්වේ:

අවදානම් කළමනාකරණය

අධ්‍යක්ෂ මණ්ඩලය

බැංකුවෙහි අවදානම් නිරාවරණයන් එහි නියම කර ඇති අවදානම් අභිරුචිය ඇතුළත පිහිටන බවට වග බලා ගැනීමේ ප්‍රමුඛතම වගකීම දරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

සිය අවදානම් කළමනාකරණය ආශ්‍රිත රාජකාරි පිළිබඳ අධීක්ෂක වගකීම හරහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වෙයි.

ණය කමිටුව (මහා කළමනාකරු - මුලසුන දරයි)

- අවදානම් අභිරුචි සීමා සැකසීම, සමාලෝචනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
- බලයලත් සීමා ඇතුළත ණය යෝජනා අනුමත/ නිර්දේශ කිරීම
- බැංකුවෙහි අවදානම් ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ තුළ නියාමන අනුකූලතාව සහතික වීම
- ණය ආශ්‍රිත ප්‍රතිපත්ති නිර්දේශ කිරීම
- අවදානම් සංකේන්ද්‍රණයන් නිරීක්ෂණය

ණය අවදානම් කළමනාකරණ ඒකකය

පළමු ආරක්ෂක වළල්ලෙහි ස්වාධීන සමාලෝචනය ලබා දීම හා බැංකුව මුළුල්ලේම ණය අවදානම් කළමනාකරණය හා අධීක්ෂණය කිරීම සිදු කරයි.

ණය ගුණාත්මකභාව සහතික කිරීමේ ඒකකය

කලින් කලට විශාල ණය නිරාවරණයන් අනුමත කිරීමෙන් පසු සමාලෝචනය සිදු කරයි.

පාරිසරික හා සමාජීය කළමනාකරණ පද්ධති (ESMS) ඒකකය

බැංකුවේ ණය කළඹ තුළ පාරිසරික හා සමාජීය අවදානම් වෙත නිරාවරණය හඳුනා ගෙන කළමනාකරණය කරයි.

ණය අවදානම් කළමනාකරණ රාමුව

මෙම බැංකුවෙහි විස්තීර්ණ ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය මඟින් පහත සඳහන් ණය-පූර්ව අනුමැතීන් හා ණය-පශ්චිම නිරීක්ෂණ යාන්ත්‍රණ සඳහා අවසර ලැබේ.

ණය-පූර්ව අනුමැතිය

- ව්‍යුහගත ණය ඇගැයීම් යාන්ත්‍රණ හා නිර්වචනය කරන ලද ණය නිර්ණායක
- විවිධ මට්ටම්වල අනුමත කිරීමේ බලය හා ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) විසින් ස්වාධීන සමාලෝචනය
- පැහැර හැරීම, සංකේන්ද්‍රණය හා ප්‍රතිපාර්ශ්ව වැනි ණය අවදානම් ප්‍රභේද සඳහා සීමා
- ශාඛා ණය ගනුදෙනු ඇගැයීම් පත්‍රිකා හා ණය ගැනුම්කරුවන් ශ්‍රේණිගතකරණ ආකෘති
- අවදානම්-පාදක මිලකරණය
- නියාමනීය සීමා

ණය-පශ්චිම නිරීක්ෂණය

- අඛණ්ඩ හා දෘඪතර ණය සමාලෝචන
- ණය කළඹ ඇගැයීම
- අවශ්‍යතා හා ප්‍රත්‍යාබලයන් හඳුනා ගැනීමෙහි ලා ගනුදෙනුකරුවන් සමග පූර්ව-ක්‍රියාකාරී ලෙස නිරත වීම
- හඳුනාගත් ණය ගැනුම්කරුවන් නිරතුරුව අධීක්ෂණය කිරීම
- ප්‍රත්‍යාබල පරීක්ෂාව හා සිද්ධි-නිරූපන විශ්ලේෂණය
- ණය ගුණාත්මකබව සහතික කිරීමේ ඒකකය මඟින් ණය සමාලෝචන ක්‍රියාවලිය සහතික කිරීම

මුඛ්‍ය මූලධර්ම

රාජකාරි වෙන් කිරීම

ණය ඇගැයීමේදී හා ණය දීමෙන් පසු නිරීක්ෂණය කිරීමේ දී රාජකාරි වෙන් කිරීම මඟින් ඇගැයීම් මාර්ගෝපදේශයන්හි වාස්තවික බව හා සඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කෙරේ. අනුමත කිරීමේ බලධාරීන් වෙත ප්‍රදානය කර ඇති එකිනෙකට වෙනස් බල සීමාවන් හා ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) විසින් ස්වාධීන ලෙස සමාලෝචනය කිරීම මඟින් රාජකාරි සඵලදායක ලෙස වෙන් කෙරෙන බවට සහතික කෙරේ.

ඇප කළමනාකරණය

සිදුවිය හැකි පැහැර හැරීමකට විරෙහිව අස්වැසිල්ලක් වශයෙන් බැංකුව මුදල්, රත්‍රං, දේපළ, ස්ථාවර වත්කම්, ණයගැතියන්, ලැබිය යුතු ශේෂයන් වැනි ඇප සුරැකුම් ගණනාවක් හා තවත් දේ ලබා ගනී. ලබා දෙන ලද පහසුකමට ප්‍රමාණවත් ආවරණයක් ඇති බවට වගබලා ගනු පිණිස නිරන්තරයෙන් ඇප සුරැකුම් තක්සේරු කිරීම සිදුකෙරේ.

ණය ශ්‍රේණිකරණ ආකෘති

බැංකුව ශාඛා ණය හා ආයතනික අංශය ඇගැයීම සඳහා අභ්‍යන්තරිකව සංවර්ධනය කරන ලද ණය ඉල්ලුම්පත්‍ර ඇගැයීම් සටහන් පත් හා ආයතනික/මැදි ආයතනික ණය ගැනුම්කාර ශ්‍රේණිකරණ ක්‍රමයක් භාවිත කරයි. ආයතනික ණය ගැනුම්කාර ශ්‍රේණිකරණය ආකෘතීන් ණය ශ්‍රේණිකරණ හා විද්‍යාත්මක මිලකරණ ක්‍රමවේදයක් සමග යුගල වී ඇති අතර ආකෘති නිරවද්‍යතාව හා ප්‍රමාණවත් බව දෘඪතර තන්ත්‍රණ යාන්ත්‍රණයක් යටතේ ස්වාධීන ලෙස සත්‍යාපනය කෙරේ.

වගකීමෙන් යුතු ණය ලබාදීමේ සංස්කෘතිය

සේවකයින්ට කාර්යයේ නිරත කරවීම, වැඩමුළු, පුහුණු කිරීම් හා ඊ-ඉගෙනුම් ආකෘති හරහා සිය ණය ඇගැයීම් හා ණය කළමනාකරණ කුසලතා ශක්තිමත් කර ගැනීමේ ඉඩප්‍රස්ථා අබණ්ඩව ලබා දෙනු ලබන අතර මෙමඟින් වගකීමෙන් යුතු හා අවදානම් සවිඥානක සංස්කෘතියක් නිර්මාණය කෙරෙන බවට සහතික කරයි.

2021 වර්ෂය තුළ ණය අවදානම් කාර්යසාධනය හා පැතිකඩ

2021 වර්ෂය තුළ සන්දර්භය:- වසංගතය මගින් ඇති කරන ලද මෙහෙයුම් බාධකයන් හා සාර්ව ආර්ථික පසුබෑම මත ඇති කරන ලද පීඩනය හේතුවෙන් ණයගැනුම්කරුවන්ගේ ආපසු ගෙවීමේ හැකියාව පහළ වැටුණු අතර එමගින් කළඹ ගුණාත්මකතාව මත පීඩනයක් ඇති විය. වසංගතය හා සාර්ව ආර්ථික දුබලතා හේතුවෙන් ද ක්ෂේත්‍ර-විශේෂිත පීඩනයන් ද දක්නට ලැබුණු අතර, සංචාරක, වෙළඳ, පරිභෝජනය හා ඉදිකිරීම් වැනි කර්මාන්ත මන්දගාමී වීමක් වාර්තා කර ඇත. ලංකා බැංකුවට කළඹ ගුණාත්මකතාව රැක ගැනීමේ හා ඒ අතර සිය ගනුදෙනුකරුවන්ට දීර්ඝ-කාලීන වාණිජ තිරසාරභාවය පවත්වා ගෙන යාමට උපකාර කිරීමේ විකිනෙක තරගකාරී අභිලාෂයන් සමබර කර ගැනීමට සිදු විය. නියාමකයා ණය ගෙවීමේ කාල පමා සහනය 2022 ජූනි දක්වා දීර්ඝ කිරීම මගින් අබණ්ඩව පීඩාවට ලක් වූ ව්‍යාපාරවලට උපකාරී විය.

2021 දී අවධානය යොමුකරන ලද අංශ සහ සංවර්ධන

වර්ෂය තුළ පැවති තත්ත්වයන් හමුවේ, බැංකුවෙහි ණය අවදානම් කළමනාකරණ ප්‍රමුඛතාව වූයේ ගනුදෙනුකාර ව්‍යාපාර පුනර්ජීවනය හා පුනරුත්ථාපනය කිරීමේ අරමුණ ඇතිව ඔවුන්ට උර දීම සහතික කරමින් ණය කළඹේ ගුණාත්මකතාව සුරැකීමයි. වර්ෂය තුළ මුඛ්‍ය සංවර්ධනයන්ට පහත ඒවා ඇතුළත් විය.

අවදානම් නිරීක්ෂණ ශක්තිමත් කිරීම

- සියලුම ආයතනික හා මැදි-ආයතනික ණය ගැනුම්කරුවන් ශ්‍රේණිගත කිරීම
- ශ්‍රේණිගත කිරීම පදනම් කර ගත් ණය දීම හා අවදානම්-පාදක මිලකරණය කෙරෙහි අනුගත වන්නේදැයි නිරීක්ෂණය කිරීම
- ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) හි විධානයන් අනුගමනය කරමින් යලි ව්‍යුහගත කරන ලද ණය පහසුකම් හඳුනා ගැනීමේ හා වර්ගීකරණය කිරීමේ යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම
- රටින් පරිබාහිර අවදානම් සමාලෝචනය කිරීම හා වාර්තා කිරීම

ගනුදෙනුකරුවන් පුනර්ජීවනය හා පුනරුත්ථාපනය

- අවශ්‍යතාව අනුව සැකසුණු යලි ගෙවීමේ සැලසුම් සකසනු පිණිස ගනුදෙනුකරුවන් සමග අබණ්ඩ හා පූර්ව-ක්‍රියාකාරී ලෙස කතිකා කිරීම
- මුදල් ප්‍රවාහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශනය

පුහුණුව හා සංවර්ධනය

- ණය ඇගයීම පිළිබඳ නිපුනතා ශක්තිමත් කිරීම
- කර්මාන්තයේ විශේෂඥයින් වෙතින් පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධති (ESMS) පුහුණුව
- ගනුදෙනුකරුවන් යථා තත්ත්වයට පත් කිරීමට වඩා නඟාසිටුවීමේ සංස්කෘතියක් පෝෂණය කිරීම

ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි

- සියලුම ප්‍රතිපත්ති නව ප්‍රවණතාවන්ට අදාළ වන බවට වග බලා ගනු පිණිස ඒවා විස්තීර්ණ ලෙස සමාලෝචනය කිරීම
- ආකෘති වලංගුකරණය සම්පූර්ණ කිරීම

පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධති (ESMS) ඒකකය

- පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධතිය පිළිබඳ විශේෂ ඒකකයක් ප්‍රධාන අවදානම් නිලධාරී කාර්යාලය යටතේ ස්ථාපිත කර ඇත.

දැඩි ණය හානිකරණය ප්‍රතිපත්ති

- සහන කාලයන් යටතේ පරිවර්තනය කරන ණය සඳහා අතිරේක ණය හානිකරණ වීම මගින් 20% ක අතිරේක ණය හානිකරණයක් ඇතිවීම
- අවදානම ඉහළ ගොස් ඇති බවට හඳුනා ගත් ක්ෂේත්‍ර මත අතිරේක ණය හානිකරණය

ණය ගුණාත්මකතාව සහතික කිරීම

- ණය ගුණාත්මකතාව සහතික කිරීමේ ඒකකය හරහා විශාල ණය නිරාවරණයන් අනුමත කිරීමෙන් පසු සමාලෝචනය කිරීම
- රු. මිලියන 500 ට අඩු ණය නිරාවරණයන් නිරීක්ෂණය කරනු පිණිස තෝරා ගත් තනි ශාඛා හා ආයතනික පරාසයන් යටතේ ණය ගුණාත්මකතාව සහතික කිරීමේ ඒකක ශක්තිමත් කිරීම

ණය අවදානම් කාර්යසාධනය 2021

භූගෝලීය සංකේන්ද්‍රණය



- බස්නාහිර පළාත
- දකුණු පළාත
- මධ්‍යම පළාත
- උතුරු පළාත
- නැගෙනහිර පළාත
- උතුරු මැද පළාත
- වයඹ පළාත
- සබරගමුව පළාත
- ඌව පළාත
- අක්වෙරළ බැංකුකරණය
- විදේශීය ශාඛා
- බස්නාහිර පළාත උතුර
- බස්නාහිර පළාත දකුණ
- ආයතනික ශාඛාව
- මෙට්‍රොපොලිටන් ශාඛාව
- පිටකොටුව ශාඛාව
- ප්‍රධාන කාර්යාලය
- කාඩ්පත් මධ්‍යස්ථානය
- ඉස්ලාමීය බැංකුකරණය

නිෂ්පාදනය අනුව සංකේන්ද්‍රණය



- වෙළඳ මූලනය
- රන් සුරැකුම්
- කල්බදු
- කාර්ය මණ්ඩල ණය
- යෝජනාක්‍රම යටතේ ණය
- බැංකු අයිරා
- ණය කාඩ්පත්
- නිවාස ණය
- විදේශ මුදල් ණය
- කාලීන ණය
- ලංකා බැංකු පුද්ගලික ණය
- භාණ්ඩ ඔඩපන ණය
- මුදල් වෙළඳපොළ ණය
- වෙනත් ණය
- රජයේ අයිරාව
- ඍජු රාජ්‍ය ණය

අවදානම් කළමනාකරණය

ඇප සුරැකුම් නිරාවරණය



ක්ෂේත්‍ර සංකේන්ද්‍රණය



ශ්‍රේණිගත කිරීම අනුව ව්‍යාප්තිය



බැංකුව විදේශීය රටවලට නිරාවරණය



බැංකුවෙහි දළ අක්‍රිය වත්කම් පසුගිය වර්ෂයේ 4.76% සිට මේ වර්ෂය තුළ 4.47% දක්වා ගුණාත්මකව වර්ධනය වූ අතර එය විශාල වශයෙන් කර්මාන්තයේ සාමාන්‍ය අගය ඔස්සේ පැවතුණි. ණය හානිකරණ පිරිවැය 40% කින් වැඩි වූ අතර එමගින් විදේශ මුදලින් දැක්වෙන රාජ්‍ය සුරැකුම්පත්වල ණය හානිකරණය වීම් හා අපේක්ෂිත අලාභයන් හඳුනා ගැනීමෙහි ලා බැංකුවෙහි විචක්ෂණශීලී ප්‍රවේශය පිළිබිඹු විය.

බැංකුවෙහි ණය කළඹෙන් 88% ක් BBB හා එයට ඉහළ ශ්‍රේණි ප්‍රභේදවලින් සමන්විත වූ අතර එය ඉහත නිරූපනය කෙරේ.

ප්‍රතිපාර්ශ්වයක් හෝ කණ්ඩායමක්, ක්ෂේත්‍රයක්, නිෂ්පාදනයක් හෝ කලාපයක් වෙත ඉහළ ණය දීමේ නිරාවරණයක් හේතුවෙන් සංකේන්ද්‍රණ අවදානම පැන නඟින අතර එය හර්ෆින්ඩාල් හර්ෂ්මන් දර්ශකය (HHI) හරහා මනිනු ලැබේ. බැංකුවෙහි ණය කළඹ ක්ෂේත්‍රයන්, නිෂ්පාදන හා කලාප සිසාරන විවිධාංගික නිරාවරණයන් හරහා මනාව සංකේන්ද්‍රණය වී ඇත.

වෙළඳපොළ අවදානම

පොළී අනුපාතික, විදේශ විනිමය අනුපාතික, කොටස් මිල ගණන් හා භාණ්ඩ මිල ගණන් වැනි වෙළඳපොළ විචල්‍යයන්හි අහිතකර සංචලනයන් හි ප්‍රතිඵලයක් වශයෙන් ඉපැයීම්වල, වෙළඳපොළෙහි හෝ මූල්‍ය උපකරණ කළඹක අනාගත මුදල් ප්‍රවාහවල වෙනස්කම් වෙතින් පැන නඟින විභව්‍ය අලාභයන් ය. වෙළඳපළ අවදානම ණය දීමෙන් හා වෙළඳ ගනුදෙනු හරහා පැන නඟින අතර පහත ඒවායින් සමන්විත වේ

- **බැංකුවේ වෙළඳපළ හා වෙළඳ නොවන ආයෝජන කළඹ මඟින් පැන නඟින පොළී අනුපාතික අවදානම**
- **විදේශ මුදලින් දැක්වෙන ගනුදෙනුවලින් පැන නඟින විදේශ විනිමය අවදානම**
- **ස්කන්ධ අවදානම:- කොටස් ස්කන්ධ මිල ගණන්වල විචලනයන් මතින් පැන නඟින කොටස් ස්කන්ධ අවදානම් අලාභ**

වෙළඳපළ අවදානම කළමනාකරණය

බැංකුවෙහි වෙළඳපළ අවදානම් රාමුව මහා වෙළඳපොළ අවදානම් කළමනාකරණයේ වැදගත්කම හඳුනා ගෙන ඇති අතර එය වෙළඳපොළ අවදානම් හඳුනා ගැනීම, මැනීම හා කළමනාකරණය කිරීම පිණිස වූ නිරවුල්ව නිර්වචනය කරන ලද ව්‍යුහයන්, මෙවලම් හා කාර්යපටිපාටි මත පදනම්ව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

බැංකුවේ වෙළඳපොළ අවදානම් පූර්ව-ක්‍රියාකාරී ආකාරයකින් නිරීක්ෂණය කෙරෙන බවට හා එහි නිර්ණය කර ඇති අවදානම් අභිරුචිය ඇතුළත පවත්වා ගැනෙන බවට වග බලාගැනීමෙහි ලා ඉහළම වගකීම දරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩලයට සිය අවදානම් කළමනාකරණය ආශ්‍රිත රාජකාරිවලදී සහාය වෙයි.

වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව

- මූල්‍ය වෙළඳපළ ආශ්‍රිත වෙළඳපළ අවදානම විශ්ලේෂණය කිරීම හා හානි අවකරණ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම
- වෙළඳපළ අවදානම් සීමා නිර්දේශ කිරීම සිය පවරන ලද බලය ඇතුළත සිදු කිරීම හා අනුමත කිරීම
- විවිධ ව්‍යවසාය-ව්‍යාප්ත වෙළඳපළ අවදානම් නිරාවරණයන් අධීක්ෂණය කිරීම
- උචිත මිලකරණ ව්‍යුහයන් නිර්දේශ කිරීම

මහා භාණ්ඩාගාර මැද පෙළ කාර්යාලය/ වෙළඳපළ අවදානම් කළමනාකරණ ඒකකය

භාණ්ඩාගාර කර්තව්‍යයන් ස්වාධීන ලෙස සමාලෝචනය කරයි. මැද පෙළ කාර්යාලය භාණ්ඩාගාර ඒකකයෙන් ස්වායත්ත ක්‍රියාත්මක වන අතර එය වෙළඳපළ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය හා සීමා කළමනාකරණ රාමුව මඟින් පාලනය කෙරේ.

මුඛ්‍ය සංරචක

වෙළඳපළ අවදානම් ප්‍රතිපත්ති

වෙළඳපළ අවදානම් රාමුව වෙළඳපොළ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය, සීමා කළමනාකරණ රාමුව, විදේශ විනිමය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය හා අතරමැදි කාර්යාල මෙහෙයුම් පිළිවෙත් යන මේවායින් සමන්විත වේ. මෙහෙයුම් සන්දර්භයෙහි වෙනස්වන ගතිකයන් ගැන සලකා මෙම ප්‍රතිපත්ති නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කිරීම හා යාවත් කාලීන කිරීම සිදු කෙරේ.

අවදානම් සීමා

අවදානම් සීමා නියම කෙරෙනුයේ විදේශ මුදල් විවෘත තත්ත්ව සීමා, ප්‍රතිපාර්ශ්ව සීමා, අලාභ නැවතුම් සීමා හා අළෙවි සීමා ඇතුළු භාණ්ඩාගාර හා ආයෝජන ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහාය. මෙම ව්‍යායාමය පිළිබඳ අවසාන වගකීම දරන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයයි. වී සඳහා වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුවේ සහය ලැබේ. ඒවා වෙළඳපළ ප්‍රවණතාවන්ට අනුව ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විසින් (වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව හා ආයෝජන කමිටුව විසින් ලබා දෙන අදහස්වලට අනුව) නිරන්තරයෙන් සමාලෝචනය හා යාවත්කාලීන කෙරේ.

අවදානම් නිරීක්ෂණය

පොළී ආන්තික, විදේශ මුදල් නිරාවරණයන් සහ ස්කන්ධ නිරාවරණයන් හා අරමුදල් අවශ්‍යතා ඇතුළු දර්ශක මාලාවක් හරහා වෙළඳපළ අවදානම නිරීක්ෂණය කෙරේ. මෙම නිරීක්ෂණ යාන්ත්‍රණය සඳහා අවදානමේ දී වටිනාකම, පාදක ඒකකයට මිල වටිනාකම, කාලය, පරතර විශ්ලේෂණය, ප්‍රත්‍යාබල පරීක්ෂාව, සීමා හා ශුද්ධ විවෘත තත්ත්වයන් වැනි සංවේදිතා විශ්ලේෂණය වැනි මෙවලම්වල උපකාරය ලැබේ.

මුඛ්‍ය වෙළඳපොළ අවදානම්

පොළී අනුපාතික අවදානම (IRR)

බැංකුවෙහි පොළී අනුපාත වලට සංවේදී වත්කම් වලට හා බැරකම් වෙත ඒහි විශාල නිරාවරණය හේතුවෙන් පොළී අනුපාතික අවදානම වැදගත් තැනක් ගනී. ලංකා බැංකුව නිරවුල්ව නිර්වචනය කරන ලද මෙවලම් හා දර්ශක කට්ටලයක් හරහා මෙම අවදානම කළමනාකරණය කරයි. කල්පිරීමේ නොගැළපීම්, පොළී අනුපාතික පරතර හා පාදක ඒකකය සඳහා මිල වටිණාකම (PVBP) යන මේවා නිරන්තර පදනම්න් නිරීක්ෂණයට ලක් කෙරෙන අතර සාර්ව ආර්ථික තත්ත්වයන්හි වෙනස්කම්වල බලපෑම් නිතිපතා ප්‍රත්‍යාබල පරීක්ෂාවන් හරහා තක්සේරු කෙරේ.

විදේශ විනිමය අවදානම

අනුමත කිරීමේ යාන්ත්‍රණ, බාහිර නියාමන මාර්ගෝපදේශ හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවනු ලබන සීමා ඇතුළු දැඩි අභ්‍යන්තර ප්‍රතිපත්ති මඟින් විදේශ විනිමය ගනුදෙනු පාලනය කෙරේ. අභ්‍යන්තරික වශයෙන් අවදානමේ දී වටිනාකම් සීමා සහ තනි මෙන්ම සාමූහික මුදල් ඒකක නිරාවරණයන්හි විවෘත තත්ත්වයන් සඳහා වූ පරිමා සීමා හා විස්තීර්ණ සීමා ව්‍යුහයක් දුබලතා කළමනාකරණය කිරීම පිණිස භාවිතා කෙරේ. එමෙන්ම මෙම බැංකුව සත්‍යරූපී විදේශ විනිමය අවදානම් සිද්ධි-නිරූපන පිළිබඳව ප්‍රත්‍යාබල පරීක්ෂාවන් සිදු කරයි.

ස්කන්ධ අවදානම

බැංකුවේ ආයෝජන තීරණයන් අවදානම්-ප්‍රතිලාභ ගතිකයන් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අපේක්ෂණයන් සමඟ එක එල්ලේ වන බවට වගබලාගනු පිණිස කැප වූ ආයෝජන කමිටුවක් ස්ථානගත කර තිබේ. ස්කන්ධ කළඹ නිසි ලෙස කළමනාකරණය කිරීම සඳහා සීමා ව්‍යුහයක් ස්ථාපිතව ඇති බවට වෙළඳපළ අවදානම් අංශය සහතික වෙයි. ස්කන්ධ අවදානම් කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා විස්තීර්ණ ප්‍රත්‍යාබල පරීක්ෂා විශ්ලේෂණය මඟින් අතිරේක පිටිවහලක් ලැබේ.

අවදානම් කළමනාකරණය

වෙළඳපළ අවදානම් කාර්යසාධනය හා පැතිකඩ 2021

වර්ෂයේ පළමු කාර්තුව තුළ විදේශ විනිමය අනුපාතිකයන්හි සැලකිය යුතු විචල්‍ය බව සහ ඉන් අනතුරුව වෙළඳපළ අවදානම් දර්ශකයන්හි දිශාවන් නිතර වෙනස් වීම හා බැඳුණු කළමනාකරණය කරන ලද විදේශ විනිමය අනුපාතිකයන් මඟින් 2021 වර්ෂය වෙළඳපළ අවදානම කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් අතිශයින්ම අභියෝගාත්මක වර්ෂයක් විය. වර්ෂයේ අග කොටස තුළ මුදල් ප්‍රතිපත්ති පියවර තීව්‍ර කිරීම මඟින් මූල්‍ය ක්ෂේත්‍රයේ ආයතනවල ණය කළඹ පීඩනයන්ට හසු විය. ගෝලීය වශයෙන් අභිතකර ප්‍රවණතා මඟින් පැන නැඟුණු ප්‍රාග්ධන වෙළඳපළවල ශුද්ධ බැහැර ප්‍රවාහයන්, අයහපත් අතට හැරුණු විදේශ මුදල් ප්‍රේෂණයන් හා හීන වූ අපනයන ආදායම් හේතුවෙන් වෙළඳපළ තුළ විදේශ මුදල් ද්‍රවශීලතාව දුර්වල තත්ත්වයක පැවතුණි. තීව්‍ර කරන ලද මුදල් ප්‍රතිපත්තිය සමඟින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ඉහළ දැමීම මඟින් වෙළඳපළ තුළ රුපියලේ ද්‍රවශීලතාව අවශෝෂණය කර ගන්නා ලදී. වර්ෂය තුළ ශුද්ධ විකිණුම් අගය විදේශිකයින්ගේ විකිණීම් පහළ අගයක පැවතියේ වුවද ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපළ දේශීය වෙළඳපළ සහභාගිත්වය අතින් වාර්තාගත ලෙස ඉහළ නැංගේය.

2021 වර්ෂය තුළ අවධානය යොමු කෙරෙන ක්ෂේත්‍ර හා සංවර්ධනයන්

වෙළඳපළ අවදානම් කළමනාකරණ දෘෂ්ටි කෝණයකින් ගත් කල, විදේශ විනිමය අනුපාතිකවල, පොළී අනුපාතිකවල, උද්ධමන අනුපාතිකයෙහි හා ස්කන්ධ වෙළඳපළ දර්ශකයන්හි නිරන්තර විචල්‍යයන් හමුවේ, වැඩි අවධාරණය යොදන ලද්දේ බැංකුවෙහි ද්‍රවශීලතා මට්ටම් කෙරෙහි හා වෙළඳපළ අවදානම් දර්ශක නිරීක්ෂණයට ලක් කිරීම හා ශක්තිමත් කිරීම කෙරෙහිය.

වැඩිදියුණු කරන ලද විශ්ලේෂණය හා වාර්තා කිරීමේ යාන්ත්‍රණය

නිතිපතා වාර්තා කිරීම

- අවිනිශ්චිතතාවන්ට ගැළපෙන පරිදි වාර ගණන වැඩි කිරීම
- වලංගු සිද්ධි-නිරූපන ආවරණ කරන ප්‍රත්‍යාබල පරීක්ෂාව
- වෙළඳපළ අවදානම් අංශයෙන් බැංකුවේ තත්ත්වය පිළිබඳව පුළුල් විශ්ලේෂණය
- රුපියල් හා විදේශ මුදල් ද්‍රවශීලතා මට්ටම් පිළිබඳ කාලීන වාර්තාකරණය
- කොටස් වෙළඳපළ සංචලනයන්
- රන් මිල සංචලනයන් හා බැංකුව මත ඒවායේ බලපෑම

ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි ශක්තිමත් කිරීම

- වෙළඳපළ අවදානම කළමනාකරණ ප්‍රතිපත්ති හා විදේශ විනිමය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති පරිපූර්ණ ලෙස සමාලෝචනය කිරීම
- සීමා කළමනාකරණ රාමුව සමාලෝචනය කිරීම
- ඉදිරියේ එන ආර්ථික සංසිද්ධි සඳහා නව ප්‍රත්‍යාබල විශ්ලේෂණයක් හඳුන්වා දීම

ශක්තිමත් කරන ලද ප්‍රාග්ධන හා ද්‍රවශීලතා තත්ත්වයන්

- ද්‍රවශීලතාව හා ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම පිණිස බාසල් අනුකූල උපකරණ නිකුත් කිරීම
- බහු-පාර්ශ්වික සංවර්ධන බැංකු හා වෙනත් ජාත්‍යන්තර ණය දෙන්නන් වෙතින් හුවමාරු ණය මුදල් ලබා ගැනීම හරහා විදේශ විනිමය වෙත ප්‍රවිෂ්ටය

පුහුණුව හා සංවර්ධනය

- නියාමන සංවර්ධනයන් හා දිශාගතව භාණ්ඩාගාර අතරමැදි කාර්යාල කර්තව්‍යය සඳහා පුහුණු කිරීම

වත්කම් හා බැරකම් පිළිබඳව සංවේදිතා විශ්ලේෂණය



පදනම් ලක්ෂ්‍යයේ මිල වටිනාකම - භාණ්ඩාගාර බැඳුම්කර



වත්කම් හා බැරකම්වල කල්පිරීම් විශ්ලේෂණය



ද්‍රවශීලතා අවදානම

බැංකුවෙහි ගිවිසුම්ගත වගකීම්භාරයන් ඒවා නියමිත පරිදි අදාළ කාලයේදී ඉෂ්ට කිරීමට අපොහොසත් වීම හේතුවෙන් ඉපයීම්වල සහ/ හෝ ප්‍රාග්ධනයේ විභව්‍ය අහිමිවීම් වේ.

බැංකුවෙහි ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුව මඟින් ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීමට උර දීම සඳහා අවශ්‍ය වගකීම්, ක්‍රියාවලි, වාර්තාකරණය හා සහතිකවීම් දැක්වේ. එමෙන්ම එය සීමා හා මාර්ගෝපදේශ ස්වරූපයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් අභිරුචිය භාවිතා කරයි. වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කිරීමේ වගකීම දරණ අතර නියාමන අවශ්‍යතා හා අභ්‍යන්තර ඉලක්කවලට අනුකූල වන බවට සහතික වනු පිණිස බැංකුවෙහි ද්‍රවශීලතා තත්ත්වය නිති නිරීක්ෂණයට ලක් කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය

අවදානම් අභිරුචිය තුළ දක්වා ඇති නිශ්චිත පරාමිතීන් ඇතුළත බැංකුවෙහි ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කිරීම සඳහා ප්‍රමුඛ වගකීම දරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩලයේ අවදානම් කළමනාකරණ රාජකාරිවලදී අධීක්ෂණ වගකීම හරහා එයට සහය වෙයි.

වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව

- නියාමන අවශ්‍යතාවන් හා අභ්‍යන්තර ඉලක්කවලට අනුකූල වන බවට වගබලාගනු පිණිස ද්‍රවශීලතා පැතිකඩ ඒකකාර ලෙස නිරීක්ෂණය කරයි.
- අතිරේක ද්‍රවශීලතා සැලැස්මක් සකස් කරයි.
- විකල්ප අරමුදල් මාර්ග හා ද්‍රවශීලතා හිඟවීම් පියවීමේ මාර්ග ගවේෂණය කරයි.
- උචිත අවදානම් අභිරුචි සීමා නිර්දේශ කරයි.
- කාර්තුමය ප්‍රත්‍යාබල පරීක්ෂාවලදී ඇඟැයීම් කර, නිර්දේශ ඉදිරිපත් කරයි.

ද්‍රවශීලතා ප්‍රතිපත්ති

ද්‍රවශීලතා අවදානම කළමනාකරණ ප්‍රතිපත්තිය සහ වත්කම් හා බැරකම් කළමනාකරණ ප්‍රතිපත්තිය වැනි ප්‍රතිපත්ති ද්‍රවශීලතා අවදානම් නිරාවරණයන් කළමනාකරණය කිරීමෙහි ලා යොදා ගත යුතු යාන්ත්‍රණ, මෙවලම් හා ප්‍රත්‍යාබල පරීක්ෂණ ක්‍රමවේද පිළිබඳ මාර්ගෝපදේශනය සපයයි.

ද්‍රවශීලතා මිනුම්

ප්‍රවාහ ප්‍රවේශය: අපේක්ෂිත කාල පරාසයක් ඇතුළත ලැබීම් ප්‍රවාහ හා ගෙවීම් ප්‍රවාහ තක්සේරු කිරීම

අරමුදල් ප්‍රවේශය: ද්‍රවශීල වත්කම් අනුපාතය, ද්‍රවශීලතා ආවරණ අනුපාතය, ශුද්ධ ස්ථාවර අරමුදල් සම්පාදන අනුපාතය හා තැන්පතු වලට-ණය අනුපාතය හරහා ද්‍රවශීලතා තත්ත්වය මැනීම.

අතිරේක අරමුදල් සම්පාදන සැලැස්ම

මෙම සැලැස්ම ද්‍රවශීලතා පීඩනයක් ඇති වූ විටෙක මෙහෙයුම් සුමට ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක වන බවට වගබලා ගනු පිණිස විශේෂිත වගකීම් සහිත නිශ්චිත අනතුරු ඇඟවීමේ සීනු බලගැන්වීම හා ක්‍රියාමාර්ග සැලසුම් නිශ්චය කරයි.

2021 වර්ෂය තුළ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය

රජයේ නිරාවරණය ඉහළ යමින් පැවතීම, වෙළඳපොළ තුළ විදේශ මුදල් හිඟවීම හා මෙරට ප්‍රමුඛතම වාණිජ බැංකුව වශයෙන් බැංකුවට විවිධ ආයතන වෙනුවෙන් භාර ගැනීමට සිදුවන විශාල විදේශ විනිමය වගකීම් ප්‍රමාණය මඟින් රුපියලේ ද්‍රවශීලතාව මත ඇතිවන පීඩනයට අතිරේකව, බැංකුවට විදේශ විනිමය ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමෙහි ලා විශාල අභියෝගයන්ට මුහුණ පෑමට සිදු විය. බැංකුව විචක්ෂණශීලී ලෙස ප්‍රමුඛත්ව පදනම්න් අවශ්‍යතාවන් ඉටුකිරීමෙන් හා ඉඩදිය හැකි සීමාවන් ඇතුළත විවිධ විකල්පයන් භාවිත කරමින් මෙම කාර්යය මැනවින් කළමනාකරණය කර තිබේ.

විදේශ විනිමය අනුපාතික පාලනය කිරීම නිසා විධිමත් මාර්ග ඔස්සේ මෙරට තුළට පැමිණෙන ප්‍රේෂණ අඩු වී තිබෙන අතර, අවිධිමත් මාර්ග හරහා ලැබෙන ආකර්ෂණීය අනුපාතික හේතුවෙන් එම මාර්ග හරහා රට තුළට ලැබෙන මුදල් ප්‍රවාහය කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කර ඇත. බැංකුව අරමුදල්/ ද්‍රවශීලතා පැතිකඩ ශක්තිමත් කිරීමේ බහුවිධ මාර්ග අනුගමනය කළ අතර, ඒවාට සංවර්ධන මූල්‍ය ආයතනයන් හරහා විදේශ අරමුදල් ලබා ගැනීමේ මාර්ග ගවේෂණය කිරීමද ඇතුළත්ය. එමෙන්ම බැංකුව සිය ශක්තිමත් දේශීය හා විදේශීය මුදල් තැන්පතු, විවිධාංගික අරමුදල් පැතිකඩ හා ප්‍රේෂණ අංශයෙන් ප්‍රමුඛ වෙළඳපොළ තත්ත්වය සිය ද්‍රවශීලතා මට්ටම් සඵලදායී ලෙස පවත්වා ගැනීමට යෙදවීය.

2021 වර්ෂය සඳහා වන බැංකුවේ මුඛ්‍ය ද්‍රවශීලතා දර්ශක පහත දක්වා තිබේ:

අරමුදල් සම්පාදන පැතිකඩ 2021



බැඳියා රහිත සුරැකුම්



ද්‍රවශීලතා අනුපාත

වසර	ද්‍රවශීලතා ආවරණ අනුපාතය	ද්‍රවශීලතා වත්කම් අනුපාතය	ශුද්ධ ස්ථාවර අරමුදල් සම්පාදන අනුපාතය	තැන්පතු මත ණය අනුපාතය
2021	111.45%	24.97%	124.31%	89.68%
2020	136.97%	26.57%	131.00%	85.57%

අවදානම් කළමනාකරණය

මෙහෙයුම් අවදානම

අප්‍රමාණවත් හෝ අසමත් අභ්‍යන්තර ක්‍රියාවලි, පුද්ගලයින් හා පද්ධති හේතුවෙන් හෝ බාහිර සිදුවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන විභව්‍ය අලාභයන් ය. මෙහෙයුම් අවදානමට නෛතික අවදානමද ඇතුළත් වන නමුදු උපායමාර්ගික හා කීර්තිනාම අවදානම එයට ඇතුළත් නොකෙරේ.

මෙහෙයුම් අවදානම් කළමනාකරණය

මෙහෙයුම් අවදානම කළමනාකරණය කිරීම සංවිධානය මුළුල්ලේ පැතිරෙන විෂය ක්ෂේත්‍රයක් වන අතර, එය බැංකුවෙහි මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව තුළ ගැබ්ව ඇති මෙවලම් භාවිතයෙන් ක්‍රියාත්මක කෙරේ. මෙම රාමුව පහත දැක්වෙන පරිදි සැලකිය යුතු මෙහෙයුම් අවදානම් හඳුනා ගැනීම, මැනීම, කළමනාකරණය කිරීම හා වාර්තා කිරීම සඳහා ඉවහල් වෙයි:

අධ්‍යක්ෂ මණ්ඩලය

අවදානම් අභිරුචිය තුළ දක්වා ඇති නිශ්චිත පරාමිතීන් ඇතුළත බැංකුවෙහි මෙහෙයුම් අවදානම් කළමනාකරණය කිරීම සඳහා ඉහළම වගකීම දරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩලයේ අවදානම් කළමනාකරණ රාජකාරිවලදී අධීක්ෂණ වගකීම හරහා එයට සහය වෙයි. එය නිත්‍ය පදනමින් බැංකුවෙහි මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම හා කාර්යසාධනය නිරීක්ෂණය කිරීම සඳහා වගකීම දරයි.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව (ORMEC)	වංචා අවදානම් කළමනාකරණ කමිටුව (FRMC)	මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය (ORMU)
මෙවලම් හා යාන්ත්‍රණ		
ප්‍රතිපත්ති රාමුව මුඛ්‍ය ප්‍රතිපත්තිවලට මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය, වංචා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ තොරතුරු සුරක්ෂිතතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ඇතුළත් වන අතර ඒවා මෙහෙයුම් අවදානම් හඳුනා ගැනීමේ, තක්සේරු කිරීමේ, හානි අවකරණය කිරීමේ හා නිරීක්ෂණය කිරීමේ වගකීම්, මෙවලම් හා කාර්යපටිපාටි පිළිබඳ මාර්ගෝපදේශ නිරවුල්ව දක්වයි.	**අවදානම් හඳුනා ගැනීම හා මැනීම** විභව්‍ය අවදෑනම් අවස්ථා හඳුනා ගැනීමට හැකියාව ඇති කරන අවදානම් හා පාලන ස්වයං-තක්සේරු (RCSA) තීරණාත්මක ව්‍යාපාරික ඒකක සඳහා ක්‍රියාත්මක කෙරේ. එමෙන්ම මෙහෙයුම් අවදානම් කෙරෙහි නිරාවරණයන් ඇගැයීම පිණිස මුඛ්‍ය අවදානම් දර්ශක, අභ්‍යන්තර අලාභ දත්ත හා මූල හේතුකාරක විශ්ලේෂණය ද භාවිතා කෙරේ.	**වාර්තා කිරීම හා නිරීක්ෂණය කිරීම** මෙහෙයුම් අවදානම් සිද්ධි/ අලාභයන් හා පාලනවිධි අසමාර්ථයන් සම්බන්ධයෙන් නිතිපතා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) හා අධ්‍යක්ෂ මණ්ඩලය යාවත්කාලීනව දැනුවත් කෙරේ. ප්‍රවණතා හා මූල හේතුකාරක හඳුනා ගැනීමට ඉඩ සලසමින් මෙහෙයුම් අලාභයන් පිළිබඳ දත්ත සමුදායක් බැංකුව පවත්වා ගෙන යයි. පුළුල් අවදානම් නිරාවරණ සංවිධානයක් වශයෙන් අපි සේවකයින්ට දැනුම බෙදාහදා ගැනීම දිරිගැන්වීම මගින් අවදානම් සවිඥානක සංස්කෘතියක් පෝෂණය කිරීමට අපේක්ෂා කරමු.

හානි අවකරණය

සියලුම වැදගත් ව්‍යාපාරික ඒකක හා උපකාරක කර්තව්‍යයන් සඳහා ව්‍යාපාරික අවිච්ඡින්නතා සැලසුම්	අති නවීන ව්‍යසන ප්‍රකෘතිකරණ කේන්ද්‍රය	අධි බලපෑම් අවදානම් හානි අවකරණය කරනු පිණිස හානි පූර්ණ රක්ෂණය	විතැන්වීම්/අවදානම් අවස්ථා හඳුනා ගනු පිණිස අඛණ්ඩ ක්‍රියාවලි ඇගයීම

2021 වර්ෂය තුළ මෙහෙයුම් අවදානම් කළමනාකරණය

වසංගතය ඇති වීමෙන් අනතුරුව මෙහෙයුම් ආකෘතිවල පෙර නොවූ විරූ වෙනස්කම් හේතුවෙන් බැංකුවේ මෙහෙයුම් අවදානම වෙත නිරාවරණය ඉහළ ගියේය. කඩිනම් ඩිජිටල් අනුවර්තනය මගින් තොරතුරු තාක්ෂණ හා සයිබර් සුරක්ෂිතතාව හා අදාළ ගැටළු වැඩි වී ඇති අතර, දුරස්ථ කාර්ය විධිවිධාන මගින් දත්ත අහිමි වීමේ අවදානම, පුද්ගලානුබද්ධ අවදානම හා වංචා අවදානම තවත් තීව්‍ර කර තිබේ. මෙම පසුබිම ඉදිරියේ ලංකා බැංකුව සිය මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීම පිණිස පුළුල් පරාසයක විහිඳුණු ක්‍රියාමාර්ග යොදා ගෙන ඇත.

2021 වර්ෂය තුළ අවධානයට ලක්වූ ක්ෂේත්‍ර හා සංවර්ධනයන්

වෙනත් මෙහෙයුම් අවදානම් හඳුනා ගැනීමේ හා නිරීක්ෂණය කිරීමේ ක්‍රියාවලීන් වර්ධනය කිරීමට අමතරව, මෙම වර්ෂය තුළ බැංකුවෙහි සයිබර් සුරක්ෂිතතා අවදානම් රාමු ශක්තිමත් කිරීම කෙරෙහි උපායමාර්ගික අවධානයක් යොදන ලදී.

ශක්තිමත් කරන ලද අවදානම් හඳුනා ගැනීම

- මෙහෙයුම් අවදානම් සඳහා පිරික්සුම් ලැයිස්තුවක් ස්ථානගත කිරීම හරහා පළාත්බද අවදානම් කළමනාකරණය වැඩිදියුණු කිරීම
- අත්පිට මුදල් කළමනාකරණය හා සුරක්ෂිතාගාර තැන්පතු පහසුකම් පද්ධතිය වැනි තීරණාත්මක කාර්යයන් තුළ අවදානම් තක්සේරුව ශක්තිමත් කිරීම

ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි

- දත්ත හානි චක්‍රලේඛය සමාලෝචනය කිරීම
- මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ වංචා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම
- මෙහෙයුම් වීකක කිහිපයක් සඳහා (පසුපෙළ කාර්යාල මෙහෙයුම්, ආරක්ෂක කැමරා පද්ධති ආදිය සඳහා) නව ප්‍රතිපත්ති/ මෙහෙයුම් කාර්ය සංග්‍රහ සැකසීම

නිරීක්ෂණය හා වාර්තාකරණය

- මෙහෙයුම් අවදානමේ නිරාවරණයන් නිරීක්ෂණය කරනු පිණිස බහුල ලෙස මුඛ්‍ය අවදානම් දර්ශක භාවිත කරන ලදී.
- සැලකිය යුතු සිද්ධි පිළිබඳව මූල හේතුකාරක විශ්ලේෂණය සිදුකරන ලදී.
- තොරතුරු සුරක්ෂිතතා අංග ඇතුළත් කරමින් අවදානම් දර්ශන පුවරුව වැඩිදියුණු කරන ලදී.

තොරතුරු සුරක්ෂිතතාව ශක්තිමත් කිරීම

- ISO 27001 ක්‍රියාත්මක කිරීම අරඹන ලදී.
- බැංකුව තුළ කෝබිට් (COBIT) තන්ත්‍රණ රාමුව ස්ථාපිත කරනු පිණිස මූලික පියවර ගනු ලැබීය.
- තොරතුරු සුරක්ෂිතතා අවදානම් ප්‍රතිපත්ති සමාලෝචනය කරන ලදී.

2021 වසර තුළ මෙහෙයුම් අවදානම්වල ප්‍රගතිය

අවදානම් අභිරුචියට සාපේක්ෂව අලාභයන් හා ප්‍රතිපාදන



උච්චතම හා මතුවෙමින් ඇති අවදානම් තේමා

තාක්ෂණවේද හා සයිබර් සුරක්ෂිතතාව

බැංකුව තුළ තොරතුරු තාක්ෂණය යොදා ගැනීම වෙතින් පැන නගින තොරතුරු, දත්ත හා මුදල් අහිමි වීමේ හෝ සොරකම් කිරීමේ, එසේත් නැති නම් විහව්‍ය සේවා බිඳවැටීමේ අවදානමයි.

2021 වර්ෂය තුළ මුඛ්‍ය අවදානම් ක්ෂේත්‍ර

- තොරතුරු තාක්ෂණ අංශය තුළ ISO 27001 ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී.
- තොරතුරු සුරක්ෂිතතා පැන විසඳුම හා පුහුණු වැඩසටහන් හරහා තොරතුරු තාක්ෂණ සුරක්ෂිතතා සංස්කෘතියක් පෝෂණය කිරීමේ ප්‍රයත්න
- අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය සඳහා සුරක්ෂිතතා දර්ශකයක් අන්තර්ග්‍රහණය කිරීම
- අවදානම අවම කරන අතර සුරක්ෂිත දුරස්ථ සම්බන්ධතාව හරහා මෙහෙයුම් අඛණ්ඩතාව සුරක්ෂිත කරන ලදී.
- සියලුම අක්වෙරළ ශාඛාවන්හි තොරතුරු සුරක්ෂිතතා ප්‍රතිපත්ති, තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා සයිබර් සුරක්ෂිතතා ප්‍රතිපත්ති හා බැංකුවෙහි දුර්වලතාවන් කළමනාකරණ ප්‍රතිපත්තිය ප්‍රතිශෝධනය කිරීම
- බැංකුව තුළ කෝබිට් තොරතුරු තාක්ෂණ තන්ත්‍රණ රාමුව ක්‍රියාත්මක කිරීමේ මූලික සැලසුම්

පුද්ගලානුබද්ධ අවදානම්

විසංගතය මඟින් ශාරීරික හා මානසික යහපැවැත්ම ඇතුළු පුද්ගලානුබද්ධ අවදානම් පැන නැඟුණ අතර, සේවකයින් හුදෙකලා වීමේ අවදානම හා සේවකයින්ගේ කාර්ය-ජීවිත සමබරතා අවශ්‍යතාවන්ට උපකාර කිරීමේ අභියෝගයන් තීව්‍ර කර ඇත. 2021 වර්ෂය තුළ බැංකුවෙහි පුද්ගල උපායමාර්ගයේ අරමුණ පහත පරිදි විය:

- සියලුම සේවකයින් සඳහා විස්තීර්ණ ආරක්ෂක ක්‍රියාමාර්ග සහතික කිරීම
- අඛණ්ඩ තථ්‍යරූපී නියුක්ති හා සංවර්ධන මූලිකෘත්‍ය
- ශක්තිමත් කරන ලද පාර්ශ්වික යෝජනාක්‍රම
- නිවසේ සිට වැඩ කිරීම හා දුරස්ථව වැඩ කිරීමේ පහසුකම් සැලැස්වීම

අවදානම් කළමනාකරණය

නියාමන හා අනුකූලතා අවදානම්

නියාමන මාර්ගෝපදේශයන්හි සුලභ වෙනස්කම් නිසා වෙනස් අර්ථනිරූපනය හා ක්‍රියාත්මක කිරීමේ ආකාරය මගින් පැන නඟින නොපිළිපැදීම් නොහොත් අනනුකූල වීමේ අවදානම ඉහළ ගොස් තිබේ. මෙහි හානිය අවකරණය කරන ක්‍රියාමාර්ග:

- නියාමන ආයතන සමඟ සමීප හා පූර්ව-ක්‍රියාකාරී ලෙස කටයුතු කිරීම
- විශේෂයෙන් ස්ථාපිත අනුකූලතා ඒකකය විසින් මාර්ගෝපදේශ හා රෙගුලාසි පිළිපදින්නේ ද යන්න නිරීක්ෂණය කිරීම

වෙනත් අවදානම්

ඉහත විස්තර කරන ලද ප්‍රධාන අවදානම්වලට අමතරව, ලංකා බැංකුව පහත සඳහන් අභ්‍යන්තර හා බාහිර අවදානම් වෙතින් පැන නඟින දුබලතා නිරීක්ෂණය හා කළමනාකරණය කරයි.

දේශගුණය ආශ්‍රිත අවදානම්

ස්වාභාවික ව්‍යසනයන් හා දීර්ඝ-කාලීන විසඳුම් ක්‍රියාත්මක කිරීමට අසමත් වීම ඇතුළු දේශගුණය ආශ්‍රිත අවදානම් වනාහි වර්තමානයේ ආයතන මුහුණ දෙන මුඛ්‍ය අවදානම් අතර වේ. මෙය අවබෝධ කොට ගෙන, ලංකා බැංකුව සිය දේශගුණික අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීමට අදහස් කරන අතර මෙම වර්ෂය තුළ පහත විස්තර කෙරෙන හඳුනා ගැනීමේ හා හානි අවකරණය කිරීමේ ක්‍රියාමාර්ග වර්ධනය කිරීමට පියවර ගෙන ඇත. බැංකුවෙහි දේශගුණික අවදානමට නිරාවරණය වීම ප්‍රධාන වශයෙන් පහත ඒවායින් පැන නඟී:

ණය අවදානම

කෘෂිකර්මය, කෘෂිකාර්මික යෙදවුම් මත යැපෙන ක්ෂේත්‍ර හා සංචාරක කර්මාන්තය ඇතුළු දේශගුණ විපර්යාසයට ඉහළ නිරාවරණයක් සහිත ණය මගින් පැන නඟින නිරාවරණයන්

මෙහෙයුම් අවදානම

බැංකුවේ මෙහෙයුම් වලට සෘජුව හෝ වක්‍රව බලපෑම් කිරීමට සමත් ස්වාභාවික ව්‍යසන හා ක්ෂණික කාලගුණ වෙනස් වීම් වෙතින් පැන නඟින අවදානම්

සංක්‍රාන්ති අවදානම්

ප්‍රතිපත්ති, ආයෝජන හා උපායමාර්ග තුළ වෙනස්කම් ඇති වීමේ හෝ ආර්ථිකයන් ක්‍රමයෙන් අඩු කාබන් සමාජයක් බවට පත් වීමෙන් පැන නඟින අවදානම

සමූහය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගයන්ට පහත ඒවා ඇතුළත් වෙයි:

- ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය යටතේ කැප වූ පාරිසරික හා සාමාජීය කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කිරීම, පාරිසරික හා සමාජීය කළමනාකරණ පද්ධති ප්‍රතිපත්තිය අන්තර්ග්‍රහණය කිරීම හා ජාත්‍යන්තර අරමුදල් සපයන ආයතනවල මාර්ගෝපදේශයන්ට අනුගත වීම සමඟින් පරිපූර්ණ පාරිසරික හා සමාජීය කළමනාකරණ පද්ධතියක් (ESMS) එළි දැක්වීම.
- ණය පහසුකම් සැපයීම අතින් මෙන්ම අභ්‍යන්තර මෙහෙයුම් අතින් සුනිත්‍ය බලශක්තිය වෙත අවධානය වැඩි කිරීම.
- බැංකුව තුළ පාරිසරික හා සමාජීය කළමනාකරණ පද්ධතිය (ESMS) ක්‍රියාවට නැංවීම පිළිබඳ සේවක දැනුවත්භාවය ඉහළ නැංවීම.
- මීළඟ වර්ෂ තුන ඇතුළත දේශගුණය ආශ්‍රිත මූල්‍ය අනාවරණය පිළිබඳ කාර්ය-සාධක බලකාය (TCFD) නියාමනයන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා පදනමක් ස්ථාපිත කිරීම.

නෛතික අවදානම

නියාමන/ව්‍යවස්ථාපිත විධිවිධාන නොපිළිපැදීම, නීති කෘත්‍ය හේතුවෙන් වන අවිනිශ්චිතතාව හෝ බැංකුවට අදාළ වන නීති රීති හෝ රෙගුලාසිවල ව්‍යවහාරකත්වය හෝ අර්ථනිරූපනය නිසා ඇති වන අවිනිශ්චිතතාව කෙරෙන් පැන නඟින, විභව්‍ය ඉපැයීම් අහිමි වීම් සහ කීර්තිනාම හානි මෙයට ඇතුළත්ය.

- ඉහළ නිපුනත්වයක් හා අත්දැකීමෙන් යුතු නෛතික ක්‍රියාවලියක් මගින් නෛතික ලෙස බන්ධනීය ගිවිසුම් අඛණ්ඩව සමාලෝචනය කිරීම හරහා සියලුම අවදානම් අවකරණය කෙරෙන බවට වගබලා ගැනේ. මෙයට බැංකුවෙහි අනුකූලතා ක්‍රියාවලියෙහි උපකාරය ලැබේ.
- වෙනස් වන නියාමන අවශ්‍යතාවන් හා කොටස්කාර අවශ්‍යතාවන් හමුවේ සියලුම ප්‍රතිපත්ති, කාර්යපටිපාටි හා මාර්ගෝපදේශ දෘඩතර හා උචිත වන බවට වගබලා ගනු ලැබේ.

නෛතික අවදානම නිසා බැංකුවට සිදු වූ කිසිදු සැලකිය යුතු අලාභයන් නොවීය.

කීර්තිනාම අවදානම

කීර්තිනාම අවදානම් බැංකුව කෙරෙහි විශ්වාසය නොමැති වීම හා සෘණාත්මක ආකල්පයක් ඇති වීම කෙරෙන් පැන නඟින අතර එමඟින් ඉපැයීම්, වත්කම්, ප්‍රාග්ධන තත්ත්වය සහ/ හෝ සන්නාම වටිනාකම කෙරෙහි අහිතකර බලපෑම් ඇති විය හැකිය. වර්ෂය තුළ පහත ක්‍රියාමාර්ග හරහා කීර්තිනාම අවදානම අවම කරන ලදී:

- ආර්ථිකයේ අතිශය වැදගත් ක්ෂේත්‍රයන්ට ණය දීම හා ගනුදෙනුකරුවන් පුනර්ජීවනය කිරීම හරහා රටේ සාර්ව ආර්ථික ස්ථාවරත්වයට හා ආර්ථික පුනර්ජීවනයට උර දීමෙහිලා ප්‍රමුඛ කාර්යභාරයක් ඉෂ්ට කරන ලදී.
- ලංකා බැංකුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සන්නාමවලින් එකක් ලෙසත්, බැංකු ක්ෂේත්‍රය තුළ අංක 1 සන්නාමය ලෙසත් නිති ශ්‍රේණිගත වෙයි.
- ඉන්ධන, ඖෂධ හා ප්‍රතිශක්තිකරණ වැන්නත් ආනයනයට පහසුකම් සැලැස්වීම හරහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය වෙත අඛණ්ඩ ප්‍රවිෂ්ටය සඳහා සහයෝගය ලබා දී ඇත.
- වර්ෂය ඇතුළත සන්නාම වටිනාකම වැඩි කර ගෙන තිබේ.

උපායමාර්ගික අවදානම

බැංකුවෙහි අනාගත ව්‍යාපාරික සැලසුම්වල ඇති විය හැකි දෝෂ සහ උපායමාර්ගයන් ප්‍රමාණවත් නොවීම වෙතින් පැන නඟින විභව්‍ය අලාභයන් ය.

බැංකුවේ උපායමාර්ගික අවදානම් පහත ක්‍රියාමාර්ග හරහා අවම කරනු ලැබේ:

- බැංකුවෙහි දැක්ම හා මෙහෙවර මගින් දැක්වෙන උපායමාර්ගික දිශානතිය කාලය සමඟ බැඳුණු මැනිය හැකි විශේෂිත ඉලක්ක සමඟ සංස්ථායික සැලැස්මක් බවට පරිවර්තනය කර තිබේ.

- සංස්ථායික හා විධායක කළමනාකරණ කණ්ඩායමේ අදහස්, මෙහෙයුම් පරිසරය පිළිබඳ තක්සේරුව, කොටස්කරුවන්ගේ අවශ්‍යතාවන් පිළිබඳව සලකා බැලීම හා අවසාන වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාකච්ඡාවට භාජනය කිරීම ඇතුළත් උපායමාර්ගය සැකසීම සඳහා වන ශක්තිමත් යාන්ත්‍රණ
- නිශ්චිත ඉලක්කවලට සාපේක්ෂව කාර්යසාධනය අඛණ්ඩව නිරීක්ෂණය කිරීම
- උපායමාර්ගික අවදානම් නිරාවරණයන් මනිනු පිණිස වූ විස්තීර්ණ ලකුණු සටහන් පත්‍රිකා භාවිතා කිරීම

ප්‍රාග්ධන කළමනාකරණ සහ අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය (ICAAP)

රාජ්‍ය බැංකුවක් ලෙස ලංකා බැංකුවට ප්‍රාග්ධනය සඳහා කොටස් වෙළඳපළ වෙත ප්‍රවිෂ්ට වීම සීමා වී ඇති අතර ප්‍රාග්ධනය වර්ධනය කිරීම සඳහා ප්‍රධාන ලෙසම යැපෙනුයේ අභ්‍යන්තර ලාභ උත්පාදනය හා රජයේ ප්‍රදානයන් මත ය. ඒ අනුව, බැංකුව මෙම වර්ෂය තුළ සිය ලාභාංශ ගෙවීම් ප්‍රවාහය උපායමාර්ගික ලෙස කළමනාකරණය කරමින්, එමගින් අභ්‍යන්තරික වශයෙන් ලාභ ජනනය වර්ධනය කර ගෙන ඇත. එමෙන්ම මෙම බැංකුව බාසල් අනුකූල අතිරේක ස්ථර I උපකරණය හරහා රු. බිලියන 3.4 ක්ද, ස්ථර II යටත් මට්ටමේ ණයකර හරහා රු. බිලියන 5.2 ක්ද රැස් කර ගෙන ඇත. මෙම මූලකෘත්‍යයන් වර්ෂය තුළ බැංකුවෙහි ප්‍රාග්ධන පදනම රු. බිලියන 243.0 දක්වා රු. බිලියන 45.2 කින් වැඩි කර ගෙන සිය ප්‍රාග්ධන තත්ත්වය ශක්තිමත් කර ගෙන තිබේ.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව	2021 දෙසැම්බර්	2020 දෙසැම්බර්
ස්ථර I	14.25%	11.22%
මුළු	17.77%	14.88%

වැඩිදුර සටහන් සඳහා පිටුව 345 වෙත යොමුවන්න.

ස්ථිම්භ II අවශ්‍යතාවන් සමඟ දිශාගතව ඇති අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය (ICAAP) බැංකුවේ ප්‍රාග්ධන අවශ්‍යතාවන් එහි අවදානම් පැතිකඩට දිශාගත කිරීම සහ එමගින් එහි උපායමාර්ගික න්‍යාය පත්‍රය ඉටු කරනු පිණිස ප්‍රමාණවත් ප්‍රාග්ධනය පවත්වා ගෙන යන බවට වගබලා ගැනීම මගින් සිය ප්‍රාග්ධන ව්‍යුහය ශක්තිමත් ලෙස කළමනාකරණය කිරීමේ හැකියාව ඇති කරයි. ණය, වෙළඳපළ හා මෙහෙයුම් අවදානම්වලට අමතරවල අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය (ICAAP) මගින් ද්‍රවශීලතාව, බැංකුවේ ගිණුම්වල පොළී අනුපාතික අවදානම, කීර්තිනාම, අනුකූලතා, උපායමාර්ගික හා සයිබර් සුරක්ෂිතතා අවදානම් සැලකිල්ලට ගනියි.

සාමාන්‍යාධිකාරී ප්‍රධානත්වය දරණ අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලි නියමු කමිටුව මෙම සැලකිය යුතු අවදානම් තක්සේරු කිරීම හා කළමනාකරණය කිරීම සඳහා වගකීම දරයි.

ප්‍රත්‍යාබල පරීක්ෂාව වනාහි ස්ථිම්භ II (සුපරීක්ෂණ සමාලෝචනය) වැදගත් සංරචකයක් වන අතර එය බැංකුවේ අවදානම් පැතිකඩෙහි විචලනයන් ගණනාවකට ඇති සංවේදිතාව දක්වයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද හා අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලි නියමු කමිටුවේ සමාලෝචන මගින් ශක්තිමත් වූ ප්‍රත්‍යාබල පරීක්ෂා ප්‍රතිපත්තිය අනුව ප්‍රත්‍යාබල පරීක්ෂාව සිදු කෙරෙන බවට වග බලා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. ප්‍රත්‍යාබල පරීක්ෂා අභ්‍යාසය විසින් ප්‍රාග්ධන ප්‍රතිපාදනය පිළිබඳව මාර්ගෝපදේශනය සැපයීමට අමතරව, අවදානම් අභිරුචි සීමා සඳහා ළඟාවීම හා ඉඩහැරීමේ සීමා නියම කිරීම සහ සම්භව්‍යතා සැලසුම් සැකසීම සඳහා පහසුකම් සලස්වනු ලැබේ.

අවදානම් සන්දර්භයෙහි විතැන් වීම් හමුවේ, මෙම බැංකුව වර්ෂය තුළ පහත දැක්වෙන ක්‍රියාමාර්ග යෙදීය.

- ද්‍රවශීලතාව මත ඍණාත්මක බලපෑම් සහ සහන කාලය ලබා දෙන ලදුව අක්‍රීය වත්කම් බවට පරිවර්තනය වූ වත්කම් ප්‍රමාණය වැඩි වීම සහ අධික ණය වර්ධනය අන්තර්ග්‍රහණය කරමින් කෝවිඩ් -19 බලපෑම ද ඇතුළත් කරන ලද ප්‍රත්‍යාබල පරීක්ෂා බහුවිධ සිද්ධි-නිරූපනය
- මෙහෙයුම් අවදානම තක්සේරු කිරීමෙහිලා වඩාත් විචක්ෂණශීලී වනු පිණිස කීර්තිනාම අවදානම්, උපායමාර්ගික අවදානම් හා අනුකූලතා අවදානම් යන අංශයන්හි නව අවදානම් දර්ශකයන් අන්තර්ග්‍රහණය කිරීම
- නව ප්‍රත්‍යාබල පරීක්ෂා සිද්ධි-නිරූපන අන්තර්ග්‍රහණය කිරීම
- ඉහළ ඩිජිටල් උපයෝගිතා මට්ටම් පිළිබිඹු කරනු පිණිස නව සයිබර් සුරක්ෂිතතා සංගුණකයක් සමගින් අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලියට සයිබර් සුරක්ෂිතතාව අන්තර්ග්‍රහණය කිරීම.

ප්‍රකෘතිකරණ සැලැස්ම (RCP)

නියාමන මාර්ගෝපදේශ අනුව, බැංකුව 2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කරනු පිණිස වූ ප්‍රකෘතිකරණ සැලැස්ම පිළියෙළ කිරීමෙහි නිරතව සිටියි.

මූල්‍ය වාර්තා

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව 115
ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම 120
මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 122
ස්වාධීන සහතිකවීමේ වාර්තාව 124
මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම 125
විගණකාධිපතිතුමාගේ වාර්තාව 126
ලාභ හෝ අලාභ ප්‍රකාශනය 130
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 131
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 132
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය 134
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 138
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 140

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව

1. හැඳින්වීම

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධනයන් හි අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙල කරන ලද 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන බැංකුවේ සහ සමූහයේ විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන මත ඉදිරිපත් කරන විගණන වාර්තාව සමඟ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, බැංකුවේ කටයුතු පිළිබඳ සිය වාර්තාව ඉදිරිපත් කරන්නේ ඉතාමත් සතුටිනි. තවද මෙම වාර්තාව තුළ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ වන 2007 අංක 11 දරණ බැංකු පනත් නියාමනයන් සහ එහි පසුකාලීන සංශෝධනයන් මඟින් හා කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නීති මඟින් දක්වන අවශ්‍යතාවයන්ට අනුව ඉදිරිපත් කරන හෙළිදරව් කිරීම් ද ඇතුළත් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2022 පෙබරවාරි 24 දින සමාලෝචනය කර අනුමත කරන ලදී .

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන් යටතේ 1939 අගෝස්තු 1 දින ලංකා බැංකුව සංස්ථාපනය කරන ලද අතර 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් යටතේ ස්ථාපනය කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වේ. බැංකුවේ පූර්ණ හිමිකාරිත්වය ශ්‍රී ලංකා රජය සතුවේ. බැංකුව විසින් සුරුකුම් රහිත, යටත්, නිදහස් කළ හැකි ණයකර නිකුත් කර ඇති අතර ඒවා කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇත.

2. ව්‍යාපාර කටයුතු පිළිබඳ සමාලෝචනය

2.1 බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්

ගෙවුණු වර්ෂය තුළ බැංකුව නිරත වූ ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස පුද්ගලික බැංකුකරණය, ආයතනික බැංකුකරණය, සංවර්ධන මූල්‍යකරණය, අක්වෙරළ බැංකු කටයුතු, වෙළඳ මූල්‍ය, කල්බදුකරණය, ලංකා රජයේ සුරුකුම්පත් සම්බන්ධව වෙළඳ කටයුතු, ආයෝජන බැංකුකරණය සහ භාණ්ඩාගාර මෙහෙයුම්, නියෝජිත ආයතන සමඟ ගනුදෙනු සහ මුදල් ප්‍රේෂණ, ඉස්ලාමීය බැංකුකරණය, බැංකු රක්ෂණය, උකස් සේවා, ණයපත් පහසුකම්, විදේශ ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු සහ වෙනත් අදාළ මූල්‍ය සේවාවන් හැඳින්විය හැකිය.

2.2 පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම්

පරිපාලිත සහ ආශ්‍රිත සමාගම්වල ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳව විස්තරාත්මක කරුණු මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් යටතේ පිටු අංක 140 හි ඇතුළත් වේ. සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳව ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි දක්වා ඇති වෙනස්වීම් හැරෙන්නට බැංකුවේ සහ සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වල ස්වභාවය සමාලෝචිත වසර තුළදී සැලකිය යුතු තරමේ වෙනසකට භාජනයවී නැත.

2.3 සමූහයේ සංයුතියේ වෙනස්වීම

2021 පළමු කාර්තුවේදී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී විසින් එහි පූර්ණ අනුබද්ධිත සී/ස කොළඳෙනිය හයිඩ්‍රෝපවර් (පෞද්ගලික) සමාගම හි ආයෝජනය ඉවත් කර ඇති බැවින් වසර තුළ සමූහයේ ව්‍යුහය වෙනස් කර ඇත. තවද, මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී ල් සී විසින් හිමිකම් නිකුතුවක් යටතේ රු. බිලියන 2.2 ක් වටිනා නව සාමාන්‍ය කොටස් නිකුත් කර ඇත. බැංකුව සහ එහි පූර්ණ අනුබද්ධිත ප්‍රොපටි ඩිවලප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම මෙම කොටස් නිකුතුවේ ආයෝජනය කරන ලදී. මෙම ආයෝජනයන් සමඟ බැංකුවේ කොටස් හිමිකම 84.5% දක්වා වැඩි විය. සමූහය පිළිබඳ විස්තර වාර්ෂික වාර්තාවේ මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 31 සහ 32, යටතේ පිටු අංක 207 සිට 214 දක්වා ඉදිරිපත් කර ඇත.

2.4 දැක්ම, මෙහෙවර සහ සංස්ථාපිත පරිචය

බැංකුවේ දැක්ම, මෙහෙවර සහ ආයතනික වටිනාකම් ප්‍රකාශන මෙම වාර්ෂික වාර්තාවෙහි දෙවන ඇතුල් කවරයේ පිටුපස දක්වා ඇත. බැංකුව උසස්ම ආචාරධර්ම පද්ධතියකට අනුරූපව තම කටයුතු ඉටු කරන අතර, එමඟින් දැක්ම මෙහෙවර හා ආයතන වටිනාකම් යටතේ ළඟා කරගැනීමට අපේක්ෂිත අරමුණු කරා බැංකුව මෙහෙයවනු ලැබේ.

2.5 වර්ෂයේ කාර්යසාධන සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුළ දී බැංකුවේ/සමූහයේ කාර්යසාධනය සහ ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳව විවරණයක් පිටු අංක 10 සිට 13 දක්වා අන්තර්ගත සභාපතිතුමාගේ පණිවිඩයෙහි ඇතුළත් කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ දී බැංකුවේ මෙහෙයුම් කටයුතු පිළිබඳව විස්තරාත්මක විග්‍රහයක් පිටු අංක 14 සිට 17 දක්වා වූ මහා කළමනාකාරතුමාගේ සමාලෝචනයෙහි ඇතුළත් කර ඇත. බැංකුවේ ව්‍යාපාර මෙහෙයුම් කටයුතු පිළිබඳව විග්‍රහයක් "ප්‍රධාන මූල්‍ය නිලධාරිතුමාගේ සමාලෝචනය" තුළ පිටු අංක 52 සිට 55 තෙක් දක්වා ඇත. මෙම වාර්තාවලින් සාධාරණ සමාලෝචනයක් ඉදිරිපත් කර ඇති අතර, ඒවා මෙම වාර්ෂික වාර්තාවෙහි සංකලිත කොටසකි.

2.6 ශාඛා ව්‍යාප්තිය

කොවිඩ්-19 වසංගත තත්ත්වය රට පුරා පැවතියද, බැංකුව සිය ජාලය මුදල් චක්‍රකරණ යන්ත්‍ර 104 කින් දිවයින පුරා වසර තුළ පුළුල් කළ අතර එමඟින් මුළු සෘජු ගනුදෙනුකාර සේවා මධ්‍යස්ථාන 2,071 දක්වා ගෙන එයි. මෙම සංඛ්‍යාව අනෙකුත් බැංකු ආයතන සතු, ලංකා බැංකුවේ ගනුදෙනුකරුවන්ට ප්‍රවේශ විය හැකි ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, පාසල් ඉතුරුම් මධ්‍යස්ථාන (සංසඳ) සහ ජංගම ඉතුරුම් ස්ථාන වලට අතිරේක වශයෙනි.

2.7 ආයතනික පරිත්‍යාග

2021 වර්ෂය තුළ සිදු කරන ලද ආයතනික සමාජ වගකීම් (CSR) ක්‍රියාකාරකම් සඳහා බැංකුව රු. මිලියන 79.5 ක් පරිත්‍යාග කර ඇත (2020 - රු. මිලියන 75.0).

2.8 මූල්‍ය වාර්තාකරණය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

සත්‍ය හා සාධාරණ තත්ත්වය නිරූපණය කරන ආකාරයට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන්නේ, ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට, 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධනවලට, 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නීතිවලට අනුකූලවන ආකාරයට මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇති බවයි. පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ 2007 අංක 07 දරණ සමාගම් පනතේ ප්‍රතිපාදන ද භාවිතා කර ඇත. මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 125 හි ඉදිරිපත් කර ඇති අතර, එය මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත්කරන වාර්ෂික වාර්තාවේ සංකලිත කොටසකි.

2.9 විගණක වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 154 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා, ලංකා බැංකුවේ විගණක වශයෙන් පත්කර ඇත. 2021 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව

වාර්ෂික වාර්තාවේ පිටු අංක 126 සිට 129 තෙක් දක්වා ඇත.

2.10 ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

බැංකුව සහ සමූහය සිය මූල්‍ය වාර්තා ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලං.ගි.ප්‍ර.) සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (ශ්‍රී ලං.මූ.වා.ප්‍ර.) අනුව පිළියෙල කරයි. මූල්‍ය වාර්තා සැකසීමේදී භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 140 සිට 315 තෙක් දක්වා ඇත.

3. සැලසුම් ගත සංවර්ධන කටයුතු

සැලසුම් ගත සංවර්ධන කටයුතු පිළිබඳව බැංකුවේ දර්ශනය හා සැලසුම් මෙම වාර්තාවේ පිටු අංක 10 සිට 13 දක්වා වූ සභාපතිතුමාගේ පණිවිඩයෙහි සහ පිටු අංක 14 සිට 17 දක්වා මහා කළමනාකාරතුමාගේ සමාලෝචනයෙහි ඇතුළත් වේ.

4. මුළු ආදායම

පෙර වර්ෂයේ සමූහයේ මුළු ආදායම වූ රු. මිලියන 252,756 ට සංසන්දනාත්මකව බැලීමේදී 2021 වර්ෂය සඳහා රු. මිලියන 297,621 ක් වශයෙන් මුළු ආදායම වාර්තා විය. බැංකුවේ මුළු ආදායම වර්ෂය සඳහා සමූහයේ මුළු ආදායමෙන් 97.6% ක් (2020 - 97.8%) විය. සමූහයේ ප්‍රධාන ආදායම පොළී ආදායම වන අතර, එය මුළු ආදායමෙන් 89.6% ක් (2020 - 91.6%) නියෝජනය කරයි.

5. ලාභාංශ සහ සංචිත

5.1 ලාභය සහ විසර්ජනයන්

සමාලෝචිත 2021 වර්ෂය තුළදී බැංකුව රු. මිලියන 43,189 ක බදු පෙර ලාභයක් වාර්තා කිරීමට සමත් වී ඇති අතර, එය සංසන්දනාත්මකව පෙර වර්ෂයේ රු. මිලියන 23,552 ට වඩා 83.4% ක වැඩි වීමක් නිරූපණය කරයි.

රු. මිලියන 5,599 ක් ආදායම් බදු වෙනුවෙන් අඩු කළ පසු (2020 රු. මිලියන 5,787) 2021 වර්ෂය සඳහා බදු පසු ලාභය රු. මිලියන 37,590 ක් ලෙස වාර්තා වී ඇති අතර, එය 2020 වර්ෂයේ වාර්තා වූ බදු පසු ලාභය වන රු. මිලියන 17,765 ට වඩා 111.6% ක වැඩි වීමක් වේ.

බැංකුවේ සහ සමූහයේ ලාභය හා සම්බන්ධ තොරතුරු පහත වගුවේ දක්වා ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2021	2020	2021	2020
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
සියලුම වියදම් දැරීමෙන් සහ ක්ෂය සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන්, ක්‍රමක්ෂය, ණය හා අත්තිකාරම් සහ වෙනත් අලාභයන් සඳහා හානිකරණ ප්‍රතිපාදන හා අසම්භව්‍යන් සඳහා වෙන්කිරීමෙන් පසු, එහෙත් බදු පෙර වර්ෂයේ ලාභය	52,216	29,010	53,843	27,627
මූල්‍ය සේවා මත බදු	(9,027)	(5,458)	(9,340)	(5,463)
ආශ්‍රිත සමාගම්වල ලාභ/(අලාභ) කොටස, බදු පසු	-	-	134	82
ආදායම් බදු පෙර ලාභය	43,189	23,552	44,637	22,246
ආදායම් බදු වියදම	(5,599)	(5,787)	(5,954)	(5,939)
වර්ෂය සඳහා ලාභය	37,590	17,765	38,683	16,307
වර්ෂයට අදාළ වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු	8,357	(1,792)	9,567	(730)
වර්ෂයට අදාළ මුළු විස්තීර්ණ ආදායම	45,947	15,973	48,250	15,577
විසර්ජනයන්				
ස්ථාවර සංචිත අරමුදලට මාරු කිරීම	(752)	(356)	(752)	(356)
ලාභාංශ	(1,846)	(1,596)	(1,846)	(1,596)

සමූහයේ බදු පෙර ලාභය රු. මිලියන 22,246 සිට සමාලෝචිත වර්ෂය තුළ දී රු. මිලියන 44,637 දක්වා ඉහළ යමින් පෙර වර්ෂයට සාපේක්ෂව 100.7% ක වැඩි වීමක් පෙන්නුම් කරන ලදී . රු. මිලියන 5,954 ක් ආදායම් බදු වෙනුවෙන් අඩු කළ පසු (2020 රු. මිලියන 5,939) 2021 වර්ෂය සඳහා සමූහයේ බදු පසු ලාභය රු. මිලියන 38,683 කි (2020 වර්ෂය සඳහා රු. මිලියන 16,307 කි).

5.2 ලාභාංශ

සියලුම බදු, ණය අලාභයන් සඳහා වෙන්කිරීම් සහ සංචිත සඳහා අවශ්‍යවන්නා වූ මාරු කිරීම් යනාදිය සිදුකළ පසු ලාභය මත පදනම්ව බැංකුව විසින්, බැංකුවේ කොටස්කරු වශයෙන් ශ්‍රී ලංකා රජයේ උපදෙස් මත ලාභාංශ තීරණය කරනු ලැබේ. ඒ අනුව 2021 වර්ෂය සඳහා බැංකුව විසින් රු. මිලියන 1,846 ක මුදලක් ලාභාංශ වශයෙන් ගෙවා ඇත (2020- රු මිලියන 1 596).

5.3 සංචිත

2021 දෙසැම්බර් 31 දිනට සමූහය සතු මුළු සංචිත වටිනාකම රු. මිලියන 188,807 (2020 - රු. මිලියන 142,689) වශයෙන් වාර්තා විය. සමූහයේ සංචිත පහත අයිතම වලින් සමන්විත වේ.

	සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන්	2021	2020
	රු. මිලියන	රු. මිලියන
ස්ථාවර සංචිත අරමුදල	14,491	13,739
මුදල් ප්‍රවාහ හෙජ් සංචිතය	3,239	-
ප්‍රත්‍යාගණන සංචිතය	26,303	24,853
නිදහස් සංචිතය	367	367
විනිමය පරිවර්තන සංචිතය	4,461	3,335
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය	1,483	2,573
ව්‍යවස්ථාපිත සංචිතය	359	359
රඳවාගත් ඉපැයුම්	138,104	97,463
එකතුව	188,807	142,689

6. දේපළ, පිරියත හා උපකරණ

වර්ෂය තුළ දී දේපළ, පිරියත හා උපකරණ, කල්බදු වත්කම් හා අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් දරන ලද ප්‍රාග්ධන වියදම රු. මිලියන 2,372 ක් (2020 රු. මිලියන 3,461) වූ අතර, ඒවා පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 217 සිට 235 දක්වා සහ පිටු අංක 238 සිට 239 දක්වා ඇති සටහන් අංක 34 සහ 36 මඟින් නිරූපණය කරයි.

7. නිදහස් දේපළවල අගය

2021 දෙසැම්බර් 31 දිනට සමූහය සතු නිදහස් දේපළවල අගය රු. මිලියන 29,560 ක් වශයෙන් (2020: රු. මිලියන 29,252) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 34.2 හි දක්වා ඇත.

8. ප්‍රකාශිත ප්‍රාග්ධනය හා කොටස් හිමිකම

8.1 ප්‍රකාශිත ප්‍රාග්ධනය

2021 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ සහ සම්පූර්ණයෙන්ම ගෙවා නිමි ප්‍රාග්ධනය රු. මිලියන 25,000 කි (2020: රු. මිලියන 25,000 කි).

8.2 කොටස් හිමිකම

ලංකා බැංකුවේ එකම කොටස්හිමියා ශ්‍රී ලංකා රජයයි.

9. යටත් කාලීන ණයකර/ බැදුම්කර නිකුතුව

වසර තුලදී, බැංකුව විසින් ඒකකයක් රු.100 බැගින් වන රු.බිලියන 3.4 (2020- රු.බිලියන 15.0) වටිනා බාසල් III අනුකූල, ලැයිස්තුගත නොකළ, ශ්‍රේණිගත කල, සුරැකුම් රහිත, යටත් කාලීන, නිත්‍ය, ශක්‍යතාවයක් නොමැති අවස්ථාවක ස්ථිරවම ලියාහැරිය හැකි අතිරේක පළමු පෙළ ප්‍රාග්ධන බැඳුම්කර (AT I) සාර්ථකව නිකුත්කරන ලදී.

මෙම අතිරේක පළමු පෙළ ප්‍රාග්ධන බැඳුම්කර කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගතකර නොමැති අතර, මෙම නිකුතුව සුදුසුකම්ලත් ආයෝජකයන් සඳහා පමණක් සීමා විය. මෙම බැඳුම්කර නිදහස් කල නොහැකි නමුත් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත කිරීම් වලට යටත්ව බැංකුවට තම අභිමතය පරිදි අදාළ බැඳුම්කර නිකුත් කල දින සිට අවුරුදු පහකින් පසු ඕනෑම අවස්ථාවකදී නැවත බැංකුවට කැඳවිය හැක.

ඉහත සඳහන් බැඳුම්කර නිකුතුවට අමතරව බැංකුව විසින් 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුලදී ලැයිස්තුගත නොකළ, සුරැකුම් රහිත, යටත්කාලීන, නිදහස් කල හැකි ශක්‍යතාවයක් නොමැති අවස්ථාවක ලියාහැරිය හැකි දෙවනපෙළ රු.බිලියන 5.2 වටිනා ප්‍රාග්ධන ණයකර නිකුත් කර ඇත.

මෙම ණයකර සම්බන්ධ විස්තර සටහන් අංක 49 යටතේ පිටු අංක 256 සිට 259 තෙක් දක්වා ඇත.

10. කොටස් පිළිබඳ තොරතුරු

සමාලෝචිත වර්ෂය තුළ දී සමූහයේ කොටසක මූලික ඉපැයුම හා කොටසක් සඳහා වූ ශුද්ධ වත්කම් ප්‍රමාණය පිළිවෙලින් රු. 1,540 (2020: රු. 674) ක් සහ රු. 8,552 (2020: රු. 6,708) ක් විය.

11. ආයතනික තිරසාරභාවය සහ වගකීම

ආයතනික තිරසාරභාවය සහ සමාජීය වගකීම් යටතේ ක්‍රියාත්මක කරන ලද විවිධ වැඩසටහන් පිළිබඳව විස්තරාත්මක සමාලෝචනයක් මෙම වාර්තාවෙහි අංක 74 සිට 77 දක්වා වූ පිටුවල "රට සහ ප්‍රජාව" යන අංශය යටතේ දක්වා ඇත.

12. අධ්‍යක්ෂ මණ්ඩලය

2021 වර්ෂය තුළ කටයුතු කල අධ්‍යක්ෂවරුන්ගේ සහ මෙම වාර්ෂික වාර්තාව අත්සන් කරන දිනය වන විට කටයුතු කරන අධ්‍යක්ෂවරුන්ගේ විස්තර පහත වගුවේ දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුව තුල කිසිදු විධායක මට්ටමේ නිලතල නොදරන අතර ඔවුන්ගේ පුළුල් වූ කුසලතා හා අත්දැකීම් බැංකුව වෙත ලබා දේ. ඔවුන්ගේ සුදුසුකම් හා අත්දැකීම් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 19 සිට 21 තෙක් දක්වා ඇත. වාර්ෂික වාර්තාව අවසන් කරන දිනය වනවිට පස් (5) දෙනෙක්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් කටයුතු කරයි.

12.1 අධ්‍යක්ෂක ලැයිස්තුව

කාංචන රත්වත්තේ මහතා
සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
(පත්වීම ලද දිනය - 2020 ජනවාරි 02)

ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා
නිල බලයෙන් පත්වූ, විධායක නොවන අධ්‍යක්ෂ
(පත්වීම ලද දිනය - 2020 අප්‍රේල් 28)

ජී හර්ෂ විජේවර්ධන මහතා
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
(පත්වීම ලද දිනය - 2020 ජනවාරි 14)

ඒ් සී මනිල්ක ප්‍රනාන්දු මහතා
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
(පත්වීම ලද දිනය - 2020 අප්‍රේල් 21)

මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ් චන්ද්‍රසිරි
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
(පත්වීම ලද දිනය - 2021 ජනවාරි 08)

ජයම්පති මොල්ලිගොඩ මහතා
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
(2021 පෙබරවාරි 18 වැනි දින පත් කරන ලද අතර 2022 ජනවාරි 31 දා සිට අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කිරීම නතර විය)

බලපත්‍රලාභී වාණිජ බැංකු වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ ආයතනික යහපාලනය පිළිබඳව මඟපෙන්වීම් අනුව අධ්‍යක්ෂවරු, ස්වාධීන/ ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන් ලෙස වර්ග කර ඇත.

වාර්ෂික වාර්තාව අවසන් කරන දිනය වනවිට අධ්‍යක්ෂ මණ්ඩලය පහත සාමාජිකයින්ගෙන් සමන්විත විය.

අධ්‍යක්ෂවරයාගේ නම	විධායක / විධායක නොවන	ස්වාධීනත්වයේ තත්ත්වය
කාංචන රත්වත්තේ මහතා	විධායක නොවන	ස්වාධීන
ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා	විධායක නොවන නිලබලයෙන් පත්වූ	ස්වාධීන නොවන
ජී හර්ෂ විජේවර්ධන මහතා	විධායක නොවන	ස්වාධීන
ඒ් සී මනිල්ක ප්‍රනාන්දු මහතා	විධායක නොවන	ස්වාධීන
මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ් චන්ද්‍රසිරි	විධායක නොවන	ස්වාධීන

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව

12.2 අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු

ඉහත දැක්වූ බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ ආයතනික යහපාලනය පිළිබඳව මඟපෙන්වීම් වලට අනුකූල වීම සඳහා සහ බැංකුවේ කටයුතු මනාව පාලනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු පහක් පිහිටුවා ඇත. උපකමිටු සංයුතීන් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 93 සිට 98 දක්වා උප කමිටු වාර්තාවල සඳහන් කර ඇත.

12.3 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල හා උපකමිටු රැස්වීවලට අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය පිළිබඳ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 88 වන පිටුවේ දක්වා ඇත.

12.4 ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

බැංකුව සමඟ ඇති ගිවිසුම් හා සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ සෘජු සහ වක්‍ර ඇල්ම පිළිබඳව දත්තයන් 120 සහ 121 දක්වා වූ පිටුවල විස්තර කර ඇත. මෙම ඇල්ම පිළිබඳව තොරතුරු අධ්‍යක්ෂවරු විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී අනාවරණය කර ඇත. ඉදිරිපත් කර ඇති ගිවිසුම්වලට අමතරව කිසිම අධ්‍යක්ෂවරයෙකු වෙනත් සෘජු හෝ වක්‍ර ඇල්මක් බැංකුව සමඟ ඇතිකරගෙන නොමැති අතර, අනාගතයේ දී යෝජිත ගිවිසුමකට සම්බන්ධයක් හෝ නොමැති බව ප්‍රකාශ කෙරේ.

12.5 බැංකුව/සමූහය මඟින් නිකුත් කර ඇති ණයකර පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

කිසිදු අධ්‍යක්ෂවරයෙකුගේ නමින් ණයකර ලේඛනගත කර නොතිබිණි.

12.6 අධ්‍යක්ෂ මණ්ඩලයේ දීමනා/ ගාස්තු

අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවනු ලබන දීමනා/ගාස්තු සියල්ලම, මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද, 2015 ජුනි 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පී ඊ ඩී 3/2015, 2020 ජනවාරි 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පී ඊ ඩී 01/2020 සහ 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට අනුව සිදු කර ඇත. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික පිළිබඳ තොරතුරු පිටු අංක 165 හි සටහන 17 යටතේ දක්වා ඇත.

13. අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය

13.1 අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය සඳහා සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි. අවදානම් අවම කිරීම සඳහා බැංකුව විසින් අනුගමනය කරන ලද විශේෂ ක්‍රියාමාර්ග මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 99 සිට 113 දක්වා ඇතුළත් කර ඇත.

13.2 අභ්‍යන්තර පාලනය

බැංකුව තුළ විගණන කමිටුව හරහා වඩාත් ඵලදායී සහ විස්තීර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරනු ලැබේ. විගණන කමිටුව විසින් හාරකාර වගකීම නිදහස් කිරීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලයට සහයෝගය දෙනු ලබයි.

විගණන කමිටුවේ සභාපතිතුමාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 93 හි ඇතුළත් කර ඇත. සමාලෝචනයට පාත්‍ර වූ වර්ෂය තුළ මූල්‍ය වාර්තා සහ වාර්ෂික වාර්තාව නිකුත් කළ දිනය දක්වා වූ අභ්‍යන්තර විගණන පාලන පද්ධතියෙහි ඵලදායීතාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ.

බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ ආයතනික යහපාලනය පිළිබඳව මඟපෙන්වීම් වල විධි විධාන අංක 3 (8) (ii) (ආ) අනුව අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කර ඇත. ඉහත සඳහන් වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 122 සහ 123 හි ඇතුළත් කර ඇත. මූල්‍ය වාර්තාකරණ පද්ධතිය, සාධාරණ තහවුරුවක් ලැබෙන පරිදි නිර්මාණය කර ඇති බවටත්, බාහිර පාර්ශ්වයන්ට ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශ, අදාළ ගිණුම්කරණ මූලධර්ම හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල වන ආකාරයෙන් සකස් වී තිබෙන බවටත්, අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය මත සහතිකවීමේ වාර්තාවක් විගණකාධිපතිතුමාගෙන් ලබාගෙන ඇති අතර එය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 124 හි දක්වා ඇත.

14. ආයතනික යහපාලනය

වඩාත් ඵලදායී ආයතනික යහපාලන රාමුවක් සහ ක්‍රියාවලියන් පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටියි. බැංකුවේ මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා ක්‍රියාකාරකම් ආයතනික යහපාලන පරිචයට අනුකූල වන පරිදි මෙහෙයවීම සහ කාර්යක්ෂමව පාලනය කිරීම සිදු වේ. වාණිජ බැංකුවල නියාමක වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ ආයතනික යහපාලනය පිළිබඳව මඟපෙන්වීම් සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය ඒකාබද්ධව නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිචය සඳහා වූ ආචාරධර්ම සංග්‍රහයට මෙම පද්ධතීන් සහ පරිචයන් අනුකූල වන අතර, මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 82 සිට 92 දක්වා ඇති "ආයතනික යහපාලනය" යටතේ සවිස්තරාත්මකව සඳහන් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ඉහත දැක්වූ 2007 අංක 11 විධිවිධානයන්ට අනුකූලවීම මත විගණකාධිපතිතුමාගෙන් වාර්තාවක් ලබා ගෙන ඇත.

15. මානව සම්පත්

බැංකුව සතු ඉහළ වටිනාකමක් සහිත සම්පතක් ලෙස එහි සේවකයින් සලකන අතර, ඔවුන්ගේ සංවර්ධනය බැංකුවට ඉතාමත් වැදගත්වනු ඇත. සංස්ථාපිත අරමුණු ඉටු කර ගැනීමේ දී ඔවුන්ගෙන් ලැබෙන දායකත්වය උපරිම තත්ත්වයෙන් පවත්වාගෙන යෑම සඳහා ඉතාවටිනා මෙම මානව ප්‍රාග්ධනය තව දුරටත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර රාශියක් ගෙන ඇත. බැංකුවේ මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තීන් සහ පරිචයන්, "අපගේ සේවක මණ්ඩලය" යටතේ විස්තර කර ඇති අතර එය පිටු අංක 68 සිට 72 දක්වා ඇතුළත් කර ඇත.

16. නීති රීති සඳහා වූ අනුකූලතාවය

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි සමූහය නීති රීතිවලට පටහැනිව කිසිදු ක්‍රියාකාරකමක නියුක්තවී නොමැති බව ප්‍රකාශ කරයි.

මෙම වාර්තාවේ සංකලිත කොටසක් වන "අනුකූලතා ඇමුණුම්" යටතේ පිටු අංක 317 සිට 356 දක්වා නීති හා රෙගුලාසි සමඟ බැංකුවේ අනුකූලතාවය පිළිබඳ විස්තර ඇතුළත් වේ.

17. සමථයකට පත් නොවූ නෛතික ක්‍රියාකාරකම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය පරිදි සහ බැංකුවේ නීතිඥයින් විසින් තහවුරු කළ පරිදි දැනට බැංකුව විසින් මෙහෙයවනු ලබන තවමත් සමථයකට පත් නොවූ නෛතික ක්‍රියාකාරකම් වලින් බැංකුවේ මූල්‍ය තත්ත්වයට හෝ අනාගත මෙහෙයුම් සඳහා ප්‍රමාණවත් අහිතකර බලපෑමක් සිදු වෙතැයි අපේක්ෂා නොකෙරේ.

18. ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට ගෙවිය යුතු සහ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත කාලයේ සිදු කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාසයෙන් තහවුරු කරයි.

19. පාරිසරික ආරක්ෂාව

පරිසරයට අයහපත් ප්‍රතිඵල ළඟා කරදෙන කිසිම ක්‍රියාකාරකමක බැංකුව නියුක්ත වී නැත. තවද, පරිසරය රැකගැනීමේ අරමුණින් ගත් පියවර පිටු අංක 74 සිට 77 දක්වා "රට සහ ප්‍රජාව" යන මාතෘකාව යටතේ දක්වා ඇත.

20. ශේෂ පත්‍ර දිනෙන් පසු සිදු වූ සිද්ධීන්

අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ ගැලපීමක් හෝ හෙලිදරව්වක් සිදු කළ යුතු කිසියම් ප්‍රමාණාත්මක සිද්ධියක් ශේෂ පත්‍ර දින හා මෙම වාර්තාව නිකුත් කළ දින අතර කාල පරාසය තුළ සිදු වී නැති බවයි.

21. අඛණ්ඩභාවය

තම මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රමාණවත් සම්පත් බැංකුව සතු බව අධ්‍යක්ෂ මණ්ඩලයේ විශ්වාසයයි. එම නිසා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී අඛණ්ඩ පවැත්ම යන සංකල්පය භාවිතාකර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



ජානකී සේනානායක සිරිවර්ධන
ලේකම්,
ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2022 මාර්තු 24 දින කොළඹ දීය.

ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 හි අවශ්‍යතාවන්ට අනුකූලව, "සම්බන්ධිත පාර්ශ්වයන් පිළිබඳ අනාවරණය" විස්තරාත්මක වශයෙන් මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 61 හි දක්වා ඇත.

අතිරේක වශයෙන්, සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළ බැංකුවේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය, සභාපති හෝ අධ්‍යක්ෂධූර දරණ අනෙකුත් ආයතනයන් සමඟ කරන ලද ගනුදෙනු සම්බන්ධව විස්තරයක් පහත දැක්වේ.

සමාගම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	සීමාව '000	ශේෂය/ ගෙවිය යුතු වටිනාකම 31.12.2021 '000	ශේෂය/ ගෙවිය යුතු වටිනාකම 31.12.2020 '000
ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම					
කාංචන රත්වත්තේ මහතා (2020 ජනවාරි 02 දින ලංකා බැංකුවේ සභාපති වශයෙන් පත් විය)					
ෆස්ට් ගාර්ඩියන් ඉක්විටීස්	අධ්‍යක්ෂ	ජංගම ගිණුම්	50,000	22,047	2,692
සී/ස හොටෙල්ස් කලම්බු (1963) (2020 පෙබරවාරි 24 වන දින පත්විය)	සභාපති	ජංගම ගිණුම්		2,392	888
		ස්ථාවර තැන්පතු		81,585	191,045
		බැංකු අයිරා	15,000	7,596	7,844
		ණය		192,562	112,210
		වෙනත් ලැබිය යුතු ශේෂයන්		89,895	66,970
ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී (2020 පෙබරවාරි 25 වන දින පත්විය)	සභාපති	ජංගම ගිණුම්		14,435	20,470
		ස්ථාවර තැන්පතු		2,763,560	2,543,760
		ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණු සුරැකුම්පත්		528,500	48,200
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී (2020 සැප්තැම්බර් 30 වන දින පත්විය)	සභාපති	ජංගම ගිණුම්		361,444	248,579
		ස්ථාවර තැන්පතු		28	27
		බැංකු අයිරා	283,000	159,014	126,665
		ණය	1,500,000	389,785	1,370,535
සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම (2020 පෙබරවාරි 24 වන දින පත්විය)	සභාපති	ජංගම ගිණුම්		3,485	6,750
		ස්ථාවර තැන්පතු		811,900	1,220,300
		ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණු සුරැකුම්පත්		38,000	24,600
		ණයකර		250,000	-
ලංකා බැංකුව (යු.කේ.) සමාගම (2020 ජූලි 03 වන දින පත්විය)	සභාපති	ජංගම ගිණුම්		5,288	5,334
		ඉතිරිකිරීමේ ගිණුම්		26	24
		නොස්ට්‍රෝ ගිණුම්		ඇ.ඩො. 1,446	ඇ.ඩො. 1,502
				*289,826	*280,032
				ම.බ්‍රි.ප. 263	ම.බ්‍රි.ප. 271
				*71,038	*68,925
				යූරෝ 90	යූරෝ 128
				*20,324	*29,448
		බැංකු වල ඇති තැන්පතු		ඇ.ඩො. 8,000	ඇ.ඩො. 8,000
				*1,603,470	*1,491,242
				යූරෝ 250	යූරෝ 500
				*56,715	*114,711
				ම.බ්‍රි.ප. 18,100	ම.බ්‍රි.ප. 113,950
				*4,897,782	*28,983,638

සමාගම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	සීමාව '000	ශේෂය/ ගෙවිය යුතු වටිනාකම 31.12.2021 '000	ශේෂය/ ගෙවිය යුතු වටිනාකම 31.12.2020 '000
පී එච් විජයවර්ධන මහතා (2020 ජනවාරි 14 දින ලංකා බැංකුවේ අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් පත් විය)					
එල් කේ ඩොමේන් රෙජිස්ට්‍රි ශ්‍රී ලංකා සමාගම	ආරම්භක අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		713	-
		කාලීන තැන්පතු		30,000	-
ඒ සී එම් ප්‍රනාන්දු මහතා (2020 අප්‍රේල් 21 දින ලංකා බැංකුවේ අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් පත් විය)					
සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පී එල් සී	අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		340	384
		ඉතිරිකිරීමේ ගිණුම්		7,196	7,171
ආර් එම් පී රත්නායක මහතා (2020 අප්‍රේල් 28 දින ලංකා බැංකුවේ අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් පත් විය)					
ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව	නිලබලයෙන් පත්වූ අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		36,689	49,080
		කාලීන තැන්පතු		641	635
මේජර් ජෙනරාල් (විශ්‍රාමික) පී ඒ චන්ද්‍රසිරි (2021 ජනවාරි 08 දින ලංකා බැංකුවේ අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් පත් විය)					
ගුවන්තොටුපල සහ ගුවන් සේවා (පුද්ගලික) සමාගම	සභාපති	ජංගම ගිණුම්		377,792	29,702
		ඉතිරිකිරීමේ ගිණුම්		-	41,068
		ඉතිරිකිරීමේ ගිණුම්		ඇ.ඩො 308	ඇ.ඩො 129
				*61,780	*23,873
		කාලීන තැන්පතු		3,237,843	7,077,722
		කාලීන තැන්පතු		ඇ.ඩො 195,879	ඇ.ඩො 191,005
				* 39,318,710	*35,431,385
		ණය	400,000	266,667	400,000
		ණයවර ලිපි	5,000,000	2,432,000	1,358,718
		ඇපකර ලිපි	50,000	20,800	20,800
ජේ මොල්ලිගොඩ මහතා (2021 පෙබරවාරි 18 දින ලංකා බැංකුවේ අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් පත් විය)					
ශ්‍රී ලංකා තේ මණ්ඩලය	සභාපති	ජංගම ගිණුම්		279,658	146,291
		ඉතිරිකිරීමේ ගිණුම්		932	-
		කාලීන තැන්පතු		7,844,639	5,959,806

* ශ්‍රී ලංකා රුපියල් වලට සමාන අගය
සටහන: මුදල් ඒකකය නිශ්චිතව සඳහන් නොකළ සංඛ්‍යා රුපියල් වලින් දක්වා ඇත.

මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

වගකීම

2007 අංක 11 දරණ බැංකු පනත් විධානයෙහි 3 (8) (ii) (ආ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබේ.

ලංකා බැංකුවෙහි අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණාත්මතාවය සහ සඵලදායීත්වය අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි. මෙහිදී බැංකු කටයුතුවලට අදාළ අවදානම් හා ප්‍රතිඵල සමබර ලෙස කළමනාකරණය කළ යුතු අතර, බැංකුවේ අවදානම් අභිරුචිය පිළිබඳ සීමා හා දර්ශකවල විචල්‍යතා ඉස්මතුවන සේ අභ්‍යන්තර පාලන පද්ධති මූලික වශයෙන් නිර්මාණය කරයි. මේ අනුව මූල්‍ය තොරතුරු හා වාර්තා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බව හෝ මූල්‍ය අලාභයන් හෝ වංචාවලට එරෙහිව අභ්‍යන්තර පාලන පද්ධතීන්ට ලබා දිය හැක්කේ පූර්ණ සහතිකයක් නොව සාධාරණ සහතිකයක් පමණි.

බැංකුව විසින් මුහුණ පෑ හැකි සැලකිය යුතු අවදානම් කාරකයන් හඳුනා ගැනීම, ප්‍රමාණ නිර්ණය, නිරීක්ෂණය සහ කළමනාකරණය සඳහා වූ අඛණ්ඩව බලපැවැත්වෙන ක්‍රමවේදයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපනය කර ඇත. ව්‍යාපාර පරිසරයේ සහ ව්‍යවස්ථාපිත මඟ පෙන්වීම් වල සිදු වන වෙනස්වීම් වලට අනුරූපීව මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධති වර්ධනය කිරීම හා ශක්තිමත් කිරීමද මෙයට ඇතුළත් වේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් බැංකු අධ්‍යක්ෂවරුන් හට මග පෙන්වීම් සඳහා නිකුත් කර ඇති අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව උපයෝගී කර ගනිමින් සහ ඒ අනුව යමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරතුරුවම ඉහත සඳහන් ක්‍රමවේදය නිරීක්ෂණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන කටයුතු නිරීක්ෂණයේ දී ඉහත මඟපෙන්වීමෙහි සඳහන් පරිදි අභ්‍යන්තර පාලන පද්ධති තක්සේරු කිරීමේ මූලධර්ම යොදාගෙන ඇත.

දැනට ක්‍රියාත්මක වන මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධති සාධාරණ සහතික ප්‍රතිඥාවක් ලබා දීමට ප්‍රමාණවත් බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතයයි. තවද බාහිර උපයෝගීතාවය සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශයන් අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල බවද අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි.

මතු වූ අවදානම් හඳුනා ගැනීමට හා තක්සේරු කිරීමට මෙන්ම එම අවදානම් අවම කිරීමට හා පාලනය කිරීමට සුදුසු අභ්‍යන්තර පාලන විධි නිර්මාණය, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම මඟින් අවදානම් සහ පාලනයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග භාවිතයට කළමනාකාරිත්වය සහය දක්වනු ලැබේ.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම හා සඵලදායීතාවය සමාලෝචනය කිරීමේදී අනුගමනය කරන ක්‍රියාවලියේ ප්‍රධාන ලක්ෂණ

මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි ප්‍රමාණාත්මකතාවය සහ සංගතභාවය සමාලෝචනය කිරීමට ස්ථාපිත කර ඇති ප්‍රධාන ක්‍රමවේදයන්හි පහත දැ ඇතුළත් වේ.

- බැංකුවෙහි දෛනික කටයුතුවල සඵලතාවය සහ බැංකුවේ සමස්ත මෙහෙයුම් අනුමත කළ ආයතනික සැලැස්ම මඟින් උකහා පිළියෙල කල ආයතනික අරමුණු, උපක්‍රම සහ වාර්ෂික අයවැය අනුව පවතීද, යන්න සහතික කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහය පිණිස විවිධ කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවා ඇත.

- නියැදි හා චක්‍රීය ක්‍රම භාවිතයෙන්, ප්‍රතිපත්තීන්ට හා ක්‍රියාදාමයන්ට අනුගත වීම සහ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි කාර්යසාධනය පිළිබඳව අඛණ්ඩව පරීක්ෂා කිරීම බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කරනු ලබන අතර එමඟින් සොයා ගනු ලබන සැලකිය යුතු අනුගත නොවීම් අවධානයට ලක් කරනු ලබයි. සියලු අංශවල සහ ශාඛාවල විගණනයන් පවත්වනු ලබන අතර, ස්වාධීන සහ විෂය මූලික වාර්තාවක් නිකුත් කිරීම උදෙසා විගණනයෙහි වාර ගණන ඇගයීමට ලක්වූ අවදානම මත තීරණය වේ. වාර්ෂික විගණන සැලසුම අධ්‍යක්ෂ මණ්ඩල විගණන නිරීක්ෂණ කමිටුව නිරීක්ෂණය කොට අනුමත කරනු ලබයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සොයාගැනීම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ නිරන්තර රැස්වීම්හි නිරීක්ෂණය සඳහා යොමු කරයි.

  නියාමන අධිකාරීන්, කළමනාකාරිත්වය, අභ්‍යන්තර හා බාහිර විගණකයින් විසින් හඳුනාගත් අභ්‍යන්තර පාලනය පිළිබඳ ගැටළු අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අවධානය යොමු කර අවදානම් කළමනාකරණයෙහි සහ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ප්‍රමාණාත්මකභාවය සහ කාර්යසාධනය පිළිබඳ ඇගයීම් සිදු කරයි. අභ්‍යන්තර විගණන ක්‍රියාවලියෙහි ගුණාත්මකභාවය සහ විෂය පථය පිරික්සීම ද විගණන කමිටුව මඟින් සිදු කරයි. සියලුම විගණන කමිටු රැස්වීම් වාර්තා ඉදිරි ක්‍රියාමාර්ග සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ. පිටු අංක 93 දක්වා ඇති විගණන කමිටු වාර්තාවෙහි විගණන කමිටුව විසින් අදාළ වර්ෂය තුළ ක්‍රියාත්මක වීම සවිස්තරව දක්වා ඇත.

- මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීමේදී බැංකුවේ අදාළ නිලධාරීන් විසින් මූල්‍ය ප්‍රකාශනයන්හි වැදගත් ගිණුම්කරණ සහ හෙළිදරව් කිරීම් වලට සම්බන්ධ සියළු ක්‍රියා පිළිවෙත් සහ පාලනයන් සිදු කරන ලදී. එම සැලැස්මේ උචිතභාවය හා සඵලතාවය පිළිබඳ අභ්‍යන්තර විගණන අංශය විසින් නැවත නිරීක්ෂණය කරන ලදී. මෙම ඇගයීමට බැංකුවේ පරිපාලිත සමාගම් ඇතුළත් නොවේ.

- බැංකුව විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" 2018 ජනවාරි 1 සිට ක්‍රියාත්මක වන පරිදි සම්මත කරන ලදී. ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 හි අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා, බාහිර ජාත්‍යන්තර උපදේශකයෙකුගේ සහාය ඇතිව දුර්වලතා ප්‍රතිපාදන තීරණය කිරීම සඳහා පුළුල් පරාසයක පුරෝකථන ආර්ථික අවස්ථා භාවිතා කරමින් බැංකුව අපේක්ෂිත ණය පාඩු (ECL) ආකෘති නිර්මාණය කළේය. මෙම ආකෘති වලංගු කිරීම සඳහා වරලත් ගණකාධිකාරී සමාගමක් පත් කර ඇති අතර වලංගු කිරීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද අංක 13 සහ 14 දරණ නියාමනයන් වලට අනුකූල වීමට බැංකුව ප්‍රමාණවත් පියවර ගෙන ඇත.

- මූල්‍ය උපකරණ වඩාත් සඵලදායීව හා කාර්යක්ෂමව හඳුනා ගැනීම, මැනීම, වර්ගීකරණය හා අනාවරණය කිරීම යන අවශ්‍යතාවයන්ට අනුකූල වීම සහ "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ" ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා බැංකුව ස්වයංක්‍රීය මූල්‍ය වාර්තාකරණ පද්ධතියක් යොදාගැනීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරමින් සිටී. ස්වයංක්‍රීය පද්ධතිය මඟින් ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" යටතේ ඇති හානිකරණ ප්‍රතිපාදන ගණනය කිරීමට හැකි වන අතර අභ්‍යන්තර හා බාහිර වාර්තාකරණ අවශ්‍යතා සපුරාලීමට පහසුකම් සපයයි.

- කොවිඩ්-19 වසංගතය මඟින් ආර්ථිකය, ව්‍යාපාර, කර්මාන්ත, කුටුම්භ කෙරෙහි ඇති කළ ක්‍රමවේදයන්ගේ බලපෑම 2021 දී ද අඛණ්ඩව පැවතුනි. කෙසේ වෙතත්, රජය ප්‍රමුඛ චින්තන් වැඩසටහන් සහ උසස් ආරක්ෂණ ක්‍රමවේදය පිළිපැදීම සමඟ කොවිඩ්-19 වසංගත තත්වයට අනුවර්තනය වීමට ජනතාව සහ ව්‍යාපාර වඩාත් සංවේදී ප්‍රවේශයක් ගත්හ. අදාළ නියාමන සහ අනෙකුත් අනුකූලතා අවශ්‍යතා සපුරාලන අතරම ක්‍රියාකාරිව සහ මූල්‍යමය වශයෙන් හොඳ ස්ථානයක් තහවුරු කර ගනිමින් බැංකුව මෙම ප්‍රවණතා සමඟ සමපාත වීමට සිය ව්‍යාපාරික ආකෘතිය වෙනස් කළේය.

- රජය විසින් හඳුන්වා දෙන ලද සහන පැකේජවලට බැංකුව අනුකූල වූ අතර, 2021 දී ද කොවිඩ්-19 මඟින් පීඩාවට පත් වූවන්ට අඛණ්ඩව සහන ලබා දුන්නේය.

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" යටතේ අපේක්ෂිත ණය අලාභ (ECL) ක්‍රමය භාවිතා කරමින් හානි ප්‍රතිපාදන තක්සේරු කිරීමේදී ණය නොගෙවීමේ අවදානම් සහිත කර්මාන්තවල ගනුදෙනුකරුවන්ට කොවිඩ්-19 නිසා ඇති වූ බලපෑම ද සලකා බලන ලදී. බැංකුව වත්මන් ආර්ථික තත්ත්වය අපේක්ෂිත පාඩුව ගණනය කිරීමේදී භාවිතා කරන ආර්ථික සාධක ගැලපීම (EFA) සංශෝධනය කිරීමෙන් හානිකරන පාඩු ගණනය කර ඇත.

- අදාළ මූල්‍ය උපකරණ සඳහා ප්‍රතිපාදන සකස් කිරීමේදී රටේ ස්වෛර්ය ශ්‍රේණිගත කිරීම "CCC" වෙතින් "CC" දක්වා අඩු කිරීම සහ පැහැර හැරීමේ සම්භාවිතාව (PD) අනුපාතය සංශෝධනය කිරීම ද සලකා බලන ලදී.

- ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 යටතේ ණය පහසුකම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මැනීම සඳහා නියාමකයා විසින් නිකුත් කරන ලද උපදෙස් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් බැංකුවේ විවිධ විෂයයන්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් ස්වයංක්‍රිය මූල්‍ය වාර්තාකරණ විසඳුම ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සහ සම්බන්ධීකරණය කරයි.

- බැංකුවේ සහ විදේශීය ශාඛා වල ණය හා අත්තිකාරම්, මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කිරීම්, අවදානම් කළමනාකරණය, අදාළ පාර්ශ්වීය ගනුදෙනු සහ වෙනස්වන නියාමන හා වෙළඳපල තත්ත්වයන් මත පදනම්ව අනෙකුත් සියලුම වැදගත් බැංකු කටයුතු සම්බන්ධව අන්තර් ක්‍රියාපටිපාටිය බැංකුව විසින් නිරන්තරයෙන් අධීක්ෂණය හා යාවත්කාලීන කරනු ලැබේ. පුහුණුකිරීම් හා දැනුවත් කිරීමේ සැසි මඟින් ශ්‍රී ලං.මූ.වා.ප්‍ර./ලං.ගි.ප්‍ර. යටතේ ඇති අවශ්‍යතා පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය ඇතුළු අදාළ පාර්ශ්වකරුවන් දැනුවත් කර ඇත.

- පෙර වර්ෂයන්හි මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් බාහිර විගණකයින්ගේ නිර්දේශයන් සමාලෝචනය කර යෝග්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග වර්ෂය තුළ දී ගන්නා ලදී. මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් 2021 වර්ෂයේ දී බාහිර විගණක නිර්දේශයන් සම්බන්ධයෙන් අනාගතයේ ක්‍රියා කරනු ඇත.

සහතික කිරීම

ඉහත සඳහන් ක්‍රියාවලීන් හා ක්‍රියාදාමයන් පදනම්ව බැංකුවෙහි මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කර ඇත්තේ බැංකුවෙහි මූල්‍ය වාර්තාකරණය ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවයන් සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව, බාහිර අරමුණු උදෙසා මූල්‍ය ප්‍රකාශන සැකසීමේ යථානුරූපී බව පිළිබඳව සාධාරණ සහතිකවීමක් සැපයෙන අයුරින් බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සභාපති - විගණන කමිටුව

සභාපති

අධ්‍යක්ෂ

2022 මාර්තු 03
දින කොළඹ දීය.

ස්වාධීන සහතිකවීමේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/B/BOC/IC/2021

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 22 March 2022

සභාපති
ලංකා බැංකුව,

ලංකා බැංකුවේ අභ්‍යන්තර පාලනයන්ට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති විසින් අධ්‍යක්ෂකවරුන් වෙත ඉදිරිපත් කරනු ලබන සහතික වීමේ වාර්තාව

හැඳින්වීම

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාවේ ඇතුළත් ලංකා බැංකුවේ අභ්‍යන්තර පාලනයට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ සහතිකවීමක් මෙම වාර්තාවෙන් සපයනු ලැබේ.

කළමනාකරණයේ වගකීම

බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ නියාමනයන් වල 3 (8) (ii) (ආ) වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති "අභ්‍යන්තර පාලනයට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා වූ මාර්ගෝපදේශය"ට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම, කළමනාකරණය සතු වගකීම වේ.

මාගේ වගකීම හා ශ්‍රී ලංකා සහතිකවීමේ කාර්යභාර ප්‍රමිත (ශ්‍රී. ලං. ස. කා .ප්‍ර) 3050 (සංශෝධිත) ට අනුකූල වීම

මාගේ වගකීම වන්නේ අධ්‍යක්ෂවරුන් විසින් සකස් කරන ලද ලියකියවිලි මඟින් මාගේ ප්‍රකාශනයට සහය දක්වයි යන්න සහ අභ්‍යන්තර පාලනයේ සැලසුම සහ සඵලදායිතාවය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂවරුන් අනුගමනය කර ඇති ක්‍රියාවලිය උචිත ලෙස පිළිබිඹු වේද යන්න තක්සේරු කිරීමයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති අභ්‍යන්තර පාලනයට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු ආයතන සඳහා සහතික වීමේ වාර්තාව ශ්‍රී.ලං.ස.කා.ප්‍ර. 3050 (සංශෝධිත) ට අනුකූලව මාගේ සහතිකවීමේ කාර්යභාරය මා විසින් මෙහෙයවා ඇත. මෙම ප්‍රමිතියට අනුව කළමනාකරණය විසින් සියලු ප්‍රමාණාත්මක ආකාරයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය සකස් කර තිබේද යන්න පිළිබඳව සීමිත සහතිකයක් ලබා ගැනීම සඳහා ක්‍රියා පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. මෙම කටයුත්ත සඳහා, කිසිදු වාර්තාවක් යාවත්කාලීන කිරීම හෝ නැවත නිකුත් කිරීම සම්බන්ධයෙන් මම වගකිව යුතු නොවේ. මෙම කටයුත්ත අතරතුර මම මූල්‍ය තොරතුරු විගණනයක් හෝ සමාලෝචනයක් කර නැත.

ඉටුකළ කාර්යයේ සාරාංශය

අදාළ ප්‍රකාශය, අධ්‍යක්ෂවරුන් විසින් හෝ අධ්‍යක්ෂවරුන් සඳහා හෝ පිළියෙල කළ ලිපි ලේඛන මඟින් තහවුරු වන්නේ ද, සහ මූල්‍ය වාර්තාකරණය සඳහා වූ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනයේ දී අධ්‍යක්ෂවරුන් විසින් යොදාගෙන තිබෙන ක්‍රියාවලිය මඟින් මැනවින් පිළිබිඹු වන්නේ ද යන්න ඇගයීම සඳහා මාගේ කාර්යභාරය මෙහෙයවා තිබේ .

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කල ක්‍රියා මාර්ග සනාථ කර ගැනීම සඳහා නියැඳි ලෙස බැංකුවේ කාර්ය මණ්ඩලයෙන් විමසීම, ලිපි ලේඛන පරීක්ෂාව යන ක්‍රියා පටිපාටි සිදු කරන ලදී.

මෙම ප්‍රකාශය තුළින් සියලු අවදානම් හා පාලනයන් ආවරණය වන්නේදැයි සලකා බැලීම හෝ බැංකුවේ අවදානම් හා පාලන ක්‍රියා පටිපාටිවල සඵලදායීතාවය පිළිබඳ මතයක් ගොඩනැගීම හෝ ශ්‍රී.ලං.ස.කා.ප්‍ර. 3050 (සංශෝධිත) ට අනුව අවශ්‍ය නොවේ. එසේම ශ්‍රී.ලං.ස.කා.ප්‍ර. 3050 (සංශෝධිත) ට අනුව වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර ඇති ප්‍රමාණාත්මක අභ්‍යන්තර පාලන අංශයන් පිළිබඳව පවතින සැලකිය යුතු ගැටළු සඳහා ක්‍රියා කිරීමට විස්තර කර ඇති ක්‍රියාවලීන් මඟින් එම ගැටළු සඳහා නියත පිළියම් ලැබේ දැයි යන්න මා විසින් සලකා බැලීම අවශ්‍ය නොවේ.

තෝරාගත් ක්‍රියා පටිපාටි රඳා පවතින්නේ බැංකුවේ ස්වභාවය, ප්‍රකාශය සකස් කර ඇති සිද්ධිය හෝ ගනුදෙනුව පිළිබඳ මගේ විනිශ්චය සැලකිල්ලට ගෙනය.

මගේ නිගමනයට පදනමක් සැපයීමට මා ලබාගත් සාක්ෂි ප්‍රමාණවත් සහ සුදුසු යැයි මම විශ්වාස කරමි.

නිගමනය

ඉටුකරන ලද ක්‍රියා පටිපාටීන් මත පදනම්ව වාර්ෂික වාර්තාවේ ඇතුළත් ප්‍රකාශය, මූල්‍ය වාර්තාකරණය සඳහා වූ බැංකුවේ අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම හා සඵලදායකත්වය පිළිබඳ සමාලෝචනයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදවා ඇති ක්‍රියාවලිය පිළිබඳ මාගේ අවබෝධය හා සංගත නොවන බවට විශ්වාස කිරීමට හේතුවන කරුණු කිසිවක් මාගේ අවධානයට ලක්වී නොමැත.

ඩබ්ලිව් පී සී වික්‍රමරත්න
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණයට අදාළ අධ්‍යක්ෂවරුන්ගේ හා විගණකවරුන්ගේ වගකීම් පැහැදිලිව දැක්වීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් පිළිබඳ ප්‍රකාශය සකසනු ලබයි. ලංකා බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම මෙම ප්‍රකාශය මඟින් දැක්වේ.

මූල්‍ය ප්‍රකාශ

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන් සමඟ 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් සහ නියාමනයන්ට අනුව, සෑම අවස්ථාවකදීම ප්‍රමාණවත් නිරවද්‍යතාවක් සමඟ බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබිඹු කෙරෙන ගිණුම් පොත් බැංකුව විසින් පවත්වාගෙන යාම තහවුරු කිරීමත් සහ බැංකුවේ කටයුතු පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස නිරූපණය වන ආකාරයට සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම මූල්‍ය ප්‍රකාශන සකස්කර ඉදිරිපත් කිරීමත් බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරන පරිදි මෙම වාර්ෂික වාර්තාවේ නිරූපණය කර ඇති, 2021 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී වඩාත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන් තෝරාගෙන ඇති අතර, ඒවා සංගතභාවයෙන් යුතුව භාවිතා කර, කළමනාකරණය විසින් වඩාත් සාධාරණ හා විචක්ෂණ ලෙස තම විනිශ්චයන් සහ ඇස්තමේන්තු කිරීම් පාදක කරගෙන ඇත. භාවිතා කරන ලද ගිණුම් ප්‍රතිපත්තීන් පිළිබඳව ප්‍රමාණාත්මක වෙනස්වීම් ඇත්නම් එවැනි දෑ පිළිබඳව අනාවරණය හා පැහැදිලි කිරීම් කර ඇත.

මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති 2021 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්, 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන් හා අනෙකුත් නියාමන අවශ්‍යතාවයන් හා අනුකූලවන පරිදි සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශවලින් 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ සත්‍ය හා සාධාරණ තත්ත්වය නිරූපණය කෙරේ.

අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන්නේ, බැංකුවට හා සමූහයට අනාගත නිශ්චිත කාලයක් සඳහා තම ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවයි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී තව දුරටත් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය භාවිතා කර ඇත.

අභ්‍යන්තර පාලන, අවදානම් කළමනාකරණය හා අනුකූලතාවය

බැංකුවේ වත්කම්වල සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීමට මෙන්ම වංචාවන් සහ අවකළමනාකරණය වැළැක්වීමට, වඩාත් ශක්තිමත් අභ්‍යන්තර පාලන පරිසරයක් පවත්වාගෙන යාම සඳහා සැලකිය යුතු වැදගත්කමක් ලබා දීම, අභ්‍යන්තර මූල්‍ය පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම සහ අවදානම් කළමනාකරණය ද අධ්‍යක්ෂවරුන් සතු වගකීමකි.

ආවේනික හා අවශේෂ අවදානම් මුළුමනින්ම තුරන් කරලීම කළ නොහැකි නමුත් කලින් තීරණය කරන ලද පද්ධති හා සීමා පැහැවීම් තුළ උචිත යටිතල පහසුකම්, පාලනයන්, පද්ධති හා ආචාරධර්ම පදනම් වූ චර්යාවන් භාවිතය හා ක්‍රියාවට නැංවීම තුළින් එවැනි දෑ අවම කරගැනීම තහවුරු කිරීම අපේක්ෂා කෙරේ.

මූල්‍ය වාර්තාකරණයේ යථානුරූපී බව පිළිබඳව සාධාරණ සහතික වීමක් ලබා දෙන ආකාරයට මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සකසා ඇති බව පිටු අංක 122 සහ 123 හි මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව මඟින් තහවුරු කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකරණය විසින් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් සහ ඒ සඳහා වන මඟපෙන්වීම් මනා ලෙස සංවිධානය කර ඇත. ප්‍රමාණාත්මක අවදානම් පාලනය කිරීමටත්, ඒවා කළමනාකරණය කිරීමටත් කළමනාකරණ කමිටු ස්ථාපිත කර ඇත. අවදානම් පිළිබඳ මාසික වාර්තා සමාලෝචනය සහ සාකච්ඡාව සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීම සහතික කිරීම සඳහා විධිවිධාන ක්‍රියාත්මක වේ. අදාළ නීති, රෙගුලාසි, රීති, විධානයන් සහ මඟපෙන්වීම් සමඟ අනුකූලවන ආකාරය ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විසින් අධීක්ෂණය කරන අතර, මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කෙරේ.

අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ගයන්ගේ කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම සඳහා විගණන කමිටුව හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අඛණ්ඩව ක්‍රියා කරයි. විගණන කමිටුවේ හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තා මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 93 සිට 95 දක්වා අන්තර්ගත වේ.

විගණන වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 154 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා බැංකුවේ විගණකවරයා වශයෙන් බැංකුවේ මූල්‍ය ප්‍රකාශ මත විගණන වාර්තාව සහ අවසාන විගණන මතය ඉදිරිපත් කර ඇත. මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණකාධිපතිගේ වගකීම මෙම වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 126 සිට 129 දක්වා විගණකාධිපතිගේ වාර්තාවේ ඇතුළත් කර ඇත. බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාව පිළිබඳ විගණකාධිපතිවරයා විසින් ලබාදුන් සහතිකය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 124 හි දක්වා ඇත.

අනුකූලතාව

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට නියාමන හා ව්‍යවස්ථාපිත අධිකාරීන්ට ගෙවීමට ඇති සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් බැංකුව සහ පරිපාලිතයන් විසින් නියමිත පරිදි ගෙවා අවසන් කර හෝ ප්‍රතිපාදන සලසා ඇති බවට අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි සෑහීමට පත් වේ.

මෙම වාර්තාවේ දක්වා ඇති පරිදි අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ ඔවුන්ගේ වගකීම යථා පරිදි ඉටුකර ඇති බවයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි ,



ජානකී සේනානායක සිරිවර්ධන
ලේකම්,
ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2022 මාර්තු 24
කොළඹ දී ය.

විගණකාධිපතිතුමාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/B/BOC/FA/2021

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 28 February 2022

සභාපති
ලංකා බැංකුව

ලංකා බැංකුවේ සහ එහි පරිපාලිතයන්හි 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ලංකා බැංකුවේ ("බැංකුව") සහ එහි පරිපාලිතයන්හි ("සමූහය") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී . ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං. වි .ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ප්‍රධාන විගණන කරුණු

ප්‍රවර්තන කාලපරිච්ඡේදය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී මාගේ වෘත්තීයමය විනිශ්චය අනුව වඩාත් වැදගත් වන කරුණු ප්‍රධාන විගණන කරුණු ලෙස සැලකේ. බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ විගණනයේදී මෙම කරුණු සමස්තයක් ලෙස සලකා බලනු ලබන අතර මෙම කරුණු පිළිබඳ වෙන් වෙන්ව මතයක් මා විසින් ප්‍රකාශ කරනු නොලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ප්‍රධාන විගණන කරුණු	මාගේ විගණනයේදී ප්‍රධාන විගණන කරුණු ආමන්ත්‍රණය කරන ලද අකාරය
ක්‍රමක්ෂය පිරිවැයට අගය කළ මූල්‍ය වත්කම්වල හානිකරණ දීමනාව. සටහන් 28 සහ 29 යටතේ දක්වා ඇති ක්‍රමයක්ෂය පිරිවැයට දරා සිටින මූල්‍ය වත්කම්වල හානිකරණ දීමනාව සටහන් 4.4.11 සහ 28 හි විස්තර කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව කළමනාකරණය විසින් තීරණය කර ඇත. මෙය ප්‍රධාන විගණන කරුණක් වීමට හේතු වන්නේ, • වාර්තාකරන ලද හානිකරණ දීමනාවල ප්‍රමාණාත්මකභාවයට සංකීර්ණ ගණනය කිරීම් ඇතුළත් වීම; සහ • තක්සේරු කිරීම සඳහා භාවිත කරන ලද කළමනාකරණ විනිශ්චයන්, උපකල්පනවල වැදගත්කම සහ අවිනිශ්චිතයන් හානිකරණය ගණනය කිරීමේදී කළමණාකාරිත්වය විසින් භාවිතා කරන ලද සැලකිය යුතු විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තුවල ප්‍රධාන ක්ෂේත්‍රයන් පහත පරිදි වේ. • කළමනාකරණයේ විනිශ්චයන් මත විශේෂ කර්මාන්ත මත කොවිඩ්-19 ඇතිකරන බලපෑම අන්තර්ගත කිරීම සහ ඒ හා සම්බන්ධ කර්මාන්තවල ප්‍රතිචාරයන් ලෙස රජයේ සහන පැකේජයන් සහ සමූහය විසින් ප්‍රදානය කරන ලද ණය ගෙවීම් පමා සහනයන්. කොවිඩ්-19 හි පවතින බලපෑමට අදාළ විනිශ්චයන්, බහු ආර්ථික අවස්ථා සහ මෙම එක් එක් අවස්ථා සඳහා තීරණය කරන ලද සම්භාවිතා බර කිරීම ඇතුළුව වර්තමාන සහ අපේක්ෂිත අනාගත බාහිර සාධක පිළිබිඹු කිරීමට ඉදිරි දැක්ම තොරතුරු භාවිතා කිරීම.	සමූහයේ හානිකරණ දීමනා ගණනය කිරීම් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා කොවිඩ්-19 බලපෑම ගණනය කිරීම හා අදාල කර්මාන්තවල වෙනස්වීම්, නිසි පරිදි ක්‍රියාත්මක කර තිබේද, යන්න මාගේ විගණන වාර්තා ඉදිරිපත් කරන දිනට ඇති තොරතුරු මත පදනම්ව තක්සේරු කර ඇත. අපගේ විගණන ක්‍රියාපටිපාටිය අතර පහත සඳහන් දෑ ඇතුලත් වේ. • ණය සහ අත්තිකාරම් හානිකරණ දීමනා ඇස්තමේන්තු කිරීම පිළිබඳ වූ පාලනයන් නිර්මාණය, ක්‍රියාත්මක කිරීම හා මෙහෙයුම් ඵලදායිකත්වය, දෝෂයන්ගේ ප්‍රමාණය තක්සේරු කිරීම සමාලෝචනය සහ ණය හානිකරණ ප්‍රතිපත්ති හා ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමණාකාරිත්වය විසින් අනුමත කිරීමද ඇතුළත්ව මා විසින් ඇගයීමට ලක් කරන ලදී. • සමූහයේ අදළ මූලාශ්‍ර වාර්තා හා ගිණුම් වාර්තා වලට විකඟ කරමින් හානිකරණ ගණනය කිරීම් සඳහා පාදක කරගත් දත්ත වල සම්පූර්ණතාවය හා නිරවද්‍යතාව මා විසින් පරීක්ෂා කරන ලදී. අපි පාදක ගණනය කිරීම් ද පරීක්ෂා කළෙමු. • ඉහත කරුණු වලට අමතරව පහත දැක්වෙන ක්‍රියාපටිපාටීන් සිදු කරන ලදී. ණය හා අත්තිකාරම් කේවල පදනමට හානිකරණය සඳහා ඇගයීම - ණය ගැනුම්කරුගේ විශේෂිත තත්ත්වයන් මත පදනම්ව ණය ගුණාත්මකභාවය පිළිබඳ කළමනාකාරිත්වයේ අභ්‍යන්තර තක්සේරුවල සාධාරණත්වය සහ කාලෝචිත බව මම තක්සේරු කළෙමි. - කොවිඩ් -19 හි පවතින බලපෑම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සිදු කරන ලද හානිකරණ දීමනාව ගණනය කිරීමට භාවිතා කළ ප්‍රධාන යෙදවුම්වල සාධාරණත්වය මම ඇගයීමට ලක් කළෙමි. මුදල් ප්‍රවාහ ඇස්තමේන්තුවල වටිනාකම සහ කාලය, ඉහළ අවදානම් කර්මාන්ත, අයකරගැනීමේ ක්‍රියාවලියේ තත්ත්වය සහ ඇපකර අගයන් සැලකිල්ලට ගනිමින් එවැනි ඇගයීම් සිදු කරන ලදී. මූල්‍ය වත්කම් සාමූහික පදනමට හානිකරණය සඳහා ඇගයීම. - හානිකරණ දීමනාවෙහි භාවිතා කරන ප්‍රධාන ගණනය කිරීම් පරීක්ෂා කළෙමි. - යොදගත් ක්‍රමවේදයන් සහ කළමනාකරණය විසින් භාවිතා කරන ලද විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සාධාරණ දැයි මම තක්සේරු කළෙමි. අපගේ පරීක්ෂණයට භාවිතා කරන ලද ඉදිරි දැක්මක් සහිත තොරතුරුවල සාධාරණත්වය, සලකා බැලූ ආර්ථික අවස්ථා සහ එම එක් එක් අවස්ථා සඳහා යොදගන්නා ලද සම්භාවිතා බර තක්සේරු කිරීම ඇතුළත් විය. - සටහන් 3.3.8.4, 4.4.11, 14, 28 සහ 29 හි දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම්වල ප්‍රමාණාත්මකභාවය මා විසින් තක්සේරු කරන ලදී.

විගණකාධිපතිතුමාගේ වාර්තාව

ප්‍රධාන විගණන කරුණු	මාගේ විගණනයේදී ප්‍රධාන විගණන කරුණු ආමන්ත්‍රණය කරන ලද අකාරය
තොරතුරු තාක්ෂණ පද්ධති සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය මත පාලනයන් සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේ සැලකිය යුතු කොටසක් මූලික වශයෙන් ස්වයංක්‍රීය ක්‍රියාවලි සහ අභ්‍යන්තර පාලන සහිත බහුවිධ තොරතුරු තාක්ෂණ පද්ධති මත රඳා පවතී. තවද, තොරතුරු තාක්ෂණ පද්ධති මගින් ජනනය කරන ලද දත්ත සහ වාර්තා භාවිතා කරමින් ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම් සකස් කරනු ලැබේ. ඒවා පැතුරුම්පත් භාවිතයෙන් සම්පාදනය කර සකස් කර ඇත. ඒ අනුව, මූල්‍ය වාර්තාකරණයට අදාළ තොරතුරු තාක්ෂණ පද්ධති සහ අදාළ අභ්‍යන්තර පාලනයන් ප්‍රධාන විගණන කරුණක් ලෙස සැලකේ.	මාගේ විගණන ක්‍රියාපටිපාටියට පහත සඳහන් දෑ ඇතුලත් විය. - මූල්‍ය වාර්තාකරණයට සහ හෙළිදරව් කිරීම් වලට අදාල ක්‍රියාවලියන්හි අභ්‍යන්තර පාලන පරිසරය පිලිබඳ අවබෝධයක් ලබගත්තෙමි. - සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියට අදාළ ප්‍රධාන තොරතුරු තාක්ෂණ පද්ධතිවල අදාළ පාලනයන් හඳුනාගෙන පරීක්ෂා කළෙමි. - පරිශීලක ප්‍රවේශය සහ වෙනස්කම් කළමණාකරණ ඇතුළුව, තොරතුරු තාක්ෂණ පාලනවල සැලසුම් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඇගයීම සඳහා විශේෂිත වූ සම්පත් දෘයකත්වයක් සම්බන්ධ කර ගත්තෙමි. - සාමාන්‍ය ලෙජර් සැසඳීම ඇතුළුව නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සඳහා ප්‍රධාන හෙළිදරව් කිරීම් උත්පාදනය කිරීමට භාවිතා කරන වාර්තාවල ප්‍රධාන මූලාශ්‍ර දත්ත පරීක්ෂා කළෙමි. - සමූහයට බලපාන සයිබර් ආරක්ෂණ අවදානම් සහ මෙම අවදානම් විසඳීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව මූලික වශයෙන් විමසීම් තුළින් මම ඉහළ මට්ටමේ අවබෝධයක් ලබා ගත්තෙමි. තවද, දුරස්ථ වැඩ කිරීමේ ක්‍රියාකාරකම් පිළිබඳ සමූහයේ අධීක්ෂණය ඇතුළුව දුරස්ථ වැඩ ප්‍රවේශ භාවිතය වැඩි කිරීම සැලකිල්ලට ගෙන, ආරක්ෂක අධීක්ෂණ ක්‍රියා පටිපාටිවල යම් වෙනසක් සිදු කර තිබේද යන්න මම පරීක්ෂා කළෙමි.

1.4 බැංකුවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමූහයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුලත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමය.

බැංකුවේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශ්වයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී.

වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා බැංකුව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට බැංකුව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් .අවශ්‍යතාවය අනුව බැංකුවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.



ඩබ්ලිව් පී සී වික්‍රමරත්න
විගණකාධිපති

ලාභ හෝ අලාභ ප්‍රකාශනය

		බැංකුව			සමූහය		
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2021	2020	වෙනස	2021	2020	වෙනස
		රු. '000	රු. '000	%	රු. '000	රු. '000	%
මුළු ආදායම	7	290,362,494	247,163,965	17.5	297,620,853	252,756,030	17.8
පොළී ආදායම		260,513,393	226,310,574	15.1	266,565,137	231,454,401	15.2
අඩු කළා: පොළී වියදම		149,261,452	151,534,708	(1.5)	151,575,510	154,251,160	(1.7)
ශුද්ධ පොළී ආදායම	8	111,251,941	74,775,866	48.8	114,989,627	77,203,241	48.9
ගාස්තු සහ කොමිස් ආදායම		17,649,434	14,261,148	23.8	17,931,406	14,500,865	23.7
අඩු කළා: ගාස්තු සහ කොමිස් වියදම		3,470,032	2,302,057	50.7	3,508,619	2,324,128	51.0
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	9	14,179,402	11,959,091	18.6	14,422,787	12,176,737	18.4
වෙළඳපොළ ගනුදෙනුවලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	10	4,742,396	2,627,620	80.5	4,813,011	2,643,463	82.1
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය උපකරණයන් ගෙන් ලත් ශුද්ධ ලාභ/(පාඩු)	11	1,347,097	928,234	45.1	1,309,021	991,525	32.0
මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	12	393,920	482,684	(18.4)	466,392	492,996	(5.4)
වෙනත් මෙහෙයුම් ආදායම	13	5,716,254	2,553,705	123.8	6,535,886	2,672,780	144.5
මුළු මෙහෙයුම් ආදායම		137,631,010	93,327,200	47.5	142,536,724	96,180,742	48.2
අඩු කළා: ණය හානිය සහ වෙනත් අලාභයන් සඳහා ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය) කිරීම	14	43,733,731	31,232,178	40.0	43,661,965	32,032,073	36.3
ශුද්ධ මෙහෙයුම් ආදායම		93,897,279	62,095,022	51.2	98,874,759	64,148,669	54.1
අඩු කළා: මෙහෙයුම් වියදම							
සේවක මණ්ඩල වියදම	15	24,981,940	18,190,480	37.3	26,925,255	20,050,612	34.3
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම	16	4,146,256	4,254,528	(2.5)	4,239,633	4,391,152	(3.5)
වෙනත් වියදම්	17	12,552,393	10,639,665	18.0	13,866,816	12,080,058	14.8
මුළු මෙහෙයුම් වියදම		41,680,589	33,084,673	26.0	45,031,704	36,521,822	23.3
මූල්‍ය සේවා මත බදු වලට පෙර ලාභය/(අලාභය)		52,216,690	29,010,349	80.0	53,843,055	27,626,847	94.9
අඩු කළා: මූල්‍ය සේවා මත බදු	18.1	9,027,173	5,458,468	65.4	9,339,679	5,463,182	71.0
මූල්‍ය සේවා මත බදු වලට පසු ලාභය/(අලාභය)		43,189,517	23,551,881	83.4	44,503,376	22,163,665	100.8
ආශ්‍රිත සමාගම්වල ලාභ/(පාඩු) කොටස, බදු පසු	19	-	-	-	133,677	82,488	62.1
ආදායම් බද්දට පෙර ලාභය/(අලාභය)		43,189,517	23,551,881	83.4	44,637,053	22,246,153	100.7
අඩු කළා: ආදායම් බදු වියදම	18.2	5,599,410	5,786,749	(3.2)	5,953,659	5,938,747	0.3
වර්ෂය සඳහා ලාභය/(අලාභය)		37,590,107	17,765,132	111.6	38,683,394	16,307,406	137.2
වර්ෂයේ ලාභයෙන්:							
බැංකුවේ කොටස්හිමියාට අදාළ කොටස		37,590,107	17,765,132	111.6	38,490,392	16,842,514	128.5
පාලනයට යටත් නොවන හිමිකම්		-	-	-	193,002	(535,108)	(136.1)
වර්ෂය සඳහා ලාභය/(අලාභය)		37,590,107	17,765,132	111.6	38,683,394	16,307,406	137.2
කොටසක ඉපැයුම් සහ කොටසක ලාභාංශ	20						
කොටසක මූලික ඉපැයුම් (රු.)		1,503.60	710.61	111.6	1,539.62	673.70	128.5
කොටසක තනුක ඉපැයුම් (රු.)		1,503.60	710.61	111.6	1,539.62	673.70	128.5
කොටසක ලාභාංශ (රු.)		73.86	63.86	15.7	73.86	63.86	15.7

පිටු අංක 140 සිට 315 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

	බැංකුව			සමූහය		
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2021	2020	වෙනස	2021	2020	වෙනස
	රු. '000	රු. '000	%	රු. '000	රු. '000	%
වර්ෂය සඳහා ලාභය/(අලාභය)	37,590,107	17,765,132	111.6	38,683,394	16,307,406	137.2
ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කිරීමට හැකි අයිතමයන්						
විදේශීය මෙහෙයුම්වල මූල්‍ය වාර්තා පරිවර්තනයේ දී ඇතිවන ශුද්ධ විනිමය ලාභ/(අලාභ)	794,531	11,571	6,766.6	1,126,180	233,259	382.8
මුදල් ප්‍රවාහ හෙජ් උපකරණ මත ශුද්ධ ලාභ/(අලාභ)	3,239,266	-	-	3,239,266	-	-
වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන ණය උපකරණවල ආයෝජන මත ශුද්ධ ලාභ/(අලාභ)	(1,246,474)	114,650	(1,187.2)	(1,256,480)	137,205	(1,015.8)
වෙනත් විස්තීර්ණ අදායම යටතේ සාධාරණ අගයට පවතින මූල්‍ය ආයෝජන මත ශුද්ධ (ලාභ)/අලාභ ලාභයට හෝ අලාභයට මාරු කිරීම	(44,002)	(3,521)	1,149.7	(44,002)	(3,521)	1,149.7
ඉහත අගය මත විලම්බිත බදු බලපෑම්	321,430	(19,946)	(1,711.5)	321,430	(19,946)	(1,711.5)
ආශ්‍රිත සමාගම්හි වෙනත් විස්තීර්ණ ආදායම් කොටස, බදු පසු	-	-	-	11,376	(19,439)	(158.5)
ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කිරීමට හැකි අයිතමයන්ගේ එකතුව	3,064,751	102,754	2,882.6	3,397,770	327,558	937.3
ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොකරන අයිතමයන්						
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන ස්කන්ධ උපකරණවල සාධාරණ අගයේ වෙනස්කම්	(187,320)	(271,739)	(31.1)	(155,320)	(805)	19,194.4
ඉහත අගය මත විලම්බිත බදු බලපෑම්	40,437	(91,689)	(144.1)	40,437	(91,689)	(144.1)
ප්‍රත්‍යාගණන ලාභ/(අලාභ) වල වෙනස්කම්	(284,831)	6,932,984	(104.1)	345,441	7,774,192	(95.6)
ඉහත අගය මත විලම්බිත බදු බලපෑම්	979,181	(1,941,235)	(150.4)	1,144,315	(2,176,773)	(152.6)
විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභ/(අලාභ)	6,769,360	(9,530,481)	(171.0)	6,834,355	(9,582,774)	(171.3)
ඉහත අගය මත විලම්බිත බදු බලපෑම්	(2,024,826)	3,007,330	(167.3)	(2,040,425)	3,020,118	(167.6)
ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොකරන අයිතමයන්ගේ එකතුව	5,292,001	(1,894,830)	(379.3)	6,168,803	(1,057,731)	(683.2)
වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු	8,356,752	(1,792,076)	(566.3)	9,566,573	(730,173)	(1,410.2)
වර්ෂයට අදාළ මුළු විස්තීර්ණ ආදායම	45,946,859	15,973,056	187.7	48,249,967	15,577,233	209.7
මුළු විස්තීර්ණ ආදායමෙන්:						
බැංකුවේ කොටස්හිමියාට අදාළ කොටස	45,946,859	15,973,056	187.7	48,028,306	16,074,875	198.8
පාලනයට යටත් නොවන හිමිකම	-	-	-	221,661	(497,642)	(144.5)
වර්ෂයට අදාළ මුළු විස්තීර්ණ ආදායම	45,946,859	15,973,056	187.7	48,249,967	15,577,233	209.7

පිටු අංක 140 සිට 315 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

		බැංකුව			සමූහය		
දෙසැම්බර් 31 දිනට	සටහන	2021	2020	වෙනස	2021	2020	වෙනස
		රු. '000	රු. '000	%	රු. '000	රු. '000	%
වත්කම්							
මුදල් සහ මුදල් හා සමාන දෑ	22	82,647,406	84,416,624	(2.1)	82,313,908	83,198,445	(1.1)
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	23	74,121,781	33,351,852	122.2	74,121,781	33,351,852	122.2
බැංකුවල ඇති තැන්පතු	24	4,957,417	27,615,851	(82.0)	5,342,369	27,913,969	(80.9)
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	25	2,074,474	2,001,047	3.7	2,976,664	3,822,312	(22.1)
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	26	4,342,531	548,926	691.1	4,342,531	548,926	691.1
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	27	9,230,022	9,856,220	(6.4)	9,640,813	10,869,471	(11.3)
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්							
- ණය සහ අත්තිකාරම්	28	2,413,762,291	1,988,409,007	21.4	2,446,330,329	2,018,393,730	21.2
- ණය සහ වෙනත් උපකරණ	29	1,082,179,876	724,390,172	49.4	1,082,837,662	725,579,585	49.2
වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	30	18,302,556	15,362,480	19.1	22,879,810	17,913,778	27.7
පරිපාලිත සමාගම්වල ආයෝජන	31	8,181,138	6,513,048	25.6	-	-	-
ආශ්‍රිත සමාගම්වල ආයෝජන	32	92,988	92,988	-	595,531	510,084	16.8
ආයෝජන දේපළ	33	2,414,640	2,534,118	(4.7)	107,704	114,370	(5.8)
දේපළ, පිරියත හා උපකරණ	34	32,757,485	33,366,003	(1.8)	46,944,191	47,418,620	(1.0)
භාවිත අයිතිය සහිත වත්කම් / කල්බදු දේපළ	35	3,137,955	3,208,879	(2.2)	2,825,719	2,643,686	6.9
අස්පෘශ්‍ය වත්කම්	36	1,039,985	1,020,881	1.9	1,214,591	1,228,597	(1.1)
විලම්බිත බදු වත්කම්	37	2,152,712	-	-	2,213,847	76,873	2,779.9
වෙනත් වත්කම්	38	61,888,586	50,292,999	23.1	63,262,306	51,189,477	23.6
මුළු වත්කම්		3,803,283,843	2,982,981,095	27.5	3,847,949,756	3,024,773,775	27.2
වගකීම්							
බැංකු වලට ගෙවිය යුතු	39	17,936,070	2,402,043	646.7	18,646,339	2,628,434	609.4
ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	40	162,156,413	57,106,652	184.0	161,668,335	57,697,780	180.2
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	41	380,328	102,182	272.2	380,328	102,182	272.2
ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම්							
- තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	42	2,866,894,010	2,474,775,488	15.8	2,886,237,094	2,493,110,291	15.8
- වෙනත් ණය ගැනීම්	43	444,107,977	180,884,127	145.5	447,875,002	185,102,055	142.0
නිකුත් කළ ණය සුරැකුම්පත්	44	-	-	-	2,107,182	2,107,493	-
ප්‍රවර්තන බදු වගකීම්	45	647,993	591,723	9.5	978,532	775,259	26.2
විලම්බිත බදු වගකීම්	37	-	923,462	(100.0)	2,153,309	3,305,797	(34.9)
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත	46	-	-	-	413,743	498,767	(17.0)
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත නොවන	46	-	-	-	526,017	488,784	7.6
වෙනත් වගකීම්	47	46,042,365	44,898,628	2.5	47,461,127	45,372,722	4.6
යටත් කාලීන වගකීම්	49	64,358,855	64,637,407	(0.4)	64,105,970	64,627,397	(0.8)
මුළු වගකීම්		3,602,524,011	2,826,321,712	27.5	3,632,552,978	2,855,816,961	27.2

		බැංකුව			සමූහය		
දෙසැම්බර් 31 දිනට	සටහන	2021	2020	වෙනස	2021	2020	වෙනස
		රු. '000	රු. '000	%	රු. '000	රු. '000	%
ස්කන්ධය							
කොටස් ප්‍රාග්ධනය	50	25,000,000	25,000,000	-	25,000,000	25,000,000	-
ස්ථාවර සංචිත අරමුදල	51	14,491,000	13,739,000	5.5	14,491,000	13,739,000	5.5
රඳවාගත් ඉපැයුම්	52	136,739,177	96,983,948	41.0	138,104,222	97,463,266	41.7
මුදල් ප්‍රවාහ හෙජ් සංචිත	53	3,239,266	-	-	3,239,266	-	-
වෙනත් සංචිත	54	21,290,389	20,936,435	1.7	32,972,844	31,486,761	4.7
බැංකුවේ කොටස්හිමියාට අයත් මුළු ස්කන්ධය		200,759,832	156,659,383	28.2	213,807,332	167,689,027	27.5
පාලනයට යටත් නොවන හිමිකම	55	-	-	-	1,589,446	1,267,787	25.4
මුළු ස්කන්ධය		200,759,832	156,659,383	28.2	215,396,778	168,956,814	27.5
මුළු වගකීම් සහ ස්කන්ධය		3,803,283,843	2,982,981,095	27.5	3,847,949,756	3,024,773,775	27.2
අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්	57	879,356,475	600,210,687	46.5	897,771,496	619,669,887	44.9
කොටසක ශුද්ධ වත්කම් වටිනාකම (රු.)	50	8,030.39	6,266.38	28.2	8,552.29	6,707.56	27.5

පිටු අංක 140 සිට 315 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂයේ ලාභය සත්‍ය හා සාධාරණ ලෙස නිරූපණය කරන බවට සහතික කරමි.

ඩබ් පී රසල් ෆොන්සේකා
ප්‍රධාන මූල්‍ය නිළධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කරන ලදී.

කාංචන රත්වත්තේ
සභාපති

ඒ සී එම් ප්‍රනාන්දු
අධ්‍යක්ෂ

කේ ඊ ඩී සුමනසිරි
මහා කළමනාකරු

2022 පෙබරවාරි 24
කොළඹ දීය.

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

සමූහය

	සටහන	කොටස් ප්‍රාග්ධනය	ස්ථාවර සංචිත අරමුදල	මුදල් ප්‍රවාහ හෙජ් සංචිත
		රු. '000	රු. '000	රු. '000
2020 ජනවාරි 1 දිනට ශේෂය		25,000,000	13,383,000	-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම				
වර්ෂය සඳහා ලාභය		-	-	-
වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු		-	-	-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		-	-	-
සෘජුව හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ ගනුදෙනු				
2020 සඳහා ලාභාංශ	20.3	-	-	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	51	-	356,000	-
ඉවත් කරන ලද වත්කම් වල ප්‍රත්‍යාගණන අතිරික්තය		-	-	-
හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ මුළු ගනුදෙනු		-	356,000	-
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය		25,000,000	13,739,000	-
2021 ජනවාරි 1 දිනට ශේෂය		25,000,000	13,739,000	-
				-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම				-
වර්ෂය සඳහා ලාභය		-	-	-
වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු		-	-	3,239,266
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		-	-	3,239,266
සෘජුව හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ ගනුදෙනු				
2021 සඳහා ලාභාංශ	20.3	-	-	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	51	-	752,000	-
ඉවත් කරන ලද වත්කම් වල ප්‍රත්‍යාගණන අතිරික්තය		-	-	-
හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ මුළු ගනුදෙනු		-	752,000	-
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය		25,000,000	14,491,000	3,239,266

පිටු අංක 140 සිට 315 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

අනෙකුත් සංචිත				
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය	වෙනත් සංචිත	ප්‍රත්‍යාගණන සංචිතය	රඳවාගත් ඉපැයුම්	මුළු හිමිකම
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
1,976,601	2,539,318	11,694,338	87,689,480	142,282,737
-	-	-	17,765,132	17,765,132
(272,245)	11,571	4,991,749	(6,523,151)	(1,792,076)
(272,245)	11,571	4,991,749	11,241,981	15,973,056
-	-	-	(1,596,410)	(1,596,410)
-	-	-	(356,000)	-
-	-	(4,897)	4,897	-
-	-	(4,897)	(1,947,513)	(1,596,410)
1,704,356	2,550,889	16,681,190	96,983,948	156,659,383
1,704,356	2,550,889	16,681,190	96,983,948	156,659,383
-	-	-	37,590,107	37,590,107
(1,115,929)	794,531	694,350	4,744,534	8,356,752
(1,115,929)	794,531	694,350	42,334,641	45,946,859
-	-	-	(1,846,410)	(1,846,410)
-	-	-	(752,000)	-
-	-	(18,998)	18,998	-
-	-	(18,998)	(2,579,412)	(1,846,410)
588,427	3,345,420	17,356,542	136,739,177	200,759,832

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

සමූහය

	සටහන	කොටස් ප්‍රාග්ධනය	ස්ථාවර සංචිත අරමුදල	මුදල් ප්‍රවාහ හෙජ් සංචිත
		රු. '000	රු. '000	රු. '000
2020 ජනවාරි 1 දිනට ශේෂය		25,000,000	13,383,000	
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම				
වර්ෂය සඳහා ලාභය		-	-	
වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු		-	-	
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		-	-	
කෘජුව හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ ගනුදෙනු				
2020 සඳහා ලාභාංශ	20.3	-	-	
පාලනයට යටත් නොවන හිමිකම සඳහා ගෙවූ පරිපාලිත ලාභාංශ		-	-	
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	51	-	356,000	
ඉවත් කරන ලද වත්කම් වල ප්‍රත්‍යාගණන අතිරික්තය		-	-	
හිමිකමට හඳුනා ගත් කොටස්හිමියන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු		-	356,000	
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය		25,000,000	13,739,000	
2021 ජනවාරි 1 දිනට ශේෂය		25,000,000	13,739,000	
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම				
වර්ෂය සඳහා ලාභය		-	-	
වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු		-	-	
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		-	-	
කෘජුව හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ ගනුදෙනු				
2021 සඳහා ලාභාංශ	20.3	-	-	
පාලනයට යටත් නොවන හිමිකම සඳහා ගෙවූ පරිපාලිත ලාභාංශ		-	-	
පරිපාලිත සමාගම්වල බැහැර කිරීම්		-	-	
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	51	-	752,000	
ඉවත් කරන ලද වත්කම් වල ප්‍රත්‍යාගණන අතිරික්තය		-	-	
පාලනයට යටත් නොවන හිමිකම වෙනස් වීම		-	-	
ලබා නොගත් ලාභාංශ නැවත මාරු කිරීම		-	-	
හිමිකමට හඳුනා ගත් කොටස්හිමියන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු		-	752,000	
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය		25,000,000	14,491,000	

පිටු අංක 140 සිට 315 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

බැංකුවේ කොටස්හිමියාට අදාළ කොටස

	අනෙකුත් සංචිත					
	වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය	වෙනත් සංචිත	ප්‍රත්‍යාගණන සංචිතය	රඳවාගත් ඉපැයුම්	පාලනයට යටත් නොවන හිමිකම	මුළු හිමිකම
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
-	2,571,824	3,827,349	19,287,824	89,140,565	1,785,087	154,995,649
-	-	-	-	16,842,514	(535,108)	16,307,406
-	1,324	233,259	5,570,078	(6,572,300)	37,466	(730,173)
-	1,324	233,259	5,570,078	10,270,214	(497,642)	15,577,233
-	-	-	-	(1,596,410)	-	(1,596,410)
-	-	-	-	-	(19,658)	(19,658)
-	-	-	-	(356,000)	-	-
-	-	-	(4,897)	4,897	-	-
-	-	-	(4,897)	(1,947,513)	(19,658)	(1,616,068)
-	2,573,148	4,060,608	24,853,005	97,463,266	1,267,787	168,956,814
	2,573,148	4,060,608	24,853,005	97,463,266	1,267,787	168,956,814
-	-	-	-	38,490,392	193,002	38,683,394
3,239,266	(1,089,736)	1,126,180	1,468,637	4,793,566	28,660	9,566,573
3,239,266	(1,089,736)	1,126,180	1,468,637	43,283,958	221,662	48,249,967
-	-	-	-	(1,846,410)	-	(1,846,410)
-	-	-	-	-	(10,280)	(10,280)
-	-	-		(64,923)	(6,142)	(71,065)
-	-	-	-	(752,000)	-	-
-	-	-	(18,998)	18,998	-	-
-	-	-	-	-	116,419	116,419
-	-	-	-	1,333	-	1,333
-	-	-	(18,998)	(2,643,002)	99,997	(1,810,003)
3,239,266	1,483,412	5,186,788	26,302,644	138,104,222	1,589,446	215,396,778

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව		සමූහය	
		2021	2020	2021	2020
		රු. '000	රු. '000	රු. '000	රු. '000
මෙහෙයුම් කටයුතුවලින් ලත් මුදල් ප්‍රවාහ					
ආදායම් බදු පෙර ලාභය		43,189,517	23,551,881	44,637,053	22,246,153
ගැලපුම්:					
ශුද්ධ පොළී ආදායම	8	(111,251,941)	(74,775,866)	(114,989,627)	(77,203,241)
ලාභාංශ ආදායම	10/13	(302,564)	(403,351)	(391,238)	(404,776)
පරිපාලිත හා ආශ්‍රිත සමාගම්වලින් ලැබූ ලාභාංශ	13	(394,454)	(434,475)	-	-
ආශ්‍රිත සමාගම්වල (ලාභ)/පාඩු කොටස, බදු පසු	19	-	-	(133,677)	(82,488)
මෙහෙයුම් වත්කම්වල වෙනස්වීම්	56.1	(495,708,888)	(412,923,813)	(497,153,928)	(408,051,752)
මෙහෙයුම් වගකීම්වල වෙනස්වීම්	56.2	535,337,949	496,722,445	535,950,023	497,455,395
බදු පෙර ලාභයේ ඇතුළත් මුදල් නොවන වෙනත් අයිතමයන්	56.3	46,351,388	39,963,871	46,385,644	40,978,788
ආයෝජන කටයුතුවලින් ලද වෙනත් ශුද්ධ ලාභ		(1,741,017)	(1,410,918)	(1,775,413)	(1,484,521)
		15,479,990	70,289,774	12,528,837	73,453,558
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් තුළින් ප්‍රතිලාභ ගෙවීම		(8,890,151)	(8,590,729)	(8,897,006)	(8,625,429)
පොළී ලැබීම්		193,501,226	168,040,640	199,239,746	172,733,898
පොළී ගෙවීම්		(136,973,421)	(128,555,512)	(138,568,991)	(130,549,871)
ලාභාංශ ලැබීම්		75,792	73,023	126,157	73,245
මෙහෙයුම් කටයුතු වලින් ලැබූ/(යෙදවූ) ශුද්ධ මුදල්, බදු පෙර		63,193,436	101,257,196	64,428,743	107,085,401
ආදායම් බදු ගෙවීම්	45	(8,166,811)	(5,158,415)	(8,399,520)	(5,361,254)
මෙහෙයුම් කටයුතු වලින් ලැබූ/(යෙදවූ) ශුද්ධ මුදල්		55,026,625	96,098,781	56,029,223	101,724,147
ආයෝජන කටයුතු වලින් ලත් මුදල් ප්‍රවාහ					
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය ආයෝජනවල ශුද්ධ වැඩිවීම්		(345,016,186)	(145,229,377)	(344,484,560)	(145,189,269)
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම		(4,346,097)	(935,063)	(6,339,860)	(412,408)
පරිපාලිත සමාගම්වල ආයෝජන		(1,668,090)	-	-	-
පරිපාලිත සමාගම් විකිණීමෙන් ලද ආදායම		-	-	180,550	-
ආයෝජන දේපල වලට චිකතු වීම්		-	(3,007)	-	-
දේපළ පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම්		(1,771,198)	(2,946,477)	(1,900,544)	(3,059,995)
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම්		(471,365)	(367,195)	(471,365)	(401,078)
දේපළ පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ලැබීම්		21,998	37,635	102,831	50,688
ලාභාංශ ලැබීම්		621,226	764,802	265,081	331,531
පොළී ලැබීම්		53,951,314	44,988,953	54,264,536	45,439,524
ආයෝජන කටයුතු වලින් ලද/ (භාවිතා කළ) ශුද්ධ මුදල්		(298,678,398)	(103,689,729)	(298,383,331)	(103,241,007)

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2021	2020	2021	2020
		රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ					
වෙනත් ණයට ගැනීම්වල ශුද්ධ වැඩිවීම්		245,235,448	28,159,729	245,076,637	21,685,842
කොටස් නිකුතුවෙන් ලද මුදල්		-	-	233,902	-
ණයකර/ ප්‍රාග්ධන බැඳුම්කර නිකුතුවෙන් ලද මුදල්		8,750,000	15,000,000	8,500,000	15,000,000
ණයකර නිදහස් කිරීම සඳහා ගෙවූ මුදල්		(9,232,254)	(4,779,196)	(9,222,244)	(4,779,196)
බැංකුවේ කොටස්හිමියාට ගෙවූ ලාභාංශ		(1,846,410)	(1,596,410)	(1,846,410)	(1,596,410)
පාලනයට යටත් නොවන හිමිකම සඳහා ගෙවූ ලාභාංශ		-	-	(10,280)	(19,658)
ණය ගැනීම් හා ණය සුරැකුම්පත් සඳහා පොළී ගෙවීම්		(16,443,988)	(8,738,923)	(17,165,671)	(9,461,333)
මූල්‍ය කටයුතු වලින් ලද/ (භාවිතා කළ) ශුද්ධ මුදල්		226,462,796	28,045,200	225,565,934	20,829,245
වර්ෂය තුළදී මුදල් සහ මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		(17,188,977)	20,454,252	(16,788,174)	19,312,385
වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		83,978,210	63,523,958	82,533,640	63,221,255
වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		66,789,233	83,978,210	65,745,466	82,533,640
මුදල් සහ මුදල් හා සමාන දෑ විශ්ලේෂණය					
මුදල් සහ මුදල් හා සමාන දෑ	22	82,647,406	84,416,624	82,313,908	83,198,445
බැංකු අයිරා	39	(15,858,173)	(438,414)	(16,568,442)	(664,805)
වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		66,789,233	83,978,210	65,745,466	82,533,640

පිටු අංක 140 සිට 315 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1.0 වාර්තාකරණ ඒකකය

1.1 ආයතනික තොරතුරු

ලංකා බැංකුව ("බැංකුව"), 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත යටතේ 1939 අගෝස්තු 1 දින ශ්‍රී ලංකාව තුළ ප්‍රතිෂ්ඨාපිත රාජ්‍ය බැංකුවකි. 1988 අංක 30 දරණ බැංකු පනත හා ඒ හා අනුෂාංගික සංශෝධනවලට යටත්වන ලෙස ස්ථාපිත කර ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවකි. ලංකා බැංකුවේ ලියාපදිංචි කාර්යාලය ශ්‍රී ලංකාවේ, කොළඹ 01, ලංකා බැංකු මාවත, ලංකා බැංකු චතුරශ්‍රයෙහි අංක 01 දරණ ස්ථානයේ පිහිටා ඇත. ලංකා බැංකුව නිකුත් කර ඇති ණයකර කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇත. 2021 දෙසැම්බර් 31 දිනට සේවකයින් 8,337 ක් ලංකා බැංකුවෙහි සේවයේ නියුක්තව සිටියහ (2020 දෙසැම්බර් 31 දිනට එම ප්‍රමාණය 8,479 කි).

1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2021 දෙසැම්බර් 31 දිනට හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන බැංකුව, ඊට අයත් වන පරිපාලිතයන් (බැංකුව සහ එහි පරිපාලිතයන්ගේ ඒකතුව සමූහය සහ තනිව ගත් කල සමූහ ආයතන ලෙස හැඳින්වේ) සහ ආශ්‍රිත සමාගම්වල සමූහයට ඇති අයිතිය අයත් වන ආකාරයට සකස් කර ඉදිරිපත් කර ඇත. සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකොඩ්ස් සොලුයුෂන්ස් (පෞද්ගලික) සමාගම සහ සී/ස සීබෑන්ක් ඇසෙට් මැනෙජ්මන්ට් සමාගම යන ආශ්‍රිත සමාගම් හැර සමූහයේ අනෙකුත් සමාගම්වල ගිණුම් වර්ෂය දෙසැම්බර් 31 න් අවසන් වේ. සමූහයේ අවසාන මව් සමාගම බැංකුව වේ.

1.3 ප්‍රධාන ක්‍රියාකාරකම්

1.3.1 බැංකුව

ගෙවුණු වර්ෂය තුළ බැංකුව නිරත වූ ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස පුද්ගලික බැංකුකරණය, ආයතනික බැංකුකරණය, සංවර්ධන මූල්‍යකරණය, අක්වෙරළ බැංකු කටයුතු, වෙළඳ මූල්‍ය, කල්බදුකරණය, ප්‍රාථමික වෙළඳ කටයුතු, ආයෝජන බැංකුකරණය සහ වත්කම් කළමනාකරණය, භාණ්ඩාගාර මෙහෙයුම්, නියෝජිත ආයතන සහ මුදල් ප්‍රේෂණ, ඉස්ලාමීය බැංකුකරණය, බැංකු රක්ෂණය, උකස් සේවා, ණයපත් පහසුකම්, විදේශ ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු සහ වෙනත් මූල්‍ය සේවාවන් හැඳින්විය හැකිය.

1.3.2 පරිපාලිතයන්

ලංකා බැංකුවේ පරිපාලිතයන්හි මූලික ක්‍රියාකාරකම් පහත දක්වා ඇත:

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී	ලංකා බැංකු ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලේ අයිතිය, පාලනය, නඩත්තු කිරීම හා උපයෝගීතාවය රඳවා ගැනීම.
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී	කල්බදුකරණය සහ කුලී පිට ගනුදෙනු, ආයතනික හා ශාඛා ණය පහසුකම්, ආයතනික වෙළඳ මූල්‍ය උපදේශක සේවා, ප්‍රාග්ධන වෙළඳපොළ ක්‍රියාකාරකම්, ආන්තික වෙළඳාම සහ ක්ෂුද්‍ර මූල්‍යනය, කෘෂිකාර්මික ණය පහසුකම් සැපයීම, ඉස්ලාමීය මූල්‍යකරණය, දේපළ ආශ්‍රිත සේවා, උකස් සේවා සහ තැන්පතු බාරගැනීම.
ලංකා බැංකුව (යූ කේ) සමාගම	එක්සත් රාජධානියේ මූල්‍ය සේවා අධිකාරිය යටතේ ලියාපදිංචි කර ඇති, වාණිජ බැංකුවක් වන අතර, ශාඛා සහ ආයතනික බැංකුකරණය, භාණ්ඩාගාර මෙහෙයුම්, නියෝජිත බැංකු සේවා සහ වෙළඳ මූල්‍ය සේවා සැපයීමේ නිරතව සිටී.
සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනෙජ්මන්ට් (පෞද්ගලික) සමාගම	කොළඹ 03, බී ඕ සී මර්චන් ටවර් හි සහ මහනුවර සීබෑන්ක් හවුස් හි කාර්යාල සඳහා සහ පහසුකම් කුලියට දීම.
සී/ස බී ඕ සී ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම	සංචාරක සේවා සම්බන්ධ කටයුතුවල නිරතවීම.
සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගම	හෝටල් සේවා සැපයීම.
සී/ස සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගම	සංචාරක නිවාස/ හෝටල් / විවේකාගාර/ආගන්තුක නිවාස කළමනාකරණය, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.
සී/ස වීම් බී එස් වල්ඩ් ඉන්ෂුවරන්ස් සමාගම	ජීවිත සහ ජීවිත නොවන රක්ෂණ සේවා සැපයීම.
සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම	ක්‍රියාකාරිත්වයේ නොමැත.

1.3.3 ආශ්‍රිතයන්

ලංකා බැංකුවේ ආශ්‍රිත සමාගම්හි මූලික ක්‍රියාකාරකම් පහත දක්වා ඇත.

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
සී/ස සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම	ඒකක භාර ආරමුදල් සහ ආයතනික සහ පෞද්ගලික ආයෝජන කළඹයන් කළමනාකරණය.
සී/ස ලංකා සිකියුරිටීස් (පෞද්ගලික) සමාගම	ලියාපදිංචි කොටස් තැරැව්කරුවෙකු වන අතර ස්කන්ධ සහ ණය සුරැකුම් ගනුදෙනු, ස්කන්ධ සහ ණය සුරැකුම් තැරැව්කාර සේවා සහ ණය සහ ස්කන්ධ සුරැකුම් භාර ගැනීම.
සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලුයුෂන්ස් (පෞද්ගලික) සමාගම	ගොඩනැගිලි සහ වත්කම් කුලියට දීම.
සී/ස සඳර්න් ඩිවලප්මනට් ෆයිනෑන්ෂල් සමාගම	ක්‍රියාකාරිත්වයේ නොමැති අතර ඈවර කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

වර්ෂය තුළදී කොළඳෙණිය හයිඩ්‍රොපවර් (පුද්ගලික) සමාගම බැහැර කරන ලද අතර බැහැර කිරීම් හඳුනා ගැනීම සඳහා සමූහයේ මූල්‍ය ප්‍රකාශනවලට අවශ්‍ය ගැලපීම් ඇතුළත් කර ඇත. සී/ස මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී විසින් රුපියල් බිලියන 2.2 ක වටිනාකමකින් යුත් නව සාමාන්‍ය කොටස් හිමිකම් නිකුතුවක් යටතේ නිකුත් කරන ලදී. බැංකුව සහ එහි පූර්ණ අනුබද්ධිත සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම මෙම කොටස් නිකුතුව සඳහා ආයෝජනය කළ අතර, මෙමගින් බැංකුවේ කොටස් හිමිකම 84.5% දක්වා වැඩි විය. සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම, 2007 වසරේ සිට සිය මූලික ව්‍යාපාර කටයුතු සිදු කර නැත. සී/ස සඳර්න් ඩිවලප්මන්ට් ෆයිනෑන්ෂල් සමාගම ක්‍රියාකාරිත්වයේ නොමැති අතර සමාගමේ අධ්‍යක්ෂකවරුන් විසින් සමාගම ඈවර කිරීමට තීරණය කර ඈවර කිරීමේ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.

2. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

2.1 මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධන ප්‍රතිපාදන, 1988 අංක 30 දරණ බැංකු ආඥා පනත හා එහි සංශෝධන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ලං.ගි.ප්‍ර/ශ්‍රී.ල.මූ.වා.ප්‍ර) අනුව, බැංකුවේ සහ එහි පරිපාලිතයන්හි හා ආශ්‍රිතයන්හි මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

මෙම මූල්‍ය ප්‍රකාශ පහත ප්‍රකාශනයන්ගෙන් සමන්විත වේ.

- ලාභ හෝ අලාභ ප්‍රකාශනය
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2.2 මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 පෙබරවාරි 24 වන දින අනුමත කරන ලදි .

3. ගිණුම් පිළියෙල කිරීමේ පදනම

3.1 අනුකූලතා ප්‍රකාශය

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (ශ්‍රී. ලං. මූ. වා. ප්‍ර.) හා ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලං. ගි. ප්‍ර.) වලින් සමන්විත වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත .

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතට, 1988 අංක 30 දරණ බැංකු පනතට සහ 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සිදුකර ඇත. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විස්තර කෙරෙන පරිදි සමූහයේ මූල්‍ය ප්‍රකාශ 2021 දෙසැම්බර් 31 වැනි දිනට බලපැවැත්වෙන ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර සහ ලං.ගි.ප්‍ර. වලට අනුකූල වන පරිදි පිළියෙළ කර ඇති අතර ඒ සමඟ සංසන්දනාත්මක වර්ෂය වන 2020 දෙසැම්බර් 31 වැනි දිනට සහ දිනෙන් අවසන් වන වර්ෂය සඳහා දත්ත ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකා මහා බැංකුව විසින් නිකුත් කරන ලද 2019 අංක 2 දරණ බලපත්‍රලාභී බැංකු විසින් වාර්ෂික සහ කාර්තුමය මූල්‍ය වාර්තා හා අනෙකුත් හෙළිදරව් කිරීම් ප්‍රසිද්ධ කිරීමට අදාල චක්‍ර ලේඛනය මඟින් නියම කර ඇති ආකෘතියට අනුගත වෙමින් මූල්‍ය වාර්තා හා අනෙකුත් හෙළිදරව් කිරීම් සඳහා ආකෘති භාවිතා කර ඇත.

3.2 මිනුම්කරණයේ පදනම

පහත සඳහන් ඒවා හැරුණු විට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සංගතතා පදනමට ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශවලට බලපාන්නා වූ උද්ධමනකාරී සාධක වෙනුවෙන් කිසිදු ගැලපීමක් කර නැත.

- ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සාධාරණ අගය මත මැනීම (සටහන් අංක 26 සහ 41)
- ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය උපකරණ (සටහන් අංක 27)
- වෙනත් විස්තීරණ අදායම මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම් (සටහන් අංක 30)
- අයිතිකරු විසින් පදිංචි සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි සහ කල්බදු ඉඩම් මත ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කළ දිනට පැවති සාධාරණ අගයෙන් පසු කාලීන සමුච්චිත ක්ෂය හා පසු කාලීන සමුච්චිත හානිකරණ අලාභ වේ නම් ඒ සඳහා වෙන්කිරීම් අඩු කල අගයට වාර්තා කෙරේ. (සටහන් අංක 34)

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

- නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් ආයුගණකවරයෙකු විසින් තක්සේරු කර වර්තමාන අගය මත හඳුනාගත් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වලින් සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය අඩු කර වාර්තා කරනු ලැබේ (සටහන් අංක 48)
- මුදල් ප්‍රවාහ හෙජ් සංචිතය, හෙජ් ගිණුම්කරණයට අනුව ගිණුම්ගත කර ඇත (සටහන් අංක 53)

3.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

බැංකුවේ හා සමූහයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇති අයිතම එම අයිතමයේ ස්වභාවය අනුව කාණ්ඩ ගතකර ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාවය හා කල්පිරීමේ කාලය අනුව පෙළගස්වා ඉදිරිපත් කරනු ලැබේ. වාර්තාකරණ දිනයේ සිට මාස 12 ඇතුලත කල් පිරෙන (ජංගම) හා මාස 12 න් පසුව කල්පිරෙන (ජංගම නොවන) වත්කම් හා වගකීම් පිළිබඳ විස්තරයක් සටහන් අංක 60, වත්කම් හා වගකීම් වල කල්පිරීම විශ්ලේෂණය හි අන්තර්ගත වේ.

3.3.1 ව්‍යවහාර හා වාර්තාකරණ මුදල් ඒකක

මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් අයිතමයන් මිනුම්කරණය හා වාර්තාකරණය කරනු ලබන්නේ බැංකුව ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරය තුළ පවතින මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

3.3.2 උපචිත පදනම මත ගිණුම්කරණය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය හැරුනු කොට අනෙකුත් මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කර ඉදිරිපත් කර ඇත.

3.3.3 හිලව් කිරීම

සාමාන්‍යයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල මූල්‍ය වත්කම් හා වගකීම් වෙන් වෙන් වශයෙන් වාර්තා කරන අතර මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කිරීම, ශුද්ධ වටිනාකමට වාර්තා කිරීම සිදුවන්නේ නීතිමය වශයෙන් බලය ලබාදී ඇති විටක සහ පහත සඳහන් අවස්ථාවල දී සම්බන්ධිත පාර්ශවයන් විසින් එකවිටම වත්කම් උපලබ්ධිය මඟින් වගකීම් පියවා ගැනීමේ අදහස් ඇති විට පමණක් වේ

- සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු
- ණය පැහැර හැර ඇති අවස්ථාවක දී
- බැංකුවට/ සමූහයට සහ එහි පාර්ශ්වයන්ට වගකීම් පියවීමට නොහැකි අවස්ථාවන්හි හෝ බුන්වත් අවස්ථා වල දී

ගිණුම්කරණ ප්‍රමිතයක් මඟින් ඉඩ සලසා ඇති අවස්ථාවල දී හෝ අර්ථ නිරූපනය කර ඇති විටක සහ විශේෂයෙන් සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තින්හි සඳහන් කර ඇති විටක පමණක් ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සඳහන් අදායම් සහ වියදම් හිලව් කරනු ලැබේ.

3.3.4 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට අවශ්‍ය අවස්ථා හිදී පෙර වර්ෂයේ මූල්‍ය තොරතුරු විස්තරාත්මකව දක්වා ඇත. ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට සමගාමීව පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන අතර ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඉදිරිපත් කිරීම් වලට අනුකූල වීම සඳහා අවශ්‍ය අවස්ථාවන් වලදී පෙර වර්ෂයේ මූල්‍ය තොරතුරු නැවත වර්ගීකරණය කරනු ලැබේ.

3.3.5 ප්‍රමාණාත්මකභාවය සහ ඒකරාශි කිරීම

ලං. ගි. ප්‍ර. 1 - "මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" අනුකූලව, සමාන අයිතමයන්හි සෑම ප්‍රමාණාත්මක වර්ගයක්ම මූල්‍ය ප්‍රකාශවල වෙන වෙනම ඉදිරිපත් කෙරේ. විවිධ ස්වභාවයේ අසමාන අයිතමයන් හෝ කාර්යයන් ද ප්‍රමාණාත්මකවේ නම් ඒවා වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

3.3.6 වැටයීම

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ දී වෙනත් අයුරකින් සඳහන් කර නොමැති විටෙක, ලං.ගි.ප්‍ර. 1 - "මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" ට අනුව සියලුම අගයන් ආසන්නම රුපියල් දහස දක්වා වන පරිදි වටයා ඇත.

3.3.7 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ලං. ගි. ප්‍ර. 7 "මුදල් ප්‍රවාහ ප්‍රකාශනය" ප්‍රමිතියට අනුව ලාභයට ගැලපීම් කර මෙහෙයුම් මුදල් ප්‍රවාහ ගණනය කිරීමේ වක්‍ර ක්‍රමයට සිදු කර ඇත. මුදල් හා මුදල් සමාන දෑ යටතට අතැති මුදල්, ද්‍රවශීලතාවයෙන් ඉහළ දින 7 කට අඩු කාලයකදී පරිණත ආයෝජන සහ බැංකු අයිරා අයත්වේ.

3.3.8 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පනයන්ගේ භාවිතය

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී ඒ සඳහා භාවිතා කළ යුතු සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති, තීරණය කිරීම හා වාර්තා වන වත්කම් සහ වගකීම් අගයන් මෙන්ම ආදායම් සහ වියදම් නිශ්චය කිරීමේ දී ඒ සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් නිශ්චය කිරීමට කළමනාකාරිත්වයට සිදුවේ. සැබෑ ප්‍රතිඵලය ඇස්තමේන්තු සමඟ වෙනස් විය හැක. විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් අතීත අත්දැකීම් සහ විවිධ අවස්ථාවන් මත සෑහීමකට පත්විය හැකි සාධක මත පදනම් වන අතර මේවා කාලීන පදනමක් මත සමාලෝචනයට භාජනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සමාලෝචනයේ දී ඒවා පිළිබඳව සංශෝධනයක් අවශ්‍ය වන්නේ නම් සමාලෝචනයට භාජනය කෙරෙන වර්ෂය තුළ දී සහ අනාගත කාලපරිච්ඡේදයන් සඳහා එම සංශෝධනයන් අදාළ වන පරිදි ගිණුම්ගත කෙරේ. සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුගමනය කිරීමේ දී ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල වඩා වැදගත් බලපෑමක් ඇති කරන්නා වූ අගයන් මත කළමනාකාරණය විසින් පහත සඳහන් විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් භාවිතා කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ හා මාර්ගෝපදේශයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කොවිඩ්-19 හි බලපෑම කළමනාකරණය විසින් සලකා බලන ලදී. විනිශ්චය කිරීමේ නිශ්චිත ක්ෂේත්‍ර වෙනස් නොවිය හැකි නමුත් කොවිඩ්-19 හි බලපෑම හේතුවෙන් වසංගතයේ විකාශනය වන ස්වභාවය සහ එවැනි සිදුවීමක ආර්ථික හා මූල්‍යමය බලපෑම් පිළිබඳ මෑත කාලීන අත්දැකීම් නොමැතිකම හේතුවෙන් එම ක්ෂේත්‍රයන් තුළ තවදුරටත් අධ්‍යනය කල යුතුව ඇත. තවද, සමූහයේ වත්කම් මැනීමේදී අදාළ පරිදි ඇස්තමේන්තුවල වෙනස්කම් සිදු කරන ලදී. උපකල්පන, ඇස්තමේන්තු තීරණයන් සහිත ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත.

3.3.8.1 අඛණ්ඩ පැවැත්ම

තම මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකි බවට සෑහීමකට පත්විය හැකි සම්පත්, සමූහය සතු බවට කළමනාකාරිත්වය තක්සේරුවක් කර ඇත. තවද සමූහයෙහි අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සැළකිය යුතු අවිශ්වාසයක් හෝ අවිනිශ්චිතතාවයක් කළමනාකාරිත්වය හඳුනාගෙන නොමැත. ඒ නිසා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සමූහය අඛණ්ඩව පවතීය යන සංකල්පය භාවිතා කර ඇත. මෙම තක්සේරුව සිදු කිරීමේදී, කොවිඩ්-19 වසංගතය නිසා සමූහයේ ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු වලට ඇතිවිය හැකි අවාසි තත්ත්වයන් කළමනාකරණය විසින් සලකා බලන ලද අතර අඛණ්ඩව පවතීය යන පදනම සාධාරණ යැයි කළමනාකාරිත්වය සෑහීමකට පත්වී ඇත.

3.3.8.2 බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම්

සියළුම හඳුනාගත හැකි සහ මැනිය හැකි වගකීම් හි වටිනාකම් ගිණුම් තබනු ලැබේ. අසම්භාව්‍ය වගකීම් යනු අනාගත අවිනිශ්චිත සිදුවීම්වල තහවුරු කිරීමක් මත ඇතිවිය හැකි බැඳියාවක් හෝ වර්තමානයේ බැඳීමක් ඇතත් ආර්ථික ප්‍රතිලාභයන් ගලා යාමේ සම්භාවිතාවක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මැනිය නොහැකි වගකීමය. අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනා නොගන්නා අතර, ඒවායේ සිදුවිය හැකි බව දුරස්ථ නොවන්නේ නම් අනාවරණ කරනු ලැබේ.

3.3.8.3 සාධාරණ අගය මත මූල්‍ය උපකරණ

අගය කරනු ලබන දිනට වෙළඳපළ ගනුදෙනුකරුවන් අතර සාමාන්‍ය ව්‍යාපාර කටයුත්තක් ලෙස වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් පියවීමට ගෙවන මුදල සාධාරණ අගය වේ.

සාධාරණ අගයට වර්ගකරණ වත්කම් වල හෝ වගකීම් වල සාධාරණ අගය ප්‍රශස්ත ක්‍රියාකාරී වෙළඳපොළක ඇති ඉල්ලුම් මිල හෝ ඉදිරිපත් කරන මිල ලෙස තක්සේරු කරනු ලැබේ.

කිසියම් වත්කමකට හෝ වගකීමකට අදාලව ක්‍රියාකාරී වෙළඳපොළක් නොමැති අවස්ථාවල එම වත්කම් වල හෝ වගකීම් වල සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා ගණිතමය තක්සේරු ක්‍රම, ආසන්නව සිදුවූ සාධාරණ ගනුදෙනුවල තීරණය වූ මිල, වට්ටම් කල මුදල් ප්‍රවාහ විශ්ලේෂණය, මිල කිරීම් ආදී තක්සේරු ක්‍රම යොදා ගනී. සාධාරණ අගය ගණනය කිරීමේදී ණය අවදානමද අදාල පරිදි ගලපනු ලැබේ.

මෙම අගය කිරීමේ ක්‍රමවලදී අවම වශයෙන් ආයතනයට විශේෂ වූ යෙදවුම් පදනම් වන අතර උපරිම වශයෙන් හඳුනාගත හැකි වෙළඳපොළ යෙදවුම් යොදාගනී.

මූල්‍ය උපකරණයක් මුල් වරට හඳුනා ගැනීමේදී සාධාරණ අගය සඳහා ප්‍රශස්ත පදනම ගනුදෙනු කරන ලද මිලයි. එසේ නොමැතිනම් එම මූල්‍ය උපකරණ වල හඳුනාගත් වෙලඳපලක වර්තමාන ගනුදෙනු මිල හෝ හඳුනාගත් වෙළඳපලක දත්ත පදනම්ව සිදු කරන අගය කිරීම් යොදාගනු ලැබේ. සමූහය විසින් සාධාරණ අගය සහ ගනුදෙනු මිල අතර වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශනයට හඳුනා ගනී. මූල්‍ය උපකරණ අගය කිරීම සවිස්තරාත්මකව සටහන් 63 හි දක්වා ඇත.

කොවිඩ්-19 වසංගත තත්ත්වය නිසා මූල්‍ය වෙලඳපොළවල ඇතිවූ සැලකිය යුතු උච්චාවචනයන් නිසා සමූහයේ මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම තීරණය කිරීමේදී සැලකිය යුතු බලපෑමක් සිදුවී නොමැත.

3.3.8.4 ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණ අලාභ

ණය හා අත්තිකාරම් සඳහා හානිකරණ අලාභ තීරණය කිරීමේදී ශ්‍රී ලං.මු.වා.ප්‍ර. 9 මූල්‍ය උපකරණ යටතේ මුදල් ප්‍රවාහ හා ඒවායේ කාලය තීරණය කිරීම සඳහා කළමනාකරණයට නිගමන වලට එළඹීමට සිදුවේ.

සෑම වාර්තා කරන දිනකට අදාලව සමූහය විසින් කේවල වශයෙන් ප්‍රමාණාත්මක ණය සහ අත්තිකාරම් ඇගයීමක් සිදු කරන අතර හානිකරණ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයට වාර්තා කෙරේ.

හානිකරණ අලාභය ගණනයේදී මුදල් ප්‍රවාහ හා ඒවායේ කාලය තීරණය කිරීම සඳහා කළමනාකරණයට නිගමනයන්ට එළඹීමට සිදුවේ.

මෙම මුදල් ප්‍රවාහ නිර්ණය කිරීමේදී සමූහය විසින් ණයකරුගේ මූල්‍ය තත්ත්වය, උකස්කරයන් විකුණා ලැබිය හැකි මිල ආදී කරුණු සලකා බලයි. සාධක බොහෝමයක් සඳහා සිදු කරනු ලබන උපකල්පන මත මෙම තක්සේරුව සිදු කරනු ලබන නිසා සත්‍ය ප්‍රතිඵල වෙනස් වීම මත හානිකරණ ප්‍රතිපාදන වලටද අනාගත වෙනස්කම් ඇතිවිය හැකි කේවල වශයෙන් ප්‍රමාණාත්මක නොවන ණය සහ කේවල වශයෙන් ප්‍රමාණාත්මක වුවත් හානිකරණය නොවූ ණය සහ අත්තිකාරම් සමාන ලක්ෂණ සහිත කාණ්ඩ වලට බෙදා සමූහ හානිකරණ වෙන් කිරීම් සිදු කරනු ලැබේ.

සමූහ හානිකරණ ඇගයීමේදී ණය කළඹයන්හි ණයවල ගුණාත්වය, හිඟ මට්ටම, ණය භාවිතය ආදිය සහ සංකේන්ද්‍රණ අවදානම, විරැකියාව, උද්ධමනය, දළ දේශීය නිෂ්පාදන වර්ධනය, රටට අදාල දර්ශක ආදී ආර්ථික දත්තයන්ද සැලකිල්ලට ගෙන ඇත.

ශ්‍රී ලං.මු.වා.ප්‍ර. 9 මූල්‍ය උපකරණ අපේක්ෂිත ණය හානි ක්‍රමය පදනම්ව ණය හානි අවශ්‍යතා හඳුන්වා දී ඇති අතර එමඟින් මූල්‍ය උපකරණ වල ණය ගුණාත්මකතාවයේ වර්ධනය හෝ අඩුවීම නිරූපනය වේ. සමූහය විසින් කේවල වශයෙන් හෝ සමූහ වශයෙන් අපේක්ෂිත අලාභය ගණනය කරනු ලැබේ. මූලික හඳුනා ගැනීමේ සිට ණය වල ගුණාත්වය පහළ යාම පදනම්ව ණය හානිකරණය හෝ වෙන් කිරීම් ලෙස අපේක්ෂිත අලාභ ප්‍රමාණය හඳුනා ගන්නා අතර එය පහත පරිදි ගණනය කරනු ලැබේ.

- ඉදිරි මාස 12 තුළ අපේක්ෂිත අලාභ (අදියර 1) සැලකිය යුතු ලෙස ණය අවදානම් අඩු තත්ත්වයක්.
- ආයු කාලය පුරා අපේක්ෂිත ණය අවදානම (අදියර 2 සහ අදියර 3) තනි තනි වශයෙන් හෝ කාණ්ඩ වශයෙන් ණය අවදානම ඉහළ ගොස් ඇති විට මෙම පදනම යොදා ගැනේ.

සමූහය විසින් අපේක්ෂිත අලාභ ක්‍රමයට අදාලව පහත සඳහන් අමතර නිගමනයන් හා තක්සේරු සිදු කර ඇත.

- මූල්‍ය වත්කම් වල ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් ඇත්නම් ඒවා ආයුකාලය පුරා අපේක්ෂිත ණය අවදානම් පදනමට අගය කල යුතුය.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

- අපේක්ෂිත ණය අවදානම් ආකෘතීන් ගොඩ නැඟීමේදී විවිධ සම්කරණ සහ යෙදවුම් වල තෝරා ගැනීම් සිදු කල යුතුය.
- දළ දේශීය නිෂ්පාදන වර්ධනය, උද්ධමනය, පොළී අනුපාත, විදේශීය විනිමය අනුපාත සහ සේවා වියුක්තිය වැනි අනාගත උපකල්පිත සාර්ව ආර්ථික තත්ත්වයන් ණය පැහැර හැරීමේ සම්භාවිතාව ණය පැහැර හරින අවස්ථාවේ නිරාවරණ අගය සහ ණය පැහැර හැරීමේ අලාභය සමඟ පවතින සම්බන්ධතාවය නිර්ණය කිරීම.
- අපේක්ෂිත ණය හානිය ගණනය කිරීමේ ආකෘතියට අනාගත සාර්ව ආර්ථික යෙදවුම් තෝරා ගැනීම හා බර තැබීම.

කොවිඩ්-19 සහ සමූහයේ ආර්ථික බලපෑම් පිළිබඳ අපේක්ෂාවන්ට ප්‍රතිචාර වශයෙන් සමූහයේ අපේක්ෂිත ණය හානි ගණනය කිරීමේදී භාවිතා කරන ප්‍රධාන උපකල්පන සංශෝධනය කර ඇති සාමූහික ප්‍රතිපාදන ගණනය කිරීම සඳහා පාදක වූ ආර්ථික අවස්ථා සහ ඉදිරි දැක්ම සාර්ව ආර්ථික උපකල්පන සටහන 4.4.11 හි දක්වා ඇත. කොවිඩ්-19 වසංගතයට ප්‍රතිචාර වශයෙන් ණය ආකෘති යෙදවුම් සහ ඉදිරි දැක්ම සාර්ව ආර්ථික උපකල්පන වලට සංශෝධන සිදු කලද සමූහයේ අපේක්ෂිත ණය හානි ගණනය කිරීමට පාදක වූ මූලික ණය ආකෘති යාන්ත්‍රණය හා ක්‍රමවේදය පෙර කාල පරිච්ඡේදයන්ට අනුකූලව පැවතුණි. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මූල්‍ය දුෂ්කරතා අත්විඳින ගනුදෙනුකරුවන්ට සහාය වීම කෙරෙහි සමූහය අවධානය යොමු කර ඇති අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආරම්භ කරන ලද ණය ගෙවීමේ දිගුවන් ඇතුළු මූල්‍ය සහන ගණනාවක් ඉදිරිපත් කර තිබේ. කර්මාන්තයේ මඟ පෙන්වීම අනුව, ණය ගෙවීමේ දිගුවන් අදියර 1 (මාස 12 තුල අපේක්ෂිත ණය පාඩු) සිට අදියර 2 දක්වා (ආයුකාලය පුරා අපේක්ෂිත ණය පාඩු) ස්වයංක්‍රියව ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමට හේතු නොවේ. වඩාත්ම වැදගත් නිරාවරණ පිළිබඳව එක් එක් සිද්ධිය විශ්ලේෂණය කර ඇති අතර වැඩි ණය අවදානමක් ඇති නිරාවරණ පමණක් අදියර 2 සහ අදියර 3 වෙත ගෙන ගොස් ඇත.

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 මූල්‍ය උපකරණ අනුව සමාන ලක්ෂණ සහිත ණය සඳහා සමූහ හානිකරණ වෙන්කිරීම සංඛ්‍යාත්මක ආකෘතියක් හෝ අතීත පාඩු අනුපාත අත්දැකීම් පදනම් සම්කරණ ප්‍රවේශය, හිඟ හිටි දින පිලිබඳ තොරතුරු පදනම්ව අලාභ ප්‍රමාණය තීරණය කිරීම සඳහා සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රමවේදයන්ද යොදා ගනිමින් ගණනය කරයි. අලාභ ඇස්තමේන්තුව තහවුරු කර ගැනීම සඳහා වාර්තා කරන දිනයට ගැලපෙන ආකාරයට ආර්ථික තත්ත්වයන් සහ ණය කළඹේ සුවිශේෂිතා ගැලපීම සඳහා අතීත තොරතුරු ගලපනු ලැබේ. අලාභ ප්‍රතිශත සත්‍ය අලාභ සමඟ නිරතුරුව සසඳා බලනු ලැබේ.

සත්‍ය අලාභ අත්දැකීම් පදනම්ව ආකෘති කාලානුරූප ඇගයීම් සිදු කිරීම හා ගැලපීම් සිදු කිරීම සමූහයේ ප්‍රතිපත්තියයි. ආකෘතිවල යොදාගන්නා උපකල්පන සහ හානිකරණ පරිමිතීන්වල නිවැරදිතාවය මත හානිකරණ වෙන්කිරීම් වල නිවැරදිතාවය තීරණය වේ. ණය හා අත්තිකාරම් මත හානිකරණ අලාභ පිලිබඳ විස්තරාත්මක තොරතුරු සටහන් 14 හි දක්වා ඇත.

3.3.8.5 පරිපාලිත සමාගම්වල ආයෝජනයන්හි හානිකරණය සහ වෙනත් මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් සඳහා හානිකරණය

ආයෝජනයක් හෝ මූල්‍ය වත්කමක් හානිකරණයට ලක්වේදැයි සලකා බැලීම සඳහා බැංකුව සහ සමූහය විසින් ලං.හි.ප්‍ර. 36 "වත්කම් සඳහා හානිකරණය" හා ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 " මූල්‍ය උපකරණ" ප්‍රමිතියන්හි දී ඇති උපදෙස් අනුගමනය කරයි. වත්කමක පොත් අගයට වඩා අයකර ගත හැකි වටිනාකම අඩු වේ නම් හානිකරණයන් ඇති වන අතර එම හානිකරණය තීරණය කිරීම හා මැහීම සඳහා අදාළ බාහිර හා අභ්‍යන්තර පරිසරය මඟින් ලබා දෙන සංඥා හඳුනා ගත යුතු වේ. එම සංඥා හඳුනා ගැනීමට සහ හානිකරණ වටිනාකම තීරණය කිරීම සඳහා ආසන්න ව්‍යාපාරික පරිසරය විශ්ලේෂණය කිරීම සහ අදාළ වන ව්‍යාපාර බණ්ඩයේ මූල්‍ය පරිසරයේ ස්වාභාවය, කර්මාන්තය, තාක්ෂණය සහ මෙහෙයුම් පරිසරය වෙනස් වීම යන සාධක අනාගත මුදල් ප්‍රවාහ සමඟ විශ්ලේෂණය කළ යුතු වේ. මෙම ක්‍රියාවලිය සඳහා සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන් භාවිතා වේ.

3.3.8.6 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත වගකීම්

ආයුගණනක තක්සේරු යොදා ගනිමින් නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලැසුම් සහ අනෙකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් හි පිරිවැය නිර්ණය කරනු ලබයි. ආයුගණනක තක්සේරුව සඳහා වට්ටම් අනුපාත, සැලසුම් වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය, අනාගත වැටුප් වැඩිවීම්, මරණ අනුපාතය සහ අනාගත විශ්‍රාම වැටුප් වැඩිවීම යන උපකල්පන භාවිතා කරනු ලැබේ. මෙම සැලසුම් දිගු කාලීන ස්වභාවයක් ගන්නා බැවින් මෙම ඇස්තමේන්තු අවිනිශ්චිත ස්වභාවයක් ගනු ඇත.

වට්ටම් අනුපාතය තීරණය කිරීමේදී නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වලට අදාල කාලපරිච්ඡේදයන්ට සමාන ශ්‍රී ලංකා රාජ්‍ය බැඳුම්කර වල පොළී අනුපාතය සලකා බලයි. උපත් හා මරණ අනුපාතය සඳහා ප්‍රසිද්ධ කර ඇති උපත් හා මරණ අනුපාත වගු යොදා ගෙන ඇත. වැටුප් හා විශ්‍රාම වැටුප් වැඩිවීම, අනාගත උද්ධමන අනුපාතය සහ සමූහයේ අපේක්ෂිත අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතය මත පදනම් වී ඇත. සෑම උපකල්පනයක්ම වාර්තාකරණ දිනට සමාලෝචනය කරනු ලබන අතර වර්ෂය තුළදී යොදාගත් උපකල්පන සටහන් 48 හි දක්වා ඇත.

3.3.8.7 ඉඩම් සහ ගොඩනැගිලිවල සාධාරණ අගය

සමූහයේ නිදහස් අයිතිය සහිත ඉඩම් සහ ගොඩනැගිලි සහ කල්බදු ඉඩම් මත ඇති ගොඩනැගිලි වල සාධාරණ අගයෙන් සමුච්චිත ක්ෂය කිරීම් අඩුකර සටහන් කරනු ලැබේ. ශ්‍රී ලං.මූ.වා.ප්‍ර.13 "සාධාරණ අගය මිනුම්කරණය" අනුව, දේපළ වල සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා සමූහය විශේෂඥ ස්වාධීන තක්සේරුකරුවන් යොදවනු ලැබේ. නිදහස් අයිතිය සහිත ඉඩම් හා ගොඩනැගිලි සහ කල්බදු අයිතිය සහිත ඉඩම් මත ගොඩනැගිලි තක්සේරුවට අදාළ විස්තර සටහන් 34 හි දක්වා ඇත.

3.3.8.8 දේපළ, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායී ජීවිත කාලය

දේපළ, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් වල සුන්බුන් අගය, ඵලදායී ජීවිත කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේදයන් සෑම වාර්තා කරන දිනයකදීම සමූහය විසින් සමාලෝචනය කරනු ලැබේ. මෙම තක්සේරු කිරීම් සඳහා කළමනාකරණය විසින් විවිධ ප්‍රතිශතයන්, අගයන් සහ ක්‍රමවේදයන් යොදාගනු ලබන බැවින් එම විනිශ්චයන් යම් අවිනිශ්චිතතාවයකට භාජනය විය හැක. එක් එක් වත්කම් බණ්ඩය සඳහා යොදා ගත් ක්ෂය කිරීමේ ක්‍රමවේදය සහ ක්ෂය අනුපාතයන් සටහන් 34 හි දක්වා ඇත.

3.3.8.9 ආයෝජන දේපළ වර්ග කිරීම

දේපළක් ආයෝජන දේපළක් ලෙස සුදුසුකම් ලැබීම නිර්ණය කිරීම කළමනාකරණ විනිශ්චයන් මත සිදුවේ.
බදු කුලී ලබා ගැනීම සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩි කිරීම හෝ ඒ අරමුණු දෙකම සඳහා පවත්වා ගනු ලබන දේපළ තුළින්, සමූහය පවත්වාගෙන යනු ලබන අනෙකුත් වත්කම්වලින් ස්වාධීනව විශාල මුදල් ප්‍රවාහයක් ජනනය කරනු ලබයි නම් එම දේපළ ආයෝජන දේපළක් ලෙස නිර්ණය කෙරේ. අනෙක් අතට මෙහෙයුම් කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන හෝ සේවා සැපයීමේ ක්‍රියාවලියේ යොදාගන්නා හෝ පරිපාලන අරමුණින් පවත්වාගෙන යනු ලබන ස්වාධීනව මුදල් ප්‍රවාහ ජනනය නොකරන වත්කම්, දේපළ පිරියත සහ උපකරණ ලෙස නිර්ණය කරනු ලැබේ.

3.3.8.10 ආයෝජිතයන් පාලනය කිරීම තීරණය කිරීම

පරිපාලිතයන් යනු බැංකුව විසින් පාලනය කරන ආයතන වේ. බැංකුව ආයෝජිතයා තුළ ආයෝජනය කිරීම නිසා විචලනය වන ප්‍රතිලාභ ලැබීමට අයිතියක් හෝ එසේ ලැබීමට සිදුවේ නම් සහ ආයෝජකයාගේ කටයුතු පාලනය කිරීම තුළින් ලැබෙන ප්‍රතිලාභ වලට බලපෑමක් සිදු කිරීමට බැංකුවට හැකියාවක් ඇත්නම් එවැනි ආයෝජන මත බැංකුවට පාලනය කිරීමේ හැකියාවක් ඇතැයි නිගමනය කළ හැක. බැංකුව විසින් එහි ආයෝජිතයන් පාලනය කිරීම තීරණය කිරීම පිළිබඳව කළමනාකරණ විනිශ්චයන්ට එළඹීමට සිදු වේ.

3.3.8.11 බදුකරණය

සමූහය විසින් ආදායම් බදු සහ මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බද්ද (VAT) ඇතුළුව අනෙකුත් අදාල බදු ගෙවිය යුතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන කාලය තුළ අදාළ වන්නා වූ බදු නීතිරීතිවල හා එම නීති අර්ථ නිරූපනය කරන ආකාරයෙන් ඇති අවිනිශ්චිතතාවයන් නිසා ආදායම් බදු වගකීම, විලම්බිත බදු වගකීමට හා වෙනත් බදු වගකීම් වලට අදාළ වෙන් කිරීම් සඳහා ගිණුම්කරණ විනිශ්චයන් යොදා ගත යුතු වේ. අදාළ බදු අනුපාතයන් සහ බදුකරණයට අදාළ වෙනත් තොරතුරු සටහන් 4.8.18 සහ 37 යටතේ දක්වා ඇත.

පැවරුම් මිල රෙගුලාසීන්ට සමූහය යටත් වන අතර මෙවැනි ගනුදෙනුවල බලපෑම තීරණය කිරීම සඳහා කළමනාකරණ විනිශ්චය භාවිතා කිරීම අවශ්‍ය වේ. ආශ්‍රිත ගනුදෙනු, සාධාරණ මිල තීරණය කිරීම සහ සුදුසු මිල ගණන් තෝරා ගැනීම ඇතුළුව පැවරුම් මිල රෙගුලාසිවලට අනුකූල වීම සඳහා එහි බලපෑම තීරණය කිරීමට අවශ්‍ය අවස්ථාවල දී මෙම කළමනාකරණ විනිශ්චයන් භාවිතා කරන ලදී.

ප්‍රවර්තන බදු වියදම මෙම විනිශ්චයන් පදනම්ව ගණනය කර ඇත. ඇස්තමේන්තු කරන ලද ආදායම් බදු වියදම හා සත්‍ය බදු ගෙවීම අතර වෙනසට හේතු වන්නේ කළමනාකාරිත්වයේ බදු සම්බන්ධ අර්ථ දැක්වීමේ වෙනස්කම් හා බදු රෙගුලාසි භාවිතා කිරීමෙන් ඇති වූ වෙනසයි.

4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

බැංකුව සහ සමූහය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදාගන්නා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත දැක්වේ. විශේෂයෙන් සඳහන් වන අවස්ථාවක දී හැර අන් සෑම විටකම පහත සඳහන් සියලුම ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මූල්‍ය ප්‍රකාශන වාර්තා කිරීමේ දී සෑම කාලපරිච්ඡේදයක් සඳහාම අඛණ්ඩව භාවිතා කර ඇත.

4.1 වි්කාබද්ධ කිරීමේ පදනම

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 10 - "වි්කාබද්ධ මූල්‍ය ප්‍රකාශ" සහ ලං.ගි.ප්‍ර. 27 "කේවල මූල්‍ය ප්‍රකාශ" අනුව බැංකුවේ සහ එහි පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශ වි්කාබද්ධ කර සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. ලං.ගි.ප්‍ර. 28 "ආශ්‍රිතයන් සහ වි්කාබද්ධ ව්‍යාපාරයන්හි ආයෝජන" අනුව ආශ්‍රිත සමාගම් වල ලාභ හා ශුද්ධ වත්කම් අයත් ප්‍රමාණය හා පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබයි.

දේශීය බැංකු අංශයේ, අක්වෙරළ බැංකු අංශයේ සහ අන්තර්ජාතික ගනුදෙනු අංශයේ වි්කාබද්ධ කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ.

පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් වි්කාබද්ධ කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් 31 හා 32 යටතේ දක්වා ඇත.

4.1.1 ව්‍යාපාර සංයෝජනය

සමූහය ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 3 "ව්‍යාපාර සංයෝජනය" හි නිර්වචනයට අනුකූලව දේපළ අත්පත් කරගැනීම සහ වගකීම් භාර ගැනීම සිදු වී ඇත්නම් ගනුදෙනුව හෝ වෙනත් සිද්ධියක් ව්‍යාපාර සංයෝජනයක්ද යන වග නිර්ණය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේ ක්‍රමය මඟින් ව්‍යාපාර සංයෝජනය ගණනය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේ දිනයේ දී පාලනයට යටත් නොවන හිමිකම ගණනය කරනු ලබන්නේ සාධාරණ අගය මත හෝ ආයෝජකයාගේ හඳුනාගත් ශුද්ධ වත්කම්වල පාලනයට යටත් නොවන හිමිකමට සමානුපාත කොටසෙනි.

අත්පත් කර ගැනීම සම්බන්ධිත වියදම යනු ව්‍යාපාර සංයෝජනයේ දී අත්පත් කරනු ලබන්නා විසින් දරන ලද වියදම් වේ. එම වියදම්වල අඩංගු වන්නේ තැරැව්කාර ගාස්තු, උපදේශක, නීති, ගිණුම්කරණ, ඇස්තමේන්තු සහ අනෙකුත් වෘත්තිමය උපදේශන ගාස්තු, සාමාන්‍ය පරිපාලන වියදම්, අභ්‍යන්තර අත්පත් කරගැනීමේ දෙපාර්තමේන්තු පවත්වා ගැනීමේ වියදම් සහ ණය සහ ස්කන්ධ සුරැකුම්පත්

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ලියාපදිංචි කිරීමේ සහ නිකුත් කිරීමේ වියදම්ය. ණය සහ ස්කන්ධ සුරැකුම්පත් නිකුත් කිරීමේ කටයුතු හා සම්බන්ධ නොවන අනෙකුත් අත්පත් කර ගැනීම් සහ සම්බන්ධිත වියදම් එම සේවාවට අදාළව දැරූ විට එම කාලච්ඡේදයේ වියදමක් ලෙස හඳුනා ගැනේ.

අත්පත් කර ගැනීමේ දිනයේ දී පාලනයට යටත් නොවන හිමිකම් ගණනය කිරීම සඳහා පදනම වශයෙන් සාධාරණ අගයට ගනුදෙනුවෙන් ගනුදෙනුවට හෝ ශුද්ධ වත්කම්වලින් සමානුපාතික කොටස සමූහය විසින් තෝරා ගනු ලැබේ.

සමූහය විසින් ව්‍යාපාර සංයෝජනයේ දී දරන ලද ණය නිකුත් කිරීමේ දී හා ස්කන්ධ සුරැකුම්පත් සඳහා ගන්නා ලද වියදම් හැරුණු විට අනෙකුත් වියදම් දැරූ අවස්ථාවේදීම වියදමක් ලෙස හඳුනා ගැනේ.

4.1.2 පාලනය අහිමි වීම

පාලනය අහිමි වීමේ දී සමූහය විසින් පරිපාලිතයන්ගේ හඳුනාගත් වත්කම් සහ වගකීම්, පාලනයට යටත් නොවන හිමිකම් සහ ස්කන්ධය අදාලව වෙනත් අගයන්ද ඇත්නම් සියළු අගයන් පොත් වලින් ඉවත් කරනු ලැබේ. තවද වෙනත් විස්තීර්ණ ආදායම යටතේ පෙර හඳුනාගත් යම් අගයක් වේ නම් ඒවා සුදුසු පරිදි ලාභ හෝ අලාභ ප්‍රකාශයට හෝ රඳවාගත් ඉපැයුම් වලට නැවත හඳුනාගනු ලැබේ. පාලනය අහිමි වීමේ දී ඇතිවන ඌනතාවය හෝ අතිරික්තය ලාභ හෝ අලාභ ප්‍රකාශනයට ගලපනු ලැබේ. සමූහය විසින් අදාළ පරිපාලිතයේ යම් ඇල්මක් රඳවා තබා ගනී නම් එවැනි රඳවාගත් හිමිකම පාලනය අහිමි වන දිනට සාධාරණ අගයට මනිනු ලැබේ. ඉන් පසු රඳවාගත් ආයෝජනය ස්කන්ධ ආයෝජන පදනමට හෝ සමූහයේ මූල්‍ය උපකරණ ගිණුම් තැබීමේ ප්‍රතිපත්ති අනුව ගිණුම් තැබේ.

4.2 විදේශ මුදල් පරිවර්තනය

4.2.1 විදේශ මුදල් ගනුදෙනු හා ශේෂ

විදේශ මුදල් ගනුදෙනු ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරන්නේ ගනුදෙනුව සිදු වන දිනට පවතින විනිමය අනුපාත මඟින් පරිවර්තනය කිරීමෙනි. විදේශ වලංගු මුදල්වලින් නිරූපණය කෙරෙන මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තා කරන දිනට බලපැවැත්වෙන විනිමය අනුපාතිකයන්ට අනුව ව්‍යවහාර මුදල් වලට නැවත පරිවර්තනය කරනු ලබන අතර වෙළඳ නොවන කටයුතු තුළින් ඇතිවන්නා වූ වෙනස්කම් ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සටහන් 13 - "ශුද්ධ වෙනත් මෙහෙයුම් ආදායම්" යටතේ සටහන් කරනු ලැබේ.

විදේශ මුදල් වලින් ඓතිහාසික පිරිවැයට නිරූපණය කරනු ලබන මූල්‍ය නොවන වත්කම් සහ වගකීම්වල විටිනාකම සාධාරණ අගයට වාර්තා කරන විට, ව්‍යවහාර මුදල් ඒකකය බවට පරිවර්තනය කරනු ලබන්නේ සාධාරණ අගය තීරණය කරන දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින්ය. නැවත පරිවර්තනයේ දී ඇතිවන විදේශ විනිමය වෙනස්කම් ඇතුළු ලාභ හෝ පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සටහන් කරයි. ඉදිරි විනිමය ගිවිසුම් තක්සේරු කරනු ලබන්නේ වාර්තා කරන දිනට බලපැවැත්වෙන ඉදිරි වෙළඳපොල අනුපාතිකයන්ට අනුව වන අතර ඉන් ඇතිවන උපලබ්ධි නොවූ ශුද්ධ ලාභ සහ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සටහන් කරනු ලැබේ.

4.2.2 විදේශීය මෙහෙයුම්

ශ්‍රී ලංකා රුපියල් නොවන ව්‍යවහාර මුදල් භාවිතා කරන්නා වූ විදේශීය මෙහෙයුම්වල මෙහෙයුම් ප්‍රතිඵල හා මූල්‍ය තත්ත්වයන් පහත දැක්වෙන පරිදි ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ.

විදේශීය මෙහෙයුම්වල පවතින වත්කම් සහ වගකීම් වාර්තාකරණ දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ආදායම් සහ වියදම් කාලපරිච්ඡේදයේ සාමාන්‍ය විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කෙරේ. විදේශ මෙහෙයුම් පරිවර්තනයේ දී ඇතිවන විදේශ විනිමය අසමානතා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සටහන් කරයි.

යම් විදේශ මෙහෙයුමක් බැහැර කිරීමේ දී අදාළ මෙහෙයුමට අදාළව පරිවර්තන සංචිතයේ ඇති ප්‍රමාණය විකිණීමෙන් ලද ලාභයක් හෝ අලාභයක් ලෙස ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම් හෝ වියදම් යටතේ දැක්වේ.

4.2.3 හෙජ් ගිණුම්කරණය

විදේශ මුදල් ගනුදෙනුවලින් විදේශ විනිමය අවදානම අවම කිරීම සඳහා බැංකුව වෙනත් පාර්ශ්ව සමඟ හෙජින් විධිවිධානවලට එළඹේ. ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 ට අනුව, ආයතනයක් අයිතමයක් සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් හෙජ් අයිතමයක් ලෙස නම් කළ හැක. හෙජින් සබඳතාවයක් හෙජින් ගිණුම්කරණය සඳහා සුදුසුකම් ලබන්නේ හෙජින් සම්බන්ධතාව සුදුසුකම් ලත් හෙජින් උපකරණ සහ සුදුසුකම් ලත් හෙජින් අයිතම වලින් පමණක් සමන්විත වන්නේ නම් පමණි. හෙජින් සබඳතාවයේ ආරම්භයේ දී හෙජින් සබඳතාවයේ විධිමත් නම් කිරීම සහ ලේඛනගත කිරීම සහ ආයතනයේ අවදානම් කළමනාකරණ පරමාර්ථය සහ හෙජ් භාර ගැනීම සඳහා උපාය මාර්ග ඇත. එම ලේඛනයට හෙජින් උපකරණය හඳුනා ගැනීම, ආරක්ෂිත අයිතමය, ආරක්ෂිත අවදානමේ ස්වභාවය සහ හෙජින් සම්බන්ධතාව හෙජ් කාර්යක්ෂමතාවයේ ප්‍රභවයන් විශ්ලේෂණය කිරීම සහ එය තීරණය කරන්නේ කෙසේද යන්න ඇතුළුව, හෙජ් සඵලතා අවශ්‍යතා සපුරාලන්නේද යන්න තක්සේරු කරන්නේ කෙසේද යන්න ඇතුළත් විය යුතුය. ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 09 යටතේ ප්‍රධාන කොටස් තුනක් යටතේ හෙජ් ගිණුම්කරණයට මඟ පෙන්වයි. මුදල් ප්‍රවාහ හෙජ් (ඉහළ සම්භාවිතා පුරෝකථනයක් සහිත ආයතනික බැඳීමක් සහිත ගනුදෙනු (මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සටහන් නොකළ) විදේශ ව්‍යවහාර මුදල් ප්‍රවාහ වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනාගත් හෝ පුරෝකථනය කළ අන්තර් සමාගම් ගනුදෙනු) ශුද්ධ හෙජ් ආයෝජන (විදේශ මෙහෙයුම් ශුද්ධ ආයෝජන සඳහා නම් කරන ලද), ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 09 "මූල්‍ය උපකරණ" හි නිශ්චිතව දක්වා ඇති හෙජ් ගිණුම්කරණ ප්‍රතිකාරය යටතේ බැංකුව මෙම ගනුදෙනු ගිණුම් ගත කරනු ලබන අතර එවැනි

උපකරණවල එක් එක් වාර්තාකරණ දිනයන් අනුව ඉදිරි විනිමය අනුපාත භාවිතා කරමින් අගය කරනු ලැබේ.

4.3 මූල්‍ය උපකරණ ණය සහ ස්කන්ධ ලෙස වර්ග කිරීම

පහත සඳහන් ණය සහ ස්කන්ධ ලෙස පදනම්ව මූල්‍ය උපකරණ වර්ග කෙරේ.

- මූල්‍ය උපකරණයට දී ඇති නම
- ස්ථිර පරිනත දිනයක් ඇති හෝ නොමැති බව
- උපකරණයේ ආයු කාලය
- ගෙවීමේ ප්‍රභව
- ගෙවීම් ලබා ගැනීම සඳහා බලපෑම් කිරීමේ අයිතිය
- කළමනාකරණයට සහභාගීවීමේ අයිතිය
- උපකරණ සමඟ බැඳී ඇති අවදානම
- මුදල් ප්‍රවාහ වල විචලනය
- සුරැකුම් ලෙස දී ඇති දෑ

4.4 මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්

4.4.1 මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා බැහැර කිරීම

මූල්‍ය වත්කම් හා වගකීම් ගෙවීම් සිදුකරන දිනයේදී වනම් උපකරණයේ ගිවිසුම්ගත විධිවිධාන සඳහා සමූහය පාර්ශ්වකරුවෙකු බවට පත් වන දිනයේදී මූලිකව හඳුනා ගනී. "ක්‍රමවත් ආකාරයේ වෙළඳාම" මෙයට ඇතුලත් වේ. ක්‍රමවත් ආකාරයේ වෙළඳාම යනු වෙළඳපල තුළ සාමාන්‍යයෙන් පවතින සම්මුතීන් හා නියාමනයන් අනුව ස්ථාපනය කර ඇති කාල රාමුව අනුව වත්කම් ලබාදීමට අවශ්‍ය මූල්‍ය වත්කම් මිලදී ගැනීම හා විකිණීමයි. ණය ලබා ගන්නාට මුදල් අත්තිකාරම් ලබා දුන් විට (හෝ ගෙවූ විට) ණය හා අත්තිකාරම් හඳුනාගනු ලබයි. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම් මූලිකව සාධාරණ වටිනාකමට හඳුනා ගනී. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකම හා සෘජුව අදාල වන ගනුදෙනු පිරිවැය යන දෙකේ එකතුවට හඳුනා ගනී.

වත්කමෙන් ලැබෙන මුදල් ප්‍රවාහ කල් පිරෙන විට හෝ හිමිකාරිත්වයේ සියලු අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණවත් ලෙස හුවමාරු වන ගනුදෙනුවකින් මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය හුවමාරු වේ නම් සමූහය විසින් මූල්‍ය වත්කම් බැහැර කරයි. හුවමාරු කල මූල්‍ය වත්කමක ඇති වූ හෝ රඳවාගත් අයිතියක් ඇත්නම් සමූහය විසින් එය වෙනමම වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනා ගනී.

සටහන 4.4.11.7 හි විස්තර කර ඇති පරිදි, කොවිඩ්-19 ණය ගෙවීම් සහන නිසා ඇති වූ ණයවල මුල් නියමයන් හා කොන්දේසි වෙනස් කිරීම හේතුවෙන් මුල් ණය අවලංගු කිරීමක් සිදු නොවූ අතර වෙනස් කිරීම් සැලකිය යුතු මට්ටමක නොමැති බව සමූහය විසින් නිගමනය කරන ලදී.

වගකීම සඳහා ඇති බැඳියාව නිදහස් කල විට හෝ අවලංගු වූ විට හෝ කල් පිරී ඇති විට මූල්‍ය වගකීම් ඉවත් කරයි. පවත්නා මූල්‍ය වගකීමක් එකම ණය දෙන්නාගෙන් ප්‍රමාණවත් ලෙස වෙනත් වගකීමකින් වෙනස් වූ කොන්දේසි වලින් ප්‍රතිෂ්ඨාපනය කරන විට හෝ පවතින වගකීමේ කොන්දේසි ප්‍රමාණවත් ලෙස සංශෝධනය කර ඇත්නම් එවැනි හුවමාරුවක් හෝ සංශෝධනයක් මුල් වගකීම ඉවත් කිරීමක් ලෙස සලකා නව වගකීමක් හඳුනා ගනී. මුල් මූල්‍ය වගකීම පවත්වාගෙන යාමේ වටිනාකම හා ගෙවූ ප්‍රතිෂ්ඨාව අතර වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී.

4.4.2 මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 "මූල්‍ය උපකරණ" අනුව මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා පවතින සමූහයේ ව්‍යාපාර ආකෘතිය හා මූල්‍ය වත්කම් වල මුදල් ප්‍රවාහයන්ගේ ගිවිසුම්ගත කොන්දේසි මත පදනම්ව වර්ගීකරණය තීරණය වේ. බැංකුව මූල්‍ය වත්කම් වර්ගීකරණය කරන ආකාරය පහත රූප සටහන මඟින් නිරූපණය කෙරේ.



මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

කොවිඩ්-19 වසංගතය මූල්‍ය වෙළඳපොළවල සැලකිය යුතු උච්චාවචනයන් ඇති කර ඇත. කෙසේ වෙතත්, වසංගතය විසින් ඇති කරන ලද සැලකිය යුතු උච්චාවචනයන් හේතුවෙන් සමූහයට සිය මූල්‍ය වත්කම් කිසිවක් නැවත වර්ගීකරණය කිරීමට අවශ්‍ය නොවීය.

4.4.2.1 ආරම්භයේදී මූල්‍ය වත්කම් පහත වර්ගීකරණයන්ගෙන් එකකට වර්ග කරනු ලබයි

- ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට මනිනු ලබන මූල්‍ය වත්කම් (සටහන 4.4.7 සහ 27)
- ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම්
  - ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම් (සටහන 28)
  - ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ (සටහන 4.4.8 සහ 29)
- වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම් (සටහන 4.4.9 සහ 30)

4.4.2.2 ආරම්භයේදී මූල්‍ය වගකීම් පහත වර්ගීකරණයන්ගෙන් එකකට වර්ග කරනු ලබයි

- ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වගකීම්
  - ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වගකීම් තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු (සටහන 42)
  - ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වගකීම් වෙනත් ණය ගැනීම් හා යටත්කාලීන ණය (සටහන 43 සහ 49)

4.4.3 මූල්‍ය උපකරණයන් මූලිකව අගය කිරීම

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තා කර ඇති අවස්ථාවලදී හැර මූල්‍ය වත්කම් හා වගකීම් ඒවායේ සාධාරණ වටිනාකම හා ගනුදෙනු පිරිවැය යන දෙකේ එකතුවට මූලිකව අගය කරයි. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම් හා වගකීම් වලට අදාල ගනුදෙනු පිරිවැය ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

4.4.4 "එක් දින" ලාභ හෝ අලාභ

යම් මූල්‍ය උපකරණයක ගනුදෙනු වන මිල, එම මූල්‍ය උපකරණයම ගනුදෙනු වන වෙනත් නිරීක්ෂිත වර්තමාන වෙළඳපොළක සාධාරණ අගයට හෝ නිරීක්ෂිත වර්තමාන වෙළඳපොළ දත්ත මත ගණනය කරන ලද සාධාරණ අගයට හෝ වෙනස් වන්නේ නම් එම සාධාරණ අගයෙහි හා ගනුදෙනු මිලෙහි වෙනස සමූහය විසින් වහාම ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගැනේ. නිරීක්ෂිත නොවන දත්ත මත සාධාරණ අගය ගණනය කරනු ලබන අවස්ථාවන්හිදී ගනුදෙනු මිල සහ ආදර්ශ මිල අතර වෙනස එම මූල්‍ය උපකරණයේ ආයුකාලය තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී.

4.4.5 ව්‍යාපාර ආකෘති ඇගයීම

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" අනුව, 2018 ජනවාරි 1 දින සිට බල පැවැත්වෙන පරිදි, සමූහය විසින් සිය ව්‍යාපාර ආකෘතිය හා එහි අරමුණු පදනම් කර ගනිමින් මූල්‍ය වත්කම් වර්ගීකරණය කරනු ලබයි. එහෙත් එය වත්කම වෙන වෙනම ඇගයීම සිදු නොකරනු ලබන අතර වත්කම් කළඹ වශයෙන් ව්‍යාපාර ආකෘතිය සමඟ සසඳා වර්ගීකරණය කරනු ලබයි. එයට හේතු වන්නේ ව්‍යාපාරය කළමනාකරණය කරන ක්‍රමය සහ කළමනාකරණයට තොරතුරු ගලාගෙන යන ආකාරය මෙය වන බැවිණි. මූල්‍ය වත්කම් වර්ගීකරණය සඳහා සලකා බලන තොරතුරු පහත දැක්වේ.

- ආයෝජන කළඹ සඳහා අදාල වන ප්‍රතිපත්ති හා අරමුණු හා ඒවා ක්‍රියාත්මක වන ආකාරය, විශේෂයෙන්ම, ගිවිසුම් ගත පොළී ආදායම උපයා ගැනීම, විශේෂිත පොළී අනුපාතයක් පවත්වා ගැනීම, වත්කම් ආයෝජනය කර ඇති කාලසීමාව හා එම වත්කම් සඳහා අරමුදල් ප්‍රතිග්‍රහණය කරණු ලබන වගකීම් වල කාලසීමාව සංසන්දනය කිරීම හෝ මුදල් ජනනය සඳහා වත්කම් විකිණීම වැනි කටයුතු කෙරෙහි කළමනාකාරිත්වයේ උපායමාර්ගික අවධානයේ ස්වභාවය,
- ආයෝජන කළඹේ කාර්යසාධනය ඇගයීමට ලක්කරන්නේ කෙසේද යන්න සහ බැංකුවේ කළමනාකාරිත්වයට වාර්තා කරන්නේ කෙසේද යන්න පිළිබඳව,
- ව්‍යාපාර ආකෘතියේ කාර්ය සාධනයට බලපාන අවදානම් (සහ එම ව්‍යාපාර ආකෘතිය තුළ පවත්වා ගෙන යන මූල්‍ය වත්කම්) සහ එම අවදානම් කළමනාකරණය කරන්නේ කෙසේද යන්න,
- ව්‍යාපාර කළමනාකරුවන්ට ගෙවීම් සිදුවන්නේ කෙසේද? එනම් කළමනාකරණය කරන වත්කම් වල සාධාරණ අගය මත පදනම්ව හෝ ගිවිසුම් ගත මුදල් ප්‍රවාහයන් එකතු කර ගැනීම මඟින් ගෙවීම් සිදු වේද යන්න හා
- පෙර වර්ෂ වලදී මූල්‍ය වත්කම් විකුණු වාර ගණන, ප්‍රමාණය සහ කාල සීමා, මෙම විකුණුම් වලට බලපාන ලද හේතු සහ අනාගතයේදී වත්කම් විකිණීමට ඇති අපේක්ෂාවන්. කෙසේ වෙතත්, විකුණුම් පිළිබඳ තොරතුරු හුදෙකලාව නොසැලකෙන අතර මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම තුළින් බැංකුවේ ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳ සහ මුදල් ප්‍රවාහ ජනනය කළ ආකාරයද සලකා බලයි.

ව්‍යාපාරික ආකෘතිය තක්සේරු කරඇත්තේ 'හානිකර අවස්ථාව' හෝ 'ආතති අවස්ථාව' යන කරුණු සලකා නොගෙන සාධාරණ අපේක්ෂිත සිදුවීම මතය. මූලික හඳුනාගැනීමකින් පසුව මූල්‍ය වත්කම් වලට අපේක්ෂිත මුදල් ප්‍රවාහයේ මූලික වෙනසක් සිදු වූවත්, බැංකුව විසින් ඉතිරි මූල්‍ය වත්කම් වල වර්ගීකරණයේ වෙනස් කිරීමක් සිදු නොකරනු ලැබේ. එහෙත් අළුතින් මිලදී ගන්නා මූල්‍ය වත්කම් තක්සේරු කිරීමේදී ඉහත අපේක්ෂාවන්ගේ වෙනස් වීම සැලකිල්ලට ගනු ලැබේ.

4.4.6 ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි පොළිය හා මූලික මුදල් පමණක් ගෙවීමේ ලක්ෂණයන්ගෙන් යුක්ත දැයි තක්සේරු කිරීම (SPPI පරීක්ෂණය)

වත්කම් වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවන පියවර ලෙස, මූල්‍ය වත්කම් SPPI පරීක්ෂණය සමත් වන්නේ දැයි සොයා බැලීම සඳහා මූල්‍ය වත්කම් වල ගිවිසුම් ගත නියමයන් අධ්‍යනය කරනු ලැබේ.

මෙම තක්සේරුව සිදු කිරීම සඳහා 'මූලික මුදල්' ලෙස අදාල මූල්‍ය වත්කම මූලික හඳුනාගැනීමේදී පොත්වල හඳුනාගන්නා ලද මූල්‍ය වත්කම් වල සාධාරණ අගය ලෙස අර්ථ දැක්විය හැකිය. එමෙන්ම මෙම වටිනාකම මූල්‍ය වත්කමේ ආයු කාලය පුරා වෙනස් විය හැකිය (උදා: අධිමිල හෝ අවමිල ක්‍රමක්ෂය කිරීම හෝ මූලික මුදල කොටස් වශයෙන් ගෙවීම).

"පොළිය" නිර්වචනයට මුදලේ කාල වටිනාකම සහ ආයෝජනය කරනු ලබන කාල පරිච්ඡේදය සඳහා ණය අවදානම සඳහා පිරිවැය මෙන්ම ලාභයද ඇතුලත් වේ.

මීට අමතරව, මුදල් ප්‍රමාණයක් පොළී තුළ අන්තර්ගත ඉහත කරුණු වලට අමතරව යම්කිසි ප්‍රමාණයක මුදල් ප්‍රවාහ වෙන්කිරීමත් ණය අවදානම හෝ වෙනත් විචල්‍යයන් ලෙස අයකර ගනී නම් එවිට එම මූල්‍ය උපකරණ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට අගය කරන මූල්‍ය වත්කම් ලෙස වර්ගකල යුතුය.

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් තුළ අන්තර්ගත වන්නේ මූලික මුදල හා පොළිය පමණක්ද යන්න තීරණය කිරීමේදී, සමූහය උපකරණයේ ගිවිසුම්ගත කොන්දේසි සලකා බලයි. මූල්‍ය වත්කමෙහි මෙම කොන්දේසිය සපුරාලිය නොහැකි වන පරිදි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්ගේ වෙලාව හෝ ප්‍රමාණය වෙනස් කල හැකි ගිවිසුම්ගත යෙදුමක් තිබේද යන්න තක්සේරු කිරීම මෙයට ඇතුලත් වේ. තක්සේරුව සිදු කිරීමේදී සමූහය පහත දෑ සලකා බලයි.

- මුදල් ප්‍රවාහයන්ගේ වටිනාකම හා කාලය වෙනස් කරන අසම්භාව්‍ය සිද්ධීන්
- තෝලන ලක්ෂණ
- පෙරගෙවුම් හා දීර්ඝ කිරීමේ කොන්දේසි
- නිශ්චිත වත්කම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහ සඳහා සමූහයේ හිමිකම් සීමාකරණ නියමයන්
- මුදලේ කාල වටිනාකම සලකා බැලීම වෙනස් කරන ලක්ෂණ

4.4.7 ලාභ හෝ අලාභ මඟින් හඳුනාගන්නා මූල්‍ය වත්කම් - සාධාරණ අගයට අගය කිරීම

ලාභ හෝ අලාභ මඟින් හඳුනාගන්නා සාධාරණ අගයට අගය කරන අයිතමයන් ලෙස අඩංගු වන්නේ

- වෙළඳපල ගනුදෙනු සඳහා පවතින අයිතමයන්
- ආරම්භක හඳුනාගැනීමේදී ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට විශේෂයෙන් නම් කල අයිතමයන් හා
- මූලික මුදල හා පොළිය පමණක් ගෙවීම නිරූපණය නොවන ගිවිසුම්ගත කොන්දේසි සහිත ණය උපකරණයන්

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට පවත්වාගෙන යන මූල්‍ය උපකරණ මූලිකව හඳුනාගනු ලබන්නේ ලාභ හෝ අලාභ ගිණුමේ හඳුනාගත් දැරෑ ගනුදෙනු පිරිවැය සමඟ සාධාරණ වටිනාකමටය. පසුව සාධාරණ වටිනාකමට අගය කරන අතර කිසියම් ලාභයක් හෝ අලාභයක් පැහැනගින විට ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී.

මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට අගය කරන විටදී ණය අවදානමේ වෙනස් වීම් වලට අදාලව සාධාරණ අගයේ සංචලනයන් නිරූපනය වන පරිදි, ප්‍රතිපාර්ශවයේ ණය ශක්‍යතාවය පිලිබිඹු වන සේ ණය තක්සේරුකරණ ගැලපුමක් සිදු කරයි.

4.4.7.1 වෙළඳ ගනුදෙනු සඳහා පවතින මූල්‍ය උපකරණ

මූල්‍ය උපකරණයන් වෙළඳපොළ ගනුදෙනු සඳහා දරා සිටින ලෙස වර්ග කරනුයේ විකිණීමේ අරමුණින් මූලිකවම අත්පත් කරගෙන ඇති නම් හෝ දරා ඇත්නම් හෝ නුදුරේදී නැවත මිලදී ගන්නේ නම් හෝ කෙටි කාලීනව ලාභ ලබා ගැනීමේ අරමුණ සහිත හා එක්ව කළමනාකරණය කරන මූල්‍ය උපකරණ වල ආයෝජන කළඹේ කොටසක් වන හෝ සුදුසුකම් ලබන හෙජින් සම්බන්ධතාවයක් නොමැති ව්‍යුත්පන්න උපකරණයන් වන විටදීය.

වෙළඳ ව්‍යුත්පන්න හා වෙළඳ සුරැකුම්පත්, වෙළඳපළ ගනුදෙනු සඳහා දරා සිටින ලෙස වර්ගීකරණය කරන අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සාධාරණ වටිනාකමට හඳුනාගනී. සාධාරණ වටිනාකමේ වෙනස්වීම් වෙළඳපළ ගනුදෙනු වලින් ලද ලාභ/(පාඩු) (සටහන 10) හා ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය උපකරණ වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු) (සටහන 11) යටතේ හඳුනා ගනී. වෙළඳපළ ගනුදෙනු සඳහා පවතින මූල්‍ය උපකරණ වලින් ලද පොළී ආදායම ශුද්ධ පොළී ආදායම (සටහන 8) යටතේ හඳුනා ගන්නා අතර ලාභාංශ ආදායම ගෙවීමට ඇති අයිතිය ස්ථාපිත කර ඇති විට වෙළඳපළ ගනුදෙනු වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු) (සටහන 10) යටතේ හඳුනාගනී.

4.4.7.2 ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට අගය කල හා නම් කල මූල්‍ය උපකරණ

මූලික හඳුනා ගැනීමෙන් පසු මූල්‍ය උපකරණයන් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට අගය කිරීම හා නම් කිරීම සිදු කල හැක. වෙනත් පදනමක් මත මූල්‍ය වත්කම් හා වගකීම් මිනුම් කරන විට ඇති වන මිණුම්කරණ හෝ හඳුනාගැනීමේ නොගැලපීම් සැලකිය යුතු ලෙස අඩු කරයි නම් හෝ සම්පූර්ණයෙන් ඉවත් කරයි නම් (එනම් ගිණුම්කරණ නොගැලපීම් ඉවත් කරයි) පමණක් මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට නම් කල හැක.

ගිණුම්කරණ නොගැලපීම් ඉවත්කිරීමට හෝ සැලකිය යුතු ලෙස අඩු කළ හැකි නම් හෝ පහත අවස්ථාවල මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ හැක.

- ධාරක ගිවිසුම ව්‍යුත්පන්න උපකරණ එකක් හෝ කිහිපයකින් සමන්විත වේ නම් හෝ

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

- ලේඛනගත අවදානම් කළමනාකරණ හෝ ආයෝජන ක්‍රමවේදය අනුව සාධාරණ වටිනාකම පදනම මත මූල්‍ය වත්කම් හා වගකීම් දෙකම කළමනාකරණය හා එහි කාර්යසාධනය ඇගයීමට ලක් කර තිබේ නම්

ගිණුම්කරණ නොගැලපීම් සැලකිය යුතු ලෙස අඩු කල හොත් හෝ ඉවත් කල හොත් හෝ පහත අවස්ථාවල මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට නම් කල හැක.

මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට නම් කර ඇති විට නීර්ක්ෂණය කල හැකි වෙළඳපොළ පොළී අනුපාතිකයන්ට ඉහළ ණය විහිදීම් වල වෙනස්වීම් නිරීක්ෂණය කිරීමෙන් සමූහයේ ණය ගුණාත්වයේ වෙනස්වීම් වලට ආරෝපිත සාධාරණ අගයේ සංචලනයන් ගණනය කර වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ වෙනමම ඉදිරිපත් කෙරේ.

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට නම් කළ කිසිදු මූල්‍ය වගකීමක් 2021 දෙසැම්බර් 31 දිනට නොමැත.

4.4.7.3 මූලික මුදල හා පොළිය පමණක් ගෙවීම නිරූපණය නොවන ගිවිසුම් ගත කොන්දේසි සහිත ණය උපකරණයන්

මූලික මුදල හා පොළිය පමණක් ගෙවීම යන පරීක්ෂණයෙන් සමත් නොවන මූල්‍ය ණය උපකරණයන් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට ගිණුම් ගත කෙරේ.

4.4.8 ක්‍රමක්ෂය පිරිවැයට අගය කල මූල්‍ය වත්කම් ණය උපකරණ

පහත අවස්ථා වලදී ණය උපකරණයන්හි ආයෝජන ක්‍රමක්ෂය පිරිවැයට අගය කරයි.

- ගිවිසුම් කොන්දේසි අනුව නිශ්චිත දිනවලදී හිඟ හිටි මුදල මත පොළිය හා මූලික මුදල පමණක් පිලිබිඹු වන මුදල් ප්‍රවාහයන් ඇති විට හා

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එකතු කර ගැනීමට තබා ගැනීමෙන් ව්‍යාපාර ආකෘතියේ අරමුණ ලගා කරගන්නා විට

මෙම ණය උපකරණයන් මූලිකව හඳුනාගනු ලබන්නේ සාධාරණ වටිනාකම හා සෘජුව අදාල වන ගනුදෙනු පිරිවැය යන දෙකේ එකතුවට වන අතර ඵලදායී පොළී අනුපාතය භාවිතා කිරීමෙන් ක්‍රමක්ෂය පිරිවැයට පසුව හඳුනා ගනී. පහත සටහන 4.4.11 මූල්‍ය වත්කම් හානිකරණය යටතේ විස්තර කර ඇති මට්ටම් තුනක අපේක්ෂිත ණය හානි ආකෘතිය මත පදනම්ව ණය හානිකරණය ගණනය කරනු ලබයි.

4.4.9 වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට මිනිනු ලබන මූල්‍ය වත්කම්

4.4.9.1 ණය උපකරණ

පහත අවස්ථාවන්හිදී ණය උපකරණයන්හි ආයෝජන වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ වටිනාකමට අගය කරයි.

- ගිවිසුම් කොන්දේසි අනුව නිශ්චිත දින වලදී හිඟ හිටි මුදල මත මූලික මුදල හා පොළිය පමණක් පිළිබිඹු වන මුදල් ප්‍රවාහයන් ඇති විට හා

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එකතු කිරීම හා මූල්‍ය වත්කම් විකිණීමෙන් ව්‍යාපාර ආකෘතියේ අරමුණ ලඟා කර ගන්නා විට

මෙම ණය උපකරණ මූලිකව හඳුනා ගනු ලබන්නේ සාධාරණ වටිනාකම හා සෘජුව අදාල වන ගනුදෙනු පිරිවැය යන දෙකේ එකතුවට වන අතර පසුකාලීනව සාධාරණ වටිනාකමට හඳුනා ගනී. සාධාරණ වටිනාකමේ වෙනස්වීම මත ඇති වන ලාභ හෝ අලාභයන් ස්කන්ධයේ වෙනම කොටසක් යටතේ වෙනත් විස්තීර්ණ ආදායම යටතේ දක්වයි. හානිකරණ අලාභයන් හෝ ප්‍රතිවර්ත්‍ය කිරීම්, පොළී ආදායම හා විදේශ විනිමය ලාභ හෝ අලාභයන් ලාභ හෝ අලාභ යටතේ හඳුනා ගනී. විකුණන අවස්ථාවේදී කලින් වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභයන් වෙනත් විස්තීර්ණ ආදායමේ සිට ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කරයි.

4.4.9.2 ස්කන්ධ උපකරණ

වෙළඳපොළ ගනුදෙනු සඳහා පවතින හා ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 3 - "ව්‍යාපාර සංයෝජනය" යටතේ ව්‍යාපාර සංයෝජනය සඳහා සමූහය විසින් හඳුනාගන්නා අසම්භාව්‍ය ප්‍රතිඵාධාව සඳහා වන ස්කන්ධ උපකරණයන්ගේ ආයෝජන හැර කළමනාකරණය විසින් වෙනස්කල නොහැකි විකල්පය තෝරාගෙන ඇතිවිට එම ස්කන්ධ උපකරණයන්ගේ ආයෝජන, වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ වටිනාකමට අගය කරයි. වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ වටිනාකමට යන වෙනස් කල නොහැකි විකල්පය ආයෝජන කලඹයන් සඳහා කළමනාකරණය සලකා නොබලයි නම් එම ආයෝජන නිරායාසයෙන් ලාභ හෝ අලාභ තුළින් සාධාරණ වටිනාකමට අගය කල යුතුයි.

විකිණීමේදී වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනය මාරු නොකරයි. කෙසේ වෙතත් සම්පූර්ණ විකිණීමකදී හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතයේ සිට ස්කන්ධය තුළ රඳවාගත් ඉපයීම් වලට මාරු කරයි. මෙම ආයෝජන වල ලාභාංශ ලාභ හෝ අලාභ ප්‍රකාශයේ "ශුද්ධ වෙනත් මෙහෙයුම් ආදායම්" (සටහන 13) යටතේ හඳුනා ගනී.

4.4.10 මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීම

මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීමට අදාල ව්‍යාපාර ආකෘතිය සමූහය විසින් වෙනස් කරන විටදී පමණක් සමූහය විසින් එහි මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරයි. ක්‍රමක්ෂය පිරිවැයට, වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට හෝ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට අගය කරනු ලබන මූල්‍ය වත්කම් සමූහය විසින් නැවත වර්ගීකරණය කරනු ලබයි නම් නැවත වර්ගීකරණය කරන දිනයේ සිට අනාගතයට බලපාන පරිදි නැවත වර්ගීකරණය ගලපනු ලබයි. සමූහය කලින් හඳුනාගත් ලාභ, අලාභ (හානිකරණ අලාභයන්ද ඇතුලත්ව) හෝ පොළිය නැවත සංශෝධනය සිදු නොකෙරේ.

නැවත වර්ගීකරණය කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ සඳහා වන ගිණුම්කරණ පිළියම් පහත වගුව මඟින් සාරාංශ ගත කර ඇත.

මූලික මිනුම් කිරීම	නැවත වර්ගීකරණය කිරීමෙන් පසු මිනුම් කිරීම	නැවත වර්ගීකරණය සඳහා වූ ගිණුම්ගත කිරීම්
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට	ක්‍රමක්ෂය පිරිවැයට	නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ වටිනාකම එහි නව පවත්වාගෙන යාමේ දළ වටිනාකම බවට පත් වේ. එම වටිනාකම මත පදනම්ව ඵලදායී පොළී අනුපාතය ගණනය කරයි. හානිකරණ අවශ්‍යතා සඳහා යොදා ගන්නා ආරම්භක දිනය ලෙස නැවත වර්ගීකරණය කල දිනය භාවිතා කරයි.
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට	වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට	නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ අගය නව පවත්වාගෙන යාමේ පිරිවැය බවට පත් වේ. නැවත වර්ගීකරණය කරන දිනයට ඇති වත්කම් වල සාධාරණ වටිනාකම මත පදනම්ව ඵලදායී පොළී අනුපාතිකය තීරණය කරයි.
වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට	ක්‍රමක්ෂය පිරිවැයට	කලින් වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනාගත් සමුච්චිත ලාභය හෝ අලාභය ස්කන්ධයෙන් ඉවත් කර මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරන දිනයේ සාධාරණ වටිනාකමට ගලපනු ලැබේ. නැවත වර්ගීකරණයේ ප්‍රතිඵලයක් ලෙස සඵල පොළී අනුපාතිකයට හා අපේක්ෂිත ණය හානියට ගැලපීමක් සිදු නොකෙරේ.
වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට	ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට	නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ වටිනාකම නව පවත්වාගෙන යාමේ පිරිවැය බවට පත් වේ. නැවත වර්ගීකරණය කරන දිනයේ නැවත වර්ගීකරණය කිරීමේ ගැලපුමක් ලෙස කලින් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගත් සමුච්චිත ලාභය හෝ අලාභය ස්කන්ධයේ සිට ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කරයි.
ක්‍රමක්ෂය පිරිවැයට	ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට	නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ වටිනාකම හා කලින් හඳුනාගත් ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනසින් ඇතිවන ලාභය හෝ අලාභය ලාභ හෝ අලාභය යටතේ හඳුනාගනී.
ක්‍රමක්ෂය පිරිවැයට	වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට	මූල්‍ය වත්කමක කලින් හඳුනාගත් ක්‍රමක්ෂය පිරිවැය හා නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ වටිනාකම අතර වෙනසින් ඇතිවන ලාභය හෝ අලාභය වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගනී. නැවත වර්ගීකරණයේ ප්‍රතිඵලයක් ලෙස සඵල පොළී අනුපාතිකයට හා අපේක්ෂිත ණය හානිය මැනීමට කිසිදු ගැලපීමක් සිදු කරනු නොලැබේ.

4.4.11 මූල්‍ය වත්කම් හානිකරණය

ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට මිනුම් නොකරන පහත සඳහන් වර්ගයේ මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය හානිය ගණනය කිරීම සමූහය මට්ටම් තුනක් යටතේ සිදු කරයි

- ක්‍රමක්ෂය පිරිවැයට හා වෙනත් විස්තීරණ ආදායම් තුලින් සාධාරණ අගයට මිනිනු ලබන ණය උපකරණ
- ණය බැඳීම්; සහ
- මූල්‍ය ඇප ගිවිසුම්

ස්කන්ධ ආයෝජන සඳහා කිසිදු අපේක්ෂිත ණය හානියක් හඳුනා නොගනී.

මූල්‍ය උපකරණයේ ඉතිරි ආයු කාලය පුරාවට සිදු වූ පැහැර හැරීමේ අවදානමෙහි වෙනස සැලකිල්ලට ගනිමින් මූල්‍ය උපකරණයන්ගේ ණය අවදානම ආරම්භයේ සිට සැලකිය යුතු ලෙස වැඩිවී තිබේද යන්න පිළිබඳ සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසානයේදීම සමූහය විසින් තක්සේරු කරයි. මෙම ක්‍රියාවලිය මත පදනම්ව ආරම්භක හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි වෙනස්වීම මත මූල්‍ය වත්කම් පහත සඳහන් මට්ටම් තුන තුළ සංක්‍රමණය වේ.

4.4.11.1 අදියර 1 - මාස 12 සඳහා වූ අපේක්ෂිත ණය හානිය

ආරම්භක හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැලකිය යුතු වැඩි වීමක් සිදුවී නොමැති හා ආරම්භයේ සිට ණය හානිකරණය වී නොමැති නිරාවරණයන් සඳහා ඉදිරි මාස 12 තුළ සිදුවිය හැකි පැහැර හැරීම් අවස්ථා වල සම්භාවිතාවය සඳහා වූ අපේක්ෂිත ණය හානියේ කොටස හඳුනා ගනී.

සැලකිය යුතු ලෙස ණය පිරිහීමට ලක් නොවූ ගනුදෙනුකරුවන් වෙතින් මාස 12 සඳහා වූ අපේක්ෂිත ණය හානිය බැංකුව විසින් තීරණය කරයි.

4.4.11.2 අදියර 2 - ජීවිත කාලය සඳහා වූ අපේක්ෂිත ණය හානිය

ආරම්භක හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැලකිය යුතු වැඩි වීමක් සිදු වූ නමුත් ණය හානිකරණය නොවූ නිරාවරණයන් සඳහා ජීවිත කාලය සඳහා වූ (එනම් මූල්‍ය වත්කම් වල ඉතිරි ආයුකාලය පිළිඹිබු වන පරිදි) අපේක්ෂිත ණය හානිය හඳුනාගනී.

4.4.11.3 අදියර 3 - ජීවිත කාලය සඳහා වූ අපේක්ෂිත ණය හානිය

වත්කම් වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයට අහිතකර බලපෑමක් ඇතිකරන සිද්ධීන් එකක් හෝ වැඩි ගණනක් සිදු වූ විට, එම නිරාවරණයන් ණය හානිකරණය වූ නිරාවරණයන් ලෙස තක්සේරු කරනු ලැබේ. ණය හානිකරණය වූ නිරාවරණයන් සඳහා ජීවිත කාලය සඳහා

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

වූ අපේක්ෂිත ණය හානිය හඳුනා ගනී. පොළී ආදායම ගණනය කිරීමේදී ක්‍රමක්ෂය පිරිවැයට (ප්‍රතිපාදනයන්ට පසු) ඵලදායී පොළී අනුපාතය භාවිත කිරීමෙන් ගණනය කරයි.

4.4.11.4 අපේක්ෂිත ණය හානිය ගණනය කිරීම

අපේක්ෂිත මුදල් හිඟය ගණනය කිරීම සඳහා සම්භාවිතාවය මත බර තැබූ අවස්ථා තුනක් මත පදනම්ව අපේක්ෂිත ණය හානිය ගණනය කරනු ලබන්නේ ඵලදායී පොළී අනුපාතිකයකට ආසන්න අනුපාතයකින් වට්ටම් කිරීමෙනි. මුදල් හිඟය යනු ගිවිසුමට අනුව ආයතනය සඳහා ලැබිය යුතු මුදල් ප්‍රවාහයන් සහ ආයතනය අපේක්ෂා කරන මුදල් ප්‍රවාහයන් අතර වෙනස වේ.

සමූහයේ අපේක්ෂිත ණය හානිය ගණනය කිරීම් පිළිබඳ යාන්ත්‍රණය පහත දැක්වෙන අතර එහි ප්‍රධාන අංග පහත පරිදි වේ:

- **පැහැර හැරීමේ සම්භාවිතාවය** (PD)
  පැහැර හැරීමේ සම්භාවිතාවය යනු කිසියම් කාල සීමාවක් තුළදී ණය පැහැර හැරීමේ සම්භාවිතාවය පිළිබඳව තක්සේරුවකි. ණය පහසුකම පෙර කාලච්ඡේදයකදී හඳුනාගෙන නොමැති නම් හා තවමත් එම වත්කම කළඹ තුළ ඇත්නම් යම් නිශ්චිත කාලච්ඡේදයක් පුරාවට පැහැර හැරීම සිදුවේ. පැහැර හැරීමේ සම්භාවිතාවය පිළිබඳ සංකල්පය සටහන 28 යටතේ තවදුරටත් විස්තර කර ඇත.

- **ණය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගය** (EAD)
  ණය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගය යනු අනාගත දිනකදී පැහැර හැරීම සිදුවන අවස්ථාවේදී පැහැර හැරීම සිදුවන අගයයි. මෙම අගය ගණනය කරනු ලබන්නේ වාර්තාකරණ දිනට පසුව සිදුවන පොළී සහ ප්‍රාග්ධන ගෙවීම්, එකඟ වූ පහසුකම් ලබාගැනීම්, මග හැරුණු ගෙවීම් වලට අදාළ උපචිත පොළිය යනාදිය ගැලපීමෙන් පසු ලැබෙන නිරාවරණය වීමේ අගය වේ. සටහන 28 යටතේ ණය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගය පිළිබඳ තවදුරටත් විස්තර කර ඇත.

- **පැහැර හැරීමේ අලාභය** (LGD)
  පැහැර හැරීමේ අලාභය යනු කිසියම් පැහැර හැරීමක් සිදුවන අවස්ථාවක ඇතිවන අලාභයේ ඇස්තමේන්තුවක් වේ. යම් කිසි කාලච්ඡේදයක් තුළදී පැහැර හැරීමෙන් පසුව සුරැකුම් උපලබ්ධි කිරීම් වැනි දෑ සැලකිල්ලට ගනිමින් අයකර ගැනීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණය හා ගිවිසුම්ගත මුදල් ප්‍රමාණය අතර වෙනස මත පැහැර හැරීමේ අලාභය පදනම් වේ. මෙය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගයෙහි ප්‍රතිශතයක් ලෙස සාමාන්‍යයෙන් දක්වයි. සටහන 28 යටතේ පැහැර හැරීමේ අලාභය පිළිබඳ තවදුරටත් විස්තර කර ඇත.

4.4.11.5 හානිකරණය සඳහා මට්ටම නිර්ණය කිරීම

සෑම වාර්තාකරණ දිනයකදීම ආරම්භක හඳුනාගැනීමේ සිට නිරාවරණයන්ගේ ණය අවදානමෙහි සැලකිය යුතු වැඩි වීමක් තිබේද යන්න පිළිබඳ සමූහය තක්සේරු කරයි. මෙය තක්සේරු කරනු ලබන්නේ ආරම්භක හඳුනාගැනීමේ දිනය හා අපේක්ෂිත ජීවිත කාලය අතර පැහැර හැරීමේ අවදානමක් තිබේද යන්න සැසඳීමෙනි. මෙම කාර්යයේදී විශේෂ වියදමක් හෝ වැයමක් නොමැතිව ලබාගන්නා සාධාරණ හා විශ්වාසදායක තොරතුරු පිලිබඳව සමූහය සලකා බලයි. මෙය ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු මෙන්ම ඉදිරි දැක්මක් සහිත විශ්ලේෂණයකින්ද යුක්ත වේ.

වත්කම් වල ගුණාත්මකභාවය පිරිහීයාමේදී නිරාවරනයන් අපේක්ෂිත ණය හානියේ අදියර තුළ සංක්‍රමණය වේ. පසුකාලීනව වත්කම් වල ගුණාත්මකභාවය වර්ධනය වුවහොත් හා කලින් තක්සේරු කරන ලද ආරම්භයේ සිට ඇති ණය අවදානමෙහි සැලකිය යුතු අඩු වීමක් සිදු වුවහොත් අවිනිශ්චිත ණය සඳහා කරන වෙන් කිරීම් ජීවිත කාලය සඳහා වන අපේක්ෂිත ණය හානියේ සිට මාස 12 සඳහා වූ ණය හානිය දක්වා අඩු වේ. ආරම්භයේ සිට සැලකිය යුතු ලෙස පිරිහී ගොස් නොමැති හෝ පිරිහීම සමූහයේ ආයෝජන ශ්‍රේණිගත නිර්නායකයන් තුළ පවතින හෝ හිඟ හිටි දින ගණන සිට දින 30 කට වඩා අඩු නිරාවරණයන් පහල ණය අවදානමක් ඇති නිරාවරණයන් ලෙස සැලකේ. මෙම මූල්‍ය වත්කම් සඳහා හානිකරණ වෙන් කිරීම මාස 12 ක් සඳහා වූ අපේක්ෂිත ණය හානිය මත පදනම්ව සිදු කරයි.

කේවල හා සාමූහික පදනම මත නිරාවරණයන් සඳහා වන ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේද යන්න පිළිබඳ සමූහය තක්සේරු කරයි.

උපකරණයේ වර්ගය, ණය අවදානම් ඇගයුම්, ඇප වර්ගය, ආරම්භක හඳුනාගැනීමේ දිනය, කල් පිරීමට ඇති කාලය, කර්මාන්තය, ණය ගැතියාගේ භූගෝලීය ව්‍යාප්තිය හා අනෙකුත් අදාල සාධක යනාදිය සැලකිල්ලට භාජනය කර සාමූහික හානිකරණ ඇගයීම සඳහා ණය අවදානම් ලක්ෂණ පදනම් කරගෙන මූල්‍ය උපකරණ කාණ්ඩගත කෙරේ.

4.4.11.6 අපේක්ෂිත ණය හානිය ගණනය කිරීම

අපේක්ෂිත අලාභ පිළිබඳ අපක්ෂපාති හා සම්භාවිතා හරිත ඇස්තමේන්තු මඟින් අපේක්ෂිත ණය හානිය ගණනය කර ඇති අතර එය පහත පරිදි ගණනය කරනු ලබයි.

- වාර්තා කරන දිනයේදී ණය හානිකරණය නොවූ මූල්‍ය වත්කම්:
  මූල්‍ය වත්කමෙහි අපේක්ෂිත ආයුකාලය පුරාවට ඇති සියලු හිඟ මුදල් හිමිකම් වල වර්තමාන වටිනාකම ඵලදායී පොළී අනුපාතයෙන් වට්ටම් කිරීමෙන් ගණනය කරයි. මුදල් හිඟය යනු ගිවිසුම් ප්‍රකාරව සමූහය වෙත ලැබිය යුතු මුදල් ප්‍රවාහ හා සමූහය ලැබීමට බලාපොරොත්තු වන මුදල් ප්‍රවාහ අතර වෙනසයි.

- වාර්තා කරන දිනයේදී ණය හානිකරණය වූ මූල්‍ය වත්කම්:
  දළ වටිනාකම හා අනාගත මුදල් ප්‍රවාහයන් ඵලදායී පොළී අනුපාතිකය මඟින් වට්ටම් කර ලබා ගන්නා වර්තමාන අගය යන දෙකෙහි වෙනස තුළින් ගණනය කරයි.

- ලබා නොගත් ණය බැඳීම් : බැඳියාව ලබා ගත හොත් සමූහය වෙත ලැබිය යුතු ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් හා සමූහය ලැබීමට අපේක්ෂිත මුදල් ප්‍රවාහ අතර වෙනසෙහි වර්තමාන අගය තුළින් ගණනය කරයි.

- මූල්‍ය ඇප ගිවිසුම් : දරන්නාට ප්‍රතිපූර්ණය කිරීම සඳහා අපේක්ෂිත ගෙවීම් වලින් සමූහය නැවත අයකරගැනීමට බලාපොරොත්තු වන අගයන් අඩු කිරීම තුළින් ගණනය කරයි.

අපේක්ෂිත ණය හානිය ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී. ණය උපකරණ වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට අගය කරනු ලබන අවස්ථාවකදී, අපේක්ෂිත ණය හානිය ගණනය කරනු ලබන්නේ ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම් වලට අදාල වන අදියර තුනේ පිවිසුම භාවිතා කිරීමෙනි.

4.4.11.7 කොවිඩ්-19 බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන්ට සහාය වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දුන් සහන පියවරයන්

කොවිඩ්-19 වසංගතය දේශීය ආර්ථිකයට සැලකිය යුතු ලෙස බලපා ඇති අතර සැපයුම්දාම සඳහාද බලපෑමක් එල්ල වී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපෑමට ලක්වූ කර්මාන්ත අංශවලට සහ බලපෑමට ලක්වූ ව්‍යාපාරවලට/ පුද්ගලයන්ට රටේ බලපත්‍රලාභී බැංකු/ මූල්‍ය ආයතන හරහා ණය සහන පැකේජ ස්වරූපයෙන් මූල්‍යයමය සහන ලබාදී ඇත.

ශ්‍රී ලංකා මහබැංකුව විසින් කොවිඩ් 19 මඟින් බලපෑමට ලක්වූ ව්‍යාපාර සහ පුද්ගලයන්ට ණය සහන සැපයීම සඳහා 2020 අංක 5 සහ 2020 අංක 8 දරන චක්‍රලේඛන ද සංචාරක කර්මාන්තයේ නියුතු ව්‍යාපාර සහ පුද්ගලයන්ට (2021 අංක 10 දරන චක්‍රලේඛනය) මඟී ප්‍රවාහන අංශයේ ව්‍යාපාර සහ පුද්ගලයින් සඳහා (2021 අංක 3 සහ 12 දරන චක්‍රලේඛන) නිකුත් කරන ලද අතර එම චක්‍රලේඛයන්ට අනුව සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන් සඳහා විවිධ සුදුසුකම් සහිත නිර්ණායකයන් යටතේ ණය සහන ලබාදිය යුතු විය.

ඒ අනුව සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන් සඳහා විවිධ සුදුසුකම් සහිත නිර්ණායකයන් යටතේ බැංකුව විසින් ණය ගෙවීම් දිගුවන් ලබාදී ඇත.

සටහන 4.4.1 හි විස්තර කර ඇති පරිදි, ණය ගැනුම්කරුවන්ට ණය ලබාදී ඇති නියමයන් සහ කොන්දේසි සැලකිය යුතු ලෙස සංශෝධනය කර ඇති විට ඒවා අළුත් ණය දීමක් ලෙස හඳුනාගනී. කෙසේ වෙතත්, කොවිඩ්-19 සහන පැකේජයන් නිසා දී ඇති ණය වල නියමයන් හා කොන්දේසි වල සැලකිය යුතු වෙනස්කමක් සිදු නොවූ බව සමූහයේ නිගමනය විය.

ඒ අනුව සහන පැකේජ යටතේ ඇති ණය පැවති ඵලදායී පොළී අනුපාතික යටතේ හඳුනාගන්නා අතර වෙනස් කරන ලද මුදල් ප්‍රවාහ පැවති ඵලදායී පොළී අනුපාතිකයෙන් වට්ටම් කිරීම මඟින් සංශෝධනය කිරීමෙන් ඇතිවූ අලාභය හඳුනාගෙන ඇත.

මූල්‍ය ප්‍රකාශනවල සටහන 8 - "ශුද්ධ පොළී ආදායම" හි පොළී ආදායම යටතේ මුළු වෙනස් කිරීමේ අලාභය හඳුනාගෙන ඇත. කොවිඩ්-19 හි තෙවන රැල්ල හේතුවෙන් ව්‍යාපාර සහ පුද්ගලයින් මුහුණ දෙන අභියෝගයන්ට මුහුණ දීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එවැනි ව්‍යාපාර සහ පුද්ගලයින් සඳහා තවත් මාස හයක් සහ මාස නවයකින් වැනි කාලයක් සඳහා ණය සහන කාලය දීර්ඝ කිරීමට බැංකුවලට උපදෙස් දුන්නේය. එම අළුත් ණය මුදල සාමාන්‍යයෙන් අවුරුදු දෙකක් තුළ වාරික ලෙස අයකරගත හැකි අතර ගනුදෙනුකරු සමඟ එකඟවන නියමයන් හා කොන්දේසි අනුව අයකරන කාලය වෙනස් වේ. ණය සහන කාලය තුළ මුල්ම එකඟවූ සවිල පොළී අනුපාතය යටතේ ගනුදෙනුකරුගේ පොළිය අය කර ගැනීමට බැංකුවලට අවසර ඇති බැවින් කොවිඩ්-19 දෙවන අදියරේ ණය සහන නිසා කිසිදු වෙනස් කිරීමේ අලාභයක් හඳුනාගෙන නොමැත.

ණය සහන ප්‍රදානය කිරීම කොවිඩ්-19 වසංගතය නිසා ඇතිවන මුදල් ප්‍රවාහ දුෂ්කරතා සමඟ සෘජුවම සම්බන්ධ වේ. කෙසේ වෙතත්, මෙම ණය පහසුකම් දෙවන අදියර හෝ තෙවන අදියර වෙත ස්වයංක්‍රීයව මාරු කිරීමට එය හේතුවක් නොවේ. වඩාත්ම වැදගත් නිරාවරණ පිළිබඳව එක් එක් සිද්ධිය අනුව විශ්ලේෂණයක් සිදු කර ඇති අතර වැඩි ණය අවදානමක් ඇති නිරාවරණ පමණක් අදියර 2 සහ අදියර 3 වෙත ගෙන ගොස් ඇත. තවද, තනි තනිව වැදගත් නොවන අවදානම් පවතින ණය ගැනුම්කරුවන් වුවත් කර්මාන්ත අවදානම මත පදනම්ව දෙවන අදියර වෙත ගෙන ගොස් ඇත.

4.5 මූල්‍ය නොවන වත්කම් හි හානිකරණය

සෑම වාර්තාකරණ දිනකටම අදාළව මූල්‍ය නොවන වත්කම් හි හානිකරණය හා සම්බන්ධ වන සංඥාවන් පිළිබඳව බැංකුව තක්සේරු කරනු ලැබේ. එවන් සංඥාවක් පවතින විට දී හෝ හානිකරණය පිළිබඳව පරීක්ෂාවක් අවශ්‍ය විටක දී එම මූල්‍ය නොවන වත්කම් යළි අයකර ගැනීමේ ශක්‍යතාවය පිළිබඳව සළකා බැලේ. වත්කම් නැවත අයකර ගත හැකි අගය වනුයේ වත්කම භාවිතයේ පවතින වටිනාකම සහ එහි මුදල් ජනනය කරන ඒකකයන්ගේ සාධාරණ අගයෙන් විකුණුම් වියදම් ඉවත් කළ පසු අගය යන දෙකෙහි උපරිම අගයයි. වත්කමේ ධාරණ අගය එහි නැවත අයකර ගැනීමේ අගය ඉක්මවන විට, එය හානිකරණයට ලක් වූ ලෙස සලකා වත්කම නැවත අයකර ගත හැකි අගයට හිඟුම්වල ගලපනු ලැබේ. භාවිතයේ පවතින වටිනාකම ගණනයේ දී, වත්කමට බද්ධ වන අවදානම සහ වෙළඳපොළ තක්සේරුව මත මුදලේ කාලානුරූපී වටිනාකම අර්ථ නිරූපනය කෙරෙන බදු පෙර වට්ටම් අනුපාතය භාවිතයෙන් තක්සේරුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ඇත. විකුණුම් පිරිවැය සාධාරණ අගයෙන් අඩුකර තීරණය කිරීමේදී ඒ සඳහා සුදුසු තක්සේරු ආකෘතීන් භාවිතා කෙරේ. මෙම තක්සේරුකරණයන් බහුවිධ තක්සේරු ක්‍රම, ප්‍රසිද්ධියේ විකිණෙන පරිපාලිතයන්ගේ ලැයිස්තු ගත කොටස් මිල හෝ අනෙකුත් වටිනාකම් ඇති සාධාරණ මිලක් පෙන්වන සංඥාවක් මඟින් තව දුරටත් තහවුරු කෙරේ.

4.6 භාරකාර සේවා

පාරිභෝගිකයින් වෙනුවෙන් වත්කම් රඳවා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස සමූහය විසින් භාරකාර සේවා සපයනු ලැබේ. භාරකාරත්වයේ පවතින වත්කම් සමූහය මඟින් පාලනය නොකරන නිසා සහ සමූහය එම වත්කම් වල ප්‍රතිලාභ ලබාගන්නා අයිතිකරු නොවන නිසා එම වත්කම් සමූහයේ මූල්‍ය ප්‍රකාශවල හඳුනා නොගැනේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

4.7 ප්‍රතිපාදනයන්

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස සමූහයට වර්තමානයේ දී නෛතික හෝ සම්මුතික වගකීමක් ඇති වූ විට දී එම වගකීම නිවැරදිව තක්සේරුගත කල හැකි නම් සහ අදාළ වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභයන්හි පිටතට ගලා යාමක් සිදුවන බවට අපේක්ෂාවක් වේ නම් ඒ සඳහා ප්‍රතිපාදනයන් වෙන් කෙරේ.

ප්‍රතිපාදන වටිනාකම තීරණය කිරීමේදී වාර්තාකරණ දිනට පවතින වගකීම් පියවීමට අවශ්‍ය වඩාත් යෝග්‍යතම අගය ඇස්තමේන්තු කරන අතර එහිදී අදාළ සිද්ධිය සිදුවීමට ඇති අවිනිශ්චිතතාව හා අවදානම සැලකිල්ලට ගනු ලැබේ. ප්‍රතිපාදන තීරණය කිරීමේදී වර්තමාන වගකීම පියවීමට අවශ්‍ය මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කරනු ලබයි නම්, එහිදී අදාළ මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය මත පදනම්ව දරා සිටින අගය තීරණය කරයි. භාරදූර ගිවිසුම් සඳහා ප්‍රතිපාදනයන් කරනු ලබන්නේ අදාල ගිවිසුමෙන් සමූහයට ලැබෙන අපේක්ෂිත ප්‍රතිලාභ එම ගිවිසුම් ඉටු කිරීමේදී දැරීමට සිදු වන නොවැලැක්විය හැකි පිරිවැයට වඩා අඩු නම් පමණි. අදාල ගිවිසුම අත්හිටුවීමට සිදුවුවහොත් එහිදී දැරීමට සිදුවන පිරිවැය හා ගිවිසුම අබණ්ඩව පවත්වාගෙන යාමට දැරිය යුතු අපේක්ෂිත ශුද්ධ පිරිවැය යන දෙකෙහි වර්තමාන අගයන්ගේ අඩු අගය ප්‍රතිපාදනය ලෙස හඳුනාගනු ලැබේ.

4.8 ආදායම් බදු වියදම හා අනෙකුත් බදු

4.8.1 ආදායම් බදු වියදම

ආදයම් බදු, ප්‍රවර්තන බදු සහ විලම්බිත බදු යන කොටස් දෙකකින් සමන්විත වේ. විස්තරාත්මක තොරතුරු සටහන 18 යටතේ විස්තරාත්මකව දක්වා ඇත.

4.8.2 මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද (VAT)

එකතු කල අගය මත බද්ද සඳහා පදනම වන්නේ සේවක පාරිශ්‍රමික හා බදු පෙර ලාභයට නියම කර ඇති ආකාරයට ක්ෂය ගැලපීමෙන් පසු ලැබෙන ලාභයයි.

2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත හා ආනුෂාංගික සංශෝධන අනුව වර්ෂය සඳහා බැංකුවේ මුළු එකතු කළ අගය මත 15% (2020: 15%) ක බද්දකට යටත් විය. එසේම සමූහය "වටිනාකම ආරෝපිත ක්‍රමය" යටතේ මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු ගණනය කෙරේ.

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතට යෝජිත සංශෝධන පනත් කෙටුම්පතට අනුව, 2022 ජනවාරි 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද (VAT) 15% සිට 18% දක්වා වැඩි කෙරේ.

4.8.3 බෝග රක්ෂණ බද්ද

2013 අංක 12 දරණ මුදල් පනත යටතේ බෝග රක්ෂණ බද්ද 2013 අප්‍රේල් 1 දින සිට බලපැවැත්වෙන අතර බදු අය කිරීමෙන් පසු ලාභයෙන් 1% ක බද්දක් ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය වෙත ගෙවිය යුතු වේ.

5. රක්ෂණ ව්‍යාපාරය

5.1 ප්‍රතිරක්ෂණය

මෙමඟින් සමූහය සිය සියලු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සමඟ බැඳි රක්ෂණ අවදානම පැවරීමකට ලක්කරන අතර ප්‍රතිරක්ෂණ වත්කම මඟින් ප්‍රතිරක්ෂණ සමාගම් වෙතින් ලැබිය යුතු ශේෂයන් නිරූපණය වේ. ප්‍රතිරක්ෂණය මඟින් ලැබිය යුතු ප්‍රමාණය තීරණයේ දී ප්‍රතිරක්ෂණ ගිවිසුම් සහ බැඳි හිමිකම්පෑම් සඳහා වන ප්‍රතිපාදන සහ ගෙවා නිමකල හිමිකම් සැලකිල්ලට භාජනය කරනු ඇත.

වාර්තාකරණ වර්ෂය තුළ සංඥාවක් ලද විට හෝ වාර්තාකරණ දිනයේ දී හෝ ප්‍රතිරක්ෂණ වත්කම්වල හානිකරණය පිළිබඳව සමාලෝචනයකට ලක්කරනු ලැබේ. ප්‍රතිරක්ෂණ වත්කමෙහි හඳුනා ගැනීමෙන් අනතුරුව සිදු වන ලද යම් සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රතිරක්ෂණය මඟින් ලැබිය යුතු මුදල් නොලැබී යාමේ විෂයානුබද්ධ සාක්ෂියක් සපයනු ලබන විට හානිකරණයක් සිදු ව ඇති බවට නිගමනය කෙරේ. එය ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

ප්‍රතිරක්ෂණය කරන ලද හෝ කිරීමට බලාපොරොත්තු වන ගිවිසුම් වලට අදාල වාරික ලැබීම් හා හිමිකම් දළ පදනම මත වාර්තා කරනු ලැබේ. ගිවිසුම් ගත අයිතිය නිම වූ පසු හෝ වෙනත් පාර්ශ්වයකට පැවරූ පසු ප්‍රතිරක්ෂණ වත්කම හෝ වගකීම බැහැර කිරීම සිදු වේ.

5.2 ලැබිය යුතු රක්ෂණ

ලැබිය යුතු රක්ෂණ වීවා උපචිත වූ විට හඳුනා ගැනෙන අතර මූලික හඳුනා ගැනීමේ දී ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය මත ගිණුම් ගත කෙරේ. ධාරණ අගය ගත නොහැකි බවට යම් සිද්ධියක් හෝ අවස්ථාවක් සංඥාවන් සපයන විට දී, ලැබිය යුතු රක්ෂණයන්හි ධාරණ අගයෙහි හානිකරණය පිළිබඳව සලකා බැලේ. එසේ හානිකරණ අලාභයක් වේ නම් එය ලාභ හෝ පාඩු ප්‍රකාශයෙහි හඳුනාගනී.

5.3 විලම්බිත වියදම්

5.3.1 විලම්බිත අත්පත් කර ගැනීමේ පිරිවැය (DAC)

නව ව්‍යාපාර අත්පත්කර ගැනීම සඳහා දරන කොමිස්, ප්‍රතිරක්ෂණය, අලෙවිකරණ, ප්‍රතිපත්ති නිකුත් කිරීමේ පිරිවැය වැනි පිරිවැයන් නව ව්‍යාපාර හෝ අභිමතය පරිදි සහභාගී වීමේ විශේෂාංග සහිත ආයෝජන ගිවිසුම්වල අනාගත වාරික වලින් ආවරණය කරගත හැකි ආකාරයට විලම්බිත කෙරේ. අනෙකුත් සියළු අත්පත් කර ගැනීමේ වියදම් වීවා දරන අවස්ථාවේදීම වියදම් ලෙස වාර්තා කෙරේ.

මූලිකව හඳුනා ගැනීමෙන් පසුව සාමාන්‍ය රක්ෂණ සඳහා විලම්බිත අත්පත් කරගැනීමේ පිරිවැය නොයිපයු වාරික ක්‍රමක්ෂය කරනු ලබන කාල පදනමට ක්‍රමක්ෂය කරනු ලැබේ. ප්‍රතිරක්ෂණකරුවන්ගේ විලම්බිත අත්පත්කර ගැනීම් පිරිවැය කොටස අදාල වත්කම ක්‍රමක්ෂය කරන ආකාරයටම ලාභ හෝ අලාභ ප්‍රකාශනයට වාර්තා කෙරේ.

වත්කමට අදාලව අපේක්ෂිත ඵලදායී ජීවකාලයේ හෝ අනාගත ප්‍රතිලාභ ලැබීමේ රටාවේ වෙනස් වීමක්, ක්‍රමක්ෂය කාලපරිච්ඡේදය වෙනස් කිරීම් මඟින් ගිණුම්ගත කරන අතර එය ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස් වීමක් ලෙස සලකනු ලැබේ. ගිවිසුම් අවසන් වීම හෝ අවලංගු කිරීමකදී විලම්බිත අත්පත්කර ගැනීමේ පිරිවැය ඉවත්කරනු ලැබේ.

5.4 ප්‍රතිරක්ෂණ කොමිස්

පිටස්තර ප්‍රතිරක්ෂණ ගිවිසුම මත ලැබිය යුතු කොමිස් වීම ප්‍රතික්ෂණ ගිවිසුම් කාලයට අදාලව විලම්බනය සහ ක්‍රමක්ෂය කරනු ලැබේ.

5.5 ආයෝජන ගිවිසුම් වගකීම්

ආයෝජන ගිවිසුම් අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණ (අ.ස.ල.) සහිත හා රහිත ගිවිසුම් ලෙස වර්ගීකරණය කරයි. අ.ස.ල. සහිත ආයෝජන ගිවිසුම් වගකීම් සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පීවිත රක්ෂණ ගිවිසුම් වගකීම් සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සමාන වේ.

අ.ස.ල. රහිත ආයෝජන ගිවිසුම් වගකීම් හඳුනා ගනු ලබන්නේ ගිවිසුමට ඇතුලත් වූ පසු සහ වාර්කය අය කිරීමෙන් පසුවය. මෙම වගකීම් මූලිකවම සාධාරණ අගයට හඳුනා ගන්නා අතර මෙම සාධාරණ අගය වන්නේ ගිවිසුම නිකුත් කෙරෙන ගනුදෙනු මිලයි. එම ගනුදෙනු මිල සඳහා සෘජුවම ආරෝපිත කල හැකි ගනුදෙනු පිරිවැය ඇතුලත් නොවේ. ආයෝජන ගිවිසුම් වගකීම මූලිකව හඳුනා ගැනීමෙන් අනතුරුව එය ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මනිනු ලැබේ.

තැන්පතු හා නැවත ගැනීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වගකීම්වලට ගැලපුමක් වශයෙන් සෘජුවම වාර්තා කරයි. සාධාරණ අගයට ගැලපුම් සෑම වාර්තා කරන දිනකම සටහන් කරන අතර ඒවා ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනු ලබයි. සාධාරණ අගය අනාගතය සඳහා වූ වට්ටම් කල මුදල් ප්‍රවාහ ක්‍රම භාවිතය තුළින් නිර්ණය කරනු ලබයි. වීකක ගත ගිවිසුම් සඳහා සාධාරණ අගය ගණනය කරනුයේ සෑම වීකකයකම ඔප්පු හිමියන් සඳහා ඇති වීකක ගණන වම අරමුදල වාර්තාකරණ දිනයේ දී ඇති වීකක මිලෙන් වැඩි කිරීම මඟින්ය. වාර්තාකරණ දිනයට වීකක මිල තීරණය කිරීම සඳහා යොදා ගනු ලබන අරමුදල්මය වත්කම් සහ වගකීම්වල පදනම රඳා පවතින්නේ ඒවා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි දැක්වෙන අගයට විලම්බිත බදු සහ උපචිත නොවූ ලාභ වෙනුවෙන් වන ගැලපීම් සිදු කළ පසු අගයයි. වීකක ගත නොවූ ගිවිසුම් ද අනතුරුව සාධාරණ අගයට පවත්වාගෙන යනු ලබන අතර ඒවා වට්ටම් ගත මුදල් ප්‍රවාහ හා අනුමානගත ආකෘති යන තක්සේරු ක්‍රම භාවිතය මඟින් නිර්ණය කරනු ලබයි. මෙම ආකෘතිවල වලංගු භාවය, ක්‍රමාංකිත බව සුදුසුකම් සහිත ස්වාධීන පුද්ගලයෙකු විසින් කලින් කල ඇගයීම් කරනු ලබයි.

ගිවිසුම කල් පිරුණු පසුව නිදහස් කිරීමෙන් හෝ අවලංගු කිරීමක් මඟින් වගකීම් බැහැර කල යුතුය. ඔප්පු හිමියාට අවලංගු කල හැකි ගිවිසුම් සඳහා වන සාධාරණ අගය අයිතිය අත්හරින අගයට වඩා අඩු නොවිය යුතුය. ගිවිසුම් මූල්‍ය අවදානම් සංරචක සහ සැළකිය යුතු රක්ෂණ අවදානම් සංරචකවලින් සමන්විත වන අතර සහ මෙම සංරචක දෙක සඳහා වූ මුදල් ප්‍රවාහයන් එකිනෙකට වෙනස් අතර ඒවා විශ්වාසී ලෙස මිනුම්කරණය කළ හැකිය. මේ සඳහා පාදක වන වටිනාකම් කලඹයක් ලෙස නොපවතී. රක්ෂණ අවදානම් සඳහා වන අධිභාර රක්ෂණය ගිණුම් ගත කරන පදනමට සමානව ගිණුම් ගත කෙරේ.

5.6 අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණ (අ.ස.ල.)

අ.ස.ල. මඟින් ගිවිසුම් ගත අයිතීන් ඔප්පු හිමියන් වෙත පරිපූරක පොරොන්දු වූ ප්‍රතිලාභ වශයෙන් ඔවුන්ගේ අයිතීන් ලබාදෙනු ලබන අතර සැලකිය යුතු වැඩිපුර ප්‍රතිලාභ අ.ස.ල. කළඹ පවතින වත්කම්වල ක්‍රියාකාරිත්වය මත පදනම් වේ. 90/10 පදනම මත ඔප්පු හිමියන්ට සහ කොටස් හිමියන්ට අ.ස.ල. අරමුදලේ අතිරික්ත, කොන්දේසි ප්‍රකාරව බෙදා දිය හැකිය. මෙම අතිරික්ත ඔප්පු හිමියන් වෙත බෙදා දීමේ දී එහි වටිනාකම සහ කාලය තීරණය කිරීමේ අභිමතය සමූහය සතුය. පොරොන්දු වූ සහ අභිමතානුරූපී, වෙන්නොකළ අතිරික්ත ද ඇතුව සියලුම අ.ස.ල. වගකීම් රක්ෂණය යටතේ හෝ ආයෝජන ගිවිසුම් වගකීම් යටතේ සුදුසු ලෙස වාර්ෂිකව රඳවා තබා ගනු ලැබේ.

5.7 නොඉපැයූ වාරික මුදල් සංචිතය

නොඉපැයූ වාරික මුදල් සංචිතය නිරූපණය කරන්නේ නොඉක්ම වූ කාල සීමාව සඳහා ආවරණය වන අදාළ වාරිකවල අගයයි. නාමික නොඉපැයූ වාරික මුදල් ගණනය කර ඇත්තේ 1/24 පදනමටය.

6. අළුතින් නිකුත් කරන ලද සහ සංශෝධිත ගිණුම්කරණ ප්‍රමිති සහ අර්ථකතනයන්

6.1 නිකුත් කළ නමුත් වාර්තා කරන දිනට බලාත්මක නොවන නව ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති නමුත් 2021 දෙසැම්බර් 31 දින දක්වා බලාත්මක නොවන පහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිති වේ. ඒ අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී මෙම ගිණුම්කරණ ප්‍රමිති අදාළ කරගෙන නැත.

සමූහයට අදාළ වන පහත දැක්වෙන ප්‍රමිතිය අපි හඳුනාගෙන ඇති අතර ඒවා සම්බන්ධව වැඩි විස්තර පහත දක්වා ඇත.

6.1.1 ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 17-"රක්ෂණ ගිවිසුම්"

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 17-"රක්ෂණ ගිවිසුම්" ප්‍රමිතියේ විෂය පථය තුළ රක්ෂණ ගිවිසුම් හඳුනා ගැනීම, මැනීම, ඉදිරිපත් කිරීම සහ අනාවරණය කිරීම සඳහා මූලධර්ම ස්ථාපිත කෙරේ. ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 17-"රක්ෂණ ගිවිසුම්" හි පරමාර්ථය වන්නේ යම් ආයතනයක් වම ගිවිසුම් විශ්වාසනීයත්වයකින් අදාළ තොරතුරු සපයන බව සහතික කිරීමයි. මෙම තොරතුරු මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට රක්ෂණ ගිවිසුම් මඟින් ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහයන් කෙරෙහි ඇති කරන බලපෑම තක්සේරු කිරීමට පදනමක් සපයයි. ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 17-"රක්ෂණ ගිවිසුම්" 2023 ජනවාරි 1 වන දින හෝ ඊට පසුව ඇරඹෙන වාර්ෂික කාල පරිච්ඡේදය බලාත්මක වේ. ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 17-" රක්ෂණ ගිවිසුම්" යොදා ගැනීම නිසා මූල්‍ය ප්‍රකාශන වලට ඇතිවිය හැකි බලපෑම සමූහය විසින් තක්සේරු කරමින් සිටියි.

6.2 සංශෝධිත ප්‍රමිති

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය 2022 ජනවාරි 1 වැනිදා හෝ ඉන් පසුව ඇරඹෙන වාර්ෂික කාලසීමාවන් සඳහා බලපැවැත්වෙන පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සංශෝධන සිදු කර ඇත. පහත සඳහන් සංශෝධන යෙදීමෙන් මූල්‍ය ප්‍රකාශනවලට ඇති විය හැකි බලපෑම තක්සේරු කරයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

6.2.1 ලං.ගි.ප්‍ර. 37 හි සංශෝධන- "ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්": බර කොන්ත්‍රාත්තු - කොන්ත්‍රාත්තුවක් ඉටු කිරීමේ පිරිවැය

මෙම සංශෝධන ''සෘජුවම සම්බන්ධ පිරිවැය ප්‍රවේශයට අදාළ වේ." අදාළ භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා වන කොන්ත්‍රාත්තුවට සෘජුවම සම්බන්ධ වන පිරිවැයට වර්ධක පිරිවැය සහ කොන්ත්‍රාත් ක්‍රියාකාරකම්වලට සෘජුවම සම්බන්ධ පිරිවැය වෙන් කිරීම යන දෙකම ඇතුළත් වේ. සාමාන්‍ය සහ පරිපාලන වියදම් කොන්ත්‍රාත්තුවකට සෘජුව සම්බන්ධ නොවන අතර කොන්ත්‍රාත්තුව යටතේ ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයට පැහැදිලිව අය කළ නොහැකි නම් හැර ඒවා බැහැර කරනු ලැබේ.

6.2.2 ලං.ගි.ප්‍ර. 16 සංශෝධන - "දේපල පිරියත සහ උපකරණ" අපේක්ෂිත භාවිතයට පෙර අදායම

අපේක්ෂිත භාවිතයට පෙර ලැබෙන ආදායම, දේපල, පිරියත සහ උපකරණ යන අයිතමවල පිරිවැයෙන් අඩු කිරීම තහනම් කරන අතර, එම වත්කම අපේක්ෂිත ආකාරයට ක්‍රියාත්මක වීමට අවශ්‍ය ස්ථානයට සහ අවශ්‍ය කොන්දේසියට ගෙන ඒමේදී නිෂ්පාදනය කරන ලද භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ඕනෑම ආදායමක් වේ. ඒ වෙනුවට, ආයතනයක් එවැනි භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම සහ එම භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ පිරිවැය ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී.

6.2.3 ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 3 සඳහා සංශෝධන - "ව්‍යාපාර සංයෝජන": සංකල්පීය රාමුව වෙත යොමුවක් යාවත්කාලීන කිරීම

මෝටර් වාහන	1,226,115	997,475	1,247,517	1,059,237
පරිගණක උපකරණ	5,008,981	4,010,339	5,020,158	4,266,903
උපකරණ, ලී බඩු හා සවිකිරීම්	2,102,715	1,907,381	2,122,473	2,169,159
කල්බදු අයිතිය සහිත ඉඩම් මත ගොඩනැගිලි	39,350	43,906	39,350	43,906
පිරියත හා යන්ත්‍රෝපකරණ	1,713,280	1,441,662	1,713,495	1,549,787
එකතුව	10,090,441	8,400,763	10,142,993	9,088,992

34.7 තාවකාලිකව භාවිතයේ නොමැති දේපළ, පිරියත හා උපකරණ

වාර්තා කරන දින වන විට තාවකාලිකව භාවිතයේ නොමැති දේපළ, පිරියත හා උපකරණ නොපැවතුනි.

34.8 ක්‍රියාකාරී භාවිතයෙන් බැහැර කරන ලද දේපළ, පිරියත හා උපකරණ

ක්‍රියාකාරී භාවිතයෙන් බැහැර කරන ලද සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 5 - "විකිණීම සඳහා තබා ඇති ජංගම නොවන වත්කම් හා නවතා දැමූ මෙහෙයුම්" ප්‍රමිතියට අනුකූලව විකිණීමේ පදනම මත රඳවා ගෙන ඇති ලෙසට නිර්වචනය කර ඇති දේපළ, පිරියත හා උපකරණ කිසිවක් සමූහය සතුව නොපැවතුනි.

34.9 ප්‍රත්‍යාගණිත වත්කම්වල පිරිවැය

පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ අගයට මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරන්නේ නම් එම නිදහස් අයිතිය සහිත දේපළවල සමුච්චිත ක්ෂය අඩු කළ පසු ධාරණ අගය පහත පරිදි වේ.

34.9.1 බැංකුව

දෙසැම්බර් 31 දිනට	2021			2020		
	පිරිවැය	සමුච්චිත ක්ෂය වීම්	ශුද්ධ පොත් අගය	පිරිවැය	සමුච්චිත ක්ෂය වීම්	ශුද්ධ පොත් අගය
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
ඉඩම්	2,069,386	-	2,069,386	2,069,386	-	2,069,386
ගොඩනැගිලි	2,736,099	(916,557)	1,819,542	2,329,975	(781,471)	1,548,504
එකතුව	4,805,485	(916,557)	3,888,928	4,399,361	(781,471)	3,617,890

34.9.2 සමූහය

දෙසැම්බර් 31 දිනට	2021			2020		
	පිරිවැය	සමුච්චිත ක්ෂය වීම්	ශුද්ධ පොත් අගය	පිරිවැය	සමුච්චිත ක්ෂය වීම්	ශුද්ධ පොත් අගය
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
ඉඩම්	2,195,353	-	2,195,353	2,116,395	-	2,116,395
ගොඩනැගිලි	3,926,069	(1,732,478)	2,193,591	3,495,307	(1,409,503)	2,085,804
එකතුව	6,121,422	(1,732,478)	4,388,944	5,611,702	(1,409,503)	4,202,199

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

34.10 කල්බදු දේපළ/ නිදහස් දේපළ ප්‍රත්‍යාගණනය - සමූහය

පහත දැක්වෙන පරිපාලිතයන්ගේ නිදහස් අයිතිය සහිත/ කල්බදු අයිතිය සහිත ඉඩම් සහ ඒවායෙහි ඇති ගොඩනැගිලි වර්ෂය තුළ වෘත්තීය සුදුසුකම්ලත් ස්වාධීන තක්සේරුකරුවන් විසින් ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කර ඇත.

කල්බදු දේපළ			2021		
දේපළ පිළිබඳ විස්තර	තක්සේරුකරු	තක්සේරු කිරීමේ පදනම	ධාරණ අගය	ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණන වටිනාකම	ගොඩනැගිලිවල අතිරික්තයන්/ (අලාභයන්)
			රු. '000	රු. '000	රු. '000
ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී ලංකා බැංකු මූලස්ථාන ගොඩනැගිල්ල ලංකා බැංකු චතුරශ්‍රය, කොළඹ 01 (ප්‍රත්‍යාගණනය කළේ 2021.12.31 දිනට)	පී පී ටී මොහිදීන්	වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ක්‍රමය	7,475,314	8,099,763	624,449
සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම ලංකා බැංකුව - සීබෑන්ක් නිවස නො. 86, ශ්‍රී දළදා වීදිය, මහනුවර. (ප්‍රත්‍යාගණනය කළේ 2021.12.31 දිනට)	පී බී කළුගලගෙදර ඇන්ඩ් ඇසෝසියේට්ස්	වෙළඳපොල වටිනාකම මත	488,400	488,040	(360)

නිදහස් අයිතිය සහිත ඉඩම්			2021		
දේපළ පිළිබඳ විස්තර	තක්සේරුකරු	තක්සේරු කිරීමේ පදනම	ධාරණ අගය	ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණන වටිනාකම	ගොඩනැගිලිවල අතිරික්තයන්/ (අලාභයන්)
			රු. '000	රු. '000	රු. '000
ලංකා බැංකුව (යූ .කේ) සමාගම 1, ඩෙවොන්ෂයර් චතුරශ්‍රය, ලන්ඩන් EC2M4AD (ප්‍රත්‍යාගණනය කළේ 2020.02.03 දිනට)	මාක් ෂෝර්ට් එම් ආර් අයි සී එස්	වෙළඳපොල වටිනාකම මත	734,664	920,025	185,361

නිදහස් අයිතිය සහිත ගොඩනැගිලි			2021		
දේපළ පිළිබඳ විස්තර	තක්සේරුකරු	තක්සේරු කිරීමේ පදනම	ධාරණ අගය	ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණන වටිනාකම	ගොඩනැගිලිවල අතිරික්තයන්/ (අලාභයන්)
			රු. '000	රු. '000	රු. '000
සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම ලංකා බැංකුව - මර්චන්ට් ටවර්, ශාන්ත මයිකල් පාර, කොළඹ 03 (ප්‍රත්‍යාගණනය කළේ 2021.12.31 දිනට)	පී බී කළුගලගෙදර ඇන්ඩ් ඇසෝසියේට්ස්	වෙළඳපොල වටිනාකම මත	1,761,815	1,768,000	6,183

34.11 සාධාරණ අගය ගණනය කිරීමේදී යොදාගත් නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්

වත්කම්වල සාධාරණ අගයන් තීරණය කිරීමේ ධුරාවලියේ තුන්වන මට්ටම යටතේ වර්ගීකරණය කළ වත්කම්වල සාධාරණ අගය තීරණය කිරීම සඳහා යොදා ගත් වැදගත් නිරීක්ෂණය කල නොහැකි යෙදවුම් පිළිබඳ පහත වගුවෙන් තොරතුරු සපයා ඇත.

34.11.1 බැංකුව

			2021		
වත්කම් වර්ගය	2021 දෙසැම්බර් 31 දිනට සාධාරණ අගය රු. '000	තක්සේරු කිරීමේ ශිල්පීය ක්‍රමය	වැදගත් නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්	නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් තක්සේරු පරාසය	නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්වලින් සාධාරණ අගයට සංවේදීතාව
නිදහස් අයිතිය සහිත ඉඩම්	19,911,607	වෙළඳපොළ හා සැසඳීමේ ක්‍රමය	පර්චසයක තක්සේරු කළ පිරිවැය	රු. 50,000 - රු. 19,053,000	ධනාත්මක සහසම්බන්ධතා සංවේදීතාව
නිදහස් අයිතිය සහිත ගොඩනැගිලි	4,468,177	වෙළඳපොළ හා සැසඳීමේ ක්‍රමය	වර්ග අඩියක තක්සේරු කළ පිරිවැය	රු. 600 - රු. 59,000	ධනාත්මක සහසම්බන්ධතා සංවේදීතාව
කල්බදු අයිතිය සහිත ඉඩම්වල ඇති ගොඩනැගිලි	2,501,994	කුලී වටිනාකම පදනම	වර්ග අඩියක තක්සේරු කළ කුලී වටිනාකම	රු. 110 - රු. 11,250	ධනාත්මක සහසම්බන්ධතා සංවේදීතාව
			වෙළඳපොළ කුලී වටිනාකමේ අපේක්ෂිත වාර්ෂික වර්ධනය	5%	ධනාත්මක සහසම්බන්ධතා සංවේදීතාව
			අපේක්ෂිත නඩත්තු පිරිවැය	40%	ධනාත්මක සහසම්බන්ධතා සංවේදීතාව
			වට්ටම් අනුපාතිකය	5.50%	සෘණාත්මක සහසම්බන්ධතා සංවේදීතාව

34.11.2 සමූහය

			2021		
වත්කම් වර්ගය	2021 දෙසැම්බර් 31 දිනට සාධාරණ අගය රු. '000	තක්සේරු කිරීමේ ශිල්පීය ක්‍රමය	වැදගත් නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්	නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් තක්සේරු පරාසය	නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්වලින් සාධාරණ අගයට සංවේදීතාව
නිදහස් අයිතිය සහිත ඉඩම්	23,067,079	වෙළඳපොළ හා සැසඳීමේ ක්‍රමය	පර්චසයක තක්සේරු කළ පිරිවැය	රු. 50,000 - රු. 20,000,000	ධනාත්මක සහසම්බන්ධතා සංවේදීතාව
නිදහස් අයිතිය සහිත ඉඩම්වල ඇති ගොඩනැගිලි	6,492,865	වෙළඳපොළ හා සැසඳීමේ ක්‍රමය	වර්ග අඩියක තක්සේරු කළ පිරිවැය	රු. 600 - රු. 59,000	ධනාත්මක සහසම්බන්ධතා සංවේදීතාව
කල්බදු අයිතිය සහිත ඉඩම්වල ඇති ගොඩනැගිලි	11,071,728	කුලී වටිනාකම පදනම	වර්ග අඩියක තක්සේරු කළ කුලී වටිනාකම	රු. 110 - රු. 11,250	ධනාත්මක සහසම්බන්ධතා සංවේදීතාව
			වෙළඳපොළ කුලී වටිනාකමේ අපේක්ෂිත වාර්ෂික වර්ධනය	5% -7.5%	ධනාත්මක සහසම්බන්ධතා සංවේදීතාව
			අපේක්ෂිත නඩත්තු පිරිවැය	40%	ධනාත්මක සහසම්බන්ධතා සංවේදීතාව
			වට්ටම් අනුපාතිකය	5.5% -10%	සෘණාත්මක සහසම්බන්ධතා සංවේදීතාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

34.12 උපකරණ

34.12.1 බැංකුව

	පරිගණක උපකරණ	ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	කාර්යාලීය උපකරණ	2021 එකතුව	2020 එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
පිරිවැය					
ජනවාරි 1 දිනට ශේෂය	9,551,357	5,323,251	3,222,818	18,097,426	16,201,964
වර්ෂය තුළ එකතු කිරීම්					
අත්පත් කර ගැනීම්	461,173	387,567	115,580	964,320	1,948,195
ප්‍රාග්ධනීකරණය කිරීම්	-	-	-	-	14,905
වර්ෂය තුළ බැහැර කිරීම්	(42,310)	(43,625)	(31,538)	(117,473)	(69,790)
විනිමය අනුපාත ගැළපුම්	19,680	3,450	4,076	27,206	(2,380)
මාරු කිරීම්/ ගැළපුම්	-	-	-	-	4,532
දෙසැම්බර් 31 දිනට ශේෂය	9,989,900	5,670,643	3,310,936	18,971,479	18,097,426
සමුච්චිත ක්ෂය වීම්					
ජනවාරි 1 දිනට ශේෂය	6,689,718	3,231,283	2,333,270	12,254,271	10,772,230
වර්ෂය සඳහා ප්‍රතිපාදන	1,038,063	436,843	205,720	1,680,626	1,547,935
වර්ෂය තුළ බැහැර කිරීම්	(41,723)	(41,866)	(30,988)	(114,577)	(64,417)
විනිමය අනුපාත ගැළපුම්	16,828	2,982	2,338	22,148	(1,486)
මාරු කිරීම්/ ගැළපුම්	-	-	-	-	9
දෙසැම්බර් 31 දිනට ශේෂය	7,702,886	3,629,242	2,510,340	13,842,468	12,254,271
ශුද්ධ පොත් අගය 2021 දෙසැම්බර් 31 දිනට	2,287,014	2,041,401	800,596	5,129,011	
ශුද්ධ පොත් අගය 2020 දෙසැම්බර් 31 දිනට	2,861,639	2,091,968	889,548	-	5,843,155

34.12.2 සමූහය

	පරිගණක උපකරණ	ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	කාර්යාලීය උපකරණ	බල ශක්ති උත්පාදක	2021 එකතුව	2020 එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
පිරිවැය						
ජනවාරි 1 දිනට ශේෂය	10,104,004	6,129,576	3,265,807	298,998	19,798,385	17,833,488
වර්ෂය තුළ එකතු කිරීම්						
අත්පත් කර ගැනීම්	499,267	423,881	121,310	-	1,044,458	2,027,949
ප්‍රාග්ධනීකරණය කිරීම්	-	-	-	-	-	14,905
වර්ෂය තුළ බැහැර කිරීම්	(42,382)	(48,148)	(31,715)	(298,998)	(421,243)	(82,669)
විනිමය අනුපාත ගැළපුම්	21,990	6,703	4,075	-	32,768	182
මාරු කිරීම්/ ගැළපුම්	-	-	-	-	-	4,530
දෙසැම්බර් 31 දිනට ශේෂය	10,582,879	6,512,012	3,359,477	-	20,454,368	19,798,385
සමුච්චිත ක්ෂය වීම්						
ජනවාරි 1 දිනට ශේෂය	7,133,814	3,814,296	2,371,515	210,691	13,530,316	11,828,371
වර්ෂය සඳහා ප්‍රතිපාදන	1,092,776	485,345	207,187	-	1,785,308	1,685,562
හානිකරන අලාභ	-	-	-	-	-	81,759
වර්ෂය තුළ බැහැර කිරීම්	(41,785)	(45,330)	(31,139)	(210,691)	(328,945)	(67,207)
විනිමය අනුපාත ගැළපුම්	18,717	5,276	2,339	-	26,332	776
මාරු කිරීම්/ ගැළපුම්	-	-	-	-	-	1,055
දෙසැම්බර් 31 දිනට ශේෂය	8,203,522	4,259,587	2,549,902	-	15,013,011	13,530,316
ශුද්ධ පොත් අගය 2021 දෙසැම්බර් 31 දිනට	2,379,357	2,252,425	809,575	-	5,441,357	-
ශුද්ධ පොත් අගය 2020 දෙසැම්බර් 31 දිනට	2,970,190	2,315,280	894,292	88,307	-	6,268,069

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

34.13 2021 දෙසැම්බර් 31 දිනට බැංකුව සතු නිදහස් අයිතිය සහිත ඉඩම් හා ගොඩනැගිලිවලට අදාළ තොරතුරු:

පරිශ්‍රයේ නම	ගොඩනැගිලි ගණන	ඉඩමේ ප්‍රමාණය (පර්චස්)	ගොඩනැගිලි (වර්ග අඩි)	තක්සේරු කළ දිනය	තක්සේරුකරු
මධ්‍යම පළාත					
ගලහ ශාඛාව 59/37, දෙල්තොට පාර, ගලහ	1	15.00	8,410	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
ගම්පොළ ශාඛාව 44, කඩුගන්නාව පාර, ගම්පොළ	1	175.00	9,832	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
ගලේවෙල ශාඛාව 158, දඹුල්ල පාර, ගලේවෙල	1	47.00	6,958	30.11.2020	උපාලි රාජපක්ෂ
හැටන් ශාඛාව සහ සේවක නිල නිවාස 46, වටරවුම් පාර, හැටන්	2	139.57	10,891	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
මහනුවර දෙවන නගර ශාඛාව සී බෑන්ක් හවුස්, 88, දළඳා වීදිය, මහනුවර	1	42.81	18,523	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
කඳපොල ශාඛාව 31/33, ප්‍රධාන වීදිය, කඳපොල	1	14.10	4,536	11.07.2018	කේ. ටී. ඩී. තිසේරා
මස්කෙළිය ශාඛාව 66, අප්කොට් පාර, මස්කෙළිය	1	42.05	6,607	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
නාවලපිටිය ශාඛාව 06, ගම්පොළ පාර, නාවලපිටිය	1	21.92	9,790	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
නුවරඑළිය ශාඛාව 43, ලෝසන් වීදිය, නුවරඑළිය	1	133.50	9,713	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
නුවරඑළිය සේවක නිල නිවාස 14, 19, හිල් වීදිය, නුවරඑළිය	1	41.40	4,847	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
නුවරඑළිය දේපළ කාන්තා නිල නිවාස 12, හිල් වීදිය, නුවරඑළිය	1	14.99	1,303	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
රිකිල්ලගස්කඩ ශාඛාව 3, දිඹුල්කුඹුර පාර, රිකිල්ලගස්කඩ	1	19.60	4,676	26.07.2017	එන්. එම්. කැප්පෙටිපොල
තලවකැලේ ශාඛාව 23, 25, 29, හැටන් පාර, තලවකැලේ	1	25.30	7,332	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
තලවකැලේ සේවක නිල නිවාස තලවකැලේ වතුයාය, තලවකැලේ	1	160.00	4,898	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
නැගෙනහිර පළාත					
මඩකලපුව ශාඛාව 19, ගෝවින්ටන් පාර, මඩකලපුව	1	64.85	7,464	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
මූතූර් ශාඛාව 36/1, ත්‍රිකුණාමලය පාර, යාය 7, මූතූර්	1	71.00	7,566	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
පොතුවිල් ශාඛාව ප්‍රධාන වීදිය, පොතුවිල්	1	10.70	4,077	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
ත්‍රිකුණාමලය ශාඛාව 24, ඇතුල්වරාය පාර, ත්‍රිකුණාමලය	1	90.00	10,810	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
ත්‍රිකුණාමලය නගර ශාඛාව 09, ප්‍රධාන වීදිය, ත්‍රිකුණාමලය	1	21.90	9,620	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
වාලච්චේන ශාඛාව ප්‍රධාන වීදිය, වාලච්චේන	1	47.34	6,621	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
උතුරු පළාත					
යාපනය කලාප කාර්යාලය සහ ශාඛාව 476, 476A, රෝහල පාර, යාපනය	2	166.25	23,641	30.11.2020	කේ. ටී. ඩී. තිසේරා
යාපනය දෙවන ශාඛාව 52, ස්ටැන්ලි පාර, යාපනය	1	33.89	18,092	30.10.2018	කේ. ටී. ඩී. තිසේරා
කරෙයිනගර් ශාඛාව තැපැල් කාර්යාලය ඉදිරිපිට, කරෙයිනගර්	1	20.09	2,633	30.11.2020	කේ. ටී. ඩී. තිසේරා

තක්සේරු කිරීමේ පදනම	ඉඩමේ ප්‍රත්‍යාගණන අගය	ගොඩනැගිල්ලේ ප්‍රත්‍යාගණන අගය	එකතුව	සමුච්චිත ක්ෂය	ලියාහල අගය
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	22,500	29,370	51,870	839	51,031
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	245,000	26,157	271,157	747	270,410
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	117,500	60,193	177,693	1,437	176,256
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	279,140	42,970	322,110	1,098	321,012
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	642,150	109,721	751,871	2,748	749,123
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	37,109	9,967	47,076	666	46,410
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	42,000	22,297	64,297	607	63,690
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	54,800	35,244	90,044	881	89,163
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	867,750	38,863	906,613	955	905,658
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	103,500	16,116	119,616	733	118,883
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	11,242	4,104	15,346	103	15,243
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	30,199	11,500	41,699	1,469	40,230
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	39,650	22,254	61,904	554	61,350
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	11,200	13,944	25,144	349	24,795
	2,503,740	442,700	2,946,440	13,186	2,933,254
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	64,850	23,676	88,526	1,184	87,342
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	24,850	45,396	70,246	1,135	69,111
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	24,075	18,304	42,379	458	41,921
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	99,000	25,699	124,699	1,274	123,425
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	38,325	85,863	124,188	179	124,009
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	37,872	18,795	56,667	614	56,053
	288,972	217,733	506,705	4,844	501,861
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	540,000	35,137	575,137	1,752	573,385
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	135,269	52,330	187,599	2,835	184,764
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	5,000	9,000	14,000	257	13,743

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

පරිශ්‍රයේ නම	ගොඩනැගිලි ගණන	ඉඩමේ ප්‍රමාණය (පර්චස්)	ගොඩනැගිලි (වර්ග අඩි)	තක්සේරු කළ දිනය	තක්සේරුකරු
මන්නාරම ශාඛාව (ඉඩම)					
මුවර් වීදිය, මන්නාරම	-	63.22	-	30.11.2020	ඒ. ආර්. එම්. එම්. කලීල්
නෙල්ලියාඩි ශාඛාව					
23, කොඩිකාමම් පාර, නෙල්ලියාඩි	1	42.74	10,889	30.11.2020	ඒ. ආර්. එම්. එම්. කලීල්
වයඹ පළාත					
අලව්ව ශාඛාව					
64, ගිරිඋල්ල පාර, අලව්ව	1	30.80	7,011	30.11.2020	ආර්. ඩබ්ලිව්. එම්. එස්. බී රාජපක්ෂ
බිංගිරිය ඉඩම					
44, හලාවත පාර, බිංගිරිය	-	40.00	-	30.11.2020	උපාලි රාජපක්ෂ
හලාවත ශාඛාව					
රදගුරු එඩ්මන් පීරිස් මාවත, හලාවත	1	38.25	8,935	30.11.2020	ආර්. ඩබ්ලිව්. එම්. එස්. බී රාජපක්ෂ
දංකොටුව ඉඩම					
01/60, මීගමු පාර, දංකොටුව	-	32.90	-	03.08.2017	කේ. ටී. ඩී. තිසේරා
දුම්මලසූරිය ශාඛාව					
227, කුලියාපිටිය-මාදම්පේ පාර, දුම්මලසූරිය	1	41.68	6,139	30.11.2020	ආර්. ඩබ්ලිව්. එම්. එස්. බී රාජපක්ෂ
කුරුණෑගල පළාත් කාර්යාලය, සහකාර මහා කළමනාකරු සහ ප්‍රධාන කළමනාකරු නිල නිවාස					
18, මිහිඳු මාවත, කුරුණෑගල	3	225.00	20,575	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
කුරුණෑගල අධිශ්‍රේණි ශාඛාව					
වෙළඳ සංකීර්ණය, කුරුණෑගල	1	-	12,242	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
කුරුණෑගල දෙවන නගර ශාඛාව					
35, කොළඹ පාර, කුරුණෑගල	1	49.40	28,000	30.11.2020	ආර්. ඩබ්ලිව්. එම්. එස්. බී රාජපක්ෂ
මාදම්පේ ශාඛාව					
10, දුම්රියපොළ පාර, මාදම්පේ	1	61.10	7,260	30.11.2020	ආර්. ඩබ්ලිව්. එම්. එස්. බී රාජපක්ෂ
මදුරන්කුලිය ශාඛාව					
66, කොළඹ පාර, මදුරන්කුලිය	1	46.00	5,760	30.11.2020	ආර්. ඩබ්ලිව්. එම්. එස්. බී රාජපක්ෂ
මැල්සිරිපුර ශාඛාව					
362, 358, දඹුල්ල පාර, මැල්සිරිපුර	1	46.20	7,242	30.11.2020	ආර්. ඩබ්ලිව්. එම්. එස්. බී රාජපක්ෂ
මාරවිල ශාඛාව (ඉඩම)					
85, මීගමු පාර, මාරවිල	-	35.00	-	03.04.2018	ආර්. ඩබ්ලිව්. එම්. එස්. බී රාජපක්ෂ
නාරම්මල ශාඛාව					
139, මීගමු පාර, නාරම්මල	1	117.50	7,190	30.11.2020	ආර්. ඩබ්ලිව්. එම්. එස්. බී රාජපක්ෂ
නාත්තණ්ඩිය ශාඛාව (ඉඩම)					
115, මාරවිල පාර, නාත්තණ්ඩිය	-	40.00	-	30.11.2020	උපාලි රාජපක්ෂ
වයික්කාල් ශාඛාව (ඉඩම)					
43/44, තෝප්පුව, වයික්කාල්	-	36.00	-	30.11.2020	උපාලි රාජපක්ෂ
වාරියපොළ ශාඛාව (ඉඩම)					
32, කුරුණෑගල පාර, වාරියපොළ	-	40.80	-	30.11.2020	ආර්. ඩබ්ලිව්. එම්. එස්. බී රාජපක්ෂ
සබරගමුව පළාත					
බලංගොඩ ශාඛාව					
137, 139, ප්‍රධාන වීදිය, බලංගොඩ	1	14.50	3,520	30.11.2020	එස්. ඒ. ආර්. අමරසිංහ
දෙහිඕවිට ශාඛාව					
62, ප්‍රධාන වීදිය, දෙහිඕවිට	1	38.60	3,818	30.11.2020	ඒ. ජී. ගුණරත්න
කෑගල්ල ශාඛාව					
110, කොළඹ පාර, කෑගල්ල	1	131.38	16,718	30.11.2020	ඩබ්ලිව්. ඩී. පී. රූපානන්ද
රත්නපුර ශාඛාව					
6, ධර්මපාල මාවත, රත්නපුර	1	99.70	11,082	30.11.2020	ඩබ්ලිව්. ඩී. පී. රූපානන්ද
රත්නපුර ඉඩම					
25, ෂාවියා මාවත, රත්නපුර	-	31.69	-	30.11.2020	ඩබ්ලිව්. ඩී. පී. රූපානන්ද

තක්සේරු කිරීමේ පදනම	ඉඩමේ ප්‍රත්‍යාගණන අගය	ගොඩනැගිල්ලේ ප්‍රත්‍යාගණන අගය	එකතුව	සමුච්චිත ක්ෂය	ලියාහල අගය
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	35,000	-	35,000	-	35,000
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	60,000	55,000	115,000	1,375	113,625
	775,269	151,467	926,736	6,219	920,517
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	54,000	22,000	76,000	550	75,450
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	30,000	-	30,000	-	30,000
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	76,500	28,500	105,000	713	104,287
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	49,973	-	49,973	-	49,973
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	41,500	23,500	65,000	587	64,413
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	1,012,500	95,277	1,107,777	2,380	1,105,397
ආයෝජන ක්‍රමය	-	224,600	224,600	5,615	218,985
සන්සන්දනාත්මක ක්‍රමය	468,000	1,670	469,670	64	469,606
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	61,000	26,000	87,000	650	86,350
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	62,100	32,700	94,800	818	93,982
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	69,000	47,443	116,443	1,180	115,263
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	48,879	-	48,879	-	48,879
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	92,750	38,750	131,500	969	130,531
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	60,000	-	60,000	-	60,000
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	60,000	-	60,000	-	60,000
සන්සන්දනාත්මක ක්‍රමය	100,000	-	100,000	-	100,000
	2,286,202	540,440	2,826,642	13,526	2,813,116
ක්ෂය ප්‍රතිස්ථාපන පිරිවැය ක්‍රමය	36,200	3,100	39,300	310	38,990
පිරිවැය ප්‍රවේශය	20,090	2,418	22,508	1,209	21,299
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	350,000	55,000	405,000	1,833	403,167
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	110,000	35,000	145,000	972	144,028
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	118,000	-	118,000	-	118,000
	634,290	95,518	729,808	4,324	725,484

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

පරිශ්‍රයේ නම	ගොඩනැගිලි ගණන	ඉඩමේ ප්‍රමාණය (පර්චස්)	ගොඩනැගිලි (වර්ග අඩි)	තක්සේරු කළ දිනය	තක්සේරුකරු
දකුණු පළාත					
අම්බලන්ගොඩ ශාඛාව 345, ගාලු පාර, අම්බලන්ගොඩ	1	58.00	6,330	30.11.2020	යූ. රාජපක්ෂ
අම්බලන්තොට ශාඛාව 11, වළුරුප්ප පාර, අම්බලන්තොට	1	38.00	5,410	30.11.2020	යූ. රාජපක්ෂ
අහංගම ශාඛාව 54, ගාලු පාර, අහංගම	1	33.35	4,917	30.11.2020	යූ. රාජපක්ෂ
බටපොළ ශාඛාව අලුත්වත්ත, බටපොළ	1	46.80	3,024	27.01.2019	යූ. රාජපක්ෂ
බෙලිඅත්ත ශාඛාව 67, වලස්මුල්ල පාර, බෙලිඅත්ත	1	53.02	6,200	30.11.2020	යූ. රාජපක්ෂ
දෙනියාය ඉඩම විහාරහේන පාර, දෙනියාය	-	55.80	-	26.02.2019	යූ. රාජපක්ෂ
ගාල්ල පළාත් කාර්යාලය 20, රෝහල වීදිය, කොටුව, ගාල්ල	1	32.63	14,250	30.11.2020	එස්. ඒ. ආර්. අමරසිංහ
ගාල්ල ශාඛාව 2, ප්‍රදීපාගාර වීදිය, කොටුව, ගාල්ල	1	31.50	16,200	30.11.2020	එස්. ඒ. ආර්. අමරසිංහ
ගාල්ල නගර ශාඛාව (ඉඩම) 07, ශ්‍රී දේවමිත්ත මාවත, ගාල්ල	-	27.14	-	29.03.2019	යූ. රාජපක්ෂ
හක්මන ශාඛාව බෙලිඅත්ත පාර, හක්මන	1	36.70	3,400	30.11.2020	යූ. රාජපක්ෂ
ඉමදූව ශාඛාව අහංගම පාර, ඉමදූව	1	83.50	3,300	30.11.2020	එස්. ඒ. ආර්. අමරසිංහ
කරාපිටිය ඉඩම 167A, හිරිඹුර හරස් පාර, කරාපිටිය	-	35.00	-	30.11.2020	යූ. රාජපක්ෂ
මාතර අධි ශ්‍රේණි ශාඛාව 11, කුමාරතුංග මාවත, මාතර	1	104.40	52,969	30.11.2020	යූ. රාජපක්ෂ
මාතර නගර ශාඛාව 58, නව තංගල්ල පාර, මාතර	1	49.25	6,920	30.11.2020	යූ. රාජපක්ෂ
නාගොඩ ශාඛාව මාපලගම පාර, නාගොඩ	1	40.00	3,100	30.11.2020	එස්. ඒ. ආර්. අමරසිංහ
රන්න ඉඩම ප්‍රධාන වීදිය, රන්න	-	40.00	-	25.10.2018	යූ. රාජපක්ෂ
තංගල්ල ශාඛාව 91/1, 91/2, තිස්ස පාර, තංගල්ල	1	21.05	5,370	30.11.2020	යූ. රාජපක්ෂ
වීරකැටිය ශාඛාව බෙලිඅත්ත පාර, වීරකැටිය	1	36.87	4,480	30.11.2020	යූ. රාජපක්ෂ
වැලිගම ශාඛාව 239, ප්‍රධාන වීදිය, වැලිගම	1	97.75	8,110	30.11.2020	එස්. ඒ. ආර්. අමරසිංහ
වලස්මුල්ල 28, බෙලිඅත්ත පාර, වලස්මුල්ල	1	38.00	8,045	30.11.2020	යූ. රාජපක්ෂ
උඹව පළාත					
බදුල්ල උඹව පළාත් කාර්යාලය 17, හිල් ඩ්‍රයිව්, කැප්පෙටිපොල පාර, බදුල්ල	2	118.75	9,537	30.11.2020	එල්. එච්. ලික්සන්
බණ්ඩාරවෙල ශාඛාව 198 B, බදුල්ල පාර, බණ්ඩාරවෙල	1	10.60	7,731	30.11.2020	එල්. එච්. ලික්සන්
ඇටම්පිටිය ශාඛාව 23, නුවරඑළිය පාර, ඇටම්පිටිය	1	20.35	3,729	30.11.2020	එල්. එච්. ලික්සන්
හපුතලේ ශාඛාව (බ්‍රවුන්ස්) 20, දුම්රියපොළ පාර, හපුතලේ	1	158.70	7,361	30.11.2020	එල්. එච්. ලික්සන්
මොණරාගල ශාඛාව, කළමනාකරුගේ සහ සේවක නිල නිවාස 401, වැල්ලවාය පාර, මොණරාගල	3	320.00	13,011	30.11.2020	එල්. එච්. ලික්සන්

තක්සේරු කිරීමේ පදනම	ඉඩමේ ප්‍රත්‍යාගණන අගය	ගොඩනැගිල්ලේ ප්‍රත්‍යාගණන අගය	එකතුව	සමුච්චිත ක්ෂය	ලියාහල අගය
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	116,000	39,550	155,550	989	154,561
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	47,500	20,000	67,500	1,667	65,833
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	40,000	68,660	108,660	143	108,517
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	60,012	6,781	66,793	540	66,253
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	101,436	39,064	140,500	977	139,523
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	57,224	-	57,224	-	57,224
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	261,000	25,650	286,650	1,282	285,368
ක්ෂය ප්‍රතිස්ථාපන පිරිවැය ක්‍රමය	252,000	29,200	281,200	1,460	279,740
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	126,566	-	126,566	-	126,566
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	49,500	11,500	61,000	287	60,713
ක්ෂය ප්‍රතිස්ථාපන පිරිවැය ක්‍රමය	62,600	7,900	70,500	282	70,218
සන්සන්දනාත්මක ක්‍රමය	77,000	-	77,000	-	77,000
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	395,400	340,910	736,310	742	735,568
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	153,750	43,729	197,479	1,093	196,386
ක්ෂය ප්‍රතිස්ථාපන පිරිවැය ක්‍රමය	20,000	10,700	30,700	267	30,433
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	28,199	-	28,199	-	28,199
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	31,575	32,000	63,575	800	62,775
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	48,000	26,700	74,700	667	74,033
ක්ෂය ප්‍රතිස්ථාපන පිරිවැය ක්‍රමය	97,750	22,265	120,015	731	119,284
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	57,000	60,463	117,463	1,509	115,954
	2,082,512	785,072	2,867,584	13,436	2,854,148
ආයෝජන හා කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	59,316	17,347	76,663	1,927	74,736
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	82,824	23,776	106,600	1,399	105,201
ආයෝජන හා කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	11,123	10,628	21,751	266	21,485
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	39,192	11,508	50,700	822	49,878
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	84,800	42,538	127,338	1,288	126,050

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

පරිශ්‍රයේ නම	ගොඩනැගිලි ගණන	ඉඩමේ ප්‍රමාණය (පර්චස්)	ගොඩනැගිලි (වර්ග අඩි)	තක්සේරු කළ දිනය	තක්සේරුකරු
සියඹලාන්ඩුව ශාඛාව ප්‍රේමදාස හාඩ්වෙයාර් ගොඩනැගිල්ල, අම්පාර හන්දිය, සියඹලාන්ඩුව	1	28.00	5,877	01.11.2017	එම්. සී. ඒ. මලික්
බස්නාහිර පළාත - උතුර					
බොරැල්ල ශාඛාව 71, ඩැනිස්ටර් ද සිල්වා මාවත, බොරැල්ල	1	49.27	20,173	30.11.2020	ඩබ්ලිව්. ඩී. පී. රූපානන්ද කේ. ඩී. තිසේරා
නගර කාර්යාලය 41, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01	1	39.50	31,443	30.11.2020	ඩබ්ලිව්. ඩී. පී. රූපානන්ද
ග්‍රෑන්ඩ්පාස් ශාඛාව 703, සිරිමාවෝ බණ්ඩාරණායක මාවත, ග්‍රෑන්ඩ්පාස්	1	20.12	6,210	30.11.2020	ඒ. ජී. ගුණරත්න
ගම්පහ ශාඛාව 170, කොළඹ පාර, ගම්පහ	1	34.06	7,295	30.11.2020	එස්. ඒ. ආර්. අමරසිංහ
ගණේමුල්ල ශාඛාව (ඉඩම) 156, කිරිදිවිට පාර, ගණේමුල්ල	-	43.61	-	26.01.2019	එස්. ඒ. ආර්. අමරසිංහ
ජා-ඇල ශාඛාව 19, මීගමු පාර, ජා-ඇල	1	45.94	7,800	31.12.2020	ඒ. ආර්. එම්. එම්. කලීල්
කඩවත ශාඛාව 469, රාගම පාර, කඩවත	1	30.72	6,138	31.12.2020	ඒ. ආර්. එම්. එම්. කලීල්
කිරිබත්ගොඩ ශාඛාව (ඉඩම) 235, නුවර පාර, කිරිබත්ගොඩ	-	43.70	-	21.06.2018	ඒ. ජී. ගුණරත්න
මීගමුව ශාඛාව 118, රාජපක්ෂ පුළුල් මාවත, මීගමුව	1	93.60	13,503	30.11.2020	එස්. ඒ. ආර්. අමරසිංහ
මීගමුව නගර ශාඛාව 77, ප්‍රධාන වීදිය, මීගමුව	1	10.76	8,355	30.11.2020	එස්. ඒ. ආර්. අමරසිංහ
පිටකොටුව ශාඛාව 212/63, ගෘස් පහ හන්දිය, කොළඹ 11	1	28.29	25,222	30.11.2020	ඩබ්ලිව්. ඩී. පී. රූපානන්ද
දෙමටගොඩ ඉඩම 400, ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09	-	38.14	-	30.11.2020	ඩබ්ලිව්. ඩී. පී. රූපානන්ද
බස්නාහිර පළාත - දකුණ					
අළුත්ගම ශාඛාව 14 ඩග්ලස් ගුණවර්ධන මාවත, අළුත්ගම	1	36.60	6,558	30.11.2020	බී. කේ. දයාරත්න
බම්බලපිටිය ශාඛාව 20, ගාලුපාර, කොළඹ 04	1	-	7,776	30.11.2020	එස්. ඒ. ආර්. අමරසිංහ
බේරුවල ශාඛාව 165 ඒ, ගාලු පාර, බේරුවල	1	21.50	5,850	30.11.2020	බී. කේ. දයාරත්න
බුලත්සිංහල ශාඛාව 40, හොරණ පාර, අතුර, බුලත්සිංහල	1	55.52	6,900	30.11.2020	බී. කේ. දයාරත්න
දෙහිවල ශාඛාව 207, ගාලු පාර, දෙහිවල	1	22.00	12,454	30.11.2020	ඒ. ජී. ගුණරත්න
හොරණ ශාඛාව 87, අඟුරුවාතොට පාර, හොරණ	1	70.02	10,280	30.11.2020	බී. කේ. දයාරත්න
ඉඩම (මොරටුව) ශාඛාව 707, ගාලු පාර, මොරටුව	1	61.12	10,464	30.11.2020	ඒ. ජී. ගුණරත්න
කළුතර ශාඛාව 218, ගාලු පාර, කළුතර දකුණ, කළුතර	1	45.86	10,645	30.11.2020	බී. කේ. දයාරත්න
කොට්ටාව ශාඛාව (ඉඩම) 903, අවිසාවේල්ල පාර, කොට්ටාව	-	35.22	-	01.12.2018	ඒ. ජී. ගුණරත්න
මහරගම ශාඛාව සහ මධ්‍යම පුහුණු කිරීමේ මධ්‍යස්ථානය 88, හයිලෙවල් පාර, මහරගම	2	185.10	82,121	30.11.2020	ඒ. ජී. ගුණරත්න
මතුගම ශාඛාව 72, අගලවත්ත පාර, මතුගම	1	9.50	4,158	30.11.2020	ඒ. ජී. ගුණරත්න

තක්සේරු කිරීමේ පදනම	ඉඩමේ ප්‍රත්‍යාගණන අගය	ගොඩනැගිල්ලේ ප්‍රත්‍යාගණන අගය	එකතුව	සමුච්චිත ක්ෂය	ලියාහල අගය
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
ආයෝජන ක්‍රමය	21,699	22,500	44,199	2,109	42,090
	298,954	128,297	427,251	7,811	419,440
ආයෝජන හා කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	513,200	85,000	598,200	2,125	596,075
ආයෝජන හා කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	610,000	77,000	687,000	2,200	684,800
පිරිවැය හා ආදායම් ප්‍රවේශය	181,080	24,045	205,125	829	204,296
ක්ෂය ප්‍රතිස්ථාපන පිරිවැය ක්‍රමය	119,200	36,519	155,719	913	154,806
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	72,645	-	72,645	-	72,645
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	165,000	35,000	200,000	2,333	197,667
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	120,000	20,000	140,000	500	139,500
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	249,963	-	249,963	-	249,963
ක්ෂය ප්‍රතිස්ථාපන පිරිවැය ක්‍රමය	327,600	33,417	361,017	946	360,071
ක්ෂය ප්‍රතිස්ථාපන පිරිවැය ක්‍රමය	48,400	53,500	101,900	1,529	100,371
ආයෝජන හා කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	539,000	56,000	595,000	1,750	593,250
සන්සන්දනාත්මක ක්‍රමය	273,000	-	273,000	-	273,000
	3,219,088	420,481	3,639,569	13,125	3,626,444
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	80,520	24,262	104,782	606	104,176
ක්ෂය ප්‍රතිස්ථාපන පිරිවැය ක්‍රමය	-	218,800	218,800	10,940	207,860
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	64,500	12,112	76,612	303	76,309
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	80,790	13,900	94,690	356	94,334
පිරිවැය ප්‍රවේශය	154,000	57,800	211,800	1,651	210,149
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	260,600	31,834	292,434	791	291,643
පිරිවැය ක්‍රමය	244,480	14,475	258,955	1,447	257,508
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	177,440	34,051	211,491	851	210,640
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	219,772	-	219,772	-	219,772
පිරිවැය හා ආදායම් ප්‍රවේශය	658,463	208,043	866,506	11,097	855,409
පිරිවැය ප්‍රවේශය	47,500	4,260	51,760	608	51,152

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

පරිශ්‍රයේ නම	ගොඩනැගිලි ගණන	ඉඩමේ ප්‍රමාණය (පර්චස්)	ගොඩනැගිලි (වර්ග අඩි)	තක්සේරු කළ දිනය	තක්සේරුකරු
නුගේගොඩ ශාඛාව 174, හයිලෙවල් පාර, නුගේගොඩ	1	67.73	42,253	30.11.2020	ඒ. ජී. ගුණරත්න
පානදුර ශාඛාව 21, සුසන්ත මාවත, පානදුර	1	80.00	11,336	30.11.2020	කේ. ඩී. තිසේරා
පානදුර නගර ශාඛාව 17/3 ඩී, ජයතිලක මාවත, පානදුර	1	36.00	7,764	30.11.2020	ඒ. ජී. ගුණරත්න
වාද්දූව ශාඛාව (ඉඩම) 58 සහ 56, දුම්රියපොල පාර, වාද්දූව	-	29.00	-	30.11.2020	බී. කේ. දයාරත්න
වැල්ලවත්ත ශාඛාව 149/2, ගාලු පාර, කොළඹ 06	1	51.25	15,832	30.11.2020	ඒ. ජී. ගුණරත්න
නිවාඩු නිකේතන සහ විශ්‍රාම ශාලා					
බදුල්ල ෆර්න්හැම් බංගලාව සහ ඉඩම 153, ස්ප්‍රින් වැලි පාර, බදුල්ල	-	222.25	-	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
බණ්ඩාරවෙල නිවාඩු නිකේතනය බිඳුණු වැව, බණ්ඩාරවෙල	1	115.00	3,100	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
දික්ඔය අපර් ග්ලින්කර්න් බංගලාව මස්කෙළිය පාර, හැටන්	1	189.65	8,799	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
දික්ඔය ලෝවර් ග්ලින්කර්න් බංගලාව (ඉඩම) මස්කෙළිය පාර, හැටන්	-	100.00	-	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
හපුතලේ වුඩ්ලන්ඩ් බංගලාව වුඩ්ලන්ඩ් බංගලාව, හයපුතලේ	1	135.00	3,082	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
යාපනය බැංකු විශ්‍රාම ශාලාව 34/3, රාසවින්තොඩම් පාර, යාපනය	1	269.83	9,605	30.11.2020	කේ. ටී. ඩී. තිසේරා
මහනුවර නිවාඩු නිකේතනය 5/1B, විමලධර්ම මාවත, දංගොල්ල පාර, මහනුවර	1	39.00	3,840	30.11.2020	යූ. රාජපක්ෂ
ලිඳුල රිඩ්ජ් නිවාඩු නිකේතනය ටිලියොකල්ට්‍රි, තලවකැලේ	1	175.00	3,072	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
නුවරඑළිය නිවාඩු නිකේතනය 16, හිල් වීදිය, නුවරඑළිය	1	35.27	2,715	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
සී බෑන්ක් නුවරඑළිය නිවාඩු නිකේතනය (අදියර 1) 19, හිල් වීදිය, නුවරඑළිය	1	67.54	3,335	31.12.2020	ආර්. එච්. ජයවර්ධන
වෙනත්					
කොළඹ 7 - මහා කළමනාකාරතුමාගේ නිල නිවස 75, ආනන්ද කුමාරස්වාමී මාවත, කොළඹ 07	1	79.80	6,380	30.11.2020	ඒ. ජී. ගුණරත්න
කොළඹ ඩාර්ලි පාර ගබඩා 497, ටී බී ජයා මාවත, කොළඹ 02	1	151.00	26,209	30.11.2020	ඩබ්ලිව්. ඩී. පී. රූපානන්ද
කොළඹ ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය 08, 8-2/1, ලංකා බැංකු මාවත, කොළඹ 01	1	-	6,347	30.11.2020	කේ. ටී. ඩී. තිසේරා
බී. ඕ. සී. මර්චන්ට් ටවර් (පෙර වෝකර්ස් ඇන්ඩ් සන්ස්) 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03	-	57.00	-	30.11.2020	කේ. ටී. ඩී. තිසේරා
මුළු එකතුව					

තක්සේරු කිරීමේ පදනම	ඉඩමේ ප්‍රත්‍යාගණන අගය	ගොඩනැගිල්ලේ ප්‍රත්‍යාගණන අගය	එකතුව	සමුච්චිත ක්ෂය	ලියාහල අගය
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
පිරිවැය ප්‍රවේශය	677,300	448,265	1,125,565	12,083	1,113,482
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	360,000	26,870	386,870	1,258	385,612
පිරිවැය ප්‍රවේශය	63,000	69,643	132,643	1,741	130,902
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	58,000	-	58,000	-	58,000
පිරිවැය ප්‍රවේශය	530,000	48,176	578,176	2,536	575,640
	3,676,365	1,212,491	4,888,856	46,268	4,842,588
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	22,225	-	22,225	-	22,225
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	23,000	10,291	33,291	257	33,034
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	12,616	24,430	37,046	1,222	35,824
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	15,000	-	15,000	-	15,000
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	21,000	7,917	28,917	566	28,351
වෙළඳපල වටිනාකම	121,424	99,780	221,204	208	220,996
කොන්ත්‍රාත්කරුගේ මූලධර්ම හා සන්සන්දනාත්මක ක්‍රමය	31,200	13,500	44,700	337	44,363
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	8,750	9,090	17,840	364	17,476
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	85,750	7,126	92,876	238	92,638
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	168,850	12,121	180,971	303	180,668
	509,815	184,255	694,070	3,495	690,575
පිරිවැය ප්‍රවේශය	1,436,400	13,600	1,450,000	800	1,449,200
කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය	1,600,000	41,183	1,641,183	3,557	1,637,626
කුලී වටිනාකම් පදනම	-	374,906	374,906	9,375	365,531
සන්සන්දනාත්මක පදනම	600,000	-	600,000	-	600,000
	3,636,400	429,689	4,066,089	13,732	4,052,357
	19,911,607	4,608,143	24,519,750	139,966	24,379,784

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

35 භාවිත අයිතිය සහිත වත්කම්/ කල්බදු දේපළ

මූලික හඳුනාගැනීම සහ මිනුම්කරණය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පියවීමට ඇති කල්බදු වගකීම නියෝජනය වන පරිදි, අදාළ කල්බදු වත්කම හා කල්බදු වගකීම භාවිතා කිරීමට ඇති අයිතිය නිරූපනය වන ලෙස බදුකරු භාවිත අයිතිය සහිත වත්කමක් හඳුනාගැනීමට අවශ්‍යවේ.

බදුකරු විසින් වෙනත් මූල්‍ය නොවන වත්කම් (දේපළ, පිරියත සහ උපකරණ වැනි) හඳුනාගන්නා පරිදි භාවිත අයිතිය සහිත වත්කම් ද අනෙකුත් මූල්‍ය වගකීම් හඳුනාගන්නා පරිදි බදු වගකීම්ද මිනුම් කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස බදුකරු විසින් භාවිත අයිතිය සහිත වත්කම් ක්‍රමක්ෂය කිරීම සහ බදු වගකීමට පොළියද හඳුනා ගනී.

කල්බදු ක්‍රමයකින් පැහැ නහින වත්කම් හා වගකීම් වල මූලික මිනුම්කරණය සිදු කරනු ලබන්නේ වර්තමාන වටිනාකම පදනම් කරගෙනය. ආරම්භක අවස්ථාවේදී කල්බදු වත්කම බොහෝ අවස්ථාවන්හි කල්බදු වගකීමට සමාන වේ.

බදු ආරම්භයේදී, බදුකරු සංරචක දෙකක් සඳහා ගිණුම් තබයි:

(අ) භාවිත අයිතිය සහිත වත්කම්: ආරම්භයේදී, භාවිත අයිතිය සහිත වත්කම් මනිනු ලබන්නේ කල්බදු වගකීම් ප්‍රමාණය සහ ආරම්භක සෘජු පිරිවැයෙහි එකතුවයි. ඉන්පසුව ආරම්භක දිනට පෙර හෝ පසුව කරන ලද බදු ගෙවීම්, ලැබුණු කල්බදු දිරි දීමනා සහ ඉවත් කිරීමේ හා ප්‍රතිෂ්ඨාපන පිරිවැය යනාදිය ගැලපුම් කරයි.

(ආ) බදු වගකීම: ආරම්භක දිනයේදී නොගෙවන ලද කල්බදු වගකීම් සඳහා වූ සත්‍ය සියලුම ගෙවීම් කල්බදු පොළී අනුපාතය හෝ එය තීරණය කල නොහැකි නම් නව ණය ගැනීමේ අනුපාතය භාවිතා කරමින් වර්ථමාන වටිනාකමට වට්ටම් කර ඇත. මෙම ගෙවීම් තුළ ස්ථාවර ගෙවීම්, විචල්‍ය ගෙවීම්, අවශේෂ වටිනාකම් ඇපකර යටතේ ගෙවීම්, මිලදී ගැනීමේ විකල්පය ක්‍රියාත්මක වන්නේ නම් මිලදී ගැනීමේ මිල ඇතුළත් විය හැකිය.

පසුකාලීන මිනුම්කරණ පදනම

ආරම්භක දිනයට පසු, මුලින් හඳුනාගත් සංරචක දෙක සඳහාම බදුකරු විසින් ගැලපීම් සිදුකළ යුතුය. බදුකරු විසින් පොළිය පිළිබිඹු වන පරිදි බදු වගකීම ඉහළ නැංවීම හා වාරික ගෙවීම නිරූපනය වන පරිදි බදු වගකීම අඩු කිරීමද සිදු කරයි.

භාවිත අයිතිය සහිත වත්කම්

භාවිත අයිතිය සහිත වත්කම් ලං.ගි.ප්‍ර. 16 'දේපළ, පිරියත සහ උපකරණ' සඳහන් පරිදි පිරිවැය ක්‍රමයට හඳුනාගන්නා අතර සරල මාර්ග ක්‍රමයට බදු කාලසීමාව පුරා ක්ෂය කරයි. අදාළ ක්ෂය ප්‍රමාණය ලාභ හෝ අලාභයට ගැලපුම් කරයි.

බදු වගකීම

බදු වගකීම් සඳහා පොළියක් බදුකරු විසින් හඳුනාගත යුතු අතර කල්බදු ගෙවීම් කල්බදු වගකීම අඩු කිරීමක් ලෙස හඳුනා ගනී. කල්බදු වගකීම් සඳහා පොළිය ලාභයට හෝ අලාභයට ගලපනු ලැබේ.

ඇතැම් සිදුවීම් (උ. දා. කල්බදු කාල සීමාව වෙනස් කිරීම, දර්ශකයක් හෝ අනුපාතයක් මත පදනම්ව විචල්‍ය කුළි වෙනස් කිරීම) ඇති වූ විට බදුකරු විසින් බදු වගකීම නැවත මැනීම සිදුකළ යුතුය. එය සාමාන්‍යයෙන් භාවිත අයිතිය සහිත වත්කම් සඳහා වූ ගැලපීමක් ලෙස හඳුනා ගනී.

ලං.ගි.ප්‍ර. 16: "දේපළ, පිරියත උපකරණ" සහ ලං.ගි.ප්‍ර. 40: "ආයෝජන දේපළ" අනුව යම් යම් තත්ත්වයන් යටතේ භාවිත අයිතිය සහිත වත්කම් සඳහා පසුකාලීන විකල්ප මිනුම් පදනමක් බදුකරුට භාවිතා කල හැක. ලං.ගි.ප්‍ර. 36: "වත්කම් හානිකරණය" යටතේ භාවිත අයිතිය සහිත වත්කම් හානිකරණ පරීක්ෂාවට යටත් වේ.

භාවිත අයිතිය සහිත වත්කම් වල වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී බදු ගිවිසුමේ කාල සීමාව සලකා බැලීම බැංකුවේ ප්‍රතිපත්තිය වේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
භාවිත අයිතිය සහිත වත්කම් / කල්බදු දේපළ	7,710,364	6,211,376	5,605,695	4,441,823
අඩුකලා: සමුච්චිත ක්‍රමක්ෂය වීම්	4,572,409	3,002,497	2,779,976	1,798,137
භාවිත අයිතිය සහිත වත්කම්/ කල්බදු දේපළවල ශුද්ධ පොත් අගය	3,137,955	3,208,879	2,825,719	2,643,686

	බැංකුව		සමූහය	
	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
පිරිවැය				
ජනවාරි 1 දිනට ශේෂය	6,211,376	4,794,183	4,441,823	2,864,824
වර්ෂය තුළ එකතු කිරීම්	1,457,891	1,417,193	1,122,775	1,574,563
මාරු කිරීම්/ ගැළපුම්	41,097	-	41,097	2,436
දෙසැම්බර් 31 දිනට ශේෂය	7,710,364	6,211,376	5,605,695	4,441,823
සමුච්චිත ක්ෂය වීම්				
ජනවාරි 1 දිනට ශේෂය	3,002,497	1,314,246	1,798,137	677,202
වර්ෂය සඳහා ප්‍රතිපාදන	1,489,358	1,688,251	901,285	1,120,935
මාරු කිරීම්/ ගැළපුම්	80,554	-	80,554	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	4,572,409	3,002,497	2,779,976	1,798,137
ශුද්ධ පොත් අගය දෙසැම්බර් 31 දිනට	3,137,955	3,208,879	2,825,719	2,643,686

තම භාවිතය සඳහා ඇති ඉඩම් වලට ඇති කල්බදු අයිතිය කල්බදු දේපළ වලින් නිරූපනය වේ. බදු ඉඩම් වල පිහිටා ඇති ගොඩනැගිලිවල වටිනාකම දේපළ පිරියත සහ උපකරන යටතේ වෙන් වෙන් වශයෙන් දක්වා ඇත. කල්බදු ඉඩම් සඳහා වන අයිතිය පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර දක්වා ඇත.

35.1 බදු වගකීම්

වෙනත් වගකීම් (සටහන 47) යටතේ දක්වා ඇති කල්බදු වගකීම් වල ධාරණ අගය සහ වර්ෂය තුළ සංචලනය පහත පරිදි වේ.

	බැංකුව		සමූහය	
	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	3,145,009	3,038,363	1,993,416	1,147,303
එකතු කිරීම්	1,432,829	1,414,196	1,065,148	1,536,474
පොළී එකතු කිරීම	422,289	501,445	321,640	392,294
ගෙවීම්	(2,063,068)	(1,808,995)	(1,172,878)	(1,082,655)
මාරු කිරීම් / ගැලපුම්	25,819	-	25,819	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	2,962,878	3,145,009	2,233,145	1,993,416

35.1.1 කල්බදු වගකීම් පිළිබඳ කල්පිරීමේ විශ්ලේෂණය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
වසර 1 ට අඩු	1,126,640	563,893	849,158	357,415
අවුරුදු 1 සිට 5 දක්වා	1,007,120	1,787,997	759,074	1,133,295
අවුරුදු 5 කට වැඩි	829,118	793,119	624,913	502,706
මුළු කල්බදු වගකීම්	2,962,878	3,145,009	2,233,145	1,993,416

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

35.2 භාවිත අයිතිය සහිත වත්කම්/ කල්බදු වගකීම් ගණනය කිරීම සඳහා භාවිතා කරන සංවේදී සාධක

	සංවේදීතාව	භාවිත අයිතිය සහිත වත්කම් සඳහා සංවේදීතාවයේ බලපෑම	කල්බදු වගකීම් සඳහා සංවේදීතාවයේ බලපෑම	බදු පෙර ලාභය සඳහා සංවේදීතාවයේ බලපෑම
		රු. '000	රු. '000	රු. '000
වර්ධනාත්මක ණය ගැනීමේ අනුපාතය	+1%	(66,614)	(55,251)	450
	-1%	70,125	57,828	(234)
බදු කාලය	වසරකින් වැඩි කිරීම	2,129,978	2,300,293	(425,502)

36 අස්පෘශ්‍ය වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

හඳුනාගැනීම

සමූහය තුළට අනාගත ආර්ථික ප්‍රතිලාභයන් වත්කම් තුළින් ගලා ඒම පිළිබඳව භව්‍යතාවයක් ඇත්නම් සහ වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි විටක අස්පෘශ්‍ය වත්කම් හඳුනා ගනී. අස්පෘශ්‍ය වත්කම් පළමුව පිරිවැයට ගිණුම් තබයි.

පරිගණක උපකරණයන්හි මෙහෙයුම් මෘදුකාංග හැර අනෙකුත් පරිගණක යෙදවුම් මෘදුකාංග සහ බලපත්‍රවල වටිනාකම අස්පෘශ්‍ය වත්කම් වලින් නිරූපණය වේ.

මිණුම්කරණ පදනම

සමූහය විසින් අත්පත් කරගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම් හි අගය එහි පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂයවීම සහ හානිකරණයන් අඩුකර දක්වා ඇත. මූලික හඳුනා ගැනීමෙන් පසුව අස්පෘශ්‍ය වත්කම් උදෙසා දරනු ලබන පිරිවැය මඟින් ඒ හා බැඳි අනාගත ආර්ථික ලාභයන්හි වැඩිවීමක් වේ නම් පමණක් එම පිරිවැය ප්‍රාග්ධනීකරණය කරන අතර නොඑසේ නම් එය වියදමක් ලෙස ගිණුම්ගත කරනු ඇත.

ක්‍රමක්ෂය වීම් සහ හානිකරණය

ක්‍රමක්ෂය කිරීම සරල මාර්ග ක්‍රමය යටතේ එහි අපේක්ෂිත ඵලදායී ආයුකාලය තුළ විහිදී යන ආකාරයට හඳුනා ගැනේ. අස්පෘශ්‍ය වත්කම්වල අපේක්ෂිත ඵලදායී ආයුකාලය වනුයේ වසර පහක් හෝ එහි යෝග්‍යතම අපේක්ෂිත ආයුකාලය යන දෙකින් අඩු කාලයයි. හානිකරණය පිළිබඳව සංඥාවක් ඇති සෑම විටකදීම නිශ්චිත ආයු කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම්වල අගයන් හානිකරණය සඳහා සලකා බලන අතර එය අනාගත ප්‍රතිලාභයක් මඟින් පියවාගත නොහැකි බව තහවුරු වන ප්‍රමාණයට ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනී. ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය, ඵලදායී ආයුකාලය සහ සුන්බුන් අගය සෑම මූල්‍ය වසරක් අවසානයේදීම සමාලෝචනය කර යම් ගැලපීමක් අවශ්‍ය වේ නම් සිදු කරනු ලැබේ.

බැහැර කිරීම්

අස්පෘශ්‍ය වත්කම් මඟින් අනාගත ප්‍රතිලාභයන් ජනනය නොවන බව පැහැදිලි වන විට සහ ධාරණ අගය හානිකරණයට ලක්ව ඇති බව තහවුරු වන විට එම වත්කම් පොත්වලින් බැහැර කෙරේ.

බැහැර කිරීම් මඟින් වන ලාභ හෝ අලාභ වනුයේ අස්පෘශ්‍ය වත්කම්හි ධාරණ අගය සහ ශුද්ධ විකුණුම් අගය යන දෙකෙහි අන්තරයයි. එය ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි ඇතුළත් කෙරේ.

	බැංකුව		සමූහය	
	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
පිරිවැය				
ජනවාරි 1 දිනට ශේෂය	4,027,760	3,660,565	4,660,802	4,256,858
වර්ෂය තුළ එකතු කිරීම්	471,365	367,195	471,365	401,078
වර්ෂය තුළදී බැහැර කිරීම්	(16)	-	(16)	(293)
විනිමය අනුපාත ගැලපුම්	-	-	15,664	13,878
ගැලපුම්/පැවරුම්	-	-	-	(10,719)
දෙසැම්බර් 31 දිනට ශේෂය	4,499,109	4,027,760	5,147,815	4,660,802
සමුච්චිත ක්ෂය වීම්				
ජනවාරි 1 දිනට ශේෂය	3,050,251	2,571,103	3,475,577	2,932,545
වර්ෂය සඳහා ක්‍රමක්ෂය	482,935	479,148	518,867	531,323
වර්ෂය තුළදී බැහැර කිරීම්	(16)	-	(16)	-
විනිමය අනුපාත ගැලපුම්	-	-	12,842	11,709
දෙසැම්බර් 31 දිනට ශේෂය	3,533,170	3,050,251	4,007,270	3,475,577
සංවර්ධන අදියරේ පවතින පරිගණක මෘදුකාංග	74,046	43,372	74,046	43,372
දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	1,039,985	1,020,881	1,214,591	1,228,597

36.1 සම්පූර්ණයෙන්ම ක්‍රමක්ෂය වූ අස්පෘෂ්‍ය වත්කම්

සම්පූර්ණයෙන්ම ක්‍රමක්ෂය වූ එහෙත් තවමත් භාවිතයේ පවත්නා අස්පෘෂ්‍ය වත්කම්හි මූලික පිරිවැය පහත පරිදි වේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
පරිගණක මෘදුකාංග	2,084,744	1,851,374	2,192,822	1,958,249
සම්පූර්ණයෙන්ම ක්‍රමක්ෂය වූ අස්පෘෂ්‍ය වත්කම් වල එකතුව	2,084,744	1,851,374	2,192,822	1,958,249

37 විලම්බිත බදු (වත්කම්)/වගකීම්

වත්කම් සහ වගකීම්වල මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වනු ලබන ධාරණ අගය සහ ඒවා බදු පදනම උදෙසා දක්වනු ලබන අගය අතර තාවකාලික වෙනස්කම් පවතිනවිට, එම වෙනසට අදාළව විලම්බිත බදු ගණනය කරනු ලැබේ. පහත සඳහන් වන තාවකාලික වෙනස්කම් මත විලම්බිත බදු හඳුනා නොගනී.

- මුල් හඳුනාගැනීමේ දී ඇතිවන කීර්තිනාමය
- ගිණුම්කරණ හා බදු ලාභ කෙරෙහි බලපෑමක් නොමැති ව්‍යාපාර ඒකාබද්ධකරණයේ දී හැර වෙනත් ගනුදෙනුවකින් හඳුනා ගැනෙන වත්කම් හෝ වගකීම්
- නුදුරු අනාගතයේ දී ප්‍රතිවර්තනය නොවන බවට තහවුරු වන, පරිපාලිත සමාගම් හි සිදු කර ඇති ආයෝජනයන්හි සිදු වන වෙනස්කම්

විලම්බිත බදු ගණනයේ දී වාර්තාකරණ දිනට බලපැවැත්වෙන බදු නීතිය අනුව ප්‍රකාශිත අනුපාතය භාවිතා කෙරෙන අතර, තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය කිරීම සඳහා ද එම අනුපාතය ම භාවිතා කෙරේ. ප්‍රවර්තන බදු වගකීම් ප්‍රවර්තන බදු වත්කමකට එරෙහිව කපා හැරීමට නෛතිකමය අවසරය සහ අයිතිය පවතින විටක පමණක් ඊට අනුරූපි වන විලම්බිත බදු වගකීම් සහ වත්කම් එකිනෙක හිලව් කරනු ඇත. තව දුරටත් එම ප්‍රවර්තන බදු වගකීම සහ වත්කම එකම ආයතනයකට අදාළව හෝ බදු වගකීම සහ වත්කම හිලව් කර පියවීමට අදහස් කරන වෙන් වශයෙන් වූ ආයතනයන්ට අදාළව හෝ එකම බදු අධිකාරියක් විසින් ආදායම් මත පනවනු ලැබුවක් විය යුතුය.

අනාගතයේ දී බදු ලාභයක් මඟින් පියවා ගත හැකි බවට විශ්වාසනීයත්වයක් ඇති විට පමණක් එම අපේක්ෂිත බදු ලාභයේ ප්‍රමාණය තෙක් භාවිතා නොකළ බදු අලාභයක්, බදු බැර අගයන් සහ අඩුකළ නොහැකි තාවකාලික වෙනස්කම් මත ප්‍රවර්තන බදු වත්කම හඳුනා ගනී. සෑම වාර්තාකරණ දිනයකදීම විලම්බිත බදු වත්කම විශ්ලේෂණයකට ලක් කර එය අනාගතයේ දී බදු ප්‍රතිලාභයක් ලෙස නිෂ්කාශනය නොවන බව හැඟීයන ප්‍රමාණය විලම්බිත බදු වත්කමට ගලපනු ලැබේ.

පහත වගුව මඟින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සහ ආදායම් බදු වියදම් (සටහන 18.2) යටතේ ප්‍රතිපාදන/(ප්‍රතිවර්තය කිරීම්) ලෙස වාර්තා කර ඇති විලම්බිත බදු පෙන්නුම් කරයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

37.1 බැංකුව

දෙසැම්බර් 31 දිනට	2021				2020			
	විලම්බිත බදු වත්කම්	විලම්බිත බදු වගකීම්	ලාභ හෝ අලාභ ප්‍රකාශනය	වෙනත් විස්තීර්ණ ආදායම/ ස්කන්ධය	විලම්බිත බදු වත්කම්	විලම්බිත බදු වගකීම්	ලාභ හෝ අලාභ ප්‍රකාශනය	වෙනත් විස්තීර්ණ ආදායම/ ස්කන්ධය
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
විශ්‍රාම ප්‍රතිලාභ	1,287,358	-	300,760	(2,024,826)	-	3,011,424	(99,623)	3,007,330
දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම	(5,413,844)	-	2,879	979,181	-	(6,395,904)	19,571	(1,941,235)
මූල්‍ය උපකරණයන්හි ආයෝජන	(289,677)	-	-	361,867	-	(651,544)	-	(111,635)
හානිකරණය සඳහා වෙන්කිරීම්වල තාවකාලික වෙනස්කම්	7,185,087	-	2,466,153	-	-	4,718,934	1,132,948	-
වෙනත් තාවකාලික වෙනස්කම්	(616,212)	-	990,160	-	-	(1,606,372)	1,661,203	-
එකතුව	2,152,712	-	3,759,952	(683,778)	-	(923,462)	2,714,099	954,460

37.1 සමූහය

දෙසැම්බර් 31 දිනට	2021				2020			
	විලම්බිත බදු වත්කම්	විලම්බිත බදු වගකීම්	ලාභ හෝ අලාභ ප්‍රකාශනය	වෙනත් විස්තීර්ණ ආදායම/ ස්කන්ධය	විලම්බිත බදු වත්කම්	විලම්බිත බදු වගකීම්	ලාභ හෝ අලාභ ප්‍රකාශනය	වෙනත් විස්තීර්ණ ආදායම/ ස්කන්ධය
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
විශ්‍රාම ප්‍රතිලාභ	1,287,358	86,874	307,175	(2,040,425)	84,457	3,023,025	(102,984)	3,020,118
දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම	(5,413,844)	(1,944,383)	170,536	1,144,315	(62,380)	(8,610,698)	982,204	(2,176,773)
මූල්‍ය උපකරණයන්හි ආයෝජන	(289,677)	-		361,867	-	(651,544)	-	(111,635)
හානිකරණය සඳහා වෙන්කිරීම්වල තාවකාලික වෙනස්කම්	7,185,087	1,411	2,345,268	-	122,296	4,718,934	1,233,730	-
වෙනත් තාවකාලික වෙනස්කම්	(555,077)	(297,211)	1,000,726	-	(67,500)	(1,785,514)	597,346	-
එකතුව	2,213,847	(2,153,309)	3,823,705	(534,243)	76,873	(3,305,797)	2,710,296	731,710

38 වෙනත් වත්කම්

කලින් ගෙවූ සේවක පිරිවැය

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" අනුව සේවක ණය සාධාරණ අගයට මූලිකව හඳුනා ගනී. මෙහිදී සාධාරණ අගය හා දුන් ණය මුදල අතර වෙනස කලින් ගෙවූ සේවක පිරිවැය ලෙස හඳුනා ගන්නා අතර එය ණය මුදලේ පීවිත කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලබයි.

අතැති රන් තොගය

රන් තොග පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වඩා අඩු අගයට තක්සේරු කරනු ලැබේ. ගැනුම් පිරිවැය, පරිවර්තන පිරිවැය සහ තොග වර්තමාන ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒමට දැරූ අනෙකුත් පිරිවැය රන් තොගවල පිරිවැය තුළ අඩංගු වේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල ඇස්තමේන්තුගත විකුණුම් මිලෙන් විකිණීම සඳහා සුදානම් කිරීමට ඇස්තමේන්තු කල වියදම් අඩු කල පසු අගයයි.

සේවක ප්‍රතිලාභ වත්කම්

ලංකා බැංකුවේ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම අරමුදලේ සහ 2014 ලංකා බැංකු විශ්‍රාම වැටුප් අරමුදලෙහි ශුද්ධ ප්‍රතිලාභ වත්කම් වලින් සේවක ප්‍රතිලාභ වත්කම් නියෝජනය කරයි. වැඩිදුර විස්තර සටහන් 48 "සේවක විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්" මඟින් දක්වා ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
අතැති පරිභෝජන තොගය	754,191	686,401	794,572	703,968
කලින් ගෙවූ සේවක පිරිවැය	16,867,864	15,128,454	16,867,864	15,128,454
මාර්ගස්ථ චෙක්පත් - දේශීය	1,185,645	1,053,547	1,185,645	1,053,547
මාර්ගස්ථ චෙක්පත් - විදේශීය	4,001	7,550	4,001	7,550
ආපසු ලැබිය යුතු ආදායම් බදු [සටහන 45]	-	-	-	10,388
අතැති රන් සංචිත හා රන් කාසි	71,033	47,495	71,033	47,495
ශුද්ධ සේවක ප්‍රතිලාභ වත්කම් [සටහන 48]	17,270,991	13,318,122	17,270,991	13,318,122
වෙනත්	25,734,861	20,051,430	27,068,200	20,919,953
මුළු වෙනත් වත්කම්	61,888,586	50,292,999	63,262,306	51,189,477

39 බැංකුවලට ගෙවිය යුතු

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

නොස්ට්‍රෝ ගිණුම්වල බැර ශේෂයන් සහ බැංකුවලින් ලබා ගත් ණයවල බැර ශේෂයන් බැංකුවලට ගෙවිය යුතු ශේෂයන් නියෝජනය කරයි. මේවා මූලිකවම සාධාරණ අගයට හඳුනා ගනී. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, සවල පොළී අනුපාත පදනම මත ක්‍රමක්ෂය පිරිවැයට මිනුම් කරනු ලැබේ. සවල පොළී අනුපාතිකයෙහි සංකලිත කොටසක් වශයෙන් ගනුදෙනු පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. සවල පොළී අනුපාත ක්‍රමක්ෂය ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි "පොළී වියදම" (සටහන 8.2) යටතේ ඇතුළත් වේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
වෙනත් බැංකුවලට අයිති තැන්පතු	2,077,897	1,963,629	2,077,897	1,963,629
බැංකු අයිරා	15,858,173	438,414	16,568,442	664,805
බැංකුවලට ගෙවිය යුතු අයිතමයන්හි එකතුව	17,936,070	2,402,043	18,646,339	2,628,434

40 ප්‍රතිමිලට ගැණුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමූහය වෙත ප්‍රමාණාත්මක සහ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභයන් රඳවා ගනිමින්, නිශ්චිත අනාගත දිනයක දී ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුමක් මත විකුණනු ලබන සුරැකුම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් බැහැර කරනු නොලැබේ. මෙම ගනුදෙනු මත ලද මුදල් ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ආපසු ලබාදීමට අනුරූප වගකීමක් සහිත වත්කමක් ලෙස හඳුනාගනු ලබන අතර, එය ගනුදෙනුවේ ආර්ථිකමය යථා ස්භාවය මත වගකීම උපචිත පොලිය ද සහිතව සමූහයේ ණය වගකීමක් ලෙස විදහා දැක්වේ. විකුණුම් සහ ප්‍රතිමිලදී ගැණුම් මිල අතර අන්තරය පොළී වියදම ලෙස සලකන අතර, ප්‍රතිවිකුණුම් ගිවිසුමේ ආයු කාලය තුළ එය ක්‍රමක්ෂය වන පරිදි සවල පොළී අනුපාතිකය යටතේ ගිණුම් ගත කෙරේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
බැංකු සමඟ	104,006,820	10,559,996	103,518,742	10,486,173
වෙනත් ගනුදෙනුකරුවන් සමඟ	58,149,593	46,546,656	58,149,593	47,211,607
මුළු ප්‍රතිමිලට ගැණුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	162,156,413	57,106,652	161,668,335	57,697,780

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

41 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ශ්‍රී ලං.මු.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" අනුව හෙජින් හිවිසුම් යටතේ හෙජින් උපකරණ ලෙස හඳුනා නොගන්නා බැංකුව ඇති කර ගන්නා හිවිසුම්වලින් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සමන්විත වේ.

ව්‍යුත්පන්න උපකරණ සාධාරණ අගයට වාර්තා කරනු ලබන අතර, ඒවායේ සාධාරණ අගය ඍණ අගයක් ගන්නා විට වගකීමක් ලෙස වාර්තා කරනු ලබයි. ව්‍යුත්පන්න උපකරණවල සාධාරණ අගයේ වෙනස් වීම "වෙළඳපොළ ගනුදෙනු වලින් ලද ශුද්ධ ලාභ/ (පාඩු)" (සටහන් 10) ඇතුළත් වේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
විදේශීය මුදල් ව්‍යුත්පන්න				
ඉදිරි විනිමය හිවිසුම්	17,297	16,192	17,297	16,192
මුදල් හුවමාරු හිවිසුම්	363,031	85,990	363,031	85,990
මුළු ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	380,328	102,182	380,328	102,182

42 ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මූලිකවම සාධාරණ අගයට හඳුනා ගන්නා පොළී රහිත තැන්පතු, ඉතුරුම් තැන්පතු, කාලීන තැන්පතු, ඉල්ලූ විට ගෙවිය යුතු තැන්පතු සහ තැන්පතු සහතිකවලින් ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු ශේෂය සමන්විත වේ. සමූහය විසින් ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ වගකීම් හැර, සඵල පොළී අනුපාත පදනම යටතේ තැන්පතු ක්‍රමක්ෂය පිරිවැයට මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව හඳුනා ගනී. සඵල පොළී වියදම ක්‍රමක්ෂය ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි "පොළී වියදම" (සටහන 8.2) යටතේ ඇතුළත් වේ.

42.1 තැන්පතු වර්ගය අනුව

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
දේශීය මුදල් තැන්පතු				
ජංගම ගිණුම් තැන්පතු	177,165,938	137,045,468	176,742,512	136,886,276
ඉතුරුම් තැන්පතු	680,053,160	582,379,867	680,964,033	583,280,576
කාලීන තැන්පතු	1,388,690,770	1,195,753,018	1,405,966,371	1,212,137,999
වෙනත් තැන්පතු	7,824,661	4,019,586	7,832,191	4,024,106
මුළු දේශීය මුදල් තැන්පතු	2,253,734,529	1,919,197,939	2,271,505,107	1,936,328,957
විදේශීය මුදල් තැන්පතු				
ජංගම ගිණුම් තැන්පතු	34,897,193	28,108,479	35,562,840	28,716,661
ඉතුරුම් තැන්පතු	130,077,505	110,117,781	130,843,659	110,573,639
කාලීන තැන්පතු	446,734,788	416,595,373	446,875,493	416,735,118
වෙනත් තැන්පතු	1,449,995	755,916	1,449,995	755,916
මුළු විදේශීය මුදල් තැන්පතු	613,159,481	555,577,549	614,731,987	556,781,334
මුළු තැන්පතු	2,866,894,010	2,474,775,488	2,886,237,094	2,493,110,291

42.2 මුදල් වීකකය අනුව

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ශ්‍රී ලංකා රුපියල් (LKR)	2,253,734,529	1,919,197,939	2,271,505,107	1,936,328,957
ඇමරිකානු ඩොලර් (USD)	533,281,802	480,475,765	533,290,823	480,487,512
බ්‍රිතාන්‍ය පවුම් (GBP)	37,483,358	36,379,798	39,038,355	37,563,665
මාලදිවයින් රුෆියා (MVR)	10,312,812	9,175,711	10,312,812	9,175,711
සීෂෙල්ස් රුපියල් (SCR)	1,618,658	1,116,521	1,618,658	1,116,521
යුරෝ (EUR)	10,924,104	9,284,862	10,932,592	9,293,033
ඕස්ට්‍රේලියානු ඩොලර් (AUD)	8,704,561	9,067,676	8,704,561	9,067,676
ඉන්දියානු රුපියල් (INR)	5,746,469	5,188,852	5,746,469	5,188,852
වෙනත් මුදල්	5,087,717	4,888,364	5,087,717	4,888,364
මුළු තැන්පතු	2,866,894,010	2,474,775,488	2,886,237,094	2,493,110,291

සටහන: තැන්පතුවල කල්පිරීමේ විශ්ලේෂණය සටහන් අංක 60 මඟින් දක්වා ඇත.

43 ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

නිත්‍ය ණය පහසුකම්, දේශීය හා විදේශීය බැංකුවලින් හා වෙනත් මූල්‍ය ආයතනවලින් ලබා ගත් කාලීන ණය සහ ප්‍රතිමූල්‍ය ණය වලින් වෙනත් ණය ගැනීම් සමන්විත වේ. මූලික හඳුනා ගැනීමේදී වෙනත් ණය ගැනීම් සාධාරණ අගයට පොත්වල හඳුනා ගන්නා අතර පසුව සඵල පොළී අනුපාතික ක්‍රමය (EIR) යොදා ගනිමින් ක්‍රමක්ෂය පදනමට හඳුනා ගනු ලැබේ. ක්‍රමක්ෂය අගය ගණනය කිරීමේ දී මූල්‍ය උපකරණයට අදාළ අධි මිල, වට්ටම් සහ ගනුදෙනු පිරිවැය මෙහි සඵල පොළී අනුපාතිකය තුළ ඇතුළත් වේ. සඵල පොළී අනුපාතිකය යටතේ ගණනය කරන ලද වියදම, "පොළී වියදම" (සටහන 8.2) තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි දක්වා ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ස්ථාවර ණය දීමේ පහසුකම	251,974,541	-	251,974,541	-
ශ්‍රී ලංකාවේ බැංකු හා වෙනත් මූල්‍ය ආයතන වලින් ගත් කෙටිකාලීන ණය	32,405,282	15,001,869	35,543,284	18,431,963
විදේශීය බැංකුවලින් ගත් කාලීන ණය	117,752,893	116,583,345	118,423,817	117,159,397
ශ්‍රී ලංකාවේ බැංකු හා වෙනත් මූල්‍ය ආයතන වලින් ගත් කාලීන ණය	21,346,016	24,617,993	21,304,115	24,829,775
ප්‍රතිමූල්‍ය ණය	20,629,245	24,680,920	20,629,245	24,680,920
මුළු වෙනත් ණය ගැනීම්	444,107,977	180,884,127	447,875,002	185,102,055

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

44 නිකුත් කළ ණය සුරැකුම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

දිගු කාලීන අරමුදල් අවශ්‍යතා සඳහා ලබා ගන්නා ලද ණය, නිකුත් කළ ණය සුරැකුම් යටතේ දැක්වේ. මෙම ණය ගිණුම්වලට අනුව අදාළ ණය උපකරණයන්ගේ වටිනාකමට සරිලන ලෙස මුදල් වෙනත් වත්කමක් හෝ තම ස්කන්ධ කොටස් ප්‍රමාණයක් අදාළ පාර්ශ්වයන් වෙත ගෙවීමේ වගකීමට සමූහය බැඳී සිටී. නිකුත් කළ ණය සුරැකුම් මූලිකව සාධාරණ අගයට පොත්වල හඳුනා ගන්නා අතර, පසුව සඵල පොළී අනුපාතික ක්‍රමය (EIR) යොදා ගනිමින් ක්‍රමක්ෂය පදනමට හඳුනා ගනු ලැබේ. ක්‍රමක්ෂය අගය ගණනය කිරීමේ දී මූල්‍ය උපකරණයට අදාළ අධි මිල, වට්ටම් සහ ගනුදෙනු පිරිවැය මෙම සඵල පොළී අනුපාතිකය තුළ ඇතුළත් වේ. සඵල පොළී අනුපාතිකය යටතේ ගණනය කරන ලද වියදම, "පොළී වියදම" (සටහන 8.2) තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි දක්වා ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
පරිණත ණයකර [සටහන 44.1]	-	-	2,107,182	2,107,493
මුළු නිකුත් කළ ණය සුරැකුම්	-	-	2,107,182	2,107,493

සටහන: ණය සුරැකුම්වල කල්පිරීමේ විශ්ලේෂණය සටහන් අංක 60 මඟින් දක්වා ඇත.

44.1 පරිණත ණයකර

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ලැයිස්තුගත ණයකර				
සුරැකුම් රහිත, නිදහස් කළ හැකි ණයකර, එකක් රු. 100/-	-	-	2,107,182	2,107,493
මුළු නිකුත් කළ ණය සුරැකුම්	-	-	2,107,182	2,107,493

44.2 පරිණත ණයකරවල සංචලනය

	බැංකුව		සමූහය	
	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	-	-	2,107,493	2,107,810
වර්ෂය තුළදී නිකුත් කිරීම්	-	-	-	-
නිදහස් කිරීම්	-	-	-	-
ක්‍රමක්ෂය ගැලපුම්	-	-	(311)	(317)
දෙසැම්බර් 31 දිනට ශේෂය	-	-	2,107,182	2,107,493

44.3 පරිණත ණයකර වර්ග

	සටහන්	පොළිය ගෙවිය යුතු වාර ගණන	නිකුත් කළ දිනය	පරිණත වන දිනය	කූපන් අනුපාතය 2021 %	කූපන් අනුපාතය 2020 %	දෙසැම්බර් 31 දිනට අගය බැංකුව 2021 රු. '000	බැංකුව 2020 රු. '000	සමූහය 2021 රු. '000	සමූහය 2020 රු. '000
ස්ථාවර පොළී අනුපාත										
සුරැකුම් රහිත, නිදහස් කළ හැකි ණයකර	(අ)	වාර්ෂික	12.05.2017	03.05.2022	15.00	15.00	-	-	884,668	884,981
සුරැකුම් රහිත, නිදහස් කළ හැකි ණයකර	(අ)	අර්ධ වාර්ෂික	12.05.2017	03.05.2022	14.50	14.50	-	-	1,221,480	1,221,477
සුරැකුම් රහිත, නිදහස් කළ හැකි ණයකර	(අ)	අර්ධ වාර්ෂික	12.05.2017	03.05.2022	13.89	13.89	-	-	1,034	1,035
මුළු නිකුත් කළ ණය සුරැකුම්							-	-	2,107,182	2,107,493

සටහන: (අ) කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත ණයකර වේ.

45 ප්‍රවර්තන බදු වගකීම්/ (වත්කම්)

	බැංකුව 2021 රු. '000	බැංකුව 2020 රු. '000	සමූහය 2021 රු. '000	සමූහය 2020 රු. '000
ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය	591,723	(1,172,018)	764,871	(1,043,712)
ප්‍රවර්තන බදු වියදම	9,359,362	8,500,848	9,777,364	8,649,043
වර්ෂය තුළදී සිදු කළ ගෙවීම්	(8,166,811)	(5,158,415)	(8,399,520)	(5,361,254)
ද්විත්ව බදු සහන බදු බැර	(1,213,722)	(1,090,736)	(1,213,722)	(1,142,142)
ගැලපුම්	77,441	(487,956)	49,539	(337,064)
දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	647,993	591,723	978,532	764,871
ප්‍රවර්ථන බදු වත්කම්	-	-	-	(10,388)
ප්‍රවර්ථන බදු වගකීම්	647,993	591,723	978,532	775,259
ප්‍රවර්තන බදු වගකීම්/ (වත්කම්)	647,993	591,723	978,532	764,871

46 රක්ෂණ ප්‍රතිපාදන

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ජීවිත රක්ෂණ ගිවිසුම් මත වන වගකීම්

2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත නියාමන පනත මඟින් විස්තර කරනු ලබන, දළ වාරික තක්සේරු ක්‍රමය භාවිතයෙන් මෙම වගකීම් මිනුම්කරණය කරනු ලැබේ. අනාගත අපේක්ෂිත ප්‍රතිලාභයන්, හිමිකම් පෑමේ හා ඔප්පු කළමනාකරණයන්හි වියදම්, ඔප්පු හිමියන්ගේ විකල්ප අවස්ථා සහ ඇපවීම් යන වටිනාකම්හි වට්ටම් කළ අගයෙන් අනාගත මුදල් ප්‍රවාහයන්ගේ පිටතට ගලායාම් පියවීම සඳහා අවශ්‍ය වන අපේක්ෂිත සෛද්ධාන්තික වාරිකයන් හි වට්ටම් කළ අගය අඩුකළ පසු ලැබෙන ශේෂය වගකීම ලෙස සැලකේ. වගකීම් වාර්තා කිරීමේ දී වර්තමානයේ වන උපකල්පනයන් හෝ ගිවිසුම ආරම්භයේ දී වූ උපකල්පනයන් යොදා ගැනෙන අතර, අවදානම හෝ හානිකරණ අපගමනයන් උදෙසා යම් ගැලපීමක් කෙරේ.

ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	380,328	-	380,328	380,328	-	380,328
ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	2,789,073,317	77,820,693	2,866,894,010	2,803,243,073	82,994,021	2,886,237,094
ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම්	397,947,404	46,160,573	444,107,977	401,229,613	46,645,389	447,875,002
නිකුත් කළ ණය සුරැකුම් පත්	-	-	-	-	2,107,182	2,107,182
ප්‍රවර්තන බදු වගකීම්	647,993	-	647,993	978,532	-	978,532
විලම්බිත බදු වගකීම්	-	-	-	-	2,153,309	2,153,309
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත	-	-	-	-	413,743	413,743
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත නොවන	-	-	-	-	526,017	526,017
වෙනත් වගකීම්	23,834,644	22,207,721	46,042,365	23,831,718	23,629,409	47,461,127
යටත් කාලීන වගකීම්	8,103,950	56,254,905	64,358,855	8,103,950	56,002,020	64,105,970
ස්කන්ධය	3,827,693	196,932,139	200,759,832	4,722,678	210,674,100	215,396,778
මුළු වගකීම් සහ ස්කන්ධය	3,403,907,812	399,376,031	3,803,283,843	3,422,804,566	425,145,190	3,847,949,756
ප්‍රතිශතය (%)	89.5%	10.5%	100.0%	89.0%	11.0%	100.0%
ශුද්ධ පරතරය	(1,791,393,892)	1,791,393,892	-	(1,792,552,541)	1,792,552,541	-

ගිවිසුම්ගත කල් පිරෙන දිනය දක්වා ඉතිරි කාලය පදනම් කොටගෙන බැංකුවේ හා සමූහයේ වත්කම් සහ වගකීම් පහත දැක්වෙන වගුව අනුව 2020 දෙසැම්බර් 31 දිනට අදාළ කල් පිරීමේ බණ්ඩයන් යටතේ විශ්ලේෂණය කෙරේ.

	බැංකුව			සමූහය		
2020 දෙසැම්බර් 31 දිනට	මාස 12 ක් ඇතුළත	මාස 12 න් පසු	එකතුව	මාස 12 ක් ඇතුළත	මාස 12 න් පසු	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
වත්කම්						
මුදල් සහ මුදල් හා සමාන දෑ	84,416,624	-	84,416,624	83,198,445	-	83,198,445
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	33,351,852	-	33,351,852	33,351,852	-	33,351,852
බැංකුවල ඇති තැන්පතු	23,206,238	4,409,613	27,615,851	23,504,356	4,409,613	27,913,969
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	2,001,047	-	2,001,047	3,822,312	-	3,822,312
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	548,926	-	548,926	548,926	-	548,926
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	3,623,677	6,232,543	9,856,220	3,880,933	6,988,538	10,869,471
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම්	752,291,850	1,236,117,157	1,988,409,007	764,748,538	1,253,645,192	2,018,393,730
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය උපකරණ	222,027,694	502,362,478	724,390,172	222,085,106	503,494,479	725,579,585
වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	2,315,503	13,046,977	15,362,480	3,585,441	14,328,337	17,913,778
පරිපාලිත සමාගම්වල ආයෝජන	-	6,513,048	6,513,048	-	-	-
ආශ්‍රිත සමාගම්වල ආයෝජන	-	92,988	92,988	-	510,084	510,084
ආයෝජන දේපළ	-	2,534,118	2,534,118	-	114,370	114,370
දේපළ, පිරියත හා උපකරණ	-	33,366,003	33,366,003	-	47,418,620	47,418,620
නාවිතා අයිතිය සහිත වත්කම්/කල්බදු දේපළ	-	3,208,879	3,208,879	-	2,643,686	2,643,686
අස්පෘශ්‍ය වත්කම්	-	1,020,881	1,020,881	-	1,228,597	1,228,597
විලම්බිත බදු වත්කම්	-	-	-	-	76,873	76,873
වෙනත් වත්කම්	23,321,873	26,971,126	50,292,999	23,934,190	27,255,287	51,189,477
මුළු වත්කම්	1,147,105,284	1,835,875,811	2,982,981,095	1,162,660,099	1,862,113,676	3,024,773,775
ප්‍රතිශතය (%)	38.5%	61.5%	100.0%	38.4%	61.6%	100.0%

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	බැංකුව			සමූහය		
2020 දෙසැම්බර් 31 දිනට	මාස 12 ක් ඇතුළත	මාස 12 න් පසු	එකතුව	මාස 12 ක් ඇතුළත	මාස 12 න් පසු	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
වගකීම්						
බැංකු වලට ගෙවිය යුතු	2,402,043	-	2,402,043	2,628,434	-	2,628,434
ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	57,106,652	-	57,106,652	57,697,780	-	57,697,780
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	102,182	-	102,182	102,182	-	102,182
ක්‍රමක්ෂය අඟයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	2,413,251,265	61,524,223	2,474,775,488	2,425,421,782	67,688,509	2,493,110,291
ක්‍රමක්ෂය අඟයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම්	180,884,127	-	180,884,127	183,502,564	1,599,491	185,102,055
නිකුත් කළ ණය සුරැකුම් පත්	-	-	-	-	2,107,493	2,107,493
ප්‍රවර්තන බදු වගකීම්	591,723	-	591,723	775,259	-	775,259
විලම්බිත බදු වගකීම්	-	923,462	923,462	-	3,305,797	3,305,797
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත	-	-	-	-	498,767	498,767
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත නොවන	-	-	-	-	488,784	488,784
වෙනත් වගකීම්	19,820,867	25,077,761	44,898,628	19,008,818	26,363,904	45,372,722
යටත් කාලීන වගකීම්	9,232,254	55,405,153	64,637,407	9,232,254	55,395,143	64,627,397
ස්කන්ධය	1,704,356	154,955,027	156,659,383	2,573,147	166,383,667	168,956,814
මුළු වගකීම් සහ ස්කන්ධය	2,685,095,469	297,885,626	2,982,981,095	2,700,942,220	323,831,555	3,024,773,775
ප්‍රතිශතය (%)	90.0%	10.0%	100.0%	89.3%	10.7%	100.0%
ශුද්ධ පරතරය	(1,537,990,185)	1,537,990,185	-	(1,538,282,121)	1,538,282,121	-

61 සම්බන්ධිත පාර්ශ්වයන් අනාවරණය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ලං.ගි.ප්‍ර. - 24 "සම්බන්ධිත පාර්ශ්වයන් අනාවරණය" යටතේ සම්බන්ධිත පාර්ශ්වයන් ලෙස නිර්වචනය කර ඇති පාර්ශ්ව වනම්, සෘජුකිය යුතු ආයෝජකයන්, පරිපාලිතයන් සහ ආශ්‍රිත සමාගම්, බැංකුවේ සේවකයන්ගේ පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්, ප්‍රධාන කළමනාකරණ පිරිස හා ඔවුන්ගේ ආසන්නතම පවුලේ සාමාජිකයන් සහ අනෙකුත් සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ බැංකුව ගනුදෙනු සිදු කර ඇත. මෙලෙස සිදු කරන ලද ගනුදෙනු යටතට ණය සැපයීමේ ක්‍රියාකාරකම්, ප්‍රතිග්‍රහණයන් සහ අනුයුක්ත කිරීම්, ශේෂ පත්‍රයෙන් බැහැර ගනුදෙනු සහ වෙනත් මූල්‍ය හා බැංකු කටයුතු අයත් වේ. සියලු කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා පවතින ණය පහසුකම් සඳහා ලබා දෙන සහනදායී පොළී අනුපාතයන් හැර ඉහත සියලු ගනුදෙනු මත අයකරන පොළී, කොමිස් සහ වෙනත් ගාස්තු සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී භාවිතා කරන අනුපාත අනුව වේ.

61.1 මව් සමාගම සහ අවසන් පාලක පාර්ශ්වය

ලංකා බැංකුව රජය සතු බැංකුවකි.

61.2 ප්‍රධාන කළමනාකරණ පිරිස, ඔවුන්ගේ ආසන්නතම පවුලේ සාමාජිකයින්

61.2.1 ප්‍රධාන කළමනාකරණ පිරිස සමඟ සහ ඔවුන්ගේ ආසන්නතම පවුලේ සාමාජිකයින් සමඟ සිදු කළ ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ලං.ගි.ප්‍ර. - 24 "සම්බන්ධිත පාර්ශ්වයන් අනාවරණය" නිර්වචනය කරන පරිදි ප්‍රධාන කළමනාකරණ පිරිසට අයත් වන්නේ, බැංකුවේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට, මෙහෙයවීමට සහ ඒවා පාලනය කිරීමට අධිකාරිය මෙන්ම වගකීම් දරන කණ්ඩායම්ය. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, බැංකුවේ ආයතනික කළමනාකරණයේ තෝරාගත් සාමාජිකයින් ප්‍රධාන කළමනාකරණ පිරිස වශයෙන් වර්ගීකරණය කර ඇත.

ආසන්නතම පවුලේ සාමාජිකයින් ලෙස හඳුන්වන්නේ, ප්‍රධාන කළමනාකරණ පිරිස විසින් ආයතනය සමඟ සිදු කරනු ලබන ගනුදෙනුවලට සැලකිය යුතු බලපෑමක් කළ හැකි යැයි අපේක්ෂා කරන හෝ එම ක්‍රියාකාරකම්වලින් බලපෑමක් විල්ල විය හැකි යැයි අපේක්ෂා කරන පවුලේ සාමාජිකයින්ය. එනම්, කාලාත්‍රයා, වයස අවුරුදු 18 ට අඩු දරුවන් සහ ප්‍රධාන කළමනාකරණ පිරිස මත යැපෙන්නන්ය. යැපෙන්නන් ලෙස හඳුන්වන්නේ, ඔහුගේ හෝ ඇයගේ මූල්‍ය අවශ්‍යතාවයෙන් 50% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ප්‍රධාන කළමනාකරණ පිරිසෙන් යැපෙන ඕනෑම අයෙකු වේ.

බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පිරිසට අදාල ප්‍රතිලාභ

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
කෙටිකාලීන සේවක ප්‍රතිලාභ	19,593	17,864	20,538	18,310
පශ්චාත් සේවක ප්‍රතිලාභ	4,469	4,412	4,469	4,412
එකතුව	24,062	22,276	25,007	22,722

ඉහත සඳහන් දෑ වලට අමතරව, බැංකුව/සමූහය විසින් ප්‍රධාන කළමනාකරණ පිරිසට බැංකුවේ අනුමත වරප්‍රසාද සැලසුමට අනුව මුදල් නොවන වරප්‍රසාද ද දෙනු ලැබේ.

61.2.2 ප්‍රධාන කළමනාකරණ පිරිස, ඔවුන්ගේ ආසන්නතම පවුලේ සාමාජිකයින් සමඟ සිදු කරන ලද ගනුදෙනු, පහසුකම් සැපයීම් සහ එකඟවීම්

(අ) ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි ඇති අයිතම

	ප්‍රධාන කළමනාකරණ පිරිස සහ ඔවුන්ගේ ආසන්නතම පවුලේ සාමාජිකයන්	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2021	2020
	රු. '000	රු. '000
පොළී ආදායම	479	687
පොළී වියදම	5,762	1,820
ප්‍රධාන කළමණාකරණ පිරිසට අදාළ ප්‍රතිලාභ	24,062	22,276

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අයිතමයන්

	ප්‍රධාන කළමනාකරණ පිරිස සහ ඔවුන්ගේ ආසන්නතම පවුලේ සාමාජිකයන්	
දෙසැම්බර් 31 දිනට	2021	2020
	රු. '000	රු. '000
වත්කම්		
ණය	7,184	8,476
බැංකු අයිරා	-	41
ණයපත්	-	19
	7,184	8,536
වගකීම්		
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	114,058	26,796
ණයකර	-	2,554
	114,058	29,350

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් බැහැර අයිතමයන්

	ප්‍රධාන කළමනාකරණ පිරිස සහ ඔවුන්ගේ ආසන්නතම පවුලේ සාමාජිකයන්	
දෙසැම්බර් 31 දිනට	2021	2020
	රු. '000	රු. '000
භාවිතා නොකළ පහසුකම්	769	3,453
	769	3,453

(ඈ) පහසුකම්වල/ තැන්පත්කරුවන්ට ගෙවිය යුතු ශේෂවල සාමාන්‍ය අගයන්

	ප්‍රධාන කළමනාකරණ පිරිස සහ ඔවුන්ගේ ආසන්නතම පවුලේ සාමාජිකයන්	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2021	2020
	රු. '000	රු. '000
ණය	7,830	6,186
බැංකු අයිරා	21	21
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	70,427	26,505

61.3 සමූහයේ සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ ගනුදෙනු

සමූහයේ සම්බන්ධිත පාර්ශ්වයන්ට බැංකුවේ පරිපාලිත සහ ආශ්‍රිත සමාගම් ඇතුළත් වේ.

61.3.1 බැංකුවේ පරිපාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම් සමඟ ගනුදෙනු

අදාළ සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ වර්ෂය තුළදී කරන ලද ගනුදෙනුවලින් ජනනය වූ ආදායම සහ වියදම මෙන්ම එම සම්බන්ධිත පාර්ශ්වයන්ට ගෙවිය යුතු හා ලැබිය යුතු ශේෂයන් හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් බැහැර අයිතමයන්ගේ එකතුන්ද සාරාංශ ලෙස පහත දක්වා ඇත.

(අ) ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි ඇති අයිතම

	පරිපාලිත සමාගම්		ආශ්‍රිත සමාගම්	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
පොළී ආදායම	123,701	174,537	16,466	13,819
පොළී වියදම	90,761	133,933	19,127	15,953
වෙනත් ආදායම්	455,201	471,587	56,480	1,037
වෙනත් වියදම්	1,121,724	1,011,942	8,665	3,200
ලාභාංශ අදායම	334,857	434,475	55,398	-

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අයිතමයන්

	පරිපාලිත සමාගම්		ආශ්‍රිත සමාගම්	
දෙසැම්බර් 31 දිනට	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
වත්කම්				
ණය	632,447	1,508,874	381,573	135,039
අයිරා	196,918	157,069	85,502	102,300
බැංකුවල ඇති තැන්පතු	6,557,968	30,589,615	-	-
වෙනත් ලැබිය යුතු දෑ	864,811	852,611	-	-
	8,252,144	33,108,169	467,075	237,339
වගකීම්				
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	4,439,061	4,704,848	235,436	204,827
ප්‍රතිම්ලදී ගැහීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	574,096	83,823	311,547	21,002
ණයකර	252,885	10,217	-	-
වෙනත් වගකීම්	41,840	155,381	-	-
	5,307,882	4,954,269	546,983	225,829

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් බැහැර අයිතමයන්

	පරිපාලිත සමාගම්		ආශ්‍රිත සමාගම්	
දෙසැම්බර් 31 දිනට	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ඇපකර	55,600	50,950	-	-
භාවිතා නොකළ පහසුකම්	168,982	209,875	26,939	2,700
	224,582	260,825	26,939	2,700

(ඈ) පහසුකම්වල/තැන්පත්කරුවන්ට ගෙවිය යුතු ශේෂවල සාමාන්‍ය අඟයන්

	පරිපාලිත සමාගම්		ආශ්‍රිත සමාගම්	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ණය	1,070,660	1,946,767	258,306	130,263
අයිරා	176,993	123,601	93,901	53,129
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	4,571,955	4,474,594	220,131	199,579

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

61.3.2 සමූහයේ පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් සමඟ ගනුදෙනු

බැංකුව සහ එහි පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් අතර සිදු වූ ගනුදෙනු සහ පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් අතර සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

(අ) ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි ඇති අයිතම

	පරිපාලිත සමාගම්		ආශ්‍රිත සමාගම්	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
පොළී ආදායම	144,562	175,402	16,466	13,819
පොළී වියදම	90,761	133,933	19,127	15,953
වෙනත් ආදායම්	912,538	986,665	58,427	2,103
වෙනත් වියදම්	1,601,287	1,528,411	9,247	3,740

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අයිතමයන්

	පරිපාලිත සමාගම්		ආශ්‍රිත සමාගම්	
දෙසැම්බර් 31 දිනට	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
වත්කම්				
ණය	864,850	1,810,677	381,573	145,104
අයිරා	196,918	157,069	85,502	102,300
ණය සහ රජයේ සුරැකුම්පත් සඳහා ආයෝජනය කිරීම	-	-	-	-
බැංකුවල ඇති තැන්පතු	6,557,968	30,589,615	-	-
වෙනත් ලැබිය යුතු දෑ	866,394	853,264	-	-
	8,486,130	33,410,625	467,075	247,404
වගකීම්				
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	4,499,386	4,775,239	235,436	204,827
ප්‍රතිමිලට ගැනුම් ගිවිසුම් යටතේ විකිණූ සුරැකුම්	574,096	83,823	311,547	21,002
ණයකර	252,885	10,217	-	-
වෙනත් වගකීම්	215,347	396,991	154	520
	5,541,714	5,266,270	547,137	226,349

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් බැහැර අයිතමයන්

	පරිපාලිත සමාගම්		ආශ්‍රිත සමාගම්	
දෙසැම්බර් 31 දිනට	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ඇපකර	55,600	50,950	-	-
භාවිතා නොකළ පහසුකම්	168,982	209,875	26,939	2,700
	224,582	260,825	26,939	2,700

(ඈ) පහසුකම්වල/තැන්පත්කරුවන්ට ගෙවිය යුතු ශේෂවල සාමාන්‍ය අඟයන්

	පරිපාලිත සමාගම්		ආශ්‍රිත සමාගම්	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ණය	1,337,763	2,226,941	263,339	135,296
අයිරා	176,993	123,601	93,901	53,129
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	4,637,313	4,639,062	220,131	199,579

61.4 බැංකුව පිළිබඳ සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි සැලකිය යුතු ආයෝජකයින් සහ බැංකු සේවකයන්ගේ පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් සමඟ කරන ලද ගනුදෙනු

රජය සතු ආයතනයක් ලෙස බැංකුව පිළිබඳ සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි ආයෝජකයා රජය වේ. රජයට අදාළ වන්නේ ශ්‍රී ලංකා රජය, රාජ්‍ය සංස්ථා, පළාත් සභා, ප්‍රාදේශිය සභා, වෙනත් රජයේ ආයතන සහ ඔවුන්ගේ පරිපාලිත සමාගම් වේ.

බැංකුව විසින් එහි සේවකයන් සඳහා පශ්චාත් සේවක ප්‍රතිලාභ පහසුකම් සැලසීම සඳහා පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් ක්‍රියාත්මක කරයි.

බැංකුව විසින් රජය සහ රජය පාලනය කරන ආයතන (සැලකිය යුතු ආයෝජකයා) සමඟ සහ පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් සමඟ කරන ලද කේවල වශයෙන් ප්‍රමාණාත්මක ගනුදෙනු සහ කේවල වශයෙන් ප්‍රමාණාත්මක නොවන නමුත් සාමූහිකව ප්‍රමාණාත්මක වෙනත් ගනුදෙනු පහත පරිදි වේ.

61.4.1 සාමූහිකව ගත් කල ප්‍රමාණාත්මක ගනුදෙනු

(අ) ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි ඇති අයිතම

	සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි ආයෝජකයා		පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම්	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
පොළී ආදායම	143,632,183	113,713,249	-	-
වෙනත් ආදායම්	1,171,607	636,554	21,952	-
පොළී වියදම	22,515,304	30,760,407	5,717,234	7,872,577
ගෙවූ ලාභාංශ	1,846,410	1,596,410	-	-
දායක මුදල් ගෙවීම්	-	-	2,096,416	1,415,578

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අයිතමයන්

	සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි ආයෝජකයා		පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම්	
දෙසැම්බර් 31 දිනට	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
වත්කම්				
ණය හා අත්තිකාරම්	1,189,473,626	860,826,882	-	-
සුරැකුම්පත් හා බැඳුම්කරවල ආයෝජන	1,084,307,997	726,180,753	-	-
ස්කන්ධවල ආයෝජනය	2,332,949	1,901,993	-	-
	2,276,114,572	1,588,909,628	-	-
වගකීම්				
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	524,780,268	423,005,912	78,989,188	69,422,730
ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	39,587,935	18,549,267	-	-
ණයකර	36,775,218	33,384,457	20,578,236	25,148,205
	601,143,421	474,939,636	99,567,424	94,570,935

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් බැහැර අයිතමයන්

	සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි ආයෝජකයා	
දෙසැම්බර් 31 දිනට	2021	2020
	රු. '000	රු. '000
ණයවර ලිපි	142,817,741	65,301,616
බිල්පත් සහ ප්‍රතිග්‍රහනය කිරීම්	52,708,196	57,912,304
ඇපකර	4,485,367	4,546,744
ඉදිරි විනිමය ගිවිසුම්	2,780,300	3,202,593
	202,791,604	130,963,257

(ඈ) වෙනත් ගනුදෙනු

	සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි ආයෝජකයා	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2021	2020
	රු. '000	රු. '000
දළ විදේශ විනිමය ගනුදෙනු		
- විකුණුම්	206,684,075	185,427,000
- ගැණුම්	5,369,529	5,698,818

(ඉ) පහසුකම්වල/ ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු ශේෂවල සාමාන්‍ය අඟයන්

	සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි ආයෝජකයා		පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම්	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ණය හා අත්තිකාරම්	1,025,150,254	785,866,934	-	-
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	473,893,090	374,273,831	68,510,629	63,727,400
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් බැහැර පහසුකම්	166,877,430	153,387,271	-	-

61.4.2 කේවල වශයෙන් ප්‍රමාණාත්මක ගනුදෙනු

බැංකුව විසින් රජය සහ රජය හා සම්බන්ධිත ආයතන සමඟ ගනුදෙනුවල ප්‍රමාණාත්මක බව හඳුනා ගැනීම සඳහා අභ්‍යන්තර තක්සේරු ක්‍රමවේදයක් භාවිතා කරයි. ඒ අනුව සාමාන්‍ය වෙළඳපොළ තත්ත්වයන්ට අනුව සාමාන්‍ය එදිනෙදා ව්‍යාපාරික කටයුතුවල ඇති වන ගනුදෙනු කේවල වශයෙන් ප්‍රමාණාත්මක ගනුදෙනු ලෙස සැලකේ.

රජයට අයත් ආයතනයන් (SOEs) වෙත ලබාදුන් ණය පහසුකම් වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජය රු. මිලියන 457,832 ක භාණ්ඩාගාර ඇපකර සහ රු. මිලියන 31,386 ක සැනසිලි ලිපි නිකුත් කර ඇත.

61.4.3 සැලකිය යුතු ආයෝජකයා සමඟ ගනුදෙනු - සමූහය

බැංකුව විසින් රජය සමඟ කළ ගනුදෙනු සහ රජය සමඟ ඇති ශේෂයන් හැරුණු විට සමූහයේ පරිපාලිතයන් රජය සමඟ කළ ගනුදෙනු සහ රජය සමඟ ඇති ශේෂයන් පහත පරිදි වේ.

	සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි ආයෝජකයා	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2021	2020
	රු. '000	රු. '000
සුරැකුම් හා බැඳුම්කරවල ආයෝජන	4,043,470	2,396,494
මහ බැංකුව සමඟ ඇති නොස්ට්‍රෝ ශේෂය	242,821	228,191
සුරැකුම් හා බැඳුම්කරවල ආයෝජනයෙන් ලද ආදායම	289,299	216,055

ඉහත සඳහන් ගනුදෙනු හැරුණු විට, සමූහය, ඒ හා සම්බන්ධිත නොවන ගනුදෙනුකරුවන් සමඟ ගනුදෙනු කරන ආකාරයෙන් 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජය හා රජය හා සම්බන්ධිත ආයතන සමඟ, සමූහය විසින් පවත්වාගෙන ගිය ගනුදෙනු ලෙස සේවා සැපයුම්, වෙළඳුම් අරමුණු කර ගත් කොටස්වල ආයෝජනය සහ අන්තර් බැංකු ණයදීම් ආදී වෙනත් මූල්‍ය සේවා සැපයීම් දැක්විය හැකිය.

62 බණ්ඩ පදනම් මත මූල්‍ය තොරතුරු වාර්තාකරණය

සමූහයේ ව්‍යාපාර කටයුතු චිකිනෙකට වෙනස් විවිධ ව්‍යාපාර ක්‍රියාවලියන් නිරූපනය කරන පරිදි ඒ ඒ ආර්ථික වාතාවරණයන් තුළ ඇතිවන අවදානම් සහ ප්‍රතිලාභයන් මත කටයුතු කරන ව්‍යාපාර බණ්ඩ හෝ මෙහෙයුම් සංරචකයන් නියෝජනය කරමින් බණ්ඩ තොරතුරු වාර්තාකරණය කර ඇත.

62.1 මූලික බණ්ඩ තොරතුරු - මෙහෙයුම් බණ්ඩ - සමූහය

මෙහෙයුම් බණ්ඩ යනු ආදායම් උපයමින් හා වියදම් දරමින් ව්‍යාපාරික ක්‍රියාකාරකම් වල නිරත වන සමූහයේ අංගයන්ය. මෙයට සමූහයේ කවර හෝ අංගයකට සම්බන්ධ ආදායම් හා වියදම් වලට අදාල ගනුදෙනු ඇතුලත් වේ. මෙහි මෙහෙයුම් ප්‍රතිඵල කළමණාකාරිත්වය විසින් සමාලෝචනය කර එක් එක් බණ්ඩ අතර සම්පත් බෙදා දීම හා කාර්යඵල ඇගයීම පිලිබඳ තීරණ ගනු ලබයි. සමූහය පහත ප්‍රධාන ව්‍යාපාර බණ්ඩ වලින් සමන්විත වේ. ශාඛා බැංකුකරණය, ආයතනික බැංකුකරණය, ජාත්‍යන්තර, භාණ්ඩාගාර හා ආයෝජන, අනෙකුත් බැංකු නොවන කටයුතු සහ සමූහයේ කටයුතු යනාදියෙන් සමන්විත වේ.

සම්පත් බෙදාහැරීම සහ කාර්යඵල තක්සේරුකරණය ආශ්‍රිතව තීරණ ගැනීමේ අරමුණින් කළමනාකාරිත්වය විසින් ව්‍යාපාර බණ්ඩයන්හි මෙහෙයුම් ප්‍රතිඵල වෙන වෙනම අධීක්ෂණය කරනු ලබයි. බණ්ඩයන්හි ප්‍රතිඵල ඒවායෙහි මෙහෙයුම් ලාභ හෝ අලාභ මත තක්සේරු කරනු ලබයි. එකතුකල අගය මත බදු සහ ආදායම් බද්ද, සාමූහික පදනමක් මත කළමනාකරණය කරනු ලබන බැවින් මෙහෙයුම් බණ්ඩ අතර බෙදා හරිනු නොලබයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	ශාඛා බැංකුකරණය		ආයතනික බැංකුකරණය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2021	2020	2021	2020
	රු. '000	රු. '000	රු. '000	රු. '000
බාහිර ගනුදෙනුකරුවන්ගෙන් ලද ආදායම:				
ශුද්ධ පොළී ආදායම	53,071,506	38,837,496	34,569,429	21,938,263
ගාස්තු සහ කොමිස් ආදායම	9,204,685	9,034,700	3,359,959	1,735,384
වෙනත් ආදායම්	651,105	284,537	3,318,650	1,331,677
මුළු මෙහෙයුම් ආදායම	62,927,296	48,156,733	41,248,038	25,005,324
ණය හානිය සහ වෙනත් අලාභයන් සඳහා (ප්‍රතිපාදන)/ප්‍රත්‍යවර්ත්‍ය කිරීම	(13,240,129)	(11,860,677)	(20,640,008)	(14,987,487)
වෙනත් මෙහෙයුම් වියදම්	(28,311,761)	(23,052,120)	(6,687,754)	(5,114,790)
මුළු වියදම්	(41,551,890)	(34,912,797)	(27,327,762)	(20,102,277)
මූල්‍ය සේවා මත බදු වලට පෙර මෙහෙයුම් ලාභය	21,375,406	13,243,936	13,920,276	4,903,047
මූල්‍ය සේවා මත බදු				
මූල්‍ය සේවා මත බදු වලට පසු මෙහෙයුම් ලාභය				
ආශ්‍රිත සමාගම්වල ලාභ/(පාඩු) කොටස, බදු පසු				
ආදායම් බද්දට පෙර ලාභය/(අලාභය)	21,375,406	13,243,936	13,920,276	4,903,047
ආදායම් බදු වියදම				
වර්ෂය සඳහා ලාභය				
මුළු වත්කම්	995,646,746	902,023,302	1,430,320,436	1,086,867,184
මුළු වගකීම්	943,090,618	854,651,090	1,354,819,658	1,029,787,391
මෙහෙයුම් ක්‍රියාවලියෙන් ලැබූ/ (යෙදවූ) මුදල් ප්‍රවාහයන්	25,159,143	49,720,200	16,491,497	25,817,153
ආයෝජන ක්‍රියාවලියෙන් ලැබූ/ (යෙදවූ) මුදල් ප්‍රවාහයන්	(78,189,852)	(31,354,725)	(112,325,524)	(37,779,979)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලැබූ/ (යෙදවූ) මුදල් ප්‍රවාහයන්	59,284,806	8,480,585	85,167,024	10,218,438
ජංගම නොවන වත්කම් මත ප්‍රාග්ධන වියදම				
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්	1,085,432	1,286,526	1,559,304	1,550,163

බැංකුවේ ප්‍රධාන ගනුදෙනුකරුවා වශයෙන් රජයට සහ රජය සතු ව්‍යාපාර (SoEs) සමඟ කරන ගනුදෙනු ශාඛා, ආයතනික, ජාත්‍යන්තර, භාණ්ඩාගාර සහ ආයෝජන අංශය යටතේ ඇතුළත් වේ. වැඩි විස්තර සටහන 61 - "සම්බන්ධිත පාර්ශ්වයන් අනාවරණය" හි දක්වා ඇත.

ජාතෘන්තර, භාණ්ඩාගාර හා ආයෝජන කටයුතු		සමූහයේ කටයුතු		නොබෙදූ		එකතුව	
2021	2020	2021	2020	2021	2020	2021	2020
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
24,778,095	14,094,243	3,737,686	2,427,375	(1,167,089)	(94,136)	114,989,627	77,203,241
932,570	634,938	243,385	217,646	682,188	554,069	14,422,787	12,176,737
7,938,658	4,869,475	924,643	208,521	291,254	106,554	13,124,310	6,800,764
33,649,323	19,598,656	4,905,714	2,853,542	(193,647)	566,487	142,536,724	96,180,742
(9,003,987)	(3,885,611)	71,766	(799,895)	(849,607)	(498,403)	(43,661,965)	(32,032,073)
(6,092,663)	(4,457,010)	(3,351,115)	(3,437,149)	(588,411)	(460,753)	(45,031,704)	(36,521,822)
(15,096,650)	(8,342,621)	(3,279,349)	(4,237,044)	(1,438,018)	(959,156)	(88,693,669)	(68,553,895)
18,552,673	11,256,035	1,626,365	(1,383,502)	(1,631,665)	(392,669)	53,843,055	27,626,847
						(9,339,679)	(5,463,182)
						44,503,376	22,163,665
		133,677	82,488			133,677	82,488
18,552,673	11,256,035	1,760,042	(1,301,014)	(1,631,665)	(392,669)	44,637,053	22,246,153
						(5,953,659)	(5,938,747)
						38,683,394	16,307,406
1,213,737,811	861,849,707	44,665,909	41,792,680	163,578,854	132,240,902	3,847,949,756	3,024,773,775
1,149,669,545	816,587,321	30,028,966	29,495,247	154,944,191	125,295,912	3,632,552,978	2,855,816,961
13,453,432	19,914,798	(77,423)	646,628	1,002,574	5,625,368	56,029,223	101,724,147
(95,316,918)	(29,958,273)	(12,846,129)	(4,596,752)	295,092	448,722	(298,383,331)	(103,241,007)
72,270,824	8,102,883	9,740,142	1,243,294	(896,862)	(7,215,955)	225,565,934	20,829,245
						(2,371,909)	(3,461,073)
1,323,190	1,229,228	93,377	136,624	178,330	188,611	4,239,633	4,391,152

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

62.2 ද්විතීයික ඛණ්ඩ තොරතුරු - භූගෝලීය ඛණ්ඩ

භූගෝලීය ඛණ්ඩ නිශ්චිත ආර්ථික පරිසරයක් තුළ නිෂ්පාදන සහ සේවා සපයන අතර ඒ හා බැඳුණු අවදානම් සහ ප්‍රතිලාභයන් වෙනත් ආර්ථික පරිසරයක් තුළ දැකිය හැකි තත්ත්වයට වඩා ස්වභාවයෙන් වෙනස් වේ.

මෙම ඛණ්ඩ මඟින් දේශීය මෙහෙයුම්, අක්වෙරළ බැංකු අංශය හා විදේශීය බැංකු කටයුතු ඒකක නියෝජනය කෙරෙයි.

	බැංකුව				සමූහය			
දෙසැම්බර් 31 දිනට	2021		2020		2021		2020	
	රු. '000	%	රු. '000	%	රු. '000	%	රු. '000	%
වත්කම්								
දේශීය බැංකු කටයුතු	3,509,004,415	92.3	2,705,875,291	90.7	3,540,430,477	92.0	2,711,338,107	89.6
අක්වෙරළ බැංකු කටයුතු හා විදේශීය බැංකු කටයුතු	294,279,428	7.7	277,105,804	9.3	307,519,279	8.0	313,435,668	10.4
මුළු වත්කම්	3,803,283,843	100.0	2,982,981,095	100.0	3,847,949,756	100.0	3,024,773,775	100.0
මුළු ආදායම								
දේශීය බැංකු කටයුතු	246,912,348	85.0	210,799,829	85.3	253,531,068	85.2	215,794,177	85.4
අක්වෙරළ බැංකු කටයුතු හා විදේශීය බැංකු කටයුතු	43,450,146	15.0	36,364,136	14.7	44,089,785	14.8	36,961,853	14.6
මුළු ආදායම	290,362,494	100.0	247,163,965	100.0	297,620,853	100.0	252,756,030	100.0
බදු පෙර ලාභය								
දේශීය බැංකු කටයුතු	32,676,698	75.7	16,770,593	71.2	34,105,477	76.4	15,461,103	69.5
අක්වෙරළ බැංකු කටයුතු හා විදේශීය බැංකු කටයුතු	10,512,819	24.3	6,781,288	28.8	10,531,576	23.6	6,785,050	30.5
මුළු බදු පෙර ලාභය	43,189,517	100.0	23,551,881	100.0	44,637,053	100.0	22,246,153	100.0
බදු පසු ලාභය								
දේශීය බැංකු කටයුතු	29,546,376	78.6	13,614,714	76.6	30,620,906	79.2	12,153,227	74.5
අක්වෙරළ බැංකු කටයුතු හා විදේශීය බැංකු කටයුතු	8,043,731	21.4	4,150,418	23.4	8,062,488	20.8	4,154,179	25.5
මුළු බදු පසු ලාභය	37,590,107	100.0	17,765,132	100.0	38,683,394	100.0	16,307,406	100.0

63 වත්කම් හා වගකීම්වල සාධාරණ අගය

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සාධාරණ අගය යනු යම් නිශ්චිත දිනක දී වෙළඳපොල සහභාගී පාර්ශ්ව අතර ක්‍රමවත් ගනුදෙනු මත දී වත්කම් විකිණීමෙන් ලැබී ඇති හෝ වගකීම් මාරු කිරීමට ගෙවා ඇති මිල (පිට වීමේ මිල) හෝ එසේ නොමැති අවස්ථාවක දී වඩාත් වාසිදායක මිල වේ. වගකීමක සාධාරණ අගය වගකීම ඉටු නොකිරීමෙන් ඇතිවන අවදානම මඟින් පිළිබිඹු වේ.

සාධාරණ අගය මැනීම සඳහා වත්කම විකිණීම හෝ වගකීම මාරු කිරීමේ ගනුදෙනුව සිදුවන වෙළඳපොළ පහත උපකල්පන මත පදනම් වේ.

- වත්කම් හා වගකීම් සඳහා වන ප්‍රධාන වෙළඳපොල තුළ හෝ

- ප්‍රධාන වෙළඳපොලක් නොමැති විට වත්කම් හා වගකීම් සඳහා වන වඩාත් වාසිදායක වෙළඳපොල තුළ

සියලුම වත්කම් හා වගකීම් වල සාධාරණ අගය නිර්ණය කිරීමේදී හෝ මූල්‍ය වාර්තාවල හෙළිදරව් කිරීමේදී, සාධාරණ අගයන් මැනීම සඳහා සමස්තයක් ලෙස සැලකිය යුතු බලපෑමක් කරන අවම මට්ටමේ යෙදවුම් පහත දක්වා ඇති පරිදි සාධාරණ අගයන්හි ධූරාවලියේ දී වර්ග කරනු ලැබේ.

පළවන මට්ටම - ප්‍රකාශිත වෙළඳපොළ මිල භාවිතයෙන් තක්සේරු ශිල්ප ක්‍රම:
ක්‍රියාකාරී වෙළඳපොළ තුළ මිල ප්‍රකාශිත මූල්‍ය උපකරණ

දෙවන මට්ටම - නිරීක්ෂණය කළ හැකි යෙදවුම් භාවිතයෙන් තක්සේරු ශිල්ප ක්‍රම:
ක්‍රියාකාරී වෙළඳපොළ තුළ ඇති සමාන උපකරණ සඳහා මිල ප්‍රකාශිත මූල්‍ය උපකරණ හෝ ක්‍රියාකාරී නොවන වෙළඳපොළ තුළ ඇති සර්වසම හෝ සමාන මූල්‍ය උපකරණ සඳහා මිල ප්‍රකාශිත මූල්‍ය උපකරණ සහ සියලුම වැදගත් යෙදවුම් නිරීක්ෂණය කළ හැකි මූල්‍ය උපකරණ ආකෘති භාවිතයෙන් තක්සේරු කරනු ලබයි.

තුන්වන මට්ටම - නිරීක්ෂණය කළ නොහැකි වැදගත් යෙදවුම් කරණ කොට ගත් තක්සේරු ශිල්ප ක්‍රම:

නිරීක්ෂණය කළ නොහැකි වැදගත් යෙදවුම් එකක් හෝ කිහිපයක් පවතින මූල්‍ය උපකරණ තක්සේරු ශිල්ප ක්‍රම භාවිතයෙන් අගය කරනු ලබයි.

සියලු මූල්‍ය උපකරණ වල මිල තීරණය කරනු ලබන්නේ බාහිර වෙළඳපොල මිල හෝ නිරීක්ෂණය කළ හැකි යෙදවුම් භාවිතයෙන් මිල තක්සේරු කිරීමේ ආකෘති, ස්වාධීන මිල නිර්ණය කිරීම හෝ වලංගුතා ලබා ගැනීම මඟින් වේ. අක්‍රීය වෙළඳපොලක් තුළදී, විකුණුම් මිල සෘජු ලෙස නිරීක්ෂණය කල නොහැකි වේ. එවැනි අවස්ථා වලදී මූල්‍ය උපකරණ වල සාධාරණ අගය තහවුරු කිරීම සඳහා බැංකුව විසින් විකල්ප වෙළඳපොළ තොරතුරු භාවිතා කරනු ලැබේ. මේ තත්ත්වයේ දී බැංකුව විසින් මූල්‍ය උපකරණයේ වටිනාකම තහවුරු කිරීම සඳහා වඩා විශ්වාසනීය ලෙස ලබා ගත හැකි විශේෂ වෙළඳපොල තොරතුරු වෙත වැඩි බරක් තබනු ලැබේ.

63.1 සාධාරණ අගයට තක්සේරු කරන වත්කම් සහ වගකීම්

ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින සියලුම ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ තක්සේරු කිරීම වෙළඳපොල නිරීක්ෂණය කළ හැකි සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් සමඟ අගය කිරීමේ ක්‍රියාදාමය මඟින් සිදු කරයි. බහුල වශයෙන් භාවිතා කරන තක්සේරු ක්‍රියාදාමයට තත්කාලීන ඉදිරි විදේශ විනිමය අනුපාතය හා ඉදිරි වාරික ඇතුළත් වේ.

ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්

රජයේ සුරැකුම්පත්, ලැයිස්තුගත ණය සුරැකුම්පත්, ඒකක භාර වල ඒකක සහ ලැයිස්තුගත ස්කන්ධයන් යනාදිය ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම් වේ. ශ්‍රී ලංකා මහා බැංකුව විසින් ප්‍රකාශිත ඵලදා වක්‍රය අනුව රජයේ සුරැකුම්පත් අගය කරනු ලැබේ. ලැයිස්තුගත ස්කන්ධයන් හා ලැයිස්තුගත ණය සුරැකුම්පත් පිලිබඳ තක්සේරු කිරීමට බැංකුව විසින් වාර්තා කරන දිනට පවතින ක්‍රියාකාරී වෙළඳපොලේ ලැයිස්තුගත වෙළඳපොළ මිල ගණන් භාවිතා කරයි. ඒකක භාර වල ඒකක වැනි වත්කම් අගය කිරීම සඳහා වඩාත් අදාළ මිල වන අදාළ වත්කම් කළමනාකරණ ආයතනයන්හි කළමනාකරණ මිලදී ගැනීමේ අගය භාවිතා කරයි.

වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්

වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම් යටතට රජයේ සුරැකුම්පත්, මිල ප්‍රකාශිත ස්කන්ධයන් සහ මිල ප්‍රකාශ නොකළ ස්කන්ධයන් වර්ගීකරණය කරයි.

- රජයේ සුරැකුම්පත්, වාර්තා කරන දිනට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශිත ඵලදා වක්‍රය පදනම් කර ගනිමින් තක්සේරු කරයි.

- වාර්තා කරන දිනට ක්‍රියාකාරී වෙළඳපොලෙහි ලැයිස්තුගත මිල, මිල ප්‍රකාශිත ස්කන්ධයන් සහ මිල ප්‍රකාශිත ණය සුරැකුම්පත් තක්සේරු කිරීම සඳහා යොදා ගනියි.

- ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කොටස්වල ආයෝජනය හැර අනෙකුත් මිල ප්‍රකාශ නොකළ ස්කන්ධයන් වීම සුරැකුම්පත්වල මිල නිරූපනය වන වඩාත්ම සාධාරණ අගය වන පිරිවැයට පවත්වා ගෙන යයි. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි කොටස් ආයෝජනය සඳහා සාධාරණ අගය ගණනය කිරීම සඳහා අභ්‍යන්තර කළමනාකරණ තක්සේරු තාක්ෂණ ක්‍රමයක් භාවිතා කරන ලද අතර එහි විස්තර සටහන 63.1.3 හි දැක්වේ.

දේපළ, පිරියත සහ උපකරණ

ප්‍රත්‍යාගණන අගයෙන් අදාළ සමුච්චිත ක්ෂය වීම් සහ හානිකරණ අලාභයන් අඩු කළ පසු අගයට නිදහස් අයිතිය සහිත ඉඩම් සහ ගොඩනැගිලි සහ කල්බදු දේපළයන්හි ගොඩනැගිලි පවත්වා ගෙන යයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

63.1.1 සාධාරණ අගයට මනින ලද වත්කම් - සාධාරන අගයන්හි ධූරාවලිය

	බැංකුව				සමූහය			
2021 දෙසැම්බර් 31 දිනට	1 මට්ටම	2 මට්ටම	3 මට්ටම	එකතුව	1 මට්ටම	2 මට්ටම	3 මට්ටම	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්								
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ								
ඉදිරි විදේශ විනිමය හිවිසුම්	-	27,558	-	27,558	-	27,558	-	27,558
මුදල් හුවමාරු හිවිසුම් (SWAPs)	-	-	4,314,973	4,314,973	-	-	4,314,973	4,314,973
	-	27,558	4,314,973	4,342,531	-	27,558	4,314,973	4,342,531
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්								
රජයේ සුරැකුම්පත්								
භාණ්ඩාගාර බිල්පත්	2,308,810	-	-	2,308,810	2,308,810	-	-	2,308,810
භාණ්ඩාගාර බැඳුම්කර	27,656	-	-	27,656	131,378	-	-	131,378
මිල ප්‍රකාශිත ස්කන්ධයන්	2,726,221	-	-	2,726,221	2,977,714	-	-	2,977,714
ඒකක භාරවල ඒකක	-	4,167,335	-	4,167,335	-	4,222,911	-	4,222,911
	5,062,687	4,167,335	-	9,230,022	5,417,902	4,222,911	-	9,640,813
වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්								
මිල ප්‍රකාශිත ආයෝජන								
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත්								
භාණ්ඩාගාර බිල්පත්	-	-	-	-	2,988,742	-	-	2,988,742
භාණ්ඩාගාර බැඳුම්කර	11,540,898	-	-	11,540,898	11,911,292	-	-	11,911,292
රාජ්‍ය සුරැකුම්පත් - ඉන්දියාව	1,780,868	-	-	1,780,868	1,780,868	-	-	1,780,868
ස්කන්ධයන්	2,749,598	-	-	2,749,598	3,940,622	-	-	3,940,622
මිල ප්‍රකාශ නොකළ ආයෝජන								
ස්කන්ධයන්	-	1,996,179	235,013	2,231,192	-	1,996,179	262,107	2,258,286
	16,071,364	1,996,179	235,013	18,302,556	20,621,524	1,996,179	262,107	22,879,810
මුළු මූල්‍ය වත්කම්	21,134,051	6,191,072	4,549,986	31,875,109	26,039,426	6,246,648	4,577,080	36,863,154
මූල්‍ය නොවන වත්කම්								
දේපළ, පිරියත හා උපකරණ	-	-	26,881,778	26,881,778	-	-	40,631,672	40,631,672
මුළු මූල්‍ය නොවන වත්කම්	-	-	26,881,778	26,881,778	-	-	40,631,672	40,631,672
එකතුව	21,134,051	6,191,072	31,431,764	58,756,887	26,039,426	6,246,648	45,208,752	77,494,826
මූල්‍ය වගකීම්								
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ								
ඉදිරි විදේශ විනිමය හිවිසුම්	-	17,297	-	17,297	-	17,297	-	17,297
මුදල් හුවමාරු හිවිසුම් (SWAPs)	-	-	363,031	363,031	-	-	363,031	363,031
මුළු මූල්‍ය වගකීම්	-	17,297	363,031	380,328	-	17,297	363,031	380,328

63.1.1 සාධාරණ අගයට මනින ලද වත්කම් - සාධාරන අගයන්හි ධූරාවලිය

	බැංකුව				සමූහය			
2020 දෙසැම්බර් 31 දිනට	1 මට්ටම	2 මට්ටම	3 මට්ටම	එකතුව	1 මට්ටම	2 මට්ටම	3 මට්ටම	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්								
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ								
ඉදිරි විදේශ විනිමය හිවිසුම්	-	38,532	-	38,532	-	38,532	-	38,532
මුදල් හුවමාරු හිවිසුම් (SWAPs)	-	-	510,394	510,394	-	-	510,394	510,394
	-	38,532	510,394	548,926	-	38,532	510,394	548,926
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්								
රජයේ සුරැකුම්පත්								
භාණ්ඩාගාර බිල්පත්	3,622,937	-	-	3,622,937	3,623,301	-	-	3,623,301
භාණ්ඩාගාර බැඳුම්කර	29,553	-	-	29,553	775,231	-	-	775,231
මිල ප්‍රකාශිත ස්කන්ධයන්	3,091,853	-	-	3,091,853	3,304,477	-	-	3,304,477
වීකක භාරවල වීකක	-	3,111,877	-	3,111,877	-	3,164,712	-	3,164,712
මිල ප්‍රකාශිත ණය සුරැකුම්පත්	-	-	-	-	1,750	-	-	1,750
	6,744,343	3,111,877	-	9,856,220	7,704,759	3,164,712	-	10,869,471
වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්								
මිල ප්‍රකාශිත ආයෝජන								
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත්								
භාණ්ඩාගාර බිල්පත්	38,421	-	-	38,421	1,282,857	-	-	1,282,857
භාණ්ඩාගාර බැඳුම්කර	9,311,619	-	-	9,311,619	9,431,278	-	-	9,431,278
රාජ්‍ය සුරැකුම්පත් - ඉන්දියාව	1,594,471	-	-	1,594,471	1,594,471	-	-	1,594,471
ස්කන්ධයන්	2,329,969	-	-	2,329,969	3,494,494	-	-	3,494,494
මිල ප්‍රකාශ නොකළ ආයෝජන								
ස්කන්ධයන්	-	1,855,430	232,570	2,088,000	-	1,855,430	255,248	2,110,678
	13,274,480	1,855,430	232,570	15,362,480	15,803,100	1,855,430	255,248	17,913,778
මුළු මූල්‍ය වත්කම්	20,018,823	5,005,839	742,964	25,767,626	23,507,859	5,058,674	765,642	29,332,175
මූල්‍ය නොවන වත්කම්								
දේපළ, පිරියත හා උපකරණ	-	-	26,441,721	26,441,721	-	-	39,929,121	39,929,121
මුළු මූල්‍ය නොවන වත්කම්	-	-	26,441,721	26,441,721	-	-	39,929,121	39,929,121
එකතුව	20,018,823	5,005,839	27,184,685	52,209,347	23,507,859	5,058,674	40,694,763	69,261,296
මූල්‍ය වගකීම්								
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ								
ඉදිරි විදේශ විනිමය හිවිසුම්	-	16,192	-	16,192	-	16,192	-	16,192
මුදල් හුවමාරු හිවිසුම් (SWAPs)	-	-	85,990	85,990	-	-	85,990	85,990
මුළු මූල්‍ය වගකීම්	-	16,192	85,990	102,182	-	16,192	85,990	102,182

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

63.1.2 සාධාරණ අගයට අගය කළ තෙවන මට්ටමේ වත්කම්වල සංචලනයන්

සාධාරණ අගයට වාර්තා කළ තෙවන මට්ටමේ වත්කම් සහ වගකීම්හි ආරම්භක සහ අවසාන ශේෂයන්හි සැසඳුමක් පහත වගුවෙන් දැක්වේ.

	බැංකුව					සමූහය				
	2021 ජනවාරි 1 දිනට	ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි වාර්තා කල මුළු ලාභ/(අලාභ)	වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි වාර්තා කල මුළු ලාභ/(අලාභ)	මිලදී ගැනීම්/ (විකිණීම්) සහ අනෙකුත් ගැලපීම්	2021 දෙසැම්බර් 31 දිනට	2021 ජනවාරි 1 දිනට	ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි වාර්තා කල මුළු ලාභ/(අලාභ)	වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි වාර්තා කල මුළු ලාභ/(අලාභ)	මිලදී ගැනීම්/ (විකිණීම්) සහ අනෙකුත් ගැලපීම්	2021 දෙසැම්බර් 31 දිනට
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්										
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ										
මුදල් හුවමාරු ගිවිසුම් (SWAPs)	510,394	-	-	3,804,579	4,314,973	510,394	-	-	3,804,579	4,314,973
වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්										
මිල ප්‍රකාශ නොකළ ආයෝජන										
ස්කන්ධයන්	232,570	-	-	2,443	235,013	255,248	-	-	6,859	262,107
තෙවන මට්ටමෙහි මුළු මූල්‍ය වත්කම්	742,964	-	-	3,807,022	4,549,986	765,642	-	-	3,811,438	4,577,080
මූල්‍ය නොවන වත්කම්										
දේපළ, පිරියත හා උපකරණ	26,441,721	(228,998)	(284,831)	953,886	26,881,778	39,929,121	(924,091)	345,441	1,281,201	40,631,672
තෙවන මට්ටමෙහි මුළු වත්කම්	27,184,685	(228,998)	(284,831)	4,760,908	31,431,764	40,694,763	(924,091)	345,441	5,092,639	45,208,752
මූල්‍ය වගකීම්										
මුදල් හුවමාරු ගිවිසුම් (SWAPs)	85,990	-	-	277,041	363,031	85,990	-	-	277,041	363,031
තෙවන මට්ටමෙහි මුළු මූල්‍ය වගකීම්	85,990	-	-	277,041	363,031	85,990	-	-	277,041	363,031
තෙවන මට්ටමෙහි ශුද්ධ මූල්‍ය වත්කම්	656,974	-	-	3,529,981	4,186,955	679,652	-	-	3,534,397	4,214,049

63.1.2 සාධාරණ අගයට අගය කළ තෙවන මට්ටමේ වත්කම්වල සංචලනයන්

සාධාරණ අගයට වාර්තා කළ තෙවන මට්ටමේ වත්කම් සහ වගකීම්හි ආරම්භක සහ අවසාන ශේෂයන්හි සැසඳුමක් පහත වගුවෙන් දැක්වේ.

	බැංකුව					සමූහය				
	2020 ජනවාරි 1 දිනට	ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි වාර්තා කල මුළු ලාභ/(අලාභ)	වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි වාර්තා කල මුළු ලාභ/(අලාභ)	මිලදී ගැනීම්/ (විකිණීම්) සහ අනෙකුත් ගැලපීම්	2020 දෙසැම්බර් 31 දිනට	2020 ජනවාරි 1 දිනට	ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි වාර්තා කල මුළු ලාභ/(අලාභ)	වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි වාර්තා කල මුළු ලාභ/(අලාභ)	මිලදී ගැනීම්/ (විකිණීම්) සහ අනෙකුත් ගැලපීම්	2020 දෙසැම්බර් 31 දිනට
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්										
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ										
මුදල් හුවමාරු ගිවිසුම් (SWAPs)	124,113	-	-	386,281	510,394	124,113	-	-	386,281	510,394
වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්										
මිල ප්‍රකාශ නොකළ ආයෝජන										
ස්කන්ධයන්	229,307	-	-	3,263	232,570	251,983	-	-	3,265	255,248
තෙවන මට්ටමෙහි මුළු මූල්‍ය වත්කම්	353,420	-	-	389,544	742,964	376,096	-	-	389,546	765,642
මූල්‍ය නොවන වත්කම්										
දේපළ, පිරියත හා උපකරණ	19,261,983	(271,385)	6,932,984	518,139	26,441,721	32,429,288	(864,207)	7,774,192	589,848	39,929,121
තෙවන මට්ටමෙහි මුළු වත්කම්	19,615,403	(271,385)	6,932,984	907,683	27,184,685	32,805,384	(864,207)	7,774,192	979,394	40,694,763
මූල්‍ය වගකීම්										
මුදල් හුවමාරු ගිවිසුම් (SWAPs)	105,607	-	-	(19,617)	85,990	105,607	-	-	(19,617)	85,990
තෙවන මට්ටමෙහි මුළු මූල්‍ය වගකීම්	105,607	-	-	(19,617)	85,990	105,607	-	-	(19,617)	85,990
තෙවන මට්ටමෙහි ශුද්ධ මූල්‍ය වත්කම්	247,813	-	-	409,161	656,974	270,489	-	-	409,163	679,652

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

63.1.3 තෙවන මට්ටමෙහි සාධාරණ අගය ගණනය කිරීම සඳහා භාවිතා කළ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්

තුන්වන මට්ටමේ මූල්‍ය උපකරණවල සාධාරණ අගය ගණනය කිරීම සඳහා 2021 දෙසැම්බර් 31 දිනට භාවිතා කරන ලද නිරීක්ෂණය කළ නොහැකි වැදගත් යෙදවුම්වලට අදාළ තොරතුරු පහත දැක්වේ.

මූල්‍ය උපකරණ වර්ගය	2021 දෙසැම්බර් 31 දිනට සාධාරණ අගය රු. '000	තක්සේරු ශිල්පීය ක්‍රමය	වැදගත් නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්	නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් සඳහා ඇස්තමේන්තු පරාසය (බර තැබූ)	නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්වලින් සාධාරණ අගය මැනීම සඳහා සංවේදීතාවය
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ					
මුදල් හුවමාරු ගිවිසුම් (SWAPs)	4,314,973	ඉදිරි මිල කිරීම් ක්‍රමය	ඉදිරි විදේශ විනිමය අනුපාතය	පදනම් ඒකක ඍණ 100 සිට ධන 100 දක්වා	ව්‍යුත්පන්න වත්කම්වල අගයට රු. මිලියන 5 ක් වාසිදායකව හෝ අවාසිදායකව බලපායි.
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය වත්කම් මිල ප්‍රකාශ නොකල ස්කන්ධ කොටස්					
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	162,300	වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය	නොවෙනස් ලාභාංශ ක්‍රමය	පවතින ප්‍රාග්ධන පිරිවැයට 5% අඩුවීම සහ 5% වැඩිවීම	සාධාරණ අගයට වන බලපෑම ධන රු. මිලියන 8.1 සිට ඍණ රු. මිලියන 8.1 අතර විය හැකිය. ආයෝජන සඳහා සැලකිය යුතු බලපෑමක් නැත.
ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය	43,645	පිරිවැයට මිල කිරීම	-		සාධාරණ අගය විශ්වාසනීය ලෙස මැනිය නොහැක. මෙම ආයෝජන අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් ඇති ආයතනවල සිදු කර ඇති අතර, එමඟින් සාමාජිකයින්ට ගනුදෙනු සේවා හා මෙහෙයවීම් සිදු කරයි. තම පිරිවැය ආවරණය කර ගැනීමට අවශ්‍ය සේවා ගාස්තු පමණක් අය කරමින් සේවා සපයනු ලැබේ.
සී/ස ලංකා ක්ලියර් (පෞද්ගලික) සමාගම	23,443	පිරිවැයට මිල කිරීම	-		
සී/ස ලංකා ෆයිනෑන්ෂියල් සර්විසස් බියුරෝ සමාගම	5,000	පිරිවැයට මිල කිරීම	-		
සී/ස ෆිච් රේටින්ස් ලංකා සමාගම	625	පිරිවැයට මිල කිරීම	-		සාධාරණ අගය විශ්වසනීය ලෙස මිනුම් කල නොහැකි අතර පිරිවැය ආකෘතිය භාවිතයෙන් තක්සේරු කර ඇත.

63.2 සාධාරණ අගයට පවත්වා ගෙන නොයන මූල්‍ය වත්කම් සහ වගකීම්හි සාධාරණ අගය

2021 දෙසැම්බර් 31 දිනට	බැංකුව					සමූහය				
	සාධාරණ අගය				ධාරණ අගය	සාධාරණ අගය				ධාරණ අගය
	1 මට්ටම	2 මට්ටම	3 මට්ටම	එකතුව		1 මට්ටම	2 මට්ටම	3 මට්ටම	එකතුව	
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
වත්කම්										
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්										
- ණය සහ වෙනත් උපකරණ	860,771,339	4,141,518	184,642,014	1,049,554,871	1,082,179,876	861,042,486	4,141,518	184,642,014	1,049,826,018	1,082,837,662
ආයෝජන දේපළ	-	-	3,003,007	3,003,007	2,414,640	-	-	653,000	653,000	107,704
එකතුව	860,771,339	4,141,518	187,645,021	1,052,557,878	1,084,594,516	861,042,486	4,141,518	185,295,014	1,050,479,018	1,082,945,366
වගකීම්										
වෙනත් ණය ගැනීම්	-	-	444,107,977	444,107,977	444,107,977	-	-	447,875,002	447,875,002	447,875,002
නිකුත් කළ ණය සුරැකුම්	-	-	-	-	-	-	-	2,107,182	2,107,182	2,107,182
යටත් කාලීන ණය	-	17,690,269	46,337,407	64,027,676	64,358,855	-	17,690,269	46,084,522	63,774,791	64,105,970
එකතුව	-	17,690,269	490,445,384	508,135,653	508,466,832	-	17,690,269	496,066,706	513,756,975	514,088,154

2020 දෙසැම්බර් 31 දිනට	බැංකුව					සමූහය				
	සාධාරණ අගය				ධාරණ අගය	සාධාරණ අගය				ධාරණ අගය
	1 මට්ටම	2 මට්ටම	3 මට්ටම	එකතුව		1 මට්ටම	2 මට්ටම	3 මට්ටම	එකතුව	
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
වත්කම්										
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්										
- ණය සහ වෙනත් උපකරණ	588,945,728	4,428,239	177,716,688	771,090,655	724,390,172	589,216,875	4,428,239	177,716,688	771,361,802	725,579,585
ආයෝජන දේපළ	-	-	3,003,007	3,003,007	2,534,118	-	-	653,000	653,000	114,370
එකතුව	588,945,728	4,428,239	180,719,695	774,093,662	726,924,290	589,216,875	4,428,239	178,369,688	772,014,802	725,693,955
වගකීම්										
වෙනත් ණය ගැනීම්	-	-	180,884,127	180,884,127	180,884,127	-	-	185,102,055	185,102,055	185,102,055
නිකුත් කළ ණය සුරැකුම්	-	-	-	-	-	-	-	2,107,493	2,107,493	2,107,493
යටත් කාලීන ණය	-	17,258,196	54,248,009	71,506,205	64,637,407	-	17,258,196	54,248,009	71,506,205	64,627,397
එකතුව	-	17,258,196	235,132,136	252,390,332	245,521,534	-	17,258,196	241,457,557	258,715,753	251,836,945

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දැනටමත් මූල්‍ය ප්‍රකාශයන්හි සාධාරණ අගයට වාර්තා නොකරන මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගය නිර්ණය කිරීමේදී භාවිතා කල ක්‍රමවේදයන් සහ උපකල්පනයන් පහතින් විස්තර කෙරේ.

ක්‍රමක්ෂ පිරිවැයට මූල්‍ය වත්කම්

මේ යටතේ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර, රාජ්‍ය සහ සංස්ථාපිත ණය සුරුකුම්පත් වාර්තා කරයි.

විචල්‍ය අනුපාත ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර අර්ධ වාර්ෂිකව මිල නැවත තීරණය වන උපකරණ වෙයි. එම නිසා ඒවායේ ධාරණ අගය සාධාරණ අගයට දළ වශයෙන් සමාන බව උපකල්පනය කරනු ලැබේ. මිල ප්‍රකාශිත සංස්ථාපිත ණය සුරුකුම්පත් වාර්තා කරන දිනට ලැයිස්තුගත වෙළඳපොල මිල මත අගය කරන අතර මිල ප්‍රකාශිත රාජ්‍ය ණය සුරුකුම්පත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශිත ඵලදා අනුපාතය භාවිතා කරමින් අගය කරයි. මිල ප්‍රකාශ නොකළ ආයතනික ණය සුරුකුම්පත්හි සහ ස්ථාවර අනුපාත ශ්‍රී ලංකා සංවර්ධන බැදුම්කරද ඇතුලත් රාජ්‍ය සුරුකුම්පත්හි සාධාරණ අගය, එම වර්ගයට සමාන උපකරණයන්හි වාර්තා කරන දිනට පවතින පොළී අනුපාතය යටතේ ලැබිය හැකි අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන අගය පදනම්ව තක්සේරු කරනු ලැබේ.

ආයෝජන දේපළ

ආයෝජන දේපළ අගය කිරීම ස්වාධීන, වෘත්තීය තක්සේරුකරුවන් විසින් සිදු කරයි. මෙයට අදාළ වැඩි විස්තර සටහන් 33 යටතේ දක්වා ඇත.

ක්‍රමක්ෂ අගයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම්

ක්‍රමක්ෂ අගයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම් යටතේ දේශීය හා විදේශීය බැංකු හා මූල්‍ය ආයතන වලින් ගත් කාලීන ණය සහ ප්‍රතිමූල්‍ය ණය නියෝජනය කරයි.

කාලීන ණය ගැනීම් සහ ප්‍රතිමූල්‍ය ණය වල සාධාරණ අගය ඒ හා සමාන උපකරණයන්හි ඵලදායී පොළී අනුපාතය පදනම්ව අපේක්ෂිත අනාගත මූල්‍ය ප්‍රවාහයන් වට්ටම් කිරීමෙන් ඇස්තමේන්තු කරයි.

නිකුත් කළ ණය සුරුකුම්පත්

වාර්තා කරන දිනට ඒ හා සමාන උපකරණයන්හි පොළී අනුපාත පදනම්ව ණය සුරුකුම්පත් සඳහා ගෙවීමට අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන අගය පදනම්ව සාධාරණ අගය තක්සේරු කරනු ලබයි.

යටත් කාලීන වගකීම්

මේවා කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත අතර ඒවායෙහි වාර්තා කරන දිනට වෙළඳපොළ මිල පදනම්ව අගය කිරීම සිදු කරයි. වාර්තා කරන දිනට පවතින සමාන උපකරණ වල පොළී අනුපාතය පදනම්ව එම උපකරණ වලට ගෙවීමට බලාපොරොත්තුවන මුදල් ප්‍රවහයන්ගේ වර්තමාන වටිනාකම පදනම්ව මිල ප්‍රකාශ නොකළ යටත්කාලීන වගකීම් වල සාධාරණ අගය තක්සේරු කෙරේ.

63.3 ධාරණ අගය දළ වශයෙන් සාධාරණ අගයට සමාන වත්කම් හා වගකීම්

කෙටි කාලීන කල් පිරීමක් සහිත මූල්‍ය වත්කම්හි සහ වගකීම්හි ධාරණ අගය දළ වශයෙන් සාධාරණ අගයට සමාන බව උපකල්පනය කරන ලදී. වර්ෂයකට වඩා වැඩි කාලයක් සහිත ගිවිසුම්ගත කල් පිරීමක් සහිත සමහර උපකරණයන්හි සාධාරණ අගය සාධාරණ පදනම් භාවිතයෙන් තීරණය කරන ලදී. එම මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගය ස්ථාපනය කිරීම සඳහා බැංකුව භාවිතා කල පදනම් පහත දක්වා ඇත.

• ක්‍රමක්ෂ පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම්

මුළු ණය සහ අත්තිකාරම් කළඹින් 38% කට වැඩි ප්‍රමාණයක කල්පිරීමේ ඉතිරි ගිවිසුම්ගත කාලය අවුරුද්දකට වඩා අඩු අතර ඉතිරියෙන් බහුතරයක ණය ශේෂයන් ප්‍රදානය කර ඇත්තේ චල පොළී අනුපාතය මතය. එම නිසා ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය සහ අත්තිකාරම්හි සාධාරණ අගය වාර්තාකරණ දිනට දළ වශයෙන් එහි ධාරණ අගය වේ.

• ක්‍රමක්ෂ අගයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන්ට ගෙවිය යුතු

පාරිභෝගික තැන්පතු අතරින් 98% කට වැඩි ප්‍රමාණයක ඉල්ලූ විට ආපසු ගෙවිය යුතු හෝ ගිවිසුම්ගත කල් පිරීම අවුරුද්දට වඩා අඩු ඒවා වේ. අවුරුද්දකට වඩා වැඩි කල්පිරීමක් සහිත තැන්පතු කල් පිරීමට පෙර අවසන් කිරීමේ ප්‍රවණතාවයක් පවතී. කල්පිරීමට පෙර තැන්පතු ලබා ගැනීමේදී ගෙවන මුදල අදාළ දිනට තැන්පතුවෙහි ධාරණ අගයට සැලකිය යුතු වෙනසක් නොපෙන්වයි. එම නිසා ගනුදෙනුකාර තැන්පතුවල සාධාරණ අගය වාර්තාකරන දිනට දළ වශයෙන් ඒවායෙහි ධාරණ අගයට සමාන වේ.

දෙසැම්බර් 31 දිනට	2021		2020	
	ධාරණ අගය	සාධාරණ අගය	ධාරණ අගය	සාධාරණ අගය
	රු. '000	රු. '000	රු. '000	රු. '000
බැංකුව				
මූල්‍ය වත්කම්				
මුදල් සහ මුදල් හා සමාන දෑ	82,647,406	82,647,406	84,416,624	84,416,624
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	74,121,781	74,121,781	33,351,852	33,351,852
බැංකුවල ඇති තැන්පතු	4,957,417	4,957,417	27,615,851	27,615,851
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	2,074,474	2,074,474	2,001,047	2,001,047
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට ණය හා අත්තිකාරම්	2,413,762,291	2,413,762,291	1,988,409,007	1,988,409,007
මුළු මූල්‍ය වත්කම්	2,577,563,369	2,577,563,369	2,135,794,381	2,135,794,381
මූල්‍ය වගකීම්				
බැංකු වලට ගෙවිය යුතු	17,936,070	17,936,070	2,402,043	2,402,043
ප්‍රති මිලදීගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	162,156,413	162,156,413	57,106,652	57,106,652
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	2,866,894,010	2,866,894,010	2,474,775,488	2,474,775,488
මුළු මූල්‍ය වගකීම්	3,046,986,493	3,046,986,493	2,534,284,183	2,534,284,183
සමූහය				
මූල්‍ය වත්කම්				
මුදල් සහ මුදල් හා සමාන දෑ	82,313,908	82,313,908	83,198,445	83,198,445
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	74,121,781	74,121,781	33,351,852	33,351,852
බැංකුවල ඇති තැන්පතු	5,342,369	5,342,369	27,913,969	27,913,969
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	2,976,664	2,976,664	3,822,312	3,822,312
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට ණය හා අත්තිකාරම්	2,446,330,329	2,446,330,329	2,018,393,730	2,018,393,730
මුළු මූල්‍ය වත්කම්	2,611,085,051	2,611,085,051	2,166,680,308	2,166,680,308
මූල්‍ය වගකීම්				
බැංකු වලට ගෙවිය යුතු	18,646,339	18,646,339	2,628,434	2,628,434
ප්‍රති මිලදීගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	161,668,335	161,668,335	57,697,780	57,697,780
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	2,886,237,094	2,886,237,094	2,493,110,291	2,493,110,291
මුළු මූල්‍ය වගකීම්	3,066,551,768	3,066,551,768	2,553,436,505	2,553,436,505

63.4 මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් නැවත වර්ගීකරණය

2021 වර්ෂය තුළදී නැවත වර්ගීකරණය කිරීම් සිදු වී නොමැත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

64 අවදානම් කළමනාකරණය

64.1 හැඳින්වීම

64.1.1 දළ විශ්ලේෂණය

බැංකුකරණ ව්‍යාපාරයේ අවදානම ආවේනික අංගයක් වන අතර, බැංකුව මූල්‍ය අතරමැදිකරණයෙහි නිරත වන බැවින් ණය අවදානමට, වෙළඳපල අවදානමට, මෙහෙයුම් අවදානමට හා ද්‍රවශීලතා අවදානමට ප්‍රධාන වශයෙන් නිරාවරණය වේ. බැංකුවේ අඛණ්ඩ පැවැත්ම සහ තිරසාරභාවය සඳහා මෙම අවදානම් කළමනාකරණය ඉතා වැදගත් වේ.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) විසින් නිසි අධීක්ෂණයකින් යුතුව කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, මැනීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ බැංකුවේ පුළුල් අවදානම් කළමනාකරණ රාමුව (RMF) සපයයි. බැංකුවේ ආයතනික යහපාලනය සහ අවදානම් කළමනාකරණ රාමුවේ කොටසක් ලෙස මූල්‍ය අවදානම ඇතුළුව ක්‍රමෝපායික, කීර්තිය පිළිබඳ, අනුකූලතා සහ නෛතික අවදානම් ආදී බැංකුව මුහුණ දෙන අනෙකුත් ප්‍රධාන අවදානම් කළමනාකරණය කර අධීක්ෂණය කරනු ලැබේ.

මෙම සටහනේ ඉදිරිපත් කර ඇති තොරතුරු වන්නේ ඉහත දක්වා ඇති අවදානම් වලට නිරාවරණය වීම සහ එම අවදානම් මිනුම් කිරීමේ හා කළමනාකරණය කිරීමේ ක්‍රියාවලියයි.

ණය අවදානම	
64.2.2	ණය අවදානමට උපරිම නිරාවරණය
64.2.3	මූල්‍ය වත්කම් බාණ්ඩය අනුව ණය ගුණාත්මකභාවය
64.2.4	හානිකරණ සංචලනයන්
64.2.6	රටවල් අනුව නිරාවරණය
64.2.7	අංශ අනුව නිරාවරණය
64.2.8	බැඳීම් සහ ඇපකර
64.2.9	අපේක්ෂිත ණය අවදානම මත කළමනාකරණ ආවරණ
ද්‍රවශීලතා අවදානම	
64.3.1	ද්‍රවශීලතා අවදානමට නිරාවරණය වීම
64.3.2	මූල්‍ය වත්කම් හා වගකීම්වල කල්පිරීම විශ්ලේෂණය
වෙළඳපල අවදානම	
64.4.1	වෙළඳ සහ වෙළඳ නොවන කළඹ - බැංකුව
64.4.2	පොළී අනුපාත අවදානම
64.4.3	විදේශ විනිමය අවදානම
64.4.4	ස්කන්ධ අවදානම
මෙහෙයුම් අවදානම	
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය සහ ප්‍රාග්ධන කළමනාකරණය	

64.1.2 සමූහයේ අවදානම් කළමනාකරණය

ලංකා බැංකු සමූහය ඍජු හා වක්‍ර හිමිකම සහිත මූල්‍ය හා මූල්‍ය නොවන පරිපාලිත සමාගම් නවයකින් හා ආශ්‍රිත සමාගම් හතරකින් සමන්විත වේ. ඒවායේ මූලික ව්‍යාපාරික කටයුතු විවිධ ව්‍යාපාර අංශවලට පැතිරී ඇත. පරිපාලිත හා ආශ්‍රිත සමාගම්වල ශේෂ පත්‍ර ප්‍රමාණයන්ට අනුව ඒවායේ කටයුතු කීර්තිනාමය සඳහා ඇතිවිය හැකි හානියක් හැරුණු විට බැංකුවේ අවදානම් කළමනාකරණයට සැලකිය යුතු බලපෑමක් ඇති නොකරයි.

බැංකුව උපාය මාර්ගික අවදානම කළමනාකරණය කරනු ලබනුයේ ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුවේ (IRMC) අධීක්ෂණය යටතේ කාර්තු පදනම මත සිය සමූහ ව්‍යාපාර කටයුතු පුළුල් වශයෙන් විමර්ශනය කිරීමෙනි. බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරන අතර, එමඟින් අදාළ ආයතන වල අවදානම, අනුකූලතාවය සහ විගණන කටයුතු සඳහා සමීපව සම්බන්ධ වී කටයුතු කරයි. විශේෂ තත්ත්ව වලදී ලංකා බැංකුවේ අභ්‍යන්තර විගණක විසින් පරිපාලිතයන් විගණනය කරනු ලැබේ.

64.1.3 අවදානම් කළමනාකරණ රාමුව (RMF)

සමස්ත අවදානම් කළමනාකරණ රාමුවෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳව සහතිකයක් දෙමින් අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් කළමනාකරණ පාලන ව්‍යුහයේ පෙරමුණ ගනී. එම නිසා අවදානම් කළමණාකරන රාමුව බැංකුවෙහි අවදානම් අභිරුචිය, සීමා පැනවීම සහ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් මඟින් බැංකුවේ උපායමාර්ගික දිශාව සහ සමස්ත අවදානම් කළමනාකරණය සඳහා පරිපූර්ණ ප්‍රවේශයක් ස්ථාපිත කරයි. නියාමන සහ වෙළඳපල පරිසරයේ වෙනස්කම් ඇතුලත් කිරීම සඳහා මෙම ප්‍රතිපත්තීන් සහ රාමු නීතිපතා සමාලෝචනය කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ උපකමිටුවක් වන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට (IRMC) සෘජුවම වාර්තා කරනු ලබන ප්‍රධාන අවදානම් නිලධාරිවරයා (CRO) යටතේ බැංකුවෙහි ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) ස්ථාපිත කර ඇති අතර එම අංශය බැංකුවේ අවදානම් කළමනාකාරණයේ දෙවන මට්ටමේ ආරක්ෂණ ක්‍රමවේදයක් ලෙස ක්‍රියා කරනු ලබයි. බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරිවරයා, ණය කමිටුව, වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව (ALCO), මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව (ORMEC), තොරතුරු තාක්ෂණ හැසිරවීමේ කමිටුව, වංචනික අවදානම් කළමනාකරණ කමිටුව සහ අක්‍රීය ණය අත්තිකාරම් අධීක්ෂණ කමිටුව ආදී බැංකුව නිරාවරණය වන විවිධ අවදානම් කළමනාකරණය සඳහා දායක වන විධායක මට්ටමේ කමිටු රාශියකද සාමාජිකත්වය දරයි.

බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්ය්‍ය බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරිත්වය තෙවන මට්ටමේ ආරක්ෂණ ක්‍රමවේදයක් ලෙස ස්වාධීනව අධීක්ෂණය හා ඇගයීමට ලක් කර, අවදානම් කළමනාකරණය පිළිබඳ ඔවුන්ගේ අදහස් විගණන කමිටුවට ලබා දෙන අතර ව්‍යාපාරික අංශ විසින් පළමු මට්ටමේ ආරක්ෂණ ක්‍රමවේදයක් ලෙස ආශ්‍රිත අවදානම් ඇගයීම හා කළමණාකරණය කරයි.

64.1.4 අවදානම් මිනුම්කරණය, වාර්තාකරණය සහ අවම කිරීම

කර්මාන්තයේ හොඳම භාවිතයන් සමඟ අනුකූලව විවිධ උපක්‍රමශීලී ක්‍රම සහ මෙවලම් යොදා ගනිමින් ණය, වෙළඳපල, මෙහෙයුම්, ද්‍රවශීලතාව සහ අනෙකුත් අදාල අවදානම් මැනීම කරනු ලැබේ. දැනට පවත්නා පෙර නොපැවති ආර්ථික තත්ත්වය හේතුවෙන් අනාගත අවදානම් තක්සේරු කිරීම සඳහා බැංකුව විසින් විවිධ තත්කාර්ය විශ්ලේෂණයන් සිදුකර ඇති අතර අවම කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඉහළ කළමනාකාරිත්වය වෙත යොමුකර ඇත. ආතති සහගත ආර්ථික තත්වයක් තුළ පිළිගත හැකි සුළු, මධ්‍යස්ත හා දැඩි වශයෙන් අවදානම් මට්ටම් තුනක් මත පදනම්ව තනි සාධක, සාම්ප්‍රදායික නොවන ආතති පරීක්ෂණ බැංකුව විසින් සිදු කර ඇත.

මීට අමතරව අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මක ඇගයීමේ ක්‍රියාවලිය (ICAAP) බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන සැළසුම් සඳහා රාමුවක් ඉදිරිපත් කරන අතර එමඟින් බැංකුවට ඇති සියලුම අවදානම් වර්ග ආවරණය කිරීමට ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් ඇති බවට සහතිකයක් සපයයි. ස්ථම්භ I අවදානමට අමතරව ස්ථම්භ II අවදානම මැනීම සඳහා අන්තර්ජාතිකව පිලිගත් විවිධ තක්සේරු ක්‍රමවේද භාවිතා කරනු ලැබේ. වඩා හොඳ අවදානම් කළමනාකරණයක් සඳහා අවදානම් මිනුම් සහ විශ්ලේෂණයේ ප්‍රතිඵල වරින් වර ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරනු ලැබේ.

සමස්ත අවදානම් කළමනාකරණයෙහි කොටසක් ලෙස අවදානම අඩුකිරීම සඳහා බැංකුව විසින් අවදානම් අවම කිරීමේ ක්‍රම සහ උපායමාර්ග කිහිපයක් භාවිතා කරයි. ණය අවදානම් කළමනාකරණය කිරීමේදී බැංකුව සිය අවදානම් අඩු කිරීම සඳහා පුළුල් පූර්ව අනුමත කිරීමේ සහ පසු අනුමත කිරීමේ ක්‍රමවේදයන් භාවිතා කරයි. අලාභයන් තවදුරටත් අවම කිරීම සඳහා සුරැකුම් භාවිතා කරනු ලැබේ. සීමිත පරිසරයක් තුළ ව්‍යුත්පන්න උපකරණ භාවිතයෙන් වෙළඳපොළ අවදානම අවම කරනු ලැබේ. මෙහෙයුම් අවදානම් කළමනාකරණය කිරීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන අතර අවශ්‍ය අවස්ථාවන්හිදී මෙහෙයුම් අවදානම් විතැන්කිරීමේ උපායමාර්ගයක් ලෙස රක්ෂණය භාවිතා කරයි. වත්මන් ව්‍යාපාරික පරිසරය තුළ වඩාත්ම අවදානමට ලක්විය හැකි තොරතුරු තාක්ෂණ අවධානම, පුළුල් ප්‍රතිපත්තීන් සහ ප්‍රමිතීන් මඟින් කළමනාකරණය කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

64.2 ණය අවදානම

ණය ගනුදෙනු වලදී එකඟ වූ කොන්දේසි පැහැර හැරීමෙන් අනෙකුත් පාර්ශවයට අලාභ ඇතිවීමේ අවදානම ණය අවදානම වේ. පැහැරහැරීමෙන් හා සංකේන්ද්‍රණය වන ආකාරයෙන් ණය අවදානම ඇති විය හැක.

64.2.1 ණය අවදානම කළමනාකරණය

ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය මඟින් ගනුදෙනු හා කළඹ මට්ටමේ ණය ප්‍රදානය, පවත්වාගැනීම, අධීක්ෂණය හා කළමනාකරණයට අදාළ කොන්දේසි හා මඟපෙන්වීම් ලබා දේ. ණය අවදානම් කළමනාකරණ කාර්යය ව්‍යාපාර අංශ වලින් ස්වාධීන වන අතර ණය තීරණ ගැනීමේ ප්‍රමිතීන්, ක්‍රියාවලීන් සහ මූලධර්ම ආයතනික අංශයේ සහ ශාඛා අංශයේ නිරන්තරයෙන් ක්‍රියාත්මක වේ. සංකේන්ද්‍රණ අවදානම ඉවත් කිරීම පිණිස අවදානම් අභිරුචියට එරෙහිව ණයකරුවන් හා කර්මාන්ත විශේෂිත සංකේන්ද්‍රණයන් තක්සේරු කරමින් හා කළමනාකරණය කරමින් විවිධාංගීකරණය වූ ණය කළඹ පවත්වාගෙන යනු ලබයි. ක්‍රියාකාරී ලෙස අවදානම අවම කිරීම සඳහා බැංකුව විවිධාකාර උපායමාර්ග හා ක්‍රියාවලි භාවිතා කරයි.

බැංකුව විසින් නව ණය අනුමත කිරීම හා පවත්නා ණය අලුත් කිරීම සඳහා මනා ලෙස ස්ථාපනය කළ ක්‍රියාවලියක් අනුගමනය කරයි. ණය යාන්ත්‍රණයේ අවදානම් හිමිකරුවන් වන ගනුදෙනු ප්‍රාරම්භකයින් විසින් බැංකුවේ විභව ණය නිරාවරණය පළමුවෙන්ම ඇගයීම සිදු කරයි. ස්ථාපිත සීමාවන් ඉක්මවා ඇති ණය යෝජනා, ප්‍රධාන අවදානම් නිලධාරිවරයා විසින් ස්වාධීනව සමාලෝචනය කරනු ලැබේ.

	1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට සහ 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධනයන්ට අනුව බැංකුව නියාමනය වේ. තවද ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකුවේ විදේශීය ශාඛා ඇති රටවල නියාමනයන්, සුරැකුම්පත් හා විනිමය කොමිසම හා කොළඹ කොටස් හුවමාරුව මඟින් නිකුත් කර ඇති නියාමනයන්ට බැංකුව අනුකූල වන අතර බැංකුවට අදාළ වන නීති වලට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියා කරයි. ස්වාධීන වෘත්තීය උපදෙස් සඳහා ප්‍රවේශය අධ්‍යක්ෂවරුන්ට අවශ්‍ය වූ විට බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම සඳහා අනුමත ප්‍රතිපත්තිය මත ප්‍රවේශ විය හැකි අතර එය 2021 වසර තුළ සමාලෝචනය කර ඇත.
අ.1.4	සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවාවන්
	සියළුම අධ්‍යක්ෂවරුන්ට, නීතිඥවරියක් වන ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමියගෙන් උපදෙස් සහ සේවාවන් ලබා ගැනීමේ හැකියාව ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි පිළිබඳ සොයා බැලීමට, නීති හා රෙගුලාසි වලට අනුකූල වීම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා ලබා ගැනීම හා පවත්වාගෙන යාම සහ බැංකුවට අදාළ වාර්තා තබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු වේ. ලංකා බැංකුවේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, ඉවත් කිරීමේ අවශ්‍යතාවයන් පැන නැඟුන විට එය මුළු අධ්‍යක්ෂ මණ්ඩලය විසින්ම සැලකිල්ල යොමු කර ක්‍රියාවට නැංවිය යුතු කාර්යයක් වේ.
අ.1.5	ස්වාධීන විනිශ්චය
	ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපායමාර්ගික සැළසුම්, කාර්යසාධනය, සම්පත් විභාජනය, අවදානම් කළමනාකරණය, අනුකූල වීම් හා සම්මතයන් පවත්වාගෙන යාමට අදාළ කාර්යයන් හා වගකීම් වලදී ස්වාධීන විනිශ්චයන් දරනු ලැබේ.
අ.1.6	අධ්‍යක්ෂ මණ්ඩලයේ හා බැංකුවේ කටයුතු සඳහා ප්‍රමාණවත් පරිදි කාලය වෙන් කිරීම හා කැපවීම
	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට දින හතකට පෙර න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ආරක්ෂිත විද්‍යුත් මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සලස්වන අතර එමඟින් වැඩිදුර තොරතුරු සොයා බැලීමට හා අවශ්‍ය දත්ත ගැන විමසීමට ප්‍රමාණවත් කාලයක් ලැබී ඇත. පූර්ව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවශ්‍ය යැයි සැලකෙන විට සැලසුම් කර ඇත,
අ.1.7	යෝජනාවන් ඉදිරිපත් කිරීම
	බැංකුවේ කටයුතු පිළිබඳව බැංකුවේ යහපත උදෙසා අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් හට තනි තනිව තමන්ගේ යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීමට ඉඩ ප්‍රස්ථා සලසා ඇත.
අ.1.8	අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණු වීම්
	බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පළමු වරට පත් වීමේදී හඳුන්වාදීමේ වැඩසටහනකට සහභාගි වීමට අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව සැලසෙන අතර එහිදී බැංකුවට අදාළ නියාමන අවශ්‍යතාවන්, බැංකුවේ ඉතිහාසය, සංවිධාන ව්‍යුහය, බැංකුවේ පරිපාලිතයන් හා ආශ්‍රිතයන් පිළිබඳ විස්තර, බැංකුවේ නිෂ්පාදන හා සේවා පිළිබඳ විස්තර ද අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ද ඇතුළත් සවිස්තරාත්මක ලිපිගොනුවක් ලබාදෙන අතර දත්ත ලබා ගැනීම සඳහා ආරක්ෂිත විද්‍යුත් මාධ්‍යයට පිවිසීමට ඉඩ සලස්වනු ලැබේ. පුහුණු සැසි සඳහා සහභාගී වීමට අධ්‍යක්ෂවරුන් උනන්දු කරවන අතර බැංකුවේ බාහිර පරිසරයේ වර්තමාන සහ නව්‍ය උපායමාර්ගයන්, පිළිබඳව බැංකුවේ ආයතනික කළමනාකාරිත්වය මඟින් හෝ බාහිර සම්පත් දායකයකු මඟින් හෝ විස්තරාත්මකව පැහැදිලි කිරීම් සිදු කෙරේ. වසර තුළ සමහර අධ්‍යක්ෂවරු යහපාලනය පිළිබඳ වැඩසටහනකට සහභාගි වී ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2017 සංග්‍රහයට අනුකූලතා

පරිච්ඡේදය	අනුකූල වීමේ මට්ටම
අ.2	**සභාපති හා ප්‍රධාන විධායක නිලධාරිතුමා අතර වගකීම් විභාජනය**
	ලංකා බැංකුවේ සභාපති තනතුර හා ප්‍රධාන විධායක නිලධාරී තනතුර (ලංකා බැංකුවේ මහා කළමනාකරු) පුද්ගලයන් දෙදෙනෙකු විසින් දරණු ලබයි. සභාපති, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. බැංකුව විසින් නිකුත් කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියට අනුව ලංකා බැංකුවේ සභාපතිතුමාගේ හා මහා කළමනාකාරතුමාගේ වගකීම් ඉතා පැහැදිලිව දක්වා ඇත.
අ.3	**සභාපතිතුමාගේ භූමිකාව**
	බැංකුවේ සභාපතිතුමා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබාදෙන අතර අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු සාර්ථකව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම සපයනු ලැබේ. මහා කළමනාකාරතුමා විසින් ඉදිරිපත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ අධ්‍යක්ෂවරුන් විසින් ඉදිරිපත් කරන ලද වෙනත් අදාල කරුණු වලට අනුව ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය සභාපතිතුමාගේ අවසරයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍ර සකස් කරයි. ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය විසින් සකස් කරන ලද න්‍යාය පත්‍රය සභාපතිතුමා විසින් අනුමත කරයි. උපායමාර්ග, කාර්යසාධනය, සම්පත් විභජනය, අවදානම් කළමනාකරණය හා අනුකූල වීම යන සියළු ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි මෙම න්‍යාය පත්‍ර සකස් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට දින හතකට පෙර අදාල කරුණු පිළිබඳ ප්‍රමාණවත් විස්තර ඇතුලත් න්‍යාය පත්‍රය ආරක්ෂිත විද්‍යුත් මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සැලැස්වේ. සියළුම අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ යුතුකම් හා වගකීම් ද (අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ දක්වා ඇති පරිදි) අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවල ව්‍යුහයද පැහැදිලිව ප්‍රකාශ කිරීම හේතු කොට ගෙන සිය වගකීම් නිසි ආකාරයෙන් ඉටු කිරීමට ඉඩ ප්‍රස්ථාව සැලසේ. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වන අතර ඔවුන් විසින් ඔවුන්ගේ හැකියාවන් මත බැංකුවේ සාර්ථකත්වයට උපරිම දායකත්වය ලබා දෙයි. සියළුම අධ්‍යක්ෂවරුන්ට රැස්වීම් න්‍යාය පත්‍රයට අදාළ කරුණු පිළිබඳ සාකච්ඡා කිරීමට හා අවශ්‍ය වැඩිදුර දැත්ත ලබා ගැනීම සඳහා ඉඩ ප්‍රස්ථා සලසා දී ඇති අතර ආයතනිකමය වශයෙන් වැදගත් යැයි හැඟෙන කරුණු න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට ඉල්ලා සිටීමට අවස්ථාව සලසා ඇත. සැලකිල්ලට භාජනය කරන ලද ගැටළු පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ අදහස් තහවුරු කරනු ලබන අතර, එවැනි සාකච්ඡාවන් පිළිබඳ විස්තරාත්මකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවේ සටහන් කර ඇත.
අ.4	**මූල්‍ය නිපුණතාවය**
	බැංකුවේ කටයුතුවලට මඟපෙන්වීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය දැනුමක් හා නිපුණතාවයක් අධ්‍යක්ෂවරුන් සතුව ඇති අතර ඒ සඳහා ඔවුන්ට තම ව්‍යාපාර/ වෘත්තීය තුළින් ලද පෙරහුරුවන් මහෝපකාරී වේ.
අ.5	**අධ්‍යක්ෂ මණ්ඩලයේ සමතුලිතතාවය**
	ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සෑම විටම විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. විකල්ප අධ්‍යක්ෂවරුන් පත්වන අවස්ථා වලදී ද ඔවුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වීම අනිවාර්ය වේ.
අ.6	**කාලීන තොරතුරු සැපයීම**
	න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු පත්‍රිකා අදාළ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු රැස්වීම් වලට දින හතකට පෙර ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සැලැස්වීම මඟින් ඒ සඳහා තොරතුරු සොයා බැලීමට අධ්‍යක්ෂවරුන්ට ප්‍රමාණවත් කාලයක් ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සුමටව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය අවස්ථා වලදී අවශ්‍ය කරුණු පැහැදිලි කර ගැනීම සඳහා පුර්ව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය කරනු ලැබේ. පැහැදිලි කිරීම් කටයුතු සඳහා ආයතනික කළමනාකාරිත්වයේ අදාළ සාමාජිකයන් සුදානම්ව සිටී. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ සිට දින 10 ක් ඇතුළත දී එහි වාර්තාව අධ්‍යක්ෂවරුන්ට ලබා ගැනීමට ඉඩ සලස්වා ඇත.
අ.7	**අධ්‍යක්ෂ මණ්ඩල සඳහා පත්වීම්**
	ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් තම විෂය පථයට බැංකුව අයත්වන අමාත්‍යවරයා විසින් බැංකු ආඥා පනත හා එහි සංශෝධන හා අදාළ නීතිරීති වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම් කරනු ලැබේ. එමෙන්ම අදාළ අමාත්‍යාංශ සමඟ හුවමාරු කරගත් අධ්‍යක්ෂවරුන් පත් කිරීමට අදාල අභ්‍යන්තර ප්‍රතිපත්තියක් බැංකුව සතුව පවතී.
අ.8	**නැවත පත් කිරීම**
	තම සේවා කාලයට ප්‍රථම අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් කළහොත් හෝ 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතට අනුව ධූරය හෙබවීමෙන් ඉවත් වුවහොත් හැර සෑම අධ්‍යක්ෂවරයෙකුම අවුරුදු තුනක සේවා කාලයක් සඳහා පත් කරනු ලබන අතර මෙම අවස්ථා දෙකෙහිදීම බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස නැවත පත් වීමට බාධාවක් ඇති නොවේ. ධූරයෙන් ඉල්ලා අස්වීම පත් වූ අධ්‍යක්ෂවරයෙකු තම අධ්‍යක්ෂ ධූරයෙන් ඉල්ලා අස්වන විට හා සේවා කාලය අවසන් වනවිට තම ඉල්ලා අස්වීමේ ලිපිය බැංකු කටයුතු විෂය භාර අමාත්‍යවරයාට ලිඛිතව ලබාදිය යුතුවේ. තවද විශේෂ හේතුවක් මත සේවයෙන් ඉවත් වන්නේ නම් එයද තම ලිපියෙහි සඳහන් කළ යුතුවේ. වසර තුළ කිසිදු අධ්‍යක්ෂවරයෙකු ඉල්ලා අස්වී නැත.

පරිච්ඡේදය	අනුකූල වීමේ මට්ටම
අ.9	**අධ්‍යක්ෂ මණ්ඩලයේ හා එහි උපකමිටු වල කාර්යසාධනය ඇගයීම**
	අධ්‍යක්ෂ මණ්ඩලයේ හා උපකමිටු වල අදාළ ඉලක්ක නිවැරදිව ළඟා කර ගනිමින් අදාළ කමිටු වගකීම් තෘප්තිමත් විය හැකි අයුරින් ඉටුකර ඇති බව තහවුරු කර ගැනීමට ස්වයං ඇගයීම් ක්‍රියාවලියක අධ්‍යක්ෂ මණ්ඩලය සහ අදාළ උපකමිටු නිරත වේ. එම කමිටු සියල්ලේම සාමූහික ප්‍රතිඵලය අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සමාලෝචනය කරනු ලැබේ. මෙම වර්ෂයේදී මෙම ස්වයං ඇගයීම් හා සමාලෝචන ක්‍රියාවලිය සිදු කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු සාමාජිකන් එම උපකමිටු වල කාර්යසාධනයන් හි ඵලදායකත්වය සහ කාර්යක්ෂමත්වය සාමුහිකව ඇගයීමට ලක් කරන ලදී.
අ.10	**අධ්‍යක්ෂවරු සම්බන්ධයෙන් තොරතුරු වාර්ෂික වාර්තාවෙන් අනාවරණය කිරීම**
	අධ්‍යක්ෂවරු හා සම්බන්ධ පහත සඳහන් තොරතුරු වාර්ෂික වාර්තාවේ සඳහන් වේ. නම, සුදුසුකම්, ප්‍රවිණතාවය දක්වන ක්ෂේත්‍ර, විධායක හෝ විධායක නොවන බව ද ඇතුළුව අධ්‍යක්ෂවරුන්ට අදාළ විස්තර පිටු අංක 19 සිට 21 දක්වා ඇත. සම්බන්ධිත පාර්ශ්ව විස්තර පිටු අංක 271 සහ 272 දක්වා ඇත. වෙනත් ආයතන වල දරණ අධ්‍යක්ෂධූර පිළිබඳ විස්තර පිටු අංක 19 සිට 21 දක්වා ඇත. උපකමිටු වල සමාජිකත්වය, වර්ෂය තුළ පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල හා උපකමිටු රැස්වීම් වල සහභාගීත්වය පිළිබඳ පිටු අංක 88 හි දක්වා ඇත.
අ.11	**ප්‍රධාන විධායක නිලධාරී/ මහා කළමනාකරු ඇගයීම**
	මහා කළමනාකාරතුමාගේ වාර්ෂික කාර්යසාධන වාර්තාව මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව මඟින් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන අතර කාර්යසාධනය මැන බැලීමට ගන්නා නිර්ණායක ලෙස බැංකුව අදාළ වර්ෂය තුළ ළඟා කරගත් ඉලක්ක හා ඊට අනුබද්ධිතව ඇති වර්ෂය ආරම්භයේ සකස් කල ආයතනික සැලැස්ම යොදා ගනී.
ආ	**අධ්‍යක්ෂ පාරිශ්‍රමික**
ආ.1	සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය (සියළුම විධායක නොවන) සඳහා පාරිශ්‍රමික ගෙවීමේ විධිමත් ක්‍රමවේදයක් ඇති අතර එය අදාළ අමාත්‍යංශය හරහා කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන චක්‍රලේඛ සහ අනෙකුත් ව්‍යවස්ථාපිත නීති රීති වලට අනුකූලව ද සිදු කරනු ලබයි.
ආ.2	බැංකුවේ මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවට, අධ්‍යක්ෂවරුන්ගේ දීමනා පිළිබඳ තීරණ ගැනීමට බලයක් නොමැත. (එහෙත් ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්ගේ පාරිශ්‍රමික සඳහා නිර්දේශයන් ඉදිරිපත් කිරීමට බලය ඇත).
ආ.3	**පාරිශ්‍රමික පිළිබඳ හෙළිදරව් කිරීම**
	සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලයේ වැටුප් ප්‍රතිපත්තිය තුළ අන්තර්ගත කරුණු මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 92 හි දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවූ මුළු පාරිශ්‍රමික පිළිබඳව පිටු අංක 165 හි දක්වා ඇත. මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සංයුතිය පිටු අංක 96 හි දක්වා ඇත.
ඇ	**කොටස්කරුවන් හා ඇති සම්බන්ධය**
ඇ.1	බැංකුවේ එකම කොටස් හිමියා ශ්‍රී ලංකා රජය වන අතර බැංකුව හා කොටස් හිමියා අතර විවිධ ආකාරයෙන් සන්නිවේදන කටයුතු සිදු වේ. ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් නිලධාරියෙක් (මුදල් අමාත්‍යංශ නිලධාරියෙකු) බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරන අතර වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සිදුවේ. වාර්ෂික වාර්තාව පිළිබඳ විමසීම් කිරීම් සඳහා පාර්ලිමේන්තුවේදී ඉඩ ප්‍රස්ථාව සලසා ඇත.
ඇ.2	**අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කල සන්නිවේදන ප්‍රතිපත්තියක් ඇත.**
	බැංකුවේ කොටස්කරු වශයෙන් රජය සතුව පවතින බැංකුවට අදාළ වන ප්‍රධාන ගැටළු හා විශේෂිත අංශයන් පිළිබඳ සාකච්ඡා කිරීම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සිදු කරන අතර එහිදී රජයේ ප්‍රධාන නියෝජිතයා හා අවශ්‍ය වූ විට අමාත්‍යංශයේ උසස් නිලධාරීන් සහභාගි වේ. සමාලෝචනය කරන ලද වර්ෂය තුළ සන්නිවේදන ප්‍රතිපත්තිය සංශෝධනය කරන ලදී.
ඇ.3	තවද 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත, 1988 අංක 30 දරණ බැංකු පනත, සුරුකුම්පත් හා විනිමය කොමිසම් පනත හා ඒවාහි සංශෝධන, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කළ නීති රීති වලට අදාළව අධ්‍යක්ෂවරු විසින් අදාළ අමාත්‍යංශයට/ අමාත්‍යවරයාට බැංකුවේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශාල සැලකිය යුතු වැදගත්කමක් සහිත ගනුදෙනු පිළිබඳ අවශ්‍ය වූ විට අනාවරණය කරනු ලැබේ. පිටු අංක 271 සහ 277 හි ඇතුළත් මූල්‍ය ගනුදෙනු වලට අමතරව බැංකුවේ කාර්යසාධනය/ ලාභදායීත්වය හෝ ශුද්ධ වත්කම් පදනමට ප්‍රමාණාත්මක ලෙස බලපාන පරිදි කිසිදු සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවක් අදාළ වර්ෂය තුළ සිදු වී නැත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2017 සංග්‍රහයට අනුකූලතා

පරිච්ඡේදය	අනුකූල වීමේ මට්ටම
අ	**වගවීම හා විගණනය**
අ.1	මූල්‍ය හා ව්‍යාපාර වාර්තාකරණය (වාර්ෂික වාර්තාව)
	අදාළ මිනුම් දණ්ඩ භාවිතා කර බැංකුවේ මූල්‍ය තත්ත්වය, බැංකුවේ කාර්යසාධනය, ව්‍යාපාර ආකෘතිය, පාලන ව්‍යුහය, අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලන හා අභියෝග, අවස්ථාවන් හා අපේක්ෂා පිළිබඳ වාර්තා පහසුවෙන් තේරුම් ගත හැකි ආකාරයෙන් මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇත.
	අදාළ නීති නියාමන හා මඟ පෙන්වීම් වලට අනුකූලව මූල්‍ය වාර්තා සකස් කර ඇති අතර සැලකිය යුතු අපගමන අවස්ථා වලදී සාධාරණ පැහැදිලි කිරීම් ද මෙම වාර්ෂික වාර්තාව තුළ ඇතුළත් කර ඇත.
	ව්‍යවස්ථාපිත අවශ්‍යතා, වෙනත් නියාමන ආයතන වලට ලබා දෙන වාර්තා, අතුරු සහ වෙනත් මිල සංවේදී ප්‍රසිද්ධ වාර්තා පිළියෙල කිරීමේදී සමතුලිත සහ පහසුවෙන් අවබෝධ කරගත හැකි අයුරින් පිළියෙල කර ඇති බව තහවුරු කරයි.
	බැංකුවේ සහ සමූහයේ මූල්‍ය වාර්තා සත්‍ය හා සාධාරණ බවට ප්‍රධාන මූල්‍ය නිලධාරී හා මහා කළමනාකාරතුමන් විසින් සහතික කරයි. සියළු මූල්‍ය වාර්තා ප්‍රසිද්ධ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට පෙර විගණන කමිටුව මඟින් සමාලෝචනය කර අනුමැතිය සඳහා නිර්දේශ කරයි.
	අනුකූලතා අනාවරණ අවශ්‍යතා සපුරාලීම සඳහා පහත ප්‍රකාශන වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇත.
	බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව පිටු අංක 115 සිට 119 දක්වා ඇත.
	මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව පිටු අංක 122 සිට 123 දක්වා ඇත. අඟය චිකතු කිරීම යටතේ කළමනාකරණ සාකච්ඡා හා විශ්ලේෂණ පිටු අංක 52 සිට 80 දක්වා ඇත.
	ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම හා ඔවුන්ට සම්බන්ධිත පාර්ශ්ව මඟින් කළ ගනුදෙනු පිළිබඳ සාරාංශය පිටු අංක 271 සහ 272 ඇත.
	මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිටු අංක 125 හි ඇත. විගණකාධිපති වාර්තාව පිටු අංක 126 සිට 129 දක්වා ඇත.
අ.2	පවතින අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලන විධි
	බැංකුවේ උපායමාර්ගික අරමුණු ළඟා කර ගැනීමට යාමේදී ඇතිවිය හැකි ප්‍රධාන අවදානම් වල ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ. බැංකුවේ ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මඟින් බැංකුවේ පැවැත්ම, අවදානම් කළමනාකරණ වැඩසටහන් වල මෙහෙයුම් හා කාර්යක්ෂමතාවය, බැංකුවට බලපෑ හැකි විවිධ අවදානම් වළක්වා ගැනීම සඳහා ඇති ප්‍රතිපත්ති හා භාවිතයන් ද ඊට අදාළ අනුකූලතා පිළිබඳ විස්තරද සපයමින් අධ්‍යක්ෂ මණ්ඩලයට පහසුකම් සලසයි.
	බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ මෙහෙයුම් කටයුතු, මූල්‍ය හා අනුකූලතා කටයුතු නිවැරදිව හැසිරවීම විගණන කමිටුවේ තවත් වගකීමක් වේ. බැංකුවේ අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලන පද්ධති සුපරීක්ෂණය සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හා විගණන කමිටුව පත් කර ඇති අතර එම කමිටු වල කාර්යක්ෂමතාව වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කෙරේ. බැංකුව සතුව සියළු අංශ වලින් පරිපූර්ණ වූ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවක් ඇති අතර එමඟින් අභ්‍යන්තර විගණන කටයුතු පරීක්ෂාවට ලක්විය. බැංකුවේ බාහිර විගණක ලෙස විගණකාධිපති කටයුතු කරයි.
අ.3	විගණන කමිටුව
	සමාලෝචිත වසර තුළ බැංකුවේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් පමණක් සමන්විත විය. එම වසර තුළ විගණන කමිටුවේ සභාපතිධූරය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විසින් හෙබවීය. විගණන කමිටුවේ සභාපති ඇතුළු සාමාජිකයන් මූල්‍ය වාර්තාකරණය හා මූල්‍ය තත්ත්ව පාලනය පිළිබඳ මනා දැනුමකින් හා අත්දැකීම් වලින් පරිපූර්ණ අය වේ.
	අධීක්ෂණ වගකීම් ඉටුකිරීමේදී විගණන කමිටුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.
	විගණන කමිටුව විසින් අවදානම් කළමනාකරණය පිළිබඳ ක්‍රියාකාරිත්වය හා කාර්යක්ෂමතාවයන් පිළිබඳ සමාලෝචන පැවැත්වීම, අභ්‍යන්තර විගණනය හා විගණන වාර්තා කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. විගණන කමිටුවේ කාර්යභාරය හා වගකීම් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 93 හි ඇති විගණන කමිටු වාර්තාවේ හෙළිදරව් කර ඇත.
	විගණන කමිටුව සඳහා ලිඛිත නියමයන් නියම කර ඇති අතර එහි භූමිකාව සහ වගකීම් පැහැදිලිව නිර්වචනය කරයි. එමෙන්ම එය වර්ෂය තුළ සමාලෝචනය කරන ලදී සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කමිටුව විසින් සිදු කරන ලද කාර්යයන් මෙම වාර්තාවේ පිටු අංක 93 සඳහන් කර ඇත.
අ.4	සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු
	සම්බන්ධිත පාර්ශ්ව, ඔවුන්ගේ ගනුදෙනු හා සම්බන්ධිත පාර්ශ්වයන්ට වඩා වාසිදායක සැලකිල්ලක් පිරිනැමීම සීමා කිරීම ආවරණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියක් ඇති අතර, එහි අරමුණ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් තීරණ ගැනීමේදී අනවශ්‍ය ලෙස බලපෑම් කිරීමට ඇති බැඳියාව වලක්වාලීමයි.
	ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම් හා ඔවුන්ගේ ආසන්න පවුලේ සාමාජිකයන් විසින් සිදුකළ ගනුදෙනු පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් ප්‍රකාශයේ පිටු අංක 271 සහ 272 තුළ ඇතුළත් වේ.
අ.5	ව්‍යාපාර හැසිරවීම හා ආචාරධර්ම සංග්‍රහය
	අදාළ නියාමනයන් හා ප්‍රතිපත්ති වලට අනුකූල වීම සඳහා බැංකුව විසින් එහි සේවකයන්ට හා අධ්‍යක්ෂ මණ්ඩලයට වෙන වෙනම ආචාරධර්ම සංග්‍රහයන් පවත්වා ගෙන යන අතර ඒවා පිළිගැනීම සඳහා ප්‍රතිඥා ලබාදේ.

පරිච්ඡේදය	අනුකූල වීමේ මට්ටම
ඇ.6	ආයතනික යහපාලන අනාවරණය
	හොඳ ආයතනික යහපාලන පුරුදු සමඟ අනුගත වීමට අදාළ තොරතුරු මෙම වාර්තාවේ ආයතනික යහපාලන වාර්තාවේ පිටු අංක 82 සිට 92 දක්වා ඇතුලත් වේ.
ඉ.1, ඉ.2	**කොටස් හිමිකාරිත්වය**
	බැංකුවේ විකම කොටස් හිමියා ශ්‍රී ලංකා රජයයි.
ඊ	**අන්තර්ජාලය හා සයිබර් අවකාශයේ සුරක්ෂිතතාව**
	බැංකුවේ ව්‍යාපාර ක්‍රමවේදය පවත්වා ගැනීමට භාවිතා වන තොරතුරු තාක්ෂණික මෙවලම් හරහා බැංකු පරිසරය තුළ හා ඉන් පිටත හුවමාරුවීම හේතු කොටගෙන බැංකුවට බලපෑ හැකි සයිබර් අවකාශ අවදානම හඳුනා ගැනීමේ ක්‍රියාපිලිවෙලක් බැංකුව සතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලත් තොරතුරු සුරක්ෂණ ප්‍රතිපත්තිය, කළමනාකාරිත්වයට බැංකුවේ තොරතුරු සුරක්ෂිතභාවය තහවුරු කරලීමට අවශ්‍ය දිශානතිය සපයයි. මීට අමතරව, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මඟින් බැංකුව, සයිබර් අවකාශ අවදානම් වලින් මිදීමට නිර්දේශිත පිළිවෙත් අනුගමනය කරන බවට සහතික වේ. සයිබර් අවකාශ අවදානම් වලින් ආරක්ෂා වීමට හා තත්ත්වය සමනය කිරීමට බැංකුව භාවිතා කරන ක්‍රියා පිලිවෙත් මෙම වාර්ෂික වාර්තාවේ අවදානම් කළමනාකරණ වාර්තාවේ පිටු අංක 111 හි දක්වා ඇත. සයිබර් අවකාශීය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම උදෙසා බැංකුව විසින් ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරියෙකු පත්කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව අධ්‍යක්ෂවරුන් හට බැංකුවට අදාළව තොරතුරු තාක්ෂණය සම්බන්ධ කාර්යයන්ට අදාළ තීරණ ගැනීමේදී හා අධීක්ෂණ කටයුතු වලදී මනා පිටුවහලක් වේ.
උ	**පරිසරය, සමාජීය සහ යහපාලනය** (ESG)
	මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 8 සිට 9 දක්වා පරිසරය, සමාජීය සහ පාලනයට අදාල අනාවරණය කිරීම ඇතුළත් වේ.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2021 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (1) අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්		
3 (1) (i)	පහත සඳහන් දෑ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම තුළින් බැංකුවේ ආරක්ෂාව හා අඛණ්ඩතාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශක්තිමත් කර ඇත.	
	(අ) බැංකුවේ උපායමාර්ගික අරමුණු හා ආයතනික වටිනාකම් අනුමත කිරීම හා අධීක්ෂණය කිරීමත් ඒවා බැංකුව තුළ සන්නිවේදනය කිරීම.	අනුකූල වී ඇත. උපායමාර්ගික අරමුණු සකස් කිරීම සහ ආයතනික වටිනාකම් සමාලෝචනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ඉහළ කළමනාකාරිත්වයේ සහභාගිත්වය ඇතුව සිදු කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනික සැලැස්ම සහ ආයතනික වටිනාකම් පිළිබඳව ශාඛා කළමනාකරුවන් දක්වා වූ සියලු කාර්ය මණ්ඩලයට සන්නිවේදනය කිරීම සිදු කරන ලදී. නිරන්තරයෙන් පවත්වන ලද සාකච්ඡා සැසි සහ රැස්වීම් හරහා අනෙකුත් සියළුම කාර්ය මණ්ඩල මේ පිළිබඳව දැනුවත් කරන ලදී. 2020 සිට කොවිඩ්-19 වසංගතය සහ නව සාමාන්‍ය පරිසරයේ ප්‍රතිපලයක් ලෙස දේශීය සහ ගෝලීය ආර්ථික අස්ථාවරත්වය සැලකිල්ලට ගනිමින් 2022-2024 සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ ආයතනික සැලැස්ම ද පිළියෙල කර ඇත. තවද, ආයතනික වටිනාකම් අභ්‍යන්තර ජාලයට ඇතුළත් කර ඇත.
	(ආ) අඩුම වශයෙන් ඊළඟ වසර තුන සඳහා සමස්ථ අවදානම් ප්‍රතිපත්තිය හා අවදානම් කළමනාකරණ පටිපාටීන් සහ මැනිය හැකි අරමුණු සහිත යාන්ත්‍රණයන් ඇතුළත් බැංකුවේ සමස්ථ වෙළඳ කටයුතු පිළිබඳව උපායමාර්ග අනුමත කිරීම.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද, වසරක් පාසා සංශෝධනය වන, වසර තුනක කාලයක් සඳහා වූ ආයතනික සැලැස්ම හා ඊට සමගාමී ක්‍රියාකාරී සැලැස්ම තුළ බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපායමාර්ග ඇතුලත් වේ. උපායමාර්ගික සැලසුම සමඟ යමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවදානම් අභිරුචිය, ප්‍රතිපත්තිය, කළමනාකරණ රාමුව සහ යාන්ත්‍රණය අනුමත කර ඇත. සමස්ථ බැංකුවට මැනිය හැකි ඉලක්ක පිහිටුවා ඇති අතර, එම ඉලක්කයන් පදනම්ව කාර්යඵලයන් ඇගයීම සිදු කරයි.
	(ඇ) ප්‍රධාන අවදානම් හඳුනා ගැනීම හා විචක්ෂණ ලෙස අවදානම් කළමනාකරණය කිරීම සඳහා යෝග්‍ය පද්ධති ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.	අනුකූල වී ඇත. බැංකුවේ අවදානම් ප්‍රතිපත්තිය අනුමත කිරීම, අවදානම් අභිරුචිය නිර්වචනය කිරීම, ප්‍රධාන අවදානම් හඳුනා ගැනීම, පාලන ව්‍යුහයක් ඇති කිරීම, ප්‍රධාන අවදානම් මැනීම, අධීක්ෂණය හා පාලන සහ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම ආදිය අරමුණු කරගෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කම්ටුව පිහිටුවා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් විසින් නව උපායමාර්ග හා එමගින් පැන නඟින අවදානම් තවදුරටත් අවම කිරීමේ ක්‍රම හා උපක්‍රම සම්බන්ධයෙන් පුළුල් ලෙස සාකච්ඡා කරන ක්‍රියාවලියක් බැංකුව ආරම්භ කර ඇත. අවදානම් සම්බන්ධ සියළුම පැතිකඩ ආවරණය කරන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ සංශෝධිත අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ. පහත වාර්තා මඟින් මේ පිළිබඳ වැඩි දුර තොරතුරු සපයනු ලැබේ: • පිටු 100 සිට 113 දක්වා අවදානම් කළමනාකරණ වාර්තාව • පිටු 94 සිට පිටු 95 දක්වා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ වාර්තාව,
	(ඈ) තැන්පත්කරුවන්, ණයහිමියන්, කොටස්කරුවන් සහ ණයගැතියන් ඇතුළු උනන්දුවක් දක්වන සියළුම පාර්ශ්වයන් සමඟ සන්නිවේදනය කිරීම සඳහා වූ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම අනුමත කිරීම.	අනුකූල වී ඇත. සමාලෝචනය කරන ලද වර්ෂය තුළ උනන්දුවක් දක්වන සෑම පාර්ශ්වයක්ම ආවරණය වන පරිදි සන්නිවේදන ප්‍රතිපත්තියක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ක්‍රියාත්මක කර ඇත.
	(ඉ) බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රම සහ කළමනාකරණ තොරතුරු පද්ධතීන්හි ප්‍රමාණාත්මකභාවය සහ විශ්වසනීයත්වය විමර්ශනය කිරීම.	අනුකූල වී ඇත. බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ මූල්‍ය වාර්තාකරණයේ ප්‍රමාණාත්මකභාවය හා අඛණ්ඩභාවය සමාලෝචනය කිරීම විගණන කම්ටුවට පැවරී ඇත. මෙම කටයුතු සිදු කිරීමට විගණන කම්ටුව ඔවුන්ට සෘජුව වාර්තා කරන අභ්‍යන්තර විගණන දෙපාර්තුමේන්තුවෙන් වාර්තා ලබා ගන්නා අතර, බාහිර විගණකයින්ගෙන්ද වාර්තා ලබා ගනී. විගණන කම්ටුව විසින් තවදුරටත් අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා වන මෙවලමක් වශයෙන් නියාමකයින්ගේ සොයාගැනීම් නිවැරදි කිරීම් නිති පතා පසු විපරම් කරයි. කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායිත්වය ඇගයීම, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ වගකීමක් වන අතර ඔවුන් විසින් ඒ සඳහා තොරතුරු පද්ධති විගණනය සිදු කරන ලදී. අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණාත්මකභාවය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර ඇත.
	(ඊ) ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් හඳුනා ගැනීම හා නම් කිරීම.	අනුකූල වී ඇත. මහා කළමනාකරු, අතිරේක මහා කළමනාකරු, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මහා කළමනාකරුවන්, නියෝජ්‍ය මහා කළමනාකරුවන්, සහකාර මහා කළමනාකරුවන් සහ ඊට සමාන ශ්‍රේණිවලට අයත් නිලධාරීන් බැංකුවේ ආයතනික යහපාලන අරමුණු යටතේ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්/ නිලධාරීන් (KMP) ලෙස බැංකුව හඳුනාගෙන තිබේ.

පරිච්ඡේදය	මූලධර්ම	2021 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(උ) අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අයත් අධිකාරී බල ක්ෂේත්‍රය හා ප්‍රධාන වගකීම් නිර්වචනය කිරීම.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අධිකාරී බලතල හා වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි ද ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ අධිකාරී බලතල හා වගකීම් රැකියා විස්තරයෙහි ද පිළිවෙලින් අර්ථ දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන අතර එය සමාලෝචනය කල වර්ෂය තුළ සමාලෝචනය කර ඇත.
	(ඌ) අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්තිවලට අනුකූලව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් බැංකුවේ කටයුතු යෝග්‍ය ආකාරයෙන් අධීක්ෂණය කරනු ලබන බවට සහතික කිරීම.	අනුකූල වී ඇත. බැංකුවේ ආයතනික සැලැස්මට විරෙහිව කාර්යසාධනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විමර්ශනය කරනු ලැබේ. ප්‍රධාන කළමනාකරණ පිරිස් විසින් තමන්ගේ විෂය පථයට අදාළ කරුණු සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම් සිදු කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ විෂය පථයට අදාළව කරුණු පැහැදිලි කිරීම් වලටද කැඳවනු ලැබේ.
	(එ) පහත සඳහන් දේ ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ යහපාලන පරිචයන්හි ඵලදායීතාවය කලින් කලට දැන ගැනීම: i. බැඳියාවන් අතර ගැටුම් කළමනාකරණය කිරීම සහ ii. දුර්වලතාවයන් නිශ්චය කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හි දී වෙනස්කම් කිරීම.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය පිළිබඳ ස්වයං ඇගයීමක් වසරක් පාසා එහි පාලන භාවිතයන් තක්සේරු කිරීම සිදු කරනු ලැබේ. 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥාපනතේ විධිවිධාන සහ එහි සංශෝධන අනුව බැංකුවට අයත් අමාත්‍යවරයා හරහා කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කිරීම සිදු කරනු ලබයි. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් පත්කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත බැඳියාව මත ගැටුම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ.
	(ඒ) ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා යෝග්‍ය වූ අනුප්‍රාප්තික සැලැස්මක් බැංකුව සතු බව සහතික කිරීම.	අනුකූල වී ඇත. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් (නියෝජ්‍ය හා සහකාර මහා කළමනාකරුවන්) සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අනුප්‍රාප්තික සැලසුමක් බැංකුව සතුව ඇත. නාම යෝජනා සහ ආයතනික යහපාලන කමිටුව විසින් මෙය සමාලෝචනය සහ සංශෝධනය කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි. අනුප්‍රාප්තික සැලසුමක් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාවලි වැඩිදියුණු කිරීම ක්‍රියාත්මක වේ.
	(ඔ) ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, සන්නිවේදන මාර්ග පිහිටුවීම සහ ආයතනික අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ ප්‍රගතිය විමර්ශනය කිරීම යනාදිය සඳහා අවශ්‍යතාවය අනුව නිරන්තරයෙන් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ රැස්වීම් පැවැත්වීම.	අනුකූල වී ඇත. තමන්ගේ විෂය පථයට අදාළව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම් ක්‍රමානුකූල පදනම්න් සිදු කරන අතර, අවශ්‍ය නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට හා උපකමිටු වලට කැඳවනු ලැබේ. ආයතනික සැලැස්ම මත පදනම්ව ආයතනික පරමාර්ථ වල ප්‍රගතිය අධීක්ෂණය කරනු ලැබේ.
	(ක) නියාමන පරිසරය අවබෝධ කර ගැනීම සහ නියාමකයින් සමඟ බැංකුව ඵලදායී සම්බන්ධතාවයක් පවත්වා ගන්නා බවට සහතික කිරීම.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂවරයකු ලෙස පත් වීමේදී විද්‍යුත් ආකෘතියෙන් පවතින "අධ්‍යක්ෂ මණ්ඩල අත්පොත" සමඟ බැංකුවට අදාළ සියළුම නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ ලිපිගොනුවක් ඔහුට ලබා දේ. අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් හරිහැටි ඉටු කිරීම සඳහා ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කිරීමට නියාමන පරිසරයේ සිදුවන වෙනස්වීම් පිළිබඳ අධ්‍යක්ෂවරුන් කලින් කලට දැනුවත් කරනු ලැබේ. නියාමක ආයතන වලින් ලැබෙන වැදගත් තොරතුරු එසැනින්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කරයි. නියාමකවරුනට ලබා දෙන ශ්‍රී ලංකා මහ බැංකුවට ලබාදෙන අනුකූලතා වාර්තා ඇතුළු නියාමන ආයතනයන්ට ලබා දෙන සියලුම වාර්තා මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඕනෑකමින් අධීක්ෂණය කරනු ලැබේ. බැංකුවේ චෙන්නායි, මාලේ සහ සීෂෙල්ස් මෙහෙයුම් කටයුතු වලට අදාල වන නියාමන අවශ්‍යතා පිළිබඳව ද අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරනු ලැබේ.
	(ඛ) බාහිර විගණකයින්ගේ සේවය ලබාගැනීමේදී සහ අධීක්ෂණයේදී නිසි ප්‍රවේශම් සහගත භාවයකින් යුතුව කටයුතු කිරීම.	අනුකූල වී ඇත. බැංකුව රජය සතු ව්‍යාපාරයක් වන බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන්ට අනුව විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වේ.
3 (1) (ii)	මෙම නියමයන්ගේ 3 (5) නියමයේ දක්වා ඇති ආකාරයට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීමත් ඔවුන්ගේ කාර්යයන් හා වගකීම් නිශ්චය කර අනුමත කිරීමත් කළයුතු වන්නේය.	දිශානති අංක 3(9)(1) සමඟ එක්ව කියවන විට අනුකූල වේ. සභාපතිවරයා පත් කරනු ලබන්නේ 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥාපනත සහ එහි සංශෝධන ප්‍රකාරව බැංකුව අයත් වන අමාත්‍යවරයා විසිනි. එම අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව ලංකා බැංකුවේ මහා කළමනාකරු ලෙස සඳහන්වන ප්‍රධාන විධායක නිලධාරිවරයා පත්කිරීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ. ඩී පී කේ ගුණසේකර මහතා විශ්‍රාම යාමෙන් පසු අවශ්‍ය අනුමැතිය සහිතව 2021.08.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලංකා බැංකුවේ මහා කළමනාකරු ලෙස කේ ඊ ඩී සුමනසිරි මහතා පත් කරන ලදී. ලංකා බැංකුවේ මහා කළමනාකරු තෝරා ගැනීමේ නිර්නායක ලබා දෙමින් අභ්‍යන්තරව සකස් කරන ලද ලේඛනයක් ක්‍රියාත්මක වේ.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2021 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (1) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලය අඛණ්ඩව රැස්විය යුතු අතර ආසන්න වශයෙන් මාසික පරතරයක් සහිතව අවම වශයෙන් වසරකට දොළොස් වතාවක්වත් අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් පැවැත්විය යුතුය. එවැනි රැස්වීම්වලට පැමිණීමට අයිතිය ඇත්තා වූ අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරයකගේ පුද්ගලික ක්‍රියාශීලී සහභාගිත්වය තිබිය යුතුය. ලිඛිත යෝජනා/ පත්‍රිකා ආදිය සංසරනය තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත ලබා ගැනීම හැකිතාක් දුරට වැලැක්විය යුතුවේ.	අනුකූල වී ඇත. අඛණ්ඩ අර්ධ මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වන අතර විශේෂ රැස්වීම් අවශ්‍යතාව පැන නඟින ආකාරයට සැලසුම් කරනු ලැබේ. සමාලෝචිත වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය 26 වතාවක් රැස්වී තිබේ. චක්‍රලේඛ යෝජනා මඟින් අනුමැතිය ලබා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවම කර තිබෙන අතර එය විශේෂිත පදනමක් මත පමණක් කරනු ලබන අතර එවැනි යෝජනා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඊළඟ රැස්වීමේදී සම්මත කෙරේ. 2021 වසර තුළ යෝජනා 10 ක් චක්‍රලේඛ මඟින් සම්මත කර ඇත.
3 (1) (iv)	අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් සඳහා වූ න්‍යාය පත්‍රයට වැදගත් කරුණු හා යෝජනා ඇතුළත් කිරීමට අධ්‍යක්ෂවරුන්ට හැකියාව ලැබෙන අයුරින් නිසි පියවර ගෙන ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුත්තේය. ඒවා බැංකු ව්‍යාපාරික කටයුතු හා අවදානම් කළමනාකරණය වැඩි දියුණු කිරීමට අදාළ වූ විෂයයන් හා යෝජනා විය යුතුය.	අනුකූල වී ඇත. ක්‍රමානුකූලව පැවැත්වෙන රැස්වීම් සඳහා සකස් කළ න්‍යාය පත්‍රය යෝජනා ඇතුළත් කළ හැකි වන පරිදි සෑම වර්ෂයක්ම ආරම්භයේදී රැස්වීම් නියම කර අධ්‍යක්ෂ මණ්ඩලයට දන්වනු ලැබේ.
3 (1) (v)	සියළුම අධ්‍යක්ෂවරුන්ට සහභාගි වීමට අවස්ථාවක් ලබාදීමේ අරමුණින් සාමාන්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අවම වශයෙන් දින හතකට පෙර දැනුම්දීමක් කරන බවට අධ්‍යක්ෂ මණ්ඩල පටිපාටියක් මඟින් සහතික කළ යුත්තේය. අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සාධාරණ පෙර දැනුම්දීමක් කළ හැකිය.	අනුකූල වී ඇත. වර්ෂය ආරම්භයේදී වාර්ෂික දින දර්ශනය මඟින් රැස්වීම් පිළිබඳ දැනුම් දීම සිදු කෙරේ. රැස්වීම් වලට දින හතකට පෙර නැවත දැනුම් දීම සිදු කෙරේ. අනෙකුත් විශේෂ රැස්වීම් සඳහා සාධාරණ පෙර දැනුම්දීමක් කරනු ලබන අතර විශේෂිත රැස්වීමක් යොදා ගැනීමට පෙර සියලුම අධ්‍යක්ෂවරුන්ගේ කැමැත්ත ද ලබා ගනු ලැබේ.
3 (1) (vi)	පසුගිය මාස 12 ක කාලය තුළ පැවැත්වූ රැස්වීම් වාර අඩුම වශයෙන් 2/3 කට සහභාගි නොවුණ අධ්‍යක්ෂවරයෙකුගේ හෝ පසුගිය රැස්වීම් වාර තුනකට අඛණ්ඩව සහභාගි නොවුණු අධ්‍යක්ෂවරයෙකුගේ හෝ අධ්‍යක්ෂධූරය අහිමි වන බවට අධ්‍යක්ෂ මණ්ඩල පටිපාටිය මඟින් සහතික කළ යුතුය. විකල්ප අධ්‍යක්ෂවරයෙකු මාර්ගයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගිවීම, නිසි පැමිණීමක් ලෙස පිළිගත හැකිය.	අනුකූල වී ඇත ආයතනික යහපාලන සංග්‍රහයට අනුව අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ රැස්වීම් වලට සහභාගි වීම් පිළිබඳ දැනුවත් කර ඇත. අධ්‍යක්ෂවරුන් රැස්වීම් වලට සහභාගි වීම් පිළිබඳ පිටු අංක 88 හි දක්වා ඇත. අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම මෙම නියමයන්ට අනුකූලව තිබේ.
3 (1) (vii)	1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වගන්තියේ දැක්වෙන විධිවිධාන සපුරන්නා වූ සමාගම් ලේකම්වරයකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ යුත්තේය. එම තැනැත්තාගේ මූලික වගකීම් විය යුත්තේ අධ්‍යක්ෂ මණ්ඩලය හා කොටස් හිමියන්ගේ රැස්වීම් සඳහා ලේකම් සේවා ලබාදීම සහ අණ පනත්වල හා වෙනත් නියාමනයන් මඟින් දක්වා ඇති අනෙකුත් කාර්යයන් කිරීමත්ය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් නීතිඥවරියක වන අතර 1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වගන්තියේ විධිවිධාන ඇය විසින් සපුරාලනු ලබයි.
3 (1) (viii)	අධ්‍යක්ෂ මණ්ඩලයේ පටිපාටීන් සහ අදාළ රීති හා නියාමනයන් පිළිපදින බව සහතික කරනු පිණිස සියළුම අධ්‍යක්ෂවරුන්ට සමානව ලේකම්ගෙන් උපදෙස් හා සේවා ලබාගැනීම සඳහා අවකාශය තිබිය යුතුය.	අනුකූල වී ඇත. සියළුම අධ්‍යක්ෂවරුන්ට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගෙන් උපදෙස් ලබා ගැනීමේ හැකියාව ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය නීතිඥවරියක වන අතර, අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි පිළිබඳ සොයා බැලීමට, නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා ලබා ගැනීම හා පවත්වාගෙන යාම සඳහා ඇය අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු වේ.
3 (1) (ix)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා ලේකම්වරිය විසින් පවත්වා ගතයුතු අතර ඕනෑම සාධාරණ වේලාවක දී සාධාරණ දැනුම්දීමකින් පසු ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට එවැනි වාර්තා පරීක්ෂා කිරීම සඳහා විවෘතව පැවතිය යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා ලේකම්වරිය විසින් පවත්වාගෙන යන අතර, ඒවා ආරක්ෂිත මෘදුකාංගය තුළ තැන්පත් කරන අතර ඒවා සෑම අධ්‍යක්ෂවරයකුටම ලැබීමට සලස්වා ඇත. රැස්වීම් වාර්තා ඊට පසුව පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී අනුමත කර ඇත. අධ්‍යක්ෂවරුන්ට ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික් සම්බන්ධතාවයක් හරහා පැරණි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවලට ප්‍රවේශ වීමට හැකියාව ඇත.
3 (1) (x)	අධ්‍යක්ෂ මණ්ඩලය නිසි සැලකිල්ලෙන් හා විචක්ෂණශීලී බවකින් කටයුතු කළා ද යන්න අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා මඟින් තොරතුරු ලබාගත හැකිවන ආකාරයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා ප්‍රමාණවත් අයුරින් විස්තරාත්මක විය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ඇති වන සාකච්ඡාවන්ගේ ගැඹුරු බව පිළිබඳ තක්සේරු කිරීමට මෙම වාර්තා නියාමන හා අධීක්ෂණ අධිකාරීන්ට උපකාරී විය යුතුය. ඒම නිසා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා තුළ පහත දෑ පැහැදිලිව ඇතුළත් විය යුතුය: (අ) අධ්‍යක්ෂ මණ්ඩලය තම සාකච්ඡා සඳහා භාවිතා කරනු ලැබූ තොරතුරු හා දත්ත පිළිබඳ සාරාංශයක් (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බැලීමට යෙදුන විෂය කරුණු (ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම යුතුකම් නිසි සැලකිල්ලෙන් හා ප්‍රවේශම් සහගත භාවයකින් යුතුව කරගෙන යන්නේ ද යන්න පිළිබඳ තොරතුරු, රැස්වීමේ සාකච්ඡා සහ මතභේදයට හෝ විරෝධයට බඳුන් වූ විෂය කරුණු	අනුකූල වී ඇත. විස්තරාත්මක අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා මඟින් මෙම නිර්ණායකයන්ට අදාළ කරුණු ආවරණය වේ.

පරිච්ඡේදය	මූලධර්ම	2021 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ උපායමාර්ග හා ප්‍රතිපත්ති සහ අදාළ නීති හා නියාමනයන් වලට අනුකූල වන බව විදහාපාන්නා වූ, අදාළ විධායකයින් විසින් කරනු ලබන සාක්ෂිදීම් සහ සනාථ කිරීම් (ඉ) බැංකුව විවෘත වන අවදානම් වලට සම්බන්ධ කරුණු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනුම සහ තේරුම් ගැනීම් හා අවදානම් කළමනාකරණය පිළිබඳ අනුගමනය කල ක්‍රමෝපාය පිළිබඳ විශ්ලේෂණය (ඊ) තීරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා	
3 (1) (xi)	යෝග්‍ය අවස්ථාවන්හි දී සාධාරණ ඉල්ලීම් මත බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීයමය උපදෙස් පැතීම සඳහා අධ්‍යක්ෂවරුන්ට අවස්ථා ලබාදෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකඟ වූ පටිපාටියක් තිබිය යුත්තේය. අදාළ අධ්‍යක්ෂවරයෙකුට හෝ අධ්‍යක්ෂවරුන්ට ඔහුගෙන්/ ඇයගෙන්/ ඔවුන්ගෙන් බැංකුවට ඉටුවිය යුතු යුතුකම් ඉටුකිරීම සඳහා ආධාර වීම පිණිස වෙනම ස්වාධීන වෘත්තීයමය උපදෙස් ලබාදීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කළ යුතුය.	අනුකූල වී ඇත. අවශ්‍ය අවස්ථා වලදී අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වාධීන වෘත්තීය උපදෙස් පැතීම සඳහා වන වර්ෂය තුළ සමාලෝචනය කරන ලද ප්‍රඥප්තියක් බැංකුව සතු වන අතර අවශ්‍ය අවස්ථාවලදී ඉහත ප්‍රඥප්තිය පදනම් කොටගෙන අධ්‍යක්ෂ මණ්ඩලය විවෘති උපදෙස් කරා යොමුවෙයි.
3 (1) (xii)	අනෙකුත් සංවිධාන හෝ සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ කටයුතු කිරීමේදී සහ වීවාට ඇති බැඳීම්වල දී, බැඳියාවන් අතර ගැටුම් ඇතිවීම හෝ විවෘති ගැටුම් ඇති බව පෙන්නුම් කිරීම අධ්‍යක්ෂවරුන් විසින් වළක්වා ගත යුත්තේය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලකිල්ලට භාජනය කිරීමට ඇති සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලකිය යුතු වැදගත්කමකින් යුතු විෂය කරුණක් බව නිශ්චය කර ඇති විෂය කරුණක් සම්බන්ධයෙන් යම් අධ්‍යක්ෂවරයෙකුට අරමුණු අතර ගැටුමක් තිබේ නම් විවෘති විෂය කරුණු සාකච්ඡාවට බඳුන් කළ යුත්තේ අදාළ විෂය කරුණු සම්බන්ධයෙන් සැලකිය යුතු හිමිකමක් නොමැති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් (මෙම නියමයන්ගේ 3(2)(iv) නියමය බලන්න) සහභාගි වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දීය. තවද, ඔහුට/ ඇයට හෝ ඔහුගේ/ ඇයගේ සමීප ඥාතියෙකුට හෝ අධ්‍යක්ෂවරයෙකුට සැලකිය යුතු හිමිකමක් ඇත්තා වූ ව්‍යාපාරයකට සම්බන්ධතාවයක් ඇති කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක දී අධ්‍යක්ෂවරයෙකු විසින් ඡන්දය දීමෙන් වැළකී සිටිය යුතුය. එසේම එම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් න්‍යාය පත්‍රයේ අදාළ අධීක්ෂණය සඳහා ගණපූරණය ගණන් බැලීමේ දී ඔහු/ ඇය ඊට ඇතුළත් නොකළ යුතු ය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට හිමි බලතල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ ඇතුළත් කර ඇත.
3 (1) (xiii)	බැංකුවේ මෙහෙයවීම හා පාලනය ස්ථිරසාර ලෙස තම අධිකාරිය යටතේ පවතින බව සහතික කිරීම පිණිස තම තීරණ ගැනීම සඳහා තමන්ට විශේෂයෙන් වෙන් කරන ලද්දා වූ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ විධිමත් උප ලේඛනයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තබාගත යුතුය.	අනුකූල වී ඇත. 2021 වර්ෂය තුළ මෙවැනි තත්ත්වයක් මතු නොවුණි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද මාසික මූල්‍ය වාර්තා මඟින් බැංකුවේ නුඹුන්වත් බව සහතික වනු ඇත.
3 (1) (xiv)	බැංකුවට තම වගකීම් ගෙවීමට නොහැකි යැයි හෝ නොහැකි වීමට ඉඩ ඇතැයි හෝ බැංකුව බුන්වත් වීමට ආසන්න යැයි හෝ තැන්පතුකරුවන්ට සහ අනෙකුත් ණය හිමියන්ට නියමිත ගෙවීම් අත්හිටුවීමට ආසන්න යැයි හෝ බැංකුව සළකන්නේ නම් වෙනත් කිසිම තීරණයක් හෝ ක්‍රියාවක් ගැනීමට පෙර වහාම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ තත්ත්වය පිළිබඳව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැන්විය යුතු වේ.	අනුකූල වී ඇත. 2021 වර්ෂය තුළ මෙවැනි තත්ත්වයක් මතු නොවුණි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද මාසික මූල්‍ය වාර්තා මඟින් බැංකුවේ නුඹුන්වත් බව සහතික වනු ඇත.
3 (1) (xv)	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සහ අනෙකුත් විවක්ෂණශීලී පදනම් අනුව මුදල් මණ්ඩලය විසින් නියම කර ඇති මට්ටම්වලට අනුකූල වන මට්ටමක බැංකුවේ ප්‍රාග්ධනය පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුව මුදල් මණ්ඩලයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතාවයන්ට පූර්ණ අනුකූලතාවයක් දක්වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරුවක් ලබා දෙයි. ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත වල තත්ත්වය බැංකුවේ මාසික මූල්‍ය ප්‍රකාශනය සමඟ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කෙරේ.
3 (1) (xvi)	මෙම නියමයන්ගේ 3 වැනි නියමයෙහි සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල වන ආකාරයෙන් වූ වාර්ෂික ආයතනික යහපාලන වාර්තාවක්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ වාර්ෂික වාර්තාව තුළින් ප්‍රසිද්ධ කළ යුතු ය.	අනුකූල වී ඇත. මෙම අනාවරණයන් බැංකුවේ වාර්ෂික වාර්තාවේ ආයතනික යහපාලන වාර්තාවට අඩංගු කොටසක් වේ.
3 (1) (xvii)	වාර්ෂිකව සෑම අධ්‍යක්ෂවරයෙකු විසින්ම ස්වයං ඇගයීමක් කිරීම සඳහා වූ ක්‍රමයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කළයුතු අතර එවැනි ඇගයීම්වල වාර්තා තබාගතයුතු වන්නේය.	අනුකූල වී ඇත. ස්වයං ඇගයීමේ යාන්ත්‍රණයක් බැංකුව විසින් භාවිතයට ගන්නා අතර එය වසර අවසානයේ සිදුකරයි. ලංකා බැංකුවේ ලේකම්තුමිය/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය විසින් ස්වයං ඇගයීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා පවත්වාගෙන යනු ලැබේ.
3 (2) අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය		
3 (2) (i)	අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටිය යුතු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව හතකට වඩා අඩු නොවිය යුතු අතර, 13 ට වඩා වැඩි නොවිය යුතුය.	1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටිය යුතු අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව හයක් වේ. 2021 වසර තුළ සිටි අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය අනුකූලතා වාර්තාවේ නියාමන අංක 3 (2)(viii) යටතේ දක්වා ඇත. වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තර වාර්ෂික වාර්තාවේ පිටු අංක 85 දක්වා ඇත.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2021 වසර තුළ අනුකූලවීමේ මට්ටම
		අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම ද ඇතුළත්ව මෙම විධිවිධානයන්හි අවශ්‍යතා සපුරාලීමට ලංකා බැංකු ආඥා පනතට යෝජනා කරන ලද සංශෝධන අනුමත කර ගැනීමේ ක්‍රියාවලියේ පවතී.
3 (2) (ii)	ප්‍රධාන විධායක නිලධාරී තනතුරෙහි සිටින අධ්‍යක්ෂවරයා හැර, අධ්‍යක්ෂවරයෙකුගේ මුළු සේවා කාලය වසර නවයක් නොඉක්මවිය යුතු අතර එම සේවා කාලයට 2008 ජනවාරි 01 දින දක්වා එවැනි අධ්‍යක්ෂවරයෙකු එම ධූරයේ සේවය කරන ලද මුළු කාලයද ඇතුළත් විය යුත්තේය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ වත්මන් අධ්‍යක්ෂවරුන් වසර නවයකට වඩා අඩු සේවා කාලයක් එම තනතුරෙහි සේවය කර ඇත. වත්මන් අධ්‍යක්ෂවරුන්ගේ පත්වීම් පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ සඳහන් කර ඇත.
3 (2) (iii)	විධායක අධ්‍යක්ෂවරුන් ගණන අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින අධ්‍යක්ෂවරුන්ගේ ගණනින් තුනෙන් එකක ප්‍රමාණය නොඉක්ම වන පරිදි බැංකු සේවකයකු බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස (මින් මතු විධායක අධ්‍යක්ෂවරුන් ලෙස හඳුන්වන) පත් කිරීමට, තෝරා ගැනීමට හෝ නම් කිරීමට හැකිය. එවැනි අවස්ථාවකදී එක් විධායක අධ්‍යක්ෂවරයකු ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත්කළ යුතුය.	අනුකූල වී ඇත. ලංකා බැංකු ආඥා පනතට අනුව ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තුළ විධායක අධ්‍යක්ෂවරුන් සිටීමට නොහැකිය.
3 (2) (iv)	අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් හෝ මුළු අධ්‍යක්ෂවරුන් ගණනින් තුනෙන් එක යන දෙකෙන් වැඩි ගණනකින් සමන්විත විය යුතු ය. මෙම අනු විධානය අදාළ වන්නේ 2010 ජනවාරි 01 දිනෙන් පසුවය. විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු පහත සඳහන් දෑට යටත් වන්නේ නම් ඔහු/ ඇය ස්වාධීන අයෙකු ලෙස නොසැලකේ; (අ) බැංකුවේ කොටස් හිමිකාරත්වයෙන් 1% කට වඩා සෘජු ලෙස හෝ වක්‍ර ලෙස අත්කර ගෙන සිටීම. (ආ) දැනට හෝ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්න වසර දෙකක කාල සීමාවක් තුළ මෙහි 3(7) වන වගන්තියෙන් දක්වන පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන කිසිදු ව්‍යාපාරික ගනුදෙනුවක වර්තමානයේ යෙදී සිටීම/ යෙදී සිට තිබීම. (ඇ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්න වසර දෙකක කාලයක් තුළ බැංකුවේ සේවා නියුක්ත වී සිට තිබීම. (ඈ) කිට්ටු ඥාතීත්වයක් ඇති අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු හෝ ජ්‍යේෂ්ඨ විධායක කළමනාකාරිත්වයේ සාමාජිකයෙක් හෝ වෙනත් සැලකිය යුතු කොටස් හිමිකරුවෙකු බැංකුවේ හෝ වෙනත් බැංකුවක සිටීම. මෙහි අරමුණ සඳහා, සමීප ඥාතියකු, යන්නෙන් අදහස් වන්නේ කාලත්‍රයා හෝ මූල්‍යමය වශයෙන් යැපෙන්නා වූ ළමයෙකි. (ඉ) බැංකුව පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වයන් නියෝජනය කිරීම. (ඊ) පහත දැක්වෙන සමාගමක හෝ ව්‍යාපාරික ආයතනයක සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු හෝ සැලකිය යුතු කොටස්කරුවෙකු වීම: i. පහත 3(7) විධානයේ දැක්වෙන පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන ගනුදෙනුවක බැංකුව සමඟ වර්තමානයේ සිටින හෝ ii. බැංකුවේ වෙනත් යම් අධ්‍යක්ෂවරුන් සේවයේ යෙදී සිටින හෝ අධ්‍යක්ෂවරයෙක් වන හෝ සැලකිය යුතු කොටස් හිමියකු වී සිටින හෝ iii. මෙම විධානයන්ගේ 3(7) වන විධානයේ දක්වා ඇති පරිදි බැංකුවේ වෙනත් යම් අධ්‍යක්ෂවරයෙකු බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන ගනුදෙනුවක යෙදී සිටින.	අනුකූල වී ඇත. මුදල් අමාත්‍යංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා ස්වාධීන නොවන අතර, ඔහු විසින් බැංකුවේ එකම කොටස්කරු වන ශ්‍රී ලංකා රජය නියෝජනය කරයි. ඒවා අධ්‍යක්ෂවරුන්ගේ පැහැකඩ යටතේ සහ අංක 3 (2)(viii) යටතේ හඳුනා ගෙන ඇත.
3 (2) (v)	ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කර ඇති විටක එසේ පත් කරන ලද පුද්ගලයා ද ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුට අදාළ වන මිනුම් දඬු සම්පූර්ණ කළ යුතුය.	අනුකූල වී ඇත. ස්වාධීන අධ්‍යක්ෂවරුන් සඳහා විකල්ප අධ්‍යක්ෂවරුන් පත්කර නොමැත.
3 (2) (vi)	විධායක නොවන අධ්‍යක්ෂවරුන් ප්‍රමාණවත් තරමේ විශ්වාසනීය පෙර වාර්තා සහිත ඉහළ හැකියාවකින් යුතු පුද්ගලයන් වියයුතු අතර, ක්‍රමෝපාය, කාර්යසාධනය සහ සම්පත් පිළිබඳව මතුවන ගැටළුවලට ස්වාධීන වූ තීරණ ගැනීමේ පළපුරුද්ද සහ හැකියාවන්ගෙන් ද යුක්ත විය යුතුය.	අනුකූල වී ඇත. අවශ්‍ය තොරතුරු නිර්ණය කිරීම සඳහා වර්තමාන අධ්‍යක්ෂවරුන්ගේ පැහැකඩ තොරතුරු පිටු අංක 19 සිට 21 දක්වා ඇත.
3 (2) (vii)	අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය අධ්‍යක්ෂවරුන්ගේ ගණපූර්ණය සම්පූර්ණ වුවද, එම රැස්වීමට සහභාගී වන අධ්‍යක්ෂවරුන්ගේ ගණනින් භාගයකට වඩා විධායක නොවන අධ්‍යක්ෂවරුන් සිටිය යුතු අතර, එසේ නොවේ නම් එවැනි රැස්වීමක් නිසි පරිදි පවත්වන ලද්දක් නොවනු ඇත. මෙම අනුවිධානය බල පැවැත්වෙනුයේ 2010 ජනවාරි 01 දින සිටය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සියළුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.

පරිච්ඡේදය	මූලධර්ම	2021 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (2) (viii)	සියළුම ආයතනික සන්නිවේදන කටයුතු වලදී බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ නම් හෙළි කිරීමේ දී ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් එවැනි විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස නිශ්චිතව හඳුනාගත යුතුය. සභාපති, විධායක අධ්‍යක්ෂ, විධායක නොවන අධ්‍යක්ෂ සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ නම් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සමන්විත වන අධ්‍යක්ෂවරුන්ගේ වර්ගීකරණයක් බැංකුව විසින් තම වාර්ෂික යහපාලන වාර්තා මඟින් අනාවරණය කළ යුතුය.	අනුකූල වී ඇත. 2021 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සාමාජිකයින්ගෙන් සමන්විත විය: ■ **කාංචන රත්වත්තේ මහතා** ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ/ සභාපති (2020 ජනවාරි 02 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් විය) ■ **ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා** විධායක නොවන, නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ (2020 අප්‍රේල් 28 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් විය) ■ **පී හර්ෂ විජයවර්ධන මහතා** ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2020 ජනවාරි 14 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් විය) ■ **ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා** ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2020 අප්‍රේල් 21 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් විය) ■ **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) පී ඒ චන්ද්‍රසිරි මහතා** ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2021 ජනවාරි 08 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් විය) ■ **ජයම්පති මොල්ලිගොඩ මහතා** ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2021 පෙබරවාරි 18 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් වූ අතර 2022 ජනවාරි 21 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)
3 (2) (ix)	අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා වූ විධිමත්, නිසි තක්සේරුවකින් පසු සකස් කරන ලද විනිවිදභාවයෙන් යුක්ත ක්‍රියාපටිපාටියක් තිබිය යුතුය. එසේම අධ්‍යක්ෂ මණ්ඩලයට අනුප්‍රාප්තිකයන් පත් කිරීම සිදු කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් ද තිබිය යුතු ය.	ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් බැංකුව අයත්වන අමාත්‍යවරයා විසින් 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම් කරනු ලැබේ. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමට සහ පත්කිරීමේ ක්‍රියාවලියට සලකා බැලීමට අවශ්‍ය වන නිපුණතා, පළපුරුද්ද සහ දැනුම පිළිබඳ විස්තරාත්මකව ඇතුළත් වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලද අදාළ අමාත්‍යාංශය සමග එකඟ වූ ප්‍රතිපත්තියක් ද සකස් කර ඇත.
3 (2) (x)	තාවකාලික ඇබෑර්තු පිරවීම සඳහා පත් කරනු ලැබූ සියළුම අධ්‍යක්ෂවරුන් එම පත් කිරීම් වලින් පසුව එළඹෙන පළවෙනි මහා සභා රැස්වීමේදී කොටස්කරුවන්ගේ ඡන්දයෙන් තෝරා පත්කර ගැනීමට යටත් විය යුතු ය.	අදාළ ඇමතිවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කරන නිසා මෙය පැන නොනඟී.
3 (2) (xi)	අධ්‍යක්ෂවරයෙකු සිය ධූරයෙන් ඉවත් කරන ලද්දේ නම් හෝ ඉල්ලා අස්වූයේ නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, (අ) අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීමේ හෝ ඉවත් කිරීමේ හේතූන් එම අධ්‍යක්ෂවරයා බැංකුව සමඟ එකඟ නොවීමට අදාළ තොරතුරු තිබේ නම් එම තොරතුරු ද සමඟ ප්‍රසිද්ධ කළයුතුය; සහ	අනුකූල වී ඇත. බැංකුවේ එකම කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය වෙනුවෙන් බැංකුව අයත්වන අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරු පත්කිරීම් හා ඉවත් කිරීම් සිදුකරයි. ඉල්ලා අස්වීමක් වේ නම් එයද එම අමාත්‍යවරයාට යොමු කරයි. ඉල්ලා අස්වීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට හා කොළඹ කොටස් හුවමාරුවට දැනුම් දෙනු ලැබේ.
	(ආ) කොටස්කරුවන්ගේ අවධානයට ලක්විය යුතු කිසියම් කරුණක් ඇත්නම් ඒ බව ද නොමැතිනම් ඒ බව ද සහතික කරමින් ප්‍රකාශනයක් නිකුත් කළ යුතුය.	බැංකුවේ කොටස් හිමියා රජය වන අතර අධ්‍යක්ෂධූරයන්හි සිදු කරන වෙනස්වීම් අදාළ අමාත්‍යවරයා හරහා ශ්‍රී ලංකා රජය විසින් සිදු කරනු ලැබේ.
3 (2) (xii)	බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයෙකු බැංකුවේ පරිපාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් නොවන වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කිරීම, තෝරා ගැනීම හෝ නම් කිරීම නොකළ යුතුය.	2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය මහා කළමනාකරුවකු පත් කිරීම හැර ලංකා බැංකුවේ වෙනත් අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයකු ආශ්‍රිත සමාගමක් නොවන වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු නොකරයි. මේ බව සහතික කරමින් ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වීමට පෙර 2019 දෙසැම්බර් 19 වන දින නිකුත් කරන ලද 2019 අංක 8 දරණ බැංකු පනතේ 42(1) සහ 76 (ඈ) කොටසට අනුකූලව දිවුරුම් ප්‍රකාශයක් ලබා ගනු ලැබේ.
3 (3) අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය සහ උචිතභාවය ඇගැයීමේ නිර්ණායක		
3 (3) (i)	අධ්‍යක්ෂවරයකු වශයෙන් සේවය කරන පුද්ගලයකුගේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතු ය. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන සාමාන්‍ය නිදහස් කිරීම් අදාළ වන්නේය: 2008 ජනවාරි 01 දිනට වයස අවුරුදු 70 සපුරන හෝ 2008 දෙසැම්බර් 31 දිනට පෙර වයස අවුරුදු 70 සපුරන අධ්‍යක්ෂවරයෙකුට 2009 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන උපරිම වසර 3 ක කාලසීමාවක තවදුරටත් රාජකාරියේ යෙදිය හැක.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් කිසිම අයෙකු වයස අවුරුදු 70 ට වඩා වැඩි නොවේ.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2021 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (3) (ii)	පුද්ගලයකු විසින් බැංකුවේ පරිපාලිත සමාගම් හෝ ආශ්‍රිත සමාගම් ද ඇතුළත්ව සමාගම්/ ඒකකයන්/ ආයතන 20 කට වඩා වැඩි ප්‍රමාණයක අධ්‍යක්ෂ තනතුර නොදැරිය යුත්තේය.	අනුකූල වී ඇත. සමාගම්/ ආයතන 20 කට වඩා අධ්‍යක්ෂධුර හොබවන අධ්‍යක්ෂවරුන් නොමැත.
3 (3) (iii)	ශ්‍රී ලංකාව තුළ මෙහෙයුම් සිදුවන බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකුට හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකුට තම ධූරයෙන් ඉවත් වූ දින සිට මාස හයක් ඉකුත් වීමට පෙර ශ්‍රී ලංකාව තුළ මෙහෙයුම් සිදුවන වෙනත් බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂ වරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු ලෙස පත්වීමට නොහැක. ප්‍රතිව්‍යුහගත කිරීම අවශ්‍ය වන බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලය නැවත පිහිටුමේදී විශ්‍රාමික බැංකුකරුවන්ගේ විශේෂ දැනුම අවශ්‍ය වීම වැනි සුවිශේෂී අවස්ථාවන්හිදී සිදුවන වෙනස්කම් මූල්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතියට යටත් විය යුතුය. මේ සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු විසින් අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන විධායක නිලධාරියා පත් කිරීමේදී අත්හිටුවීමේ සහන කාලය අවශ්‍ය බව සහතික කළ යුතුය. පත් කිරීමේ අධිකාරියක් විසින් බලපත්‍රලාභී බැංකුවකට අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමේදී මෙම විධිවිධාන කඩකරන්නේ නම්, බලපත්‍රලාභී බැංකුව විසින් එවැනි පත්වීම්ලාභියෙකු බලය හෝ ප්‍රතිලාභ භුක්තිවිඳීමෙන් වැලැක්වීමට පියවර ගත යුතුය.	අනුකූල වී ඇත. සමාලෝචනය කරන ලද වසර තුළදී මෙවැනි තත්ත්වයක් පැන නැඟී නොමැත.
3 (4) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා ඇති කළමනාකරණ කාර්යයන්		
3 (4) (i)	බලතල පවරා දීම සඳහා පවතින ක්‍රියාවලිය අධ්‍යක්ෂවරුන් විසින් සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කිරීම හා නිරවුල්ව අවබෝධ කර ගැනීම කළ යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය බලය පවරා දීමේ කටයුතු කාලෝචිතව අධීක්ෂණය හා අනුමත කිරීම කරන අතර, බලය බෙදීමේ ප්‍රමාණය අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන්ගේ කාර්යයන් කාර්යක්ෂමව සිදු කිරීමට ඉඩ තබමින් බැංකුවේ කටයුතු කිරීමට අවශ්‍ය ප්‍රමාණයට ප්‍රමාණවත් බව තහවුරු කර ගනී. මෙම ක්‍රියාවලියේදී දැනට පවතින පාලන ආඥා පනතේ සඳහන් නියමයන් සලකා බලනු ලැබේ.
3 (4) (ii)	අධ්‍යක්ෂ මණ්ඩලයට සමස්තයක් ලෙස තම කාර්යයන් ඉටු කිරීම සඳහා සැලකිය යුතු ලෙස අවහිරවන්නා වූ හෝ ඉටුකිරීමේ හැකියාව අඩු කරන්නාවූ ආකාරයේ ප්‍රමාණයකට, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩලීය කමිටුවකට, ප්‍රධාන විධායක නිලධාරියාට, විධායක අධ්‍යක්ෂවරු හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරියාට කිසිම කාර්යයක් පවරා දීම නොකළ යුත්තේය.	
3 (4) (iii)	බැංකුවේ අවශ්‍යතාවයන්ට අදාළ වන ආකාරයෙන් තිබෙන බව සහතික කර ගැනීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවතින බලතල පවරාදීමේ ක්‍රියාවලිය කාලීනව විමර්ශනය කළයුතු වේ.	
3 (5) සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී		
3 (5) (i)	සභාපති හා ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යභාරයන් වෙන් කළ යුතු අතර, මෙම කාර්යයන් තනි පුද්ගලයෙකු විසින් සිදු නොකළ යුතුය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ සභාපති තනතුර හා මහා කළමනාකරු වශයෙන් හඳුන්වන ප්‍රධාන විධායක තනතුර පුද්ගලයින් දෙදෙනෙකු විසින් දරනු ලැබේ. සභාපතිතුමන්ගේ සහ මහා කළමනාකරුගේ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි විස්තර වෙයි.
3 (5) (ii)	සභාපති විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතු අතර ස්වාධීන අධ්‍යක්ෂවරයකු වන්නේ නම් මැනවි. සභාපති ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නොවන විට, ස්වාධීනත්වය සහතික කිරීම පිණිස ලිඛිත කාර්යභාරයන් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ජ්‍යේෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කළ යුතුය. මෙම ජ්‍යේෂ්ඨ අධ්‍යක්ෂවරයාගේ තනතුර බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි පළ කළ යුතුය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු හෙයින් ජ්‍යේෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු පත්කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනඟී.
3 (5) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වාර්ෂික වාර්තාවේ අනිවාර්ය කොටසක් විය යුතු ආයතනික යහපාලන වාර්තාවේ, සභාපති හා ප්‍රධාන විධායක නිලධාරීගේ අනන්‍යතාවය ද, සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර කිසියම් සම්බන්ධතාවයක් ඇත්නම්, (මූල්‍ය, ව්‍යාපාරික, පවුලේ හෝ අනෙකුත් සැලකිය යුතු/අදාළ සම්බන්ධතාවයන් ඇතුළුව) එයද පළ කළ යුතුයි.	අනුකූල වී ඇත. සභාපති සහ මහා කළමනාකරු කවරෙක්ද යන්න මෙම වාර්ෂික වාර්තාවේ අනාවරණය කර ඇත. වර්තමාන සභාපති, මහා කළමනාකරු සහ අනිකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතර සැලකිය යුතු, මූල්‍යමය, ව්‍යාපාරික හෝ පවුල් සම්බන්ධතාවයන් නැත.
3 (5) (iv)	සභාපතිතුමා විසින් (අ) අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සැපයීම, (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස කටයුතු කරන බව හා සිය වගකීම් නිසි ලෙස ඉටුකරන බව සහතික කිරීම (ඇ) ප්‍රධාන ගැටළු කාලීන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සාකච්ඡා කරන බව සහතික කිරීම කළයුතු වේ.	අනුකූල වී ඇත.

පරිච්ඡේදය	මූලධර්ම	2021 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (5) (v)	අනිකුත් අධ්‍යක්ෂවරුන් විසින් රැස්වීම්වල දී සාකච්ඡා කිරීමට යෝජනා කරනු ලබන කාරණා සැලකිල්ලට ගනිමින් රැස්වීම්වල න්‍යාය පත්‍රය සැකසීමේ වගකීම සභාපතිතුමා සතුවන අතර, සමාගම් ලේකම්ට අදාළ කාර්යය පැවරිය හැකිය.	අනුකූල වී ඇත. සභාපති විසින් බලය පවරාදීම හා අනුමත කිරීම යටතේ, ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් මහා කළමනාකරු හරහා ඉදිරිපත් කරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා මත න්‍යාය පත්‍රය පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර බෙදා හරින අතර කිසියම් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන වෙනත් අදාළ කරුණු ද පදනම්ව රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය පිළියෙල කරයි.
3 (5) (vi)	සභාපති විසින් සියළුම අධ්‍යක්ෂවරුන් රැස්වීමේ පැහැ නඟින කරුණු පිළිබඳව නිසි ලෙස දැනුවත්ව සිටින බවට සහතික විය යුතු අතර, ප්‍රමාණවත් තොරතුරු කාලීන පදනමක් මත අධ්‍යක්ෂවරුන්ට ලැබෙන බවට ද සහතික විය යුතුය.	අනුකූල වී ඇත. සියළුම අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ඇතිවන කරුණු පිළිබඳව දැනුවත්ය යන්න සභාපති විසින් සොයා බලා තහවුරු කරගත යුතුය. මෙම කටයුත්ත තහවුරු කිරීම සඳහා පහත ක්‍රියාපටිපාටි ඇති කර ඇත: • අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා රැස්වීමට දින හතකට පෙර ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සැලැස්වේ. හදිසි පත්‍රිකා සඳහා මෙය අදාළ නොවේ. • අවශ්‍ය වූ විට පූර්ව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වේ කළමනාකරණ කණ්ඩායමේ අදාළ සාමාජිකයින් ඕනෑම පැහැදිලි කිරීමක් සඳහා සුදානමින් සිටී. • බැංකුවේ කාර්යාලය හා ස්ථායිතාවය ඇගයීම සඳහා අවශ්‍ය කළමනාකරණ තොරතුරු එකඟ වූ ආකෘතියකට නියමිත කාලවකවානු අනුව අධ්‍යක්ෂවරුන්ට සපයනු ලැබේ. • අධ්‍යක්ෂවරුන්ට අවශ්‍යතාවය පරිදි බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීමය උපදෙස් ලබා ගැනීමේ හැකියාව ඇත.
3 (5) (vii)	සභාපති විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සඳහා සම්පූර්ණ හා සක්‍රීය දායකත්වයක් ලබාදීම සඳහා සියළුම අධ්‍යක්ෂවරුන් ධෛර්යමත් කළ යුතු අතර, බැංකුවේ උපරිම වාසිය සඳහා ක්‍රියාකරන බව සහතික කිරීමට මූලිකත්වය ගත යුතුය.	අනුකූල වී ඇත.
3 (5) (viii)	සභාපතිතුමා විසින් විශේෂයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ඵලදායී දායකත්වය ලබාගැනීමට පහසුකම් සැපයිය යුතු අතර, විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතර හිතකර සබඳතාවයන් පවත්වා ගැනීම ද සහතික කළ යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළු දෙනාම විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
3 (5) (ix)	ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හෝ වෙනත් කිසිම විධායක කාර්යයක් සෘජුවම අධීක්ෂණය සඳහා සභාපති සම්බන්ධ නොවිය යුතුය.	අනුකූල වී ඇත. සභාපතිතුමන් ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වේ.
3 (5) (x)	කොටස් හිමියන් සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බවට හා කොටස් හිමියන්ගේ අදහස් අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය වන බවට සභාපති විසින් සහතික විය යුතුය.	අනුකූල වී ඇත. මුළුමනින්ම කොටස් හිමිකාරිත්වය දරණ ශ්‍රී ලංකා රජය සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගනී. නිල බලයෙන් පත්වන අධ්‍යක්ෂවරයා, අධ්‍යක්ෂ මණ්ඩලය හා කොටස් හිමිකාරිත්වය අතර සම්බන්ධිත මඟක් ලෙස ක්‍රියා කරයි.
3 (5) (xi)	ප්‍රධාන විධායක නිලධාරිවරයා බැංකුවේ දෛනික මෙහෙයුම් හා ව්‍යාපාරික කටයුතු භාර ඉහළම විධායකයා වශයෙන් ක්‍රියා කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුවේ එදිනෙදා මෙහෙයුම් ඉටු කිරීම මහා කළමනාකාරතුමාගේ වගකීමයි. මහා කළමනාකරුගේ බලතල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ විශේෂයෙන් සඳහන් වේ.
3 (6) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කළ කමිටු		
3 (6) (i)	මෙම විධානයන්ගේ 3(6)(ii), 3(6)(iii), 3(6)(iv) සහ 3(6)(v) යන විධානවල දක්වා ඇති ආකාරය අනුව සෑම බැංකුවකම අඩුම තරමේ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හතරක්වත් තිබිය යුතු ය. සෑම කමිටුවක්ම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය. කමිටුවේ සභාපතිවරයාගේ අධීක්ෂණය යටතේ රැස්වීම් සංවිධානය කිරීම හා රැස්වීම් වාර්තා පවත්වා ගැනීම යනාදිය සඳහා සෑම කමිටුවක් විසින්ම ලේකම්වරයෙකු පත්කර ගත යුතුය. සෑම කමිටුවකම යුතුකම් හා කාර්යයන් ඇතුළත් කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය.	අනුකූල වී ඇත. මෙම විධිවිධානය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලීය උපකමිටු හතරක් (විගණන, මානව සම්පත් හා පාරිශ්‍රමික, නාමයෝජනා හා ආයතනික යහපාලන සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ) ස්ථාපිත කර ඇති අතර, රැස්වීම් වාර්තා සමඟ නිර්දේශයන් ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කරයි. මීට අමතරව තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කමිටුව නමින් උපකමිටුවක් ද පිහිටවනු ලැබීය. සෑම උපකමිටුවක් සඳහා පවතින විෂය ක්ෂේත්‍රය වාර්ෂිකව සමාලෝචනය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්/ ලංකා බැංකුවේ ලේකම් සියළුම උපකමිටුවල ලේකම් ලෙස පත්කර ඇති අතර, උපකමිටුවේ සභාපතිගේ අධීක්ෂණය යටතේ රැස්වීම් වාර්තා පවත්වා ගනී. උපකමිටු වල වාර්තා වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම් වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇත. එකම කොටස්කරුවා රජය වන නිසා, බැංකුවේ වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට හා බැංකුව අදාළ අමාත්‍යාංශයට ඉදිරිපත් කෙරේ.
3 (6) (ii)	විගණන කමිටුව සම්බන්ධයෙන් පහත රීති අදාළ වේ: (අ) ගණකාධිකාරණය සහ/ හෝ විගණනය පිළිබඳ සුදුසුකම් ඇති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු කමිටුවේ සභාපතිවරයා විය යුතුය.	අනුකූල වී ඇත. විගණන කමිටුවේ සභාපතිත්වය දරනු ලබන්නේද අවශ්‍ය සුදුසුකම් හා අත්දැකීම් ඇති ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2021 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	ආ) කමිටුවේ සෑම සාමාජිකයෙක්ම විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතු ය.	අනුකූල වී ඇත. කමිටුවේ සියළුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
	ඇ) කමිටුව විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කළ යුතුය: i. අදාළ නීති ප්‍රකාරව විගණන සේවා සඳහා බාහිර විගණක පත් කිරීම. ii. මහ බැංකුව විසින් විගණකවරුන් වෙත වරින් වර නිකුත් කරන ලද උපදෙස් මාලාවන් ක්‍රියාත්මක කිරීම. iii. අදාළ ගිණුම්කරණ ප්‍රමිත භාවිතා කිරීම. iv. විගණකවරුන්ගේ සේවා කාලය, ගාස්තු සහ විගණකවරයාගේ ඉල්ලා අස්වීමක් හෝ ඉවත් කිරීම; මෙහි දී විගණක හවුල්කරුවකුගේ සේවය ලබා ගැනීම වසර පහක් නොඉක්මවිය යුතු අතර, එම කාලය සපිරූ හවුල්කරුවකු නැවත පත්කළ හැකි වන්නේ මුල් වාරය සම්පූර්ණකර වසර තුනක් ඉක්මවූ පසුවය.	අනුකූල වී ඇත. විෂය ක්ෂේත්‍රය අනුව, විගණන කමිටුවේ අනිකුත් කරුණුවලට අමතරව පහත නිර්දේශ කර ඇත: • විගණකවරුන්ට කලින් කල නිකුත් කර ඇති ශ්‍රී ලංකා මහ බැංකු මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම • අදාළ ගිණුම්කරණ ප්‍රමිත භාවිතය විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වන නිසා, බාහිර විගණකගේ කටයුතු සම්බන්ධයෙන් කමිටුවට ඉටු කළ හැකි භූමිකාවක් නැත.
	ඈ) බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වය, විෂය මූලිකත්වය සහ විගණන ක්‍රියාවලියේ සඵලදායකත්වය, අදාළ ප්‍රමිතීන් සහ මනා පරිචයන් අනුව සමාලෝචනය කිරීම කමිටුවේ කාර්යයකි.	විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වන නිසා ඔහුගේ ස්වාධීනත්වය හා සඵලතාව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සහතික කර ඇත.
	(ඉ) අදාළ නීති නියමයන්, අවශ්‍යතාවයන් සහ මාර්ගෝපදේශ මඟින් අවසර දෙන ලද විගණන නොවන සේවා සැපයීම සඳහා බාහිර විගණකයින් යොදා ගැනීම පිළිබඳව ප්‍රතිපත්තියක් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම විගණන කමිටුවේ වගකීමකි. බාහිර විගණකවරයා විසින් සපයනු ලබන එවැනි විගණන නොවන සේවා ඔහුගේ ස්වාධීනත්වය සහ විෂය මූලිකභාවයට හානි නොවන බවට කමිටුව වගබලා ගත යුතුය. විගණන නොවන සේවා සැපයීමේ දී විගණකවරයාගේ ස්වාධීනත්වය හෝ විෂය මූලිකභාවය තක්සේරු කිරීමේදී කමිටුව විසින් පහත කරුණු සළකා බැලිය යුතුය: i. විගණන සමාගමේ නිපුණතා සහ පළපුරුද්ද විගණන නොවන සේවා සැපයීම සඳහා යෝග්‍ය වන්නේ ද නැද්ද යන්න ii. බාහිර විගණකවරයා විසින් එවැනි සේවා සැපයීමේදී විගණනයේ ස්වාධීනත්වය හා/ හෝ විෂය මූලිකභාවය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇද්දැයි යන්න සහ iii. විගණන නොවන සේවාවල ස්වභාවය, අදාළ ගාස්තු මට්ටම්, විගණන සමාගමට සාපේක්ෂව එක් එක් ගාස්තු මට්ටම් හා සමුච්චිත ගාස්තු මට්ටම් යනාදිය බාහිර විගණකවරයාගේ විෂය මූලිකභාවයට හෝ ස්වාධීනත්වයට කිසියම් බලපෑමක් කරන්නේ ද යන වග.	විගණකාධිපති, බැංකුවේ විගණක නිසා මෙය පැන නොනඟී. බැංකුවේ විගණන නොවන කටයුතු සඳහා යොදා ගන්නා බාහිර විගණක ආයතනය (විගණකාධිපති විසින් ඔහුගේ සහයට පත් කරන ලද) කරන විගණන නොවන සේවා මඟින් ගාස්තු හේතු කොට ගෙන එම බාහිර විගණකවරයාගේ විගණන සම්බන්ධයෙන් වන ස්වාධීනත්වයට හෝ විෂය මූලිකභාවයට බලපෑමක් නොකරන බවට කමිටුව සහතික කරයි. සමලෝචිත වසරේදී එවැනි විගණන ආයතනයක් පත් කර නැත.
	(ඊ) විගණනය ආරම්භ කිරීමට පෙර කමිටුව විසින් පහත සඳහන් දේ ඇතුළත් විගණනයේ ස්වභාවය සහ විෂය පථය පිළිබඳව බාහිර විගණකවරයා සමඟ සාකච්ඡා කර අවසන් කළ යුතුය: i. අදාළ ආයතනික නීති සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ කළමනාකරණයේ අභ්‍යන්තර පාලන විධිවිධානවලට බැංකුවේ අනුකූලවීම පිළිබඳ ඇගයීමක්. ii. අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කිරීමේ අවශ්‍යතාවයන් අනුව බාහිර අවශ්‍යතා වෙනුවෙන් මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම. iii. එක් විගණන සමාගමකට වඩා වැඩි සංඛ්‍යාවක් සම්බන්ධ වන විට ඒවා අතර සම්බන්ධීකරණය යනාදියයි.	විගණනයේ විෂය පථය හා පරාසය පිළිබඳව විගණකාධිපති විසින් තීරණය කරනු ලබයි.
	(උ) තොරතුරු අනාවරණය කිරීම සඳහා බැංකුව විසින් නිකුත් කරනු ලබන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන එහි වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තුමය වාර්තාවල සත්‍යතාවය සහ ඒවායේ අඩංගු මූල්‍ය වාර්තාකරණ විනිශ්චයන් පරීක්ෂා කිරීම සඳහා කමිටුව විසින් බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කළ යුතුය. බැංකුවේ වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තුමය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙර කමිටුව විසින් විශේෂයෙන් අවධානය යොමු කළ යුතු කරුණු වන්නේ	අනුකූල වී ඇත. මෙය කමිටුව විසින් මාසික, ත්‍රෛමාසික හා වාර්ෂික මූල්‍ය තොරතුරු සමාලෝචනය කරමින් සිදු කරන අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර, කමිටුවේ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ.

පරිච්ඡේදය	මූලධර්ම	2021 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	i. ප්‍රධාන විනිශ්චයන් සහිත ක්ෂේත්‍ර, ii. ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පරිචයන්ගේ සඳහා වූ වෙනස්කම්, iii. විගණනය තුළින් ඇති වූ ප්‍රධාන ගැලපීම්, iv. අඛණ්ඩ පැවැත්මේ උපකල්පනයන් සහ v. අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූලවීම ආදියයි.	
	(උ) කමිටුව විසින් අතුරු සහ වාර අවසාන විගණන මඟින් මතුවන ගැටළු, ප්‍රශ්න සහ අනෙකුත් දේ සාකච්ඡා කළයුතු අතර, ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ සහභාගිත්වය නොමැතිව විගණකවරයාට සාකච්ඡා කිරීමට අවශ්‍ය දෑ වේ නම් ඒවාද ඇතුළු අනෙකුත් කරුණු ද අවශ්‍ය විට සාකච්ඡා කළ යුතුය.	අනුකූල වී ඇත. කමිටුව විසින් අතුරු සහ වසර අවසාන විගණන මඟින් මතුවන ගැටළු, ප්‍රශ්න සහ අනෙකුත් දේ සාකච්ඡා කරයි. විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වන අතර, ඔහුගේ නියෝජිතයෙකු විගණන කමිටුව සමඟ සංවෘත සාකච්ඡා වලට ඉදිරිපත් වෙයි. සමාලෝචනය කරන ලද වර්ෂය තුළ සංවෘත සාකච්ඡා දෙකක් පැවැත්වුන අතර, ඒ සඳහා නිතිපතා පවත්වන විගණන කමිටු න්‍යාය හා අයිතම ඇතුලත් මඟින් පහසුකම් සපයනු ලැබී.
	(ඌ) කමිටුව බාහිර විගණනයේ කළමනාකරණ ලිපිය හා එයට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කළ යුතුය.	අනුකූල වී ඇත.
	(ඒ) බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යය පිළිබඳව කමිටුව විසින් පහත දැක්වෙන පියවර ගත යුතුය: i. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ සම්පත් ප්‍රමාණවත්ද යන්න සමාලෝචනය හා සිය කටයුතු කරගෙන යාම සඳහා දෙපාර්තමේන්තුවට අත්‍යවශ්‍ය බලය තිබේද යන්න පිළිබඳව සෑහීමකට පත් වීම.	අනුකූල වී ඇත. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ සම්පත් හි ප්‍රමාණාත්මකභාවය සම්බන්ධයෙන් විගණන කමිටුව සමාලෝචනය කර අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ පවතින/ අවශ්‍ය කාර්ය මණ්ඩල පිහිටීම ඇතුළත් වූ කාල සීමාවක් සහිත විගණන සැලැස්මක්, කමිටුව විසින් සලකා බලන ලදී.
	ii. අභ්‍යන්තර විගණන වැඩසටහන හා අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය සහ අදාළ වන පරිදි අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත උචිත ක්‍රියාමාර්ග ගෙන තිබේදැයි සහතික කිරීම.	අනුකූල වී ඇත. කමිටුව මඟින් අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කරයි. වැඩි දියුණු කිරීම් සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන තිබෙන බවට එහිදී සහතික කරනු ලැබේ.
	iii. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම හෝ තක්සේරු කිරීම සමාලෝචනය කිරීම.	අනුකූල වී ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්යසාධනය හා අභ්‍යන්තර විගණන කාර්යයේ ක්‍රියාපටිපාටිය හා ප්‍රතිඵල විගණන කමිටුව විසින් 2021 වසරදී අගයන ලදී. ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ඇගයුම් ක්‍රියාපටිපාටිය අනුව යමින්, ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් 2021 වර්ෂය සඳහා ඉටු කරන ලදී.
	iv. අංශ ප්‍රධානී, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් හා අභ්‍යන්තර විගණන කාර්යය සඳහා බාහිර සේවා සපයන්නන් බඳවා ගැනීම හා සේවය හමාර කිරීම පිළිබඳ නිර්දේශ කිරීම.	අභ්‍යන්තර විගණන කාර්යය සඳහා අභ්‍යන්තර විගණන ප්‍රධානියා සහ බාහිරින් ලබා ගත් සේවා සපයන්නන් සම්බන්ධයෙන් අනුකූල වේ. අනෙකුත් ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය පත් කරනු ලබන්නේ බැංකු කාර්ය මණ්ඩලය අතරින් ය.
	v. ප්‍රධාන අභ්‍යන්තර විගණක ද ඇතුළුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ හා බාහිර සේවා සම්පාදකයන්ගේ ඉල්ලා අස්වීම් පිළිබඳව කමිටුව දැනුවත් කරන බවට ද ඉල්ලා අස්වන ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයට හා බාහිර සේවා සම්පාදකයන්ට තමන් ඉල්ලා අස්වීමට හේතු ඉදිරිපත් කරන්නට අවස්ථාවක් සලසා දී ඇති බවට සහතික වීම.	අනුකූල වී ඇත. මෙබඳු අවස්ථාවක් වසර තුළ පැන නැඟුනේ නැත.
	vi. අභ්‍යන්තර විගණනය, එහි විගණනයට බඳුන්වන කටයුතු වලින් ස්වාධීන වන බවට හා අපක්ෂපාතීව, ප්‍රවීණතාවයෙන් යුක්තව හා නිසි වෘත්තීය සැලකිල්ල සහිතව ඉටු කෙරෙන බවට සහතික වීම.	අනුකූල වී ඇත. බැංකුවේ සංවිධාන ව්‍යුහය අනුව ප්‍රධාන අභ්‍යන්තර විගණක, විගණන කමිටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුවම වාර්තා කරන අතර, ඔහු බැංකුවේ මෙහෙයුම් කටයුතු වලින් ස්වාධීනව කටයුතු කරයි.
	(ඔ) කමිටුව, අභ්‍යන්තර විමර්ශනයන් හි ප්‍රධාන පෙළේ නිගමන හා ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සලකා බැලිය යුතුය.	අනුකූල වී ඇත. විගණක කමිටුව, අභ්‍යන්තර විමර්ශනයන් හි ප්‍රධාන පෙළේ නිගමන හා ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කළේය.
	(ඕ) ප්‍රධාන මූල්‍ය නිලධාරි, ප්‍රධාන අභ්‍යන්තර විගණක හා බාහිර විගණකවරුන්ගේ නියෝජිතයෙක් සාමාන්‍යයෙන් රැස්වීම් සඳහා සහභාගි වනු ඇත. සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට හා ප්‍රධාන විධායක නිලධාරීන්ට, කමිටුවේ ආරාධනයෙන් රැස්වීම් සඳහා සහභාගි වීමට ඉඩ ඇත. කෙසේ වුවත් කමිටුව යටත් පිරිසෙයින් වසරකට දෙවරක් විධායක අධ්‍යක්ෂවරුන් රහිතව බාහිර විගණකවරුන් හමුවිය යුතුය.	අනුකූල වී ඇත. ප්‍රධාන මූල්‍ය නිලධාරි, අතිරේක මහා කළමනාකරු, අභ්‍යන්තර විගණක, ප්‍රධාන අවදානම් නිලධාරි, අනුකූලතා නිලධාරි හා විගණකාධිපතිවරයාගේ නියෝජිතවරයා කමිටු රැස්වීම් වලට සහභාගි විය. මහා කළමනාකාරතුමාද කමිටුවේ ආරාධනය මත රැස්වීම් වලට සහභාගි විය. කළමනාකාරිත්වයේ සාමාජිකයන් අවශ්‍යතාවය මත, කරුණු පැහැදිලි කිරීම සඳහා කැඳවනු ලබති. සංවෘත දොරටු රැස්වීම් රැස්වීම්වල න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති අතර විගණකාධිපතිවරයාගේ නියෝජිතයා අවශ්‍යතාවය තීරණය කරයි. ඉහත "උ" යටතේ දක්වා ඇති පරිදි විධායක නිලධාරීන් නොමැතිව විගණකාධිපතිවරයාගේ නියෝජිතයා සමඟ සංවෘත දොරටු රැස්වීම් දෙකක් වර්ෂය තුළ පවත්වන ලදී.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2021 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ක) කමිටුවට පහත කියැවෙන දෑ සතුව තිබිය යුතුය: i. විෂය පථයට අයත් වන කරුණක් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා ප්‍රකාශිත අධිකාරිය ii. එසේ කටයුතු කරන්නට අවශ්‍ය සම්පත්, iii. තොරතුරු සඳහා පූර්ණ ප්‍රවේශය, iv. අවශ්‍ය නම්, බාහිර වෘත්තීය උපදෙස් ලබා ගැනීමට හා අදාළ පළපුරුද්ද සහිත බාහිර පාර්ශ්වයන්ට රැස්වීම් සඳහා ආරාධනා කිරීම උදෙසා අධිකාරිය.	අනුකූල වී ඇත.
	(ඛ) කමිටුව, සාකච්ඡාවට නියමිත කරුණු පිළිබඳ නිසි දැනුම්දීමක් සහිතව ක්‍රමිකව රැස්විය යුතු අතර, සිය කාර්යයන් හා වගකීම් ඉටු කිරීමෙහි දී වළඹී නිගමනයන් වාර්තාගත කළ යුතුය.	අනුකූල වී ඇත. විගණන කමිටුව ක්‍රමිකව රැස්වීම් පැවත්වීය. අවශ්‍ය කරන පරිදි අතිරේක රැස්වීම් පවත්වනු ලැබේ. ඒ අනුව මෙම වසර තුළදී සත් වතාවක් කමිටුව රැස්වන ලදී. කමිටුවේ සාමාජිකයන් වෙත සාකච්ඡාවට භාජනය වන කරුණු පිළිබඳ කල් ඇතිව දැනුම් දී ඇති අතර, එහි බලතල හා වගකීම් ඉටු කිරීමේදී වළඹෙන නිගමනයන් නිසි පරිදි වාර්තා කර ඇත.
	(ඡ) අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් කරුණු පිළිබඳ සවිස්තරාත්මක හෙළිදරව්වක් කළ යුතුය: i. විගණන කමිටුවේ කටයුතු පිළිබඳ සවිස්තර තොරතුරු, ii. වසර තුළ පැවැත්වූ විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව, හා iii. එම රැස්වීම් තුළ ඒ ඒ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ පැමිණීම.	අනුකූල වී ඇත. කමිටුවේ කටයුතු වාර්ෂික වාර්තාවේ පිටු අංක 93 හි විගණන කමිටු වාර්තාවේ දක්වා ඇත. කමිටුව සභාභාගිවීම් විස්තර වාර්ෂික වාර්තාවේ පිටු අංක 88 හි දක්වා ඇත.
	(ට) කමිටුවේ ලේකම් (සමාගම් ලේකම් හෝ අභ්‍යන්තර විගණන කාර්ය ප්‍රධානී විය හැක) කමිටු රැස්වීම්වල වාර්තා සවිස්තරව වාර්තා ගත කර පවත්වාගෙන යා යුතුය.	අනුකූල වී ඇත. කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරන ලංකා බැංකුවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් රැස්වීම්වල වාර්තා පවත්වා ගනු ලබයි.
	(ඩ) බැංකු කාර්ය මණ්ඩලයට, මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන විධි හෝ වෙනත් දෑ පිළිබඳ විය හැකි අයථා ක්‍රියාවන් සම්බන්ධ සිය සැලකිලිමත් වීම්, රහස්‍යභාවයෙන් යුතුව මතු කිරීමට පවත්නා විධිවිධාන කමිටුව විසින් සමාලෝචනය කළ යුතුය. ඒ අනුව කමිටුව මෙකී කරුණු මත සාධාරණ හා ස්වාධීන විමර්ශනය සඳහා නිසි විධිවිධාන ස්ථාපිත කර ඇති බවට හා උචිත පසු විපරම් කාර්යයන් පිළිබඳව සහතික විය යුතු අතර, බාහිර විගණනකවරුන් හා බැංකුවේ සම්බන්ධතා සුපරීක්ෂණ සඳහා වන ප්‍රධානතම නියෝජන මණ්ඩලය ලෙසද කටයුතු කළ යුතුය.	අනුකූල වී ඇත. මෙම කරුණු ආවරණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලත් 'විස්ල් බ්ලෝවර් ප්‍රතිපත්තියක්' ස්ථාපිත කර ඇති අතර, සැලකිය යුතු මට්ටමේ සොයා ගැනීම්, උචිත පසු විපරම් කටයුතු සඳහා විගණන කමිටුවට වාර්තා කරන ලදී. විගණන කමිටුව, බාහිර විගණකවරු සමඟ බැංකුවේ සම්බන්ධතා නිරීක්ෂණයේ ප්‍රධානතම නියෝජිතයා වන අතර බැංකුවේ බාහිර විගණක වන විගණකාධිපති සමඟ සම්බන්ධීකරණ කටයුතු කරයි.
3 (6) (iii)	පහත දැක්වෙන ඊති මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සම්බන්ධයෙන් බල පවත්වනු ඇත: (අ) කමිටුව, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරියාගේ හා ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන්ගේ පාරිශ්‍රමික (වැටුප්, දීමනා හා සෙසු මූල්‍යමය ගෙවීම්) ප්‍රතිපත්තිය නිශ්චය කළ යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික අදාළ අමාත්‍යංශය හරහා ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන චක්‍රලේඛ/ ලිපි හා 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධන වලට අනුරූප වන අතර, තවද බැංකුව ඉහත සඳහන් කළ චක්‍රලේඛ/ ලිපි සහ ලංකා බැංකු ආඥා පනත මත පදනම් ව පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් සම්මත කොට ඇති අතර එය 2021 වසරේදී යහපාලන ප්‍රතිපත්තිය අනුමත කිරීමේදී සමාලෝචනය කරන ලදී. ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් ස්ථාපිතය. කමිටුව විසින් වසර තුනකට වරක් මහා කළමනාකාරතුමාගේ සහ ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින්ගේ පාරිශ්‍රමික පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කරයි. 2021 සිට 2023 දක්වා වූ සංශෝධන සමාලෝචිත වර්ෂය තුළ මෙම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.
	(ආ) කමිටුව, අධ්‍යක්ෂකවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් හා ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන් සඳහා අරමුණු හා ඉලක්ක ස්ථාපිත කළ යුතුය.	අනුකූල වී ඇත. ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන්ට අදාලව සම්පූර්ණ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහභාගීත්වයෙන් යුතුව ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින් සඳහා අරමුණු හා ඉලක්ක බැංකුවේ ආයතනික සැලැස්ම පදනම් කොට සැකසූ ක්‍රියාකාරී සැලැස්ම තුළ විස්තරාත්මකව වාර්තා ගතකර ඇත. ප්‍රධාන කළමනාකාරීත්ව කණ්ඩායම තුළින් ආයතනික සැලැස්ම ක්‍රියාත්මක කරලීමේ වගකීම මහා කළමනාකරුට පැවරේ. ඉහත සැලසුම් මත පදනම්ව, කමිටුව විසින් 2021 වර්ෂය සඳහා සාමාන්‍යාධිකාරී සහ ආයතනික කළමනාකාරීත්වයේ සාමාජිකයින් සඳහා පිහිටුවා ඇති ඉලක්ක සහ ඉලක්ක නිර්දේශ කරන ලදී. විධායක නොවන අධ්‍යක්ෂවරුන් නිසා අධ්‍යක්ෂවරුන් සඳහා ඉලක්ක පනවා නැත.
	(ඇ) කමිටුව ප්‍රධාන විධායක නිලධාරියාගේ හා ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන් ගේ කාර්යසාධනය, ඔවුන්ට ලබාදුන් ඉලක්ක හා අරමුණු සමඟ කලින් කලට ඇගයීමට ලක්කෙරුණු ලබන අතර, පාරිශ්‍රමික, ප්‍රතිලාභ හා කාර්යසාධනය මත පදනම් අනෙකුත් ගෙවීම් සමාලෝචනය කිරීමේ පදනම නිශ්චය කළ යුතුය.	වර්ෂ අවසාන කාර්යසාධන ඇගයීම් පැවැත්වීමට නියමිතයි

පරිච්ඡේදය	මූලධර්ම	2021 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	ඈ) ප්‍රධාන විධායක නිලධාරී පිළිබඳ කරුණු සාකච්ඡා වන අවස්ථාවන්හි හැර සෙසු සියළුම කමිටු රැස්වීම් වල දී ප්‍රධාන විධායක නිලධාරීගේ පෙනී සිටීම අවශ්‍යය.	අනුකූල වී ඇත.
3 (6) (iv)	නාමයෝජනා කමිටුව සම්බන්ධව පහත දැක්වෙන ඊති බලපානු ඇත:	බැංකුව නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුවක් ස්ථාපනය කර ඇත. මෙම නිර්දේශයේ දක්වා ඇති වැඩකටයුතු වලට අමතරව අදාළ ආයතනික යහපාලන මූලධර්ම පවත්වාගෙන යාම හා බැඳුණු අනෙකුත් නිශ්චිත වැඩ කටයුතුද කමිටුවේ විෂය ක්ෂේත්‍රය තුළ අන්තර්ගත කර ඇත. කමිටුව සඳහා වන ප්‍රඥප්තිය 2021 වර්ෂය තුළ සමාලෝචනය කරන ලදී.
	(අ) කමිටුව, නව අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන් තෝරා පත් කර ගැනීම සඳහා පටිපාටියක් ක්‍රියාත්මක කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුව අයත් වන අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබයි. අධ්‍යක්ෂවරුන් පත් කිරීම පිළිබඳ ප්‍රතිපත්තියක් ද අදාළ අමාත්‍යාංශය සමඟ හුවමාරු කර ගෙන ඇත. ලංකා බැංකු ආඥා පනත දක්වා ඇති පරිදි ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත කී අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව මහා කළමනාකරු පත් කරයි. මහා කළමනාකරු සහ ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින් පත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත පොදු පටිපාටියක්/ යෝජනා ක්‍රමයක් පවතී.
	ආ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත වගකීම් ඉටු කිරීම සම්බන්ධයෙන් අදාළ අධ්‍යක්ෂවරයාගේ කාර්යසාධනය හා දායකත්වය සැලකිල්ලට ගනිමින් වර්තමාන අධ්‍යක්ෂවරුන් යළි පත් කිරීම නිර්දේශ කිරීම (හෝ නිර්දේශ නොකිරීම) සලකා බැලිය යුතුය.	අධ්‍යක්ෂවරුන් පත්කරනු ලබන්නේ අදාළ අමාත්‍යවරයා විසින් බැවින් මෙය පැන නොනගී.
	(ඇ) ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන් යන තනතුරු සඳහා තෝරා පත් කිරීමට/ උසස් කිරීමට සලකා බැලිය යුතු සුදුසුකම්, පළපුරුද්ද හා විශේෂිත ගුණාංග වැනි නිර්ණායකයන් කමිටුව විසින් ස්ථාපිත කළ යුතුය.	අනුකූල වී ඇත. මහා කළමනාකරු පත් කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද නිර්ණායක, සුදුසුකම් සහ අනෙකුත් ප්‍රධාන ගුණාංග සහ නිපුණතා සලකා බැලේ. සෙසු ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරී තනතුරු සඳහා තෝරා ගැනීම හෝ උසස් කිරීමට යෝග්‍යතාවය ලැබීමට අවශ්‍ය කරුණු, අවශ්‍ය සුදුසුකම්ද සඳහන් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උසස් කිරීමේ ක්‍රියාවලියක් ඇත.
	(ඈ) කමිටුව, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන් නියෝග අංක 3 (3) ආඥා පනත්වල දක්වා ඇති නිර්ණායක පරිදි අදාළ තනතුරු දැරීමට සුදුසු හා යෝග්‍ය පුද්ගලයන් බවට සහතික කළ යුතුය.	අනුකූල වී ඇත. තමන්, අංක 3 (3) නියෝගය හා ආඥා පනත් වල දක්වා ඇති නිර්ණායක තුළින් විශේෂිතව පෙන්වා ඇති පරිදි සිය තනතුරු දැරීමට සුදුසු හා යෝග්‍ය පුද්ගලයන් බවට සහතික කරමින් අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික ප්‍රකාශ ලබා ගන්නා අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කෙරේ. තවද ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන් එම තනතුරු වලට පත් කරන හෝ උසස් කෙරෙන අවස්ථාවන්හි දී ඔවුන් එකී තනතුර දැරීමට සුදුසු හා යෝග්‍ය පුද්ගලයන් බව කමිටුව තහවුරු කරයි.
	(ඉ) කමිටුව, අතිරේක/ නව නිපුණතාවයන් පිළිබඳව අවශ්‍යතා හා විශ්‍රාම ගන්නා අධ්‍යක්ෂවරුන්ගේ හා ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීගේ අනුප්‍රාප්තික සැලසුම් පිළිබඳව සළකා බලා, විටින් විට නිර්දේශ කරනු ලැබේ.	අනුකූල වී ඇත. ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන් උදෙසා අනුප්‍රාප්තික සැලැස්ම ස්ථාපිත කර ඇත. අවශ්‍ය අතිරේක හෝ නව නිපුණතා අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු විසින් හෝ නැතහොත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කෙරේ.
	(ඊ) කමිටුව ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුගේ සභාපතිත්වය සහිත විය යුතු අතර, වඩා යෝග්‍ය ලෙස බහුතරයක් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය යුතුය. ප්‍රධාන විධායක නිලධාරියාට, ආරාධනයෙන් රැස්වීම් සඳහා සහභාගි විය හැකිය.	අනුකූල වී ඇත.
3 (6) (v)	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සම්බන්ධයෙන් පහත දැක්වෙන ඊති බලපවත්වනු ඇත:	අනුකූල වී ඇත.
	(අ) කමිටුව, යටත් පිරිසෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු, ප්‍රධාන විධායක නිලධාරී සහ ණය, වෙළඳපොළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම් හා උපායමාර්ගික අවදානම් වැනි පුළුල් අවදානම් කාණ්ඩ සුපරීක්ෂණය කරන ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන්ගෙන් සමන්විත විය යුතුය. කමිටුව, ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන් හා සම්පව කටයුතු කළ යුතු අතර, කමිටුවට අනුයුක්ත වගකීම් හා අධිකාරීත්ව රාමුව තුළ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගත යුතුය.	සමාලෝචනය කරන ලද වර්ෂය තුළ කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. මහා කළමනාකරු සහ ණය, වෙළඳපළ, මෙහෙයුම්, කීර්තිනාම හා උපායමාර්ගික අවදානම් සුපරීක්ෂණය කරන ප්‍රධාන අවදානම් නිලධාරියාගෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රධාන මූල්‍ය නිලධාරී හා අනුකූලතා නිලධාරී කමිටුවේ ආරාධනාව මත සෑම කමිටු රැස්වීමකටම සහභාගි වෙති. සෙසු ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින් හා සෙසු කාර්ය මණ්ඩලය කමිටුවට ඔවුන්ගේ පැමිණීම අවශ්‍ය අවස්ථා වලදී ආරාධනය කරනු ලැබේ. කමිටුව, එහි අධිකාරීත්ව රාමුව හා ඊට අනුයුක්ත වගකීම් තුළ ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින් හා සම්පව කටයුතු කරයි.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2021 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ආ) කම්ටුව බැංකුවට ඇති සියළුම අවදානම් උදාහරණ ලෙස ණය, වෙළඳපොළ, ද්‍රවශීලතාවය මෙහෙයුම් හා උපායමාර්ගික අවදානම්, සුදුසු අවදානම් දර්ශක හා කළමනාකරණ තොරතුරු තුළින් මාසිකව තක්සේරු කල යුතුය. පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණය බැංකුව පදනම්න් හා සමූහ පදනම්න් යන දෙයාකාරයෙන්ම සිදු කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුවේ ස්වාධීන වීකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය, බැංකුවේ ණය, වෙළඳපොළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම්, උපායමාර්ගික හා කීර්තිනාම අවදානම් කම්ටුව විසින් නිර්දේශ කොට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති ලේඛණ මත පදනම්ව, මාසික පදනමකින් තක්සේරු කරන අතර, සාරාංශ ගත වාර්තා කම්ටු රැස්වීම් වලටද ඉන් පසු එළෙඹෙන ආසන්නතම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමටද ඉදිරිපත් කරනු ලැබේ. පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම් අවදානම් පිළිබඳව කටයුතු කිරීම සඳහා අවදානම් කළමනාකරණ දර්ශන පුවරුවක් සකස් කොට ඇති අතර කම්ටුවට වාර්තා ද සපයයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත සාමුහික අවදානම් ප්‍රතිපත්තියක් ද ස්ථාපිතය.
	(ඇ) කම්ටුව, විශේෂිත අවදානම් කෙරේ පියවර ගන්නට හා කම්ටුව විසින් පැහැදිලිව පනවා ඇති ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම් සීමා තුළ හිදිමින් මෙකී අවදානම් කළමනාකරණය කරන්නට, ණය කම්ටුව හා වත්කම් හා වගකීම් කම්ටු බඳු කළමනාකාරීත්ව මට්ටමේ කම්ටුවල ප්‍රමාණාත්මකතාව හා සථලතාවයන් සමාලෝචනය කළ යුතුය.	අනුකූල වී ඇත.
	(ඈ) බැංකුවේ ප්‍රතිපත්ති හා නියාමක හා සුපරීක්ෂණ අවශ්‍යතා පදනම මත කම්ටුව විසින් තීරණය කළ විවක්ෂණශීලිතාවයන්ට ඔබ්බෙන් වන මට්ටමේ විශේෂිත අවදානම් පවත්නා අවස්ථාවන් හිදී කම්ටුව කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය.	අනුකූල වී ඇත. සීමාවන් ඉක්මවා ගිය විශේෂිත ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම්, ප්‍රධාන අවදානම් නිලධාරී විසින් අධීක්ෂණය කරනු ලබන අතර ඒ සම්බන්ධ ගැටළුවල තීව්‍රතාවය මත කම්ටුවට සෘජුවම වාර්තා කෙරේ.
	(ඉ) මෙම කම්ටුව, යාවත්කාලීන කළ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්ද ඇතුළුව අවදානම් කළමනාකාරීත්වයේ සියළු පැතිකඩ තක්සේරු කිරීම සඳහා යටත් පිරිසෙන් ත්‍රෛමාසිකව හමුවිය යුතුය.	අනුකූල වී ඇත. වසර තුළදී කම්ටුව අට වතාවක් රැස්විය. රැස්වීම් තොරතුරු හා සහභාගිත්වය පිටු අංක 88 හි දැක්වේ.
	(ඊ) විශේෂිත අවදානම් හඳුනා ගැනීමට අසමත් වීමට වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව කම්ටුව උචිත ක්‍රියාමාර්ග ගත යුතු අතර, කම්ටුව විසින් නිර්දේශ කළ පරිදි හෝ බැංකු සුපරීක්ෂණ අධ්‍යක්ෂ විසින් නිර්දේශ කළ පරිදි, කඩිනම් ප්‍රතිකර්ම ක්‍රියාත්මක යුතුය.	මෙම විධානයට අනුකූල වීම සඳහා විධිමත් ලේඛනගත විනය ක්‍රියා පටිපාටියක් බැංකුව තුළ ක්‍රියාත්මක වේ.
	උ) කම්ටුව, සෑම රැස්වීමක්ම පවත්වා සතියක් ඇතුළත අවදානම් තක්සේරු වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර, එමඟින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, එකඟතාවය හා/ හෝ විශේෂිත නියෝග ඉල්ලා සිටිය යුතුය.	අනුකූල වී ඇත. සෑම රැස්වීමකටම පසු වැලඹෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට, විස්තරාත්මක කම්ටු රැස්වීම් වාර්තා ඉදිරිපත් කරන අතර, ඒ හා සමඟ අවදානම් කළමනාකරණ වාර්තා සහ නිර්දේශ ද යොමු කෙරේ.
	(ඌ) කම්ටුව, නීති, රෙගුලාසි, නියාමන මඟ පෙන්වීම්, අභ්‍යන්තර පාලන විධි හා ව්‍යාපාරික මෙහෙයුම් තුළ සෑම අංශයකම අනුමත ප්‍රතිපත්ති හා බැංකුවේ අනුකූලතාවය තක්සේරු කිරීම උදෙසා අනුකූලතා කෘත්‍යයක් ස්ථාපනය කළ යුතුය. ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරී කාර්ය මණ්ඩලය තුළින් තෝරා ගැනුණු කැපවූ අනුකූලතා නිලධාරියෙකු අනුකූලතා කෘත්‍යය ඉටුකළ යුතු අතර, කලින් කලට කම්ටුවට වාර්තා කළ යුතුය.	අනුකූල වී ඇත. සියළුම ව්‍යාපාරික ක්ෂේත්‍රවල අදාළ නීති, නියාමන, නියාමන මඟ පෙන්වීම්, අභ්‍යන්තර පාලන විධි හා අනුමත ප්‍රතිපත්ති හා සමඟ බැංකුවේ අනුකූලතාවය තක්සේරු කිරීම සඳහා බැංකුව විශේෂ අනුකූලතා කෘත්‍යයක් ස්ථාපනය කර ඇත. මෙම කෘත්‍යය සඳහාම කැපවූ අනුකූලතා නිලධාරියකු විසින් එය මෙහෙයවන අතර, ඔහු ත්‍රෛමාසික අනුකූලතා වාර්තා කම්ටුවට ද මාසික අනුකූලතා වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ද ඉදිරිපත් කරයි. අභ්‍යන්තර පාලන විධි හා බැංකුවේ සෑම ව්‍යාපාරික අංශයක් තුළම අනුමත ප්‍රතිපත්ති හා සමඟ බැංකුවේ අනුකූලතාවය ද තක්සේරු කරයි.
3 (7) සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු		
3 (7) (i)	කිසියම් පුද්ගලයෙකු සහ විශේෂයෙන් මෙම නිර්දේශයට අනුව සම්බන්ධිත පාර්ශ්ව සේ සැලකෙන පහත දැක්වෙන පුද්ගල කාණ්ඩ හා බැංකුවේ කිසියම් ගනුදෙනුවකින් මතු විය හැකි අරමුණු අතර, ගැටුම් ඇතිවීම වළකාලන්නට අවශ්‍ය පියවර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගත යුතුය: (අ) බැංකුවේ පරිපාලිත සමාගම් අතරින් කිසිවක්. (ආ) බැංකුවේ ආශ්‍රිත සමාගම් අතරින් කිසිවක්. (ඇ) බැංකුවේ අධ්‍යක්ෂවරුන් අතරින් කිසිවෙක්. (ඈ) බැංකුවේ ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන් අතරින් කිසිවෙක්. (ඉ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙකුගේ හෝ ප්‍රධානතම කළමනාකාරීත්ව නිලධාරියෙකුගේ ආසන්නතම පවුලේ සාමාජිකයෙක්. (ඊ) බැංකුවේ සැලකිය යුතු බැඳියාවක් සහිත කොටස් හිමියෙක්. (උ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙක්, බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ කිසියම් ආසන්න පවුලේ සාමාජිකයෙක් හෝ කිසියම් සැලකිය යුතු කොටස් හිමියෙක් සැලකිය යුතු බැඳියාවක් දරණ ව්‍යාපාරයක්.	අනුකූල වී ඇත. සම්බන්ධිත පාර්ශ්ව, ඔවුන්ගේ ගනුදෙනු හා සම්බන්ධිත පාර්ශ්වයන්ට වඩා වාසිදායක සැලකිල්ලක් පිරිනැමීම සීමා කිරීම ආවරණය කෙරෙන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියක් ඇති අතර, එහි අරමුණ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර අරමුණු සඳහා ගැටුම් ඇතිවීම වළකාලීමය. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සහිත අධ්‍යක්ෂවරුන්ගෙන් සිය ගනුදෙනු හෙළිදරව් කරන ලෙස පුද්ගලිකව ඉල්ලා සිටිනු ලැබේ. එම ගනුදෙනු ස්වයංක්‍රීය පද්ධතියක් හරහා අධීක්ෂණය කෙරේ.

පරිච්ඡේදය	මූලධර්ම	2021 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (7) (ii)	මෙම නියෝගය මඟින් ආවරණය කෙරෙන සම්බන්ධිත පාර්ශ්ව හා ගනුදෙනු වර්ග තුළ පහත දැක්වෙන දෑ ඇතුළත්විය යුතුය: (අ) උපරිම ණය පහසුකම් පිළිබඳ මුදල් මණ්ඩලයේ නියෝග තුළ නිර්වචනය කර ඇති කිසියම් ආකාරයක ණය පහසුකමක් පිරිනැමීම. (ආ) තැන්පතු, ණය ගැනීම් හා ආයෝජන යන ආකාරයෙන් බැංකුවේ ඕනෑම වගකීමක් නිර්මාණය කිරීම. (ඇ) බැංකුවට සැපයූ හෝ බැංකුවෙන් ලබාගත් කිසියම් මූල්‍යමය හෝ මූල්‍යමය නොවන සේවා සම්පාදනය. (ඈ) බැංකුව හා කිසියම් සම්බන්ධිත පාර්ශ්ව අතර, එබඳු සම්බන්ධිත පාර්ශ්වයන්ට ප්‍රතිලාභ අත්කර දිය හැකි, හිමිකාරිත්ව, රහසිගත හෝ වෙනයම් ආකාරයකින් සංවේදී විභවයක් සහිත තොරතුරු හුවමාරු කිරීමට තුඩුදිය හැකි වාර්තාකරණ මාර්ග හෝ තොරතුරු ප්‍රවාහ ගොඩනැගීම හා පවත්වා ගෙන යාම.	අනුකූල වී ඇත. මේ පිළිබඳ තොරතුරු සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් යටතේ වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර ඇත.
3 (7) (iii)	බැංකුව ඉහත සඳහන් විධාන අංක 3 (7) (i) තුළ නිර්වචනය කර ඇති අන්දමට සම්බන්ධිත පාර්ශ්ව හා සමඟ, සමාන ව්‍යාපාරික කටයුතු වල නිරත බැංකුවේ සෙසු ගනුදෙනුකරුවන්ට සපයනවාට වඩා වැඩි වාසිදායක සැලකීමක් එබදු පාර්ශ්වයන්ට පිරිනැමෙන අන්දමේ ගනුදෙනුවල නිරත නොවන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කළ යුතුය. මේ සම්බන්ධයන් වැඩි වාසිදායක සැලකීම යන්නට, පහත දැක්වෙන දෑ ඇතුළත් වෙයි. (අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කළ පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ විචක්ෂණශීලි ප්‍රතිශතය ඉක්මවමින් සමස්ථ ශුද්ධ ණය පහසුකම්, සම්බන්ධිත පාර්ශ්වයන්ට සැපයීම. මෙම උප විධානය අනුව, i. 2007 අංක 7 දරණ බැංකු ආඥා පනත අනුව පහසුකම් යනුවෙන් නිර්වචනය කරනුයේ උපරිම ප්‍රමාණයේ පහසුකමයි. ii. සමස්ත ශුද්ධ ණය පහසුකම සමස්ථ ණය පහසුකමෙන්, මුදල්මය සුරැකුම් හා මෙබඳු සම්බන්ධිත පාර්ශ්ව විසින් බැංකුවේ කොටස් ප්‍රාග්ධනය තුළ හා වසර 5 කට හා එයට වැඩි කල්පිරීමේ කාලසීමාවක් සහිත ණය උපකරණයන් හි ආයෝජනය අඩු කිරීමෙන් ගණනය කළ යුතුය. (ආ) අසම්බන්ධිත සංසන්දනාත්මක ප්‍රතිපාර්ශ්වයක් සමඟ සංසන්දනාත්මක ගනුදෙනුවකදී බැංකුවේ ප්‍රශස්තම ණය පොළී අනුපාතයට වඩා අඩු පොළියක් අය කිරීම හෝ බැංකුවේ තැන්පතු පොළියට වඩා වැඩි පොළියක් ගෙවීම. (ඇ) අසම්බන්ධිත පාර්ශ්ව හා සාමාන්‍ය ව්‍යාපාරික ගනුදෙනු කරගෙන යාමේදී පිරිනමන කොන්දේසි ඉක්මවන, වාසිදායක කොන්දේසි, වෙළඳ අලාභ ආවරණය හෝ ගාස්තු/ කොමිස් කපා හැරීම වැනි පක්ෂපාති සැලකිල්ල දැක්වීම. (ඈ) ඇඟයීම් පටිපාටියක් රහිතව සම්බන්ධිත පාර්ශ්වයකට සේවා සැපයීම හෝ සේවා ලබා ගැනීම. (ඉ) නිත්‍යානුකූල වැඩ කටයුතු හා කාර්යාවලි සාධනය සඳහා අවශ්‍ය ප්‍රමාණ හැර, හිමිකාරිත්ව, රහසිගත හෝ වෙනත් ආකාරයකින් සංවේදී විභවයක් සහිත තොරතුරු සම්බන්ධිත පාර්ශ්ව හා බෙදාගැනීමට තුඩුදිය හැකි වාර්තාකරණ මාර්ග හා තොරතුරු ප්‍රවාහ පවත්වාගෙන යාම.	අනුකූල වී ඇත. බැංකුව, අනුකූලතා අංශය විසින් අධීක්ෂණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු අධීක්ෂණය කිරීමේ පටිපාටියක් ක්‍රියාත්මක කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාසිකව ඉදිරිපත් කරනු ලබන අනුකූලතා වාර්තාවෙහි අනුකූලතා තත්ත්වය සඳහන් කර ඇත. තවදුරත් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කාර්තුමය පදනමින් විගණන කමිටුව වෙත වාර්තා කරයි. අනුකූල නොවූ අවස්ථා වලදී එය අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කරනු ලැබේ.
3 (7) (iv)	බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී, අදාළ අධ්‍යක්ෂවරයා හැර සෙසු අධ්‍යක්ෂවරුන් අතරින් තුනෙන් දෙකක්, එබඳු ණය පහසුකමක් පිරිනැමීම සඳහා කැමැත්තෙන් ඡන්දය පාවිච්චි කොට එකී පහසුකම අනුමත කළ අවස්ථාවේ හැර, බැංකුව කිසිඳු අධ්‍යක්ෂවරයෙකුට හෝ අධ්‍යක්ෂවරයාගේ සමීප ඥාතියෙකුට කිසිදු ණය පහසුකමක් පිරි නොනැමිය යුතුය. මෙබඳු ණය පහසුකමක්, මුදල් මණ්ඩලය මඟින් වරින් වර නිශ්චය කරනු හැකි කිසියම් සුරැකුමකින් ආවරණය කළ යුතුය.	අනුකූල වී ඇත.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2021 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (7) (v)	(අ) බැංකුවක් කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයෙකුගේ ආසන්න පවුලේ සාමාජිකයෙකුට හෝ පුද්ගලයා විසින් සැලකිය යුතු බැඳියාවක් දරණ කිසියම් ව්‍යාපාරයකට කිසියම් ණය පහසුකමක් පිරිනමනු ලැබූ අවස්ථාවක එකී පුද්ගලයා පසු කාලීනව බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස පත්කර ඇත්නම්, බැංකුව විසින් එම පුද්ගලයා අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කළ දිනයේ සිට වසරක් ඇතුළත, මුදල් මණ්ඩලය විසින් මෙබදු කරුණක් සඳහා වරින් වර අනුමත කරනු ලැබිය හැකි අවශ්‍ය සුරැකුම් ලබාගැනීමට බැංකුව විසින් පියවර ගැනිය යුතුය. (ආ) ඉහත කී 3(7)(v) (අ) විධානය මඟින් සලසා ඇති පරිදි එකී කාලසීමාව තුළ එබඳු සුරැකුමක් සම්පාදනය නොකළ අවස්ථාවකදී බැංකුව එකී පහසුකම සම්බන්ධයෙන් ගෙවීමට නියමිත මුදල පොළිය සමඟ, ණය මුදල පිරිනමන අවස්ථාවේදී නියාමනය කළ කාල සීමාව ඇතුළත හෝ එකී අධ්‍යක්ෂවරයෙකු ලෙසින් පත් කළ දිනයේ සිට මාස දහඅටක් ඉකුත්වූ පසු යන මේ දෙකින් මුලින් එළඹෙන දිනයේදී ආපසු අය කරගත යුතුය. (ඇ) මෙකී උප නියෝග අනුව කටයුතු කරන්නට අපොහොසත් වන කිසියම් අධ්‍යක්ෂවරයෙකු වේ නම් ඔහු එකී අධ්‍යක්ෂධුරය හැර ගියා සේ සැලකෙන අතර, බැංකුව ඒ බව පොදු මහජනතාව වෙත හෙළිදරව් කළ යුතුය. (ඈ) කෙසේ වුවද, පහසුකම පිරිනමන අවස්ථාවේදී එකී අධ්‍යක්ෂවරයා බැංකුවේ සේවකයකුව සිටිමින් හා එකී පහසුකම බැංකුවේ සියළුම සේවකයන්ට අදාළ යෝජනා ක්‍රමයක් යටතේ ලබා දුන් අවස්ථාවකදී මෙම උප විධානය අදාළ නොවිය යුතුය.	අනුකූල වී ඇත.
3 (7) (vi)	බැංකුවක්, බැංකුවේ සේවකයන්ට අදාළ යෝජනා ක්‍රමයක් මත වන පදනම්ින් හෝ ඉහත 3(7)(v) විධානය ප්‍රකාර පහසුකම් පිරිනැමීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් අනුමත කළ හැකි සුරැකුමකින් ආවරණය කළ අවස්ථාවකදී හැර කිසියම් සේවකයෙකුට හෝ සේවකයෙකුගේ ආසන්න පවුලේ සාමාජිකයෙකුට හෝ එකී සේවකයා හෝ ආසන්න පවුලේ සාමාජිකයකු සැලකිය යුතු බැඳියාවක් දරණ කිසියම් ව්‍යාපාරයකට හෝ ගාස්තු හෝ කොමිස් කපා හැරීම හා බැඳුණු කිසිදු පහසුකමක් හෝ වඩා වාසිදායක සැලකීමක් පිරි නොනැමිය යුතුය.	අනුකූල වී ඇත. බැංකුව සියළුම සේවකයන්ට අදාළ වන සාමාන්‍ය සේවක ණය යෝජනා ක්‍රම යටතේ හැර බැංකුවේ කිසිම සේවකයෙකුට වඩා වාසිදායක සැලකීමත්/ ණය පහසුකම් සපයා නැත. මේ පිළිබඳව චක්‍රලේඛන උපදෙස් නිකුත් කර ඇත. බැංකු සේවකයන්ගේ ආසන්න පවුලේ සාමාජිකයෙකුට කිසිදු වාසිදායක සැලකීමක්/ පහසුකමක් සපයන්නේ ද නැත.
3 (7) (vii)	බැංකුවක් විසින් ඉහත 3(7)(v), 3(7)(vi) විධාන මත ලබා දුන් කිසිදු පහසුකමක් හෝ එකී පහසුකමක කිසියම් කොටසක් හෝ ඒ සඳහා ලැබිය යුතු කිසියම් පොළියක්, මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය රහිතව ප්‍රේෂණය නොකළ යුතු අතර, කිසියම් ප්‍රේෂණයක් සිදු කරයි නම් එය වලංගු රහිත හා බලනොපාන එකක් විය යුතුය.	අනුකූල වී ඇත. 2021 වසර තුළ මෙබඳු තත්ත්වයක් උද්ගත නොවීය.
3 (8) හෙළිදරව් කිරීම		
3 (8) (i)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දෑ තහවුරු කල යුතුය. (අ) වාර්ෂිකව විගණනය කළ මූල්‍ය ප්‍රකාශ හා ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශ, සුපරීක්ෂණය හා නියාමන බලධාරීන් විසින් නියම කර ඇති ආකෘතිය හා බල පවත්වනා ගිණුම්කරණ ප්‍රමිති හා සමඟ අනුරූපව සකස් කොට ප්‍රකාශයට පත් කර ඇති බව ද, (ආ) එකී ප්‍රකාශයන් හි සංක්ෂිප්තයක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පුවත්පත් වල ප්‍රසිද්ධ කරන බව ද,	අනුකූල වී ඇත.
3 (8) (ii)	පහත දැක්වෙන අවම හෙළිදරව් කිරීම් වාර්ෂික වාර්තාවේ තිබෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය: (අ) වාර්ෂික විගණනය කළ මූල්‍ය ප්‍රකාශන, විශේෂිත හෙළිදරව් කිරීම් ද ඇතුළත්ව, අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා නියාමන අවශ්‍යතාවය අනුව යමින් සකස් කොට ඇති බවට ප්‍රකාශයක්.	අනුකූල වී ඇත. වාර්තා පිටු අංක 115 සිට 119 දක්වා බැංකුවේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව යටතේ ද, පිටු අංක 125 හි මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් යටතේ ද හෙළිදරව් කර ඇත.
	(ආ) මූල්‍ය වාර්තාකරණ පද්ධතිය, මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් සැපයීම සඳහා නිර්මාණය කර ඇති බවට හා බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශ සැකසීම අදාළ මූල්‍යකරණ හා නියාමන අවශ්‍යතා හා අනුරූපවෙමින් ඉටු කළ බවට ද, බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවක්.	අනුකූල වී ඇත. වාර්ෂික වාර්තාවේ පිටු අංක 122 සහ 123 හි මූල්‍ය වාර්තාකරණයේ 'අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය' හා පිටු අංක 125 හි 'මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම' තුළ හෙළිදරව් කර ඇත.

පරිච්ඡේදය	මූලධර්ම	2021 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඇ) ශ්‍රී ලංකා සහතික කිරීමේ කාර්යභාර ප්‍රඥප්ති 3050 යටතේ අභ්‍යන්තර පාලනය මත අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශ පිළිබඳව බැංකු සඳහා සහතික වාර්තා යටතේ විගණනකරුවන් විසින් නිකුත් කළ සහතික වාර්තා.	අනුකූල වී ඇත. බැංකුව මූල්‍ය වාර්තාකරණය මත අභ්‍යන්තර පාලන විධින් හි සඵලතාවය පිළිබඳව විගණනාධිපතිවරයාගෙන් සහතිකයක් ලබාගෙන ඇති අතර එය මෙම වාර්තාවේ පිටු අංක 124 යටතේ දැක්වේ.
	(ඈ) නාමයන්, යෝග්‍යතාවය, බැංකුව සමඟ ඇති ගනුදෙනු සහ බැංකුව විසින් ගෙවූ මුළු ගාස්තු/ පාරිශ්‍රමික ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ විස්තරාත්මක තොරතුරු.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂවරුන්ගේ තොරතුරු පිටු අංක 19 සිට 21 හි දක්වා ඇත. බැංකුව සමඟ වන ගිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ කැමැත්ත පිටු අංක 120 සිට 121 හි දක්වා ඇත. බැංකුව විසින් ගෙවූ පාරිශ්‍රමික පිළිබඳ විස්තර, පිටු අංක 165 හි 17 වන සටහන යටතේ දක්වා ඇත.
	(ඉ) 3 (7) (iii) හි නිර්වචනය කර ඇති පරිදි එක් එක් අදාළ පාර්ශ්ව සඳහා ලබා දී ඇති සම්පූර්ණ ශුද්ධ ණය පහසුකම් අදාළ පාර්ශ්වවල එක් එක් කාණ්ඩයට ලබා දී ඇති ශුද්ධ ණය පහසුකම් බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස ද හෙළි කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස 2021 වර්ෂය තුළ එක් එක් අදාළ පාර්ශ්වයන් සඳහා ප්‍රදානය කරන ලද සම්පූර්ණ ශුද්ධ නවාතැන්" පහත දැක්වේ

	රු. '000	%
ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන්	681,528	0.28
පරිපාලිතයන්	691,797	0.28
ආශ්‍රිත සමාගම්	420,954	0.17
රජය හා රජයට සම්බන්ධිත ආයතන (මූල්‍ය ප්‍රකාශයේ සටහන් අංක 61 හි සඳහන් නිර්වචනය බලන්න.)	2,414,798,009	993.61

	(ඊ) බැංකුව ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන්ට ගෙවූ පාරිශ්‍රමික වල මුළු එකතුව හා ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන් සමඟ බැංකුවේ මුළු ගනුදෙනු එකතුව, ගෙවූ පාරිශ්‍රමික, සැපයූ ණය පහසුකම්, තැන්පතු හා ආයෝජන ආදී විශයෙන් පුළුල් වර්ග යටතේ වෙන්ව දැක්වීම.	අනුකූල වී ඇත. 2021 වර්ෂය සඳහා ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන්ට ගෙවූ පාරිශ්‍රමික හා බැංකුව හා ඔවුන් අතර වූ ගනුදෙනු පහත දැක්වේ:

	රු. '000
කෙටි කාලීන රැකියා ප්‍රතිලාභ	613,180
පශ්චාත් රැකියා ප්‍රතිලාභ	114,220

මෙයට අමතරව බැංකුව විසි අනුමත ප්‍රතිලාභ සැලසුම යටතේ, ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන්ට වාහන පරිහරණය වැනි මුදල්මය නොවන ප්‍රතිලාභ ද සපයා ඇත.

	රු. '000
ණය	598,040
බැංකු අයිරා	10,028
ණය කාඩ්පත්	13,800
තැන්පතු	944,455
ණයකර	41
භාවිතා නොකළ පහසුකම්	74,833

	(උ) 'ශ්‍රී ලංකා සම්බන්ධිත සේවා පරිච ප්‍රකාශය 4750' යටතේ නිකුත් කළ විගණකවරුන්ගේ 'සත්‍ය සොයා ගැනීම් වාර්තාවන්' හි සියළුම සොයා ගැනීම්, වාර්ෂික ආයතනික යහපාලන වාර්තාව තුළට අන්තර්ගත කර ඇති බවට සහ විගණකවරුන් විසින් ඒ පිළිබඳව බැංකු සුපරීක්ෂණ අධ්‍යක්ෂ වෙත දැනුවත් කර ඇති බව අධ්‍යක්ෂවරුන් විසින් සිය වාර්ෂික ආයතනික යහපාලන වාර්තාවේ සහතික කල යුතුය.	අනුකූල වී ඇත. බැංකුව 2007 අංක 11 දරණ ආයතනික යහපාලන විධානය පිළිබඳව විගණකාධිපතිවරයා ගෙන් සහතිකයක් ලබා ගෙන ඇත. විගණකවරුන්ගේ සියළුම සොයාගැනීම් මෙම ආයතනික යහපාලන වාර්තාව තුළ අන්තර්ගත කර ඇති බවට ද, කිසියම් නිර්දේශයක් වේ නම් ඒ පිළිබඳව අදාළ වර්ෂය තුළ කටයුතු කරන බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.
	(ඌ) විචක්ෂණශීලී අවශ්‍යතා, නියාමන නීති රීති හා අභ්‍යන්තර පාලන විධි හා කිසියම් සැලකිය යුතු අනුකූල නොවීම් නිවැරදි කරන්නට ගත් ක්‍රියාමාර්ග සමඟ අනුකූලතා විස්තර විදහා පෙන්වන වාර්තාවක්.	අනුකූල වී ඇත.
	(එ) බැංකුවේ අවදානම් කළමනාකරණයේ ප්‍රමාදදෝෂ හෝ බැංකු සුපරීක්ෂණ අධ්‍යක්ෂ විසින් පෙන්වා දී ඇති පරිදි මෙකී විධානයන් හා අනුකූල නොවීම් පිළිබඳ නියාමන හා සුපරීක්ෂණ සැලකිලිමත් වීම පිළිබඳ ප්‍රකාශයක් හා එවැන්නක් පොදු මහජනතාවට හෙළිදරව් කළ යුතු යැයි මුදල් මණ්ඩලය විසින් නියෝග කළ අවස්ථාවක, එකී සැලකිලිමත් වීම් පිළිබඳව බැංකුව විසින් ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග පිළිබඳවද ඇතුලත් කල යුතුය.	අනුකූල වී ඇත.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2021 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (9) (i)	තාවකාලික හා වෙනත් පොදු ප්‍රතිපාදන අනුකූලතාවයට අදාල මෙම විධානය හා අනුකූලත්වය 2008 ජනවාරි 01 දා සිට ඉදිරියට ආරම්භ කෙරෙන අතර, මෙම විධානය තුළ සපයා ඇති අනුකූලතා දිනයන් විශේෂයෙන් සම්පාදනය කර ඇති විටෙක හැර සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකු 2009 ජනවාරි 01 දා හෝ ඊට ප්‍රථම මෙම විධානයේ විධිවිධානයට පූර්ණ ලෙසින් අනුකූල විය යුතුය.	අනුකූල වී ඇත.
3 (9) (ii)	ශ්‍රී ලංකාව තුළ විශේෂිත ව්‍යවස්ථාපිත පනත් මඟින් සංස්ථාපනය කරන ලද බැංකු සම්බන්ධයෙන් එකී ව්‍යවස්ථාපිත පනත් ප්‍රතිපාදන සමඟ පටහැනි නොවන මෙම විධානයේ සියළුම ප්‍රතිපාදන හා අනුකූල වන්නට පියවර ගත යුතු අතර එකී පනත් තුළින් විශේෂිතව දක්වා ඇති ප්‍රතිපාදන අනුව යමින් දිගටම කටයුතු කළ යුතුය.	අනුකූල වී ඇත. ලංකා බැංකුව 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධන මඟින් පැන නැඟෙන ප්‍රතිපාදන හා පටහැනි නොවන ලෙස මෙම විධානයේ අදාළ හැම ප්‍රතිපාදනයක්ම හා අනුකූල වන්නට ගත හැකි හැම ක්‍රියාමාර්ගයක්ම ගනිමින්, එහි පැනවුම බලාත්මක කර ඇත. කිසියම් අනුකූල අවස්ථා හා එකඟ නොවන අවස්ථාවන්හි බැංකුව ඊට අදාළ ව්‍යවස්ථාපිත පනත් ප්‍රතිපාදන අනුව යමින් කටයුතු කරගෙන යන අවස්ථාවන්හිදී, ඒ බැව් ඉහත අදාළ පරිච්ඡේදයන්හි විශේෂිතව සඳහන් කර ඇත.
3 (9) (iii)	මෙම විධානය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක විදේශ බැංකු ශාඛාවකට අදාළ විය යුත්තේ, එය එකී බැංකුවේ සංස්ථාපිත රට තුළ බලාත්මක නීති හා රෙගුලාසි සමඟ පටහැනි නොවන වපසරිය තුළය විදේශීය බැංකු ශාඛාව, එහි වාර්ෂික වාර්තාව හා ගිණුම් හා ශ්‍රී ලංකා ශාඛා මෙහෙයුම් හා බැඳුණු ගිණුම් සමඟ මව් බැංකුවේ වාර්ෂික ආයතනික යහපාලන වාර්තාව ද ප්‍රකාශයට පත් කළ යුතුය.	අදාළ නොවේ.
3 (9) (iv)	මෙම විධානයේ ප්‍රතිපාදන සහ කිසියම් බැංකුවක සාංගමික ව්‍යවස්ථාවලිය (හෝ අභ්‍යන්තර රීති) අතර ගැටුමක් මතු වූ කිසියම් අවස්ථාවක මෙම විධානයේ ප්‍රතිපාදන බලපවත්වනු ඇත. කෙසේ වූවත්, එක් බැංකුවක සාංගමික ව්‍යවස්ථාවලියේ ප්‍රතිපාදන, මෙම විධානයේ දක්වා ඇති ප්‍රතිපාදනවලට වඩා දැඩි වේ නම් සාංගමික ව්‍යවස්ථාවලියේ ප්‍රතිපාදන අනුව කටයුතු කළ හැකිය.	අදාළ නොවේ.
3 (9) (v)	යම් හෙයකින් අයහපත් සෞඛ්‍ය තත්ත්වය හෝ බැංකු පනතේ විධි විධාන සලසා ඇති පරිදි විධාන අංක 3 (2) (ii) (ආ), 3 (3) (i) (අ) හා 3 (3) (ii) (අ) හා යොමුවෙන මුදා හැරීම් ලබා නොගත යුතු යැයි මුදල් මණ්ඩලය අදහස් කරන්නේ නම්, එකී පදනම මුදල් මණ්ඩලය විසින් එම තැනැත්තාට දැනුම් දිය හැකි අතර, විභාගයකට පසු මුදල් මණ්ඩලයට මුදා හැරීමේ කාලසීමාව සීමා කළ හැකිය.	අදාළ නොවේ.

කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා

කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය හා බැඳුණු ලැයිස්තුගත රීති හා අනුකූලවීම් පහත පරිදි සාරාංශ කළ හැකිය.

රීති අංකය	අවශ්‍යතාවය	කාලපරිච්ඡේදය	ඉදිරිපත් කළ දිනය
7.4.අ.(i)	කාර්තුමය පදනම මත සකස් කළ අතුරු මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර, කොළඹ කොටස් හුවමාරුව වෙත ඉදිරිපත් කළ යුතු අතර, පළමු කාර්තු තුන සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අදාළ කාර්තු නිමවී දින 45 ක් තුළ දී ද අවසන් කාර්තුව සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අදාළ කාර්තුව අවසන් වූ දින සිට මාස දෙකක් තුළ ද ඉදිරිපත් කළ යුතුය.	2021 මාර්තු 31 න් අවසන් පළමු කාර්තුව	2021 මැයි 13
		2021 ජූනි 30 න් අවසන් දෙවන කාර්තුව	2021 අගෝස්තු 11
		2021 සැප්තැම්බර් 30 න් අවසන් තෙවන කාර්තුව	2021 නොවැම්බර් 15
		2021 දෙසැම්බර් 31 න් අවසන් සිව්වන කාර්තුව	2022 පෙබරවාරි 28

රීති අංකය	අවශ්‍යතාවය	අනුකූලතාවය
7.4.ආ.(i)	ශ්‍රී ලං.ගි.ප්‍ර. 34 ට අනුකූලවීම සහ බැංකුව හා සමූහය වෙන් වෙන්ව හෙළිදරව් කිරීම	අනුකූල වී ඇත.
7.4.ආ.(ii)	ලැයිස්තුගත රීති වලට අනුව අතිරේක සටහන් සහ අනුපාත හෙළිදරව් කිරීම	අනුකූල වී ඇත.
7.4.ආ.(iii)	අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් අත්සන් කිරීම	අනුකූල වී ඇත.
7.4.ආ.(iv)	මූල්‍ය ප්‍රකාශ විගණනය කර ඇති ද යන්න සඳහන් කිරීම	අනුකූල වී ඇත.
7.5.අ	අදාළ මූල්‍ය වර්ෂය අවසන් වන දින සිට මාස 5 ක් තුළ වාර්ෂික වාර්තාව කොළඹ කොටස් හුවමාරුවට ඉදිරිපත් කළ යුතුය	2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන 2022 පෙබරවාරි 28 දින ඉදිරිපත් කර ඇත. 2021 වසර සඳහා වාර්ෂික වාර්තාව නියමිත දිනට පෙර ඉදිරිපත් කෙරෙනු ඇත.

රීති අංකය	අනාවරණ අවශ්‍යතාව	පරිශීලනය/අදහස්	පිටු අංකය
7.6.(i)	අදාළ මූල්‍ය වර්ෂය තුළ ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම්	ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව	117
7.6.(ii)	අදාළ මූල්‍ය වර්ෂය තුළ දී ආයතනයෙහි සහ එහි පරිපාලිතයන්ගේ ප්‍රධාන ක්‍රියාකාරකම් සහ එම ක්‍රියාකාරකම්හි ස්වභාවයේ සිදුවූ වෙනස්කම්	ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්	115 140
7.6.(iii)	ජන්ද හිමි හා අහිමි කොටස් හිමිකාරිත්වය මත, ඉහළම ප්‍රමුඛත්වය ලැබූ ප්‍රථම කොටස් හිමියන් විසිදෙනාගේ නම්, හිමිකම් කියනු ලබන කොටස් ප්‍රමාණය සහ අදාළ හිමිකාරිත්වය ප්‍රතිශතයක් ලෙස	ශ්‍රී ලංකා රජය ලංකා බැංකුවෙහි එකම කොටස්හිමියා වේ.	369
7.6.(iv)	පොදු හිමිකාරිත්වය ප්‍රතිශතයක් ලෙස	අදාළ නොවේ.	
7.6.(v)	මූල්‍ය වර්ෂය ආරම්භයේදී සහ අවසානයේදී අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිළධාරියාගේ කොටස් හිමිකාරිත්වය පිළිබඳ ප්‍රකාශය	අදාළ නොවේ.	
7.6.(vi)	මූල්‍ය වර්ෂය ආරම්භයේදී සහ අවසානයේදී අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිළධාරියාගේ කොටස් හිමිකාරිත්වය පිළිබඳ ප්‍රකාශය	අවදානම් කළමනාකරණ වාර්තාව	100-113
7.6.(vii)	ආයතනයෙහි සේවක සහ කෂේත්‍ර සබඳතාවයන්ට අදාළ ප්‍රමාණාත්මක ගැටළු පිළිබඳ තොරතුරු	සලකා බලනු ලබන වර්ෂය තුළ දී ප්‍රමාණාත්මක ගැටළු කිසිවක් පැන නොනැඟිණි.	
7.6.(viii)	ආයතනය සතු ඉඩම් සහ ආයෝජිත දේපළවල ප්‍රමාණ, පිහිටීම, තක්සේරු වටිනාකම සහ ඒවායේ ඇති ගොඩනැඟිලි සංඛ්‍යාව	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් අංක 33 සහ 34	215-235
7.6.(ix)	ආයතනයෙහි ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් නියෝජනය වන කොටස් සංඛ්‍යාව	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් අංක 50.1	259
7.6.(x)	එක් එක් වර්ගයේ ස්කන්ධ සුරුකුම් හිමිකරුවන් ගණන සහ එම හිමිකාරිත්වය සහ එම හිමිකාරිත්වය ප්‍රතිශතයක් ලෙස දක්වන ලද ව්‍යාප්ති සටහන	ශ්‍රී ලංකා රජය ලංකා බැංකුවෙහි එකම කොටස්හිමියා වේ.	369
7.6.(xi)	අනුපාතයන් සහ වෙළඳපළ මිල පිළිබඳ තොරතුරු		
	1. කොටසක ලාභාංශය, කොටසක ශුද්ධ වත්කම්, සංසන්දනීය රාජ්‍ය සුරුකුම්පත්වල පොළී අනුපාතිකය, ණය/ප්‍රාග්ධන අනුපාතිකය, පොළී ආවරණය සහ ද්‍රවශීල වත්කම් අනුපාතය	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 20 සහ 50.2 අතිරේක තොරතුරු,	169, 259 357
	2. ලැයිස්තුගත ණයකර වලට අදාළ වෙළඳපළ තොරතුරු	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 49 අතිරේක තොරතුරු	256, 357
	3. ණය ශ්‍රේණිගත කිරීමෙහි සිදුවූ වෙනස්වීම්	සංස්ථාපිත තොරතුරු	387

කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා

රීති අංකය	අනාවරණ අවශ්‍යතාව	පරීශීලනය/අදහස්	පිටු අංකය
7.6.(xii)	ආයතනයේ සහ එහි පරිපාලිතයන්ගේ ස්ථාවර වත්කම්වල සහ ඉඩම්වල වෙළඳපළ වටිනාකම, පොත් අගයත් අතර සැලකිය යුතු වෙනස්වීම්	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 34	217-235
7.6.(xiii)	ආයතනය වර්ෂය තුළදී ප්‍රසිද්ධ නිකුතුවකින්, හිමිකම් නිකුතුවකින් හෝ පුද්ගලික නිකුතුවකින් අරමුදල් සම්පාදනය	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 44, 49 සහ 50	244, 256, 259
7.6.(xiv)	සේවකයින් සතු කොටස් හිමිකාරීත්වය හෝ කොටස් යෝජනා ක්‍රම පිළිබඳ තොරතුරු	අදාළ නොවේ.	
7.6.(xv)	7 වන කොටසෙහි 7.10.3, 7.10.5 (ඇ), 7.10.6 (ඇ) යන රීතීන් වලට අදාළව ආයතනික යහපාලනය පිළිබඳ අනාවරණයන්	ආයතනික යහපාලනය සම්බන්ධයෙන් 2007 අංක 11 දරණ බැංකු පනතේ විධිවිධාන වලට අනුකූලව බැංකුව කටයුතු කරන බැවින් ලැයිස්තුගත කිරීමේ 7.10 විධානය යටතේ නිදහස් කර ඇත.,	
7.6.(xvi)	විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ වල දක්වා ඇති ස්කන්ධයෙන් 10% හෝ මුළු වත්කම් වලින් 5% යන දෙකෙන් අඩු අගය ඉක්මවන සම්බන්ධිත පාර්ශ්වයන් හා සිදුකළ ගනුදෙනු	අතිරේක තොරතුරු	371

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා

චක්‍ර ලේඛ අංකය	අවශ්‍යතාවය	කාලපරිච්ඡේද	සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත් වල පලකළ දිනය
2019 අංක 02 2019 ජනවාරි 18	6.1 සෑම කාර්තුවකම අවසාන දිනෙන් මාස දෙකක් ඇතුළත සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පතක අවම වශයෙන් වික් වරක්වත් පළකළ යුතුය. 6.2 වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශනය මූල්‍ය වර්ෂය අවසානයේ සිට මාස පහක් ඇතුළත සිදු කළ යුතුය. 6.3 මූල්‍ය වර්ෂය අවසාන වී මාස 3 ක් ඇතුළත බැංකුව විසින් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත්කළ හොත්, 4 වෙනි කාර්තුව සඳහා වන මූල්‍ය ප්‍රකාශන පල කිරීම සම්බන්ධයෙන් ඉහත 6.1 ට අනුව කටයුතු කිරීම අනිවාර්ය නොවේ.	2021 මාර්තු 31 න් අවසන් පළමු කාර්තුව	2021 මැයි 28
		2021 ජූනි 30 න් අවසන් දෙවන කාර්තුව	2021 අගෝස්තු 30
		2021 සැප්තැම්බර් 30 න් අවසන් තෙවන කාර්තුව	2021 නොවැම්බර් 29
		2021 දෙසැම්බර් 31 න් අවසන් සිව් වන කාර්තුව (විගණනය කරන ලද)	2022 මාර්තු 25

බලපත්‍රලාභී වාණිජ බැංකු වල මූල්‍ය ප්‍රකාශන වලට අදාළ අනෙකුත් හෙළිදරව් කිරීම් වලට අනුකූල වීම් පහත පරිදි සාරාංශ කළ හැකිය:

1 මූල්‍ය තත්ත්වය හා කාර්යසාධනය සඳහා මූල්‍ය උපකරණ වල වැදගත්කම පිළිබඳ තොරතුරු

1.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

1.1.1	මූල්‍ය වත්කම් හා වගකීම් වර්ග හෙළිදරව් කිරීම්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 21
1.1.2	අනෙකුත් හෙළිදරව් කිරීම්	
	(i) ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට ගණනය කිරීම සඳහා නම් කළ මූල්‍ය වත්කම් හා වගකීම් පිළිබඳ විශේෂ හෙළිදරව් කිරීම්. ණය අවදානම හා වෙළඳපළ අවදානම, මෙම අවදානම් සඳහා ආරෝපිත සාධාරණ අගයෙහි වෙනස්වීම් සහ ඇගයීම් ක්‍රම යනාදිය ද මෙයට ඇතුළත් වේ.	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 4.4, 27 සහ 64
	(ii) මූල්‍ය උපකරණ එක් කාණ්ඩයකින් තවත් වර්ගයකට නැවත වර්ගීකරණය කිරීම	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63.4
	(iii) සුරැකුම් ලෙස ඔඩපණය කළ මූල්‍ය වත්කම් පිළිබඳ තොරතුරු සහ සුරැකුම් වශයෙන් තබා ඇති මූල්‍ය සහ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 58
	(iv) මූල්‍ය වත්කම් වර්ග වල ණය අලාභය සඳහා ප්‍රතිපාදන ගිණුම සංසන්දන කිරීම	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 28.1 සහ 28.2
	(v) බහුවිධ ව්‍යුත්පන්න උපකරණ වලින් සමන්විත සංයුක්ත මූල්‍ය උපකරණ පිළිබඳ තොරතුරු	නැත
	(vi) ණය ගිවිසුම් කොන්දේසි කඩකිරීම් පිළිබඳ	නැත
1.2	**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය**	
1.2.1	ආදායම්, වියදම්, ලාභ හා පාඩු අයිතම අනාවරණය	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 7 සිට 18 දක්වා
1.2.2	අනෙකුත් හෙළිදරව් කිරීම්	
	(i) ලාභ හා පාඩු මඟින් සාධාරණ අගයට නම් නොකළ මූල්‍ය උපකරණ මත වන මුළු පොළී ආදායම සහ පොළී වියදම	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 8
	(ii) ගාස්තු ආදායම් සහ වියදම්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 9
	(iii)මූල්‍ය වත්කම් කාණ්ඩය අනුව හානිකරණ අලාභ වටිනාකම	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 14
	(iv) හානිකරණය වූ මූල්‍ය වත්කම් මත පොළී ආදායම්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 8.1
1.3	**අනෙකුත් හෙළිදරව් කිරීම්**	
1.3.1	මූල්‍ය උපකරණ සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 4.4.21 සිට 30 දක්වා, 39 සිට 44 දක්වා සහ 49
1.3.2	ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වගකීම් පිළිබඳ තොරතුරු	නැත
1.3.3	වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගයට අගය කරන ලද ස්කන්ධ උපකරණ වල ආයෝජන	
	(i) වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගයට අගය කරන ලද ස්කන්ධ උපකරණ වල තොරතුරු සහ එලෙස හඳුනා ගැනීමට හේතු	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 30
	(ii) ශේෂ පත්‍ර දිනට එක් එක් ආයෝජන වල සාධාරණ අගය	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 30.2 සහ 30.3
	(iii) සැසඳිය හැකි ධාරණ අගයන්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 30
	(iv) සාධාරණ අගය තීරණය කළ ආකාරය පිළිබඳ විස්තරයක්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63
	(v) වාර්තා කරන කාලපරිච්ඡේදය තුළ හඳුනා නොගත් සහ ශේෂ පත්‍ර දිනට දරා සිටින ආයෝජන සඳහා කාලපරිච්ඡේදය තුළ හඳුනා ගත් ලාභාංශ	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 13
	(vi) කාලපරිච්ඡේදය තුළ ස්කන්ධයේ සිදු වූ සමුච්චිත ලාභ හෝ පාඩු මාරු කිරීම් සහ එලෙස මාරු කිරීමට හේතු	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 12

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා

	(vii) වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගයට අගය කරන ලද ස්කන්ධ උපකරණ වල ආයෝජන වාර්තා කරන කාලපරිච්ඡේදය තුළ ඉවත් කෙරේ නම්,	නැත
	ආයෝජන ඉවත් කිරීමට හේතු	
	ඉවත් කිරීමේ දිනට ආයෝජන වල සාධාරණ අගය	
	ඉවත් කිරීමෙන් ලද සමුච්චිත ලාභ හෝ අලාභ	
1.3.4	මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීම	
	(i) වාර්තා කරන කාලපරිච්ඡේදය හෝ පෙර කාලපරිච්ඡේදය තුළ සියළුම මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීම් සඳහා	නැත
	නැවත වර්ගීකරණය කල දිනය ව්‍යාපාර ආකෘතියේ වෙනස්කම් පිලිබඳ විස්තරාත්මක පැහැදිලි කිරීම් සහ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි එහි බලපෑම දැක්වෙන ගුණාත්මක විස්තරයක්	
	එක් එක් කාණ්ඩයේ නැවත වර්ගීකරණය කිරීමේ වටිනාකම	
	(ii) ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ අගයේ සිට වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගයට අගය කරන ලද ක්‍රමක්ෂය පිරිවැයට නැවත වර්ගීකරණය කිරීම් සඳහා	නැත
	නැවත වර්ගීකරණය සිදු කරන දිනට තීරණය කළ සඵල පොළී අනුපාතය	
	හඳුනා ගත් පොළී ආදායම	
	(iii) වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගයේ සිට ක්‍රමක්ෂය පිරිවැයට නැවත වර්ගීකරණය කිරීම් සඳහා හෝ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ අගයේ සිට ක්‍රමක්ෂය පිරිවැයට හෝ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගයට නැවත වර්ගීකරණය කිරීම් සඳහා	නැත
	ශේෂ පත්‍ර දිනට මූල්‍ය වත්කම් වල සාධාරණ අගය	
	මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කර නොමැති නම් වාර්තා කරන කාලපරිච්ඡේදය තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හෝ වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනා ගත් සාධාරණ අගයේ ලාභ හෝ අලාභ	
1.3.5	හෙජින් ගිණුම්කරණය පිළිබඳ තොරතුරු	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 53
1.3.6	සාධාරණ අගයට නම් කළ සියළුම මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වල සාධාරණ අගයන් පිළිබඳ තොරතුරු පහත කරුණු සමඟ:	
	(i) සැසඳිය හැකි ධාරණ අගයන්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63
	(ii) සාධාරණ අගය තීරණය කළ ආකාරය පිළිබඳ විස්තරයක්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63
	(iii) සාධාරණ අගය තීරණය කිරීමට භාවිතා කළ යෙදවුම් වල මට්ටම	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63
	(iv) (අ) සාධාරණ අගය මැනීමේ ධූරාවලි මට්ටම් සංචලනයේ සැසඳුම්	නැත
	(ආ) තෙවන මට්ටමේ යෙදවුම් යොදාගෙන සාධාරණ අගයට අගය කළ මූල්‍ය උපකරණ සඳහා වන අමතර හෙළිදරව් කිරීම්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63.1.3,
	(v) විශ්වාසනීය ලෙස අගය කළ නොහැකි සාධාරණ අගය පිළිබඳ තොරතුරු	නැත
2. මූල්‍ය උපකරණ වල ස්වභාවය හා ඉන් පැන නඟින අවදානම් වල ප්‍රමාණය පිළිබඳ තොරතුරු		
2.1	**ගුණාත්මක හෙළිදරව් කිරීම්**	
2.1.1	සියළුම මූල්‍ය උපකරණ වර්ගයන්හි අවදානම් අනාවරණයන්	අවදානම් කළමනාකරණ වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ වල සටහන් අංක 64
2.1.2	කළමනාකරණ අරමුණු ප්‍රතිපත්ති සහ ඒම අවදානම කළමනාකරණය කිරීමේ ක්‍රියාවලි	අවදානම් කළමනාකරණ වාර්තාව
2.1.3	කලින් වර්ෂ වල වෙනස් වීම්	අවදානම් කළමනාකරණ වාර්තාව
2.2	**ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම්**	
2.2.1	ශේෂ පත්‍ර දිනට එක් එක් අවදානම් පිළිබඳ අනාවරණයන්ගේ ප්‍රමාණාත්මක දත්ත සාරාංශය	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 64
2.2.2	ණය අවදානම, ද්‍රවශීලතා අවදානම, වෙළඳපොළ අවදානම, මෙහෙයුම් අවදානම, පොළී අනුපාත අවදානම පිළිබඳ හෙලිදරව් කිරීම් හා මෙම අවදානම් කළමනාකරණය කරන ආකාරය	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 64
	(i) ණය අවදානම	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 64.2
	(අ) අනාවරණය කරන ඉහළම ප්‍රමාණය (සුරැකුම් වල වටිනාකම අඩු කිරීමට පෙර), සුරැකුම් පිළිබඳ විස්තරයක්, හිඟ හෝ හානිකරණය නොවූ මූල්‍ය වත්කම් වල ණය ගුණත්වය පිළිබඳ තොරතුරු සහ මූල්‍ය වත්කම් වල ණය ගුණත්වය පිළිබඳ තොරතුරු	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 64 .2.2
	(ආ)හිඟ හෝ හානිකරණය වූ මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් එම වත්කම් වල කාල ප්‍රමාණය, හානිකරණය වූ ලෙස තීරණය කිරීමට සලකා බලන ලද කරුණු, සියළුම වර්ගයේ මූල්‍ය වත්කම් වල සුරැකුම් පිළිබඳ විස්තරයක්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 64.2.1

(ඇ) ලබාගත් හෝ කැදවූ සුරැකුම් හෝ වෙනත් ණය වැඩි කිරීම් පිළිබඳ තොරතුරු	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 64.2.2.1
